පටුන

මෙම පොතෙහි අඩංගු කරුණු අන්තර්ජාලය තුළ
භාවිතයට පහසු යුනිකෝඩ් අකුරු ක්‍රමයට සකසා
http://pitaka.lk වෙබ් අඩවියේ ඇතුළත් කර ඇත.

# ඛුද්දක නිකාය

# 3

## 10. ජාතක

ධම්මවිනය උගත් පණ්ඩිත
**මහාස්ථවිරයන් වහන්සේලාගේ**
ආධාර ඇතුව

**ආචාර්‍ය්‍ය අධිනීතිඥ**
**ඒ. පී. ද සොයිසා මහතා**
**විසින්**
**සිංහලට පරිවර්තනය කරන ලදී.**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# අනුශාසක මණ්ඩලය

පෑලියගොඩ විද්‍යාලංකාර පරිවෙණාධිපති ගරු කිරිවත්තුඩුවේ පඤ්ඤාසාර නායක මාහිමියන්වහන්සේ

මාලිගාකන්දේ විද්‍යොදය පිරිවෙනේ B.A., PH.D. උපාධිධාරී පණ්ඩිත ගරු දෙහිගස්පේ පඤ්ඤාසාර නායක ස්ථවිරයන් වහන්සේ

කළුතර පුලිනතලාරාමාධිපති ගරු බේරුවල ශ්‍රීසුමංගල ශ්‍රීනිවාසාභිධාන මහානායක මාහිමියන්වහන්සේ

අම්බලම්ගොඩ මහා විහාරස්ථ විද්‍යාලොක විද්‍යාලයාධිපති ශ්‍රී සද්ධර්මභාරතීශ්වර පණ්ඩිතාචාර්ය විලේගොඩ ශ්‍රී ධර්මානන්ද මහාස්ථවිරපාදයන් වහන්සේ

වැලිතර මහාකප්පිණ මුදලින්දාරාමස්ථ රාජපක්ෂ පරිවෙණාධිපති ගරු රන්දොඹේ ශ්‍රී සුධර්මාලංකාර ප්‍රධාන අධිකරණ නායක ස්ථවිරයන්වහන්සේ

බළන්ගොඩ ශ්‍රී ධර්මානන්ද පරිවෙණාධිපති ගරු ආනන්ද මෛත්‍රෙය ස්ථවිරයන්වහන්සේ

බෙල්ලන ධර්මපාල පරිවෙණාධිපති පණ්ඩිත බෙල්ලන ඤාණවිමල ස්ථවිරයන්වහන්සේ

රන්දොඹේ මහාචෛතිය පරිවෙණාධිපති ගරු වලගෙදර පණ්ඩිත සොමාලොක නායක ස්ථවිරයන්වහන්සේ

අඹගහපිටියේ සුගත ශාසනොදය පරිවෙණාධිපති අහුංගල්ලේ පණ්ඩිත විමලකිත්ති නායක ස්ථවිරයන් වහන්සේ

අම්බලන්ගොඩ අග්ගාරාමාධිපති අග්ග මහා පණ්ඩිත ගරු පොල්වත්තේ බුද්ධදත්ත මහා ස්ථවිරයන්වහන්සේ

ගාල්ලේ ගල්වඩුගොඩ විද්‍යාරාජ පරිවෙණාධිපති පණ්ඩිත සුමංගල නායක ස්ථවිරයන්වහන්සේ

බම්බලපිටියේ වජිරාරාමවාසී ගරු නාරද මහා ස්ථවිරයන්වහන්සේ

මාදම්පේ සුනන්දොදය පරිවෙණාධිපති ගල්පොත්තාවෙල ශ්‍රී පඤ්ඤානන්ද ප්‍රධාන නායක ස්ථවිරයන්වහන්සේ

මරදානේ ශ්‍රීලංකා විද්‍යාලයාධිපති ගරු බද්දේගම පණ්ඩිත විමලවංශ ස්ථවිරයන්වහන්සේ

පණ්ඩිත එච්. නන්දසාර මහතා

ආචාර්ය්‍ය ආර්‍ය්‍යරත්න රේරුකාන මහතා

# ඛුද්දක නිකාය

# 3

## 10. ජාතක

ධර්මවිනය උගත් පණ්ඩිත
මහාස්ථවිරයන් වහන්සේලාගේ
ආධාර ඇතුව

ආචාර්ය්‍ය අධිනීතිඥ
ඒ. පී. ද සොයිසා මහතා
විසින්
සිංහලට පරිවර්තනය කරන ලදී.

සීමාසහිත
ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්.
http://pitaka.lk

ප්‍රථම මුද්‍රණය - 1957
දෙවැනි මුද්‍රණය - 2014

**ත්‍රිපිටකය**

**ඛුද්දක නිකාය 3**

© කුමාරි ජයවර්ධන

ISBN 978-955-

පිටුවැසුම සැකසුම :
පාලිත සේනානායක

අක්ෂර සංයෝජනය:
නෙල්කා අබේවික්‍රම

ප්‍රකාශනය:
සී/ස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම
661,665,675, පී. ද ඇස්. කුලරත්න මාවත, කොළඹ 10.

මුද්‍රණය:
චතුර මුද්‍රණාලය
69, කුමාරදාස පෙදෙස, වැල්ලම්පිටිය.

------------

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# ත්‍රිපිටක සිංහල පරිවර්තනය

බුදුරජාණන් වහන්සේ දෙසූ ධර්මය මුලින්ම සඳහන් වූයේ මාගධී භාෂාවෙන් හෙවත් පසුකලක 'පාළි' නමින් හැඳින්වුණ භාෂාවෙනි. ප්‍රථම ද්විතීය හා තෘතීය ධර්ම සංගායනාවලින් සංගෘහීත වූයේත් ශ්‍රී ලංකාවේදී ග්‍රන්ථාරූඪ වූයේත් මෙම පාළි ත්‍රිපිටකයමය. පසුකාලවලදී එම ත්‍රිපිටකයට අට්ඨකථා හා ටීකා ඉතා වැඩි කොටසක් ලියවුණේ එම පාළි භාෂාවෙන් මය, ශ්‍රී ලංකාවේ දී මය. සිංහල භික්ෂූන් වහන්සේලාගේ ප්‍රමුඛත්වයෙනි. මේ නිසා මූලික ලෙස බුදුදහම හදාළ හැකිව පැවැතුණේ පාළි භාෂාවෙන් මය. සන්න සහ පිටපොත් වශයෙන් සමහර පාළි පොත්වල කොටස් සිංහල භාෂාවට නගා ලියා තිබුණ නමුත් සම්පූර්ණ පරිවර්තනයක් සිදුවී නොතිබිණ. ජාතකට්ඨ කථාව හා විනය පොත්වල කොටස් බොහෝ දුරට සිංහල භාෂාවට පරිවර්තිතව පැවැතිණ. ශ්‍රී ලංකාවේ මුද්‍රණ ශිල්පය පටන්ගැනුනේ මේ තත්ත්වය මතය. වටිනා ඥාණ සම්භාරයක් ඇතුළත්වන සිංහල ජාතිය සන්තකයැයි කිව හැකි බෞද්ධ සාහිත්‍යය සිංහල පාඨකයන්ට කියවා තේරුම් ගත හැකි තත්ත්වයේ වැඩ පිළිවෙළක අවශ්‍යතාව බෙහෙවින් දැනෙන්නට විය.

මේ අවස්ථාවේ නොයෙක් විෂයයන් කෙරෙහි මනස යොමු කළ පඬිවරයෙක් මෙදෙසට යොමු විය. එනම් ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතාය. නීතිය, දර්ශනය, විවිධ භාෂා ආදිය ප්‍රගුණ කොට දේශපාලනයට පිවිසි ඒ මහතා දකුණු කොළඹ ආසනයෙන් රාජ්‍ය මන්ත්‍රණ සභාවට තේරුණේය. එක්වරකින්ම එම මග අත්හල එතුමා යොමුවූයේ ධර්ම ශාස්ත්‍රීය කටයුතු වෙතටය. එහි ඵලයක් වූයේ පාළි බෞද්ධ සාහිත්‍යය සිංහල භාෂාවට පරිවර්තනය කිරීමය.

සිංහලයන් සතුව පැවැතුණද ඉතා සුළු පිරිසකට තේරුම් ගත හැකිව තුබූ පාළි ත්‍රිපිටකය හා ඒ සඳහා ලියැවුණ අට්ඨකතා ද ඒවා සඳහා ලියැවුණ ටීකා ග්‍රන්ථද ගත් කල විශාල පොත් සමූහයකි. එම පොත් සමූහය තනිවම සිංහල භාෂාවට නැගීමට කෙනෙකු සිතීම පවා ආශ්චර්යකි. එම අසිරිමත් කාර්යයට සිතත් අතත් යොමු

කළ වීරයා වූයේ ආචාර්ය ඒ. පී. ද සොයිසා ශ්‍රීමතාය. එවකට ශ්‍රී ලංකාවේ ටික දෙනෙකුට ලැබිය හැකිව තුබූ එංගලන්තයට ගොස් පශ්චාත් උපාධියක් ලැබීමට වරම් ලත් එතුමා ශ්‍රී ලංකාවට පැමිණ පිය තැබූ නීති වෘත්තිය මෙන්ම දෙවන වරට යොමු වූ දේශපාලනය ද සිත් නොගත් නිසාදෝ ඒවා වෙනුවට ග්‍රන්ථ රචනයට බැස්සේ තමාගේම තෝරාගැනීමක් ලෙසය.

විසිවන සියවසේ මැද භාගය වනවිට එංගලන්තයේ පාළි පොත් සමාගම පාළි ත්‍රිපිටකයෙන් බොහෝ කොටසක් ඉංග්‍රීසි භාෂාවට පෙරළා මුද්‍රණය කර තිබිණ. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණ බවක් ලබා සිටි ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතා බෞද්ධ සාහිත්‍ය ග්‍රන්ථ සිංහලට නැගීමේදී ඉංග්‍රීසි පරිවර්තන උපයෝගී කරගන්ට ඇත. ඒ සමග එවකට ශ්‍රී ලංකාවේ සිටි ධර්මවිනයධර මහතෙරවරුන්ගේ උපදෙස් ද ලබා ගත් බව එතුමාම පවසා ඇත. මුද්‍රණ පහසුකම් අඩුවෙන් පැවැති එම කාලයේ නිරවුල්ව ස්වකීය ග්‍රන්ථ ප්‍රකාශනය කිරීමට සිතූ එතුමා ධර්මසමය නමින් මුද්‍රණාලයක් ද පටන්ගත්තේය. පාළි ත්‍රිපිටක ග්‍රන්ථවල සිංහල පරිවර්තනයේ සමහර තැන් වියතුන්ගේ විවේචනයටද භාජනද විය.

පාළි භාෂාවෙන් සඳහන් වී ඇති කරුණු පැහැදිලි කිරීමේදී අට්ඨකතාවල පවා මතභේද සහිත තැන් දක්නට ඇත. මේ සෑම ආගමකම දක්නා දෙයකි. බුදුසසුනද වෙන වෙන නිකායවලට බෙදුනේ බුද්ධ දේශනාවන් විවිධව තේරුම් කිරීම නිසාය. විශේෂයෙන් සූත්‍ර පිටකයේ ඇතුළත් වෙන ගැඹුරු අදහස් වෙනත් භාෂාවකින් පැවැසීම සුළුපටු කාර්යයක් නොවේ. ඒ ගැන සලකන විට ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතාට ලොකු සම්මානයක් හිමිය. අඩසියවසකින් පැරැණි වූ එම ග්‍රන්ථ මේ වන විට වෙළඳපොලේ දක්නට නැති බව සලකා ආචාර්ය ඒ. පී. ද සොයිසා සූරීන් පළ කළ සිංහල ත්‍රිපිටකය නැවත මුද්‍රණය කිරීමෙන් එම අඩුව පිරවීමට සිරිසුමන ගොඩගේ සිරිමතාණන් ගත් පියවර ප්‍රශංසනීයය. ඇතැම් පොත් සොයා ගැනීමත් දුෂ්කරය. අපහසුකම් නොසලකා ගත් මෙම පියවර නොපමාව නිම කිරීමට එතුමාට හැකිවේවායි මම ප්‍රාර්ථනා කරමි.

**බෙල්ලන ඤාණවිමල මහානායක ස්ථවිර**

# පෙරවදන

බෞද්ධ ග්‍රන්ථ අතර මුදුන්මල්කඩ ත්‍රිපිටකයයි. බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මය මුළුමනින්ම ග්‍රන්ථාරූඪ කර ඇති ත්‍රිපිටකය පළ වී ඇත්තේ පාළි භාෂාවෙනි. එනිසාම වැඩිදෙනෙකුට ත්‍රිපිටකය කියවා අවබෝධ කර ගැනීම බලවත් ගැටලුවක් විය. 2500 බුද්ධ ජයන්තිය වෙනුවෙන් සංස්කරණය කරන ලද ත්‍රිපිටකය බොහෝවිට උගතුන්ට පමණක් සීමා විය. පසුකාලයේ බොහෝ වියතුන් ත්‍රිපිටකය සිංහලට නැගුවද එම පරිවර්තන ද එතරම් ලිහිල් බසින් පළ නොවිනි.

මෙරට විසූ ප්‍රකට බුද්ධිමතකු මෙන්ම සිංහල, පාළි හා ඉංග්‍රීසි භාෂාත්‍රයෙහි මනා ප්‍රවීණත්වයක් ලද විද්වතකු ද වූ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා එවක මෙරට විසූ ධර්ම විනය උගත් පණ්ඩිත මහස්ථවිරයන් වහන්සේලාගේ ආධාර ඇතිව ත්‍රිපිටකය සරල බසින් සිංහලට නැගුවේ එබැවිනි. ත්‍රිපිටකයේ දැනට පළ වී ඇති සිංහල පරිවර්තන අතුරෙන් කියවා පහසුවෙන් අවබෝධ කරගත හැකි, කාටත් වැටහෙන බසින් ලියැවුණ පොත් පෙළ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ මෙම පොත් පෙළ බව අපගේ වැටහීමයි. ත්‍රිපිටකය මෙතරම් සරල සිංහලෙන් ලියැවුණ වෙනත් ග්‍රන්ථ මාලාවක් බිහිවී නැත. එබැවින් බොහෝ දෙනා අපෙන් කළ ඉල්ලීම් ද සලකා බලා ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව නැවත මුද්‍රණය කර ප්‍රකාශයට පත් කිරීමට අප අදහස් කළේ බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මය සරල සිංහලෙන් කියවා අවබෝධ කරගනු රිසි පාඨකයන් වෙනුවෙනි.

මෙම බැරෑරුම් කටයුත්තේදී අප මුහුණ දුන් බලවත් ගැටලුව වූයේ පනහ දශකයේ මුල් භාගයේ කාණ්ඩ 48 කින් පළවූ එම සම්පූර්ණ ග්‍රන්ථ මාලාව සොයා ගන්නේ කෙසේද යන්නයි. ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා එම පොත් පෙළ සංස්කරණය කරන සමයෙහි එම කාර්යය සඳහා ඒ මහතාට මග පෙන්වූ

මහතෙරුන් වහන්සේලා අතුරෙන් අද ජීවතුන් අතර වැඩසිටින එකම භික්ෂූන් වහන්සේ වන කොල්ලුපිටියේ වාලුකාරාමාධිපති අතිපූජ්‍ය බෙල්ලන ඥාණවිමල මහනායක ස්වාමිපාදයාණන් වහන්සේගේ මඟ පෙන්වීම මෙහිදී අපට විශාල ශක්තියක් විය.

ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ ත්‍රිපිටකය සරල සිංහල පොත් පෙළ අප වෙත ලබාදීමට කටයුතු කළ විද්‍යෝදය පරිවෙණාධිපති බලන්ගොඩ සෝභිත නාහිමිපාණන් වහන්සේටත්, දොඩන්දූව පූජ්‍ය පණ්ඩිත ගංතලාවේ ගුණානන්ද නායක ස්ථවිරයන් වහන්සේටත්, පූජ්‍ය විද්‍යානිධි අම්බලන්ගොඩ සුමේධානන්ද ස්ථවිරයන් වහන්සේටත්, අරිසෙන් අහුබුදු මහත්මියටත්, ශ්‍රීනාත් ගනේවත්ත මහතාටත්, ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක මිලින්ද මොරගොඩ මහතාට සහ එස්. අයි. ගමගේ මහතාටත් අපගේ කෘතගුණපූර්වක ස්තුතිය හිමිවේ.

මෙම ග්‍රන්ථ මාලාව යළි මුද්‍රණය කිරීමට අනුමැතිය පළ කළ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතාගේ දියණිය වන ආචාර්ය කුමාරි ජයවර්ධන මහත්මියටත්, පරිගණක අක්ෂර සංයෝජනය කළ නෙල්කා අබේවික්‍රම මහත්මියටත්, මුද්‍රණ සම්බන්ධීකරණයෙන් දායක වුණු පාලිත සේනානායක මහතාටත්, සෝදුපත් කියැවූ මිල්ටන් මද්දුමගේ මහතාටත් අපගේ ස්තුතිය හිමිවිය යුතුය.

**සිරිසුමන ගොඩගේ**

2014 ජනවාරි

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්.    http://pitaka.lk

# සංඥාපනය

සූත්‍ර පිටකයේ පස්වෙනි නිකායවූ ඛුද්දක නිකාය කාණ්ඩ පසළොසකින් යුක්තයි. මේ නිකායේ ජාතක කථා ආදී ධර්ම රස ඇති කරන කථා රාසියක් අන්තර්ගත කර තිබේ. කාව්‍යරසය දක්වන පද්‍ය රචනා බොහෝ වෙත්. මේ පොතට ඛුද්දක නිකායේ ජාතක කාණ්ඩයේ උම්මග්ග ජාතකය අවසන්කොට ඇතුළත් කළෙමි.

මේ පොත් ලියා ප්‍රසිද්ධ කිරීමට නොයෙක් පළාත්වල සංඝයා වහන්සේලා දුන් ආධාරය මහත් උපකාරයක් විය.

මේ පොත් පෙළ කියවීමට නොයෙක් තරාතිරම්වල පින්වතුන් දක්වන උනන්දුව ප්‍රීතියට කරුණක් වේ. සමහර පාඨශාලා ශිෂ්‍යයන් විසින්ද මේ පොත් පිළිවෙළට කියවීමට පටන් ගෙන තිබේ.

බොහෝ වැඩ කටයුතුවල යෙදී සිටින කාලයක, ශාසන ආලයෙන් ආචාර්ය ආයඹිරත්න රේරුකාන මහත්මයා මේ ව්‍යාපාරයට කරගෙන යන උපකාර මහත් බව නැවතත් දන්වමු.

මේ පොත සඳහා සියලු ආකාරයෙන් අපට ආයඹිරත්න රේරුකාන මහත්මයාගෙන් ආධාර ලැබුණා පමණක් නොව රන්දොඹේ ශ්‍රී සුධර්මාලංකාර ප්‍රධාන අධිකරණ නායක ස්ථවිරයන් වහන්සේද, පණ්ඩිත පින්කන්දේ පඤ්ඤාවාස ස්ථවිරයන් වහන්සේද, පණ්ඩිත කේ. පඤ්ඤාරාම ස්ථවිරයන් වහන්සේද, පණ්ඩිත විමල විජයසූරිය මහතාද, ඩී. එන්. ඒ. මුදලිගේ මහතාද, ඒ. ඇස්. බී. ඩබ්ලිව්. නානායක්කාර මහතාද, ඇල්. ජී. පෙරේරා මහතාද ආධාර කළෝය.

මේ පොත් ලිවීමට නොයෙක් උපදෙස් සහිත ලියුම් එවා තිබෙන උගත් භික්ෂූන් වහන්සේලාටත් බෞද්ධ උපාසක පින්වතුන්ටත් සාමාජිකයින් වශයෙන් පොත් ගැනීමට බැඳී සිටින පින්වතුන්ටත් අපේ ගෞරව ස්තුතිය පිරිනමමු.

මීට,

**ඒ. පී. ද සොයිසා**

5 - 5 - 57.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්.

http://pitaka.lk

*x*

පටුනේ සඳහන් එක් එක් පරිච්ඡේද වලට පිවිසීම සඳහා ඒ නම් මත **click** කරන්න, නැතිනම් වම් පස **bookmarks** තීරුව භාවිතා කරන්න.

# පටුන

| | පිට |
|---|---|
| 464. චුල්ල කුණාල ජාතකය (පාලි සිංහල පොත්වල නැත). | |
| 465. භද්දසාල ජාතකය | 981 |
| 466. සමුද්ද වාණිජ ජාතකය | 982 |
| 467. කාම ජාතකය | 983 |
| 468. ජනසන්ධ ජාතකය | 985 |
| 469. මහා කණ්හ ජාතකය | 986 |
| 470. මහා පදුම ජාතකය | 988 |
| 471. මිත්තාමිත්ත ජාතකය | 990 |
| 472. අම්බ ජාතකය | 991 |
| 473. පන්ධන ජාතකය | 993 |
| 474. මේ පාලි සිංහල පොත්වල නැත | |
| 475. ජවන හංස ජාතකය | 994 |
| 476. චූල නාරද ජාතකය | 995 |
| 477. දූත ජාතකය | 997 |
| 478. කාලිංග බෝධි ජාතකය | 998 |
| 479. අකීර්ති ජාතකය | 1000 |
| 480. තක්කාරිය ජාතකය | 1003 |
| 481. රුරු මෘග ජාතකය | 1005 |
| 482. සරභ මෘග ජාතකය | 1007 |
| 483. සාලිකේදාර ජාතකය | 1009 |
| 484. චන්ද කින්නර ජාතකය | 1011 |
| 485. මහා උක්කුස ජාතකය | 1014 |
| 486. උද්දාලක ජාතකය | 1017 |
| 487. භිස ජාතකය | 1019 |
| 488. සුරුචි ජාතකය | 1023 |
| 489. පඤ්චු කොසඨ ජාතකය | 1025 |
| 490. මහා චෝර ජාතකය | 1027 |
| 491. තච්ඡක සූකර ජාතකය | 1030 |
| 492. මහා වාණිජ ජාතකය | 1032 |
| 493. සාධීන ජාතකය | 1034 |

494. දශ බ්‍රාහ්මණ ජාතකය 1037
495. භික්කා පරම්පරා ජාතකය 1042
496. මාතංග ජාතකය 1044
497. චිත්ත සම්භූත ජාතකය 1048
498. සිවි ජාතකය 1051
499. සිරිමන්ද ජාතකය 1055
500. රෝහන්ත මෘග ජාතකය 1055
501. චුල්ල හංස ජාතකය 1059
502. සත්ති ගුම්බ ජාතකය 1062
503. භල්ලාටිහ ජාතකය 1065
504. සෝම නස්ස ජාතකය 1068
505. චම්පෙය්‍ය ජාතකය 1072
506. මහා පලෝභන ජාතකය 1077
507. පංච පණ්ඩිත ජාතකය 1080
508. සත්ථිපාල ජාතකය 1080
509. අයොඝර ජාතකය 1084
510. කිංඡන්ද ජාතකය 1087
511. කුම්භ ජාතකය 1091
512. ජයද්දිස ජාතකය 1195
513. ඡද්දන්ත ජාතකය 1100
514. සම්භව ජාතකය 1105
515. මහා කපි ජාතකය 1110
516. දකරක්ඛස ජාතකය 1114
517. පණ්ඩරක ජාතකය 1114
518. සම්බුලා ජාතකය 1119
519. ගණ්ඩන්දුක ජාතකය 1124
520. තෙසකුණ ජාතකය 1128
521. සරභංග ජාතකය 1134
522. අලංම්බුසා ජාතකය 1141
523. සංඛපාල ජාතකය 1146
524. චුල්ල සුතසෝම ජාතකය 1153
525. නලීනි ජාතකය 1159
526. උම්මාදන්ති ජාතකය 1167
527. මහා බෝධි ජාතකය 1175

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

528. සෝනක ජාතකය 1183
529. සංකිච්ච ජාතකය 1191
530. කුශ ජාතකය 1197
531. සෝණ නන්ද ජාතකය 1209
532. චුල්ල හංස ජාතකය (2) 1219
533. මහා හංස ජාතකය 1228
534. සුධා භෝජන ජාතකය 1240
535. කුණාල ජාතකය 1251
536. මහා සුතසෝම ජාතකය 1262
527. මූග පක්ක ජාතකය 1279
538. මහා ජනක ජාතකය 1292
539 සාම ජාතකය 1308
540. නිමි ජාතකය 1321
541. ඛණ්ඩහාල ජාතකය 1340
542. භූරිදත්ත ජාතකය 1356
543. මහා නාරද ජාතකය 1380
544. විධුර ජාතකය 1402
545. උම්මග්ග ජාතකය 1441

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# ඛුද්දක නිකාය

## 10. ජාතක

### 12 ද්වාදස නිපාතය.

**465 භද්දසාල ජාතකයා:-** 1 "අහසෙහි සිටියාවූ පිරිසිදු වස්ත්‍ර වලින් සැදුනාවූ තොප කවරෙක්ද, කුමකින් තොපගේ කඳුළු වැගිරෙද්ද, තොපට කොයින් බියක් පැමිණියේද,

2 "දේවයන් වහන්ස, ඔබවහන්සේගේම රාජ්‍යයෙහි වාසය කරන්නාවූ නුඹවහන්සේ විසින් පුදන ලද්දාවූ මට සැට දහසක් හවුරුදු ඉක්ම ගියහ. මා භද්දසාල යයි දන්නාහුය.

3 "ඒ පෞරාණික රජහු නගරයන්ද ගෘහයන්ද නොයෙක් ප්‍රාසාදයන්ද කරවන්නාහු මා නොඉක්මවූහ. ඔහු තුමූ යම්සේම මා පිදුවාහුද, එසේම නුඹ වහන්සේද පුදව,

4 "කදින් මහත්වූ ඒ ප්‍රාසාදයට සුදුසු අනික් රුකක්ද මම නොදකිමි. තොපගේ වෘක්ෂය උසින් මහතින් යුක්තය. හට ගැණීමෙන්ද විශිෂ්ට රූ ඇත්තේ විය.

5 "සිත් කළුවූ එක්ටැම් ඇති පහයක් කරවන්නෙමි. තොප එහි පමුණුවන්නෙමි. එම්බා යක්ෂය, බොහෝකලක් තොපගේ ජීවත්වීම වන්නේය.

6 "මාගේ ශරීරයවූ භද්‍රශාල වෘක්ෂයෙන් වෙන්වීමවූ මරණයට හේතුවූ මේ කාරණය වනාහි ඔබ සිත පහළවීනම් මා බොහෝසෙයින් සිඳ කඩ කඩ කොට කපන්නහුය.

7 "අගද මැදද පළමුකොට සිඳ පසුව මුල සිඳින්නහුය. මෙසේ වනාහි සිඳිනු ලබන මට දුක්වූ මරණය නොවන්නේය.

8 "යම්සේ ජීවත්වන්නහුගේ අත් පාද කන් නාසාද සිඳින්නේද ඉන්පසු හිස සිඳින්නේද එය දුක්වූ මරණය නම් වන්නේය.

9 "වනස්පතීවූ භද්‍රශාල වෘක්ෂය, කඩ කඩ වශයෙන් සිඳීම සැපයක්ද, කුමක් හේතු කොටගෙණ කුමක් සඳහා කඩ කඩකොට සිඳීම කැමැත්තෙහිද,

10 "මහරජ ධර්ම යුක්තවූ කාරණය යුක්තමය. යම් හේතුවක් සඳහා කඩ කඩකොට සිඳීම කැමැතිවෙම්ද, මාගේ ඒ හේතුව ඇසුව මැනව, මාගේ වෘක්ෂ පාර්ශ්වයෙහි වාතාවරණයෙහි හටගත් සුවසේ වැඩුනාවූ මාගේ ඥාතීහු වෙත්. මම ඔවුන්ද පෙළන්නෙම් නම් අන්‍යවූ නෑයන්ගේ කඳුළු වගුරුවන ලද්දේ වෙමි.

11 "වනස්පතිවූ භද්‍රශාලය, සිතිය යුත්තක් සිතුයෙහි නෑයන්ට වැඩ කැමතිවෙහිය. යහළු දිව්‍යපුත්‍රය, තොපට අභය දෙමියි කීයේය."

**466 සමුද්ද වානිජ ජාතකයː-** 1 "ඒ දඹදිව වැසි මිනිස්සු සී සාත් වපුරත්. කර්මයන්ගේ විපාකය අනුව ජීවත් වන්නාවූ මනුෂ්‍යයෝ මේ රසයට කොටස් කාරයෝ නොවෙත්. දඹදිවට වඩා මේ දිවයින අපට උතුම් වන්නේය.

2 "චන්ද්‍රයා මෙයින් පසළොස් රැයක් ඉක්ම ගිය කල්හි සාගරයාගේ වේගය මහත් වන්නේය. මහත්වූ මේ දිවයින උල්පවමින් තොප නොනසාවා. අනික් සැඟවී සිටියයුතු තැනකට යව්.

3 "මේ සාගරයාගේ ජලවේගය කිසිකලෙකත් මහත්වූ මේ දිවයින යට නොකරන්නේය. මා විසින් ඒ කාරණය බොහෝ නිමිති වලින් දක්නා ලදී. බිය නොවව් සතුටුවව්.

4 "බොහෝ කෑ යුතුදෑ ඇති බොහෝ ආහාර පාන ඇති මහත්වූ මේ නිවාසය පැමිණි සම්පත් ඇත්තේය. තොපට කිසි භයක් නොදක්නෙමි. මුනුබුරන් දක්වා සතුටුවව්.

5 "මේ දකුණු දිශාවෙහි සිට යම් දෙවියෙක් නිර්භය යයි. කෑඳවාද ඔහුගේ වචනය සැබව, උතුරුදිග සිටි තැනැත්තේ වෛරීය. ඔහුගේ බිය පිණිස කියනලද වචනය සත්‍ය නොවේ. එහෙයින් භය නොවව්, කුමකට ශොක කරව්ද, සතුටුවව්.

**6** "යම්සේ මේ යක්ෂයෝ විරුද්ධ වචන කියත්ද, එකෙක් බිය ප්‍රකාශ කෙරෙයි. එකෙක් නිර්භය ප්‍රකාශ කෙරෙයි. එබැවින් ඒ පිළිබඳ මාගේ වචනය අසව්. වහා යුහුව සියල්ලෝ නොනැසෙවු.

**7** "සියලුදෙනා රැස්ව ගැඹුරුවූ දැඩිවූ සියලු යන්ත්‍රොපකරණ ඇති මහ නැවක් කරමු. ඉදින් මේ දකුණුදිග සිටි දිව්‍ය පුත්‍රතෙම සත්‍යයක් කීනම්, මේ උතුරුදිග දෙව් පිත් අසත්‍යය ප්‍රකාශ කෙරේනම් අපට ඕතොමෝම මතු විපත්හි වැඩ පිණිස වන්නීය. වේ දිවයිනද අත් නොහරමු

**8** "ඉදින් වනාහි උතුරුදිග දෙව් පිත් සත්‍යය කීනම් මේ දකුණුදිග දෙව්පිත් හිස් දෙයක් කීයේනම් මෙසේ ඒ නැවටම අපි සියල්ලෝ නැග සුවසේ එතෙරට තරණය කරමු.

**9** "ප්‍රථමයා විසින් කියනලද වචනය යහපතැයි ගන්නේ ඒකාන්තයෙන් උතුම් නොවේ. පශ්චිමයා කී වචනය යහපතැයි ගන්නේ ඒකාන්තයෙන් උතුම් නොවේ. ඉන්ද්‍රිය හමුවූවක් ගෙණ යමෙක් තෙමේ මෙහි නුවණින් සොයා සත්‍යය ගත්තේද, ඒකානත්යෙන් ඒ මනුෂ්‍යතෙමේ උතුම් තැනට පැමිණේ.

**10** "යම්සේ වනාහි ඒ මුහුදු වෙළෙන්දෝ සාගර ජල මධ්‍යයෙහි ස්වකීය කර්මන්තයෙන් සුවසේ නිර්භය ස්ථානයට පැමුණුනාහුද, මතුවන්නාවූ අභිවෘද්ධිය දැන ඒ පණ්ඩිත ජන තෙම මඳකුදු නොඉක්මවයි.

**11** "අඥාන ජනයෝද මුළාවෙන් රසයෙහි ඇලුනාහු ගිජුවූවාහු මතුවන වැඩ නොදැන පවත්නා සැපතෙහි මුහුද මැද වැනසූහ. ඒ මිනිසුන් මෙන් විනාශයට පැමිණෙත්.

**12** "මතු වැඩ සිදුවන්නාවූ කටයුත්ත පළමුකොට කරන්නේය. කටයුතු කාලයෙහි කටයුත්ත මා නොපෙළාවා එබඳුවූ පළමුකොට කටයුත්ත කරන්නාවූ ඒ ප්‍රාඥයා ඒ මතු වන වැඩදායක කටයුත්ත කිරීමට සුදුසු කල්හි නොපෙළයි."

**467 කාම ජාතකයඃ- 1** "ඉදින් වස්තු කාමය කැමැති වන්නාවූ ඒ පුද්ගලයාට එය සමෘද්ධවේනම් මනුෂ්‍යතෙම යමක් කැමැතිවේ නම් එය ලදින් ඒකාන්තයෙන් සතුටු සිත් ඇත්තේවේ.

2 "වස්තුකාම ක්ලෙශ කාමය කැමැතිවන්නාවූ ඔහුගේ ඒ කැමැති වස්තුව ඉදින් සමෘද්ධ වේනම්, ඉක්බිති ඔහු අනික් කාම වස්තුන් ග්‍රිෂ්මයෙහි තැවුනහුගේ පැන් පිපාසය මෙන් සොයයි

3 "වැඩෙන්නාවූ අං ඇති ගවයන්ගේ අඟ යම් සේ වැඩේද, එපරිද්දෙන් මද නුවණ ඇති අඥානවූ කිසිවක් නොදන්නාවූ වැඩෙන්නාවූ පුරුෂයාගේ තෘෂ්ණා පිපාසාවද බොහෝසෙයින් වැඩේ.

4 පොළොවෙහි සාලික්ෂෙත්‍ර යවක්ෂෙත්‍රද ගවඅශ්වදාස පුරුෂාදීහුද එක් පුද්ගලයෙකුට දුන් නමුත් ඔහුට එය ප්‍රමාණ නොවේයයි දැන පණ්ඩිතතෙම සමව හැසිරෙන්නේය.

5 "රජතෙම බලාත්කාරයෙන් පෘථිවිය දිනා සයුර හිම්කොට ඇති පොළොවට අධිපතිව වසන්නේ මුහුදින් මෙතෙර තෘප්ති රහිතවූයේ මුහුදින් එතෙරද ප්‍රාර්ථනා කරන්නේය.

6 "යමෙක්තෙම වස්තුකාම ක්ලෙශ කාමයන් සිහි කරන්නේ සිතින් තෘප්තියට නොපැමිණියේද, ඒ කාමාශාවෙන් නැවතී ප්‍රතිකර්මය දැක යමෙක් තුමූ නුවණින් තෘප්තියට පැමිණියාහුද, ඔහු තුමූ ඒකාන්තයෙන් මොනවට තෘප්තියට පැමිණියාහු වෙත්.

7 "තෘප්තීන්ගෙන් ප්‍රඥාවෙන් වන්නාවූ තෘප්තිය ශ්‍රෙෂ්ඨවේ. හෙතෙම කාමයන්ගෙන් නොතැවේ. ප්‍රඥාවෙන් තෘප්තියට පැමිණි පුරුෂයා තෘෂ්ණාතොමෝ වසඟ නොකෙරේ.

8 "අල්පෙච්ඡවූවහුගේ කාමයන් ලොල් නොවූයේ නසන්නේමය. මහත්වූ ප්‍රඥාවෙන් යුක්ත බැවින් සමුද්‍රය පමණවූ ඒ පුරුෂතෙම කාමයන්ගෙන් නොතැවේ

9 "සම කපා හරිමින් වහනක් කරන්නාවූ සම්කරුවෙකු මෙන් කාමයන්ගේ යම් යම් කොටසක් හරනේද, ඒ ඒ කොටස් සැපයට පමුණුවන්නේය ඉදින් සියලු සැපය කැමැත්තේ නම් සියලු කාමයන් හරනේය

10 නුඹ වහන්සේ විසින් ගාථා අටක් කියන ලදහ. සියලු ගාථාවෝ දහස බැගින් අගනාහු වෙත්. පූජ්‍යවූ බ්‍රාහ්මණය,

එබැවින් මේ අටදහස පිළිගණු මැනවි. ඔබගේ මේ භාෂිතය යහපතැයි කීයේය.

11 "මට දහසකින්ද සියයකින්ද දසදහසකින්ද ප්‍රයෝජනයෙක් නැත. පශ්චිමවූ ගාථාව කියන්නාවූ මාගේ සිත වස්තුකාමයෙහි නොඇලුනේය.

12 "ඒකාන්තයෙන් සියලු ලෝකය දත්තාවූ මුනිවූ පණ්ඩිතවූ යමෙක්තෙම සියලු දුක් උපදවන්නාවූ මේ තෘෂ්ණාව පිරිසිඳ දනීද, ඒ මේ මානවකතෙම යහපත් වන්නේය."

**468 ජනසන්ධ ජාතකය**:- 1 "යම්බඳු කරුණු පළමු කොටම නොකොට වාසය කළ යමෙක් වේද හෙතෙම පසුව තැවේද, එබඳුවූ මේ කරුණු දශයක් ඒකාන්තයෙන් වෙත්යයි ජන සන්ධනම් රජතෙම මෙසේ කීයේය.

2 "පළමු තරුණ කාලයෙහි රැස් නොරකණ ලද වස්තුව මහළු කල්හි නොලැබ පළමු ධනය නොසෙව්වෙමියි පසුව තැවේ හෙවත් නොකෙරේ.

3 "පෙර ළදරු කාලයෙහි ගුරුවරුන් ඇසුරුකොට ඉගෙණගන්ට හැකිවූම ශිල්පය මා විසින් නූගන්නාලදී. නූගත් ශිල්ප ඇත්තහුගේ දුක්වූ ජීවිකා වෘත්තිය වන්නීයයි පසුව ශොක කෙරෙයි.

4 "පෙර තරුණ කල්හි තරාදියෙන් කරණ වංචා මැණීම් වලින් කරණ වංචා ආදිය දැන එයින් ලොව රවටන්නෙක්වීමි. කේලාම් කියන්නෙක්ද අල්ලස් ගෙණ අහිමියන් හිමියන් කරන්නෙක්ද චණ්ඩවූවෙක්ද පරුෂවූවෙක්ද වීමි. මෙසේ පසුව තැවෙන්නේය.

5 "පෙර ප්‍රාණ ඝාත කරන්නෙක් වූවෙමි. අනායයීවූ රෞද්‍ර ක්‍රියා ඇත්තෙක්ද වීමි සත්වයන්ට කරුණාවෙන් යටත් පැවතුම් ඇත්තෙක්ද නොවූයෙමි. මෙසේ පසුව තැවෙන්නේය.

6 "ඒකාන්තයෙන් අන්‍යයන් විසින් පරිග්‍රහ නොකරණ ලද බොහෝ ස්ත්‍රීන් කෙරෙහි පරදාර සේවනය කෙළෙමියි පසුව තැවෙන්නේය.

7 "ඒකාන්තයෙන් එළඹ සිටියාවූ බොහෝ ආහාර පානය ඇති කල්හි පෙර දානයක් නුදුන්නෙමියි කියා පසුව තැවෙන්නේය.

8 ජරාවෙන් දිරුවාවූ ඉක්ම ගියාවූ යොවුන් වයස් ඇති මව හෝ පියා හෝ පොහොසත්වූයේ පෝෂණය නොකෙළෙමියි මෙසේ පසු කල්හි තැවෙන්නේය.

9 "අවවාද අනුශාසනා කරන්නවූ ආචාවූ සියලු කැමති රස ගෙණවුත් පොෂ්‍ය කරන්නාවූ පියාණන් ඉක්මවා සිතුයෙමියි. මෙසේ පසුකල්හි තැවෙන්නේය.

10 "සිල්වත්වූ බොහෝ උගත් දැහැමි මහණ බමුණන්ද පෙර තරුණ කල්හි ආශ්‍රය නොකෙළෙමියි මෙසේ පසුව තැවෙන්නේය.

11 සත්පුරුෂයෙක් තෙම පයිරුපාසණය නොකරණ ලද දැහැමි තපසක් රැස්කරණ ලද්දේ යහපත්වේ. පෙර තපසක් රැස්නොකරණ ලද්දේයයි මෙසේ පසුව තැවෙන්නේය.

12 යමෙක්තෙම මේ කරුණු දසය නුවණින් පිළිපදීද, පුරුෂ වීයර්‍ය කරන්නාවූ හෙතෙම පසුව මෙලෝ පරලෝ දෙක්හි නොතැවෙන්නේය."

**469 මහාකණ්හ ජාතකය**:- 1 "ප්‍රාඥය, ඉතා කළුවූ භයානකවූ රශ්මීමත් දළ ඇති රැහැන් පසකින් බඳනාලද තොපගේ මේ බල්ලා කුමක් කෙරේද?

2 "උසීරථ නම් මහරජ, මේ ශුනඛතෙම මෘගයන් කෑමට ආයෙක් නොවන්නේය. මිනිසුන් විනාශ කරන්නෙක්ව ආයේය. යම් කලෙක මිනිසුන් විනාශ කෙරෙද්ද, එකල්හි මේ කළු බල්ලා මා අතින් මිදෙන්නේය.

3 "පාත්‍රයක් ගත් අත් ඇති හිසමුඩු කළාවූ සඟල සිවුරු පෙරවියාවූ ශ්‍රමණ ප්‍රතිරූපකයෝ වෙද්ද, ඔහු නගුල් වලින් සීසාන්නාහු වෙද්ද, (මොව්හු සතුරෝ වෙත්.) යම් කලෙක මොවුන් මරා මස් කන්ට ලබත්ද, එකල්හි මේ කළු බල්ලා මා අතින් මිදෙන්නේය.

4 "පැවිදිවූ හිස මුඩුකළාවූ සඟල සිවුරු පෙරෙව්වාවූ භික්ෂුණීහු වෙද්ද, යම් කලෙක්හි ලෝකයෙහි ගිහි පස්කම් සැප සේවනය කරමින් හැසිරෙන්නාහුද, ඒ දුශ්ශීල භික්ෂූණීහු මට සතුරුවූවාහුය. යම් කලෙක මොවුන් මරා කන්ට ලැබේද එකල්හි මේ කළු බල්ලා (මා අතින් මිදෙන්නේය.)

5 "වැඩුනාවූ උඩුරැවුල් ඇති ජටාධරවූ මළ බැඳුනු දත් ඇති රජසින් ගැවැසීගත් හිස් ඇති තාපසයෝ වෙද්ද, ඔව්හු භික්ෂු චයර්‍යාවෙන් ධනය රැස්කොට ණය පොලීකර දිවි පවත්වන්නාහුද, (ඒ දුශ්ශීල තවුසෝ මට සතුරුවෙත්.) යම් කලෙක මොවුන් මරාකන්ට ලැබේද (එකල්හි මේ කළු බල්ලා මිදෙන්නේය.")

6 "යම් බ්‍රාහ්මණ කෙනෙක් සාවිත්තිනම් වේද ශාස්ත්‍රයද යාග විධායක තන්ත්‍රයද හදාරා බැල පිණිස යාග කරන්නාහුද, (ඒ පව්ටු බමුණෝ මට සතුරුවෙත්) යම් කලෙක මොවුන් මරාකන්ට ලැබේද, එකල්හි මේ කළු බල්ලා මා අතින් මිදෙන්නේය.

7 "ජරාවෙන් ජීර්ණවූ ඉක්මගියාවූ යොවුන් වයස් ඇති මවද පියාද පොහොසත්වූවාහු යම් කෙනෙක් පොෂ්‍ය නොකෙරෙද්ද, (ඔව්හු මට සතුරුවෙත්.) යම් කලෙක මොවුන් මරාකන්ට ලැබේද (එකල්හි මේ කළු බල්ලා බැම්මෙන් මිදෙන්නේය.)

8 "ජරාවෙන් ජීර්ණවූ ඉක්මගියාවූ යොවුන් වයස් ඇති මව්පිය දෙදෙනාටද තෙපි අඥානයෝයයි යමෙක් කියන්නාහුද, (ඔව්හු මට සතුරුවෙත්) යම්කලෙක මොවුන් මරා කන්ට ලැබේද, එකල්හි මේ කළු බල්ලා මිදෙන්නේය.

9 "යම් කලෙක්හි ලෝකයෙහි ආචාර්‍ය්‍ය භාර්‍ය්‍යාවද යහළුවන්ගේ භාර්‍ය්‍යාවද මයිලනුවන්ගේ භාර්‍ය්‍යාවද නැන්දනියද යන මොවුන් කෙරෙහි (ලෝක ධර්ම වශයෙන් වරදවා) පිළිපදිද්ද, ඔව්හු මට සතුරුවෙත්. යම් කලෙක මොවුන් මරා කන්ට ලැබේද, එකල්හි මේ කළු බල්ලා මිදෙන්නේය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

10 "යම් බමුණු කෙනෙක් කඩුපලිහ ගෙණ කඩුවක් ඔසවාගෙණ මං පැහැරීම කරන්නාහුද, (ඔව්හු මට සතුරුවෙත්.) යම් කලෙක මොවුන් මරා මස් කන්ට ලැබේද එකල්හි මේ කළු බල්ලා මිදෙන්නේය.

11 "කසා සුණු ආදිය ගෑමෙන් මෘදුවූ ෂවිවර්ණ ඇති ධන ධාන්‍යාදීන් සමෘද්ධ වැන්දඹුවන් හා සමග හැසිරෙන්නාවූ මහත්වූ බාහු ඇති ධන ඉපදවීමෙන් තොරවූ ස්ත්‍රී ධූර්තයෝ යම් කලෙක ඔවුන් හා මිත්‍රභෙදය කෙරෙද්ද, ඔව්හු මට සතුරුවෙත්. යම් කලෙක මොවුන් මරා කන්ට ලැබේද, එකල්හි කළු බල්ලා මිදෙන්නේය.

12 "ලොව මුළාකරණ මායා ඇත්තාවූ වඤ්චනිකවූ අසත් පුරුෂ සිතිවිලි සිතන්නාවූ දුර්ජනයෝ යම් කලෙක්හි ලෝකයෙහි වන්නාහුද, ඔව්හු මට සතුරුවෙත්. (යම් කලෙක මොවුන් මරාකන්ට ලැබේද) එකල්හි මේ කළු බල්ලා මේ පස් රැහැන් බැම්මෙන් මිදෙන්නේයයි කීයේය."

**470 මහා පදුම ජාතකයː-** 1 "අන්‍යයාගේ සියලු ලොකු කුඩා වරද නොදැක තෙමේ කල්පනා නොකොට අධිපතිතෙම දඬුවම නොපනවන්නේය.

2 "යම් ක්ෂත්‍රියයෙක් තෙම කල්පනා නොකොට යමෙකුට දඬුවම් කෙරේද, හෙතෙම කටුසහිත භෝජනය ගිලින්නේ නම්වේ. ජාත්‍යන්ධයෙකුමෙන් මැස්සන් සහිත භෝජනය අනුභව කරන්නේ නම් වේ.

3 "යමෙක් තෙම දඬුවම් නොකටයුත්තාට දඬුවම් කෙරේද, දඬුවම් කටයුත්තාට දඬුවම් නොකෙරේද, හෙතෙම විෂමවූ මාර්ගයට පැමිණි අන්ධයෙකු මෙන් සම නොසම දෙක නොදනියි

4 "යමෙක් තෙම මේ කරුණු දැන ලොකු කුඩා සියලු වරද මනාකොට දැක අනුශාසනාකරන්නේද, ඒ රජතෙම රාජ්‍යානුශාසනා කරන්ට සුදුසුවේ.

5 "ඒකාන්ත මෘදු භාවයෙන්ද ඒකාන්ත තියුණු භාවයෙන්ද තමා මහත් බැව්හි තබවන්ට නොහැක්කේය. එහෙයින් කායාදී ව්‍යපසමයෙහි හැසිරෙන්නේය.

6 "යම් රජෙක් වැසියන් විසින් මඩනලද්දේ මෘදු සිත් ඇත්තේවේද, නොඉවසන සුළුවූයේ වෛරීන් ඇත්තේ වේද, එහෙයින් මේ කාරණා දෙක දැන මෘදු තියුණු භාවයන්ට මැදහත්ව හැසිරෙන්නේය.

7 "රාගයෙන් රත්වූ තැනැත්තේ බොහෝවූද කරුණු කියන්නේය. ද්වෙෂයෙන් දුෂ්ටවූ තැනැත්තේද බොහෝ කියන්නේය. මහරජ, ස්ත්‍රිය කරණකොට ගෙණ පුත්‍රයා නසන්ට සුදුසු නොවේ.

8 "සියලු ලෝවැසිතෙම එක් පක්ෂයක් වූයේය. මේ ස්ත්‍රීතොමෝ තනිවූවාය. එහෙයින් මම මැගේ වචනය පිළිපදින්නෙමි. යව් ඔහු ප්‍රපාතයෙහි බහාලව්යයි කීයේය.

9 "නොයෙක් තල්ගස් පමණ ඇති ගැඹුරුවූ එතරවන්ට ඉතා දුෂ්කරවූ නරකයක් වැනිවූ පර්වත දුර්ගයෙහි හෙළනලද නුඹ වහන්සේ කුමකින් නොමළේද,

10 "ඒ ප්‍රපාතයේ හටගත් බල ඇති ශක්තිමත්වූ පර්වත සමප්‍රදෙශයෙහි උපන්නාවූ නාගතෙම මා භොගයෙන් පිළිගත්තේය. එහෙයින් මම එහි නොමළෙමි.

11 'රාජපුත්‍රය, එව, නුඹ ස්වකීය ගෘහයට ගෙණ යන්නෙමි. පින්වත, රාජ්‍යය කරව, වනයෙහි කුමක් කරන්නෙහිද,

12 "යම්සේ බිළියක් ගිල ලේ සහිතව උදුරන්නේද, වමාරා දමා සුවපත් වන්නේද, එසේ සුවපත්වූ ආත්මය දකිමි.

13 "නුඹ කුමක් බිලියයයි කීයෙහිද, නුඹ ලේ සහිතයයි කුමක් කීයෙහිද, නුඹ කුමක් උදුරණ ලදයයි කීයෙහිද, විචාරණලද මට කියව,

14 "මම කාමයෝ බිලිය යයි කියමි. ලේ සහිතයයි හස්ති අශ්වයන් කියමි. මම හැරදමනලද්ද උදුරණ ලද්දයයි කියමි. ක්ෂත්‍රියය, මෙසේ දැන ගණුව.

15 "මච්තොමෝ චිඤ්ච මානවිකාවූවාය. මාගේ පිය රජතෙම දෙවදත්තවූයේය. නුවනැත්තාවූ නාගතෙම ආනන්ද නම් වීය. දිව්‍ය පුත්‍රතෙම සාරීපුත්‍ර නම්විය රාජපුත්‍රතෙම මමවීමි. මෙසේ ජාතකය දරාගණිව්."

**471 මිත්තාමිත්ත ජාතකයඃ-** 1 "කවර කර්මයන් කරන්නාවූ නුවණැත්තාවූ පණ්ඩිතතෙම දැකද අසාද සතුරා යම්සේ දැනගන්නේද, එපරිද්දෙන් නුවණැත්තේ කෙසේ උත්සාහ කරන්නේද,

2 "ඒ මිත්‍ර ප්‍රතිරූපකයා දැක සිනාවක් නොකෙරේ. ඔහුට සතුටුනොවේ. ඔහුට ඇස් දල්වා බැල්මක් නොදේ. ඔහුගේ කථාවට විරුද්ධවද සිටියි.

3 "ඒ මිත්‍ර ප්‍රතිරූපකයාගේ සතුරන් සේවනය කෙරේ. ඔහුගේ මිතුරන් සේවනය නොකෙරේ. ගුණ කියනු කැමැත්තන් වළක්වයි. ආක්‍රොෂ කරන්නවුන්ට ප්‍රශංසා කෙරෙයි.

4 "ඔහුට සැඟවියයුත්ත නොකියයි. ඔහුගේ සැඟවිය යුත්ත නොසඟවයි. ඔහුගේ කර්මාන්තය වර්ණනා නොකරයි. ඔහුගේ ප්‍රඥාවට ප්‍රශංසා නොකරයි.

5 "ඔහුගේ අනභිවෘද්ධියෙහි සතුටුවෙයි. ඔහුගේ අභිවෘද්ධියෙහි නොසතුටුවෙයි. ආශ්චර්‍ය්‍යවූ භෝජනයක් ලැබ ඔහු ගැන සිහියක් නූපදියි. එයින් ඔහුට අනුකම්පා නොකෙරෙයි. නොසතුටෙක්ද මෙයින් ලබන්නේය.

6 "මෙසේ පණ්ඩිත තෙම යමකින් සතුරා දැකද අසාද දැනගන්නේද, මේ සොළොස් ආකාරයෝ සතුරා කෙරෙහි පිහිටියාහුය.

7 "කවර කර්මයන් කරන්නහු දැකද අසාද නුවණැති පණ්ඩිතතෙම මිත්‍රයා දැනගන්නේද, නුවණැත්තේ කෙසේ උත්සාහ කරන්නේද,

8 "ඔහුගේ නොරට ගියාවූ මිත්‍රයා සිහි කරයි. ආවහු දැක සතුටුවෙයි. ඉක්බිති මමත්වය කරන්නේවෙයි. වචනයෙන් සතුටු වන්නේය.

9 "ඔහුගේ මිත්‍රයන්ම සේවනය කෙරේ. ඔහුගේ සතුරන් සේවනය නොකෙරේ. ආක්‍රොෂ කරන්නවුන් වලක්වයි. ගුණ කියනු කැමැත්තවුන්ට ප්‍රශංසාකරයි.

10. ඔහුට සැඟවිය යුත්තද කියයි. ඔහුගේ සැඟවිය යුත්තාද සඟවයි ඔහුගේ කර්මාන්තද වර්ණනා කරයි. ඔහුගේ ප්‍රඥාවටද පසසයි.

11 "ඔහුගේ අභිවෘද්ධියෙහි සතුටුවෙයි. ඔහුගේ අනභිවෘද්ධියෙහි නොසතුටුවෙයි. ආශ්චර්‍ය්‍යවූ භෝජනයක් ලැබ ඔහුට දෙන්නෙමියි සිහිය උපදියි. එයින් ඔහුට අනුකම්පා කෙරෙයි. සතුටක්ද මෙයින් ලබන්නේය.

12 "මෙසේ පණ්ඩිත තෙම යමකින් මිත්‍රයා දැකද අසාද මනාව දැන ගන්නේද, මේ සොළොස් ආකාරයෝ මිතුරා කෙරෙහි පිහිටියාහුය."

---

## 13 තෙරස නිපාතය

**472 අම්බ ජාතකයः-** 1 "බ්‍රහ්මචාරිය, මට පෙර කුඩාවූද මහත්වූද අඹගෙඩි ගෙණාවෙහිය. බ්‍රාහ්මණය, තොපගේ ඒ මන්ත්‍රවලින්ම දැන් දෑම ඵලයෝ හෙවත් අඹගෙඩි පහළ නොවෙත්.

2 "නැකැත් යෝගය ගරුකරමි. ක්ෂණයද මොහොතද මා සතුටු නොකෙරෙත්. නැකැත් යෝගයද මුහුර්තයද ලැබ ගෙණ නැවත බොහෝවූ අඹගෙඩි ගෙනෙන්නෙමියි. කීයේය.

3 "පූර්වයෙහි නැකැත් යෝගයක් නොකීයේය. පෙර ක්ෂණයක් මුහුර්තයක් ලැබියයුතු බව නොකීයේය. තෙමේ වර්ණයෙන් සුවඳින්ද රසයෙන්ද යුක්තවූ අඹඵල ගෙණායේය.

4 "බ්‍රාහ්මණය, පළමුකොට මන්ත්‍ර ජපකිරීමෙන් තොපට අඹ ගසෙහි ගෙඩි පහළවූහ. ඒ තෝ අද මන්ත්‍රයන් ජප කරන්නේද, අඹඵල ගන්වන්ට නොහැකිවූයේය. අද තොපගේ ඒ මේ ස්වභාවය තෙම කවරෙක්නම් වේද,

5 "චණ්ඩාල පුත්‍රයෙක්තෙම මට මන්ත්‍රයන් දැහැමින් දුන්නේය. විචාරණ ලද්දේ මාගේ නාම ගෝත්‍රය නොසඟවව. මන්ත්‍රයතෙම තා නොහරීවායි නොනස්නා කාරණයද කීයේය.

6 "ඒ මම මහරජහු විසින් ජනයා මැද අසනලද්දේ ගුණමකු බැවින් මඩනාලද්දේ බොරුව කීයෙමි. මේ මන්ත්‍රයෝ බ්‍රාහ්මණයෙකුගේයයි කීම බොරු බසකි. එහෙයින් දැන් ප්‍රහීණවූ මන්ත්‍ර ඇත්තේ, බැගෑපත්ව හඬමි.

7 "මී කැමති තැනැත්තේ එරඬුගස හෝ කොසොඹ ගස හෝ නොහොත් එරබදු ගස් හෝ බැඳි මීයක් ලබන්නේද ඔහුට ඒ ගස වනාහි උතුම් ගසවේ.

8 "ක්ෂත්‍රියයෝද බ්‍රාහ්මණයෝද වෛශ්‍යයෝද ශූද්‍රයෝද චණ්ඩාල පුක්කුසයෝද යන යමෙකු කෙරෙන් ධර්මයක් දැන ගන්නේද, හෙතෙම වනාහි ඔහුට නරොත්තම නම් වේ.

9 "යමෙක්තෙම දුකින් ලබන ලද උතුම්වූ අර්ථය අධික මානයෙන් නැසුයේද, මොහුට දඬුවම්ද වධයද දී මේ හීනයා බොටුව අල්වාගෙණ පිටතට ඇද දමව්

10 "යම්සේ ආවාටයක ගුහාවට ප්‍රපාතයෙක නරා වළෙක යන විෂම තැන් සමයයි සිතන්නේ වැටෙන්නේද, වැළක යන සංඥාවෙන් කෘෂ්ණ සර්පයෙකු ආක්‍රමණය කරන්නේද, අන්ධයෙක්තෙම යම්සේ ගිනි මඩින්නේද, සප්‍රාඥය, එපරිද්දෙන්ම වරදකළාවූ මා නුඹවහන්සේ දැන ප්‍රහීණවූ මන්ත්‍ර ඇති මට නැවත මන්ත්‍රය දුනමැනවයි යාඥාකෙළේය.

11 "දැහැමින් තට මන්ත්‍රය දුනිමි. තෝද දැහැමින් පිළිගත්තෙහිය. සතුටු සිත් ඇත්තේ ස්වභාවයද තට කීයෙමි. ධර්මයෙහි සිටියහු නම් තා මන්ත්‍රයතෙම නොහරින්නේය.

12 "යමක් අද මනුෂ්‍ය ලෝකයෙහි දුර්ලභද එබඳුවූ දුකසේ ලබන ලද බලවත්වූ මන්ත්‍රයද දුකසේ ලබන ලද ජීවිකාවෘත්තියද නුවණ මදවූ යමෙක්තෙම බොරු කියමින් විනාශ කෙළේද,

13 "මූඪවූ කෙළෙහිගුණ නොදන්නාවූ බොරු කියන්නාවූ සංයමයක් නැත්තාවූ අඥානවූ තට අපි එබඳු මන්ත්‍ර නොදෙමු. මන්ත්‍රයෝ කොයින්ද, මට තා නුරුස්නේය. යවයි කීයේය."

473 එන්දන ජාතකය:- 1 "පොරාවක් ගත් අත් ඇති පුරුෂයෙක්වූ තෝ කුමට වනයට වැද සිටිනෙහිද, යහළුව මා විසින් විචාරණ ලද්දේ කියව. කිනම් දැවයක් කපන්ට කැමැත්තෙහිද,

2 "වලසෙක්වූ තෝ සමවූද විෂමවූද වනයන්හි හැසිරෙන්නෙහිය. යහළුව, මා විසින් විචාරණ ලද්දේ කවරනම් දැවයක් නිම්වළල්ලට සවිශක්ති ඇත්තේදැයි කියව.

3 "සල්ගසද නිම්වළල්ලට සුදුසු නොවේ. කිහිරි වෘක්ෂයද සුදුසු නොවේ. අශ්වකර්ණ වෘක්ෂයද සුදුසු නොවේ. දැව ගස කොයින් සුදුසු වේද, කෝන්නම්වූ වෘක්ෂය තෙමේම ඒ දැවමය නිම්වළල්ලට දෘඪවන්නේය.

4 "මේ කෝන්ගසේ පත්‍ර කෙබඳු වෙද්ද, කඳ හෝ කෙබඳුවේද, යහළුව, මා විසින් අසන ලද්දේ යම්සේ කෝන්ගස දැනගන්නෙමුද, එසේ කියව.

5 "යම් ගසක්හුගේ අතු එල්ලෙත්ද නැමෙන්නාහු වෙද්ද, නොබිඳෙත්ද, යම් ගසක්හුගේ මුල මම සිටියෙම්ද, ඒ ගසතෙම එන්දන හෙවත් කෝන් නම්වේ.

6 "තොපගේ රථයෙහි දැව්වලටද රෝදයට හා බොස් ගෙඩියටද රථ හිසටද නිම්වළල්ලටද රියමැදුරටද යන සියල්ලට මේ කෝන්ගස සුදුසු වන්නේය.

7 "මෙසේ (කීකල්හි) කෝන්ගසද හෙවත් එහි අධිගෘහිත දේවතාවාද එකෙනෙහි මෙසේ කීයේය. භාරද්වාජය, මාගේද වචනයක් ඇත. මාගේ ඒ වචනයද අසව.

8 "වලසාගේ කඳ සමීපයෙන් සතරඟුලක් කපාගෙණ එයින් හෙවත් ඒ වලස් සමින් නිම්වළල්ල සවිකර ගණුව. මෙසේ කළ කල්හි අතිශයින් ශක්තිමත් වන්නේය.

9 මෙසේ කෝන්ගසද එකෙණෙහි වෛරය මුදුන් පැමිණවීය. උපන්නාවූද නූපන්නාවූද වලසුන්ට දුක් එලවූයේය.

10 "මෙපරිද්දෙන් කෝන්ගස වලසාටද වලස්තෙමේ කෝන්ගසටද යන ඔවුනොවුන්ට විරුද්ධව වාදකිරීමෙන් ඔවුනොවුන් නැසූහ.

11 "එපරිද්දෙන්ම මිනිසුන්ගේ විවාදයෙක් යම් තැනෙක උපදීද, එහි මොනරුන්ගේ නැටීමෙන් නටත්නාහු වෙත්. කෙසේද, ඒ වලසා හා කොළොම් ගසය යන දෙදෙන යම්සේද එමෙනි.,

12 "එහෙයින් තොපට කියමි. තොපට යහපතක් වේවා යම්තාක් මෙහි රැස්වූවාහුද, ඒ සියල්ලෝ වලසා හා කෝන්ගස මෙන් නොවව්. සතුටුවව්, වාද නොකරව්.

13 "සමගි බැව්හිම හික්මෙව්. මෙය බුදුවරයන් විසින් පසස්නා ලදී. සමගි බැව්හි ඇළුනාවූ සුචරිත ධර්මයෙහි පිහිටි තැනැත්තේ නිර්වාණ සැපයෙන් නොපිරිහෙන්නේයයි" වදාළසේක.

**475 ජවනහංස ජාතකයඃ-** 1 "හංසරාජය මේ රන් පුටුවෙහිම හිඳුව. මට තොපගේ දැක්ම ප්‍රියවේ. අධිපතිවූ නුඹ මෙහි පැමිණියෙහිය. මෙහි ඔබ කැමති යමක් ඇත්තේද එය කියව.

2 "ගුණ ඇසීමෙන් එකෙකුට සමහරු ප්‍රියවෙත්. සමහරෙක් දැක සමහරෙකුගේ ප්‍රේමය දුරුවේ. දැකද අසාද සමහරු ප්‍රිය වෙත්. එහෙයින් විචාරමි. කිම මාගේ දර්ශනයෙන් ප්‍රිය වෙහිද?

3 "මට ඇසීමෙන් නුඹ ප්‍රියවූයෙහිය, දර්ශනයට පැමිණ වඩාත් ප්‍රියවූයෙහිය. මෙසේ ප්‍රිය දර්ශන ඇතිවූයේම හංසරාජය, මාගේ සමීපයෙහි වාසය කරව.

4 "නිතර සත්කාර කරණලද්දාහු පුදන ලද්දාහු නුඹ වහන්සේගේ රජගෙදර වසන්නෙමු නම් එක් දවසෙක සුරාවෙන් මත්වූයේම මට මස් පිණිස හංසරාජයා පිසත්වයි කියන්නේය.

5 "යමක් මට නුඹවහන්සේට වඩා ඉතා ප්‍රියද, ඒ ආහාර පානයට නින්දාවේවා. යම්තාක් කල් මාගේ ගෘහයෙහි නුඹවහන්සේ හිඳිනෙහිද, ඒතාක්කල් මද්‍යපානයක් පානය නොකරන්නෙමියි කීයේය.

6 "සිවලුන්ගේද පක්ෂීන්ගේද වචනය මනාකොට දත හැකිවේ. මහරජ්ජුරුවෙනි, මිනිසුන්ගේ වචනය ඊට වඩා දැනගන්ට ඉතා දුස්කර වන්නේය.

7 "ඉදින් යම් පුරුෂයෙක් තෙම ඤාතිමිත්‍රයෙක, යහළුවෙකැයි සිතයිද, හෙතෙම පෙර සතුටු සිත් ඇතිව පසුව සතුරෙක් වන්නේය.

8 "යමෙකු කෙරෙහි සිත ඇතුළත්ව පවතීද, හෙතෙම නුදුරෙහි වේ. සමග වාසය කරන්නේදවේ. යමෙකු කෙරෙන් සිත පහවයේද, හෙතෙම සමීපයෙහි වාසය කරන්නේ නමුත් දුරෙහි වේ.

9 "ප්‍රසන්නවූ සිත් ඇත්තේ මුහුද එතෙර වසන්නේද, ප්‍රසන්න සිත් ඇති හෙතෙම ඇතුළත වාසය කරන්නෙක් වන්නේය. ප්‍රදූෂ්‍යවූ සිත් ඇත්තේ ඇතුළත වාසය කරන්නේ වේද, ප්‍රදූෂ්‍යවූ සිත් ඇති හෙතෙම මුහුද එතෙර වාසය කරන්නෙක් වන්නේය.

10 "මහරජ, යමෙක් තුමූ සතුරු වෙද්ද, ඔහු තුමූ එක්ව වාසය කරන්නාහුද වෙන්ව වාසය කරන්නාහු නම් වෙත්. රට්ඨවඩ්ඪන නම්වූ මහරජ, මෛත්‍රී සිතින් යුක්තව දුර වසන්නාවූද මිත්‍රයෝ සමගිව වාසය කෙරෙත්.

11 ඉතා බොහෝ කලක් එකතැන වාසයකිරීමෙන් ප්‍රිය තැනැත්තේ අප්‍රියවේ. එහෙයින් නුඹවහන්සේට අප්‍රියවෙමුද ඉන් පෙර ඔබට කියා සමුගෙණ යන්නෙමු.

12 "ඉදින් මෙසේ ඇඳිළි බැඳගෙණ යාඥා කරන්නාවූ අපගේ යාඥාව නොපිළිගන්නේ නම් ආශ්‍රය කරන්නාවූ ජනයන්ගේ වචනය නොකරන්නෙහි නම් මෙසේ ඔබට නැවත යාඥා කරමු. නැවත මේ පරියාය හෙවත් යාම ඊම කරවයි කීයේය.

13 "රට වර්ධනය කරන්නාවූ මහරජ, ඉදින් මෙසේ වාසය කරන්නාවූ තොපගේද මාගේද ජීවිතන්තරායෙක් යම්තාක් නොවන්නේ නම් ඒතාක් රාත්‍රි දිනයන්ගේ ඇවෑමෙහි ඔවුනොවුන් දක්නෙමු නම් ඉතා මැනවයි කීයේය"

**476 චූලනාරද ජාතකයඃ-** 1 "තාවිසින් දර නොබිඳින ලදහ. තා විසින් වතුර නොගෙණෙන ලද්දේය තා විසින් ගිනි නොදල්වන ලදී. කුමක්හෙයින් බාලයෙකුමෙන් සිතමින් ඉන්නෙහිද?

2 කාශ්‍යපයන් වහන්ස, නුඹ වහන්සේට කියා අවසර ගණිමි. වනයෙහි වාසය කරන්ට නොහැක්කෙමි. වනයෙහි වාසය දුක්වේ. රටට යන්ට කැමැත්තෙමි.

3 උතුම්වූ පියාණෙනි, මම මේ වනයෙන් ගොස් යම් ජනපදයෙක්හි වසන්නේ යම් බඳු ජනපද චාරිත්‍රයක හික්මෙන්නෙම්ද? ඒ ආචාර ධර්මය මට අනුශාසනා කරණු මැනව.

4 ඉදින් වනයද වනමුල් පලා පලයන්ද හැරදමා රටෙහි වාසය කැමැත්තෙහි නම් මා කියන ඒ චාරිත්‍ර ධර්මය අසව.

5 විෂය සේවනය නොකරව, ප්‍රපාතය දුරු කරව, මඩෙහිද නොගැලෙව, සර්පයා කෙරෙහි උත්සාහවත්වම හැසිරෙව.

6 බ්‍රහ්මචාරීන්ට කුමක් විෂය හෝ වේද, ප්‍රපාතය හෝ වේද, මඩ හෝ වේද, නුඹ වහන්සේ කුමක් ආශීර්විෂයයි කියන්නේහිද, එය විචාරණ ලද මට කියවයි කීයේය.

7 පුත නාරදය, ලෝකයෙහි සිත් කළුවූ සුවඳ ඇති මනොඥවූ මිහිරිවූ කුඩා මීරසයට බඳුරස ඇති ආසවය තෙම සුරානමැයි කියනු ලැබේ. එය ආර්‍ය්‍යයෝ බ්‍රහ්මචර්‍ය්‍යාවට විෂයයි කියත්.

8 දරුව, නාරදය, ලෝකයෙහි ස්ත්‍රීහු ප්‍රමාදවූවහු ආලෝලනය කෙරෙත්. ඒ ස්ත්‍රීහු සුලඟින් ගිලිහී වැටුනු පුළුන් රොදක් මෙන් තපස්වීහුගේ සිත හැර ගණිත්. මෙතෙම බ්‍රහ්මචර්‍ය්‍යාවට ප්‍රපාතයයි කියන ලදී.

9 නාරදය, ලාභයද ගුණ කීර්තියද සත්කාරයද අන් කුලයන්හි පූජාවද යන මෙතෙම බ්‍රහ්මචර්‍ය්‍යාවට ගැලෙන අර්ථයෙන් මඩයයි කියන ලදී.

10 දරුව, මහත්වූ තේජස් ඇති රජ දරුවෝ මේ පොළොවට අධිපතිව වාසය කෙරෙත්, එබඳුවූ ඓශ්වර්‍ය්‍යාදියෙන් මහත්වූ ඒ රජුන්ද නාරදය (කුළුපගව සේවනය නොකරව.)

11 ඉසුරුමත්වූ අධිපතිවූ ඒ රජුන්ගේ සමීපයෙහි නොහැසිරෙන්නේය නාරදයෙනි මෙතෙම බ්‍රහ්මචර්‍ය්‍යාවට ආශීර්විෂයයි කියන ලදී.

12 අනුභව කරණ කාලයෙහි ආහාර කැමැත්තේ යම් ගෙයකට පැමිණෙන්නේද, යම්බඳුවූ මේ කුලයෙහි නිරවද්‍ය භාවය දැන ගණුව, ඒ නිවැරැදිවූ ගෘහයෙහි ආහාර සෙවීමෙහි හැසිරෙන්නේය.

13 පානය කිරීම පිණිස හෝ අනුභව කිරීම පිණිස හෝ අන්කුලයකට ප්‍රවිෂ්ටව පමණ දැන කන්නේය. පමණ දැන අනුභව කරන්නේය. ස්ත්‍රී රූපයෙහි සිත යොමු නො කරන්නේය.

14 ගවගාලද පානාගාරයද ධූර්තයන් ඇති ස්ථානයද සභාවන්ද හිරණ්‍ය ස්වර්ණාදිය විසුරුවන තැනද යන මේ අගෝචර ස්ථාන විෂම මාර්ගය අත්හැර යන්නාවූ තෙල් බඳුන් ආදිය ගෙණයන යානාවක් මෙන් දුරින්ම දුරු කරවයිද කීයේය."

477 දූත ජාතකයඃ- 1 "බ්‍රාහ්මණය, ගංඉවුරෙහි සිතමින් හිඳිනාවූ ඔබ සමීපයට දූතයන් එව්වෙමි. ඔවුන් විචාරණ ලද්දේ තොපගේ දුක්වූ සැඟවුනු අදහස් ප්‍රකාශ නොකෙළෙහිය (කිම, අනිකෙකුට නොකිය යුතුදැයි විචාළේය.)

2 කශීරට වාසීන්ගේ රට වර්ධනය කරන්නාවූ මහරජුනි ඉදින් ඔබවහන්සේට දුකක් උපන්නේද, යමෙක් තෙම ඒ දුක නොමුදන්නේද, ඔහුට එය නොකියව.

3 යමෙක්තෙම හටගත් දුක් ඇති ඔහුගේ ඒ දුක කොටස් වශයෙන් එක් කොටස කුදු දැහැමින් මුදන්නේද, ඒකාන්තයෙන් ඔහුට එය කියව.

4 සිවලුන්ගේද පක්ෂීන්ගේද වචනය මනාකොට දත හැකිවේ. මහරජ, මිනිසුන්ගේ වචනය ඊටවඩා දැනගන්ට ඉතා දුෂ්කර වන්නේය.

5 ඉදින් යම් පුරුෂයෙක්තෙම ඥාති මිත්‍රතෙමේය. යහළු තෙමේයයි සිතන්නේ නමුත් හෙතෙම පළමු සතුටු සිත් ඇතිව පසුව සතුරෙක් වන්නේය.

6 යම් සත්වයෙක්තෙම තමාගේ දුක නැවත නැවත විචාරණ ලද්දේ නුසුදුසු කල්හි දන්වන්නේද, ඔහුගේ සතුරෝ සතුටු

වන්නාහුවෙත්. ඔහුගේ හිතෛෂිවූ මිත්‍රයෝ හටගත් දුක් ඇත්තෝ වෙත්.

7 සුදුසු කාලයද දැන නුවණැත්තන්ගේ තමන් හා එක්සිත් ඇති බවද දැන එබඳු පුද්ගලයකුට දුක්වූ කාරණය කියන්නේය. ප්‍රාඥතෙම අර්ථවත්වූ මෘදුවූ වචනය මුදන්නේය. හෙවත් කියන්නේය.

8 ඉදින් තමන්ගේ දුක නොඉවසිය හැකිබව දන්නේ නම් (ඔවුන් විසින් මෙසේ සිතිය යුතුය.) ඒ ලෝක ධර්මයෝ වනාහි මට සැප ගෙණදීම පිණිස පවත්නාවූ නො වෙත්. තමන්තුළ ඇත්තාවූ ලජ්ජාභය දෙක අපේක්ෂා කරන්නාවූ ප්‍රාඥතෙම හුදකලාවම තමාගේ තියුණු දුක් ඉවසන්නේය.

9 මහරජ්ජුරුවෙනි, ආචාර්‍යයාට දිය යුතු වස්තුව කැමැතිවූ මම රටෙහි නියම් ගම්වලද රාජධානිවලද සිඟා ඇවිදින්නෙමි.

10 ජනාධිපතිය, ගෘහපතීන්ද රාජ පුරුෂයන්ද මහා සාරවූ බ්‍රාහ්මණයන්ද යාඥාකොට ස්වර්ණය සම්බන්ධ නිෂ්ක සතක් ලැබූයෙමි. මහරජ්ජුරුවෙනි, මාගේ ඒ ස්වර්ණ නිෂ්කයෝ නැතිවූහ. එහෙයින් මම අතිශයින් ශොක කෙරෙමි.

11 මහරජ්ජුරුවෙනි, නුඹ වහන්සේගේ දූත පුරුෂයෝ සිතින් සිතුවාහු නමුත් මා දුකින් මුදන්ට නොපොහොසත් වූහ. එහෙයින් ඔවුන්ට නොකියෙමි.

12 මහරජ්ජුරුවෙනි, නුඹ වහන්සේද වනාහි මාගේ දුක සිතින් සිතන ලද්දේ දුකින් මා මුදන්ට පොහොසත්ය. එහෙයින් නුඹ වහන්සේට දැන්වූයෙමි.

13 කශීරට වැස්සන්ගේ රට වර්ධනය කරන්නාවූ රජ තෙම පහත් සිත් ඇතිව ඔහුට රත්‍රං තුදුස් නිෂ්කයක් දුන්නේය.”

**478 කාලිංගබොධි ජාතකයඃ-** 1 “කාලිංග නම් චක්‍රවර්ති රජතෙම රාජධර්මයෙන් පෘථිවිය අනුශාසනා කරන්නේ මහත් ආනුභාව ඇති ඇත් රජහු පිටින් ශ්‍රී මහබොධි සමීපයට (අහසින්) ගියේය.

2 "කාලිංග භාරද්වාර නම් පුරෝහිත බ්‍රාහ්මණතෙම භූමිභාගය විමසා චක්‍රවර්තිවූ තාපස කුලපුත්‍රවූ කළිඟු රජහට ඇඳිලි බැඳගෙණ මේ වචනය කීයේය.

3 "මහරජ්ජුරුවෙනි, මේ භූමිප්‍රදෙශයතෙම යම්සේ සියලු බුදුවරයන් විසින් වර්ණනා කරණලද්දේද, එහෙයින් ඇතුපිටින් බසිනු මැනව මෙතන්හි අතුල්‍යවූ බුදුවරයෝ සම්‍යක්සම්බෝධියට පැමිණ බබළන්නාහුය.

4 "මේ භූමිභාගයෙහි තෘණ ලතාවෝ දක්ෂිණාවෘත වීමෙන් කරකැවී නැවී සිටිනාහ. ඒ මේ භූමිප්‍රදෙශය පෘථිවියට අලංකාරවූ ස්ථානයක් වූයේය. මහරජ, මෙසේ අප විසින් ලක්ෂණ ශාස්ත්‍රානුසාරයෙන් අසනලදී.

5 "සාගරය අවසන්කොට ඇති සියලු සත්වයන් දරා සිටින්නාවූ මේදිනී නම් මහාපෘථිවියට මේ ස්ථානය අලංකාරයක් වූයේය. එහෙයින් මහරජ, ඇතුපිටින් බැස නමස්කාර කරණු මැනව.

6 "මව්පසින්ද, පිය පසින්ද උපොසථ කුලයෙහි උපන්නාවූ සක්විති රජහට පහළවන රත්නවූ යම් මේ හස්තීහු වෙද්ද, ඒ හස්තීහු මෙතෙක් ප්‍රදෙශයට නොපැමිණෙන්නාහුය.

7 "හස්තිතෙම උපොසථ කුලයෙහි උපන්නේය. උතුම්වූ ඒ ඇතා කැමති පරිද්දෙන් පිටත් කළ මැනව, මෙතෙක් මේ ප්‍රදෙශය තෙම උතුම් ඇතු විසින් එළඹෙන්ට නොහැකි වන්නේය.

8 "කාලිංග චක්‍රවර්ති රජතෙම එය අසා ලක්ෂණ ශාස්ත්‍ර දන්නාවූ බ්‍රාහ්මණයාගේ වචනය පරීක්ෂාකොට අපි මොහුගේ මේ වචනය යම්සේද, එසේ වන්නේදැයි දැනගනිමුයි ඇතු මෙහෙයවී.

9 "රජහු විසින් මෙහෙයවනලද ඒ ඇත්තෙමේද කොස්වා ලිහිණියෙකු මෙන් නාද පවත්වා හෙවත් කුඤ්ච නාදකොට පස්සට හැකිලී මහත්වූ බරක් උසුලන්නට නො හැක්කාක් මෙන් එහිම හුන්නේය.

10 "කාලිංග භාරද්වාජ නම් බ්‍රාහ්මණතෙම ඇතු මළහු යයි දැන කළිඟු රජුට වහා මෙසේ කීය. මහරජ, හස්තිතෙම මළේය. එහෙයින් අන් ඇතෙකුට මාරුවුව මැනවැයි කීයේය.

11 "කළිඟු රජතෙමේ ඒ අසා වහා අන් ඇතෙකුට සංක්‍රමණය විය. රජු අන් ඇතෙකු පිටට මාරුවූ කල්හි මළ ඇත්තෙම එහිම බිම වැටුනේය. ලක්ෂණ ශාස්ත්‍රය දන්නාවූ කාලිංග බ්‍රාහ්මණයාගේ කීම යම්සේද, එසේම ඒ ඇත්තෙම මළේය.

12 "කළිඟු රජතෙමේ කාළිංග භාරද්වාජ නම් බ්‍රාහ්මණයාට මෙය කීයේය. නුඹම සියල්ල දක්නාවූ සියලු දෙය දන්නා සුළුවූ සම්‍යක් සම්බුද්ධ වෙහියයි කීය.

13 "කාළිංග බ්‍රාහ්මණතෙමේ ඒ කීම නොඉවසන්නේ මෙය කීයේය. මහරජ්ජුරුවෙනි, අපි වනාහි ලක්ෂණ ශාස්ත්‍ර දන්නෝ වෙමු. බුදුවරයෝම සියල්ල දත්තාහුවෙත්.

14 "සර්වඥතාඥානයෙන් සියල්ල දන්නාවූ බුදුවරයෝ වනාහි ලක්ෂණ ශාස්ත්‍රයන් නොදනිත්. දැනගත් ශිල්ප බලයෙන්ම අපි එක දෙශයක් දනිමු. බුදුවරයෝ වනාහි දතයුතු සියල්ල දනිත්යයි කීයේය.

15 "කළිඟු රජතෙම මල්ගඳ විලවුන් ගෙන්වා වාදනය කරණු ලබන්නාවූ නොයෙක් තූර්‍ය්‍ය භාණ්ඩවලින් මහබෝමැඩ සතියක් මුළුල්ලෙහි පූජාපවත්වා නැවත සත්රුවන් පවිරකින් එය වටකරවූයේය.

16 "ඒ කළිඟුරජ ගැල් සැටදහසක මල්ද රැස්කරවීය. උතුම්වූ බෝමැඩෙහි ඒ මල්වලින් පූජා පැවැත්වීයයි වදාළේය."

479 **අකීර්ති ජාතකය:-** 1 "සියලු භූතයන්ට අධිපතිවූ ශක්‍රදෙවෙන්ද්‍රතෙම තපස් කරන්නාවූ අකීර්ති තාපසයන් දැක පින්වත් තාපසයන් වහන්ස, මේ ග්‍රීෂ්මයෙහි හුදකලාව හිඳ කිනම් සම්පත්තියක් සඳහා තපස් කරන්නෙහිදැයි ඇසුයේය.

2 "ශක්‍ර දෙවෙන්ද්‍රය, යම්හෙයකින් සත්වයන්ගේ නැවත නැවත ඉපදීම දුක්වේද, ශරීරයාගේ බිඳීමද මුළාවූ මරණයද, දුක්වේද, වාසවය, එහෙයින් මම මෙහි තපස් කරමියි කීයේය.

3 "කාශ්‍යපයන් වහන්ස, නුඹවහන්සේ විසින් මනාකොට කියනලද සුදුසුවූ මේ සුභාසිතය හේතුකොටගෙණ නුඹවහන්සේට වරයක් දෙමි. නුඹවහන්සේ සිතින් යමක් කැමැත්තෙහි නම් ඒ වරය ගණීවායි කීයේය.

4 "සියලු භූතයන්ට අධිපතිවූ ශක්‍රදේවෙන්ද්‍රය, ඉදින් මට වරයක් දෙන්නෙහිනම් යම් ලෝභයකින් රුවනද, අඹුවන්ද, ධන ධාන්‍යද අනිකුදු ප්‍රිය භාණ්ඩද, ලැබ මනුෂ්‍යයෝ තෘප්තියකට නොපැමිණෙද්ද, එබඳු ලෝභයෙක් ම කෙරෙහි නොවෙසේවා හෙවත් මා තුළ නූපදීවායි වරකැමැත්තෙමි කීයේය.

5 "කාශ්‍යපයන් වහන්ස, නුඹවහන්සේ විසින් මනා කොට කියන ලද සුදුසුවූ මේ සුභාෂිතය හේතුකොටගෙණ නැවතද නුඹවහන්සේට වරයක් දෙමි. සිතින් යම්කිසිවක් කැමැත්තෙහි නම්, ඒ වරය ගණීවායි කීයේය.

6 "සියලු භූතයන්ට අධිපතිවූ ශක්‍ර දේවේන්ද්‍රය, ඉදින් මට වරයක් දෙන්නෙහි නම් කුඹුරුද, වතුද, අමු රන්ද, ගවයන් හා අශ්වයන් ද, දාසයන් හා කම්කරු පුරුෂයන්ද යන සියල්ල හටගත්තාවූ යම් ක්‍රොධ සිතකින් පිරිහීයෙද්ද, ඒ ක්‍රොධයතෙම මා කෙරෙහි නොවෙසේවා හෙවත් මා තුළ නූපදීවා යන වරය කැමැත්තෙමියි කීයේය.

7 "කාශ්‍යපයන් වහන්ස, නුඹවහන්සේ විසින් මනාකොට කියනලද මේ සුභාෂිතය හේතුකොටගෙණ නැවතද නුඹවහන්සේට වරයක් දෙමි. ඉදින් යම්කිසිවක් කැමැත්තෙහි නම් ඒ වරය ගණීවායි කීයේය.

8 "සියලු භූතයන්ට අධිපතිවූ ශක්‍රදේවේන්ද්‍රය, ඉදින් මට වරයක් දෙන්නෙහි නම් අඥානයෙකු නොදකිම්වා ඔහු ගැන නොඅසම්වා අඥානයෙකු සමග එකතැන වාසය නො කෙරෙම්වා. අඥානයා සමග පෙරපසු කතාබහ නොකෙරෙම්වා එයද රුචි නොවෙම්වායි කීයේය.

9 "කාශ්‍යපයෙනි, අඥානතෙමේ ඔබට කුමක් නම් කෙළේද, කාශ්‍යපයෙනි, කවර කරුණකින් අඥානයාගේ දැකීම නොකැමැත්තෙහිද, ඒ කාරණය මට කියවයි කීයේය.

10 "අඥානතෙමේ නොකටයුත්තට පමුණුවයි නොකටයුත්තෙහි යොදවයි ශ්‍රෙෂ්ඨයකු වශයෙන් පැමිණවිය. නොහැක්කේවෙයි. මනකොට කියනලද්දේ දැයි කෝපයට පැමිණෙයි. හෙතෙම ආචාරයෙහි හික්මීම නොදනියි. එහෙයින් ඔහුගේ නොදැකීම යහපතැයි කීයේය.

11 "කාශ්‍යපයන් වහන්ස, නුඹවහන්සේ විසින් මනාකොට කියනලද සුදුසුවූ මේ සුභාෂිතය හේතුකොටගෙණ නුඹවහන්සේට වරයක් දෙමි. නුඹවහන්සේ සිතින් යම් කිසිවක් කැමැත්තෙහි නම් ඒ වරය ගණීවායි කීයේය.

12 "සියලු භූතයන්ට අධිපතිවූ ශක්‍ර දේවේන්ද්‍රය, ඉදින් මට වරයක් දෙන්නෙහි නම් නුවණැති සත්පුරුෂයා දක්නෙම්වා. සත්පුරුෂයා ගැන අසම්වා. නුවණැති සත්පුරුෂයා සමග එකතැන වෙසෙම්වා. නුවණැති සත්පරුෂයා සමග ඒ පෙර පසු කතාබහද කෙරෙම්වා. එයද රුචිවෙම්වායි කීයේය.

13 "කාශ්‍යපයෙනි, නුවණැති සත්පුරුෂතෙමේ ඔබට කුමක් නම් කෙළේද, කාශ්‍යපයෙනි, කවර කාරණයකින් සත්පුරුෂයාගේ දැකීම කැමැත්තෙහිද, ඒ කාරණය මට කියවයි, කීයේය.

14 "නුවණැති සත්පුරුෂතෙමේ කටයුත්තට පමුණුවයි. නොකටයුත්තෙහි නොයොදවයි. ශ්‍රෙෂ්ඨයෙකු වශයෙන් පැමිණවිය හැකිවෙයි. මනාකොට කියනලද්දේ නොකිපෙයි. හෙතෙම ආචාර විනය දනියි. එහෙයින් ඔහු හා සමග එක්වීම යහපතැයි කීයේය.

15 "කාශ්‍යපයෙනි, මේ මනාකොට කියන ලද යහපත් වචනයෙහි ප්‍රසන්නවූ මම කැමැති වරයක් දෙමි. යම්කිසිවක් ඔබගේ සිතට කැමැත්තෙහි නම් ඒ වරය ගනීවායි කීයේය.

16 "සියලු භූතයන්ට අධිපතිවූ ශක්‍රදේවේන්ද්‍රය, ඉදින් මට වරයක් දෙන්නෙහි නම් ඉක්බිති රාත්‍රිය ඉක්මගිය කල්හි හිරු උදාවෙන වේලෙහි දිව්‍යවූ භෝජනයෝ පහළවෙත්වා. එය පිළිගන්නාවූ සිල්වත් ප්‍රතිග්‍රාහකයෝද පැමිණෙත්වා.

17 "දෙන්නාවූද මාගේ දානවස්තුව නොපිරිහේවා. මම දානය දීද, පසුතැවිලි නොවෙම්වා. දෙමින්ද සිත

පහදවන්නෙම්වා, ශක්‍ර දේවේන්ද්‍රය, මම මේ වරය ඉල්වමියි කීයේය.

18 "ශාක්‍යයයන් වහන්ස, නුඹවහන්සේ විසින් මනාකොට කියනලද මේ යහපත්වූ වචනයෙහි සතුටුවූයෙම් ඔබට කැමති වරයක් දෙමි. යම්කිසිවක් සිතට කැමැත්තෙහි නම් එය ගනීවායි කීයේය.

19 "සියලු භූතයන්ට නායකවූ ශක්‍රදේවේන්ද්‍රය, ඉදින් මට වරයක් දෙන්නෙහි නම් ඔබ මාවෙත නැවත නොඑළඹෙන්නෙහිවා. ශක්‍රය, මම මේ වරය ඉල්වමියි කීයේය.

20 "බොහෝවූ දාන ශීලාදී ව්‍රතවල හැසිරීමෙන් පුරුෂයෝද එසේම ස්ත්‍රීහුද මාගේ දැකීම කැමතිවෙත්. නුඹ වහන්සේට මා දැක්මෙහි කිනම් බියක්දැයි ඇසීය.

21 "මෙබඳුවූ දිව්‍ය වර්ණ ඇත්තාවූ සියලු කැමති සම්පත්තීන් සමෘද්ධවූ යුෂ්මතා දැක මම තාපසෙහි ප්‍රමාද වන්නෙමි. එහෙයින් ඔබගේ දැක්මෙහි මේ භය වේයයි කීයේය."

**480 තක්කාරිය ජාතකයː-** 1 "එම්බා තක්කාරිය නම් මානවකය, වනයෙහි තමන් කන නයින් කැඳවමින් අඬන්නා වූ මැඩියෙකු මෙන් මමම අඥානවූයේ නපුරුකොට කියන ලද්දක් කීමි. එහෙයින් දැන් මේ වළෙහි වැටෙමි. සීමාව ඉක්මවා කථාකරණ තැනැත්තේ වනාහි සුදුසු නොවේමයයි කීයේය.

2 "ආචාර්‍ය්‍යයන් වහන්ස, සීමාව ඉක්මවා කථාකරණ පුද්ගල තෙමේ අන්දු (සිර) බන්ධනාදියටද අත් පා සිඳීම් ආදියටද ශෝක කිරීමටද, වැළපීමටද පැමිණේ. යම් ඒ කාරණයකින් ඔබ මේවළෙහි හෙළත්ද, මේ කාරණයෙන් ඔබ තමන්ටම නින්දා කරගන්නෙහිය.

3 "මම කාලී නම් ගණිකාව වෙතින් කුමක් හෙයින් සිය සොහොයුරුවූ තුණ්ඩිලයාට මෙසේ (හැඳීමට වස්ත්‍රයක් නොදීම) කරන්නේදැයි ඇසුවෙමි. එහෙයින් මම වස්ත්‍ර යුග්මයද නැතිවූයේ නග්නවද ගියෙමියි (සිටුපුත්‍රයා කීය) ආචාර්‍ය්‍යයෙනි, මේ කාරණයද බොහෝ කරුණුවලින් එබඳුම වේයයි කීයේය

4 "පොර ඇන ගන්නාවුන්ගේ පොර ඇනීම වළකමින් යම් කැරල පක්ෂියෙක් එළුවන් දෙදෙනා අතරට පැමිණේද, හෙතෙම එහි එළුවන් දෙදෙනාගේ හිස්වලින් ඇඹරී ගියේය. ආචාර්‍ය්‍යය, මේ කාරණයද බොහෝ සෙයින් එබඳුමයයි. කීයේය.

5 නයාට බියෙන් තල්ගසින් පතින්නාවූ, එක් මිනිසෙකු රක්නාවූ සතරදෙනෙක් ඝන වැහැරි කඩක් කොන් සතර අල්වාගෙණ සිටියාහුය. ඔහු සතර දෙනාම බිඳිගිය හිස් ඇත්තාහු ශයනය කළාහුය. ආචාර්‍ය්‍යය, මේ කාරණයද බොහෝ සෙයින් මෙබඳුමයයි කීයේය.

6 "යම්සේ (ආයුධයක් නැතිහෙයින් මරණින් මුදා) හුණපඳුරෙහි බඳනාලද එළුදෙන ක්‍රීඩාවශයෙන් පසු පාවලින් ගසන්නේ එහි සඟවා තුබූ ආයුධය හෙළීද, ඒ ආයුධයෙන්ම ඒ එළුදෙනගේ ගෙළසිඳින ලදී. ආචාර්‍ය්‍යය, මේ කාරණයද බොහෝසෙයින් එබඳුමයයි කීයේය.

7 "මේ කිඳුරෝ දෙවියෝ නොවෙති. ගන්ධර්ව පුත්‍රයෝද නොවෙති. මොව්හු මෘගයෝ වෙත්. වැද්දා විසින් වස්තු ලොභයෙන් මොව්හු මා වෙත ගෙණෙන ලද්දාහ. උන්ගෙන් එකෙකුදු සවස බතට පිසත්වා. අනිකාද නැවත උදය බතට පිසත්වායි, රජතෙම නියම කෙළේය.

8 "අයහපත් කොට කියන ලද වචන ලක්ෂයකුත් යහපත්ව, කියනලද එක වචනයක්හුගේ කලාවකටත් නො අඟිත්. අයහපත් වචනයෙහි සැක කරමින් වෙහෙසුනාවූ කිම්පුරුෂතෙම එහෙයින් නිශ්ශබ්ද විය. අඥාන භාවයකින් නොවේයයි (කිඳුරී කීයේය.)

9 "යම් මේ කිඳුරියක්තොමෝ මා හා කථා කෙළේද, මා මුදා හරිව්, ඇය හිමවත් පර්වතයටද පමුණුවත්වා, මේ කිඳුරුද වනාහි මුළුතැන්ගෙට දෙත්වා ඔහු උදෑසනම උදය බතට පිසත්වායි, (රජතෙම කීයේය)

10 "මහරජ්පුරුවන් වහන්ස, සිව්පාවෝ මේඝය පිහිට කොට ඇත්තාහ. මේ මනුෂ්‍ය ප්‍රජාව සිව්පාවුන් පිහිටකොට ඇත්තීය. මම ඔබවහන්සේ පිහිටකොට ඇත්තෙමි. භාර්‍ය්‍යාව මා පිහිටකොට

ඇත්තීය. අප දෙදෙනා අතුරෙන් මළ එකෙකු දැන ඉන්පසු මරණින් මිදුනේ පර්වතයට යන්නේය.

11 "මහරජ්ජුරුවෙනි, නින්දාව නම් ඒකාන්තයෙන් පහසුවෙන් දුරු නොකළ හැක්කේය. නොයෙක් අදහස් ඇති ජනයෝ සේවනය කටයුතු වෙත්, යම් කාරණයකින්ම එකෙක් ප්‍රශංසා ලබාද, ඒකාරණයෙන්ම අනිකා නින්දා ලබන්නේය.

12 මහරජ, සියලු ලෝවැසිතෙම අනුන්ගේ සිත් හා වෙනස්වූ සිත් ඇත්තේය. සියලු ලෝවැසිතෙම ස්වකීය සිතෙහි සිත් ඇත්තේවේ. මේ ලෝකයෙහි වෙන් වෙන්වූ සියලු සත්වයෝ වෙන වෙනම සිත් ඇත්තාහ. කවරෙකුගේ චිත්ත වසඟයෙහි පවතීදැයි (කිඳුරුතෙම රජුට දම් දෙසීය.)

13 "භාර්‍යාව සහිතවූ යම් කිම්පුරුෂයෙක්තෙම නිශ්ශබ්දවීද, හෙතෙම දැන් මරණභයින් බියපත්වූයේ දැහැමි කථාවක් කෙළේය. එහෙයින් දැන් හෙතෙම මරණින් මිදී සුවපත්ව නිරෝගවිය. මේ ලෝකයෙහි සත්වයන්ට වචනයම හිත සැප එළවන්නීයයි (රජතෙම ප්‍රශංසා කෙළේය.)"

481 රුරුමෘග ජාතකයː- 1 "කවරෙකුට ගම්වර හා අලංකාරයෙන් සැරසුනාවූ ස්ත්‍රීන් දෙන්නෙම්ද, කවරෙක් මුවන්ගෙන් උතුම් මුවෙකුවූ ඒ රන්වන් මුවා මට කියන්නේදැයි (ඇමතිතෙම කීයේය.)

2 මට ගම්වරද අලංකාරයෙන් සැරසුනාවූ ස්ත්‍රීන්ද දෙව, මම තොපට මුවන්ගෙන් උතුම් මුවෙකුවූ ඒ රන්වන් මුවා කියන්නෙමියි සිටු පුත්‍රතෙම කීයේය.

3 මේ වනලැහැබෙහි පිපීගියාවූ අඹගස්ද සල්ගස්ද ඇති රතිඳුගොව් පැහැයෙන් යුත් තෘණයෙන් ගැවසීගත් භූමියවේ මෙහි ඒ රන්වන් මුවා සිටීයයි කීයේය.

4 රජතෙම දුන්න දෙකඩ නොකොට හෙවත් දුනුදිය හා හීය එක්කොට හීය සරසාගෙණ පැමිණියේය. මුව තෙමේද එසේ එන රජහු දැක දුරදීම මෙසේ කීය.

5 "මහරජ්ජුරුවෙනි, බලාපොරොත්තු වුව මැනව, මා නොවිඳුනු මැනව, ශ්‍රෙෂ්ඨයන් වහන්ස. මෙහි මේ රන්වන් මුවා සිටී යන මේ පුවත කවරෙක් නම් ඔබට කීයේ දැයි ඇසීය.

6 යහළු මුව රජ්ජුරුවෙනි, ඒ ලාමකවූ හැසුරුම් ඇති පුරුෂතෙම මෙහි මදක් ඈතින් සිටියි. හෙතෙම වනාහි මට මේ රන්වන් මුවා මෙහි සිටී යන මේ පුවත කීයේය.

7 මේ ලෝකයෙහි ඇතැම් නුවණැති මිනිස්සු දියෙහි පාවී යන දණ්ඩක් ගොඩ ගැණීම උතුම්ය. ඇතැම් මිනිසෙකු ගොඩ ගැණීම උතුම් නොවේමැයි සැබවක්ම කීවාහුය.

8 එම්බා රූරු මෘගය, කිමෙක්ද. තොපි මෘගයන්ට නින්දා කරන්නෙහිද, කිම පක්ෂියෙකුට නින්දා කරන්නෙහිද කිම මිනිසුන්ට නින්දා කරන්නෙහිද, මිනිස් බසින් කියන්නාවූ එය අසා මට වනාහි මහත් බියක් උපදීයයි කීයේය

9 වහා ගලායන්නාවූ මහත්වූ ජලස්කන්ධය ඇති ගංගා ප්‍රවාහයෙහි ගසාගෙණ යන්නාවූ යම් මිනිසෙකු මම ගොඩලීම්ද, ඒ හේතුවෙන් මට මේ භය පැමිණියේය. මහරජ්ජුරුවෙනි, අසත් පුරුෂයන් හා එක්වීම ඒකාන්තයෙන් දුක්වන්නේයයි කීයේය.

10 මෘග රාජය, ඒ මම හී පත්‍ර සතරක් ඇති අහසින් යන්නාවූ සිරුර සිඳින්නාවූ මේ හීය ඔහුගේ හෘදයෙහි හරින්නෙමි. යමෙක් එබඳුවූ කළ උපකාරය නොදනීද, නොකටයුතුකරන්නාවූ ඒ මිත්‍ර ද්‍රෝහියා නසමියි කීයේය.

11 ජනාධිපතිය, ඒකාන්තයෙන් ප්‍රාඥයාගේද බාලයාගේද නැසීම සත්පුරුෂයෝ කිසි කලෙකත් නොපසසත්. එහෙයින් මේ ලාමක ස්වභාව ඇත්තේ කැමති පරිදි ගෙදරට යේවා. යමකුත් මොහුට දෙමි කීයේද, එයද මොහුට දුන මැනව, මමද ඔබට කැමති පරිදි කරන්නෙක් වෙමියි කීයේය.

12 යමෙක් ද්‍රෝහි මිනිසාට ද්‍රෝහ නොකෙළේද, ඒ මේ රූරු මෘග රාජතෙම ඒකාන්තයෙන් සත් පුරුෂයන් ගෙන් කෙනෙකි. මේ ලාමක ස්වභාව ඇත්තේ කැමති පරිදි ගෙදරටයේවා. යමකුත් මොහුට දෙමි කීම්ද, එයද ඔහුට දෙමි. මම වනාහි කැමති වරයක් දෙමියි කීයේය.

13 මහරජ, සිවලුන්ගේද පක්ෂීන්ගේද හඬ සුවසේ දතහැක. මිනිසුන්ගේ හඬ දැන ගැණීම ඊට වඩා දුෂ්කරය.

14 ඉදින් යම් මිනිසෙක්තෙම මේ මාගේ නෑයෙක මිත්‍රයෙක යහළුවෙක කියා හෝ දනීද, හෙතෙම පළමු සතුටු සිත් ඇතිව පසුව සතුරෙක් වන්නේයයි කීයේය.

15 රුස්වූ දනව්වැස්සෝද රුස්වූ නියම් ගම්වැස්සෝද මුවෝ ගොයම් කති. දෙවයන් වහන්සේ එය වළක්වන සේක්වායි කීහු.

16 ඒකාන්තයෙන් ජනපදය නැතිවේවා. රටද වැනසේවා මම වනාහි අභය දානය දී රූරු මෘගරාජයාට ද්‍රෝහ නොවන්නෙම්මය.

17 මාගේ ජනපදය නැතිවේවා. රටද වැනසේවා, මම වනාහි මුව රජහට වර දී බොරු නොකියන්නෙමියි (රජ තෙම කීයේය.”

**482 සරභ මෘග ජාතකයඃ-** 1 නුවණැති පුරුෂ තෙමේ පටන් ගත් කටයුත්තෙහි ආශාව නොහරින්නේය. හෙවත් බලාපොරොත්තු වන්නේමය. නොකලකිරෙන්නේය. කුමක් හෙයින්දයත් යම්සේ මම කැමති වීම්ද, එසේම විය. ඒ මම වනාහි තමන් දකිමි.

2 නුවණැති පුරුෂතෙමේ ආශාව නොසිඳින්නේමය. නොකලකිරෙන්නේය. ඒ මම වනාහි දියෙන් ගොඩ එනලද තමන් දකිමි.

3 නුවණැති පුරුෂතෙමේ උත්සාහ කරන්නේමය. නොකලකිරෙන්නේය. කුමක් හෙයින්ද යත් යම්සේ මම කැමතිවීම්ද, එසේ වූයේය. මම වනාහි ඒ තමන් දකිමි.

4 නුවණැති මිනිස්තෙමේ පටන්ගත් කටයුත්තෙහි උත්සාහ කරන්නේමය නොකළකිරෙන්නේය. මම වනාහි දියෙන් ගොඩ එනලද ඒ තමන් දකිමි.

5 දුකට පැමිණියාවූද නුවණැති මනුෂ්‍යතෙමේ සැපයට පැමිණීමෙහි ආශාව නොසිඳින්නේය. අහිතවූද හිතවූද නොසිතනලද බොහෝවූ ස්පර්ශයෝ වනාහි සත්වයාට පැමිණෙත්.

6 නොසිතන ලද්දවේ. සිතන ලද්ද වැනසේ. ස්ත්‍රියකට හෝ පුරුෂයෙකුට හෝ සිතූ පරිදිම පම්පත් නොලැබෙතියි (රජතෙම උදන් ඇනීය.)

7 මහරජ, නුඹ වහන්සේ පෙර දවස පර්වත දූර්ගයෙහි යම් සරභ මුවෙකු ලුහුබැඳ ගියේද, කරුණා සිත් ඇති ඒ මුවාගේ නරාවළෙන් ගොඩ ගැණීමට කරණ ලද උත්සාහය නිසා ඔබ ජීවත් වෙහිය.

8 යම් සරභ මෘගයෙක් ගලින් යානයක් හෙවත් ගොඩ නැගීමට සුදුසු උපායක් කොට ගොඩ නැගිය නොහැකිවූ නරාවලින් ඔබ ගොඩ ගත්තේද, දුකට පැමිණියාවූ ඔබ මරුවාගේ මුඛයෙන් මිදුයේද, කරුණා සිත් ඇති ඒ මුවාගේ ගුණය කීයහියයි පුරෝහිතතෙම කීයේය.

9 "බ්‍රාහ්මණය, එකල්හි නුඹ එහි සිටියේද, නොහොත් කිසිවෙක් ඒ මේ කාරණය කීයේද, නැතහොත් නුඹ විවෘත කළ කෙළෙස් සෙවෙනි ඇති සියල්ල දන්නාසුළු සර්වඥවෙහිද, ඔබගේ නුවණ වනාහි බලවත් ස්වභාව ඇත්තෙකැයි කීයේය.

10 "මහරජ, මම වනාහි එකල්හි එහිද නොමවූයෙමි. අන්කිසිවෙක්ද මට ඒ මේ කාරණය නොමකීය. මනාකොට කියනලද ගාථා පාදයන්ගේ වනාහි යම් අර්ථයක්වේද ප්‍රාඥයෝ ඒ අර්ථය සලකත්යයි කීයේය.

11 "මහරජ, හී පත්‍ර ඇති අනුන්ගේ වීර්‍ය්‍ය නසනසුළුවූ හීතලය දුන්නෙහි සරසාගෙණ නුඹවහන්සේ කුමකට සැක කරන්නෙහිද, උතුම් ප්‍රඥා ඇති රජුනි, හී සැරය විද සරභමුවා වහා නසාවා මේ සරභමුවා වනාහි රජහුගේ ආහාරයයි කීයේය.

12 "බ්‍රාහ්මණය, මුවා ක්ෂත්‍රියයාගේ ආහාරය යන මේ කාරණය මමද ඒකාන්තයෙන් දනිමි. යම්හෙයකින් මම පෙර කළගුණයට පුදන්නෙම්ද, එහෙයින් මේ සරභමුවා නොමරමියි කීයේය

13 "දිශාවන්ට අධිපතිවූ මහරජ, මෙතෙම මුවෙක් නොවේ. අසුරයන්ට නායකවූ ශක්‍රයාය, මනුජේන්ද්‍රය, මොහු මරා නුඹවහන්සේ ශක්‍ර වනසේක්වා.

14 "මහරජ ඉදින් නුඹවහන්සේ මේ සරභමුවා මාගේ යහළුවායයි නසන්ට සැකවන්නෙහිද නරවීරශ්‍රෙෂ්ඨය, අඹුදරු සහිතවූ නුඹවහන්සේ යමයාගේ වේතරණී නම් නරකයට යන්නේයයි කීයේය.

15 "බමුණ, ඒකාන්තයෙන් මමද දනව්වැස්සෝද, පුත්‍රයෝද, භාර්‍ය්‍යාවෝද, යහළු සමූහයාද යන සියල්ලෝ යමයා ගේ ඒ වේතරණී නම් නරකයට යන්නෙමු. එසේ වුවත් යම් සරභ මෘගයෙක් මාගේ ප්‍රාණය දුන්නේද, හෙතෙම නැසිය යුතු නොවේමයයි කීයේය.

16 "එම්බා බ්‍රාහ්මණය, මේ මුව රජතෙම දරුණුවූ මහ වනයෙහි හුදකලාව දුකට පැමිණියාවූ මට නරාවලෙන් ගොඩ ඒමට උපකාර කෙළේය එබඳුවූ පූර්වොපකාරය සිහිකරන්නා වූ මම දැනගෙණ ඔහු කෙසේ නසන්නෙම්දැයි කීයේය.

17 "මහරජ, මිතුරන් සතුටුකරන්නාවූ නුඹ බොහෝ කලක්ම ජීවත්වේවා. මේ රාජ්‍යය දශරාජධර්මයෙහි සිට අනුශාසනය කෙරේවා. බොහෝවූ ස්ත්‍රීන් පිරිවරාගෙණ දෙව්ලොව ශක්‍රයා මෙන් රාජ්‍යයෙහි සතුටින් වෙසේවා.

18 "නොකිපෙන සුළුවූයේ නිතර පහන් සිත් ඇත්තේ සියලු ආගන්තුගයන්ගේ ඉල්ලීමට සුදුස්සෙක් වේවා ශක්තිවූ පරිද්දෙන් දානයකොටද, අනුභවකොටද, නින්දා නොලබන ලද්දේ පස්කම් සැපයෙන් අග්‍රස්ථානයවූ දිව්‍යලෝකයට පැමිණේවායිකියා ශක්‍රතෙම ගියේය."

---

## පකිණ්ණක නිපාතය

483 **සාලිකේදාර ජාතකයː-** 1 "කොශිය ගොත්‍ර ඇති බ්‍රාහ්මණයාණෙනි, හැල්කෙත පැසී සම්පූර්ණය. එය ගිරව් කති. එය වළක්වන්ට නොහැක්කෙමි. ඒබව ඔබට දන්වන්ට ආවෙමි.

2 "එහි ඒ ගිරවුන්ගෙන් සියල්ලන්ට යහපත්වූ එක් ගිරවෙක්ද වේ. හෙතෙම කැමතිපරිදි හැල් අනුභවකොට තුඩින්ද හැල් කරල් අරගෙණ යන්නේයයි කෙත රකින පුරුෂයා කීයේය.

3 "ඒ ගිරා පක්ෂිතෙම යම්සේ බැඳෙන්නේද, එසේ මළපුඩු අටවත්වා, ජීවත්වන්නාවූම ඔහු අල්වාගෙණ මා සමීපයට ගෙනෙව්යයි (බමුණා කීයේය.)

4 "මේ පක්ෂීහු හැල් අනුභවකොට පැන්ද පාණය කොට බැහැරයෙත්. එකළාවූ මම පුඩුවෙන් බැඳුනේ වෙමි. මාවිසින් කවර පාපයක් කරණලදදැයි ගිරාතෙම ශොක කෙළේය.

5 "සුවපෝතකය, සෙස්සන්ගේ බඩ බඩ පමණය. නුඹගේ බඩ වනාහි ඉතා මහතැයි හඟිම් කුමක් හෙයින්ද, කැමති පරිද්දෙන් හැල් අනුභවකොට යනකල්හි තුඩින්ද හැරගෙණ යන්නෙහිය.

6 "සුවපෝතකය, කිම, ඒ හිඹුල් රුකෙහි කොටුගුලක් පුරවන්නෙහිද, නැතහොත් මා හා තොපගේ වෛරයක්ද යහළුව, මා විසින් විචාරණ ලද්දේ කියව, කොතැනෙක හැල් වී තැන්පත් කරන්නෙහිදැයි බමුණා ඇසීය.

7 "එම්බා කොශිය බ්‍රාහ්මණය, නුඹ හා මාගේ වෛරයක් නැත. මාගේ කොටුගුලකුත් නැත්තේය. හැල් කරල් ගෙණ හිඹුල් රුකට පැමිණි මම නයක් මුදමි. තවද නය දෙමි. එහි නිධානයක්ද තැන්පත් කරමි. මෙසේ දනුවයි ගිරවා කීයේය.

8 "එම්බා ගිරාපොතකය, නුඹගේ නයදීම කෙබඳුද, නයින් මිදීම නම් කෙසේද, නිදානය තැන්පත් කිරීම කෙබඳු දැයි කියව, එකල්හි නුඹගේ බැම්මෙන් මිදෙන්නෙහියයි කීයේය.

9 "එම්බා කෝශිය බ්‍රාහ්මණය, පියාපත් හට නොගන්නාවූ ළදරුවූ මාගේ දරුවෝ ඇත්තාහ. මා විසින් පෝෂණය කරණලද ඔව්හු නැවත මා පොෂණය කරන්නාහුය. එහෙයින් මම ඔවුන්ට නය දෙන්නෙමි.

10 "වසඟයට ගියාවූ ජරාවෙන් යුක්තවූ මාගේ මව්පිය දෙදෙනාද ඉක්මගිය යොවුන් වයස් ඇත්තාහුය. තුඩින් හැල් කරල් ගෙණ ගොස් ඔවුන්ට දී පෙර මා ගත් ණය මුදමි.

11 "ඒ හිඹුල් වෙනෙහි සිඳීගිය පියාපත් ඇති ඉතා දුර්වලවූ අනාථවූද ගිරා පක්ෂීහු වෙත්. ඔවුන්ටද පිං සලකාදෙමි. නුවණැත්තෝ එය අනුගාමික නිධානයයි කීහු.

12 "පින්වත් කෝශිය බ්‍රාහ්මණය, මාගේ ණයදීම මෙබඳුය. මාගේ නයින් නිදහස්වීමද මේ ආකාරවේ. කියන ලද නිදන් තැන්පත්කිරීමද මෙසේ දැනගනුවයි කීයේය.

13 "ඒකාන්තයෙන් උතුම් ධර්මයෙහි පිහිටියාවූ මේ ගිරා පක්ෂිතෙමේ යහපත්වේ. සමහර මිනිසුන් අතරෙහිද මෙබඳු ගුණ ධර්මයෙක් විද්‍යමාන වේයයි බමුණුතෙම සතුටුවිය.

14 "පින්වත් සුවරාජය, සියලු නෑයන් සමග නුඹ කැමති පරිදි හැල් අනුභව කරව, නැවතද සිය කැමැත්තෙන් මෙහි පැමිණියාවූ නුඹ දක්නෙමු. ඔබගේ දැකීම මට ප්‍රියවේ යයිද කීයේය.

15 "කෝශිය බ්‍රාහ්මණය, ඔබගේ ගෘහයෙහි කෑමද, පීමද ලැබූයෙමි. එහෙයින් ඔබ සමීපයෙහි ඇල්මද විය. බහා තබන ලද දඬු ඇත්තවුන් කෙරෙහි දන් දෙව, ජරාවට පැමිණියාවූ මව් පියන්ද පොෂණය කරවයි, අවවාද කෙළේය.

16 "යම් මම පක්ෂීන්ගෙන් උතුම්වූ මේ සුවරාජයා දුටුයෙම්ද, ඒ මට අද ඒකාන්තයෙන් ශ්‍රී කාන්තාව පහළ වූවාය. මම සුවරාජයාගේ යහපත් වචන අසා බොහෝවූ පිං කරන්නෙමියි කීයේය.

17 "ඔදවැඩීගිය සතුටුසිත් ඇත්තාවූ ඒ කෝශිය බ්‍රාහ්මණතෙම ආහාරයද, පානවර්ගද, සකස්කොට පහන් සිත් ඇත්තේ ආහාරයෙන් හා පානයෙන් ශ්‍රමණයන්ද, බ්‍රාහ්මණයන්ද සතුටුකරවූයේයි" වදාළේය.

484 **චන්දකින්නර ජාතකයඃ-** 1 "එම්බා චන්ද්‍රාවෙනි, මාගේ මේ ජීවිතය පරම්පරා සිඳීමට පැමිණියේයයි සිතමි. අධික ලෙයින් තැවරුණෙමි. නුඹගේ ක්‍රීඩා විනොදයෙහි නොඇලෙමි. සොඳුරු චන්ද්‍රාවෙනි, මාගේ ප්‍රාණයෝ නිරුද්ධවෙති.

2 "මාගේ ජීවිතය නවතී. මට දුකෙකි. මාගේ හෘදය දවන්නේය. අතිශයින් වෙහෙසෙමි. එය ශොක කරණ චන්ද්‍රාව වූ තී හේතුකොට ගෙණය. අන් ශොක කරුණුවලින් නොවේ.

3 "රත්වූ ගලෙක්හි එෑ තෘණ මෙන්ද, මුල සිඳිනලද වනයෙහි ගසක් මෙන්ද, මලානික වෙමි. දිය නොපිරුනාවූ හොයක් මෙන් වියලෙමි. එය ශොකකරණ චන්ද්‍රාවවූ තීගේ හේතුවෙනි. අන් ශොක කරුණුවලින් නොවේ.

4 "පර්වත පාදයෙහිවූ විලෙහි වර්ෂා ජලය මෙන් මාගේ මේ කඳුළු ධාරාවෝ වැගිරෙත්. එය ශොකවන චන්ද්‍රාවවූ තී හේතුකොට ගෙණය අන් ශොක කරුණුවලින් නොවේයයි (සඳකිඳුරුතෙම වැළපුනේය.)

5 'රාජපුත්‍රය, යමෙක් බැගෑපත්වූ මාගේ කැමති ස්වාමියා වන ලැහැබෙහි විද්දේද, ඒ නුඹ පාපයෙක් වෙහිය. ඒ මේ විදිනලද මාගේ ස්වාමිතෙම බිම සයනය කෙරේ.

6 "රාජ පුත්‍රය, කිම් පුරුෂයා බලන්නාවූ මාගේ හෘදයෙහි යම් ශොකයෙක් වේද, මාගේ මේ හෘදයෙහි හටගත් ශොකය නුඹගේ මව ලබාවා.

7 "රාජපුත්‍රය, සඳකිඳුරා දෙස බලන්නාවූ මාගේ හෘදයෙහි යම් ශොකයක් හටගණීද, මේ මාගේ හෘදයෙහිවූ ශොකය තොපගේ අඹුව ලබාවා.

8 "රාජපුත්‍රය, යමෙක් මා කැමැත්තෙන්ම අහිංසක වූ මාහිමි සඳකිඳුරා විද මැරීද, ඒ තොපගේ මව දරුවන්ද නොදකීවා. ස්වාමියාද නොදකීවා.

9 "රාජපුත්‍රය, යමෙක් මා කැමැත්තෙන්ම අහිංසකවූ මාගේ ස්වාමියා විද මැරීද, ඒ තොපගේ අඹුව දරුවන්ද නොදකීවා ස්වාමියාද නොදකීවායි සඳකිඳුරී රජහට පරිභව කළාය.

10 "ගිනෙරමල් බඳු ඇස් ඇති චන්ද්‍රාවෙනි, තී නොහඬව, ශොක නොකරව, තී රජකුලයෙහි ස්ත්‍රීන් විසින් පුදනලද්දී මට භාය්‍යාවන්නෙහිවායි, රජතෙම කීයේය.

11 "රාජපුත්‍රය, යමෙක් මා කැමැත්තෙන්ම සඳකිඳුරා විද මැරීද, ඒකාන්තයෙන් මම මැරෙන්නෙම් නමුදු ඒ නුඹට භාය්‍යා නොවන්නෙමියි කීවාය.

12 "බිහිසුනු ස්වභාව ඇති තලිස් පතුරු තුවරලා භොජනකොට ඇති කිඳුරිය, තී ජීවත්වනු කැමතිනම්, හිමාලයට යව, වනයෙහි සමාන ජාති ඇති මෘගයෝ තී අභිරමණය කරන්නාහුයයි කියා රජතෙම හැර ගියේය.

13 "මාගේ ස්වාමිවූ කිම් පුරුෂයාණෙනි, අපි එක්ව සතුටින් හැසුරුණාවූ ඒ පර්වතද, ඒ කඳුරැළිද ඒ පර්වත ගුහාවන්ද ඇත්තාහ. එහි ඔබ නොදක්නී මම කෙසේ නම් සිත් සැනසීම කරන්නෙම්ද,

14 "සඳකිඳුරු හිමියාණෙනි, වල්මෘගයන් හා පුරුදු වූ සිත්කළුවූ කොළ ඇතිරිද වෙත්. එහි නොදක්නීවූ, මම කෙසේ නම් සිත් සනසන්නෙම්ද,

15 "මා ප්‍රිය කිඳුරාණෙනි, වල්මෘගයන් හා පුරුදුවූ සිත් කළුවූ මල් ඇතිරිද ඇත්තාහ. එහි ඔබ නොදක්නා මම කෙසේ නම් සිත සනසාගන්නෙම්ද,

16 "මා ප්‍රිය කිම්පුරුෂයාණෙනි, නිර්මලවූ ජලය ඇති මල්වලින් ගැවසීගත් දිය පහර ඇති උතුම් පර්වත නදීහු ගලා බසිත්. එහි ඔබ නොදක්නාවූ මම කෙසේ වාසය කරන්නෙම්ද,

17 "මා සොඳුරු සඳකිඳුරාණෙනි, දැකුම්කළුවූ නිල්මිණිවන් හිමවත් පර්වත කූටයෝ ඇත්තාහ. එහි ඔබ නොදක්නී මම කෙසේ සැනසෙන්නෙම්ද,

18 "ප්‍රියවූ කිම් පුරුෂායණෙනි, දැකුම්කළුවූ රන්වන් හිමවත් පර්වත කූටයෝද වෙත්. එහි ඔබ නොදක්නී කෙසේ නම් වාසය කරන්නෙම්ද,

19 "මාහිමි කිඳුරාණෙනි, දැකුම් කටයුතුවූ තඹවන් හිමවත් පර්වත මුදුන්ද වෙත්. එහි ඔබ නොදක්නී මම කෙසේ නම් සිත් සනසාගන්නෙම්ද,

20 "සඳකිඳුරු හිමියාණෙනි, දැකුම්කටයුතුවූ, උස්වූ හිමවත් පර්වත මුදුන්ද වෙත්. එහි ඔබ නොදක්නී මම කෙසේ නම් සැනසෙන්නෙම්ද,

21 "සඳකිඳුරාණෙනි, දැකුම් කටයුතුවූ සුදුපැහැ ඇති හිමවත් පර්වත මුදුන්ද ඇත්තාහ. එහි ඔබ නොදක්නී මම කෙසේ නම් සිත් සැනසීම කරන්නෙම්ද,

22 "කිම් පුරුෂයාණෙනි, දැකුම්කටයුතුවූ විසිතුරු වර්ණ ඇති හිමවත් පර්වත මුදුන්ද ඇත්තාහ. එහි ඔබ නොදක්නී මම කෙසේ නම් සිත් සැනසීම් කරන්නෙම්ද,

23 "කිම්පුරුෂයාණෙනි, යක්ෂ සමූහයා විසින් සේවනය කරණලද ඖෂධවලින් ගැවසීගත්තාවූ ගන්ධමාදන පර්වතයෙහි අපි ක්‍රීඩාකොට හැසුරුණෙමු. එහි ඔබ නොදක්නී මම කෙසේ නම් සිත් සැනසීම කරන්නෙම්ද,

24 "කිම්, පුරුෂයාණෙනි, කිඳුරන් විසින් සේවනය කරණලද බෙහෙත්වලින් ගැවැසීගත් ගන්ධමාදන පර්වතයෙහි අපි හැසුරුණෙමු. එහි ඔබ නොදක්නී මම කෙසේ නම් සිත් සැනසීම කරන්නෙම්දැයි (සඳකිඳුරී මෙසේ වැළපුණීය)

25 "උතුම්වූ බ්‍රාහ්මණය, යමෙක් බැගෑපත්වූ මාගේ කැමැතිවූ ස්වාමියාට අමෘත ජලය ඉස්සේද, එහෙයින් මම නැවත ස්වාමියා හා එක්වීම්ද, ඒ ඔබගේ පා වඳිම්යි කීවාය.

26 "දැන් අපි මල්වලින් ගැවසීගත් දියපහර ඇති උතුම් පර්වත නදීවල නොයෙක් ගස්වල අතුවලින් කරණලද වස්ත්‍ර ඇත්තෝව ඔවුනොවුන්ට කියන ප්‍රිය වදන් ඇත්තාහු හැසිරෙමුයයි" (පෙරවිසූ චන්ද්‍රපර්වතයටම ගියාහුය)

485 මහා උක්කුස ජාතකයඃ- 1 "උකුස්සාණෙනි, මේ දිවයිනෙහි දනව් වැස්සෝ හුළු බඳිත්. මාගේ දරුවන් කනු කැමතිවෙත්. එහෙයින් උපකාර ඇත්තාවූ මිතුරෙකුට කියනු මැනව, පක්ෂිවූ අපගේ නෑයන්ට පැමිණි විපත, උක්කුස රාජයාට හෙවත් ගිජුලිහිණියාට දන්වනු මැනවැයි උකුසු ධෙනුව කීයේය.

2 "ලිහිණිරජ්ජුරුවෙනි, නුඹ වහන්සේ පක්ෂීන් අතුරෙන් උතුම් පක්ෂිවෙහිය. මම ඔබ සරණයෙමි. රෞද්‍රවූ දනව්වැස්සෝ මාගේ දරුවන් කණු කැමතිවෙත්. නුඹ වහන්සේ මට සුවය පිණිස වනු මැනවැයි උකුස්සා කීයේය.

3 සබඳ උකුස්සාණෙනි, නුවණැත්තෝ කල්හිද නොකල්හිද, සැපය සොයන්නාහු උපකාර කරණ මිතුරන් ඇති කරත්. එබැවින් තොපට මම මේ උපකාරය කරමි. ආචාර ගුණ ඇත්තේ ආචාරගුණ ඇත්තෙකුගේ කටයුත්ත කෙරේමයයි (කැස්බා කීයේය.)

4 අනුකම්පා ඇති මිතුරෙකු විසින් කටයුතු යමක් වේද, උතුම් වූ ගුණ ඇති නුඹවහන්සේ විසින් ආචාරගුණ ඇති මට ඒ මේ උපකාරය කරණ ලදී. නුඹ වහන්සේ ආරක්ෂා වුවමැනව. නොදැවෙනු මැනව. ඔබ ජීවත්වන කල්හි අපි දරුවන් ලබන්නෙමුයි. උකුස්සා කීයේය.

5 එම්බා සේනකය, නුඹගේම ආරක්ෂාව සඳහා භය වළක්වමින් මරණයටද භය නොවෙමි. සමහර යාළුවෝ යහළුවන් සඳහා ප්‍රාණය හැර දැමීම පවා කෙරෙත්. මේ සත් පුරුෂයන්ගේ ගුණධර්මයෙකියි ලිහිණි රජ කීයේය.

6 අහසින් යන්නාවූ මේ උක්කුස නම් ලිහිණි රජතෙම රාත්‍රි භාගයක් පසුවනතුරු යහළුවාගේ දරුවන් සඳහා ඉතා දුෂ්කරවූ කටයුත්තක් කෙළේය.

7 දියෙහි වාසය කරන්නාවූ මාගේම මිත්‍රයාණෙනි, සමහරු යශසින් ධනයෙන් ගිළිහුනාහුද, සිය කටයුතුවලින් පිරිහුනාහුද, මිතුරන්ට අනුකම්පාවෙන් උපකාර වෙත්. දැන් මාගේ දරුවෝ කරදරයට පැමිණියාහුය. එහෙයින් මම ඔබ පිහිට සොයා ආවෙමි. මාගේ ඒ කටයුත්ත කරණු මැනවයි. (උකුසුතෙම කැස්බාට කීයේය.)

8 මිත්‍ර සේනකය, නුවණැත්තෝ ධනයටද ධාන්‍යයටද තම ජීවිතයටද වඩා උපකාර ඇති මිතුරන්ට සලකත්. එහෙයින් මම තොපගේ මේ කටයුත්ත කරමි. ආචාර ගුණවන්තයා ආචාරගුණ ඇත්තෙකුගේ කටයුත්ත කෙරේමයයි කැසුබුතෙම කීයේය.)

9 "පියාණෙනි, ඔබ වෙහෙස නොගෙණ හිඳිනු මැනව, පුත්‍රතෙමේ පියාගේ කටයුත්තෙහි හැසිරෙන්නේය. උකුස්සාගේ

දරුවන් රක්නේ මම ඔබගේ මේ කටයුත්තෙහි හැසිරෙන්නෙමියි කැසුබු පුත්‍රයා කීයේය.

10 "පුත්‍රය, පියාගේ කටයුත්තෙහි පුත්‍රයා හැසිරෙන්නේය යන මේ වනාහි ඒකාන්තයෙන් සත්පුරුෂයන්ගේ ගුණ ධර්මයක් වේ. එසේවුවත් ඒ දනව් වැස්සෝ ඉතා වැඩුනු සිරුරු ඇති මා දැක උකුස්සාගේ දරුවන්ට පීඩා නොකරන්නාහු නම් යෙහෙකැයි කැස්බා කීයේය.

11 මෘගයන් අතර වීර්‍යය ඇත්තවුන්ගෙන් ශ්‍රෙෂ්ඨවූ සිංහ රාජය, සිව්පාවෝද, මිනිස්සුද භයින් පෙළුනාහු උතුමෙකු වෙත එළඹෙත්. මාගේ දරුවෝ දැන් භයින් පීඩිතවූහ. එහෙයින් මම ඔබ පිහිට සොයා ආවෙමි. නුඹවහන්සේ අපගේ රජවෙහිය. මාගේ දුක් දුරු කිරීමට උපකාරවුව මැනවැයි උකුස්සා සිංහයාට කීයේය.

12 "එම්බා සේනකය, තොපගේ මේ කටයුත්ත කරමි. තොපගේ ඒ සතුරු සමූහයා නැසීමට එන්නෙමු. නුවණැත්තේ සතුරන් මැඩීමට සමර්ථවූයේ සතුරු භය දැන තමා හා සමාන මිත්‍ර ජනයාගේ ආරක්ෂාව පිණිස කෙසේනම් උත්සාහ නොකරන්නේ දැයි (සිංහතෙම කීයේය).

13 "ආර්‍යයවූ යමෙක් සැප සඳහා මිත්‍රයන් ඇතිකරන්නේද, සුහෘදයන් ස්වාමීන් ඇති කරන්නේද, හෙතෙම හැඳි සන්නාහ ඇත්තෙක් ඊ පහර වළක්වා රැකෙන්නාක් මෙන් සතුරන්ගෙන් මිදේ. එසේ රැකුනාවූ අපි දරුවන් හා එක්ව සතුටුවෙමු.

14 "බියෙන් පැන නොයන්නාවූ යහළුවූ ස්වකීය මිත්‍රවූ සිංහයාගේ වික්‍රමයෙන් අපගේ පක්ෂි පෝතකයෝ සිත් සතුටු කරමින් අපගේ නාදයට අනුව නාද කෙරෙත්.

15 "නුවණැත්තේ යහළු මිතුරෙකු ලබාද, හෙතෙම පුත්‍රයන්ද සිව්පාවුන්ද ධනයද ලැබ පරිභෝග කෙරේ. මමද මාගේ පුත්‍රයෝද, ස්වාමියාද යන අපි මිත්‍රයන්ගේ අනුකම්පාවෙන් එක්ව වාසය කරමු.

16 "ස්වාමීනි, සිංහයා වැනි රාජ බලය ඇත්තාවූද උකුසු කැසුබු වැනි ශූර බල ඇත්තාවූද, මිතුරන්ගෙන් ප්‍රයෝජන

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ඇත්තේය. මිත්‍ර ධර්මයෙන් යුක්තයාට මෙබඳු මිතුරෝ ඇති වෙත්. මිත්‍රයන් ඇති යසස් ඇති උසස්වූ ගති ඇති හෙතෙම මෙලොවදීද, සතුටු වේ.

17 "ස්වාමීවූ සේනකය දිළිඳුවූවහු විසිනුදු මිතුරන් කටයුතුය මිතුරන්ගේ අනුකම්පාවෙන් දරුවන් සහිතවූ අපි එක්වීමු. එය බලව,

18 "සේනක හිමියෙනි, යම් පක්ෂියෙක් සූරයෙකු හා බලවතෙකු හා මිතුරුකම් කෙරේද, හෙතෙම මමද ඔබද යම්සේ සුවපත් වීම්ද, එසේ සුවපත් වේයයි උකුසු දෙන මිතුරන් ඇතිවීමේ අනුසස් කීවාය."

**486 උද්දාලක ජාතකය:-** 1 "එම්බා ආචාර්යය, රළුවූ අඳුන් දිවිසම් ඇති මැලියම් සහිත දත් ඇති, අඳුන් නොගෑමෙන් නොසැරසීමෙන් අයහපත් මුහුණු හා රූප ඇති යම් ඒ ජටාධර තාපස කෙනෙක් මන්ත්‍ර පිරවීම කෙරෙත්ද, කිමෙක්ද, ඔව්හු මිනිසුන් විසින් කළයුත්තෙහි මේ තපස දන්නාහු ඔව්හු අපාය දුකින් මිදුනාහු වෙද්දැයි (රජතෙම ඇසීය.)

2 "මහරජ, ඉදින් බොහෝ ඇසූ පිරූතැන් ඇත්තේද, කුශල ධර්මයෙහි නොහැසිරෙන්නේ නම් පාප කර්ම කරන්නේ තමා දහසක් වේද දැනගත් නමුත් එය නසා අෂ්ට සමාපත්ති සංඛ්‍යාත චරණ ධර්මයට නොපැමිණ දුකින් නොමිදෙන්නේ යයි පුරෝහිත තෙම කීයේය.

3 "දහසක් වේද දත්තේද එය නිසා චරණ ධර්මයට නොපැමිණ දුකින් නොමිදෙන්නේ නම් වෙදයෝ නිෂ්ඵල වෙත්. ශීල සංයමයෙන් යුත් චරණයම සත්‍යයයි හඟිමියි (උද්දාලකතෙම කීයේය.)

4 "වෙදයෝ නිෂ්ඵලයයි මම නොකියමි. ශීල සංයමයෙන් යුක්තවූ චරණයම සත්‍යයවේ. වෙදයන් හදාරා කීර්තියටම පැමිණේ අෂ්ට සමාපත්ති සංඛ්‍යාත චරණයෙන් දමනයවූයේ භය සංසිඳීම ඇති නිවනට පැමිණේයයි (පුරෝහිත තෙම කීයේය.)

5 "මව්පියෝද නෑයෝද පොෂණය කටයුතුයි. යමෙකු නිසා උපන්නේද හෙතෙමේද පොෂණය කටයුතුයි ඒ උද්දාලක නම් මම පින්වත්හුගේ බ්‍රාහ්මණ වංශය රැකීමට සුදුසු පුත්‍රවෙමියි කීයේය.

6 "පින්වත, කෙසේනම් බ්‍රාහ්මණවේද, කෙසේ සියල්ල සම්පූර්ණවූවෙක්වේද, කෙසේ පරිනිර්වාණයවේද, කුමකින් ධර්මයෙහි පිහිටියේයයි කියනු ලැබේදැයි ඇසීය.

7 "බමුණුතෙම නිරන්තරයෙන් ගිනිගෙණ පුදයිද, දිය ඉසීම කෙරේද, යාග පිණිස ටැඹ ඔසවාද, මෙසේ කරන්නාවූ බමුණුතෙම නිර්භයවූයේ වෙයි. එහෙයින් ඔහු ධර්මයෙහි පිහිටිය හුයයි කීවාහුයයි කීයේය.

8 "දිය ඉසීමෙන්ද පිරිසුදුවීමක් නැත්තේය. ගිනි පිදීමාදිය කළ පමණින් සියල්ල සම්පූර්ණවූ බ්‍රාහ්මණයෙක්ද නොවේ. ඉවසීමද නොවේ. සුරත භාවයද නොවේ හෙතෙම පිරි නිවියේද නොවේයයි කීයේය.

9 "කෙසේ නම් හෙතෙම බ්‍රාහ්මණවේද, කෙසේ සියල්ල සම්පූර්ණවූයේවේද, කෙසේ නම් පරිනිර්වාණයවේද, කුමකින් ධර්මිෂ්ටයායයි කියනු ලැබේදැයි ඇසීය.

10 "යමෙක් වතු කුඹුරු හා නෑයන් නැත්තේ මමත්වය කිරීමක් නැත්තේ ලාභාදියෙහි ආසා නැත්තේ පවිටුවූ විෂම ලොභ රහිතවූයේ ක්ෂයවූ භවාසාව ඇත්තේවේද, මෙසේ කරන්නාවූ බ්‍රාහ්මණ තෙමේ නිර්භයවේ. එහෙයින්ම ධර්මයෙහි පිහිටියේයයි කීවාහුය.

11 "එම්බා පුරෝහිත බ්‍රාහ්මණය, ක්ෂත්‍රියයෝය බ්‍රාහ්මණයෝය වෛශ්‍යයෝය. ශුද්‍රයෝය චණ්ඩාලයෝය. පුක්කුසයෝය යන සියල්ලෝම සුරත භාවය ඇත්තාහු දැමුනාහුද, සියල්ලෝම පිරිනිවියාහුද මෙසේ නිවීසැනහී ගිය ඒ සියල්ලන්ගේ මෙතෙම උතුම්ය. මෙතෙම හීනය යන වෙනසක් ඇද්දැයි උද්දාලකතෙම ඇසීය.

12 "ක්ෂත්‍රියෝය, බ්‍රාහ්මණයෝය, වෛශ්‍යයෝය ශුද්‍රයෝය චණ්ඩාල පුක්කුසයෝය යන සියල්ලෝම සුරත භාවය ඇත්තාහු

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

දමනය වූවාහුද, සියල්ලෝම පිරිනිවියාහුද, මෙසේ සිහිල්වූ ඒ සියල්ලන්ගෙන් මෙතෙම උතුම්ය මෙතෙම ලාමකය යන වෙනසක් නැත්තේයයි (පුරෝහිතතෙම කීයේය.)

13 "ක්ෂත්‍රියයෝය, බ්‍රාහ්මණයෝය, වෛශ්‍යයෝය ශුද්‍රයෝය, චණ්ඩාල පුක්කුසයෝය යන සියල්ලෝම සුරත භාවය ඇත්තාහු දමනයවූවාහුද, සියල්ලෝම පිරිනිවියාහුද,

14 "මෙසේ නිවී සැනහීගියාවූ සියල්ලන්ගේ ශ්‍රෙෂ්ඨයායයිද හීනයායයිද වෙනසක් නැත්තේ නම් බ්‍රාහ්මණයන්ගේ කුල පරම්පරාවෙන්වූ බ්‍රාහ්මණ භාවය නසා සැඩොලුන් සමානව හැසිරෙන්නහුයයි කීයේය.

15 "යම්සේ නොයෙක් පැහැඇති වස්ත්‍රවලින් ගෙයක් වසනලද්දේවේද, ඒ වැසූ වස්ත්‍රයන්ගේ සෙවනට ඒ පැහැය නොපැමිණේද,

16 "මෙපරිද්දෙන්ම මිනිසුන් අතර යම් කලෙක්හි මානවකයෝ පිරිසුදු වෙද්ද, සුසිල්වත්හු ධර්මය දැන ඔවුන්ගේ ජාතිය නොවිචාරත්යයි පුරෝහිතතෙම කීයේය.

487 **භිස ජාතකයා:-** 1 "ආචාර්‍ය්‍යවූ තාපස බ්‍රාහ්මණය, යමෙක් ඔබගේ ආහාර කොටස වූ නෙළුම්ල සොරා ගත්තේද, හෙතෙම මෙලොව අශ්වය ගවය රිදීය රත්රන්ය යන ධනයද මනවඩන්නාවූ භාර්‍ය්‍යාවක්ද ලබාවා. පුත්‍රයන් සමගද භාර්‍ය්‍යාවන් සමගද එක්වේවායි (දෙවෙනි තාපසතෙම දිවුරුවේය.)

2 "ආචාර්‍ය්‍ය බ්‍රාහ්මණය, යමෙක් ඔබගේ නෙළුම්ල හැර ගත්තේද, හෙතෙම මල්මාලාද කශී සඳුන්ද දරාවා. ඔහුට දරුවෝද බොහෝවෙත්වා හෙතෙම කාමයන්හි තියුණු අපේක්ෂාවද කෙරේවායි (තුන්වැන්නා දිව්රුවේය.)

3 "පින්වත් බ්‍රාහ්මණය, යමෙක් ඔබගේ නෙළුම්ල කොටස් සොරාගත්තේද හෙතෙම බොහෝ ධාන්‍ය ඇති සී සාන්නාවූ යස පරිවාර ඇති පුත්‍රයන්ද සියලු කැමති සම්පත්ද ඇති ධනවත්වූ ගෘහස්තයෙක්ව වයස නොදක්නේ ගිහිගෙයි වාසය කෙරේවායි (සතරවැන්නා දිව්රුවේය.)

4 "පින්වත් බ්‍රාහ්මණය, යමෙක් ඔබසතු නෙළුම්ල හැර ගත්තේද, හෙතෙම රජුන්ට අධිරාජවූ බලවත් සහපිරිවර ඇති බලාත්කාරකම් කරන්නාවූ ක්ෂත්‍රියයෙක් වේවා සතරදිග මුහුද හිමිකොට පෘථිවියට අධිපතිව වාසය කෙරේවායි (පස්වැන්නා දිව්රුවේය)

5 "එම්බා බමුණ, යමෙක් ඔබගේ නෙළුම්ල සොරා ගත්තේද, හෙතෙම මුහුර්තයන්හි හා නක්ෂත්‍රමාර්ගයන්හි යෙදුනාවූ පහව නොගිය ආශාව ඇති බමුණෙක් වේවා. යශපිරිවර ඇති රජතෙමේ ඔහු පුදාවායී (සවැන්නා දිව්රුවේය.)

6 "ආචාර්‍යයවූ බ්‍රාහ්මණය, යමෙක් ඔබ සතු නෙළුම්ල සොරාගත්තේද, ඔහු මන්ත්‍ර හදාරන්නාවූ සියලු සම්පූර්ණ කළ වේදය ඇති තපස්වීයෙකුයයි සියලු ලෝවැසි තෙම හඟීවා දනව්වැස්සෝ එකතුව ඔහු පුදත්වායි (සත්වැන්නා දිව්රුවේය.)

7 "පින්වත් බ්‍රාහ්මණය, යමෙක් ඔබසතු නෙළුම්ල ගත්තේද, හෙතෙම කරුණු සතරකින් උත්සන්නවූ සමෘද්ධවූ ශක්‍රයා විසින් දෙනලද්දක්මෙන් ලැබූ ගම්වරක් අනුභව කෙරේවා පහනොවූ ආශාඇත්තේ මරණයට පැමිණේවායි, (යහළු තාපසතෙම දිවුරුවේය.)

8 "පින්වත් තාපසයන් වහන්ස, යමෙක් නුඹ වහන්සේගේ නෙළුම්ල කොටස සොරාගත්තේද, හෙතෙම යහළුවන්මැද නෘත්‍යවලින්ද ගීතවලින්ද සතුටු වන්නාවූ ගම්දෙටුවෙක්වේවා රජ කෙරෙන් කිසි ව්‍යසනයක් නොලබාවායි (ඒදාස තවුස්තෙම දිව්රුවේය.)

9 "පින්වත් බ්‍රාහ්මණය, යම් තැනැත්තියක් ඔබගේ නෙළුම්ල සොරාගත්තීද ඇය අසහාය රජෙක්තෙම පෘථිවිය ජයගෙණ යම් ස්ත්‍රියක් අගමෙහෙසිය කෙරේද, ස්ත්‍රීන් දහසකට අග්‍රවූ ඒ තනතුරෙහි තබාවා ඕතොමෝ ස්ත්‍රීන්ගෙන් උතුම් තැනැත්තියක්ද වේවායි (නැගනි තවුසී දිවුලාය)

10 "පින්වත් තාපසයන් වහන්ස, යම්තැනැත්තියක් නුඹවහන්සේගේ නෙළුම්ල කොටස සොරාගෙණ කෑවානම්

ඕතොමෝ රුස්වූ සියලු තාපසවරුන් මැද හිඳ මධුර රසය පැකිලීමත් නැතිව අනුභව කෙරේවා. තවද ලාභ සඳහා කුහකකම් කරන්නියක්ද වේවායි ඒ දාසී තවුසිය දිව්රුවාය.

11 "පින්වත් බ්‍රාහ්මණය, යමෙක් ඔබගේ නෙළුඹල සොරාගත්තේනම් හෙතෙම කජංගලා නම් නුවර මහත්වූ විහාරයෙක්හි ආවාස පිළිදැගුම් කරන්නාවූ මහතෙර කෙනෙක් වේවා නව කර්මාන්තයෙහි යෙදුනෙක්ද වේවා. දවසකින් එක් කවුළුවක් කෙරේවායි රුක්දෙවිතෙම දිව්රුවේය.

12 පින්වත් බ්‍රාහ්මණය, යමෙක් නුඹවහන්සේගේ නෙළුඹල සොරා ගත්තේද, හෙතෙම සතැනකින් සිය ගණන් බැම්වලින් බඳිනු ලැබේවා. සිත්කළුවූ වනයෙන් නුවරට ගෙණයේවා. හෙතෙම කටුදෙකක් ඇති දිග කෙවිට්වලින් හෝ අකුසුවලින් අනිනු ලැබේවායි, (හස්තිතෙම දිව්රුවේය.)

13 පින්වත් තාපසයන් වහන්ස, යමෙක් නුඹවහන්සේගේ නෙළුඹල කොටස සොරාගත්තේද, හෙතෙම ගෙල බැඳි වරාමල් මාලාවක් ඇත්තේ ඊයමින් කළ කන් පළඳනා ඇත්තේ යෂ්ටියෙන් ගසන ලද්දේ සර්පයන් ඉදිරියට පමුණුවාවා සකස්කොට බඳනා ලද්දේ වීථියෙහි හසුරුවායි. (දිව්රුවේය.)

14 පින්වත්නි, යමෙක් නැතිනොවූ ආහාර කොටස නැතිවීයයි කීද, යමෙක් හෝ තොප අතුරෙන් කිසිවෙකු සැක කෙළේද, හෙතෙම පඤ්චකාමයන්ද ලබාවා. එය අනුභවද කෙරේවා. ගිහිගෙය මැද මරණයට පැමිණෙත්වායි මහාකාඤ්චන තාපස තෙමේද දිව්රුවේය.)

15 ලෝකයෙහි සත්වයෝ යම් කාම සම්පත්තියක් සොයමින් හැසිරෙද්ද, මේ සත්ව ලෝකයෙහි මේ කාම සම්පත්තිය ඉෂ්ටද කාන්තද ප්‍රියද මනාපද වේ. කුමක් හෙයින් ඍෂිවරු කාම සම්පත් නොපසසත්දැයි (ශක්‍රතෙම ඇසීය.)

16 ශක්‍ර දෙවෙන්ද්‍රය, ඉදින් කාම සම්පත් හේතුවෙන් සත්වයෝ නසනු ලබත්ද, බඳිනු ලබත්ද කාමයන් හේතු කොටගෙණ දුක් හා භය හටගණීද, කාමයන්හි ප්‍රමාදවූවෝ මුළාවෙන් පව්කම් කෙරෙද්ද.

17 ඒ පවිටු ස්වභාව ඇත්තේ පව් රැස්කොට ශරීරයාගේ බිඳීමෙන් පසු නරකයට පැමිණෙත්. මෙසේ කම්සැපවල දෝෂය දැක ඒ හේතුවෙන් ඍෂිහු කාමයන් නොපසසත්යයි තාපසතෙම කීයේය.

18 බ්‍රහ්මචාරීවූ තාපසයන් වහන්ස, ඍෂීන්වහන්සේලා විමසන්නාවූ මම ඉව්රෙහි තිබුණු ඔබවහන්සේ සතු නෙළුම්ල ගොඩ බිමෙක්හි සඟවා තැබීමි. ඍෂින්වහන්සේලා පිරිසිදු වූවාහු පව් නැත්තෝව වාසය කෙරෙත්. මේ නුඹවහන්සේගේ නෙළුම්ලයයි ශක්‍රතෙම කීයේය.

19 දහසක් ඇස් ඇති දිව්‍යරාජය, අපි ඔබගේ නළුවෝ නොවෙමු. ක්‍රීඩාකළ යුත්තෝද නොවෙමු. නෑයෝද නොවෙමු. ඔබගේ යහළුවෝද නොවෙමු. කුමක් නිසා ඔබ තාපසයන් සමග ක්‍රීඩා කරන්නෙහි දැයි ඇසීය.

20 මහත් ප්‍රඥා ඇති තාපසයන් වහන්ස, නුඹවහන්සේ මාගේ ආචාර්‍ය්‍යවෙහිය, මාගේ පියාද වෙහිය. මේ නුඹ වහන්සේගේ පා සෙවෙන අද මා කළ වරදට පිහිට වේවා. මාගේ මේ එක වරද ක්ෂමා කළ මැනව, නුවණැත්තෝ ක්‍රොධය බලකොට ඇත්තෝ නොවෙතියි ශක්‍රතෙම කීයේය.

21 යම්හෙයකින් භූතයන්ට අධිපතිවූ ශක්‍රයා දුටුවෙමුද, එහෙයින් තාපසවරුන්ගේ මේ වනයෙහි එක් රැයකුදු විසීම යහපත් විසීමකි. යම්හෙයකින් තොපගේ ආචාර්‍ය්‍යවූ බ්‍රාහ්මණතෙමේ නෙළුම්ල පසුව ලැබීද, එහෙයින් පින්වත්නි, සියල්ලෝම සතුටු සිත් ඇත්තෝ වෙත්වායි (මහාකඤ්චන තාපසතෙම කීයේය.)

22 මමද ශාරිපුත්‍රතෙමේද, මෞද්ගල්‍යායනතෙමේද, කාශ්‍යප තෙමේද අනුරුද්ධතෙමේද පුණ්ණතෙමේද ආනන්ද තෙමේද යන මොහු එකල්හි සහෝදරයෝ සත් දෙනවූහ.

23 එකල්හි නැගණිතොමෝ උත්පල වර්ණාවූවාය. දාසී තොමෝ ඛුජ්ජුත්තරාවවූවාය. එකල්හි දාසතෙමේ චිත්ත නම් ගෘහපති විය. යක්ෂතෙම ශාතාගිරනම් විය.

24 එකල්හි හස්තිතෙමේ පාරිලෙය්‍යනම් හස්තිවූයේය. ශ්‍රෙෂ්ඨවූ වානරතෙමේ මී දුන් වඳුරා වූයේය. එකල්හි ශක්‍ර තෙම කාළුදායි නම් විය. ජාතකය මෙසේ දරා ගණිවියයි” වදාළේය.

488 **සුරුචි ජාතකයඃ-** 1 සෘෂීන් වහන්ස, සියල්ලන්ට පළමුව ගෙණනලද මම සුරුචිනම් රජහුගේ භාය්‍ය්‍යාවවූ අගමෙහෙසිය වෙමි. යම්කලෙක සුරුචි රජතෙම මා ගෙණයේද, එතැන්පටන් දසදහසක් අවුරුදු මම මෙහි තනිව වාසය කෙළෙමි.

2 ඒ මම විදෙහ රට මියුළු නුවරට අධිපතිවූ සුරුචි නම් රජහු කයින් හෝ වචනයෙන් හෝ සිතින් හෝ ඉදිරියෙහිද රහසෙහිද ඉක්මවා සිතීමියයි නොදනිමි.

3 “සෘෂීන් වහන්ස, මේ සත්‍ය වචනය කරණකොට ගෙණ මට පුතෙක් උපදීවා. බොරුකියන්නාවූ මාගේ මුදුන සත් කඩක්ව පැලේවා.

4 සෘෂීන්වහන්ස, ප්‍රිය මනාපවූ මාගේ ස්වාමීහුගේ මව්ද පියාද යන ඒ නැදිමයිලන් දෙදෙනා මා හික්මවන්නාහු යම්තාක් ජීවත්ව සිටියාහුද ඒ තාක්

5 ඒ මම අවිහිංසා ඇළුම් ඇත්තී ඒකාන්තයෙන් කුශල ධර්මයන්හි හැසිරෙන්නී රෑ දාවල් දෙක්හි අනලස්ව ඔවුන්ට සකස්කොට උපස්ථාන කෙළෙමි.

6 සෘෂීන් වහන්ස, මේ සත්‍ය වචනය කරණකොට ගෙණ මට පුත්‍රයෙක් උපදීවා. බොරු කියන්නීවූ මාගේ හිස සත්කඩක්ව පැලේවා.

7 බ්‍රාහ්මණය, සමාන භාය්‍ය්‍යාවූ සොළොස් දහසක් ස්ත්‍රීහු වෙත්. ඔවුන් කෙරෙහි කිසිකලෙකත් මාගේ ඊෂ්‍ය්‍යාවක් හෝ ක්‍රොධයක් හෝ නොවීය.

8 ඔවුන්ට හිත වශයෙන් සතුටුවෙමි. කිසි ස්ත්‍රියකුත් මට අප්‍රිය නොමවිය. හැමකල්හි ඒ සියලුම සම්පත්තීන්ට තමාට මෙන් අනුකම්පා කරමි.

9 ස්‍වාමීන් වහන්ස, මේ සත්‍ය වචනය කරණකොට ගෙණ මට පුතෙක් උපදීවා බොරු කියන මාගේ හිස සත් කඩකට පැලේවා.

10 දාසයන්ය, කම්කරුවන්ය, පණිවිඩකාරයන්ය යන සෙසු අනුව ජීවත්වන්නාවූ යම් කෙනෙක් වෙද්ද, ඔවුන් හැම කල්හි සතුටුවූ ඉඳුරන් ඇත්තී සමාන භාවයෙන් පොෂණය කරමි

11 ස්‍වාමීන් වහන්ස, මේ සත්‍ය වචනය කරණකොට ගෙණ මට පුත්‍රයෙක් උපදීවා. බොරු කියන්නාවූ මාගේ හිස හත් කඩක්ව පැලේවා.

12 තවද ශ්‍රමණයන්ද බ්‍රාහ්මණයන්ද සෙසු වනිබ්බක යාචකයන්ද හැමකල්හි පිරිසිදු අත් ඇත්තී ආහාරයෙන් හා පානයෙන් සතුටු කෙරෙමි.

13 ස්‍වාමීන් වහන්ස, මේ සත්‍ය වචනය කරණ කොට ගෙණ මට පුතෙක් උපදීවා බොරු කියන්නී නම් මාගේ හිස හත් කඩක්ව පැලේවා.

14 තවද පක්ෂය සම්බන්ධවූ යම් තුදුස්වකය, පසළොස්වකය අටවකය ප්‍රාතිහාර්‍ය්‍ය පක්ෂය යන දවස් වෙද්ද, ඒ පොහෝ දිනයන්හි හැමකල්හි පංචසීලයෙහි පිහිටියාවූ මම අංග අටකින් යුත් පෙහෙවස සමාදන්ව වාසය කරමි.

15 ස්‍වාමීන් වහන්ස, මේ සත්‍ය වචනය කරණකොට ගෙණ මට පුත්‍රයෙක් උපදීවා බොරු කියන්නී නම් මාගේ හිස සත් කඩක්ව පැලේවායි කීයේය.

16 සොඳුරුවූ යශස් ඇති රාජපුත්‍රිය, නුඹ තමන් කෙරෙහි විද්‍යමානවූ යම් ගුණ ප්‍රකාශ කෙළෙහිද, ඒ සියලුම ස්වභාව ගුණයෝ තී කෙරෙහි විද්‍යමානවෙත්.

17 ක්ෂත්‍රිය වූ ජාතිසම්පන්නවූ අතිජාත පුත්‍රවූ යශපිරිවර ඇත්තාවූ විදෙහ වාසීන්ට ධර්ම රාජන්වූ පුත්‍රයෙක් ඔබට උපදින්නේයයි ශක්‍රතෙම වරප්‍රදානය කෙළේය.

18 තවුස් වෙස් ගත්තාවූ රජස් දැලිවගුල සිරුර ඇති හිස්වූ අහසෙහි සිටියාවූ යමෙක් මාගේ සිතට වැදගන්නාවූ මනොඥවූ වචන කියන්නෙහිද.

19 "මෙහි පැමිණියාවූ ඒ නුඹවහන්සේ දෙව්ලොවින් ආ දෙවතාවෙක් වෙහිද, මහත් සෘර්ධි ඇත්තාවූ සෘෂිවරයෙක් හෝ වෙහිද කවරෙක් හෝ වෙහිදැයි තමන් මට කියවයි කීයේය.

20 "සුධර්මා නම් දිව්‍ය සභාවෙහි රැස්වූ දිව්‍ය සමූහයෝ යමෙකුට වඳිත්ද, දහසක් ඇස් ඇති ශක්‍ර නම්වූ ඒ මම තීගේ සමීපයට ආයෙමි.

21 "මේ සත්ව ලෝකයෙහි සමවූ හැසුරුම් ඇති නුවණැත්තාවූ සිල්වත්වූ නැදිමයිලන් දෙවිකොට ඇති පතිව්‍රතා රක්නාවූ යම් ස්ත්‍රීහු වෙද්ද,

22 "එබඳු ගුණ ඇති යහපත් නුවණ ඇති පවිත්‍රවූ කර්මාන්ත ඇති මනුෂ්‍යවූ ස්ත්‍රියගේ දැකීමට අමනුෂ්‍යවූ දෙවියෝද එන්නාහ.

23 "සොඳුර, නුඹද පෙර පුරුදුකළාවූ සුචරිත හේතුවෙන් මෙහි රජ කුලයෙහි උපන්නී සියලු කැමති සම්පත්තීන් සමෘද්ධවූවාය.

24 "රාජ පුත්‍රිය, නුඹගේ දෙව්ලොව ඉපදීමද මෙලොව මනුෂ්‍ය ජීවිතයෙහි කීර්තියට පැමිණීමද යන මෙය දෙලොව ජය ගැණීමවේ.

25 "මනා නුවණ ඇත්තිය, නුඹ බොහෝකල් සුව ඇළෙනී තමා කෙරේ පැවැති ගුණ ධර්මය ආරක්ෂා කරව, ඒ මම දෙව්ලොවට යමි. තීගේ දැකීම මට ප්‍රියවේයයි කියාද ශක්‍රතෙම ගියේය."

489 **පඤ්චුපොසථ ජාතකයඃ-** 1 "කපෝත පක්ෂිය, දැන් නුඹ ගොදුරෙහි ආලය නැත්තේය. නුඹට ආහාරයෙන් ප්‍රයෝජනයෙක් නැත්තේද, පින්වත් පරෙවිතෙමේ කුමක් හෙයින් සාපිපාස දෙක ඉවසමින් පෙහෙවස් රක්නේදැයි (තාපසතෙම ඇසීය)

2 "පින්වත් තාපසයන් වහන්ස, පෙර මම පරෙවි ධෙනුව කෙරෙහි ඇලීමට ගියෙමි. මේ භූමිප්‍රදෙශයෙහි අපි දෙදෙන කාමාශාවෙන් සිත් අලවා වාසය කෙළෙමු. එකල්හි උකුස්සෙක්

පරෙවි ධෙනුව අල්වා ගත්තේය. එබැවින් මම නොකැමැත්තේම ඇගෙන් වෙන්වීමි.

3 "ඇගේ නැතිවීමෙන්වූ වියෝග දුක හේතුකොට ගෙණ සිතෙහි හටගත් වේදනාව විඳිමි. එහෙයින් මම පෙහෙවස් රකිමි. රාගයතෙම මට නැවත නොපැමිණේවායි (පරෙවියා කීයේය)

4 "ඍජුව නොයන්නාවූ ඇලයින් ගමන් කරන්නාවූ දිව් දෙකක් ඇති සර්පය, නුඹ දළ ආවුධකොට ඇති දරුණු විෂ ඇත්තෙක් වෙහිය. පින්වත් සර්පතෙමේ කුමක්හෙයින් සාපිපාස දෙක ඉවසමින් පෙහෙවස් රකීදැයි ඇසීය.

5 "පින්වත, ග්‍රාම භෝජකයාගේ සැලෙන මොල්ලිය ඇති වර්ණයෙන් හා ශක්තියෙන් යුක්තවූ බලවත් වෘෂභයෙක් විය. හෙතෙම මා පයින් මැඩපීය. කිපියාවූ මම ඔහු දෂ්ට කෙළෙමි. දුකින් පෙළුනාවූ ඒ ගවතෙම මරණයට පැමිණියේය.

6 "ඉක්බිති ගම්වාසී ජනයෝ නික්ම අවුත් හඬා වැළපී පිටත්ව ගියාහුය. එහෙයින් මම පෙහෙවස් රකිමි. ක්‍රොධයතෙම මට නැවත නොපැමිණේවායි සර්පයා කීයේය.

7 "සොහොන්හි මළවුන්ගේ මස් බොහෝ වෙත්. තොපට මේ ආහාරය මනහර ස්වභාව ඇත්තේය. පින්වත් සිවල්තෙමේ සාපිපාස දෙක ඉවසමින් කුමක්හෙයින් පෙහෙවස් රකීදැයි ඇසීය.

8 "ස්වාමීනි, මම ඇත් කුණපයෙක්හි ඇළුනේ මළ ඇතුගේ මසෙහි ඉතා ගිජුවූයේ මහත්වූ ඇතෙකුගේ කුසයට ඇතුල්ව ගියෙමි. උණුසුම් වාතයද ඒ තියුණුවූ සූර්‍ය්‍යරශ්මීහුද ඒ ඇතුගේ මළ මාර්ගය වියලවූහ.

9 "ස්වාමීනි, ඒ මම කෘශවූයේද පඬුවන් වූයේද වීමි. එහි මට නික්මීමට මාර්ගයක් නොවීය. හදිසියෙන් මහත්වූ වර්ෂාවක් වැස්සේය. උගේ මළ මාර්ගය තෙමුයේය.

10 "ස්වාමීනි, ඉක්බිත්තෙන් මම රාහු මුඛයෙන් මිදුනාවූ චන්ද්‍රයාමෙන් ඉන් පිටතට නික්මුනෙමි. එහෙයින් මම පෙහෙවස් රකිමි. ලෝභය තෙම මට නැවත නොපැමිණේවායි සිවලා කීයේය.

11 "යහළුව, පෙර නුඹ හුඹස් තුළ වේයන් අනුභව කරමින් හැසුරුනෙහිය. පින්වත් වලස්තෙමේ දැන් සාපිපාස දෙක ඉවසමින් කුමක් හෙයින් පෙහෙවස් රක්නේදැයි ඇසීය.

12 "ස්වාමීනි, මම ස්වකීය නිවාසයවූ වනලැහැබට නින්දා කරමින් අධික ආශා ඇති බැවින් මලය ප්‍රදෙශයට ගියෙමි. ගම්වැසි ජනයෝ එයින් නික්ම අවුත් දුනු දඬු මුගුරුවලින් මට තැළුවාහුය.

13 "බිඳුනාවූ හිස ඇති ලේ තැවරුණු සිරුරු ඇති ඒ මම ස්වකීය නිවාසස්ථානයට පෙරලා ආයෙමි. එහෙයින් මම පෙහෙවස් රකිමි. අධික ආශා ඇති බව මට නැවත නොපැමිණේවායි වළසා කීයේය.

14 "ස්වාමීනි, නුඹවහන්සේ අපගෙන් යම් කරුණක් විචාළාහුද, අපි සියල්ලෝම දන්නා පරිද්දෙන් එය ප්‍රකාශ කෙළෙමු. ස්වාමීනි, අපිදු නුඹවහන්සේ විචාරමු. බ්‍රාහ්මණය, පින්වතුන් වහන්සේ කුමක්හෙයින් පෙහෙවස් රක්නේදැයි ඇසූහ.

15 "කෙළෙසුන්ගෙන් නොතැවරුණාවූ පසේ බුදුවරයෙක් මාගේ අසපුවෙහි මොහොතක් කල් වැඩහුන්නේය. උන්වහන්සේ මට යායුතු තැනද ආවාවූ තැනද නමද ගොත්‍රයද චරණ ධර්මයද යන සියල්ල දෙශනා කළසේක.

16 "මෙසේ වුවද මම් උන්වහන්සේගේ පා නොවැන්දෙමි. මාන සහගත සිතින් උන්වහන්සේගෙන් එය නොමඇසුවෙමි. එහෙයින් මම පෙහෙවස් රකීමි. මානයතෙමේ මට නැවත නොපැමිණේවායි" තාපසතෙම කීයේය.

**490 මහා මෝර ජාතකය**:- 1 "යහළුව, ඉඳින් නුඹ විසින් මා වස්තුව හේතුකොට ගන්නා ලද්දේ නම් මා නොමරාවා. ජීවග්‍රහයෙන් ගෙණ මා රජුගේ සමීපයටද ගෙණ යව. එකල්හි බොහෝවූ වස්තුව ලබන්නෙහියයි හඟිමි.

2 "පින්වත් මයුර රාජය, දැන් මා විසින් මේ හීයතෙම ඔබ නැසීමට දුන්නෙහි තබන ලද්දේ නොවෙමි. ඔබගේ මලපුඩුවද මම සිඳලන්නෙමි. මයුර රාජතෙමේ සැපසේ යේවා.

3 "පින්වත, යම් හේතුවකින් සත්වසක් මුළුල්ලෙහි රැදාවල් සාපිපාස උසුලමින් මා ලුහුබැඳ ගියේද, එසේ ඇති කල්හි කුමකට මල පුඩුවෙහි බැඳුනාවූ මා බැම්මෙන් මුදන්ට කැමතිවෙහිද,

4 "යහළුව, අද නුඹ ප්‍රාණඝාතයෙන් වැළකුනේවෙහිද නුඹ විසින් සියලු සතුන් කෙරෙහි අභය දෙනලදද, යම් හෙයකින් මළපුඩුවෙහි බැඳුනාවූ මා බැම්මෙන් මුදන්ට කැමති වන්නෙහිද, එහෙයිනි.

5 "පින්වත් මයුර රාජය, යමෙක් ප්‍රාණඝාතයෙන් වළකින්නේද, සියලු සතුන්ට අභයදානය දේද, හෙතෙම මෙයින් චුතවූයේ කිනම් සුවයක් ලබාද, මේ කාරණය විචාරමි. එය මට කියනු මැනවයි ඇසීය.

6 "යහළුව, යමෙක් ප්‍රාණඝාතයෙන් වළකින්නේද, සියලු සතුන්ට අභයදානය දෙන්නේද, හෙතෙම මේ ආත්මයෙහිම ප්‍රශංසා ලබයි. ශරීරයාගේ භෙදයෙන් පසු ස්වර්ග ලෝකයටද පැමිණේයයි කියමි.

7 "ඇතැම් මහණ බමුණෝ දෙවියෝ නැත්තාහයි කියත්. මෙලොවම ජීවිතෙන්ද්‍රිය විනාශයට පැමිණේයයිද එසේම සුකෘත දුෂ්කෘතයන්ගේ විපාක නැතැයිද, දානය අඥානයන් විසින් පණවන ලද්දක්යයිද කියත්. ඒ රහතුන්ගේ වචනය අදහමින් ඒ හේතුවෙන් මේ ලිහිණින් මරා ජීවත්වෙමියි කීයේය.

8 "මනා දැකුම් ඇත්තාවූ සඳද හිරුද යන දෙදෙන අහසෙහි බබලමින් ගමන් කෙරෙත්. ඔව්හු මෙලොවට අයත්ද, නොහොත් පරලොවට අයත්ද, මිනිස්ලොව ඒ මහණ බමුණෝ කෙසේ නම් කියත්දැයි ඇසීය.

9 "මනා දර්ශන ඇත්තාවූ චන්ද්‍රයාද සූය්‍ර්‍යයාද යන දෙදෙනා අහසෙහි බබළමින් ගමන් කරත්. ඔව්හු පරලොවට අයත්ය. මෙලොවට අයත් නොවෙත්. මනුෂ්‍ය ලෝකයෙහි ඔව්හු දෙවියෝයයි කියත්.

10 "යම් කෙනෙක් කර්මය නොකියද්ද, එසේම සුකෘත දුෂ්කෘතයන්ගේ විපාකය නොකියද්ද, යමෙකුත් දානය

අඥානයන් විසින් පණවන ලද්දක් කියයිද, අහේතුකවූ ලාමක වාද ඇත්තාවූ ඒ මහණ බමුණෝ මේ කරුණෙහිදීම නැසුනාහු වෙත්.

11 "මයුර රාජය, ඒකාන්තයෙන් ඔබගේ මේ වචනය සත්‍යය කෙසේ නම් දානය විපාක නැතැයි කියන්නේද, එසේම සුකෘත දුෂ්කෘතයන්ගේ ඵලයද අඥානයන් විසින් පනවන ලද්දක් නම් කෙසේ වන්නේද,

12 "මයුර රාජය, කෙසේ කරන්නේ කවර දෙයක් කරන්නේ කුමක හැසිරෙන්නේ කුමක් සේවනය කරන්නේ කිනම් තපස් ගුණයක් කරණකොටගෙණ යම්සේ මම නරකයෙහි නොවැටෙම්ද, මේ කාරණය මට කියව්.

13 "යහළුව, මේ ලෝකයෙහි යම්කිසි ශ්‍රමණකෙනෙක් ඇද්ද, කාශාය වස්ත්‍ර දරන්නාවූ අනගාරිකවූ නොකල්හි හැසිරීමෙන් වැළකුණාවූ ඒ සත්පුරුෂවූ පසේ බුදුවරයෝ වනාහි උදෑසනම සුදුසු කල්හි පිඬු පිණිස හැසිරෙත්.

14 "එහි සුදුසු කල්හි උන්වහන්සේලා කරා එළඹ තොපගේ සිතට යමක් කැමතිවන්නේද එය අසව. උන්වහන්සේලා තොපට මෙලොව සම්බන්ධවූද පරලොව සම්බන්ධවූද අර්ථය දන්නා පරිද්දෙන් ප්‍රකාශ කරත්.

15 "සර්පයෙක් තෙම පැරණිවූ දිරුවාවූ සැවය මෙන්ද නිල්වන්වූ වෘක්ෂයතෙම පඬුවන්වූ පත්‍රය මෙන්ද මාගේ මේ රෞද්‍රභාවය ප්‍රහීණවිය. මම දැන් මේ රෞද්‍රභාවය දුරුකරමි.

16 "මා විසින් සිය ගෘහයෙහි බඳනා ලද නොයෙක් සිය ගණන් යම් මේ පක්ෂීහු ඇද්ද. ඔවුන්ටද මම අද ජීවිතය දෙමි. මම මොක්ෂයටද පැමිණියෙමි. ඒ සත්‍යයෙන් ඒ සියලුම පක්ෂීහු ස්වකීය නිවාසස්ථානයට පැමිණෙත්වායි (සත්‍යක්‍රියා කෙළේය.)

17 "යශස් ඇත්තාවූ මයුර රාජයා බැඳගන්ට මළ පුඩු ගත් අත් ඇති වැද්දෙක් වනයෙහි හැසුරුනේය. ඒ වැද්දා යශස් ඇත්තාවූ මයුර රාජයා බැඳ යම්සේ මම දුකින් මිදුනේද, එසේම දුකින් මිදුනේයයි වදාළේය."

**491 තච්ඡක සූකර ජාතකයඃ-** 1 "යම් ඥාති සමූහයක් සොයමින් අපි පර්වතවලද වනාන්තරවලද හැසුරුණෙමුද, මා විසින් ලබනලද ඒ මේ ඥාතීන් සොයමින් හැසුරුණෙමි.

2 "මේ අල වර්ගද ගෙඩි වර්ගද බොහෝවේ. බොහෝවූ මේ කෑ යුතු දෙයද වේ. මේ පර්වත නදීහුද සිත් කළුවෙත්. අපට පහසුවූ වාසස්ථානයක් වන්නේය.

3 "නිරුත්සාහවූ සැක නැත්තාවූ ශෝකයක් නැත්තාවූ කොයිනුත් බියක් නැත්තාවූ මම සියලු නෑයන් සමග මෙහිම වාසය කරන්නෙමියි" තච්ඡ ශූකරතෙම කීයේය.

4 "එම්බා තච්ඡ ශූකරය, අන්‍යවූ ලෙනක් සොයව, අපට මෙහි සතුරෙක් ඇත්තේය. ඒ සතුරා මෙහි පැමිණ හොඳ හොඳ ඌරන් මරාගණීයයි" කීවාහුය.

5 "අපට මෙහි කවරෙක් සතුරුවේද, මනාව එක්වූ නොමැඩිය හැක්කාවූ නෑයන් කවරෙක් මඩීද, මාවිසින් විචාරණ ලද්දාවූ තෙපි එය මට කියව්.

6 "තච්ඡය, උඩුකුරුව ගියාවූ රේඛා ඇති මෘගරාජවූ බල ඇත්තාවූ දළ ආයුධකොට ඇති ව්‍යාඝ්‍ර මෘගයෙක් වේ. හෙතෙම මෙහි පැමිණ හොඳ හොඳ ඌරන් මරාගණීයයි" කීවාහුය.

7 "අපට දළ නැත්තාහු නොවෙත්. බලයද ශරිරයෙහි මනාව හටගත්තේය. අපි සියල්ලෝ සමගිව තනිවවූ ඔහු වසඟ කරන්නෙමුයි" (තච්ඡයා කීයේය.)

8 "එම්බා තච්ඡකය, සිතට කා වදින්නාවූ කණට සුව එළවන්නාවූ වචනයක් කීයෙහිය. යමෙකුත් සටනෙහි පැනයන්නේ නම් ඔහුද පසුව නසම්හයි" කීවාහුය.

9 "එම්බා ව්‍යාඝ්‍රය, යම්බඳුවූ නුඹ සූකර සමූහයා මැදට පැමිණ බැගෑවූවෙකු මෙන් අද ප්‍රාණඝාතයෙන් වැළකුණේ වෙහිද, නැතහොත් සිතමින් සිටිනෙහිද, ඒ නුඹ විසින් සියලු සතුන්ට අභය දෙන ලදද, නුඹගේ දළ නැද්ද, මෘග වීයෑ නැද්දැයි" ජටිලතෙම ඇසීය.

10 "තාපසයාණෙනි, මාගේ දළ නැත්තාහු නොවෙත්. ශරීර ශක්තියද මනාව පිහිටියේය. එතකුදුවුවත් සමගිව එකතුවූ නෑයන්ද දැක බියවීමි. එහෙයින් වනයෙහි තනිවූ මම කල්පනා කෙළෙමි.

11 "මේ උඟුරෝ වනාහි පෙර භයින් මැඩුනාහු වෙන වෙනම ලෙන් සොයන්නාහු දිශාවෙන් දිශාවට යෙත්. අද ඔව්හු යම්තැනක රැස්ව සිටියාහු මා විසින් මැඩලිය නොහැක්කාහු වෙද්ද, දැන් ඔව්හු එකතැන රැස්ව වසත්.

12 "පිරිස් නායකයෙකුගෙන් යුක්තවූ එකතුවූ සමගි කථා ඇත්තාවූ ඒ සියල්ලෝ මට හිංසා කරන්නාහුය. එහෙයින් අද මම ඔවුන් ප්‍රාර්ථනා නොකරමියි" කීයේය.

13 "එකම ශක්‍රතෙම අසුරයන් දිනයි. එකලාවම උකුසු තෙම පක්ෂීන් අල්වාගෙණ නසයි. තනිවම ව්‍යාඝ්‍රතෙමේ මෘග සමූහයා මැදට පැමිණ හොඳ හොඳ මෘගයා මරාගණියි. ඔහුගේ බලය එබඳුම යයි" ජටිලයා කීයේය.

14 "සමගිවූ නෑයන් සහිතවූ ව්‍යාඝ්‍ර බඳුවූවන් ශක්‍ර තෙමේද නොම වසඟ කරන්නෙහිය. උකුස්සාද වසඟ නොකරන්නේය. මෘගාධිපති ව්‍යාඝ්‍රතෙමේද වසඟයෙහි පවත්වන්ට නොහැකි වේයයි" කීයේය.

15 "සමූහ ඇත්තාවූ පිරිවර සමග හැසිරෙන්නාවූ කුම්භීලක නම් පක්ෂීහු සතුටු වෙමින් එකතුව ගොදුරු සොයමින් අහසට නගිත්. ගොදුරු ගෙණ අහසින්ද යෙත්."

16 "එසේ අහසින් යන්නාවූද ඔවුන්ගෙන් මෙහි එකෙක් ඉවත්ව යේද, උකුසුතෙම උඟද ගසා ගණියි. මෝතොමෝ ව්‍යාඝ්‍රයන්ගේ ස්වභාව ගතිය යයි' කීයේය.

17 "ආමිෂයෙහි ලොල්වූ ඇස් ඇති රෞද්‍රවූ ජටිලයා විසින් උත්සාහවත් කරණලද දළ ඇති ව්‍යාඝ්‍රතෙම පෙර මෙන් සිතමින් දළ ඇති හූරන් වෙතට පැන්නේය.

18 "බොහෝවූ නෑයෝ යහපත, වනයෙහි හටගත්තාවූ වෘක්ෂද බොහෝවූවාහු යහපත. සමගිවූ හූරන් විසින් එක

ගමනෙහිදීම ව්‍යාඝ්‍රතෙම නසන ලද්දේයයි" (වෘක්ෂ දේවතාවා කීය.)

19 "කූට ජටිල බ්‍රාහ්මණයාද ව්‍යාඝ්‍රයාද යන දෙදෙන නසා ශූකරයෝ සතුටු සිත් ඇත්තාහු ප්‍රමුදිතවූවාහු මහා නාදයෙන් නාද කළාහුයයි" වදාළේය.

20 "ඒ උදුම්බරෝ දිඹුල් ගස මුල රැස්වූවාහු නුඹ අපගේ අධිපතියාවූ රජ වෙහියයි තච්ඡකයා අභිෂෙක කළාහුයයි වදාළේය."

**492 මහා වානිජ ජාතකයඃ-** 1 "නොයෙක් රටින් පැමිණියාවූ වෙළෙන්දෝ රැස්ව එකෙකු ප්‍රධානියා කොට ධනය හැරගෙණ වෙළඳාමට ගියාහුය.

2 'ඒ වෙළෙන්දෝ ආහාර නැත්තාවූ ජලය නැත්තාවූ ඒ කාන්තාරයට පැමිණ සිත් කළුවූ සිහිල් සෙවන ඇති මහත්වූ නුග රුකක් දුටුවාහුය.

3 "මොහයෙන් වැසුනාවූ අඥානවූ ඒ වෙළෙන්දෝද, එහි නුගරුක සෙවණෙහි හිඳ මෙසේ සිතුවාහුය.

4 "වෙළඳුනි, මේ වෘක්ෂය තෙම තෙත්වූවාක් මෙන්වේ. මෙහි ජලයද වැගිරේ. එබැවින් මේ ගසේ පළමු අත්ත අපි සිඳිමු.

5 "ඒ ශාඛාවද සිඳින ලද්දීම නොකැලත්වූ නිර්මලවූ ජලය වැගුරුවේය. ඒ වෙළෙන්දෝ එහි කැමතිතාක් ස්නානය කොටද පානය කොටද සතුටුවූහ.

6-7 "මෝහයෙන් මුළාවූ අඥානවූ ඒ වෙළෙන්දෝ දෙවනුව මෙසේ සිතූහ. එබැවින් අපි මේ වෘක්ෂයාගේ දකුණු අත්ත සිඳීමුයි ඒ දකුණු අත්තද සිඳින ලද්දීම බොහෝවූ මස් සහිත ඇල් සාලේ බතද දිය නුමුසු කිරිබත් වැනි කොමුපිඩුද අවුළුපත්ද මුද්ගාදී සූපයන්ද වැගුරුවේය.

8 "ඒ වෙළෙන්දෝ එහි භෝජනය කොට කැමතිතාක් අනුභව කොට සතුටුවූහ. මෝහයෙන් මුළාවූ අඥානවූ ඒ වෙළෙන්දෝ තුන්වෙනුව සිතුවාහුය.

9 "එබැවින් අපි මේ වෘක්ෂයාගේ පශ්චිම ශාඛාව සිඳිමුයි වෙළෙන්දෝ සිතූහ. ඒ ශාඛාවද සිඳින ලද්දීම අලංකාරයෙන් සැරසුනාවූ ස්ත්‍රීන් වැගුරුවේය.

10 "තවද උන් අතුරෙන් එක එක වෙළෙන්දාම විසිතුරු වස්ත්‍රාභරණ ඇති අවුණනලද මිණි කොඩොල් ඇති එක එක ස්ත්‍රියද ගැල් නායකයා වෙත ස්ත්‍රීන් විසි පස්දෙනෙක්ද වූහ.

11 "ඒ වෘක්ෂය සෙවනෙහි හාත්පස පිරිවැරූහ. ඒ වෙළෙන්දෝ ඒ ස්ත්‍රීන් සමග කැමතිතාක් පරිචරණය කොට සතුටු වූහ.

12 "මෝහයෙන් මුළාවූ අඥාන වෙළෙන්දෝ එබැවින් මේ වෘක්ෂයාගේ උතුරෙහිවූ අත්ත අපි සිඳිමුයි සතර වෙනුව සිතුවාහුය.

13 "ඒ ශාඛාවද සිඳින ලද්දීම බොහෝවූ මුතුද වෙරළු මිණිද රිදීද රත්‍රංද කුත්තක නම් ඇතිරිද හෙවත් ඇතුන් පිට අතුරණ පලස්ද ලොම්මුවා පසතුරු නාද වැගුරුවේය.

14 "කශී සළුද උද්දියාන නම් කම්බිලිද වැගුරුවේය. ඒ වෙළෙන්දෝ එහි කැමතිතාක් බර බැඳගෙණ සතුටුවූහ.

15 "මෝහයෙන් මුළාවූ අඥානවූවාහු එබැවින් අපි මේ වෘක්ෂයාගේ මුල සිඳිමු. තවද වැඩියක් වස්තුව ලබමුයි පස් වෙනුව සිතුවාහුය.

16 "ඉක්බිති වෙළඳුනි, තොපට යහපතක් වේවායි කරණලද ඇඳිලි ඇත්තේ නුග රුක කෙරෙහි කුමට අපරාධ කරව්දැයි, යාඥා කරමින් එය වලකන්ට සාර්ථවාහකතෙම නැගී සිටියේය.

17 "වෙළඳුනි, තොපට යහපතක් වේවා. මේ ගසෙහි පෙරදිග අත්ත ජලය දුන්නීය. දකුණු දිග අත්ත ආහාර පානද දුන්නීය පැසුළු දිග අත්ත ස්ත්‍රීන් දුන්නාය. උතුරු දිග අත්ත සියලු කැමති වස්තූන්ද දුන්නාය. එහෙයින් මේ නුග රුක කෙරෙහි කුමට වරද කරව්ද,

18 "යම් ගසක්හුගේ සෙවණෙහි ඉන්නේද, නිදීම හෝ කරන්නේද ඒ ගසේ අත්ත නොබිඳින්නේය. මිත්‍ර ද්‍රෝහිකම වනාහි ලාමකවේයයි කීයේය.

19 "බොහෝවූ ඒ වෙළෙන්දෝද තනිවූ ඒ ගැල් නායකයාගේ කීම නොගෙණ මුවහත්වූ ඒ පොරෝවලින් ඒ ගස මුලින් කපන්ට පටන් ගත්තාහුය.

20 "ඉක්බිති සටනට සැරසුනාවූ නාගයෝ විසිපස් දෙනෙක්ද දුනු ඊ ගත්තවුන්ගෙන් තුන් සියයක්ද යුද්ධ සැට්ටලූවාවූ සදහසක්ද නික්මුනාහුය.

21 "මොවුන් නසව්, බඳිව්, මොවුන්ගේ ජීවිතය නොමුදව්, ගැල් නායකයා හැර උන් සියල්ලන් හළු කරව්යයි (නාරජතෙම නියෝග කෙළේය)

22 "එහෙයින්ම නුවණැති පුරුෂතෙමේ තමහට වැඩ දක්නේ ලෝභයාගේ වසඟයට නොයන්නේය. ඒ ලෝභ සහගත සතුරු සිත නසන්නේය.

23 "තෘෂ්ණාව දුක හට ගන්නකැයි මේ දෝෂය දැන පහකළාවූ තෘෂ්ණා ඇති තෘෂ්ණා වශයෙන් නොගන්නාවූ ස්මෘති සම්පන්නවූ භික්ෂුතෙමේ වාසය කරන්නේයයි වදාළේය."

**493 සාධීන ජාතකයː-** 1 "යම් හෙයකින් යශස් ඇත්තාවූ අපගේ වෛදේහ රජහට දිව්‍ය රථයක් පහළවූයේද එහෙයින් ලෝකයෙහි ඒකාන්තයෙන් ලොමු ඩැහැගන්නාවූ ආශ්චර්‍ය්‍යයෙක් පහළ විය.

2 දිව්‍ය රථාචාරීවූ මහත් ඍද්ධි ඇත්තාවූ මාතලී නම් දිව්‍ය පුත්‍ර තෙම විදෙහරට මියුළු නුවර අධිපතිවූ සාධීන නම් රජුට ආරාධනා කෙළේය.

3 දිශාවන්ට අධිපතීවූ රාජෝත්තමය, එනු මැනව, මේ දිව්‍ය රථයට නගිනු මැනව, ශක්‍රයා සහිතවූ ඒ තව්තිසා වැසි දෙවියෝ ඔබ දකිනු කැමැත්තාහුය. ඒ දෙවියෝ සිහි කරන්නාහුම සුධර්මානම් දිව්‍ය සභාවෙහි හිඳිත්.

4 ඉක්බිති සාධින රජතෙමේද ප්‍රමුඛව රථයට නැංගේය. දහසක් අසුන් යෙදූ රථයට නැග දෙවියන් වෙත ගියේය. දෙවියෝ ආවාවූ ඒ රජහු දැක පිළිගෙණ සතුටුවූහ.

5 "මහරජ, ඔබගේ මෙහි යහපත් පැමිණීමකි. තවද ඔබගේ අප සමීපයට පැමිණීමකි. රාජොත්තමය, දැන් සක්දෙව් රජහුගේ සමීපයෙහි හිඳිනු මැනව, ශක්‍රතෙමේද මියුළු නුවර අධිපතිවූ වේදේහ රජු පිළිගනිමින් සතුටු විය. ශක්‍රතෙම කම්සැපවලින්ද ආසනයෙන්ද පැවරීම් කෙළේය.

6 රාජොත්තමය, කාමයන් වසඟයෙහි පවත්වන්නාවූ දෙවියන්ගේ වාසස්ථානයට පැමිණීම යහපත්වූයේය. සියලු කාම සම්පත්තියෙන් සමෘද්ධවූ දෙවියන් අතර වාසය කරව. තව්තිසා වැසි දෙවියන් කෙරෙහිවූ මිනිසුන් අයත් නොවූ කාමයන් අනුභව කරවයි කීයේය.

7 ශක්‍රදෙවෙන්ද්‍රය, පෙර මම දෙව්ලොවට පැමිණියේ නෘත්‍යවලින්ද ගීතවලින්ද වාද්‍යවලින්ද සිත් ඇලවිමි. ඒ මම දැන් දෙව්ලොව සිත් නොඅලවමි. ආයුෂය ගෙවී ගියේද, මරණය ළඟාවූයේද, නොහොත් මුළාවූයෙම්දැයි ඇසීය.

8 නරවීර ශ්‍රෙෂ්ඨය, නුඹගේ ආයුෂ ක්ෂය වූයේද නොවෙයි. මරණයද දුරවේ. මුළාවූයේද නොවෙයි. යම් පුණ්‍යයන්ගේ විපාකය මෙහි වින්දහුද, නුඹගේ ඒ පින් මඳවූහ.

9 දිශාවන්ට අධිපතිවූ රාජොත්තමය, දෙවියන්ගේ ආනුභාවයෙන් හෙවත් පිනෙන් මෙහි වාසය කරව. තව්තිසා වැසි දෙවියන් කෙරෙහි මිනිසුන් අයත් නොවූ කාමයන් අනුභව කරවයිද, (ශක්‍රතෙම කීයේය.)

10 අනුන්ගෙන් ඉල්වාගත් යානාවක් යම්සේ අනුන්ගෙන් ඉල්වාගත් වස්තුවක් යම්සේද අනුන් දුන් පිනෙන් යමක් ලබානම් මේ කාරණයද මෙසේ දතයුතුයි.

11 අනුන් විසින් දීමෙන් යමක් ලබාද, මෙය මම නොකැමැත්තෙමි. තෙමේ කරණ ලද්දාවූ පින් ඇද්ද, එය මට ආවේනික ධනයවේ.

12 ඒ මම ගොස් මිනිසුන් අතර යමක්කොට සුවපත් වේද, පසු තැවිලි නොවේද, දන්දීමෙන්ද සමවූ හැසිරීමෙන්ද, සීල සංයමයෙන්ද ඉන්ද්‍රිය දමනයෙන්ද එබඳුවූ බොහෝ කුශල් කරන්නෙමියි (රජතෙම කීයේය.)

13 පුත නාරදය, මේ ඒ භූමි භාගයෝ වෙත්. මේ මනා කුණ්ඩල ඇති දිය සොරොව්ද වේ. මේ ඒ නිල්වන්වූ ජල බහුල භූමීහුද වෙත්. මේ ගලාබස්නාවූ නදී හුද වෙත්.

14 සිත්කළුවූ සක්වාලිහිණින් විසින් පවත්වන ලද නාද ඇති මන්දාලකයන්ගෙන්ද පියුම් උපුල්වලින්ද ගැවසී ගත්තාවූ ඒ මේ පොකුණු වෙත්. මා සමග හැසුරුනාවූ යම් කෙනෙක් මේ ස්ථානයන්ට ප්‍රිය කළාහුද ඔව්හු දැන් කවර දිශාවකට ගියාහුද.

15 පුත නාරදය, මේ උයනෙහි ඒ ක්ෂෙත්‍රයෝද වෙත්. ඒ භූමිප්‍රදෙශයද වේ. ඒ උයන් වතුද වෙත්. ඒ මේ වනයෙහි හැසිරෙන තැන්ද වෙත්. මාගේ ඒ පිරිවර ජන සමූහයා නොදක්නාවූ මට මේ සියලු දිශාවන් සිස්වූවක් මෙන් වැටහේයයි කීයේය.

16 පුත නාරදය, සක්දෙව් රජහුගේ හමුවෙහිද, සෙසු දෙවියන්ගේ හමුවෙහිද, සිව්දිග බබළන්නාවූ දිව්‍ය විමාන මා විසින් දක්නා ලදහ.

17 සියලු කාම සම්පත්තියෙන් සමෘද්ධවූ තව්තිසා වැසි දෙවියන් අතර මා විසින් දිව්‍යභවනයෙහි වසනලදී. මිනිසුන් අයත් නොවූ කම්සැප අනුභව කරණ ලදී.

18 ඒ මම මෙබඳුවූ දිව්‍යසැප දැක පිං සඳහා මෙහි ආයේ වෙමි. මම කුශල ධර්මයෙහිම හැසිරෙන්නෙමි. රාජ්‍ය සම්පත්තියෙන් ප්‍රයෝජන ඇත්තෙක් නොවෙමි.

19 සර්වඥවරයෝ ධර්ම මාර්ගයකින් ගමන් කෙරෙද්ද, සර්වඥවරයන් විසින් දෙශනා කරණ ලද බහා තබනලද දඬු ඇත්තවුන් විසින් යායුතු මාර්ගයවූ ඒ ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයෙහි පිළිපදින්නෙමියි කීයේය.”

**494 දශ බ්‍රාහ්මණ ජාතකයඃ-** 1 කුශල ධර්මයන් කැමතිවූ යුධිට්ඨිල නම් රජතෙම විධුර පණ්ඩිතයාට මෙසේ කීයේය. යහළුවූ විධුර පණ්ඩිතයාණෙනි, යම් කෙණෙක් මාගේ භෝජනය වළඳන්නාහුද, යමෙකුට දුන් දෙය මහත් ඵල වේද, එබඳුවූ සිල්වත්වූ බහුශ්‍රැතවූ මෛථුන ධර්මයෙන් වැළකුණාවූ බ්‍රාහ්මණයන් සොයව, දක්ෂිණාව දෙන්නෙමුයි කීයේය.

2 දෙවයන් වහන්ස, යම් කෙනෙක් ඔබගේ භොජනය වළඳන්නාහුද, එබඳු සිල්වත්වූ බහුශ්‍රැතවූ මෙවුන් දමින් වැළකුනාවූ බ්‍රාහ්මණයෝ දුර්ලභ වෙත්.

3 මහරජ, යම් මේ බ්‍රාහ්මණ කුලදශයක් වෙද්ද, ඔවුන්ගේ විභාගය සොයනලදී. ඒ විස්තර වශයෙන් මගෙන් අසනු මැනව.

4 මහරජ ඇතැම් බමුණෝ කට අවුරණලද මුදල් පිරුණු පසුම්බි ගෙණ බෙහෙත් ද්‍රව්‍යයන් ගැටගසා දෙත්. බෙහෙත් දියෙන් නෑවීමද කරත්. මන්ත්‍ර ජපයද කරත්.

5 මහරජ, වෙදුන් හා සමානවූ ඔව්හුද බ්‍රාහ්මණයෝ යයි කියනු ලැබෙත්. ඔව්හු මා විසින් වෙද බ්‍රාහ්මණයෝයයි කියන ලදහ. මහරජ, එබඳු බමුණන් වෙත පැමිණ ආරාධනා කරන්නෙමුයි කීයේය.

6 විධුර පණ්ඩිතය, ඔව්හු බ්‍රාහ්මණ බැවින් තොරවූවාහුය. ඔව්හු බ්‍රාහ්මණයෝයයි නොකියනු ලැබෙතියයි කෝරව්‍ය රජතෙම කීයේය. යහළු විධුර පණ්ඩිතය, යම් කෙනෙක් මාගේ භෝජනය අනුභව කරන්නාහුද, යමෙකුට දුන්දෙය මහත් ඵලවේද. එබඳුවූ මෛථුන ධර්ම සෙවනයෙන් වැළකුණාවූ බහුශ්‍රැතවූ සිල්වත්වූ අන්‍ය බ්‍රාහ්මණයන් සොයව, දක්ෂිණාව දෙන්නෙමුයි කීයේය.

7 ඒ ඇතැම් බමුණෝ කුළුතාලම් ගෙණ රජ ඇමති ආදීන් ඉදිරියෙහි වාදනයද කරත්. පණිවිඩවල යෙදෙත්. රථ ශිල්පයන්හිද හික්මවත්.

8 මහරජ, මෙහෙකරුවන් හා සමානවූ ඔව්හුද බ්‍රාහ්මණයෝයයි කියනු ලැබෙත්, මහරජ, ඔව්හු මා විසින්

පරිචාරක බ්‍රාහ්මණයෝයයි කියන ලදහ, එබඳු බ්‍රාහ්මණයන් වෙත පැමිණ ආරාධනා කරම්හයි කීයේය.

9 ඔව්හු බ්‍රාහ්මණ භාවයෙන් තොරවූවාහුය. ඔහු බ්‍රාහ්මණයෝයයි නොකියනු ලැබෙත්. මෙසේ කෝරව්‍ය රජතෙම කීයේය.

10 "යහළු විධුර පණ්ඩිතය, යම් කෙනෙක් මාගේ භෝජනය වළඳන්නාහුද, යමෙකුට දුන් දෙය මහත්ඵල වේද, එබඳු අන්‍යවූ සිල්වත්වූ බහුශ්‍රැතවූ මෛථුන්දම් සෙවීමෙන් වැළකුණාවූ බමුණන් සොයව. දක්ෂිණාව දෙන්නෙමුයි කීයේය.

11 "මහරජ, ඇතැම් බමුණෝ කමඬලාවක්ද වක් දණ්ඩක්ද ගෙණ ගම්වලද, නියම්ගම්වලද රජුන් වෙත එළඹෙන්නාහුය. ගමෙහිද වෙණෙහිද නුදුන් කල්හි නොනැගිටින්නෙමුයි ඉඳගන්නාහුය.

12 "මහරජ, නිග්‍රහකොට ගන්නවුන් සමානවූ ඔව්හුද බ්‍රාහ්මණයෝයයි කියනු ලැබෙත්. මහරජ, ඔව්හුද මා විසින් කියන ලදහ. එබඳු බමුණන් වෙත එළඹ ආරාධනා කරමුයි කීයේය.

13 "යහළු විධුර පණ්ඩිතය, ඔව්හු බ්‍රාහ්මණ භාවයෙන් තොරවූවාහුය. ඔව්හු බ්‍රාහ්මණයෝයයි නොකියනු ලැබෙතියි කෝරව්‍ය රජතෙම කීයේය.

14 "යම්කෙනෙක් මාගේ භෝජනය වළඳන්නාහුද, යමෙකුට දුන් දෙය මහත්ඵල වේද, එබඳු අන්‍යවූ සිල්වත්වූ බහුශ්‍රැතවූ මෛථුන්දමින් වැළකුණාවූ බමුණන් සොයව. දක්ෂිණාව දෙන්නෙමු.

15 "ඉතා වැඩුනු කිසිලි ලොම් හා නිය ඇති මැලියම් සහිත දත් ඇති රජසින් ගැවසීගත් හිස් ඇති රජස් ධූලිවලින් ගැවසීගත්තාවූ ඒ සමහර බමුණෝ ඉල්වමින් හැසිරෙත්.

16 "මහරජ, දාගිය කනු හා සමානවූ ඔව්හුද, බ්‍රාහ්මණයෝයයි කියනු ලැබෙත්. මහරජ ඔව්හු යාචක

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

බ්‍රාහ්මණයෝ යයි කියන ලදහ. එබඳුවූවන් වෙත එළඹ ආරාධනා කරමුයි කීයේය.

17 "ඒ බමුණෝ බ්‍රාහ්මණ භාවයෙන් තොරවූවාහුය. ඔව්හු බ්‍රාහ්මණයෝයයි නොකියනු ලැබෙත්යයි කෝරව්‍ය රජතෙම මෙසේ කීයේය.

18 "යහළු විධුරය, යම්කෙනෙක් මාගේ භෝජනය වළඳන්නාහුද, යමෙකුට දුන් දෙය මහත් ඵල වේද, එබඳු අන්‍යවූ සිල්වත්වූ බොහෝ ඇසූපිරූ තැන් ඇති මෙවුන්දම්න් වැළකුණාවූ බමුණන් සොයව. දක්ෂිණාව දෙන්නෙමුයි කීයේය."

19-20 "මහරජ, සමහරු අරළුද නෙල්ලිද අඹද දඹද බුළුද දෙල්ද දැහැටි දඬුද බෙලිද ඩෙබරද, ඇසළද උක්ද පැනි මුල්ද දුම්කෝවද මීද අඳුන්ද යන කුඩා මහත් විකිණියහැකි ද්‍රව්‍ය විකුණා ජීවත් වෙත්.

21 "මහරජ, වෙළඳුන් හා සමානවූ ඔව්හුද බ්‍රාහ්මණයෝයයි කියනු ලැබෙත්. මහරජ ඔව්හු වෙළඳ බ්‍රාහ්මණයෝ යයි කියන ලදහ. එබන්දන් වෙත පැමිණ ආරාධනා කරම්හයි කීයේය.

22 "ඔව්හු බ්‍රාහ්මණ භාවයෙන් තොරවූවාහුය. ඔව්හු බ්‍රාහ්මණයෝයයි නොකියනු ලැබෙත්යයි කෝරව්‍ය රජතෙම මෙසේ කීයේය.

23 "යහළු විධුර පණ්ඩිතය, යම් කෙනෙක් මාගේ භෝජනය වළඳන්නාහුද, යමෙකුට දුන් දෙය මහත්ඵල වේද, එබඳු අන්‍යවූ සිල්වත්වූ බොහෝ ඇසූ පිරූ තැන් ඇති මෙවුන්දම්න් වැළකුණාවූ බමුණන් සොයව. දක්ෂිණාව දෙන්නෙමුයි කීයේය.

24 "මහරජ, සමහරු සීසෑම, වෙළඳාම කරවත්. එළු තිරළුවන් ඇති කරත්. තමන්ගේ කුමරියන් හිරණ්‍ය ස්වර්ණ ගෙණ අනුන්ට පාවා දෙත්. මෙසේ කරමින් විවාහද කරත්. තම පුතුන්ට ආවාහද කරත්.

25 "කෙළෙස් ගැහැවීයන් හා සමානවූ ඔව්හුද, බ්‍රාහ්මණයෝයයි කියනු ලැබෙත්. මහරජ, ඒ කෙළෙඹි

ගැහැවියන් සමාන බ්‍රාහ්මණයෝ මා විසින් කියන ලදහ. එබඳු වූවන් වෙත පැමිණ ආරාධනා කරමුයි කීයේය.

26 "ඒ බ්‍රාහ්මණයෝ බ්‍රාහ්මණ ධර්මයෙන් තොරවූවාහුය. ඔව්හු බ්‍රාහ්මණයෝයයි නොකියනු ලැබෙත්. කෝරව්‍ය රජතෙම මෙසේ කීයේය.

27 "යහළු විධුර පණ්ඩිතය, යම්කෙනෙක් මාගේ භෝජනය වළඳන්නාහුද, යමෙකුට දුන් දෙය මහත් ඵල වේද? එබඳු අන්‍යවූ සිල්වත් බහුශ්‍රැත මෛථුන්දම්න් වැළකුණාවූ බමුණන් සොයව. දක්ෂිණාව දෙන්නෙමුයි කීයේය.

28 "ඇතැම් බමුණෝ ගම්වල පුරෝහිතව නිබඳ දෙන භික්ෂාව වළඳත්. බොහෝදෙනා ඔවුන් වෙත පැමිණ නැකැත් ආදිය විචාරත්. ගවයන් කරඅඹන්නාහු හන්වඩු ගසන්නාහු වෙත්. එහි මීවෝය, හූරෝය, එළුවෝය යන සිව්පාවෝද නසනු ලැබෙත්.

29 "මහරජ, ගවයන් මරන්නවුන් හා සමානවූ ඔව්හුද බ්‍රාහ්මණයෝයයි කියනු ලැබෙත්. මහරජ, ඒ බමුණෝද මා විසින් කියන ලදහ. එබඳුවූවන් වෙත එළඹ ආරාධනා කරමුයි කීයේය.

30 "ඒ බමුණෝ බ්‍රාහ්මණ ධර්මයෙන් තොරවූහ. ඔව්හු බ්‍රාහ්මණයෝයයි නොකියනු ලැබෙතියි කෝරව්‍ය රජතෙම මෙසේ කීයේය.

31 "යහළු විධුර පණ්ඩිතය, යම්කෙනෙක් මාගේ භෝජනය වළඳන්නාහුද යමෙකුට දුන් දෙය මහත්ඵල වේද, එබඳු අන්‍යවූ සිල්වත් බහුශ්‍රැත මෛථුනධර්මයෙන් වැළකුණාවූ බමුණන් සොයව. දක්ෂිණාව දෙන්නෙමුයි කීයේය.

32 "මහරජ, සමහර බමුණෝ කඩු පළඟ දරාගෙණ කඩුවක් අතින් ගෙණ වෙළඳුන්ගේ ගමන් මාර්ගයන්හි සිටිත්. සොරුන් සිටින වනයෙන් ගැල්ද එතෙර කරවත්.

33 "ගොපොල්ලන්ද ගම් පහරණ සොරුන්ද සමානවූ ඔව්හුද බ්‍රාහ්මණයෝයයි කියනු ලැබෙත්. මහරජ ඔව්හුද මා විසින් කියන ලදහ. එබඳුවූවන් වෙත පැමිණ ආරාධනා කරමුයි කීයේය.

34 "ඒ බමුණෝ බ්‍රාහ්මණ ධර්මයෙන් තොරවූවාහුය. ඔව්හු බ්‍රාහ්මණයෝයයි නොකියනු ලැබෙතියි කෝරව්‍ය රජතෙම මෙසේ කීයේය

35 "යහළු විධුර පණ්ඩිතය, යම්කෙනෙක් මාගේ භෝජනය වළඳන්නාහුද, යමෙකුට දුන් දෙය මහත්ඵල වේද, එබඳු අන්‍යවූ සිල්වත් බහුශ්‍රැත මෙවුන්දමින් වැළකුණාවූ බමුණන් සොයව. දක්ෂිණාව දෙන්නෙමුයි කීයේය

36 "ඒ සමහර බමුණෝ වනයෙහි කුටියක්කොට වාසය කරමින් මලපුඩු ආදිය ඇටවීම කරවත්. ගොයින් ඇතුළු සාවුන් බළලුන්ද මස් කැසුප් යන මොවුන්ද පෙළත්."

37 "මහරජ, වැද්දන් හා සමානවූ ඔව්හුද, බ්‍රාහ්මණයෝයයි කියනු ලැබෙත්. මහරජ, ඔව්හුද මා විසින් කියන ලදහ. එබඳුවූවන් වෙතගොස් ආරාධනා කරමු. ඔව්හු බ්‍රාහ්මණ භාවයෙන් තොරවූවාහුය. ඔව්හු බ්‍රාහ්මණයෝයයි නොකියනු ලබතියි කෝරව්‍ය රජතෙම මෙසේ කීයේය.

38 "යහළු විධුර පණ්ඩිතය, යම් කෙනෙක් මාගේ භෝජනය වළඳන්නාහුද, යමෙකුට දුන්දෙය මහත්ඵල වේද, එබඳු අන්‍යවූ සිල්වත් බහුශ්‍රැත මෙවුන්දමින් වැළකුණාවූ, බමුණන් සොයව, දක්ෂිණාව දෙන්නෙමුයි කීයේය.

39 "අන්‍යවූ බ්‍රාහ්මණ කෙනෙක් ධන කැමැත්තාහුම රුවන්මය ඇඳයට දිගැරී හොවිත්, හෝමයාගය එළඹ සිටි කල්හි රජවරු ඇඳ මතුයෙහි ස්නානය කරවත්.

40 "මහරජ, කිළුටු පිළිගන්නවුන් සමානවූ ඔව්හුද බ්‍රාහ්මණයෝයයි කියනු ලැබෙත්. මහරජ, ඔව්හුද මා විසින් කියන ලදහ. එබඳුවූවන් වෙත ගොස් ආරාධනා කරමුයි කීයේය.

41 "ඒ බමුණෝ බ්‍රාහ්මණ ධර්මයෙන් තොරවූවාහුය. ඔව්හු බ්‍රාහ්මණයෝයයි නොකියනු ලැබෙතියි කෝරව්‍ය රජතෙම මෙසේ කීයේය.

42 "යහළු විධුර පණ්ඩිතය, යම් කෙනෙක් මාගේ භෝජනය වළඳන්නාහුද, යමෙකුට දුන්දෙය මහත් ඵල වේද, එබඳු අන්‍යවූ

සිල්වත් බොහෝ උගත් මෛථුන්දමින් වැළකුණාවූ බමුණන් සොයව, දක්ෂිණාව දෙන්නෙමුයි කීයේය.

43 "දෙවයන් වහන්ස, යම් කෙනෙක් ඔබගේ භෝජනය වළඳන්නාහුද, එබඳුවූ ආයර්‍ය්‍යශීලයෙන් යුක්තවූ ප්‍රතිවේධ බහුශ්‍රැත භාවයෙන් යුක්තවූ මෛථුන ධර්මයෙන් වැළකුණාවූ බැහැරකළ පව් ඇති බ්‍රහ්මණයෝද ඇත්තාහ.

44 "උන්වහන්සේලා එකවේලේ බතද වළඳත්, මත්පැන්ද පානය නොකරත් මහරජ, උන්වහන්සේලා මා විසින් කියනලදහ. එබඳුවූ බැහැර කළ පව් ඇති පසේ බුදුවරුන් වෙත ආරාධනා කිරීමට යමුයි කීයේය.

45 "පින්වත් විධුර පණ්ඩිතය, මුන්වහන්සේලාම සිල්වත්වූ බහුශ්‍රැතවූ බ්‍රාහ්මණයෝවෙත්. විධුර පණ්ඩිතය, මේ පසේබුදුවරුන් වහාසොයව, උන්වහන්සේලාට ආරාධනාද කරවයි, රජතෙම කීයේය."

**495 භික්ඛා පරම්පරා ජාතකයː-** 1 "උතුම් කුළු ගෙවල්හි වාසය කළාවූ මාහැඟි සිරියහන් ඇසුරුකළාවූ රාජ්‍යය හැර මේ ප්‍රත්‍යන්තයට පැමිණියාවූ සිව්මැලි ස්වභාව ඇති රජහු දැක,

2 "ඒ නුඹවහන්සේට ප්‍රේමයෙන් මම සොයනලද පිවිතුරුවූ රස මසවුලෙන් යුක්තවූ ඇල්සාලෙන් පිසනලද උතුම්වූ බත දුනිමි.

3 "නුඹවහන්සේ ඒ බත පිළිගෙණ තමා අනුභව නොකොට බ්‍රාහ්මණයාට දුන්නේය. මහරජ්ජුරුවන් වහන්ස, ඔබට නමස්කාරවේවා. මේ කිනම් ස්වභාව ධර්මයක්දැයි (කෙළෙඹිතෙම ඇසූයේය.)

4 "කෙළෙඹි පුත්‍රය, මේ බ්‍රාහ්මණතෙම මාගේ ආචාර්‍ය්‍යය, කුදු මහත් කටයුතුවල යෙදුනෙක ගරුකටයුත්තේද මා විසින් දුන් දෙය ගන්ට සුදුස්සෙක්ද වේ. එහෙයින් භෝජනය දෙන්ට සුදුසුවෙමියි කීයේය.

5 "දැන් මම ගෞතම ගොත්‍ර ඇති රජහු විසින් පුදන ලද බ්‍රාහ්මණයා විචාරමි. රජතෙම ඔබට රස මසවුලෙන් යුක්තවූ පිවිතුරුවූ බත දුන්නේය.

6 "නුඹ වහන්සේ ඒ බත පිළිගෙණ ඍෂීහුහට ඒ භෝජනය දුන්නේය. දානයට ක්ෂෙත්‍ර නොවේයයි දැන ගත්තෙහිද, බ්‍රාහ්මණය, ඔබට නමස්කාරවේවා. මේ කිනම් ස්වභාව ධර්මයෙක්දැයි ඇසීය.

7 "ගිහිගෙයි ගැටුනාවූ මම අඹුවන්ද දරුවන්ද පෝෂණය කරමි. මිනිසුන් අයත් කාමයන් අනුභව කරවයි. රජහට අනුශාසනා කරමි. වෙනෙහි වසන්නාවූ බොහෝ කලක් කරණලද තපස් ඇත්තාවූ ගුණයෙන් වැඩිහිටියාවූ වඩනාලද සිත් ඇති මේ ඍෂිහුහට භෝජනය දෙන්ට සුදුසුවෙමියි (බමුණුතෙම කීයේය.)

8 "දැන් මම කෘශවූ නහර ඉල්පුනාවූ සිරුර ඇති ඉතා වැඩුනු කිසිලි ලොම් හා නියද ඇති මැලියම් සහිත දත් ඇති රජස් සහිත හිස් ඇති ඍෂීන් වහන්සේද විචාරමි.

9 "ස්වාමීනි, නුඹ වහන්සේ තනිව වෙනෙහි වාසය කරන්නෙහිය, කිම, ජීවිතය නොකැමැත්තෙහිද, යමෙකුට නුඹ වහන්සේ භෝජනය දුන්නේද, ඒ භික්ෂුතෙම කවර ගුණයකින් නුඹවහන්සේට වඩා ශ්‍රෙෂ්ඨවේදැයි ඇසූයේය.

10-11 "කෙළෙඹිය, මම අලවර්ගද, තල් අලද බිලාලිනම් අලද කක්කල නම් අලද සාරාගණිමින් බඩහමු උඟුරු හැල්ද පොළමින් රැස්කරමින් දිගහරිමින්, පලාවර්ගද නෙළුඹලද මීද මස්ද ඩෙබර හා නෙල්ලිද යන ඒ ආහාර වර්ග රැස්කොටගෙණ අනුභව කරමි. මාගේ ඒ පිළිබඳවූ අයිතියක් ඇත්තේය.

12 "පිසන්නාවූ මම නොපිසන්නාවූ මමත්වය කිරීමක් නැත්තාවූ පලිබොධයක් නැත්තාවූ නොගන්නාවූ පසේ බුදුවරයන් වහන්සේට ගැණීම සහිතවූයේ භෝජනය දෙන්ට සුදුසුවෙමියි ඍෂිතෙම කීයේය.

13 "දැන් මම නිශ්ශබ්දව වැඩ උන්නාවූ සිල්වත්වූ භික්ෂූන් වහන්සේද විචාරමි. පවිත්‍රවූ රසමසවුලෙන් යුක්තවූ බත ඍෂීතෙමේ ඔබ වහන්සේට දුන්නේය.

14 "නුඹවහන්සේ ඒ බත පිළිගෙණ නිශ්ශබ්දව තනිවම වළඳන්නෙහිය. අන්කිසිවෙකුට නොපවරන්නෙහිය

නුඹවහන්සේට නමස්කාරවේවා. මේ කිනම් ස්වභාව ධර්මයෙක් දැයි ඇසූයේය.

15 "කෙළෙඹිය, මම නොපිසමි. නොපිසවමි. නොසිඳිමි. නොසිඳවන්නෙමි. පලිබොධ රහිතවූ ඒ මා සියලු පාපයන්ගෙන් දුරුව සිටිබැව් දැන.

16 "සෘෂිතෙම වමතින් ආහාරය ගෙණ දකුණතින් පැන් කෙන්ඩිය ගෙණ මට රසමසවුලෙන් යුත් පිවිතුරුවූ බත පිළිගැන්වීය.

17 "මාගේ යයි ගැණීම් සහිතවූ අයිතිවූවන් සහිතවූ මොව්හු වනාහි මාවැන්නහුට දෙන්ට සුදුස්සෝවෙත්. යමෙක් දුන්නහුට පවරන්නේද, එය විරුද්ධ ප්‍රතිපදාවයයි මම හඟිමියි පසේ බුදුහු වදාළේය.

18 "අද ඒකාන්තයෙන් මට වැඩ පිණිස රජතෙම මෙහි ආයේය. යමෙකුට දෙනලද දෙය මහත් ඵලද, එය මින් පෙර මම නොදනිමි

19 "රජදරුවෝ රටවල්වල ගිජු වූවාහුය. බමුණෝ රජුන්ගේ ලොකු කුඩා කටයුතුවල ගිජුවූවාහුය. සෘෂිහු අල වර්ග හා ගෙඩි වර්ගවල ගිජුවූවාහුය. ප්‍රත්‍යෙක බුද්ධ භික්ෂූහු සියලු භවයන්ගෙන් මිදුනාහු වෙත් යයි වදාළේය."

---

## වීසති නිපාතය

**496 මාතංග ජාතකයː-** 1 "අපිරිසිදු වස්ත්‍ර ඇති ලාමකවූ පාංශු පිශාචකයෙකුමෙන් තොප කොයිසිට එන්නෙහිද, කසලගොඩින් ලබාගත් වස්ත්‍රයක් බොටුවෙහි බහාගෙණ දන් පිළිගැණීමට නුසුදුසුවූ තෝබොල, කවරෙක් වන්නෙහිදැයි. (මණ්ඩව්‍යතෙම ඇසීය.)

2 "යශස් ඇත්තාවූ මණ්ඩව්‍ය කුමාරය, ඔබගේ මේ ආහාරය පිළියෙල කරණලදී. එය කනු ලබත්. අනුභවද කරණු ලබත්. පානයද කරණු ලබත්. අනුන් දුන් දෙයින් යැපෙන්නාවූ මා

නුඹ දන්නෙහිය, එළඹ සිට ලැබිය යුතු ආහාරය චණ්ඩාලතෙමේ ලබාවායි.

3 "මාගේ මේ ආහාරය ජාති සම්පන්න බ්‍රාහ්මණයන් සඳහා කරණලදී. ඇදහිලිමත්වූ මාගේ මේ දානය තමහට වැඩ පිණිසවේ. චණ්ඩාලය, මෙතැනින් ඉවත්ව යව. කුමකට මෙහි සිටින්නෙහිද, මා වැන්නෝ තොපට දානය නොදෙත්යයි කීයේය.

4 "එම්බා කුමාරය, ශෂ්‍ය ඵලය කැමැතිවන්නාහු ගොඩබිමද වලතැනද ජල බහුල භූමියෙහිද බිජුවට වපුරත්. මෙබඳුවූ ඇදහීමෙන් දානය දෙව, මෙසේ දක්ෂිණාර්හයන් සතුටු කරන්නෙහි නම් ඉතා මැනවැයි කීයේය.

5 "යම් ක්ෂෙත්‍රයන්හි මම බිජුවට පිහිටුවම්ද, ලෝකයෙහි එබඳු ක්ෂෙත්‍රයෝ මට ප්‍රකටයහ. ජාතියෙන්ද, මන්ත්‍රවලින්ද යුක්තවූ යම් බ්‍රාහ්මණ කෙනෙක් වෙද්ද, ඉතා ප්‍රියශීලීවූ ඔව්හු මේ ලෝකයෙහි ක්ෂෙත්‍රවෙත්යයි කීයේය.

6 "ජාති මදයද අධික මානය ඇති බවද ලෝභයද ද්වෙෂයද මදයද මොහයද මේ සියලු අගුණයෝ යමෙකුන් කෙරෙහි පවතිද්ද, ඔව්හු මේ ලෝකයෙහි අප්‍රිය ස්වභාව ඇත්තාවූ ක්ෂෙත්‍රයෝ වෙත්.

7 ජාති මානයද අධික මාන්නය ඇතිබවද ලෝභයද ද්වෙෂයද මදයද මෝහයද යන මේ සියලු අගුණයෝ යමෙකුන් කෙරෙහි නොවෙද්ද, ඔව්හු මේ ලෝකයෙහි ඉතා ප්‍රිය ස්වභාව ඇත්තාවූ ක්ෂෙත්‍රයෝ වෙත් යයි මාතංග පණ්ඩිතතෙම කීයේය.

8 "මේ දොරටුවල සිටියාවූ උපජොතියාද උපඣ්ජායයාද තවද භණ්ඩ කුච්ඡියාද යන දොරටු පාලයෝ කොයි ගියාහුද, මොහුට දඬුවම්ද වධද දී ගෙලෙහි අල්වාගෙණ මේ චණ්ඩාලයා ඇද දමව්යයි (මණ්ඩව්‍යතෙම කීයේය.)

9 "මානවකය, යම්බඳුවූ නුඹ ඍෂිහට පරිභව කෙරෙහිද, ඒ නුඹ නියෙන් පර්වතය සාරන්නෙහිය දතින් යකඩය කන්නෙහිය ගිනි ගිලින්ට උත්සාහ කරන්නෙහිය.

10 "සත්‍යවූ පරාක්‍රම ඇති මාතංග ඍෂිතෙම මේ වචනය කියා බමුණන් බලා සිටියදීම අහසෙහි නැග ගියේය.

11 "හිස පිටුපසට පෙරලනලදී. කිසිවක් නොකොට හැකිපරිදි අතද දිගහරියි. මළහුගේ මෙන් ඇස් සුදුවන්වූහ. කවරෙක් නම් මාගේ මේ පුතුට මෙසේ කෙළේදැයි (දිට්ඨ මංගලිකා ඇසීය.)

12 "අපිරිසුදු වස්ත්‍ර දරන්නාවූ ලාමකවූ පංශු පිශාචකයෙකු මෙන් කශලගොඩ තිබී ගත් වස්ත්‍රයක් බොටුව සිට පෙරවාගෙණ ශ්‍රමණයෙක් මෙහි ආවේය. හෙතෙම ඔබගේ මේ පුතුට මෙසේ කෙළේයයි (එහි සිටි ජනයා කීයේය.)

13 "එම්බා මානවකයෙනි, බොහෝ ප්‍රඥා ඇත්තාවූ ඒ ශ්‍රමණයන් වහන්සේ කවර දිශාවකට ගියේදැයි මේ කාරණය මට කියව්. ඔහුගේ සමීපයට ගොස් ඒ වරදට පිළියම් කරන්නෙමු. පුත්‍රයාගේ ජීවිතය ලබන්නෙමු නම්, ඒ ඉතායෙහෙකැයි කීය.

14 "බොහෝ ප්‍රඥා ඇත්තාවූ උන්වහන්සේ ආකාශ පථ නම් මාර්ගයාගේ මැද සිටියාවූ පසළොස්වක්හි සඳ මෙන් අහසට නැග ගියේය. තවද සත්‍යවූ ප්‍රතිඥා ඇති යහපත් ස්වභාව ඇති ඒ ඍෂිතෙම නැගෙණහිර දිශාවට ගියේයයි එහි සිටි මානවකයෝ කීහ.

15 "හිස පිටි අතට කරකැවී ගියේය. කිසිවක් නොකොට හැකිපරිදි අත් දිග හරියි මළ එකෙකුගේ මෙන් ඇස් සුදුවූහ. කවරෙක් මාගේ පුතුට මෙසේ කෙළේදැයි ඍෂිහුගෙන් (දිට්ඨමංගලිකාව ඇසීය.)

16 "යහපත් ස්වභාව ඇත්තාවූ ඍෂීවරුන් අනුව ගියාවූ ඒකාන්තයෙන් මහත් ආනුභාව ඇති යක්ෂයෝ ඇත්තාහ. දුෂ්ටවූ සිත් ඇති කිපියාවූ ඔහු දැන ඒ යක්ෂයෝ වනාහි තිගේ පුතුට මෙසේ කළාහුයයි කීයේය.

17 "යක්ෂයෝ වනාහි මාගේ පුතුට මෙසේ කළාහුද, බ්‍රහ්මචාරීන් වහන්ස, නුඹවහන්සේම මාගේ පුත්‍රයාට නොකිපුන මැනව. නුඹවහන්සේගේම පාදයන් සරණකොට ගියෙමි.

භික්ෂූන්වහන්ස, පුතු කෙරෙහිවූ ශොකයෙන් නුඹ වහන්සේ අනුව ආයෙමි.

18 "දිට්ඨ මංගලිකාවෙනි, ඒ බණින වේලෙහිද ඔබගේ පුතුට මාගේ චිත්ත ප්‍රදූෂ්‍යයෙක් නොවීය. දැනුදු ඔහුට මාගේ සිතෙහි කිසියම් ප්‍රදූෂ්‍යයෙක් නැත්තේය. තිගේ පුත්‍ර තෙමේද වේදයන් ඉගෙණ වේද මදයෙන් මත්වූයේ අර්ථානර්ථ නොදනීයයි කීයේය.

19 "භික්ෂූන් වහන්ස, ඒකාන්තයෙන්ම මිනිසාගේ සංඥාව මොහොතකින් මුළාවේමය. බොහෝ ප්‍රඥා ඇති ස්වාමීනි, මේ එක වරද ක්ෂමාකළ මැනව. නුවණැත්තෝ ක්‍රොධය බලකොට ඇත්තෝ නොවෙතියි කීවාය.

20 "මාගේ මේ ඉඳුල් ආහාරයද මද නුවණැති මණ්ඩව්‍ය තෙමේ අනුභව කෙරේවා. ඒ යක්ෂයෝද ඔහුව නොවෙහෙසන්නාහුය. තිගේ පුත්‍රතෙමේද නීරෝග වන්නේයයි කියා (අහසට පැන හිමවතටම ගියේය)

21 "මහත්වූ රාගකසටාදියෙන් යුක්ත කිළුටුවූ කර්මාන්ත ඇති සංයම නැත්තවුන් කෙරෙහි දානය දෙන්නෙහිද එම්බා මණ්ඩව්‍ය කුමාරය යම්බඳුවූ නුඹ පුණ්‍යක්ෂෙත්‍රයන් දැනීමෙහි දක්ෂ නොවෙහිද, එහෙයින් ස්වල්ප ප්‍රඥා ඇත්තාවූ නුඹ අඥානවෙහිය.

22 "පුත මණ්ඩව්‍යය, ඇතමුන්ගේ කේශයෝ ජටා කොට බඳනා ලද්දාහ. අඳුන් දිවිසම් වස්ත්‍රවූහ. දිරූ ළිඳක් මෙන් මුඛය ඉතාවැඩුනු රැවුල් ඇත්තේ වෙයි. අපිරිසිදු ස්වභාව ඇත්තාවූ මේ ප්‍රජාව බලව්. මේ දළමඬුළු හා අඳුන් දිවිසම ඇත්තේ මඳ නුවණ ඇත්තහු නොරකියි. හෙවත් පිහිට නොවේ.

23 "යම් කෙනෙකුන්ගේ රාගයද ද්වෙෂයද අවිද්‍යාවද වැළකුණාහුද ක්ෂය කළ ආශ්‍රව ඇති රහත්හු වෙද්ද, උන්වහන්සේලා විෂයෙහි දෙනලද දානය මහත් විපාක ඇත්තේ යයි කීයේය.

24 "මෙධ්‍ය රජතෙම යශස් ඇත්තාවූ මාතංග ඍෂීහු කෙරෙහි සිත දූෂ්‍යකොට පිරිවර සහිතව මුලින්ම සිඳුනේය. එකල්හි මෙධ්‍යාරණ්‍යයවූයේයයි" වදාළේය.

**497 චිත්ත සම්භූත ජාතකය:-** 1 "මේ ලෝකයෙහි මිනිසුන් මනාව පුරුදුකළාවූ කර්ම සියල්ල විපාක සහිතවේ. කුශලාකුශල කර්මයන් අතර කිසියම් හිස්වූ කර්මයක් නැත්තේය. ස්වකීයවූ කර්මයෙන් පුණ්‍ය විපාකයට පැමිණියාවූ මහත් ආනුභාව ඇති සම්භූත නම් රජවූ මම ඒවා දකිමි.

2-3 "මෙලොව මිනිසුන් මනාව පුරුදුකළාවූ කර්ම සියල්ල ඵල සහිතවේ. කරණ ලද කුශලාකුශල කර්මයන්හි කිසියම් එක කර්මයකුත් හිස් නැත්තේය. යම්සේ මට සමෘද්ධවූයේද එපරිද්දෙන්ම කිමෙක්ද, ඒ මාගේ සහෝදරවූ චිත්තයාගේද සිත සමෘද්ධවූයේදැයි (සම්භූත රජතෙම කීයේය.)

4 "පින්වත, කිම, චිත්ත නම් මම වෙමියි අනිකෙකු කෙරෙන් තොප අසන ලදද, නොහොත් චිත්තතෙම දක්නා ලදැයි තට කිසිවෙකුත් මේ කාරණය කීයේද, ගාථාව මනාකොට කියන ලදී. මට එහි සැකයක් නැත. තොපට ගම්වර සියයක්ද දෙමියි රජතෙම කීයේය.

5 "මහරජ්ජුරුවෙනි, මම චිත්ත නම් වෙමියි අනිකෙකු කෙරෙන්ද මා නොඅසන ලදී. රජහුගේ ළඟට ගොස් මේ ගාථාව කියව, එකල්හි සතුටු සිත් ඇති රජතෙම තොපට වරයක්ද දෙන්නේයයි ඍෂිකෙනෙක් මට මේ කාරණය කීයේය.

6 "විසිතුරු මැහුම් ඇති මනාකොට කරණලද රජුන්ට අයත් රථයක් ඒකාන්තයෙන් යොදත්වා. ඇතුන්ගේ පොරොද්ද බඳිව්. ග්‍රීවාභරණයන්ද බහාලව්.

7 "මහබෙර මිහිඟුබෙර සක් යන මොවුන් නාද කෙරෙත්වා. වහා ගමන් කරන්නාවූ යානාවන්ද යොදත්වා. යම්තැනෙක්හි උපන්නාවූ ඍෂීහු දක්නෙම්ද, මම දැන්ම ඒ අසපුවට යන්නෙමියි රජතෙම කීයේය.

8 "ඒකාන්තයෙන් මට මනාකොට ලබනලද ලාභයෙක් වූයේය. එකල මා විසින් පිරිස් මැද ගාථාව මනාකොට ගායනා කරණ ලදී. ඒ මම ශීලයෙන් හා ව්‍රතයෙන් යුක්තවූ ඍෂීන්වහන්සේ දැක ප්‍රීතියට පැමිණියෙමි. මම සතුටු සිත් ඇත්තේ වෙමියි රජතෙම කීයේය.

9 "පින්වතුන් වහන්සේ අපගේ ආසනයද පා දෝනා පැන්ද පිළිගන්නාසේක්වා. පින්වතුන් වහන්සේ ආගන්තුග සත්කාර විචාරමි. පින්වතුන් වහන්සේ අපගේ ආගන්තුග සත්කාරය පිළිගන්නා සේක්වායි කීයේය.

10 "ඔබට වාසයට සුදුසු සිත්කළුවූ ගෘහයක්ද කෙරෙත්වා ස්ත්‍රී සමූහයා හා පරිචරණය කෙරේවා. අපට අනුග්‍රහ පිණිස අවකාශ කරණු මැනව. අපි දෙදෙනම මේ රාජ්‍ය සම්පත්තිය අනුභව කරමුයි රජතෙම කීයේය.

11 "මහරජ, දුශ්චරිතයාගේ මහත්වූ විපාකයද දැක නැවත මනාව පුරුදු කළාවූ සුචරිතයාගේ මහත්වූ විපාකයද දැක මෙසේ තමන්ම සංවරයට පැමිණියෙමි. පුත්‍ර සම්පත් හෝ ගව මහිෂාදී සම්පත් හෝ වස්තුසම්පත් හෝ නොපතන්නෙමියි (චිත්ත නම් ඍෂිතෙම කීයේය.)

12 "මේ ලෝකයෙහි මිනිසුන්ගේ ජීවිතය වර්ෂයන් සම්බන්ධවූ මේ දශක දශයක්ම වෙත්. ඒ දශකයන් සම්බන්ධ සීමාවට නොපැමිණියහුම (මැරෙයි) සිඳින ලද බට ගසක් මෙන් වියලෙයි."

13 "එසේ වියලෙන්නාවූ ජීවිතයෙහි පස්කම් ගුණ නිසා කවර සතුටක්ද, කයින් කරන්නාවූ කවර ක්‍රීඩාවෙක්ද, සතුටු වීම් වශයෙන් කවර ඇලීමක්ද, කිනම් වස්තු සෙවීමක්ද, මහ රජ, පුත්‍රයන්ගෙන්ද, අඹුවන්ගෙන්ද මට කවර ප්‍රයෝජනයක්ද, මේ බන්ධනයෙන් මම මිදුනේ වෙමි.

14 "ඒ මම හොඳාකාර දනිමි. මරුවා මට ප්‍රමාද නොවේ. මරුහට යටත්වූවහුගේ කවර ඇලීමක්ද, කිනම් වස්තු සෙවීමක්ද,

15 "මහරජ මිනිසුන්ගේ නීච ජාතියවූ චණ්ඩාලයෝ නිය දෙපා ඇත්තවුන් අතරෙහි ලාමකවේ. පෙර අපි දෙදෙනම ඉතා ලාමකවූ ස්වකීය කර්මවලින් චණ්ඩාල මාතෘ ගර්භයෙහි වාසය කෙළෙමු.

16 "අවන්ති ජනපදයන්හි අපි දෙදෙන චණ්ඩාලයෝ වීමු. ඉන් සැව නෙරඤ්ජරා ඉවුරෙහි මුවෝවීමු. එයින් චුතව නර්මදා නම් ගංඉවුරෙහි උකුස්සෝ දෙදෙනෙක් වීමු. එතැනින් අවුත් ඒ අපි අද බ්‍රාහ්මණ හා ක්ෂත්‍රියෝ වීමුයි (චිත්ත පණ්ඩිතතෙම කීයේය.)

17 "මහරජ, මේ ජීවිතය මරණය කරා පැමිණෙයි. සත්වයන්ගේ ආයුෂය ස්වල්පවේ. ජරාවට පැමිණියහුට රක්ෂා ස්ථාන නැත. පඤ්චාල දේශාධිපති රජුනි, මාගේ මේ කීම කරව, දුක් වැඩෙන්නාවූ කර්මයන් නොකරව,

18 "සත්වයන්ගේ මේ ජීවිතය මරණයට ලඟාවෙයි. ආයුෂයද ස්වල්පවේ. ජරාවට පැමිණියාහුට ආරක්ෂාවක් නම් නැත. පඤ්චාලය, මගේ මේ වචනම කරව, දුක් විපාක ඇත්තාවූ කර්මයන් නොකරව.

19 "සත්වයන්ගේ ජීවිතය මරණය කරා පැමිණෙයි, ආයුෂය ස්වල්පය. ජරාවට පැමිණියහුට රක්ෂාස්ථාන නැත. පඤ්චාලය මගේ මේ වචනය කරව, කෙළෙස් රජසින් වැසුනු හිස් ඇති කර්මයන් නොකරව.

20 "සත්වයන්ගේ ජීවිතය මරණයට ලඟාවෙයි. දිරන්නාවූ මිනිසාගේ ශරීර වර්ණය ජරාතොමෝ නසයි. පඤ්චාලය මගේ මේ වචනය කරව, නරකයෙහි ඉපදීමට හේතුවූ කර්මය නොකරවයි (චිත්තපණ්ඩිතතෙම කීයේය.)

21 "ඒකාන්තයෙන්ම නුඹවහන්සේගේ මේ වචනය සත්‍යවේ. ඍෂිතෙමේ යම්සේ කියන්නෙහිද, මේ කාරණය මෙසේමැයි. බොහෝවූ කාම සම්පත් මට ඇත්තාහ. තාපසයන් වහන්ස, ඒ කාම සම්පත් මා වැන්නකු විසින් අත්හැරිය නොහැක්කාහ.

22 යම්සේ මඩවගුරෙහි එරුනාවූ හස්තිතෙම ගොඩ දක්නේ යන්ට නොහැකිවේද, මෙපරිද්දෙන්ම කම්සැප නමැති මඩෙහි එරුණාවූ මම භික්ෂූන්වහන්සේගේ අනුශාසනා මාර්ගයට නොපැමිණෙමි. හෙවත් පැවිදිවන්ට නොහැක්කෙමි.

23 "යම්සේ මව්ද, පියාද කුමකැයි සුවපත්වන්නේ යයි පුතුට අනුශාසනා කරන්නාහුද, ස්වාමීනි, යම් මාර්ගයක හැසිරෙන්නේ පරලොව සුවපත් වන්නෙම්ද, මෙසේම මට නුඹවහන්සේ අනුශාසනා කරණු මැනවයි රජ තෙම කීයේය.

24 "ජනාධිපතිවූ මහරජ, ඉදින් නුඹ මිනිසුන් අයත්වූ මේ කම්සැප හැර දමන්ට නොහැකි වෙහිනම්, ඔබගේ රාජ්‍යයෙහි දැහැමින් අයබදු ගැණීම පිහිටුවව, අධර්ම කරන්නාහුද නොවෙත්වා.

25 "මහණ බමුණන්ට ආරාධනා කරන්නාවූ දූතයෝ වහා යවත්වා. ඒ මහණ බමුණන්ට ආහාරයෙන් හා පානයෙන්ද, වස්ත්‍රයෙන්ද ශයනාශන හ ගිලානප්‍රත්‍යයෙන්ද උපස්ථාන කරව.

26 "ආහාරයෙන් හා පාන වර්ගයෙන් පහන්සිත් ඇත්තේ මහණ බමුණන්ද සතුටුකරවා, ශක්තිවූ පරිද්දෙන් නින්දා නොලබන ලද්දේ පස්කම් සැපයෙන් අග්‍රස්ථානයවූ දෙව්ලොවට පැමිණෙව්.

27 "මහරජ, ඉදින් වනාහි ස්ත්‍රී සමූහයා හා පරිචරණය කරන්නාවූ ඔබ රාජ්‍ය සම්පත් නිසා උපන් මදය තෙමේ යටපත් කරන්නේනම් මේ ගාථාව මෙනෙහි කරව, තවද මේ ගාථාව පිරිස් මැද කියව.

28 "පෙර මට තෘණ කුටියක්වත් නැති බැවින් එලිමහනෙහි වාසය කරන්නාවූ සැඩොලෙක්වීමි. එකල කිරි පොවා මව වලට ගියකල්හි ශුනකියගේ කිරි බීමෙන් වැඩුනෙමි. බළුපැටවුන් විසින් පිරිවරණ ලදුව වාසය කෙළෙමි. ඒ මම අද රජයයි කියනු ලැබේ යනුයි."

498 **සිවිජාතකය:-** 1 "මහරජ්ජුරුවෙනි, දුරසිට ඇසින් නොදක්නේ ජරාවට පැමිණ මහළුවූයේම ඇසක් ඉල්වාගන්ට

ආයේ වෙමි. යාඥා කරණලද්දේ මට ඇසක් දුනමැනව, අපි දෙදෙනා එකැස් ඇත්තෝ වන්නෙමුයි. (බමුණු වෙස් ගත් ශක්‍රතෙම කීයේය.

2 "වණිබ්බකය, කවරෙකු විසින් අනුශාසනා කරණ ලද්දේ ඇස් ඉල්වන්ට මෙහි ආයෙහිද, මිනිසා විසින් යමක් දීමට දුෂ්කරයයි කියද්ද, දීමට ඉතා දුෂ්කරවූ උතුම් ශරීරාවයවයක් වූ ඒ ඇස් ඉල්වන්නෙහිදැයි සිවිරජතෙම කීයේය.

3 "මහරජ, දෙවියන් අතර සුජම්පතීයයි යමෙකුට කියද්ද, මනුෂ්‍යලෝකයෙහි ඔහුට මඝවන්තයයි කියත්. ඒ ශක්‍රයා විසින් අනුශාසනා කරණලද්දේ වණිබ්බකවූ මම ඇස් ඉල්වන්ට මෙහි ආයේ වෙමි.

4 "ඉල්වීම් අතුරෙන් මාගේ මේ ඉල්වීම උතුම්වේ. ඉල්ලනලද්දේ මට ඇස් දුනමැනව. මිනිසා විසින් දීමට දුෂ්කරයයි යමක් කියද්ද, එබඳුවූ ඇසක් මට දුනමැනව.

5 "යම් අර්ථයකින් යම් කරුණක් ප්‍රාර්ථනා කරමින් මෙහි ආයේද බ්‍රාහ්මණය, තොපගේ ඒ අදහස් සමෘද්ධ වෙත්වා. ඇස් ලබව"

6 බමුණ, එක ඇසක් ඉල්වන්නාවූ තොපට මම ඇස් දෙකම දෙමි. එයින් ඇස් ඇත්තෙක්ව ජනයා බලාසිටියදී යව, තෝ මා සමීපයෙන් යමක් කැමැත්තෙහිද, එය තට සමෘද්ධ වේවායි සිවිරජතෙම කීයේය.

7 දෙවයන් වහන්ස, ඇස් නොදෙනු මැනව, ඇස්දී අප සියල්ලන් හැර නොදමනු මැනව, මහරජ්ජුරුවන් වහන්ස, බොහෝවූ මුතුද වෙරළු මිණිද යන වස්තුව දුන මැනව,

8 දෙවයන් වහන්ස, අසුන් යොදන ලද රථයන්ද සරසනලද ආජානීය අසුන්ද දෙනු මැනව. මහරජ්ජුරුවෙනි, රණින් කළ ආභරණ ඇත්තාවූ ඇතුන් දෙනු මැනව.

9 රජ්ජුරුවන් වහන්ස, සේනා සහිතවූ රථ සහිතවූ සියලු සිවිරට වාසීහු හැමකල්හි ඔබවහන්සේ යම්සේ හාත්පස

පිරිවරන්නාහුද, මෙසේ ඇස් නොදී සෙසු වස්තූන් දුන මැනවයි, නුවර වැස්සෝ කීහු.

10 යමෙක් ඒකාන්තයෙන් යමක් දෙන්නෙමි කියා නොදීමෙහි සිත ඇති කරන්නේද, හෙතෙම බිම තිබුනාවූ මලපුඩුවක් බෙල්ලෙහි බහා ගණියි.

11 යමෙක් ඒකාන්තයෙන් යමක් දෙන්නෙමියි කියා නොදීමට සිතන්නේද, හෙතෙම පව්ටෙකුටත් වඩා පවිටු වූයේ යමයාගේ අණ පවත්නා තැනට පැමිණියේ වෙයි.

12 යමක් වනාහි ඉල්වන්නේ නම් එයම දෙන්නෙමි. යමක් නොඉල්වානම් එය නොදෙන්නෙමි. බමුණුතෙම යමක් මගෙන් ඉල්වාද ඒ මම එයම දෙන්නෙමියි රජතෙම කීයේය.

13 මහරජ, ආයුෂයද වර්ණයද සැපයද බලයද යන මේ කවර දෙයක් පතමින් ඇස් දෙන්නෙහිද සිවිරට වාසීන්ට උතුම්වූ රජතෙමේ පරලොව සැප හේතුකොටගෙණ කෙසේනම් ඇස් දෙන්නේදැයි වැසියෝ ඇසූහ.

14 ඒකාන්තයෙන් මම යශස් හේතුකොටගෙණ මෙය නොදෙමි. පුත්‍ර සම්පත්තියක් නොකැමැත්තෙමි, වස්තුවද නොකැමැත්තෙමි, රාජ්‍යයද නොකැමැත්තෙමි. එතකුදු වුවත් මේ සත්පුරුෂයන් විසින් පුරුදු කරණලද පුරාණ ධර්මයවේ. එසේහෙයින්ම මාගේ සිතද මෙහිම ඇලේයයි රජතෙම කීයේය.

15 යහළු සීවකය, නුඹ මාගේ යහළුවාද මිත්‍රයාද වෛද්‍ය ශිල්පයෙහි මනාව හික්මුනු තැනැත්තාද වෙහිය. මනාකොට මාගේ මේ කීම කරව, මා බලාසිටියදීම ඇස්දෙක උදුරා මේ යාචකයාගේ අතෙහි තබවයි රජතෙම කීයේය.

16 සිවි රජහු විසින් මෙහෙයන ලද රජුගේ කීම කරන්නාවූ සීවක වෛද්‍යතෙම රජුගේ ඇස් උදුරා බ්‍රාහ්මණයාට දුන්නේය. බ්‍රාහ්මණතෙම ඇස් ඇත්තෙක් වූයේය. අන්ධවූ රජතෙම හිඳගත්තේය.

17 ඉන්පසු සිවිරට වාසීන්ගේ රට වර්ධනය කරන්නාවූ ඒ රජතෙම කීප දිනකින් ඇස් තුබූ තන්හි මස් වැඩූ කල්හි සාරථියාට

ආමන්ත්‍රණය කළේය. එම්බා සාරථිය, යානයක් යොදව, යොදන ලද්දද දන්වව, උයන් භූමියටද පොකුණුවලටද වනයන්ටද යමියි" කීයේය.

18 ඒ රජතෙමේද, පොකුණු ඉවුරෙහි පයඹීංකයෙන් හිඳ ගත්තේය. ඔහුගේ සමීපයෙහි සුජම්පතී නම් සක්දෙව් රජතෙම පහළ වූයේය.

19 එම්බා රාජෙශ්වරය, මම ශක්‍රදෙවෙන්ද්‍රවෙමි. ඔබගේ සමීපයට ආයෙමි. ඔබගේ සිතට යම්කිසිවක් කැමැත්තෙහි නම් ඒ වරය ඉල්වා ගණුවයි කීයේය.

20 එම්බා ශක්‍රය මාගේ ධනය බොහෝ වෙත්, බලයද බොහෝය. බොහෝවූ කෝෂ්ටාගාරද වෙත්. දැන් ඇස් අන්ධවූම මට මරණයම රුචිවේයයි රජතෙම කීයේය.

21 දෙපා ඇත්තවුන්ට අධිපතිවූ රජ්ජුරුවෙනි, යම් සත්‍ය කාරණයෝ වෙද්ද, ඒ සත්‍යයන්ම කියව, සත්‍යය කියන්නාවූ ඔබගේ නැවත ඇසක් ඇතිවන්නේයයි ශක්‍රයා කීයේය.

22 නොයෙක් ගොත්‍ර ඇත්තාවූ යම් යාචක කෙනෙක් මාගෙන් ඉල්වන්ට එත්ද, ඔවුන් අතරෙහි යමෙකුත් මා ගෙන් ඉල්වාද, හෙතෙමේද මාගේ සිතට ප්‍රියවේ. මේ සත්‍ය වචනය කරණකොටගෙණ මට ඇසක් පහළ වේවායි (සත්‍යක්‍රියා කෙළේය.)

23 ඒ බ්‍රාහ්මණතෙමේ ඇසක් දෙවයි යමක් මාගෙන් ඉල්වන්ට ආයේද, ඒ යාචක බ්‍රාහ්මණයාට මම ඇස් දුනිමි.

24 අධික වශයෙන් ප්‍රීතියද බොහෝවූ සොම්නසද මට පහළවූයේය. මේ සත්‍ය වචනය කරණකොටගෙණ මට දෙවන ඇසද පහළවේවායි (සත්‍ය ක්‍රියා කෙළේය.)

25 සිවිරට වැස්සන්ට වැඩ සිදුකරන්නාවූ මහරජ, ඔබ විසින් ස්වභාව ධර්මයෙන්ම ගාථාව කියන ලදී. මේ දිව්‍යානුභාවයෙන් යුක්තවූ ඔබගේ ඇස් දක්නා ලැබෙත්.

26 මහරජ ඔබගේ මේ ඇස් බිත්තියෙන් පිටතද ශෛලයෙන් පිටතද පර්වතය ඉක්මවාද හාත්පස යොදුන් සියයක් තැන රූප දැකීම සිද්ධ කෙරෙත්වායි ශක්‍රතෙම කීයේය.

27 මේ ලෝකයෙහි කවරෙක් නම් ඉල්වන ලද්දේ විශිෂ්ටවූද තමහට ඉතා ප්‍රියවූද වස්තුවක් නොදෙන්නේද එබැවින් රැස්වූ සියළු සිවිරට වාසීහු අද මාගේ දිව්‍ය නෙත්‍රයන් බලව්.

28 මාගේ මේ දිව්‍ය නෙත්‍රයෝ බිත්තියෙන් පිටත්හිද ගලින් පිටත්හිද පර්වතය ඉක්මවාද හාත්පස යොදුන් සියයක් රූප දැක්ම සිද්ධ කෙරෙත්.

29 මේ සත්වලෝකයෙහි මිනිසුන්ට ත්‍යාගයට වඩා උතුම් අන්කිසිවක් නම් නැත්තේය. මිනිසුන් පිළිබඳවූ ඇසක් දී මා විසින් දිව්‍යවූ ඇසක් ලබන ලදී. සිවිරට වැසියෙනි මේ කාරණයද, දැක දන්දෙව්. අනුභවද කරව්. ශක්තිවූ පරිද්දෙන් දානයද දී අනුභවද කොට නින්දා නොලබන ලද්දාහු පස්කම් සැපයෙන් අග්‍රස්ථානවූ දෙව්ලොවට පැමිණෙව් යයි සිවිරජතෙම කීයේය."

**499 සිරිමන්ද ජාතකය:-** 1 "ප්‍රඥාවෙන් යුක්තවූ ශ්‍රීයෙන් මනහරවූ" යනාදී මේ සිරිමන්ද ප්‍රශ්නය මහා උම්මග්ග ජාතකයෙහි ප්‍රකාශ වන්නේය.

**500 රොහන්ත මෘග ජාතකය:-** 1 චිත්‍රකය, මේ රැලෙහිවූ මුවෝ මරණයට බියවූවාහු පැනදුවත්. තෝද යව, බලාපොරොත්තු නොවෙව. තා සමග ඒ මුවෝ ජීවත්වන්නාහුයයි රෝහන්ත මෘගතෙම කීයේය.

2 "එම්බා රෝහන්ත මෘගරාජය, මම නොයමි. මාගේ හෘදය ශොකයෙන් අදිනු ලැබේ. මම ඔබ නොහරින්නෙමි. මාගේ ජීවිතය මෙහි හරින්නෙමියි චිත්‍රකතෙම කීයේය.

3 "ඇස් අන්ධවූ පිළිදැගුම් කරන්නෙකු නැත්තාවූ ඒ අපගේ මව්පිය දෙදෙනා වනාහි ඒකාන්තයෙන් මැරෙන්නාහුය. එහෙයින් සහෝදරය නුඹද යව, බලාපොරොත්තු නොවෙව, තොප සහ ඒ මව්පියෝ ජීවත් වන්නාහුයයි (රෝහන්ත මෘගතෙම කීයේය.)

4 "පින්වත් රෝහන්ත මෘගරාජය, මම නොයමි. මාගේ හෘදය ශොකයෙන් ඇදගනී. මළපුඩුවෙහි බැඳුනාවූ ඔබ හැර නොයන්නෙමි. මෙතන්හිම ජීවිතය හරින්නෙමියි (චිත්‍රක මෘගතෙම කීයේය.)

5 "බියවනසුළු තැනැත්තිය, වහා යව, මෙයින් පැන දුවව, මම යකඩ කණුවක් සිටුවා කරණලද මලපුඩුවෙක්හි බැඳුනේ වෙමි. තීද යව, බලාපොරොත්තු නොවෙව. තී සමග ඒ මුවෝ ජීවත්වන්නාහුයයි සුතනු නම් නැගනියට කීයේය.

6 "එම්බා රෝහන්ත නම් මෘගරාජය, මම නොයමි. මාගේ හෘදය ශොකයෙන් අදනාලැබේ. මම ඔබ හැර නොයන්නෙමි. මෙතැන්හිම මාගේ ජීවිතය හරින්නෙමියි සුතනු නම් මුවදෙන කීයේය.

7 "එම්බා සුතනුව, ඇස් අන්ධවූ පිළිදැගුම් කරන්නෙකු නැත්තාවූ ඒ අපගේ මව්පිය දෙදෙනා වනාහි ඒකාන්තයෙන් මැරෙන්නාහුය. තීද මෙතැනින් යව, බලාපොරොත්තු නොවෙව, තී හා සමග මව්පියෝ ජීවත්වන්නාහුයයි රොහන්ත මෘග තෙම කීයේය.

8 "පින්වත් රෝහන්ත මෘගරාජය, මම මෙතැනින් නොයමි. මාගේ හෘදය ශොකයෙන් ඇදගණියි. පුඩුවෙහි බැඳුනාවූ ඔබ හැර නොයන්නෙමියි මෙතැන්හිම ජීවිතය හරින්නෙමියි (සුතනු නම් නැගණියද කීයේය.)

9 "රෞද්‍ර ස්වභාව ඇත්තාවූ ආයුධයක් අතින් ගත් ඒ මේ වැදිතෙම එයි. හෙතෙම අද අපට හීයෙන්ද, අඩයටියෙන්ද පහරදී හිංසා කරන්නේය. (එහෙයින් වහා පැනයව් යයි මුවරජතෙම කියේය.

10 "භයින් පෙළුනාවූ, භයින් තැතිගත්තාවූ බියවන සුළුවූ ඒ මුවැත්තී මොහොතක් කල් පලාගොස් සිට ඉතා දුෂ්කරවූවක් කෙළේය. මරණය සඳහා නැවත පෙරලා ආයේය."

11 "මිදුනාහු පුඩුවෙහි බැඳුන ඔබ සමීපයෙහි හැසිරෙත්. ඒ මේ මුවෝ ඔබට කවරහු වෙද්ද, ජීවිතය හේතු කොටගෙණවත් ඔබ හැර යන්ට නොකැමැති වෙත්යයි වැදිතෙම ඇසීය.

12 "එම්බා වැදි පුත්‍රය, මොව්හු සමාන කුස ඇත්තාවූ එක මව වෙත වැඩුනාවූ මාගේ සහෝදරයෝ වෙත්. ඔව්හු ජීවිතය

හේතුකොට ගෙණවත් මා හැර යන්ට නොකැමැති වෙත්යයි මුව රජතෙම කීයේය.

13 "එම්බා වැදිපුත්‍රය, පිළිදැගුම් කරන්නෙකු නැත්තාවූ ඇස් අන්ධවූ අපගේ මව්පිය දෙදෙන වනාහි ඒකාන්තයෙන් මැරෙන්නාහුය. එහෙයින් ඔවුන් දෙදෙනාගේද අප තිදෙනාගේද පස් දෙනෙකුන්ගේ ජීවිතය දෙව, මාගේ සහෝදරයා මුදා හරිනු මැනවැයි චිත්තක නම් මෘගතෙම වැද්දාට කීයේය.

14 "එම්බා මුවරජ, ඒ මම මව්පියන් පොෂණය කරන්නාවූ මුව රජහු මුදා හරින්නෙමි. මරණයෙන් මිදුනාවූ මහා මෘගරාජයා දැක මව්පියෝ සතුටු වෙත්වායි වැදිතෙම කීයේය.

15 "එම්බා වැදිපුත්‍රය, අද මම මරණින් මිදුනාවූ මුව රජහු දැක යම්සේ සතුටුවෙම්ද, එසේම නුඹද සියලු නෑයන් සමග සතුටුවේවායි චිත්‍රකතෙම අනුමෝදනා කෙළේය.

16 "පුත්‍රයිනි, ජීවිතය මරණයට ලංව සිටි කල්හි කෙසේනම් මිදුනේවේද, වැදිතෙම මළ පුඩුවෙන් කෙසේ මුදා හැරියේදැයි (මව්පියෝ ඇසූහ)

17 "පින්වත් මව්පියවරුණි, චිත්‍රක නම් මාගේ සහෝදර තෙම සිත් ගන්නාවූ හෘදය ඇසුරු කළාවූ කණට සුව එළවන්නාවූ වචනය කියමින් යහපත්ව කියනලද වචනවලින් මා මුදා ගත්තේය.

18 "එසේම සුතනුතොමෝද හෘදය ඇසුරු කළාවූ කණට සුව එළවන්නාවූ වචනය කියමින් මනාකොට කියන ලද්දාවූ ඒ වචනවලින් මා මුදා ගත්තේය.

19 "වැදිතෙම හෘදය නිඃශ්‍රිතවූ සිතට වදින්නාවූ කණට සුව එළවන්නාවූ වචන අසා මනාකොට කියනලද ඒ වචනයන් ඇසීම නිසා මා මිදුනේයයි මෘග රාජතෙම කීයේය.

20 "මරණයෙන් මිදී ආවාවූ රෝහන්ත නම් මුවරජහු දැක අද අපි යම්සේ සතුටුවෙමුද, එසේම වැදිපුත්‍ර තෙමේ, අඹු දරුවන් සමග සතුටු වේවායි (මව්පියෝ අනුමෝදනා කළහ.)

21 "එම්බා වැද්දාණෙනි, මුවා හෝ මුවසම් හෝ ගෙණෙමියි නුඹ කීයෙහි නොවේද, එකල්හි කවර කාරණයකින් මුවාහෝ මුව සම් නොගෙනා වේදැයි රජතෙම ඇසීය.

22 "මහරජ, ඒ මුව රජතෙම මාගේ අත් පසටද මා විසින් අටවනලද මල පුඩුවටද පැමිණියේමය. ඒ මුව රජහු පුඩුවෙහි බැඳුණේය. ඒ බැඳුනාවූ මුව රජහුද නොබැඳුනාවූ මුවෝ දෙදෙනෙක් ඇසුරු කරගෙණ සිටියාහුය.

23 "ඒ මට ලොමු ඩැහැගන්නාවූ නොවූවිරූ සංවේගයක් පහළවිය. මම මේ මුවා නසන්නෙම් නම් අද මෙහි ජීවිතය හරින්නෙමියි කියායි.

24 "එම්බා වැදි පුත්‍රය, ඒ මුවෝ කෙබඳුද, කෙබඳු ධර්මයෙහි පිහිටියාවූ මුවෝද, කෙබඳු වර්ණ ඇත්තාහුද, කෙබඳු ස්වභා ඇත්තාහුද, නුඹ දැඩිකොට ඔවුන්ට ප්‍රශංසා කරන්නෙහියයි ඇසීය.

25 "මහරජ, ඒ මුවන්ගේ රිදී දම් වැනි අං ඇත්තාහ. සෙමෙර වල්ගා වැනි පිරිසිදු වල්ගා ඇත්තාහ. රත්රන් පැහැයට බඳු පැහැ ඇත්තාහ. ලේවන් පාද ඇත්තාහ. සිත්කළුවූ අඳුන්ගානලද ඇස්වැනි ඇස් ඇත්තාහයි කීයේය.

26 "දෙවයන් වහන්ස, ඒ මුවෝ මෙබඳුවූහ. ඒ මුවෝ මෙබඳු ධර්ම ඇත්තෝවූහ. දෙවයන් වහන්ස, ඒ මම මව්පියන් පොෂණය කරන්නාවූ ඔවුන් නොගෙනායෙමියි කීයේය

27 "එම්බා වැදිපුත්‍රය, නුඹට ස්වර්ණ නිෂ්ක සියයක් දෙමි. මහත් අගනාවූ මිණිකොඬොලක්ද දෙමි. සතර පැත්තෙන් උස්වූ දියබෙරලියමල් වැනි පසතුරුණු අතුරුවා පයඞ්ංකයක්ද දෙමි

28 "රූපයෙන් හා භොගයෙන් ඔවුනොවුන්ට සමානවූ භාර්‍ය්‍යාවන් දෙදෙනෙක්ද දෙමි. වෘෂභයෙක්ද ගවයන් සියයක්ද දෙමි. වැදිපුත්‍රය, නුඹ මට බොහෝ උපකාර ඇත්තෙක් වෙහිය. මම දැහැමින් රාජ්‍යයද කරවන්නෙමි.

29 "වැදිපුත්‍රය, නුඹ සීසෑමය, වෙළඳාමය ණය දීමය සිඟා හැසිරීමය යන මෙයින් ජීවිකාව කරව, මේ යහපත් ජීවිකා

වෘත්තීවලින් අඹුදරුවන් පොෂණය කරව, නැවත පාපයක් නොකරවයි" රජතෙම කීයේය.

**501 චූලහංස ජාතකය:-** 1 "රන්වන්වූ සිවිය ඇති රන්වන්වූ පැහැ ඇති සුමුඛ නම් හංසය, වක්වූ අවයව ඇති භයින් කම්පාවූ මේ හංසයෝ බැහැර යෙත්. තොපද ඒකාන්තයෙන් බැහැරයව,

2 "මලපුඩුවෙහි අසුවූ හුදකලාවූ මා හැර ඒ මාගේ නෑ සමූහයෝ මා කෙරෙහි අපෙක්ෂාවක් නැත්තාහු යත්. හුදකලාවූ තොප කුමකට පසුබස්නෙහිද,

3 "අහසට පැන යන්නවුන්ගෙන් ශ්‍රෙෂ්ඨවූ හංසය, පැනලාම යව. පාශයෙහි බැඳුනහු කෙරෙහි යහළු බවක් නැත්තේය. ලැබිය යුතු නිදුක්භාවය පිණිස උත්සාහය නො පිරිහෙළව, සුමුඛය, ඒකාන්තයෙන් බැහැර යවයි හංස රජ කීයේය.

4 "ධ්‍රතරාෂ්ට නම් හංසරාජය, නුඹවහන්සේ දුකින් පෙළුනේයයි මම අත්නොහරිමි. මාගේ ජීවත්වීම හෝ මරණය හෝ නුඹවහන්සේ සමග වන්නේයයි සුමුඛතෙම කීයේය.

5 "එම්බා සුමුඛය, මම නුඹවහන්සේ අත්නොහරිමි. තොප යමක් කීයෙහිද, මෙය ආචාරයෙන් යුත් ආර්‍ය්‍යයාගේ යහපත් වචනය වේ. මම වනාහී තා විමසමින් පැනයවයි යන මේ වචනය කීවෙමියි හංස රජතෙම කීයේය.

6 "අහසෙහි හැසිරෙන්නාවූ පක්ෂිතෙමේ පියවර නොතැබීමෙන් අහසෙහි පියවරකොට ගමන්කරයි. හංසයන් අතුරෙන් ඉතා උතුම්වූ එබඳුවූ නුඹ දුරදීම මේ මළපුඩුව දැන නොගන්නේදැයි වැදිතෙම ඇසීය.

7 "යහළු වැදිපුත්‍රය, යම්කලෙක පිරිහීමක්වේද, එකල්හි පුරුෂතෙම ජීවිතය විනාශයට පැමිණීමේ දැළටද, පුඩුවටද ලංවූවත් නොදනීයයි හංසරජ කීයේය."

8 රන්වන්වූ සිවිය ඇති රන්වන් පැහැඇති පක්ෂිය, වක්වූ අවයව ඇති භයින් කම්පාවූ මේ හංසයෝ බැහැර යෙත්. ඔබ පමණක් පසුබසින්නෙහිය.

9 වක්වූ අවයව ඇති මේ පක්ෂීහු අනුභව කොටද පානය කොටද අපේක්ෂාවක් නැත්තාහු බැහැරයෙත්. හුදකලාවූ නුඹම මොහු ඇසුරු කරන්නෙහිය.

10 මිදුනාවූ නුඹ පාශයෙහි බැඳුනාවූ මොහු ඇසුරු කෙළෙහිය. මේ පක්ෂිතෙම ඔබට කවරෙක්වේද, පක්ෂීහු මොහු හැරයෙත්. කුමක් හෙයින් හුදකළාවූ නුඹ පසු බසින්නෙහිදැයි වැදිතෙම ඇසීය.

11 එම්බා වැදිපුත්‍රය, මේ පක්ෂිතෙම මාගේ රජවෙයි. මිත්‍රයාද වෙයි. මාගේ ප්‍රාණය හා සමවූ යහළුවාදවේ. ජීවත් වන කාලයාගේ කෙළවර දක්වා මම ඔහු නොමහරින්නෙමියි සුමුඛතෙම කීයේය.

12 පින්වත් හංසය, යම්බඳුවූ නුඹ වනාහි යහළුවාගේ හේතුවෙන් ප්‍රාණය හරින්ට කැමැත්තෙහිද, ඒ මම ඔබගේ යහළුවා මුදා හරිමි. මේ හංස රජතෙම නුඹ අනුව යන්නෙක් වේවායි වැදිතෙම කීයේය.

13 එම්බා වැදි පුත්‍රය, යම්සේ අද මම බන්ධනයෙන් මිදුනාවූ මේ පක්ෂිරජ දැක සතුටු වෙම්ද, මෙපරිද්දෙන්ම නුඹද සියලු නෑයන් සමග සතුටු වේවායි අනුමෝදන් කෙළේය.

14 කිමෙක්ද, පින්වත් මහරජ, ඔබට සැපද, කිමෙක්ද පින්වත්හට නිරෝගද කිමෙක්ද, මේ රට සමෘද්ධද, ධර්මයෙන් අනුශාසනාකරන්නෙහි දැයි (හංසරාජයා ඇසීය.)

15 එම්බා හංසරාජය, මට නිදුක්ද වේමය තවද හංස රාජය, නීරෝගයදවේ. තවද මේ රට සමෘද්ධය, මම දැහැමින් අනුශාසනා කරමියි (රජතෙම කීයේය.)

16 කිමෙක්ද, පින්වතාගේ ඇමැතියන් කෙරෙහි කිසියම් දොෂයක් නැත්තේද, කිම, ඔබගේ සතුරෝ දකුණු දිගට නොයන සෙවනැල්ල මෙන් දුරුවූවාහු දැයි ඇසීය.

17 තවද මාගේ ඇමැතියන් කෙරෙහි කිසි දොසෙක් නැත්තේය. තවද මාගේ සතුරෝ දකුණු දිගට නොයන සෙවනැල්ල මෙන් දුරුවූවාහුයයි කීයේය,

18 කිම ඔබගේ භාර්‍ය්‍යාතොමෝ සමාන ගුණ ඇත්තීද කීකරුවූවාද, ප්‍රිය වචන කියන්නීද, පුත්‍රයන් රූපය යශස් යන මෙයින් යුක්තවූවාද, ඔබගේ කැමැත්තට අනුව පවත්නී දැයි ඇසුයේය.

19 තවද මාගේ භාර්‍ය්‍යාතොමෝ සමාන ගුණ ඇත්තීය. කීකරුය. ප්‍රිය වචන කියන්නීය, පුත්‍රයන්ය, රූපය, යශස්ය යන මෙයින් යුක්තවූවාය. මාගේ කැමැත්ත අනුව පවත්නී යයි කීයේය.

20 රට වර්ධනය කරන්නාවූ මහරජ, මනාකොට උපන්නාවූ ඔබගේ බොහෝවූ පුත්‍රයෝ ප්‍රඥාවේගයෙන් යුක්තවූවාහු ඒ ඒ තන්හි සතුටින් වාසය කෙරෙද්දැයි ඇසීය.

21 ධෘතරාෂ්ට්‍ර නම් හංසරාජය, මා හා ප්‍රකටවූ මාගේ පුත්‍රයෝ එකසිය එක්දෙනෙක් වෙත්. ඔවුන්ට නුඹ වහන්සේ කටයුතු දේ කියනු මැනව, ඔව්හු ඔබගේ වචනය නොවරදවන්නාහුයයි කීයේය.

22 පින්වත්නි, ඉදින් ජාතියෙන් හෝ අචාර විනයෙන් හෝ යුක්තවූයේද ඉගෙණිය යුතු කල්හි නොඉගෙණ නැවත පසුව උත්සාහ කෙරේද? එබඳු කටයුත්තක් ඇතිකල්හි හෝ විපත් පැමිණි කල්හි හෝ හෙතෙම ගැලෙයි,

23 නුගත් බැවින් නිශ්චල නුවූ ප්‍රඥා ඇති ඔහුට භෝගාදීන් සම්බන්ධවූ මහත් සිදුරක් හෙවත් පිරිහීමක් හට ගනියි. රාත්‍රියෙහි අන්ධයෙකු මහත්වූ රූපම දක්නේද, එමෙන් හෙතෙම සියුම් කරුණු නොදක්නේය.

24 නිශ්ශාරවූ සමයයෙහි සාරයෙන් යුක්තයයි හඟින්නේ ප්‍රඥාව නොලබාමය, හෙතෙම පර්වත දුර්ගයෙහි සරභ මෘගයෙකුමෙන් අතරමගදීම ගැලෙයි

25 ඉදින් මහරජ හීනජාති ඇත්තේද, උත්ථාන වීර්‍ය්‍යය ඇත්තාවූ ප්‍රඥා ඇති මනුෂ්‍යතෙම ආචාරගුණයෙන් හා ශීලයෙන් යුක්තවූයේ රාත්‍රියෙහි ගිනිකඳක් මෙන් බබළයි

**26** මා විසින් කියනලද මෙය උපමාකොට ඔබගේ පුත්‍රයන් විද්‍යාවන්හි යොදව, හෙවත් උගන්වව, එසේ උගන්වන ලද්දාවූ නුවණැත්තේ මනා කෙතෙහි වපුල බිජුවට වර්ෂා ජලයෙන් වැඩෙන්නාක් මෙන් මනාව වැඩෙන්නේයයි හංස රජතෙම බණ කීයේය."

**502 සත්තිගුම්බ ජාතකයඃ- 1** "පඤ්චාල දෙශවාසීන්ගේ රථ ශ්‍රෙෂ්ඨවූ මුවදඩයම් කරන්නාවූ මහරජතෙම සෙනග සමග නික්මුනේ සමූහයාගෙන් වෙන්ව වනයට පිවිසියේය.

**2** ඒ රජතෙම ඒ වනයෙහි සොරුන් විසින් කරණ ලද කුටියක් දුටුවේය. ඒ කුටියෙන් නික්ම අවුත් ගිරවෙක් රෞද්‍ර වචන කියයි.

**3** අශ්ව වාහනයෙන් යුක්තවූ මනා මටවූ කුණ්ඩල ඇති රක්තවර්ණ නළල් පටක් ඇති තරුණවූ පුරුෂතෙම දහවල් සූර්‍ය්‍යයා බබළන්නාක් මෙන් බබළයි.

**4-5** දැන් මෙබඳු මධ්‍යාහ්ණයෙහි රියැදුරු සහිත රජ තෙම නිදන ලද්දේය. එබැවින් අපි මොහුගේ ආභරණ සියල්ල බලාත්කාරයෙන් ගනිමු. රාත්‍රියෙහිදු දැනුදු රහස්ව රියැදුරු සහිත රජතෙමේ නිදන ලදී. මොහුගේ වස්ත්‍රද මිණිකොඬොල්ද ගෙණ මොහු මරා කොළ අතුවලින් වසාදමමුයි සත්තිගුමබ නම් ගිරවා පතිකෝලම්බ නම් සොරාට කීයේය.

**6** එම්බා සත්තිගුම්බය, උමතු ස්වභාව ඇත්තෙකු මෙන් තෝ කුමක් කියන්නෙහිද, ඇවිලෙන ලද ගින්නක් මෙන් රජවරු ලංවිය නොහැක්කාහුමයයි සොරා කීවේය.

**7** එම්බා පතිකෝලම්බය, තෝ මත්වූයේ මහත්වූ ගර්ජනා කරන්නෙහිනොවේද, මාගේ මව නග්නව සිටිකල්හි කිමෙක්ද, නුඹ සොරකම පිළිකුල් කරන්නෙහිදැයි සත්තිගුම්බනම් ගිරවා ඇසීය.

**8** යහළු සාරථිය, වහා නැගිටුව, රථය යොදව, මේ පක්ෂීහු මට රුචි නොවෙත්. අනික් අසපුවකට යමුයි රජ තෙම කීවේය.

9 මහරජ, බලවත් අසුන් යොදන ලද්දාවූද රථය තෙම යොදනලදී. මහරජ, එහි නගිනු මැනව, අනික් අසපුවකට යමුයි රියැදුරු කීයේය.

10 මේ අසපුවෙහි වාසය කරන්නාවූ යම් සොරුවෙද්ද මේ සියල්ලෝ කොහිගියාහුද, ඒ සොරුන්ගේ නොදැක්මෙන් මිදුනාවූ මේ පඤ්චාල රජතෙම යන්නේය.

11 දුනු ගණිව්, අඩයටිද තෝමරද ගණිව්. මේ පඤ්චාල රජතෙම යන්නේය. ජීවත්වන්නාවූ ඔහු තොපි මුදා නොහරිව්යයි සත්තිගුම්බයා කීයේය.

12 ඉක්බිති අනාවූ ලේවන්තුඩ ඇති ගිරවෙක්තෙම මහරජ, ඔබට යහපත් ඊමක්වේවා. තවද ඔබගේ අප සමීපයට පැමිණීම යහපත කියා පිළිගෙණ සතුටු වූයේය

13 මෙහි පැමිණියාවූ ඔබ මෙහි අධිපති වෙහිය. මෙහි කැමති යමක් ඇත්නම් ඒ කියව, තිඹිරි ගෙඩිද මොර ගෙඩිද, මී ගෙඩිද, එරමිණියද යන මොහු ඇත්තාහ.

14 මහරජ, හොඳ හොඳ මේ කුඩා ගෙඩි වර්ග අනුභව කරව, මේ සිහිල් පැන්ද කඳුරැලියෙන් ගෙණෙනලදී. එහෙයින් මහරජ, ඉදින් ඔබ කැමැත්තෙහි නම් එය පානය කරව.

15 මහරජ, මේ අසපුවෙහි වාසය කරන්නාවූ යම් සෘෂීහු වෙද්ද, උන්වහන්සේලා පලවැල පිණිස වනයට ගියාහුය. එහෙයින් තෙමේ නැගිට ගොස් ගණු මැනව, දීමට මට අත් නැතැයි පුප්ඵක නම් ගිරාතෙම කීයේය.

16 උතුම් ධර්මයෙහි පිහිටියාවූ ද්විජනම්වූ මේ පක්ෂිතෙම ඒකාන්තයෙන් යහපත්වේ. තවද මේ අනික් ගිරා පක්ෂිතෙම රෞද්‍ර වචන කියයි.

17 මොහු මරව්, බඳිව්, මොහුගේ ජීවිතය අත් නො හරිව්යයි මෙසේ මෙසේ විලාප කියද්දීම සුවසේ මේ අසපුවට පැමිණියේ වෙමියි රජතෙම කීවේය.

18 මහරජ්ජුරුවෙනි, අපි දෙදෙන සමාන උදර ඇත්තාවූ එක මව විසින් පෝෂණය කළාවූ එක ගසෙක්හි වැඩුනාවූ නොයෙක් තැන්වලට ගියාවූ සහෝදරයෝ වෙමු.

19 "ඒ සත්තිගුම්බ තෙමේද සොරුන්ගේ ළඟට ගියේය. මම වනාහි මෙහි ඍෂීන්ගේ ළඟට පැමිණියෙමි. හෙතෙම අසත් පුරුෂයන්ගේ ළඟට ගියේය. මම සත්පුරුෂයන්ගේ ළඟට පැමිණියෙමි. ඒ ධර්මයෙන් අපගේ වෙනස වූයේයයි පුෂ්පක තෙම කීයේය.

20 "මහරජ, ඒ සොරුන්ගේ සමීපයෙහි හිංසාවද, බැඳීමද රැවටීම්ද වංචාකිරීම්ද ගම්පැහැරීම්ද බළාත්කාරකම්ද ඇත්තාහ. හෙතෙම ඒ වධ හිංසාදීන් එහි උගනියි.

21 "මෙහි වනාහි මම සත්‍යයද සුචරිතධර්මයද අවිහිංසාවද සංවර ශීලයද ඉන්ද්‍රිය දමනයද ඇත්තාවූ ආගන්තුකයින්ට අසුන්ද පැන්ද දෙන ස්වභාව ඇත්තාවූ ඍෂීන්ගේ ඇකයෙහි වැඩුනේ වෙමියි පුෂ්පක තෙම කීයේය.

22 "මහරජ්ජුරුවෙනි, සත්පුරුෂවූ හෝ නොහොත් අසත් පුරුෂවූ හෝ සිල්වත්වූ හෝ සිල්නැත්තාවූ හෝ යමක් යමක්හුම සේවනය කෙරේද, ඔහුගේම වසඟයට යන්නේය.

23 "යම්බඳුවූවෙකු මිත්‍රයා කෙරෙයිද, යම්බඳු වූවෙකුත් සේවනය කෙරේද, හෙතෙමේද එබඳු වූවෙක්වේ. සමග වාසය කිරීම වනාහි එබඳුවේ.

24 "සේවනය කරණු ලබන්නේ සේවනය කරණු ලබන්නහුද, ස්පර්ශ කරණලද්දේ ස්පර්ශ කරණ අතවැසිවූ අනිකාද, විෂ පොවනලද හීයතෙම හියවුර මෙන් පාප ධර්මයෙන් නොතැවරුණහු තවරයි. පාප ධර්මයෙන් තැවරීමෙහි බියෙන් ප්‍රාඥතෙම පවිටු යහළුවන් ඇත්තෙක් නොවන්නේමය.

25 "යම් මනුෂ්‍යයෙක් තෙම කුණු මසක් කුසතණ අගින් වැළඳගණියිද, ඒ කුසතණද කුණුගඳ හමත්. බාලයන් සේවනය කිරීම මෙබඳුවේ.

26 "යම් මනුෂ්‍යයෙක්තෙම පත්‍රයකින් තුවරලා වැළඳ ගණීද, පත්‍රයෝද සුවඳ හමත්, ප්‍රාඥයන්ගේ සේවනය කිරීම මෙබඳුවේ.

27. "එහෙයින් සුවඳ ඔතා බඳිනලද කොළයට මෙන් තමහට වන විපාකය දැන නුවණැත්තේ අසත් පුරුෂයන් සේවණය

නොකරන්නේය. සත්පුරුෂයන් සේවනය කරන්නේය. අසත්පුරුෂයෝ සේවනය කරන්නාහු නරකයට පමුණුවත්. සත්පුරුෂයෝ සුගතියට පමුණුවත්යයි (පුෂ්පක නම් ගිරවා බණ කීයේය."

**503 හල්ලාටිය ජාතකය:- 1** "පෙර බරණැස හල්ලාටිය නම් රජෙක් වූයේය. ඒ රජතෙම රාජ්‍යය හැර මුවදඩයමට ගියේය. මනාව පිපියාවූ කිඳුරන්ගෙන් ගැවසීගත්තාවූ ගන්ධමාදන නම් උතුම් පර්වතයට ගියේය.

2 "හෙතෙම සුනඛ සමූහයාද වළක්වා දුනු හියවුරුද බහා තබා වචනයක් කියනු කැමැත්තේ කිඳුරෝ යම්තැනෙක සිටියාහුද, එතනට එළඹියේය.

3 "පින්වතුනි, හෙමන්ත අවසානයෙහි මේ හේමවත නම් ගංඉවුරෙහි සිටියාහු නිබඳ කුමක් කථාකරන්නහුද, මිනිසුන්ගේ ශරීර බඳු ශරීර ඇත්තවුනි. තොපගෙන් විචාරමි. තොපි මනුෂ්‍ය ලෝකයෙහි කෙසේ නම් දනිද්දැයි රජතෙම ඇසීය.

4 "සබඳ වැද්දාණෙනි, අපි මේ මල්‍ය පර්වතයද, පණ්ඩරක නම් පර්වතයද, ත්‍රිකූට නම් පර්වතයද, සිහිල් දිය ඇති ගංගාවන්ද අනුව හැසිරෙමු මිනිසුන් හා සමානවූ මෘගයෝවූ අපි කිං පුරුෂයෝයයි දනිත්යයි කිඳුරී කීවාය.

5 "මිනිසුන් හා සමාන සිරුරු ඇත්තනි, ඉතා දුකට පැමිණියාක් මෙන් වැළපෙන්නහුය. ප්‍රියාව විසින් ප්‍රියතෙම වැළඳගන්නා ලද්දේද විය. මේ වනයෙහි නොසතුටුවූවාහු කුමකට හඬව්දැයි තොප විචාරමි.

6 "මිනිසුන්ට සමාන ශරීරවර්ණ ඇත්තෙනි, ඉතා දුක් ස්වභාවයෙන් වැළපෙන්නාහුය. ප්‍රියාව විසින් ප්‍රියතෙම වැළඳගන්නා ලද්දේදවිය. මේ වනයෙහි නොසතුටුවූවාහු කවර කරුණකින් වැළපෙන්නහුදැයි තොප විචාරමි.

7 "මිනිසුන්ට බඳු ශරීරවර්ණ ඇත්තෙනි, ඉතාදුක් ස්වභාවයෙන් හඬන්නහුය. ප්‍රියාව විසින් ප්‍රියතෙම වැළඳ ගන්නා ලද්දේවිය. කුමක් හෙයින් මේ වනයෙහි නොසතුටු වූවාහු ශොකවම්දැයි තොප විචාරමියි රජතෙම කීයේය.

8 "සබඳ වැද්දාණෙනි, අපි නොකැමැත්තාහු ඔවුනොවුන් සිහිකරන්නාහු එක් රැයක් වෙන්ව වාසය කෙළෙමු. ඒ එක රාත්‍රිය අනුව තැවෙන්නාවූ අපි එබඳු රාත්‍රියක් නැවත නොපැමිණේවායි ශොක කරමු.

9 "මිනිසුන්ට බඳු ශරීරවර්ණ ඇත්තෙනි, තෙපි යම් මේ එක රැයක් නැසුනාවූ ධනය හෝ පරලොව ගියාවූ පියා හෝ අනුව තැවුනහුද, කෙසේ නම් වෙන්ව වාසය කළහුදැයි තොප විචාරමි."

10 "වහා බස්නා දිය පහර ඇති නොයෙක් ගස්වලින් වැසුනාවූ පර්වත දෙකක් අතරින් බස්නාවූ යම් මේ ගඟක් දක්නෙහිද, මාගේ ප්‍රියතෙම මාද පසුපස්සේ එන්නීයයි හඟිමින් වර්ෂාකාලයෙහි ඒ ගඟ එතෙර කෙළේය.

11 "මම වනාහි පිපුනාවූ අඟුන මල්ද යොහොඹු මල්ද සත්පෙති දෑසමන්ද සීනිද්දද නෙලීමි. මාගේ ප්‍රිය තෙමේද මල් මාලාබර ඇත්තෙක් වන්නේය. මමද මල්මාලා ඇතුව ඔහු වෙත එළඹෙන්නෙමියි.

12 "තවද මම රත්කරවිද ඇසළද පළොල්ද නිකමල්ද කඩාරැස් කෙළෙමි. මාගේ ප්‍රිය තෙමේද මල්බර ඇත්තෙක් වන්නේය. මමද මල් මාලා ඇත්තී ඔහුවෙත එළඹෙන්නෙමි කියායි.

13 "තවද මම මනාව පිපියාවූ සල්ගසක මල් නෙලා මාලාවක් කෙළෙමි. මාගේ ප්‍රිය තෙමේද මල්බර ඇත්තෙක් වන්නේය මමද මාලා ඇත්තී ඔහුවෙත එළඹෙන්නෙමියි කීවාය.

14 "තවද මම මනාව පිපියාවූ සල්ගසක මල් කඩා බරක් කෙළෙමි. යම්තැනක අද මේ රැය වාසය කරන්නෙමුද, මේ මල් රැසද එහි අපට ඇතිරීම පිණිස වන්නේය.

15 "තවද මම ප්‍රමාද ස්වභාව ඇත්තී අගිල්ද සඳුන්ද ගලෙහිලා ඇඹරීමි. මාගේ ප්‍රිය තෙමේද සුවඳ ගල්වනලද ශරීර ඇත්තෙක් වන්නේය. මමද සුවඳ ගල්වනලද්දී ඔහු වෙත එළඹෙන්නෙමි කියායි.

16 "ඉක්බිති, වහා බස්නාවූ ගඟදිය රැස්කරණලද සල් මල්ද සලිල මල්ද, කිණිහිරිමල්ද ගසාගෙණ යමින් පැමිණියේය. ඒ මොහොතකින් ගඟ පිරීගියේය. මේ ගඟ මා විසින් එතෙර කළ නොහැකිවීය.

17 "එකල්හි ඉවුරු දෙකෙහි සිටියාවූ අපි දෙදෙන ඔවුනොවුන් දක්නාහු වරකුත් හැඬීමු. වරක් සිනාසුනෙමු. මෙසේ දුකින් අපට ඒ රාත්‍රී තොමෝ ගතවීය.

18 "එම්බා වැදිපුත්‍රය, උදෑසන වනාහි හිරු උදාවූ කල්හි දියහිස්වූ ගඟ එතෙර කොට අපි දෙදෙන ඔවු නොවුන් වැළඳගෙණ වරකුත් හැඬීමු, වරක් සිනාසුනෙමු.

19 "එම්බා වැදිපුත්‍රය, යම්කාලයක මෙහි අපි වෙන්ව විසුයෙමුද. ඒ කාලය මෙයින් පෙර තුනකින් අඩු අව්රුදු සත්සියයක් වෙත්. රජ්ජුරුවෙනි, වාසය කිරීම මේ එක්සියයක් හවුරුදු පමණවූ ජීවිත කාලයවේ. මෙසේ මේ සුළු ජීවිත කාලයෙහි කවරෙක් නම් ප්‍රිය භාර්‍ය්‍යාවගෙන් වෙන්ව (වාසයකරන්නේදැයි ඇසීය.)

20 "යහළු කිඳුරෙනි, තොපගේ ආයුෂද කොතෙක් වේදැයි ඉදින් දන්නහු නම් ආයුෂ පමණ කියව්, කිසිවෙකුගෙන් ඇසීමෙන් හෝ වැඩිමහල්ලන්ගෙන් අසා දැනීමෙන් හෝ මෙය කම්පා නොව මට කියව්යයි රජතෙම කීයේය.

21 "එම්බා වැදි රජ අපගේ ආයුෂය වනාහි අවුරුදු දහසක්වේ. අතර පවිටු රෝගයක්ද නැත්තේය. දුක ස්වල්පද වේ. වැඩි වශයෙන් සැපයම වේ. ඔවුනොවුන් කෙරෙහි පහ නොවූ ප්‍රේම ඇත්තෝව, ජීවිතය හරිමුයි කිඳුරී කීවාය.

22 "ඉක්බිති භල්ලාටිය නම් රජතෙම අමනුෂ්‍යාවූ කිඳුරන්ගේ මේ කථාවද අසා ජීවිත කාලය ස්වල්පයයි දැන නැවතුනේය. මුවන් මැරීමෙහි නොහැසුරුනේය. දන් දුන්නේය සම්පත් අනුභව කෙළේයයි" වදාළේය.

23 "අමනුෂ්‍යාවූ කිඳුරන්ගේ මේ පුවතද අසා සතුටුවව්, කලහ නොකරව්, යම්සේ ඒ කිඳුරන් එක් රැයක් තැවීද එපරිද්දෙන් තමාගේ කර්මදෝෂය තෙම තොප නොතවාවා.

24 "අමනුෂ්‍යවූත් කිඳුරන්ගේ මේ පුවතද අසා සතුටුවව්, විවාද නොකරව්, යම්සේ ඒ කිඳුරන් එක් රැයක් තැවීද, එසේ තමන්ගේ කර්මදොෂය තෙම තොප නොතවාවායි වදාළේය.

25 "ස්වාමීනි නොයෙක් අයුරින් දෙශනා කරණලද ධර්මය පහන් සිත් ඇත්තී මම ඇසුවෙමි. නුඹවහන්සේගේ අර්ථයෙන් යුක්තවූ වචන පථය කණට සුව එලවන්නාවූ මිහිරිවචන මුදමින් මාගේ ශොකය දුරුකෙළේමය දෙව් මිනිස් සැප එලවන්නාවූ මාගේ බුදුරජාණන්වහන්ස, බොහෝ කලක් ජීවත්වනු මැනවයි. මල්ලිකාදේවි කීවාය."

504 **සොමනස්ස ජාතකයඃ-** "ස්වාමීනි, කවරෙක් ඔබ වහන්සේට හිංසා කෙරේද, ආක්‍රොෂ කෙරේද, කුමකට දොම්නස් වූයේ නොසතුටු වූයේ ශොක කරන්නෙහිද, කවරෙකුගේ අද මව්පියෝ හඬාවැළපෙද්ද, කවරෙක් නම් අද දඬුවම් කරණ ලද්දේ භූමියෙහි ශයනය කෙරේදැයි, රේණු රජතෙම කීයේය.

2 "දෙවයන් වහන්ස, ඔබවහන්සේගේ දැකීමෙන් සතුටුවූයේ වෙමි. රජ්ජුරුවෙනි, ඔබ බොහෝ දවසකින් දකිමි. රේණු නම් දේවයන් වහන්ස, ඔබ වහන්සේගේ පුත්‍රයා විසින් අසපුවට ඇතුල්ව අහිංසකවූ මම වෙහෙසන ලද්දේ වෙමියි කූටජටිලයා කීයේය.

3 "කඩු බඳනාලද දොරටුපාලයෝ යෙත්වා, චෝර ඝාතකයෝ අන්තඃපුරයට යෙත්වා. ගොස් ඒ සෝමනස්ස නම් කුමාරයා සිඳ උතුම්හිස ගෙණ එත්වායි (රජ අණ කෙළේය.)

4 "යවන ලද්දාවූ රජහුගේ දූතයෝ කුමාරයාට මෙය කීවාහුය. එම්බා රාජකුමාරය, රජහු විසින් හැරදමන ලද්දේවෙහිය. එහෙයින් ඔබ වධයට පැමිණියේ වෙහිය.

5 "ඒ රාජපුත්‍ර තෙමේ වැළපෙමින් ඇඟිලි දශයක් ඇති ඇඳිළි බැඳගෙණ මමද රජහු දක්නට කැමැත්තෙමි. ජීවත් වන්නාවූ මා ගෙණගොස් රජහට දක්වව්යයි කීයේය.

6 "ඒ දූතයෝ ඒ කුමාරයගේ ඒ වචනය අසා රජහට පුත්‍රයා දැක්වූවාහුය. පුත්‍රතෙමේද පියා දැක දුරදීම මෙසේ කීයේය.

මහරජ්ජුරුවන් වහන්ස, කඩු බඳනා ලද දොරටු පාලයෝ ආවාහුය, මා නසන්ට චොරඝාතකයෝ ආවාහුය, මෙහි මාගේ කවර නම් අපරාධයෙක් ඇත්තේදැයි දැන් මා විසින් අසන ලද්දේ මේ කාරණය මට කියවයි කුමාරයා කීයේය.

7 "සවසද උදයද දියට බැසීමකරයි. හැම කල්හි අප්‍රමාදව ගිනිපුදයි. ඒ එබඳුවූ සංයමවූ බ්‍රහ්මචාරීවූ තාපසයන්ට කුමක් හෙයින් නුඹ ගෘහපතියායයි කීයෙහිදැයි ඇසීය.

8 "දෙවයන් වහන්ස, තල්ද අලමුල්ද ගෙඩිවර්ගද අනෙක ප්‍රකාරවූ පරිග්‍රහ වස්තු මොහුට ඇත්තාහ. ඒ වස්තූන් රකියි. අප්‍රමාදව ආරක්ෂාකෙරෙයි. එහෙයින් මේ බ්‍රාහ්මණ තෙමේ ගෘහපති නම් වේයයි කුමාරතෙම කීයේය.

9 "එම්බා කුමාරය, මොහුට අනෙකප්‍රකාරවූ අයිති වස්තු ඇත්තාහ. ඒ වස්තූන් රකියි. අප්‍රමාදවූයේ ඒ වස්තූන් ආරක්ෂා කෙරේ. එහෙයින් බ්‍රාහ්මණතෙම ගෘහපති නම් වේයයි මෙය සැබවක්ම කියන්නෙහිය.

10 "රැස්වූ පිරිසෙහි වූවාහුද නියම් ගම්වැස්සන් සහිතවූ දනව් වැස්සෝද සියල්ලෝ මාගේ වචනය අසත්වා. අඥානවූ මේ රජතෙම අඥානවූ තව්සාගේ වචනය අසා නිකරුනේ මා මරවායයි කීයේය.

11 "දැඩිවූ මුල ඇතිව මහත්ව හටගත් කල්හි අතුපතර හටගත්තාවූ හුණපඳුර වෙන්කොට ඇදගත නොහැක්කේය. මහරජ, ඔබගේ පා වඳිමි. දෙවයන් වහන්ස, මට අවසර දුනමැනව, මම පැවිදි වන්නෙමියි කීයේය.

12 "එම්බා කුමාරය, මහත් ප්‍රයෝජන ඇත්තාවූ සම්පත් අනුභව කරව, සියලු ඓශ්වර්‍ය්‍යයද තොපට දෙමි. අදම නුඹ කුරුරටවාසීන්ට රජවෙව, පැවිදි නොවෙව, ප්‍රව්‍රජ්‍යාව වනාහි දුක්වන්නීයයි රජතෙම කීයේය.

13 "දෙවයන් වහන්ස, මෙහි ඔබගේ කිනම් සම්පතෙක් ඇත්තේද, මම මින් පෙර ජාතියෙහිම සිත්කළුවූ රූපවලින්ද

ශබ්දවලින්ද, තවද රසවලින්ද සුවඳවලින්ද ස්පර්ශවලින්ද, දිව්‍යලෝකයෙහි සිත් අලවා වාසය කෙළෙමි.

14 "දෙවයන් වහන්ස, මා විසින් දිව්‍යප්සරා සමූහයා විසින් පිරිවරණ ලද්දාවූ දෙව්ලොව සම්පත් අනුභව කරණලදී. ඔබගේ අනුන් විසින් පැමිණ වියයුතු අඥාන බව දැන එබඳුවූ රජකුලයෙහි නොවසන්නෙමියි කීයේය.

15 "පුත්‍රය, ඉදින් මම අඥානවූ අනුන් විසින් පැමිණ විය යුත්තෙක් වෙම්ද මාගේ මේ එකවරද ක්ෂමා කරව, සොමනස්ස කුමාරය, ඉදින් නැවතත් මෙබඳු වරදක් වන්නේ නම් කැමති පරිද්දක් කරවයි රජතෙම කීයේය.

16 "නොසලකා කරණලද්දාවූ තීරණය නොකොට සිතනලද්දාවූ කර්මය බෙහෙතක්හුගේ විපත්තිය මෙන් ලාමකවූ විපාක ඇත්තේවේ.

17 "පරීක්ෂාකොට කරණ ලද්දාවූ මනාව තීරණය කොට සිතන ලද්දාවූද කර්මය බෙහෙතක්හුගේ සම්පත්තිය මෙන් යහපත්වූ විපාක ඇත්තේවේ.

18 "කම්සැප අනුභව කරන්නාවූ අලසවූ ගෘහස්ථ තෙමේ යහපත් නොවේ. සංයම රහිතවූ ප්‍රව්‍රජිත තෙමේ යහපත් නොවේ. පරීක්ෂා නොකොට කටයුතු කරන්නාවූ රජතෙමේ යහපත් නොවේ. යම් පණ්ඩිතයෙක් කිපෙන සුළුද එය යහපත් නොවේ.

19 "ක්ෂත්‍රිය තෙමේ විමසා කරන්නේය. රජතෙමේ නොවිමසා කිසිවක් නොකරන්නේය, මහරජ, විමසා කටයුතු කරන්නහුගේ යශසද කීර්තියද වැඩේ.

20 "මහරජ, අධිපතිකොට පරීක්ෂාකොට දඬුවම පනවන්නේය වහාකරණලද කර්මයට තැවෙන්නේය. මනාව පිහිටුවනලද්දාවූද මිනිසාගේ අර්ථයෝ පසුව ඔවුන් තවන්නාහු නොවෙත්.

21 "ලෝකයෙහි යම් කෙනෙක් පසුව නොතැවෙන්නාවූම විභාගකොට කරණලද කර්මයන් කෙරෙද්ද, සැපවඩන්නාවූ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

නුවණැත්තන් විසින් පසස්නාලද්දාවූ ඒ කර්මයෝ පණ්ඩිතයන් විසින් අනුමත කරණලද්දාහු වෙත්.

22 "මහරජ දොරටු පාලයෝද බඳනාලද කඩු ඇති වධකයෝද මා නසන්ට ආවාහුය. දෙවයන් වහන්ස, මවගේ ඇකයෙහි උන්නාවූද මම ඔවුන් විසින් වහා අදිනා ලද්දේ වෙමි.

23 "මහරජ කර්කෂවූ කරදරවූ ඉතා දුකට පැමිණියේ වෙමි. ඒ මම අද දුකසේ වධයෙන් මිදුනේ මිහිරිවූ ප්‍රියවූ ජීවිතය ලබා සිටිමි. දැන් ඒ මම ප්‍රව්‍රජ්‍යාවට අභිමුඛවූ සිත් ඇත්තේ වෙමියි කුමාරතෙම කීයේය.

24 "එම්බා සුධර්මාවෙනි, ඔබගේ තරුණ පුත්‍රවූ මේ සෝමනස්ස කුමාරතෙම අනුකම්පා ඇත්තේවේ. දැන් යාඥා කරණු ලබන්නේ ඔහු නොලබම් නුඹද ඔහුට යාඥා කරන්ට සුදුසු නොවේදැයි රජතෙම කීයේය.

25 "පුත්‍රය පිඬුසිඟා හැසිරීමෙහිම සිත් අලවා වාසය කරව, පරීක්ෂාකොට සම්‍යක් දෘෂ්ටියෙන් යුත් ධර්මයන්හි ප්‍රව්‍රජ්‍යාවට පැමිණෙව සියලු සත්වයන් කෙරෙහි දඬු බහා නින්දා නොලබනලද්දේ, බ්‍රහ්මලෝකයට පැමිණෙවයි මවු කීවාය.

26 "එම්බා සුධර්මාවෙනි, යම්බඳුවූ දුකට පැමිණියාවූ මා වැඩියක් දුකට පැමිණවූයෙහි ඒකාන්තයෙන් ආශ්චර්‍ය්‍ය ස්වභාවයෙක පුත්‍රයාට යාඥාකරවයි කියනු ලබන්නී වැඩියක්ම කුමාරයා ප්‍රව්‍රජ්‍යාවට උත්සාහවත් කෙළෙහියයි රජ කීයේය.

27 "රාගාදීන් මිදුනාවූ නිරවද්‍යවූ භෝජන ඇති කෙලෙස් පිරිනිවීමෙන් පිරිනිවියාවූ යම් උත්තම කෙනෙක් මේ ලෝකයෙහි හැසිරෙද්ද, ඒ ආර්‍ය්‍යයන් සතු මගට පිළිපදින්නාවූ මාගේ පුත්‍රයා වළක්වන්ට මම උත්සාහ නොකරන්නෙමියි මව් තොමෝ කීවාය.

28 "මේ සුධර්මා තොමෝ යම් කෙනෙකුන්ගේ යහපත් වචන අසා පහවූ ශොක ඇත්තී ඒකාන්තයෙන් මන්දොත්සාහ වූවාද, යම් කෙනෙක් බොහෝ කරුණු සිතන්නාවූ බහු ශ්‍රැතවූවාහුවෙද්ද, ඒ සප්‍රාඥයෝ ඒකාන්තයෙන් සේවනය කටයුතු වෙත්යයි රජතෙම කීයේය."

**505 චම්පෙය්‍ය ජාතකය:- 1** "විදුළියක් මෙන්ද දවහත් තරුව මෙන්ද කවර නම් තැනැත්තියක්වූ තී බබළමින් සිටින්නෙහිද, දෙව්දුවක් හෝ වෙහිද, ගන්ධර්ව ස්ත්‍රියක් හෝ වෙහිද, තී මනුෂ්‍ය ස්ත්‍රියකැයි නොහඟිමියි උග්ගසෙන රජ තෙම ඇසීය.

2 "මහරජ්ජුරුවෙනි, මම දෙව්දුවක් නොවෙමි. ගන්ධර්ව ස්ත්‍රියක්ද නොවෙමි. මනුෂ්‍ය ස්ත්‍රියක්ද නොවෙමි. ස්වාමීනි මම නාගකන්‍යාවක් වෙමි. යම්කිසි කටයුත්තක් සඳහා මෙහි ආමියි කීය.

3 "එම්බා නාගකන්‍යාව විභ්‍රාන්ත සිත් ඇත්තී කිපුනාවූ ඉන්ද්‍රියයන් ඇත්තීවෙහිය. තොපගේ ඇස්වලින් කඳුළුධාරාවෝ වැගිරෙත්. තොපගේ කිනම් වස්තුවක් නැතිවූයේද, කුමක් වනාහි පතමින් මෙහි ආවාදැයි එබැවින් එය මට කියවයි රජ තෙම කීයේය.

4 "මහරජ්ජුරුවෙනි, යමෙකුට උග්‍ර තේජස් ඇත්තාවූ උරයෙන් ගමන්කරන්නෙකැයි කීවාහුද, ජනයෝ ඔහුට නාගයායයි කියත්. දිවිරැකීම ප්‍රයෝජනකොට ඇත්තාවූ පුරුෂයෙක් තෙම ඔහු අල්වාගත්තේය. ඒ නාගයා බන්ධනයෙන් මුදාහරිනු මැනව, මේතෙම මාගේ ස්වාමියායයි කීවාය.

5 "එම්බා නාගකන්‍යාවෙනි, බලයෙන් හා වීය්‍ර්‍යයෙන් යුක්තවූ මේ නාගතෙම මේ වනිබ්බක පුරුෂයාගේ අත්පත් වීමට කෙසේ නම් පැමිණියේද, මොහු විසින් ගන්නාලද නාගයා කෙසේ දනිමුද, ඒ කාරණය මට කියවයි කීයේය.

6 "බලයෙන් හා වීය්‍ර්‍යයෙන් යුක්තවූ ඒ නාගතෙම එසේ වනාහි නුවරද හළු කරන්නේය. නාගතෙමේ ධර්මයම ගරුකරන්නේවේ. එහෙයින් ඒ දුක ඉවසා තපස්හී වීය්‍ර්‍යයම කෙරේයයි කීයේය.

7 "මහරජ, මේ නාගරජතෙම තුදුස්වක් පොහොයද පසළොස්වක් පොහොයද සතරමංසන්ධියෙක්හි පෙහෙව වාසය කරයි. ජීවිකාව ප්‍රයෝජනකොට ඇති පුරුෂයෙක් තෙම ඔහු අල්වාගත්තේය. ඒ නාරජ බන්ධනයෙන් මුදනු මැනව, මෙතෙම මාගේ ස්වාමියා යයි කීවාය.

8 "අමුනනලද මිණිකොඬොල් ඇති ජලය ගෘහ සයන කොට ඇත්තාවූ සොළොස් දහසක් ස්ත්‍රීහුවෙත්. ඒ ස්ත්‍රීහුද ඔහු සරණකොට ගියාහුය. ගම්වරයෙන්ද ස්වර්ණ නිෂ්කයෙන්ද ගවයන් සියගණන් දීමෙන්ද සැහැසිකමින් නොව ධර්මයෙන් මුදනු මැනව, මුදාහරිනලද ශරීර ඇති උරගතෙම හැසිරේවා පින් කැමැත්තේ බන්ධනයෙන් මුදාවායි කීවාය.

9 "ගම්වර දීමෙන්ද ස්වර්ණනිෂ්ක දීමෙන්ද ගවයන් සිය ගණන් දීමෙන්ද, සැහැසිකමින් නොව ධර්මයෙන් මුදමි. මුදා හරිනලද ශරීර ඇති උරගතෙම හැසිරේවා, පින් කැමැත්තේ බන්ධනයෙන් මුදාවා.

10 "වැදිපුත්‍රය, ස්වර්ණ නිෂ්ක සියයක්ද මහත්වූ මිණි කොඬොලක්ද සිව්පසින් උස්වූ දියබෙරලිය මල් බඳු පැහැ ඇති පර්‍ය්‍යංකයක්ද සමාන ගුණ ඇති භාර්‍ය්‍යාවන් දෙදෙනක්ද වෘෂභයෙක්ද ගවයන් සියයක්ද දෙමි. මුදාහරිනලද සිරුර ඇති උරගතෙමේ හැසිරේවා පින් කැමැත්තේ බන්ධනයෙන් මුදාවායි රජතෙම කීයේය.

11 "මහරජ්ජුරුවෙනි, මේ වස්තු දීමෙන් තොරවද ඔබගේ වචනය ගරුකරමි. ඒ සර්පයා බන්ධනයෙන් මුදමු. මුදනලද සිරුරු ඇති සර්පතෙමේ හැසිරේවා. පින් කැමැත්තේ බන්ධනයෙන් මුදනුලබාවායි අහිගුණ්ඨිකයා කීයේය.

12 "බන්ධනයෙන් මිදුනාවූ චම්පෙය්‍යක නාගතෙම රජහට මෙය කීයේය. පින්වත් කශී රජ්ජුරුවෙනි, ඔබට නමස්කාර වේවා. කශීරට වර්ධනය කරන්නාවූ රජ්ජුරුවෙනි, ඔබට නමස්කාර කරමි. ඔබට ඇඳිලිබැඳ කියමි. මාගේ නාග භවනය බැලීමට යායුතුයයි නාරජ කීයේය.

13 "පින්වත් නාරජ, මනුෂ්‍යයෙක්තෙම අමනුෂ්‍ය වූවෙකු කෙරෙහි විශ්වාස කරන්නේය යන යමක්වේද, මෙය ඒකාන්තයෙන්ම විශ්වාස නොකොට හැක්කකැයි කියත්, ඉදින් මේ සඳහා මට යාඥා කරන්නෙහි නම් ඔබගේ නාග භවනයන් දකින්නෙමුයි රජතෙම කීයේය.

14 "මහරජ, ඉදින් වනාහි වාතයතෙම පර්වතයක් ගසාගෙණ යන්නේ නමුදු සඳ, හිරුද භූමියෙහී වැටෙන්නාහු නමුදු සියලු ගංගාවෝ උඩුගංබලා යන්නාහු නමුදු මම බොරුවක්නම් නොම කියන්නෙමි.

15 "අදහස ද පැලෙන්නේ නමුදු මුහුද ද වියලෙන්නේ නමුදු භූතයන් දරාසිටින්නාවූ පෘථිවිතොමෝ හැකිලෙන්නේ නමුදු පර්වතයන්ගෙත් උස්වූ මහමෙර සහමුලින් ඉදිරෙන්නේ නමුදු මහරජ, මම බොරුවක් නම් නොම කියන්නෙමියි දිව්රුවේය.

16 "එම්බා නාරජ, මනුෂ්‍යයෙක්තෙම අමනුෂ්‍යවූවෙකු කෙරෙහි විශ්වාස කරන්නේය. යන යමක්වේද, මෙය ඒකාන්තයෙන්ම විශ්වාසකළ නොහැක්කකැයි කියත්. ඉදින් මේ සඳහා මට යාඥා කරන්නෙහි නම් ඔබගේ නාගභවනයන් දකින්නෙමුයි රජතෙම කීයේය.

17 "නාරජ, තොප වනාහි මහත්වූ දරුණුවිෂ ඇත්තෝවහුය, මහත් තේජස් ඇති වහා කිපෙනසුළුද වව්, බන්ධනයෙන් මුදනලද්දාවූ මාගේ ඒ කාරණයෙන් අප විසින් කළ උපකාරයන් දැනගන්ට නුඹ සුදුසුවෙහියයි රජතෙම කීයේය.

18 "මහරජ, යමෙක්තෙම එබඳුවූ කරණලද ධර්මය නොදන්නේද, හෙතෙම දරුණු ස්වභාව ඇති නරකයෙහි පැසේවා. කායික වූ කිසි සුවයක් නොලබාවා. පැසෙක්හි බඳනා ලද්දේ මරණයට පැමිණේවායි මෙසේ දිව්ළේය.

19 "පින්වත් නාගරාජය, ඔබගේ මේ ප්‍රතිඥාව සත්‍යවූ ප්‍රතිඥාවක් වේවා නොකිපෙනසුළුවූ බද්ධ වෛර නැත්තෙක් වෙව, තොපගේ සියලුම නාගකුලය සුපර්ණයෝ ග්‍රීෂ්මකාලවල ගින්නක් මෙන් දුරුකෙරෙත්වායි කීයේය.

20 "මහරජ්ජුරුවෙනි, ඉතා ප්‍රියවූ එකම පුත්‍රයෙකුට මවමෙන් නාගකුලයට අනුකම්පා කෙරෙහි නම් මමද ඔබට නාගකුලය හා සමග මහත්වූ වතාවතක් කරන්නෙමියි නාරජ කීයේය.

21 "ඉතා විසිතුරුවූ රජුගේ රථයෙහි කම්බෝජ රට උපන්නාවූ ඉතා හික්මුණු අශ්වතරයන් ඒකාන්තයෙන් යොදත්වා. රත්‍රනින්

සැරසුවාවූ ඇතුන්ද යොදත්වා. නාරජහුගේ විමානයන් දකින්නෙමුයි රජතෙම අණකෙළේය.

22 "උග්ගසේන නම් රජහුගේ මහබෙරද මිහිඟුබෙරද, පනාබෙරද, සංඛයෝද, වාදනය කළාහුය. පිරිවරණලද ස්ත්‍රී සමූහයා මැද ඉතාම ශොභමානවූ රජතෙම ගියේයයිවදාළේය.

23 "කශීරට වර්ධනය කරන්නාවූ රජතෙම රන්වැලි අතුරණලද භූමියද වෙරළුමිණි පුවරු අතුරණලද රනින් කළ ප්‍රාශාදයන්ද දුටුයේය.

24 "සූයඝීයාගේ වර්ණයට බඳුවූ රන්වන් විදුලියක් මෙන් පැහැ විහිදෙන්නාවූ චම්පෙය්‍ය නම් නාරාජයාගේ සිත්කළුවූ විමානයට ඒ උග්ගසේන නම් රජතෙම ඇතුල්වූයේය

25 "ඒ කශීරජතෙම නොයෙක් වෘක්ෂවලින් ගැවසුනාවූ නොයෙක් සුවඳ විහිදෙන්නාවූ චම්පෙය්‍ය නම් නා රජහුගේ විමානයට ඇතුල්වූයේය.

26 "චම්පෙය්‍ය නා රජහුගේ විමානයට කශීරජ ඇතුල් වූ කල්හි දිව්‍යවූ තූයඝීයෝ වාදනය කළාහුය. නාගකන්‍යාවෝද නැටුවාහුය.

27 "නාගකන්‍යා සමූහයා විසින් හැසිරෙනලද ඒ විමානයට ප්‍රසන්නවූ කශීරජතෙම ගොඩනැංගේය. රජතෙම දිව්‍යවූ සඳුන් කල්ක ගල්වනලද හේත්තුවන පුවරු සහිතවූ රණින් කළ පුටුවෙක්හි හිඳගත්තේයයි වදාළේය.

28 "ඒ කශී රජතෙම එහි අනුභවකොටද නැවත අභිරමණයකොටද, චම්පෙය්‍යක නම් නා රජුට මෙසේ කීයේය. පින්වත් නාරජ, ඔබගේ සූයඝීයාබඳු පැහැ ඇති පැහැ විහිදෙන්නාවූ මේ උතුම් විමානයෝ වෙත්. මෙබඳු විමානයක් මනුෂ්‍යලෝකයෙහි නැත්තේය. ඔබ කුමක් සඳහා තපස් කරන්නෙහිද හෙවත් පෙහෙවස් රකින්නෙහිද,

29 "රන්වන් ආභරණ දමන්නාවූ මනාකොට හඳනාලද වස්ත්‍ර ඇත්තාවූ පබළු දළු වැනි වටවූ ඇඟිලි ඇති තඹවන් අතුල්පතුල්වලින් යුක්තවූ අලාමක වර්ණ ඇත්තාවූ ඒ නාග

කන්‍යාවෝ දිව්‍යවූ පානය ගෙණ පොවත්. නාගරාජය, මනුෂ්‍ය ලෝකයෙහි මෙබන්දක් නැත්තේය. කුමක් සඳහා තපස් කරන්නෙහිද,

30 "පුළුල් වරල්වලින් යුත් මත්ස්‍යයන් ඇති, උකුසු පක්ෂීන් විසින් පවත්වනලද නාද ඇති මනාතොටුපල ඇති ඒ මේ ගංගාවෝද ඇත්තාහ. නාරජ, මනුෂ්‍යලෝකයෙහි මෙබඳු වූවක් නැත්තේය. කුමක් සඳහා තපස්කරන්නෙහිද,

31 "එම්බා නාගරාජය, දිව්‍යවූ කොස්වා ලිහිණිද, මොණරුද, හංසයෝද මිහිරිනාද ඇත්තාවූ කොවුලෝද ගසින් ගසට මාරුවෙත්. මනුෂ්‍ය ලෝකයෙහි මෙබන්දක් නැත්තේය. කුමක් සඳහා තපස් කරන්නෙහිද,

32 'එම්බා නාගරාජය, පිපී ගියාවූ අඹද, සල්ද, එරහැන්දද, දඹද, ඇසළ ගස්ද, පළොල් ගස්ද ඇත්තාහ. මනුෂ්‍ය ලෝකයෙහි මෙබන්දක් නැත්තේය. කුමක් සඳහා පෙහෙවස් වසන්නෙහිද,

33 "එම්බා නාරජ, ඒ මේ පොකුණුද හාත්පස දිව්‍යවූ සුගන්ධයෝ නිතර හමත්. මනුෂ්‍ය ලෝකයෙහි මෙබන්දක් නැත්තේය. කුමක් සඳහා තපස් කරන්නෙහිද,

34 "මහරජ, මම පුත්‍රයන් හේතුකොටගෙණ පෙහෙවස් නොවසමි. ධනය හේතුකොටගෙණ ද නොවේ. ආයුෂය හේතු කොට ගෙණද, පෙහෙවස් නොවසමි. මනුෂ්‍යාත්මභාවය පතමින් ඒ කාරණයෙන් උත්සාහකොට පෙහෙවස් වසමියි කීයේය.

35 "එම්බා මහරජ, නුඹ ලේවන් ඇස් ඇති නැසුවාවූ අන්තරා ඇති සරසනලද, කපනලද හිසකේ රැවුල් ඇති රත් සඳුනෙන් සුවඳ ගල්වනලද්දේ ගන්ධර්ව රාජයෙකු මෙන් දිශාවන් බබුළුවන්නෙහිය.

36 "සියලු කාමසම්පත්තියෙන් යුක්තවූ මහත් ආනුභාව ඇත්තාවූ දිව්‍යමය ඍද්ධියට පැමිණියෙක්වෙහිය නාගරාජය, මේ කාරණය ඔබ විචාරමි මේ ලෝකයට වඩා මනුෂ්‍යලෝකය කුමකින් ශ්‍රෙෂ්ඨවේදැයි ඇසුවේය.

37 "මහරජ්ජුරුවෙනි, මනුෂ්‍යලෝකය හැර අන් තැනෙක්හි පිරිසිදු වීමද ශීල සංයමයද නැත්තේය. එහෙයින් මමද මනුෂ්‍යාත්මයක් ලැබ ජාති ජරා මරණයන්ගේ කෙළවර කරන්නෙමියි තපස්කරමියි කීයේය.

38 "නාගරාජය, යම් කෙනෙක් බොහෝ කරුණු සිතන්නාවූ බහුශ්‍රැතයෝ වෙද්ද, ඒකාන්තයෙන්ම එබඳුවූ සප්‍රාඥයෝ සෙවනය කටයුත්තාහුය. මම වනාහි නාග කන්‍යාවන්ද ඔබද දැක බොහෝවූ පින් කරන්නෙමියි කීයේය.

39 "මහරජ, යම්කෙනෙක් බොහෝ කරුණු සිතන්නා වූ බහුශ්‍රැතයෝ වෙද්ද, ඒකාන්තයෙන්ම එබඳු සප්‍රාඥයෝ සේවනය කටයුත්තාහ. නුඹ වනාහි මේ නාගකන්‍යාවන්ද, මා ද, දැක බොහෝ වූ පින් කරවයි නාරජතෙම කීයේය.

40 "මහරජ්ජුරුවෙනි, මාගේ මේ බොහෝවූ රත්රන් ද වේ තල්ගස් පමණ රත්‍රංගොඩවල්ද වෙත්. මෙයින් හැරගෙණ ගොස් ස්වර්ණමය ගෙවල් කරණු මැනව, රිදීවලින් ප්‍රාකාරයක්ද කරත්වා

41 "වෛඩූර්‍ය්‍ය මිශ්‍රවූ මුතුවලින්ද, ගැල් පන්දහසක් මෙයින් හැරගෙණ ගොස් අන්තඃපුරයෙහිවූ භූමියෙහි අතුරත්වා. භූමිතොමෝ මඩ නැත්තී රජස් නැත්තීද වන්නේය.

42 "රාජෝත්තමය, ඉතා ශෝභමානවූ මෙබඳු උතුම් විමානයෙක්හි වාසය කරව, අලාමකවූ නුවණැත්ත සමාධියෙන් පිරීගියාවූ බරණැස් නුවර රාජ්‍යයද කරවයි නාරජ තෙම කීයේය."

**506 මහාපලෝභන ජාතකයඃ-** 1 "සියලු කාම සම්පත්තීන් සමෘද්ධවූ කශී දනව්වෙහි රජහට මහත් ඎද්ධි ඇත්තාවූ දිව්‍යපුත්‍රයෙක් බ්‍රහ්ම ලෝකයෙන් චුතව පුත්‍රයෙක්ව උපන්නේය.

2 "වස්තු කාම ක්ලෙශකාමයන්හි ආශාව හෝ කාම සංඥාව හෝ බ්‍රහ්මලෝකයෙහි විද්‍යමාන නොවේ. යම් කුමාරයෙක් ඒ බ්‍රහ්ම ලෝකයෙහි නිපදවනලද ධ්‍යාන සංඥාවෙන්ම යුක්ත වූයේද, හෙතෙම කාමසම්පත් පිළිකුල් කෙළේය.

3 "ඔහුගේද අන්තඃපුරයෙහි පියා විසින් මනාකොට සාදවනලද ධ්‍යානාගාරයක් හෙවත් විවේකව වසන ගෙයක්

වූයේය. හෙතෙම එහි විවේකයෙන් යුක්තව හුදකලාව රහසිගතව ධ්‍යාන කෙළේය.

4 "ඒ රජතෙම මාගේ මේ එකම පුත්‍රයා කම්සැප අනුභව නොකෙරේයයි පුත්‍ර ශොකයෙන් පෙළුනේ වැළපුනේය.

5 "යම්සේ මාගේ පුත්‍රයා කම්සැප කැමතිවන්නේද, මෙහි එබඳු කවර උපායක් හෝ වේද, කවරෙක් හෝ පළිබොධ කාරණයක් දනීද, කවරෙක් මාගේ පුත්‍රයා පොළඹවන්නේදැයි කීයේය.

6 "ඒ අන්තඃපුරයෙහිම රූපයෙන් හා වර්ණයෙන් යුක්තවූ නැටීමට හා ගී කීමට දක්ෂවූ වීණාවාදනයෙහිද සමර්ථවූ කුමරියක් වූය. ඕතොමෝ එහි රජු වෙත පැමිණ මෙය කීය.

7 "ඉදින් මාගේ ස්වාමි පුරුෂයා වන්නේ නම් මම ඔහු පොළොඹවන්නෙමි කියායි. එසේ කියන්නාවූ ඒ කුමාරියට රජතෙම තීම ඔහු පොළොඹවා ගනුව, තීගේ ස්වාමි පුරුෂයා වන්නේයයි මෙය කීයේය.

8 "ඕතොමෝද, අන්තඃපුරයට ගොස් බොහෝවූ කාමයන්ගෙන් යුක්ත කොටසින් කාවදින්නාවූ ප්‍රේම උපදවන්නාවූ විසිතුරු ගාථාවන් කීහු.

9 "ගායනා කරණු ලබන්නාවූ ඒ ස්ත්‍රියගේද ශබ්දය අසා මේ අනිර්ථිගන්ධ කුමාරයාට කාමරාගය උපන්නේය. හෙතෙම පිරිවර ජනයා විචාළේය.

10 "මේ කවරෙකුගේ ශබ්දයෙක්ද ඒ කවරෙක් හෝ උස් පහත්කොට අනෙකප්‍රකාරවූ සිත් කාවදින්නාවූ ප්‍රේම උපදවන්නාවූ තවද මාගේ කනට සුව එළවන පරිදි කියා දැයි ඇසීය.

11 "දෙවයන් වහන්ස, මෝතොමෝ ස්ත්‍රියක. මෝ තොමෝ මහත්වූ ක්‍රීඩාවක ඉදින් ඔබ කම්සැප අනුභව කරන්නේනම් එය වැඩි වැඩියක් කැමති වන්නාහුය.

12 'එසේනම් මොබට ඒවා නුදුරු තන්හි ගායනා කෙරේවා, සයනාගාරයට සමීපව මාගේ සමීපයෙහි ගායනා කෙරේවා.

13 'බිත්තියෙන් පිටත්හි ගායනාකොට ධ්‍යානාගාරයට ඇතුල්වූයේය. පිළිවෙළින් ඔහු වනයෙහිවූ ඇතෙකුමෙන් බැඳගත්තේය.

1 "ඒ කුමාරයාට කාම රසය දැන ඊර්ෂ්‍යා ස්වභාවයක් හටගත්තේ මමම කාම සම්පත් අනුභව කරන්නෙමි කම් සැප විඳින අන්පුරුෂයෙක් නොවේවායි.

15 "ඉන්පසු කඩුවක්ගෙණ මිනිසුන් නසන්ට පටන් ගත්තේය. මමම තනිව කම්සැප විඳින්නෙමි. කම්සැප විඳින අන් පුරුෂයෙක් නොවේවායි.

16 "ඉක්බිති දනව් වැස්සෝ සියල්ලෝ රැස්වූවාහු මොරගා කීහ. මහරජ, ඔබගේ මේ පුත්‍රතෙම නිරපරාධ ජනයා පෙළායයි.

17 "රජතෙමේ ඔහුද මාගේ රට යම්තාක් වේද, ඒතාක් තැන තොප නොවිසිය යුතුයයි ස්වකීය රටින් පිට කෙළේය.

18 "ඉන්පසු හෙතෙම භාය්‍යාව හැරගෙණ මුහුදු වෙරළට පැමිණියේය. එහි පන්සලක්කොට වාසය කරන්නේ පල වැල පිණිස වනයටද පිවිසියේය.

19 'එකල්හි එහි සමුද්‍රය මතුමත්තෙහි තපස්වියෙක් ආයේය. හෙතෙම ආහාර වේලාව පැමිණි කල්හි ඒ කුමරුන්ගේ ගෙට ඇතුළුවිය.

20 "ඒ තව්සාද කුමරුගේ භාය්‍යාතොමෝ පොළඹවා ගත්තේය. ඇයගේ ඉතා දරුණු කීමක් බලව. ඒ තාපසතෙම බ්‍රහ්මචය්‍යාවෙන් ගිලිහුනේ ඍද්ධියෙන්ද පිරිහුනේය.

21 "රාජපුත්‍රතෙමේද, පලවැල සෙවීමෙන් වනයෙහි අලමුල් හා බොහෝවූ පලවැල කදකින් හැරගෙණ සවස් වේලෙහි අසපුවට පැමිණියේය.

22 "තාපසතෙමේද රජ කුමරු දැක මුහුදට ලංවිය. අහසින් යන්නෙමියි හෙතෙම මහමුහුදෙහි ගැලෙයි.

23 "රාජපුත්‍රතෙමේද, මුහුදෙහි ගැලෙන්නාවූ තව්සා දැක ඔහුටම අනුකම්පාවෙන් මේ ගාථාවන් කීයේය.

24 "නොබිඳෙනු ලබන්නාවූ ජලය මතුපිට තෙමේ සෘද්ධියෙන් අවුත් ස්ත්‍රිය හා එක්වීමට පැමිණ මහාසාගරයෙහි ගැලෙහිය.

25 "මේ ස්ත්‍රීහු නම් කාමාවර්තයෙන් ආවර්තනය කරණ හෙයින් ආවර්තනීහ. මහත්වූ මායා ඇත්තාහ. බ්‍රහ්මචය්‍ය්‍යාව විනාශ කිරීමෙන් පුරුෂයන් අපාය ගල්වති. මෙය දැන නුවණැති පුරුෂතෙමේ ස්ත්‍රීන් දුරින්ම දුරුකරන්නේය.

26 "කොතෙක් පුරුෂයෝත් මොවුන්ට පමණ නොවන හෙයින් අනලා නම්වූ මොලොක්වූ කථා ඇත්තාවූ නොපිර විය හැක්කාවූ ගංගාවන් හා සමානවූ ඒ ස්ත්‍රීහු තමන් වෙත, පැමිණියවුන් අපායයෙහි ගල්වතියි දැන එකී ස්ත්‍රීන් නුවණැත්තේ දුරින්ම දුරුකරන්නේය.

27 "මේ ස්ත්‍රීහු සිය කැමැත්තෙන් හෝ වස්තුව හේතු කොටගෙණ හෝ යම් පුරුෂයෙකු සේවණය කෙරෙද්ද, ස්වකීය ස්ථානය දවන්නාවූ ගින්න මෙන් වහා ඒ සේවනය කළහු දවත්.

28 "රජ කුමරුගේ වචනය අසා තපස්විහට කාමයන්හි කලකිරීම වූයේය. හෙතෙම පළමු තිබූ ධ්‍යාන මාර්ගය ලැබ අහසින් යයි.

29 "රාජ පුත්‍රතෙමේද අහසින් යන්නාවූ සෘෂිහු දැක කලකිරීම ලැබුයේය. ප්‍රාඥාවූ හෙතෙම ප්‍රව්‍රජ්‍යාව කැමති වූයේය.

20 "ඉක්බිති හෙතෙම පැවිදිව කාම රාගය දුරු කෙළේය. කාම රාගය දුරුකොට බඹලොව උපන්නේයයි වදාළේය."

507 **පඤ්ච පණ්ඩිත ජාතකය**:- එය මහා උම්මග්ග ජාතකයෙහි ප්‍රකාශ වන්නේය.

508 **හත්ථිපාල ජාතකය**:- 1 "ශ්‍රෙෂ්ඨ වර්ණ ඇති මහත්වූ ජටාවක් ඇති තවුස්පිරිකර දරන්නාවූ මැලියම් සහිත දත් ඇති රජසින් යුත් හිස ඇති බ්‍රාහ්මණයෙකු ඒකාන්තයෙන් බොහෝ කලකින් දකිමි.

3 'සුචරිත ධර්ම කොටස්හි ඇළුනාවූ කසට වත් හැන්දාවූ වැහැරි සිවුරක් පෙරවූ සෘෂිවරයෙකු ඒකාන්තයෙන් බොහෝ කලකින් දකිමි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

4 "පින්වත්තෙමේ අපගේ ආසනද ජලයද පය ගල්වන දේද, පිළිගනීවා මෙ ආසනාදී පිදිය යුතු දෑ පින්වත්හු විචාරමු. පිනවත්තෙමේ අපගේ මේ පිදිය යුතු දේ පිළිගැණීම කෙරේවායි (හත්ථිපාල කුමාරතෙම කීයේය.)

5 "පුත්‍රය, වේදයන් හදාරා වස්තුව සොයාගෙණ පුත්‍රයන් ගෘහයෙහි පිහිටුවා ගන්ධයන්ද රසයන්ද සියලු කම්සැප අනුභව කොට මහළු කල්හි වනයට යාම සුදුසුවේ. එසේවූ තපස්වීතෙම බුද්ධාදීන් විසින් පසස්නා ලද්දේයයි (පියවූ බ්‍රාහ්මණතෙම කීයේය.)

6 "වේදයෝ සත්‍ය නොවෙත් හෙවත් නිෂ්ඵලවෙත්. වස්තු ලාභයද නිෂ්ඵලවේ. පුත්‍රයන් ලැබීමෙන් ජරාව නොනසත්. ස්කන්ධයන්ගෙන්ද රසයන්ගෙන්ද සෙසු අරමුණු වලින්ද මිදීමම සත්පුරුෂයෝ කියත්. ස්වකීය කර්මයෙන්ම ඵලය ඉපදීම වේයයි කීයේය.

7 "ඒකාන්තයෙන්ම නුඹගේ මේ කීම සැබව, ස්වකීය කර්මයෙන්ම ඵලයාගේ නිෂ්පත්තිය වේ. ජරාවට ගියාවූද නුඹගේ මේ මව්පියෝ අවුරුදු සියයක් නීරෝගවූ තා දකින්නාහුයයි රජතෙම කීයේය.

8 "මහරජ, යමෙකුගේ මරණය හා මිත්‍ර ධර්මයක් වන්නේද, නරවීර ශ්‍රෙෂ්ඨය, යමෙකුගේ ජරාව හා මිත්‍රකම වන්නේද, යමෙක් හෝ මම කිසිකලෙකත් නොමැරෙන්නෙමියි දන්නේද එබඳු වූවෙකු වර්ෂ සියයක් නීරෝගවූවහු දක්නාහුය.

9 "යම්සේ පුරුෂයෙක් ගඟ දියෙහි නැවක් ඉදින් කම්පා කෙරේනම් හෙවත් පැදගෙණ යා නම් ඉවුරට පැමිණේද, එපරිද්දෙන්ම ව්‍යාධියද ජරාවද නිරන්තරයෙන් සත්වයා මරුවාගේ වසඟයට පමුණුවත්යයි කුමාරතෙම කීයේය.

10 "කාමයෝ ඇලෙන හෙයින් පංක නම් මඩකට බඳු උපමා ඇත්තාහුද, කාමයෝ ගැලෙන හෙයින් පලිප නම් ගොහොරු මඩකට බඳු උපමා ඇත්තාහුද, සිත් හැරගන්නාහුද, එතෙර කළ නොහැක්කාහුද, මරුවාට යටත්වූවාහුද වෙත්. මෙබඳු කාම සංඛ්‍යාත ඇලෙන මඩෙහිද ගැලෙන මඩෙහිද

ගැලුනාවූ ලාමක චිත්ත ස්වභාව ඇත්තේ පාර සංඛ්‍යාත නිවණට නොපැමිණිය හැක්කාහු වෙත්.

11 "මහරජ, මාගේ මේ ආත්ම භාවයතෙම පෙර අස්ගොව්වන් සමග රෞද්‍රකම් කෙළේය. ඒ මෙම එහි විපාක ගන්නා ලද්දෙමි. මට එයින් මිදීමෙක් නැත්තේය. දැන් කාය වාක් ද්වාරයන් අවුරාගෙණ එය ආරක්ෂා කරන්නෙමි. කවර හෙයකින්ද මාගේ මේ ආත්මයතෙම නැවත රෞද්‍රකම් නොකෙරේවායි.

12 "මහරජ යම්සේ පුරුෂයෙක්තෙම නැතිවූ ගවයෙකු නොදක්නේ වනයෙහි සොයාද, ඒ සුකාරී නම් රජ, මෙපරිද්දෙන් මාගේ ප්‍රව්‍රජ්ජ්‍යා සංඛ්‍යාත අර්ථයතෙම නැතිවූයේ වෙයි. මහරජ, ඒ මම අද කෙසේ එය නොසොයන්නෙම්දැයි කීයේය.

13 "මහරජ, අද කටයුතු දෙය හෙට යයි කල්දමන පුරුෂතෙම පිරිහේ. අනිද්දා යයිද පිරිහේ. යමක් නොපැමිණියේද, මෙය නැත්තේයයි දැන උපන්නාවූ කුසල් අදහස කවර නම් පණ්ඩිතයෙක් දුරු කරන්නේදැයි ගෝපාල කුමාරතෙම කීයේය.

14 "මහරජ, හාවභාව ලීලා විලාසයෙන් මත්වූවක් මෙන් හැසිරෙන්නාවූ දුනුකේ මල්පෙති බඳු ඇස් ඇත්තාවූ තරුණ කුමරියක් දකිමි. කාම සම්පත් අනුභව නොකළාවූ පළමු වයස්හි සිටියාවූ ඒ කුමරිය මෘත්‍යු මාරයා හැර ගෙණයේ.

15 "තරුණවූ මනාව හටගත්තාවූ ශෝභන මුඛයක් ඇත්තාවූ මනා දර්ශනයෙන් යුක්තවූ රන්වන් පැහැවූ තරුණ කොමොඩු කෙසරු මෙන් ගැවසීගත් රැවුල ඇත්තාවූ කුමාරයෙක්වේද, (ඔහුද මරුවා හැරගෙණ යේ) ඉන් පළමුවම ගෘහයද කාමයන්ද හැර පැවිදිවන්නෙමි. දේවයන් වහන්ස, මට අවසර දුන මැනවැයි අජපල් කුමාරතෙම කීයේය.

16 "අතුවලින් වෘක්ෂය යන නාමය ලබයි. පිරිහී ගිය අතු ඇත්ත වනාහි කණුවයයි කියත්. පින්වත් වාසෙට්ඨ ගොත්‍ර ඇති බැමිණිය පහව ගියාවූ පුත්‍රයන් ඇති මට දැන් පිඬු සිඟා යාමට හෙවත් පැවිදිවීමට සුදුසු කල් වේයයි පුරෝහිත බ්‍රාහ්මණතෙම් කීයේය.

17 "අහසෙහි නොගෑවෙමින් යන්නාවූ කොස්වා ලිහිණින් මෙන්ද වර්ෂා ඍතුහුගේ අවසානයෙහි අදිනලද දැල පලාගෙණ යන්නාවූ හංසයන් මෙන්ද මාගේ පුත්‍රයෝද ස්වාමියාද කාම සම්පත් නමැති දැල බිඳගෙණ යෙත්. ඒ මම කෙසේ නම් දරුවන් ගිය අනුව නොයන්නෙම් දැයි බැමිණි කීවාය.

18 "මේ ගිජුලිහිණි පක්ෂීහු මස් අනුභව කොටද වමාරාද බැහැර යෙත්. යම් කෙනෙකුන් අනුභව කොට නොවැමෑරුවාහුද, ඔව්හු මාගේ අතට පැමිණියාහුය.

19 "බ්‍රාහ්මණතෙම කාම සම්පත් වැමෑරුවේය. ඒ සම්පත් ඔබ පසුව අනුභව කරන්නෙහිය. මහරජ, වැමෑරූ දෙය අනුභව කරන්නාවූ යම් පුරුෂයෙක් වේද හෙතෙම බුද්ධාදී පණ්ඩිතයන් විසින් පැසසිය යුතු නොවේයයි. (අග මෙහෙසිය කීවාය.)

20 "ඇලෙන මඩෙහිද ගැලෙන මඩෙහිද ගැලුනාවූ දුර්වල පුරුෂයෙකු බල ඇත්තෙක් යම්සේ ගොඩ ලන්නේද, මෙපරිද්දෙන්ම පින්වත් පඤ්චාල රාජධීතාව ඔබ මා මනාව කියන ලද ගාථාවලින් කාම නමැති මඩෙන් උද්ධරණය කෙළේයයි රජතෙම කීයේය.

21 "දිශාධිපතිවූ ඒ සුකාරී නම් මහරජතෙම මෙය කියා බැමි සිඳගත් හස්තියෙකු මෙන් රට හැර පැවිදිවූයේය.

22 "නරවීර ශ්‍රෙෂ්ඨවූ රජතෙමේද රාජ්‍යය හැර ප්‍රව්‍රජ්ජ්‍යාව කැමතිවූයේය. ඔබද අපට රජ මෙන් වෙව. අප විසින් රක්නා ලද්දී රාජ්‍යය අනුශාසනා කරවයි. (මහජන තෙම දේවියට කීයේය.)

23 "නරවීර ශ්‍රෙෂ්ඨවූ රජතෙමේද රාජ්‍යය හැර පැවිදි වීම කැමතිවිය. මමද සිත්කළුවූ කාමයන් හැර ලෝකයෙහි තනිවම හැසිරෙන්නෙමි.

24 "පෙරවරු ආදී කාලයෝ ඉක්ම යත්. රාත්‍රීහු ආයු සංස්කාරාදිය ගෙවමින් ඉක්මයත්. ප්‍රථම වයස් ආදීවූ වයස පිළිබඳ කොටස් පිළිවෙලින් හැර දමත්. මමද සිත්කළුවූ කාමයන් හැර ලෝකයෙහි තනිව හැසිරෙන්නෙමි.

25 "පෙරවරු ආදී කාලයෝ ඉක්ම යත්. රාත්‍රීහු ආයු සංස්කාරාදිය ගෙවමින් තරණය කරත්. ප්‍රථමාදී වයස් කොටස් පිළිවෙලින් හරිත්. මමද තුබු තුබූ පරිදි කාම සම්පත් හැරදමා ලෝකයෙහි තනිවම හැසිරෙන්නෙමි.

26 "පෙරවරු ආදී කාලයෝ ඉක්ම යත්. රාත්‍රීහු ආයු සංස්කාරාදිය ගෙවමින් තරණය කෙරෙත්. ප්‍රථමාදී වයස් කොටස් පිළිවෙලින් දුරු කෙරෙත් මමද සිහිල්වූවා. සියලු රාගාදී සංගයන් ඉක්මවා ලෝකයෙහි තනිවම හැසිරෙන්නෙමියි දේවී තොමෝ කීවායයි වදාළේය."

509 **අයොඝර ජාතකය:-** 1 "සත්වතෙම පළමු යම් එක් රැයක් මාතෘ ගර්භයෙහි වාසය කෙරේද, හෙතෙම වලාකුලක් හටගත්තාක් මෙන්ම සයනය කෙරෙයි. හෙතෙම ගමන් කරන්නේ පෙරලා නොනවතියි.

2 "යුද්ධ කරණු ලබන්නාවූද බලයෙන් යුක්තවූද මනුෂ්‍යයෝ නොම නොදිරත්. නොම නොමියෙත්. ඒ සියල්ලම ජාති ජරාවන්ගෙන් උපද්‍රැතය. එහෙයින් මම ධර්මයෙහි හැසිරෙමියි මට මේ සිත උපදියි.

3 "ඉතා බිහිසුනු ස්වභාව ඇති සිව්රඟ සෙනග ගෙණ සමහර රජහු බළාත්කාර කම්කොට ජය ගනිත්. මරහුගේ සෙනඟ ජයගන්ට නොහැකිවෙත්. එහෙයින් ධර්මයෙහි හැසිරෙමියි මට මේ සිතවේ.

4 "ඇතුන් විසින්ද අසුන් විසින්ද රථවලින්ද පාබල සෙනඟින්ද පිරිවරණ ලද්දාවූ සමහරු සතුරන්ගෙන් මිදෙනු ලැබෙත්. ඔව්හු මරුවාගෙන් මිදෙන්ට නොහැකිවෙත්. ඒ කාරණයෙන් ධර්මයෙහි හැසිරෙමියි මට මේ සිතවේ.

5 "ඇතුන්ගෙන්ද අසුන්ගෙන්ද රථවලින්ද පාබල සෙනඟින්ද යුක්තවූ ශූරවූ රජවරු පසමිතුරන්ගේ නුවරවල් බිඳිත්. පසමිතුරන් නසත්. මරහු නසන්ට නොහැකිවෙත්. එහෙයින් ධර්මයෙහි හැසිරෙමියි මට මේ සිතවේ.

6 "තුන් තැනෙක්හි බිඳී මද ගලන්නාවූ මත්ත හස්තීහු නගරයන් මඩිත්. ජනයා නසත්. මරහු මඩින්ට නොහැකි වෙත්. එහෙයින් ධර්මයෙහි හැසිරෙමියි මට මේ සිතවේ.

7 "ධෛර්‍ය්‍යවත්වූ කළ පුරුද්ද ඇත්තාවූද ඊතල දුර විදින්නාවූද ඉලක්කය නොවරදවා විදින්නාවූ ධනුර්ධරයෝ වෙත්. ඔව්හුද මරහු විදින්ට නොහැකිවෙත්. එහෙයින් ධර්මයෙහි හැසිරෙමියි මට මේ සිතවේ.

8 "පර්වත වනාන්තර සහිතවූ මහවිල් සතද ක්ෂයවී යෙත්. දීර්ඝ කාලයකින් ඒ සියල්ලම ක්ෂයවනු ලැබේ. ඒ සියල්ලම නස්නා කාලයට පැමිණ බිඳෙත්. එහෙයින් ධර්මයෙහි හැසිරෙමියි මට මේ සිතවේ.

9 "මෙසේම මනුෂ්‍යයන්ද ස්ත්‍රීන්ද යන සියලු සතුන්ගේ මෙලොව ජීවිතය චඤ්චලවේ. සුරාධූර්තයෙකුගේ වස්ත්‍රය මෙන්ද ගං ඉවුරෙහි හටගත් ගසක් මෙන්ද සත්වයන්ගේ ජීවිතය ස්ථිර නොවේ. එහෙයින් ධර්මයෙහි හැසිරෙමියි මට මේ සිතවේ.

10 "ළදරුවූද මහළුවූද ස්ත්‍රීහුද පුරුෂයෝද ඒ දෙපස අතරසිටි පුරුෂයෝද යන සත්වයෝ ගස්වල ගෙඩිමෙන් ශරීර භේදයෙන් වැටෙත්. එහෙයින් ධර්මයෙහි හැසිරෙමියි මට මේ සිතවේ.

11 "මේ සත්වයන්ගේ වයස කළුවර පක්ෂයෙහි පිරිහී ශුක්ල පක්ෂයෙහි වැඩෙන්නාවූ සඳ මෙන් නොවේ. යමක් ඉක්ම ගියේද, දැන් එය ගියේම වේ. ජරාවෙන් ජීර්ණවූවහුගේ වනාහි කාම ගුණයන්හි ඇල්මක් නැත්තේය. ඒ නිසා හට ගන්නා සැපයක් නම් කොයින්ද, එහෙයින් ධර්මයෙහි හැසිරෙමියි මට මේ සිතවේ.

12 "යක්ෂයෝය, පාංශු පිශාචකයෝය. තවද ප්‍රේතයෝය යන ඔව්හු කිපියාහුද, මිනිසුන් ආශ්වාස කිරීමෙන් නසත්, හෙවත් මිනිසුන්ට වැහෙත්. මරහු ආශ්වාස කිරීම වශයෙන් නසන්ට නොහැකි වෙත්. එහෙයින් ධර්මයෙහි හැසිරෙමියි මට මේ සිතවේ.

13 "යක්ෂයන්ද පාංශු පිශාචයන්ද තවද ප්‍රේතයන්ද යන කිපුනාවූද ඔවුන් බලිකර්ම වශයෙන් ක්ෂමා කිරීම හෙවත්

සතුටුකිරීම කරත්. මරුවා සතුටු කිරීම නොකරත්. එහෙයින් ධර්මයෙහි හැසිරෙමියි මට මේ සිතවේ.

14 රාජාපරාධ කරන්නවුන්ද ජනයා පෙළන්නවුන්ද රාජ්‍යය දූෂ්‍ය කරන්නවුන්ද රජවරු දෝෂය දැන දඬුවම් කරත්. මරුහට දඬුවම් කරන්ට නොහැකිවෙත්. එහෙයින් ධර්මයෙහි හැසිරෙමියි මට මේ සිතවේ.

15 රාජාපරාධ කරන්නාවූද රාජ්‍යය දූෂ්‍ය කරන්නාවූද ජනයා පෙළන්නාවූද ඔව්හු රජුන් පහදවා ගැණීමට ලබත්. මරහුගේ පහදවාගැණීම නොකරත්. එහෙයින් ධර්මයෙහි හැසිරෙමියි මට මේ සිතවේ.

16 "ක්ෂත්‍රියයෙක කියාද බ්‍රාහ්මණයෙක කියාද ආඪ්‍යයෝය කියාද බල ඇත්තේය කියාද තෙජස් ඇත්තේය කියාද මාත්‍යු රාජයාගේ අපේක්ෂාවක් නැත්තේය. එහෙයින් ධර්මයෙහි හැසිරෙමියි මට මේ සිතවේ.

17 "සිංහයෝද ව්‍යාඝ්‍රයෝද තවද දිවියෝද බළාත්කාරයෙන් අල්වාගෙණ කම්පනය කරමින් මිනිසුන් කත්. ඔව්හුද මාරයා අල්ලා කන්ට නොහැකිවෙත්, එහෙයින් ධර්මයෙහි හැසිරෙමියි මට මේ සිතවේ.

18 "මායාකාරයෝ නෘත්‍යස්ථාන මධ්‍යයෙහි මායා කරන්නාහු එකෙනෙහි ජනයාගේ ඇස් මුළා කරත්. ඔව්හුද මරුවා මුළාකරන්ට නොහැකිවෙත්. එහෙයින් ධර්මයෙහි හැසිරෙමියි, මට මේ සිතවේ.

19 'කිපුනාවූ උග්‍රවූ තේජස් ඇති ඒ සර්පයෝද මිනිසුන් දෂ්ට කෙරෙත්. මරණයටද පමුණුවත්. ඔව්හුද මරහු දෂ්ට කරන්ට නොහැකිවෙත්. එහෙයින් ධර්මයෙහි හැසිරෙමියි මට මේ සිතවේ.

20 "කිපියාවූ සර්පයෝ යමෙකු දෂ්ට කෙරෙද්ද, විෂ වෛද්‍යයෝ ඔවුන්ගේ විෂ නසත්. මරහු දෂ්ට කළ විෂ නො නසත්, එහෙයින් ධර්මයෙහි හැසිරෙමියි. මට මේ සිතවේ.

21 "ධම්මන්තරී නම්වූද වේතරණී නම්වූද භෝජ නම්වූද මේ වෛද්‍යයෝ සර්පයන්ගේ විෂ නසා එසේම ඔව්හුද කාලක්‍රියා

කළාහුයයි අසනු ලැබෙත්. එහෙයින් ධර්මයෙහි හැසිරෙමියි මට මේ සිතවේ.

22 "සෞර නම් විද්‍යාව හදාරණු ලබන්නාවූ විද්‍යාධරයෝ ඖෂධවලින් සතුරන්ගේ නොදැක්මට පැමිණෙත්. මෘත්‍යු රාජයාගේ නොදැක්මට නොපැමිණෙත්. එහෙයින් ධර්මයෙහි හැසිරෙමියි මට මේ සිතවේ.

23 "සුචරිත ධර්මයතෙම ඒකාන්තයෙන් ධර්මයෙහි හැසිරෙන පුද්ගලයා රකියි. මනාව පුරුදු කළාවූ සුචරිත ධර්මය තෙම සැපය එළවයි. මනාව පුරුදු කළාවූ සුචරිත ධර්මයෙහි මේ ආනිශංසවේ. ධර්මයෙහි හැසිරෙන සුළු පුද්ගලතෙමේ උත්පත්ති වශයෙන් දුර්ගතියට නොපැමිණේ.

24 "කුශල ධර්මයද අකුශල ධර්මයද යන දෙක සමාන විපාක ඇත්තාහු නොවෙත්. අධර්මයතෙම නරකයට පමුණුවයි. කුශලධර්මය තෙමේ ප්‍රතිසන්ධි වශයෙන් සුගතියට පමුණුවායයි මහසත්තෙමේ ධර්මදෙශනා කෙළේයයි වදාළේය."

---

## තිංස නිපාතය

**510 කිංඡන්ද ජාතකය:-** 1 "බ්‍රාහ්මණය, කවර අදහසක් ඇත්තේ කුමක් සිතමින් කුමක් පතමින් කුමක් සොයමින් කවර කරුණකින් ග්‍රීෂ්ම ඇත්තාවූ මේ ගංඉවුරෙහි තනිව හුන්නෙහිදැයි දෙව්දුව ඇසීය

2 "විශාලවූ මහත්වූ කලයක් යම්සේද, එබඳුවූ වර්ණයෙන්ද සුවඳින්ද රසයෙන්ද උතුම්වූ අඹගෙඩියක් විය. නිර්මලවූ මධ්‍යප්‍රදෙශ ඇති දෙවතා දුව ගඟ දියෙන් ගසා ගෙණ යන්නාවූ එය දැක මම අත්වලින් ගෙණ එය ගිනිහල් ගෙයට ගෙණ ගියෙමි.

3 "ඉන්පසු කෙසෙල් කොළවල එය තබා මම පිහියෙන් එය කපා මාගේ සාපිපාස දුරුකර ගතිමි.

4 "ඒ මම පහව ගියාවූ කායචිත්ත පීඩා ඇත්තෙමි. එය අඹ ඵලය අවසන් වූයේ දුක ඉවසන්නේ අන් කිසීම ඵලයෙක්හි ආස්වාදයක් නොලබමි.

5 "යම් අඹ ඵලයක් මධුරවූ රසයෙන් අග්‍රවූ සිත් කළුවූවක්වීද මහා ජලයෙහි බැසයන්නාවූ යමක් මම දියෙන් ගොඩ ගතිම්ද, එය මා වියලවා ඒකාන්තයෙන් මට මරණය එළවන්නේය.

6 "යම්හෙයකින් මම උපවාසය කෙරෙම්ද, මත්ස්‍යයන්ගෙන් යුක්තවූ දිගු පුළුල ඇති සිත් කළුවූ ගඟබලා හුන්නෙම්ද, මාවිසින් ඒ සියල්ල ඔබට කියන ලදී.

7 "අපලායිනිය, හෙවත් පැන නොයන්නිය, ඔබද මට තමා කියව, කළ්‍යාණිය, ඔබ කවරක් හෝ වෙහිද, මනා මධ්‍යප්‍රදෙශ ඇත්තිය, කුමකට හෝ ඔබ මෙහි ආයෙහිද

8 "මනාව ඔපමට්ටන් කරණලද රත්‍රංපටක් බඳුවූද පර්වත හිස්හී උපන් තරුණ ව්‍යාඝ්‍රධෙනුවක් බඳුද වූවාය. දෙවියන් අතර දෙවියන්ගේ යම් පරිචාරිකා ස්ත්‍රීහු වෙද්ද, මනුෂ්‍යලෝකයෙහි රූපයෙන් යුක්තවූ යම් ස්ත්‍රීහු වෙද්ද, දෙවියන් අතරෙහිද ගන්ධර්වලෝකයෙහි හා මනුෂ්‍යලෝකයෙහිද තිගේ රූපයට සමානවූ රූ ඇත්තියක් නැත්තේය.

9 "මනොඥවූ උතුම් ලක්ෂණයෙන් යුත් තැනැත්තිය මාවිසින් විචාරණ ලද්දී වෙහි එය කියව නාමයද නෑයන්ද මට කියවයි, තවුස්තෙම කීයේය.

10 "බ්‍රාහ්මණය, ඔබ යම් කෝසිකී නම් සිත් කළු ගංගාවක් බලා හුන්නෙහිද, උතුම් ජලය බැසයන්නාවූ සැඩ පහරින් යුක්තවූ ඒ ගංගාවෙහි පිහිටි විමානයෙහි අධිගෘහිතවූ දෙවතා දූ නම් මම වෙමි.

11 "නොයෙක් වෘක්ෂ සමූහයාගෙන් ගැවැසී ගත්තාවූ බොහෝවූ කඳුරැළි මාම ප්‍රමුඛකොට ඇත්තාහුවෙත්. බොහෝවූ වර්ෂා ජලය මේ ගඟටම ඇතුල් වෙත්.

12 "තවද, බොහෝවූ ඒ ඒ වනයෙන් වැහෙන්නාවූ ජලයෝද ප්‍රවිෂ්ට වෙත්. නීලවර්ණ ජලයෙන් යුත් දිය පහරවල් දරන්නාවූ නාගයන් සතුටු කරණ වන සංඛ්‍යාත ජලයෙන් හෝ යුක්තවූවාහු බොහෝවූ ගංගාවෝ මේ ගඟට පිවිසෙත්.

13 "ඒ නදීහු අඹ, දඹ, හා දෙල්ද, බක්මීද, තල්ද, දිඹුල්ද, යන බොහෝ ගෙඩි ජාතීන් නිරන්තරයෙන් මේ ගඟදිය පහරට පමුණුවත්.

14 "ඒ ගඟ උභය තීරයෙහි යම්කිසි ඵලයක් දියෙහි වැටේද, එය මේ ගංගා ජලපහර අනුව ගියාවූ ඵලයයි. සැක නැතිවේ.

15 "මහත්වූ ප්‍රඥා ඇත්ත නුවණැත්තේ මෙය දැන මාගේ වචනය අසව, මහරජ, තෘෂ්ණාවශයෙන් ඇලීම රුචි නොවෙව, එය දුරුකරව,

16 "රට වර්ධනය කරන්නාවූ මහරජ, මස් ලේ වලින් වැඩෙමින් තරුණව සිටි ඔබ යම් හෙයකින් නිරාහාරව මරණය කැමැති වෙහිද, එහෙයින් මම මෙය නුඹගේ නුවණින් වෘද්ධ බවකැයි නොහඟිමි.

17 "ඔහුගේ තෘෂ්ණා වසඟවීම බ්‍රහ්මයෝද දෙවියන් සහිතවූ ගන්ධර්වයෝද සංයමවූ සිත් ඇති යශස් ඇත්තාවූ ලෝකයෙහි යම් ඍෂීහු ඇද්ද, නුවණින් වැඩුනාවූ යශස් ඇත්තාවූ ඔව්හු නිසැකයෙන් දැන ගනිත්යයි දෙව්දුව කීය.

18 "නුවණැත්තේ සියලු සුචරිත ධර්මය මෙසේ දැන ජීවිතයාගේ නැසීමද චුතවීමද දැන සිටීද ඉදින් ඒ අනිකාගේ වධය පිණිස නොසිතාද, ඒ මනුෂ්‍යයාට පව්රැස් නොවේ.

19 "මෙසේ ලොවට හිත ඇත්තාහුයයි ඍෂි සමූහයා විසින් දක්නාලද කල්හි මාකෙරෙහි අයහපත්වූ නින්දා කිරීම කැමැත්තෙන් යුක්තවූ තැනැත්තිය තී පාප කර්මයක් හැරගනු කැමැත්තෙහිය.

20 "පුළුල්වූ මනා කටිප්‍රදෙශ ඇත්තිය, ඉදින් මම තිගේ ගංඉවුරෙහි මැරෙන්නෙම්ද, මා පරලොව ගිය කල්හි තිට සැක නැතිව අපකීර්තියෙක් පැමිණෙන්නේය.

21 "මනා මධ්‍ය ප්‍රදෙශ ඇත්තිය. එහෙයින් පාප කර්මයෙන් ආරක්ෂාවෙව, මා මළකල්හි තිට සියලු ජනතෙම පසුව නින්දා නොකෙරේවායි.

22 "නොඉවසිය හැක්ක ඉවසන සුළු මහරජ, මේ කරුණ මාවිසින් දන්නාලදී. යමෙක්තෙම හැරදැමිය නොහැකි කාමගුණයන්හැර සංයම් සීලයෙහිද සුචරිත ධර්මයෙහිද පිහිටියේවීද, ඒ ඔබට තමාද ඒ අඹද දෙමි.

23 "යමෙක්තෙම පළමු බන්ධය හැර පසුව තෘෂ්ණා බන්ධනයෙක් හි පිහිටියේ වේද, හෙතෙම අධර්මයෙහිද හැසිරේ මොහුගේ පාපයද වැඩේ.

24 'එව, ඒ අඹ උයනට පමුණු වන්නෙමි. ඒකාන්තයෙන් අඹ ඵල කෙරෙහි මන්දොත්සාහ වෙව, සිහිල්වූ අඹ උයනෙහි නොකලකිරී වාසය කරව.

25 "මහරජ, මල් රසයෙන් මත්වූ වක්වූ ග්‍රීවා ඇති ලිහිණින් විසින් නාද කරණ ලද ඒ අඹඋයන බලව, කොස්වා ලිහිණිහුද මොණරුද දිව්‍යවූ කෝයට්ඨි නම් පක්ෂිහුද ස්වර්ණශාලීය නම් පක්ෂිහුද එහි වෙසෙත්.

26 "හංස සමූහයා විසින් නාද කරණලද්දාවූ මේ අඹ උයනෙහි කොවුලෝ නාද කරන්නාහු තමන් ප්‍රබොධ කෙරෙත්. මෙහි අඹ වෘක්ෂයෝ පලබරින් නැමුනු අතු අග ඇත්තාහ. සමහර බිම්පෙදෙස් මල් රැසින් හැල් පිදුරු ඇති කලවිටි සමානයහ. වනුක්ද හොරගස්ද බක්මීද ඇත්තාහ. පැසුනු පලබරින් යුත් තල්ගස්ද ඇත්තාහයි කීවාය.

27 "දිවමල් දරන්නාවූ මිනි ඔටුනු දරන්නාවූ දිව අබරණ පැළඳ අංගදාභරණයෙන් යුක්තවූ රත්සඳුන් ගැල්වූ තොපි රාත්‍රියෙහි දිව්‍ය සම්පත් අනුභව කරන්නෙහිය. දාවල් වනාහි දුක්වේදනාව විඳින්නෙහිය.

28 "යම් මේ සොළොස් දහසක් දිව්‍ය ස්ත්‍රීහුවෙද්ද, ඔව්හු ඔබට පරිචරණය කරන්නාහ. මෙසේ අද්භූතවූ දුටුවන් ලොමු ඩැහැගන්වන්නාවූ මහත් ආනුභාව ඇත්තේ වෙහිය.

29 "මනුෂ්‍ය ලෝකයෙහි යම් කර්මයක්කොට දැන් තමාගේ පිටමස් කන්නෙහිද, පෙර තමහට දුක්ඵලවන්නාවූ කවර නම් පාපකර්මයක් කෙළේදැයි ඇසුවේය.

30 "පෙර ජාතියෙහි මම වේදයන් හදාරාකාමයන්හි ඇළුනෙක්වීමි. මම බොහෝ කලක් අනුන්ට අවැඩ පිණිස හැසුරුනෙමි. යම් පුද්ගලයෙක් අනුන්ගේ පිට මස් කන්නාවූ කේලාම් කියන්නෙක්වේද, යම්සේ මම අද තමන්ගේ පිට මස් කන්නෙම්ද, මෙසේ හෙතෙම තමාගේ පිටමස් කඩ කඩා කන්නේයයි විමාන ප්‍රේතයා කීයේයයි" වදාළේය.

**511 කුම්භ ජාතකයඃ-** 1 "බ්‍රාහ්මණය, ඔබ චන්ද්‍රයා මෙන් රාත්‍රිය බබුළුවමින් අහස සිටිනෙහිය. ඔබගේ ශරීරයෙන් සියගණන් රැලි ඇති අහසෙහි විදුලියක් මෙන් රශ්මීහු නික්මෙත්. දෙව් ලොවින් ආයෙහිද, කොයින් ආයෙහිද,

2 "ඒ ඔබ සුන්වූ වාතය ඇති අහසෙහි ගමන් කරන්නෙහිය. අහසෙහි යන්නේද සිටින්නේදවෙහි පයින් ගමන් නොයන්නාවූ දෙවතාවන්ගේ යම් සෘර්ධියක් වේද, ඒ සෘර්ධිතොමෝ නුඹ විසින් මනාව වඩනා ලද්දී ප්‍රතිෂ්ඨාවක් මෙන් කරණලද්දීවේ.

3 "අහසෙහි ගමන් කරමින් මෙහි පැමිණ සිටිනෙහි ඔබ කවරෙක් වෙහිද, කළය මිලදී ගනිව්යයි යම් මේ කාරණයක් කියන්නෙහිද, ඒ නුඹ කවරෙක් හෝ වෙහිද, මේ කළය තෙම කුමකින් යුක්තවූයේ වේදැයි, මේ කාරණය මට කියවයි, සබ්බමිත්ත නම් රජතෙම කීයේය.

4 "මහරජ, මේ කළය තෙම ගිතෙල් පිරූකළයක් නොවේ. තලතෙල් පිරූ කළයකුත් නොවේ. උක්පැනි පිරූ කළයක් නොවේ. මීයෙන් පිරුණු කළයකුත් නොවේ. කළයේ ආදීනවයෝ බොහෝවෙත්. කළයෙහිවූ බොහෝ දෝෂයන් අසව්.

5 "යමක් පානය කොට ගමන් කරන්නේ පියවරක් පාසා පෙරලෙන්නේද, ප්‍රපාතයට වැටෙන්නේද, වලටද ගුහාවටද අපිරිසිදු මඩවලටද ගම්දොර ගමරවලටද වැටෙන්නේද, බොහෝවූ අනුභව නොකටයුතුදෙය අනුභව කරන්නේද, එයින් පිරුනාවූ මේ කළය මිලදී ගනිමු.

6 "ඉදින් යමක් පානය කොට සිතෙහි අධිපතිකම් නැත්තේ සුරා කසට අනුභව කරන්නාවූ ගවයෙකු මෙන් ඇවිදීද, අනාථ

වෙමින් ගායනාකරන්නෙකු අනුව ගායනා කෙරේද, නටන්නහු අනුව නටාද, එයින් පිරුනාවූ මේ කළය මිලදී ගනිව්.

7 "ඉදින් යමක් පානයකොට නිර්වස්ත්‍ර තවුසෙකු මෙන් නග්නව ගමෙහිද වීථි අතරෙහිද හැසිරෙන්නේද, ඉතා මුළාවූ සිත් ඇත්තේ ඉතා බොහෝ කල්සයනය කරන්නේද, ඒ සුරාවෙන් පිරුණු මේ කළය මිලදී ගනිව්.

8 "ඉදින් යමක් පානයකොට නැගීසිට වෙව්ලමින් හිසද අත්ද සොළවමින් සිටීද, හෙතෙම දැවයෙන් කරණ ලද යන්ත්‍ර රූපයක් මෙන් නටයි. ඒ සුරාවෙන් පිරුණු මේ කළය මිලදී ගනිව්.

9 "ඉදින් යම් සුරාවක් පානය කොට ගින්නෙන් දැවුනාහු සයනය කෙරෙද්ද, තවද හිවලුන් විසිනුත් කනු ලබද්ද, බන්ධනයටද හිංසාවටද සම්පත් පිරිහීමටත් පැමිණෙද්ද, එබඳු සුරාවෙන් පිරුනාවූ මේ කළය මිලදී ගණිව්.

10 "ඉදින් යම් සුරාවක් පානයකොට නොකිය යුත්ත කියන්නේද, සභාවෙහි හුන්නේ අපගතවූ වස්ත්‍ර ඇත්තේ වේද, කුනුතැවරීම් සහිතව වමනයෙහි ගැළුනේ ව්‍යසනයට පැමිණියේවේද, එබඳු සුරාවෙන් පිරුනාවූ මේ කළය මිලදී ගනිව්.

11 "ඉදින් යම් සුරාවක් පානයකොට උත්කෘෂ්ටවූයේ කැළඹුනාවූ රතුවූ ඇස් ඇත්තේ සියලු පෘථිවිය මාගේම යයිද මා හා සමවූ සතර දිසාවට අධිපතිවූ රජෙකුත් නැත්තේයයි හඟීද, එබඳු සුරාවෙන් පිරුනාවූ මේ කළය මිලදී ගනිව්.

12 "යම් සුරාවක් පානය කොට මානය ඇත්තාහු අධික මාන ඇත්තාහු වෙද්ද, කලහ ඇත්තාහු කේලාම් කියන්නාහු වෙද්ද, අයහපත් වර්ණ ඇත්තාහු නග්න භාවය ඇත්තාහු පැන දුවන්නාහුවෙද්ද, සොරුන්ගේද ධූර්තයන්ගේද නිෂ්පත්තියට නිවාසස්ථානවේද, එබඳු සුරාවෙන් පිරුනාවූ මේ කලය මිලදී ගනිව්.

13 "සමෘද්ධවූද පිරිගියාවූද නොයෙක් දහස් ගණන් ධනය ඇති කුල ලෝකයෙහි වූවාහුද මේ සුරාවෙන් ඒ කුලයෝ සිඳුනාවූ

ධනය ඇත්තන් කරණලද්දාහුය. එබඳු සුරාවෙන් පිරුණාවූද මේ කළය මිලදී ගනිව්.

14 "සුරාපානය කළාවූ යම් කුලයෙක්හි ධාන්‍යද ධනයද රිදීද රත්‍රංද කුඹුරුද ගවයන්ද යන මොවුන් විනාශයට පමුණුවද්ද, ඒ සුරාව වස්තු ඇති කුලයන් නසන්නීවේ. එබඳු සුරාවෙන් පිරුණාවූ මේ කළය මිලදී ගනිව්.

15 "ඉදින් යම් සුරාවක් පානය කොට දුෂ්ට ස්වභාව ඇත්තාවූම පුරුෂතෙම පියාටද මවටද ආක්‍රොෂ කෙරේද, නැන්දනියද තවද යෙහෙළියද භාර්‍ය්‍යාවයයි සිතා අතින් අල්වාගන්නේද, එබඳු සුරාවෙන් පිරුනාවූ මේ කළය මිලදී ගනිව්.

16 "ඉදින් යමක් පානය කොට දුෂ්ට ස්වභාවය ඇත්තාවූම ස්ත්‍රී තොමෝ මාමාටද ස්වාමියාටද ආක්‍රොෂ කරන්නීවේද, වැඩකාරයාද සමීපයෙහි හැසිරෙන තැනැත්තාද ස්වාමියායයි අතින් අල්වාගන්නීවේද, එබඳු සුරාවෙන් පිරුණු මේ කළය මිලදී ගනිව්.

17 "ඉදින් යම් සුරාවක් පානය කොට පුරුෂතෙම ධර්මයෙහි සිටියාවූ ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ හිංසා කරන්නේද, හෙතෙම ඒ හේතුවෙන් අපායටත් යන්නේද, එබඳු සුරාවෙන් පිරුණු මේ කළය මිලදී ගනිව්,

18 "ඉදින් යමක් පානය කොට කයින් හෝ වචනයෙන් හෝ සිතින් හෝ දුශ්චරිතයෙහි හැසිරෙද්ද, දුශ්චරිතයෙහි හැසිර ඔව්හු නිරයට යද්ද, එබඳු සුරාවෙන් පිරුණාවූ මේ කළය මිලදී ගනිව්.

19 "පෙර බොහෝවූ රන්ද පරිත්‍යාග කරමින් යාඥා කරන්නාහු යමකු ලවා බොරුකියවීම නොලබද්ද හෙතෙම ඒ සුරාව පානය කොට බොරුව කියාද, එබඳු සුරාවෙන් පිරුනාවූ මේ කළය මිලදී ගනිව්.

20 "ඉදින් යමක් පානය කොට ඉක්මන් කටයුත්තක් ඇතිවූ කල්හි පනිවිඩයක් යවන්නේ හෙතෙම කියනලද කරුණත් නොදනීද, එබඳු සුරාවෙන් පිරුණු මේ කළය මිලදී ගනිව්,

21 "ලජ්ජාවෙන් යුත් සිත් ඇත්තාවූද සුරාමදයෙන් මත්වූවාහු ලජ්ජානැතිබව පහළ කරත්ද, ප්‍රාඥවූවාහුද බොහෝකොට බෙනෙත්ද, එබඳු සුරාවෙන් පිරුනාවූ මේ කළය මිලදී ගනිව්.

22 "ඉදින් යම්සුරාවක් පානයකොට එකතැන රැස්වූවාහු අනුභව නොකරන්නාහු හිස් බිම දුක්වූ සයනයෙන් සයනය කරද්ද, දුර්වර්ණ භාවයට හා නින්දාවටත් පමුණුවද්ද, එබඳු සුරාවෙන් පිරුණාවූ මේ කළය මිලදී ගණිව්.

23 'ඉදින් යම්සුරාවක් පානය කොට කුලින් පහරලත් ගවයන් මෙන් පතිතවූ කඳ ඇත්තාහු සයනය කෙරෙද්ද, ඒ සුරාපානයාගේ වේගය මිනිසා විසින් ඉසිලිය නොහැක්කේමවේ.

24 'මනුෂ්‍යයෝ යම් සුරාපානයක් ඝොර විෂ ඇත්තාවූ සර්පයෙකු මෙන් දුරුකෙරෙද්ද, ලෝකයෙහි විෂ හා සමානවූ එය කවර මිනිසෙක් පානය කරන්ට සුදුසුවේද,

25 "ඉදින් යම් සුරාවක් පානයකොට දශබෑ රජදරුවෝ මුහුදුතෙර හැසිරෙන්නාහු මොහොල්වලින් ඔවුනොවුන්ට පහර දුන්නාහුද, එබඳු සුරාවෙන් පිරුනාවූ මේ කළය මිලදී ගණිව්,

26 "ඉදින් යම් සුරාවක් පානයකොට ප්‍රමාදවූ මායා සහිතවූ අසුරයෝ සාස්වතයයි සම්මතවූ තව්තිසා දෙව් ලොවින් චුතවූවාහුද, මහරජ, එබඳු ඒ මේ නිරර්ථකවූ සුරාව දැනගෙණ ඔබ වැන්නෙක් කෙසේ පානය කරන්නේද,

27 "මහරජ, මේ කළයෙහි දී හෝ මී හෝ නොවේයයි මෙසේ දැන මිලදී ගනුව, සබ්බමිත්ත නම් රජ මෙසේ වනාහි මේ කළයෙහිවූ දේ මා විසින් ස්වභාවෙන් තොපට කියන ලද්දේයයි බමුණු වෙසින් ආ ශක්‍ර තෙම කීයේය.

28 "බ්‍රාහ්මණය, ඔබ යම් බඳු හිතානුකම්පා ඇත්තෙක් උතුම් වැඩ කැමැත්තෙක් වෙහිද, මාගේ පියා හෝ තවද මාගේ මව හෝ එබඳු නොවේ. එහෙයින් ඒ මම දැන් නුඹගේ කීම කරන්නෙමි.

29 "ඔබට ගම්වර පසක්ද දාසීන් සත්සියයක්ද ගවයන් සියයක්ද ආජානීය අශ්වයන් යෙදූ මේ රථ දශයක්ද දෙමි. ඔබ මට වැඩ කැමතිවූ ගුරුවරයෙක් වෙහියයි රජතෙම කීයේය.

30 "මහරජ, දාසීන් සියය තොපටම වේවා ගම්වරද ගවයෝද තොපටම වෙත්වා ආජානීය අශ්වයන් යෙදූ රථද තොපටම වෙත්වා මම වනාහි දෙව්ලෝ වැස්සන්ට අධිපතිවූ ශක්‍රයාවෙමි.

31 "මහරජ, නුඹ මාංශයෙන් යුක්තවූ බතද ගිතෙල් හා කිරිද වළඳව, මීයෙන් යුක්තවූ මැවලින් කළ කැවුම් අනුභව කරව, මෙසේ ඔබ සුචරිත ධර්මයෙහි ඇලුනේ කිසිවෙකු විසින් නින්දා නොකරණ ලද්දේ දෙව්ලොවට පැමිණේවයි කියා අවවාදකොට ශක්‍රතෙම දෙව්ලොවට ගියේය."

**512 ජයද්දිස ජාතකයඃ-** 1 "ඒකාන්තයෙන් නිරාහාරව සිටින්නාවූ මට අද සත්වන දවසෙහි ආහාර අනුභව කරණ කාලයෙහි බොහෝ කලකින් මහත්වූ කෑයුත්තෙක් පහළවිය. එබැවින් එය කියව, යම්සේ දන්නාලද්දේ වේද, එසේ ජාතිය කියව. කොයි සිට ආයෙහිද, කවරෙක් හෝ වෙහිදැයි (මිනිස් යකා ඇසීය.)

2 "මුව දඩයමට ප්‍රවිෂ්ටවූ ජයද්දිස නම් ඉදින් තොප විසින් අසන ලද්දේද, ඒ මම පර්වත පාර්ශවයන්හිද වනයන්හිද හැසිරෙමි. මේ පසද මෘගයා අනුභව කරව. අද මා මුදවයි (ජයද්දිස රජතෙම කීයේය.)

3 "නුඹ මා සතුවූම දෙයින් කියන්නෙහිය. හිංසා කරණු ලබන්නේ යමක් කියන්නෙහිද මේ පසද මුවා මාගේ ගොදුරවේ. පළමුකොට තා අනුභව කොට අනුභව කරණු කැමති වූ මේ පසද මුවා පසුව කන්නෙමි. තොපට මේ වැළපීමට කාලය නොවේයයි (යක්ෂතෙම කීයේය.)

4 "ඉදින් මාගේ ගණු දෙනුවෙන් මිදීමක් නැත්තේද, එහෙයින් ගොස් බ්‍රාහ්මණයාට ඒ පොරොන්දු ධනය දී හෙට උදෑසන පෙරලා ඊමට ප්‍රතිඥා ගණුව, සත්‍ය වචනය රක්නේ නැවත මෙහි එන්නෙමියි (රජතෙම කීයේය.)

5 "මහරජ, මරුවා සමීපයට පැමිණියාවූ තා කිනම් කර්මයක් තවයිද, හෙට උදෑසන ඊමට හැක්කේහි නම් අවසර දෙන්ට හැක්කෙමුයි එය මට කියවයි කීයේය.

6 "මා විසින් බ්‍රාහ්මණයෙකුට ධනය දෙමියි එහි ආශාව ඇති කරණ ලදී. ඒ පොරොන්දුවූ ඇපය නුමුදන ලදී. ඒ පොරොන්දු ධනය බ්‍රාහ්මණයාට දී සත්‍ය වචනය රකිමින් මම නැවත මෙහි එන්නෙමියි (රජතෙම කීයේය.)

7 "ඔබ විසින් බ්‍රාහ්මණයාට යම් ධනාශාවක් කරණ ලද්දීද ඒ පොරොන්දු ඇපය නොමුදන ලද්දේද, ඒ පොරොන්දු ධනය බ්‍රාහ්මණයාට දී සත්‍ය වචනය රකිමින් නැවත මෙහි එවයි යක්ෂතෙම කීයේය.

8 "කාමයන් කැමති වන්නාවූ ඒ රජතෙම පෝරිසාදයා අතින් මිදුනේම ස්වකීය රාජමන්දිරයට ගොස් ඒ පොරොන්දුවූ ධනය බමුණාට දී අලීනසත්ත නම් පුත්‍ර කුමාරයා කැඳවූයේය.

9 "පුත්‍රය, අදම රාජ්‍යයෙහි අභිෂෙක වෙව. රටවැස්සන් කෙරෙහිද ජනයන් කෙරෙහිද දැහැමින් රාජ්‍යය කරව, අධර්මයෙන් රාජ්‍යය කිරීමක් නම් තාගේ රටෙහි නොවේවා මම පෝරිසාදයාගේ සමීපයට යමියි (රජතෙම කීයේය.)

10 "දෙවයන් වහන්ස, ඔබට කිනම් කර්මයක් කරමින් සතුටු නොකෙළෙම්ද, අද ඔබ යම්හෙයකින් මා රාජ්‍යයෙහි අභිෂෙක කරන්නෙහිද, එය අසන්ට කැමැත්තෙමි. ඔබගෙන් වෙන්ව මම රාජ්‍යයද කැමති නොවන්නෙමියි (කුමාර තෙම කීයේය.)

11 "පුත්‍රය, මම නුඹගේ කර්මයකින් හෝ වචනයකින් හෝ කරණ ලද අපරාධයක් සිහි නොකරමි. මම පෝරිසාදයා හා සමග පොරොන්දුවක් වී ආවෙමි. එහෙයින් සත්‍ය වචනය රක්නේ නැවත එහි යන්නෙමියි (රජතෙම කීයේය.)

12 "පිය රජ්ජුරුවෙනි, මම යන්නෙමි. ඔබ මෙහිම වුව මැනව. ඒ පෝරිසාදයා කෙරෙන් ජීවිතය මිදීමෙක් නැත්තේය. ඉදින් ඔබ යන්නෙහිම නම් මමද යමි. එසේ ඇති කල්හි අප දෙදෙනාම නොවන්නෙමුයි කුමාරතෙම කීයේය.

13 "පුත්‍රය, ඒකාන්තයෙන්ම මෙතෙම සත්පුරුෂයන්ගේ ස්වභාවයවේ. එසේ වුවත් යම්කලෙක්හි ඔබ ඒ කැලල්වූ පා

ඇති පෝරිසාදතෙම තියුණුවූ ලී හුල් වලින් ඇන බලාත්කාරයෙන් පිස කන්නේද, එකල්හි එය මට මරණයටද වඩා ඉතා දුක්වන්නේයයි රජතෙම කීයේය.

14 'පිය රජ්ජුරුවෙනි, මම ඔබගේ ප්‍රාණයෙන් මාගේ ප්‍රාණය පරිවර්තනය කරන්නෙමි. හෙවත් මාරුකරන්නෙමි. ඔබ පෝරිසාදයාගේ සමීපයට නොයනු මැනව. යම්හෙයකින් ඔබගේ ප්‍රාණය හා මාගේ ප්‍රාණය මාරුකරන්නෙමි. යන මේ යමක් වේද එහෙයින් ජීවත්වීමට වඩා මරණය මම කැමැත්තෙමියි කීයේය.

15 "ඉන්පසු ඒකාන්තයෙන් ධෛර්‍ය්‍යවත්වූ රාජපුත්‍ර තෙම මවගේද පියාගේද පා වැන්දේය. දුක්වූ මොහුගේ මව් තොමෝ බිම ඇදවැටුනීය. මොහුගේ පියතෙමේ දෙයත් බැඳගෙණ හඬයි.

16 "පළමුකොට පිය රජතෙමේ පිටි පා යන්නාවූ ඔහු දැන ඇඳිළිබැඳගෙණ දෙවියන්ට නමස්කාර කරයි. පුත්‍රය, සෝම නම් දෙව්රජද වරුණ නම් දෙව්රජද මහාබ්‍රහ්මයාද චන්ද්‍රයාද සූර්‍ය්‍ය දිව්‍යරාජයාද යන මේ දෙවියන් විසින් රක්නා ලද නුඹ පෝරිසාදයා කෙරෙන් අවසර ලද්දේ සුවසේ පෙරලා ඒවායි ආශිංසනය කෙළේය. දණ්ඩකාරණ්‍යවූ නුවරට ගියාවූ රාමනම් තැනැත්තහුට මනාව රක්නාලද ඔහුගේ මව යම් සුවයක් කළාද, ඒ සුවය මම ඔබට කරමි. පුත්‍රය, මේ සත්‍යය කරණකොට ගෙණ දෙවියෝ සිහිකෙරෙත්වා. පෝරිසාදයාගෙන් අවසර ලද්දේ සුවසේ පෙරලා ඒවායි (මම සත්‍යක්‍රියා කළාය.)

17 "ඒකාන්තයෙන් මම අලීනසත්ත කුමරු කෙරෙහි ඉදිරියෙහිද රහසද කළාවූ චිත්ත ප්‍රදූෂ්‍යයක් සිහිනොකරමි. සහෝදරය, මේ සත්‍යය කරණකොට ගෙණ දෙවියෝ සිහි කෙරෙත්වා. පෝරිසාදයාගෙන් අවසරලද්දේ සුවසේ පෙරලා ඒවායි නැගනිය සත්‍යක්‍රියා කළාය.

18 "මාගේ ස්වාමිවූ අලීනසත්ත කුමාරයෙනි, යම් හෙයකිනුත් ඔබ මා නොඉක්මවූ සිත් ඇත්තෙහිද මාගේ සිතිනුත් ඔබ අප්‍රියයෙක් නොවෙහිද, ස්වාමිය, මේ සත්‍ය කාරණාකොට

දෙවියෝ සිහිකෙරෙත්වා. පෝරිසාදයාගෙන් අවසර ලද්දේ සුවසේ පෙරලා ඒවායි (අගමෙහෙසිය සත්‍ය ක්‍රියා කළාය.)

19 "මහත්වූ ඍජුවූ මනොඥ මුහුණක් ඇති ඔබ කොයි සිට ආයෙහිද, වනයෙහි වසන්නාවූ මා නොදන්නෙහිද, රෞද්‍රවූද මා පුරුෂයන් කන්නෙකැයි දැන කවරෙක් නම් සුවය පතමින් මෙහි එන්නේදැයි (පෝරිසාදතෙම ඇසීය.)

20 "රෞද්‍රවූ තැනැත්ත නුඹ පුරුෂයන් අනුභව කරන්නෙකැයි දනිමි. වනයෙහි වසන්නාවූ තා නොදන්නෙම් නොවෙමි. මමද ජයද්දිස රජහුගේ පුත්‍ර වෙමි. පියහුගේ මිදීම හේතුකොටගෙණ අද මා තවයි. (කුමාරතෙම කීයේය)

21 "ඔබ ජයද්දිස රජහුගේ පුත්‍රයායයි දනිමි. ඔබ දෙදෙනාගේ මුඛවර්ණය එබඳුමවේ. යමෙක් පියාගේ මිදීම හේතුකොට ගෙණ මරණයට කැමතිවන්නේ නම් නුඹ විසින් කරණ ලද මේ ක්‍රියාව ඉතා දුෂ්කරවූවක්ම වේයයි පෝරිසාද කීයේය.

22 "යමෙක් පියාගේ මිදීම හේතුකොට ගෙණද මවගේ මිදීම හේතුකොට ගෙණද, මරණයට කැමතිවන්නේ නම් හෙතෙම පරලොව ගොස් ස්වර්ගයෙහිවූ සැපයෙන් යුක්තවේ. එහෙයින් මම මෙහි කිසි දුෂ්කරයක් නොහඟිමියි (කුමාර තෙම කීයේය)

23 "මමද වනාහි ඉදිරියෙහිවූ රහස හෝ තමන්ගේ පාපකර්මය ඒකාන්තයෙන් සිහිනොකරමි. මම නුවණින් පිරිසිඳින ලද ජාති මරණ ඇත්තේ වෙමි. මට මේ ලෝකයෙහි යම්සේම වේද, පරලොවද එසේම වේ.

24 "මහත් ආනුභාව ඇත්ත අද දැන් මා අනුභව කරව. මේ ශරීරයට කටයුතු දෑ කරව. වෘක්ෂයාගේ අගින් හෝ තා පිණිස මම වැටෙමි. කැමතිවන්නේ තෝ මාගේ මස් අනුභව කරවයි (කුමාරතෙම කීයේය.)

25 "රාජ පුත්‍රය, පියාගේ මිදීම හේතුකොට ගෙණ ප්‍රාණය හරණෙහි යන මෙයද තා විසින් කැමතිවනු ලැබේ. එහෙයින්

මෙහි නුඹ ඉක්මන් ස්වභාව ඇත්තේ දර බිඳ රැස්කොට ගිනි දල්වවයි. (පෝරිසාද කීයේය.)

26 "ඉක්බිති ඒකාන්තයෙන් ධෛර්‍ය්‍යවත්වූ රාජපුත්‍ර තෙම දර එක්කොට මහත්වූ ගින්නක් දල්වා දැන් මේ මහා ගින්න මා විසින් දල්වන ලද්දේයයි දැන්වූයේය.

27 "බලහත්කාර කම් කරණ සුළු තැනැත්ත අද දැන් මා අනුභව කරව. ලොමුඩැහැගත්තේ කුමට මා නැවත නැවත බලන්නෙහිද, යම් යම් පරිද්දකින් කැමති වන්නේ මා අනුභව කරන්නෙහිද, ඒ ඒ පරිද්දෙන් තොපගේ වචනය මම කරමියි (කුමාරතෙම කීයේය.)

28 "ධර්මයෙහි පිහිටියාවූ සත්‍ය වචන ඇත්තාවූ ප්‍රතිග්‍රාහකයන්ගේ වචන දන්නාවූ තොප වැන්නෙකු අනුභව කරන්ට කවරෙක් නම් සුදුසු වේද, යමෙක් තොප වැනි සත්‍ය වචන ඇත්තෙකු අනුභව කරන්නේ නම් ඔහුගේ මුදුනද සත්කඩක්ව පැලෙන්නේයයි (පෝරිසාද කීයේය.)

29 "මේ වනාහි ඒ සස පණ්ඩිතතෙම බ්‍රාහ්මණයෙකැයි හඟිමින් ස්වකීය ශරීර මාංශ දීම පිණිස සාතෙම බමුණා වාසය කරවීද, යක්ෂය එහෙයින්ම ඒ චන්ද්‍ර දිව්‍ය පුත්‍රතෙම ලකුණ ඇත්තේයයි ප්‍රසිද්ධවූයේ අද ප්‍රේමය වඩන්නේ වේයයි කීයේය.

30 "යම්සේ පසළොස්වක්හි රාහු මුඛයෙන් මිදුනාවූ චන්ද්‍රතෙම බබළාද, සූර්‍ය්‍යතෙම බබළාද මෙපරිද්දෙන් මහත් ආනුභාව ඇති කුමාරය, පෝරිසාදයාගෙන් මිදුනාවූ නුඹ පියාද මවද සතුටු කරමින් කම්පිල්ල දෙශයෙහි බබළව. ඔබගේ සියලු නෑ පිරිවරද සතුටුවේවායි (මහසත්හු පිටත් කෙළේය.)

31 "ඉක්බිති ඒකාන්තයෙන් ධෛර්‍ය්‍යවත්වූ රාජපුත්‍රතෙම පෝරිසාදයාට කරණ ලද ඇඳිලි ඇත්තේ පෙරළා ගියේය. පෝරිසාදයා විසින් අනුදන්නා ලද අලීනසත්ත කුමාරතෙම සැප ඇත්තේ නිරෝගවූයේ කම්පිල්ල දෙශයට පෙරලා ආයේය.

32 "නියම්ගම් වැස්සෝද දනව් වැස්සෝද ඇතැරුවෝද රථසෙනගද පාබල සෙනගද යන සියල්ලෝ බඳැඳිළි ඇත්තාහු

නුඹවහන්සේ දුෂ්කර කටයුතු කරන්නෙක්වෙහිය. ඔබට නමස්කාරවේවායි නමස්කාර කරමින් ඒ කුමරුවෙතට එළඹුනාහුයයි" වදාළේය.

**513 ඡද්දන්ත ජාතකය:-** 1 "රන්වන් ශරීර ඇත්තිය, කුමකට ශොක කෙළෙහිද, උතුම් ශරීර වර්ණ ඇත්තිය කුමක් හෙයින් පඬුවන්වූයෙහිද, මහත්වූ ඇස් ඇත්තිය අත් වලින් මඩනා ලද පියුම් මාලාවක් මෙන් කුමක් නිසා මළානිකවූයෙහි දැයි (රජතෙම ඇසීය.)

2 "මහරජ, සිහිනයෙන් මට දොළක් පැමිණියේය. මාගේ ඒ දොළ යම්බඳුද, හෙතෙම පහසුවෙන් ලැබෙන ස්වභාව ඇත්තෙක් නොවේම" යයි (බිසව කීවාය.)

3 "එම්බා නන්දනිය, මේ ලෝකයෙහි මිනිසුන් අයත්වූ යම්කිසි කාම සම්පත් කෙනෙක් ඇද්ද, ඒ සියල්ල මට බොහෝ සුලභ වෙත්. මම තිට දොළදෙමියි (රජතෙම කීයේය)

4 "දේවයන්වහන්ස, ඔබගේ රාජ්‍යයෙහි යම්කිසි වැදි කෙනෙක් වෙත් නම් ඔව්හු කැඳවත්වා. මාගේ දොළ යම්බඳු වේද, මම එය මේ වැද්දන්ට කියන්නෙමියි බිසව කීවාය."

5 "එම්බා දේවිය, මේ ඒ වැද්දෝ දක්ෂවූවාහු භය නැත්තාහු වෙත්. වනාන්තර දන්නාහුද මෘගයන් හඳුනන්නා හුදවෙත්. මේ සියල්ලෝම මා සඳහා හරණලද දිවි ඇත්තෝද, වෙත්යයි රජතෙම කියේය."

6 "මෙහි යම්තාක් වැදිපුත්‍රයෝ රැස්වූවාහුද, ඒ සියල්ලෝ අසව්. මම ස්වප්නයෙහි ෂට්වර්ණ දළ ඇති ශ්වෙත වර්ණවූ ඇතෙකු දුටුවෙමි. ඔහුගේ දළ වලින් මට ප්‍රයෝජන ඇත්තේය. එය නොලැබූ කල්හි මාගේ ජීවිතය නැතැයි බිසව කීවාය.

7 "එම්බා දේවිනි, අපගේ පියවරුන් විසින්ද මුත්තනුවරු විසින්ද එබඳු ෂට්වර්ණ දළ ඇති ඇතෙක් දක්නාලදැයි නොඅසනලදී. රාජපුත්‍රීතොමෝ ස්වප්නයෙහි යම් ඇතෙකු දිටීද, ඒ ඇත් රජතෙම යම්බඳු නම් එය අපට කියව.

8 "ස්වප්නයෙහි යම් ෂට්වර්ණ දළ ඇති ඇතෙකු දිටීද, ඒ ඇත්රජතෙම සතර දිසාවය. සතර අනුදිසාවය, උඩය, යටය යන මේ දස දිසාවන් ගෙන් කවර දිසාවක සිටීදැයි වැද්දා ඇසීය.

9 "මෙතැනින් ඍජුව උතුරු දිශාවෙහි මහත්වූ පර්වත සතක් වෙත්. ඉන් සයක් ඉක්මවා මනාව පිපුනාවූ ගස් ඇති කිඳුරන්ගෙන් ගැවසීගත්තාවූ සුවර්ණ පාර්ශව නම් මහත් පර්වතයක් වෙයි.

10 "කිඳුරන්ගේ වාසභවනයවූ ඒ පර්වතයට නැගී පර්වත පාමුල බලව, එකල්හි මේඝයකට සමාන වර්ණ ඇති අටදහසක් උඩින් පහළට ඇදෙන මුල් ඇති මහත් නුගරුකක් දක්නෙහිය.

11 "එහි ඒ නුග ගස යට ෂට්වර්ණ දළ ඇති සතුරන් විසින් මැඩලිය නොහැකි සියල්ල සුදුවූ ඇත් රජතෙම සිටියි. රථ හිස සමාන දළ ඇති වාතයටබඳු වේගයෙන් ගොස් සතුරන්ට පහරදෙන්නාවූ අටදහසක් හස්තීහු ඔහු රකිත්.

12 "ඒ ඇත්තු බිහිසුනු ලෙස ප්‍රශ්වාස කරමින් සිටිත්. කම්පාවූ වාතයටද කිපෙත්. එහි මනුෂ්‍යයවූවෙකු වනාහි දැක හළුකරන්නාහුය. ඔහුගේ ධූලිවත් ඉතිරි නොවන්නේයයි දේවි තොමෝ කීවාය.

13 "එම්බා දේවීනි, මේ රාජ කුලයෙහි රත්තරණින් කරණලද්දාවූ මුතු, මැණික් වලින් කරණලද්දාවූද වෙරළු මිණියෙන් කරණලද්දාවූද, බොහෝවූ ආභරණයෝ ඇත්තාහ. දළකඩ පළඳනායෙන් කුමක් කරන්නෙහිද, ඔබ ෂට්වර්ණ දළ ඇති ඇත් රජ මරවනු කැමැත්තීවෙහිද, නොහොත් වැදි පුත්‍රයන් මරවනු කැමැත්තෙහිදැයි වැද්දා ඇසීය.

14 "එම්බා වැදිපුත්‍රය, ඒ මම හටගත් ඊර්ෂ්‍යා ඇත්තී දුකින් පෙළුනීද විමි. එය සිහිකරන්නී මම මත්තෙහිද වියලෙන්නෙමි. වැදිපුත්‍රය, මාගේ මේ කටයුත්ත කරව, තොපට ගම්වර පසක් දෙන්නෙමියි දේවී තොමෝ කීවාය.

15 "දේවීනි, ඒ හස්ති රාජතෙම කොතනක වෙසේද, කොතැන්හි සිටීමට පැමිණේද, ස්නානයට ගියාවූ මොහුගේ

ගමන් වීථිය කවරක්වේද, කෙසේනම් හෙතෙම ස්නානය කෙරේද ඒ ඇතුගේ ගතිය කෙසේ දනිමුදැයි වැද්දා ඇසීය.

16 "ඒ වාසස්ථානයෙහිම නුදුරුතන්හි සිත්කළුවූද මනාකොට ඇත්තාවූද මහත්වූ ජලය ඇත්තාවූද බමර සමූහයාගෙන් ගැවසීගත්තාවූද ඒ පුෂ්කරණියක් හෙවත් ඡද්දන්ත නම් විල ඇත්තේය. මේ විලෙහි වනාහි ඒ ඇත්රජ තෙම ස්නානය කරයි.

17 "හිස සහිතව ස්නානය කළාවූ උපුල් මල් දරන්නාවූ සියල්ල සුදුවූ හෙළ පියුම් බඳු සමින් යුත් ශරීර ඇති ඇත්රජ තෙම සතුටු වෙමින් සර්ව සුභද්‍රා නම් මෙහෙසිය පෙරටුකොට ගෙණ ස්වකීය නිවාස ස්ථානයට පැමිණේයයි දේවීතොමෝ කීවාය.

18 'වැදිතෙම එහිදීම දේවියගේ වචනය උගෙණ හියවුරුද මහදුන්නද ගෙණ හෙතෙම මහත්වූ පර්වත හත ඉක්මවා ස්වර්ණපාර්ශව නම් මහා පර්වතය දැනගත්තේය.

19 "කිඳුරන්ගේ වාසභවනයවූ පර්වතයට නැග පර්වත පාමුල බැලීය. එහි මේඝය බඳු වර්ණ ඇති අටදහසක් පාරෝහ ඇති මහත්වූ නුගරුක දුටුයේය.

20 "එහි (නුගරුකයට) ෂට්වර්ණ දළ ඇති සියල්ල සුදුවූ සතුරන් විසින් මැඩලිය නොහැකිවූ ඇත්රජු දුටුයේය. රථහිස් සමාන දළ ඇති වාතය බඳු වේගයෙන් ගොස් සතුරන්ට පහර දෙන්නාවූ අටදහසක් හස්තීහු ඔහු රකිත්.

21 "ඒ ඇත්රජතෙම යම් විලෙක්හි ස්නානය කෙරේද, එහිම නුදුරුතැනෙක්හි සිත්කළුවූද, මනාකොට ඇත්තාවූද මහත් ජලය ඇත්තාවූද, සුපිපි මල් ඇත්තාවූද, බමර සමූහයාගෙන් ගැවැසීගත්තාවූද, ඒ විල දුටුයේය.

22 "ඇත්රජහුගේ ගමන්කරණ තැන්ද, නැවතී සිටින තැනද, ස්නානයට ගියාවූ මොහුගේ යම් ගමන් වීථියක් වේ නම් එයද දැක චිත්ත වසඟයට ගියාවූ දේවිය විසින් මෙහෙයන ලද යහපත් ස්වභාව ඇති වැදිතෙම වලක් සෑරුවේය.

23 "ඒ වැද්දා වලක් සාරා තමාද, දුන්නද එහි ඇතුලත් කොට පුවරුවලින් වැසීය. නපුරුකම්කරණසුළුවූ ඒ වැදි තෙම තමන් පාර්ශවයෙහි ආවාවූ ඒ ඇත්රජුට මහත්වූ ඊයකින් විද්දේය.

24 "විදිනලද්දාවූද, ඇත්රජතෙම මහත්ලෙස කුඤ්ච නාද කෙළේය. සියලුම ඇත්තු දරුණු ස්වභාවයෙන් කුඤ්ච නාදකළාහුය. ඒ ඇත්තු තෘණරඬපලාද කාෂ්ටද සුණු කරමින් හාත්පස අටදිසාවට දිව්වාහුය.

25 "මොහු නසන්නෙමියි අල්වාගන්නේ ඍෂීන්ගේ ධ්වජයවූ කාෂාය වස්ත්‍රය හෙවත් සිවුර දුටුයේය. දුකින් පෙළුනාවූ ඇත් රජුට රහතුන්ගේ ධ්වජය මේසිවුර සත්පුරුෂයන් විසින් නොනැසිය යුතුයයි මේ සංඥාව පහළවූයේය,

26 යහළු වැදි පුත්‍රය, යම් පුරුෂයෙක් රාගාදී කෙළෙස් කසට වලින් යුක්තවූයේ ඉන්ද්‍රිය දමනයෙන් හා වාක් සත්‍යයෙන් තොරවූයේ කාෂාය වස්ත්‍ර වැළඳ ගන්නේද, හෙතෙම කාෂාය වස්ත්‍රය වැළඳ ගැණීමට සුදුස්සෙක් නොවේ.

27 "යමෙක් වනාහි වමාරණලද කෙළෙස් කසට ඇත්තෙක් සීලයන්හි මනාව පිහිටියෙක් වන්නේද ඉන්ද්‍රිය දමනයෙන් හා වාක් සත්‍යයෙන් යුක්තවූ හෙතෙම ඒකාන්තයෙන් කාෂාය වස්ත්‍රය වැළඳගැණීමට සුදුසු වේයයි කීයේය.

28 "මහත්වූ ඊතලයකින් විදින ලද ඇත් රජතෙම දූෂ්‍ය නොවූ සිත් ඇත්තේ වැද්දාට මෙසේ කීයේය. යහළු වැදි පුත්‍රය, කුමක් පතමින් කුමක් හේතුකොටගෙණ හෝ මට හිංසා කෙළේද, මේ කවරෙකුගේ ප්‍රයෝගයක් හෝ වේදැයි ඇත් රජතෙම ඇසීය.

29 "ස්වාමීනි, කසී රජහුගේ මෙහෙසි තොමෝ සුභද්‍රා නම් වීය. ඕතොමෝ රජ කුලයෙහි පුදන ලද්දීවේ ඕතොමෝ ඔබ දුටුවාය. ඒ සුභද්‍රා දේවීතොමෝ මටද කීයේය. දළවලින් ප්‍රයෝජන ඇත්තේයයිද මට කීයේයයි වැද්දා කීයේය.

30 "මාගේ පියවරුන්ගේද මුත්තනුවරුන්ගේද යම් දාඨායුග්ම වෙද්ද, ඒ මේ මහත්වූ දාඨායුග්මයෝ බොහෝ ඇතැයි ඕතොමෝ දනියි. ක්‍රොධ ඇත්තාවූ අඥානවූ මට වධ කරණු කැමතිවූ ඒ රාජ පුත්‍රීතොමෝ වෛරයක් කෙළේය

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

31 "වැදිපුත්‍රය, තෝ කියත ගෙණ නැගී සිටුව, මා මැරෙන්ට පෙර මේ දත්දෙක කපව, ඒ ක්‍රොධ ඇත්තාවූ රාජ පුත්‍රියට හස්තිරාජතෙම නසන ලදී. එබැවින් මේ ඔහුගේ දළදෙක ගණුවයි කියවයි ඇත් රජතෙම කීයේය.

32 ඒ වැදිතෙම නැගිට කියත ගෙණ උතුම් ඇත් රජහුගේ දළ කපා පොළොවෙහි අසමානවූ සෝභාවත්වූ ඉතා යහපත්වූ ඒ දළදෙක ගෙණ එතනින් වහා නික්ම ගියේය.

33 "ඇත්රජුට විදීමෙන් මරණ භයින් තැතිගත්තාවූ දුක්වූ යම් ඒ හස්තීහු අට දිශාවන්ට දිව්වාහුද ඔව්හු ඇතුන්ට පසමිතුරුවූ පුරුෂයා නොදැක ඒ ඇත් රජතෙම යම් තැනෙක්හිද එතනට පෙරළා ආවාහුයයි වදාළේය.

34 "ඒ හස්තීහු එතැන්හි හඬා වැළප සොහොනෙහි පස් ස්වකීය හිසෙහි විසුරුවා ඒ සියල්ලෝ සර්ව සුභද්‍රා නම් මෙහෙසිය පෙරටුකොට ස්වකීය නිවාස ස්ථානයට ගියාහුයයි වදාළේය.

35 "ඒ වැදිතෙම ඇත්රජුගේ මනොඥවූ සුන්දරවූ පෘථිවියෙහි අසමානවූ රන්වන් රැසින් හාත්පස බබුළුවන්නාවූ දළදෙක හැරගෙණ කශී රටට පැමිණියේය. හෙතෙම ඇත් රජ නසනලදී. එබැවින් ඔහුගේ මේ දළදෙකයයි. රාජ කන්‍යාවට දළදෙක දුන්නේය.

36 "පළමු ජාතියෙහි ප්‍රිය ස්වාමීවූ ඇත්රජහුගේ දළ දෙක දැක ශොකයට පත්වූ ඇගේ එහිදීම හෘදය පැලුනේය ඒ හේතුවෙන්ම ඒ අඥාන තැනැත්ති කළුරිය කෙළේයයි වදාළේය.

37 "සම්‍යක්සම්බෝධියට පැමිණියාවූද මහත් ආනුභාව ඇති ශාස්තෲන් වහන්සේ පිරිස් මැද සිනා පහළකළ සේක. කෙළෙසුන් කෙරෙන් මිදුනාවූ සිත්ඇති රහත් භික්ෂුහු බුදුවරයෝ නිකරුනේ සිනහ පහළ නොකරන්නේයයි කරුණ විචාළාහුය.

38 "මහණෙනි, කසටවත් හැන්දාවූ ශාසනයෙහි පැවිදිව වාසය කරන්නාවූ යම් තරුණ කුමරියක් දක්නහුද ඕතොමෝ වනාහි එකල්හි රාජ කන්‍යාව වූවාය. එකල්හි මම ඇත් රජ වීමි.

39 "යම් වැද්දෙක් ඇත් රජහුගේ මනොඥවූ යහපත්වූ පෘථිවියෙහි අසමානවූ දළදෙක කපාගෙණ කශීරටට පැමිණියේද, එකල්හි හෙතෙම වනාහි දැන් දෙවදත්ත වූයේය.

40 "පහවූ කෙළෙස් දරථ ඇති පහවූ ශොක ඇති පහවූ කෙළෙස් හුල්ඇති බුදුරජතෙම බොහෝ කලකට පෙර සැරි සරණ ලද උස් පහත්වූ මේ පුරාණ චරිතය ප්‍රකාශකොට වදාළේය.

41 "මහණෙනි, මම වනාහි එකල්හි ඒ ඡද්දන්ත විලෙහි වූයෙමි. එකල්හි ඇත්රජද වීමි. මෙසේ මේ ජාතකය දරව්ය"යි වදාළේය.

514 **සම්භව ජාතකයː-** 1 "එම්බා සුචීරථ බ්‍රාහ්මණය, අපි මේ ඉඳිපත් නුවර රාජ්‍යයටද කුරු රට අධිපති බවටද පැමිණියෙමු. මහත් බවට පැමිණෙන්ට මේ පෘථිවිය දිනන්ට කැමැත්තෙමි.

2 "හෙද ධර්මයෙන් වේ. අධර්මයෙන් නොවේ. අධර්මය තෙම මට රුචිනොවේ. ශුචීරථනම් බ්‍රාහ්මණය, රජගේම ධාර්මිකවූ චරිතය කටයුතුවේ.

3 "බ්‍රාහ්මණය, යම් හෙයකින් මේ ලෝකයෙහිද නින්දා ලබන ලද්දාහු නොවෙමුද, යමකින් පරලොව නින්දා ලබන ලද්දාහු නොවෙමුද යමකින් දෙව් මිනිසුන් අතර යශසට පැමිණෙමුද, එය කියව,

4 'බ්‍රාහ්මණය, යම්බඳුවූ මම ඵල විපාක නමැති අර්ථයද එයට හෙතුවූ ධර්මයද සමාදන්ව පවතින්ට කැමැත්තෙම්ද බ්‍රාහ්මණය ඒ අර්ථයද ධර්මයද විචාරණ ලද්දේ මට කියවයි (රජතෙම) ධර්මයාග නම් ප්‍රශ්නයක් ඇසුවේය.

5 "මහරජ, ඔබ අර්ථයද ධර්මයද කරන්ට කැමැත්තෙහිය යන යමක්වේද, මෙය ප්‍රකාශ කරන්ට විධුර පණ්ඩිතයන් හැර අනිකෙක් සුදුසු නොවේයයි (ශුචීරථ බ්‍රාහ්මණතෙම කීයේය.)

6 "ශුචිරථ බ්‍රාහ්මණය මෙහි එව, මා විසින් මෙහෙයන ලද්දේ විධුර පණ්ඩිතයා වෙත යව, රත්‍රං නිෂ්ක දහසක් හැර ගෙණයව, අර්ථයද ධර්මයද අනුශාසනා කළහුට පූජාවශයෙන් මෙය දෙවයි, රජතෙම කීයේය.

7 "ඒ භාරද්වාජ ගොත්‍රයෙහිවූ ශුචිරථ බ්‍රාහ්මණතෙම විධුරපණ්ඩිතයාගේ සමීපයට ගියේය. මහා බ්‍රාහ්මණතෙම ස්වකීය ගෘහයෙහි ආහාර අනුභව කරන්නාවූ ඔහු දුටුවේ යයි වදාළේය.

8 "මම යශ පිරිවර ඇත්තාවූ කොරව්‍ය රජහුගේ එවන ලද දූතයෙක් වෙමි. යුධිට්ඨිල ගොත්‍රයෙහිවූ ධනඤ්ජය රජ තෙම අර්ථයද ධර්මයද හෙවත් ධර්මයාග නම් ප්‍රශ්නය අසවයි මට කීයේය. විධුර පණ්ඩිතය, අර්ථයද ධර්මයද අසනලද්දාවූ ඔබ එය මට කියවයි ශුචිරථතෙම කීයේය.

9 "බ්‍රාහ්මණය, මට මහජනයාගේ නොයෙක් සිතිවිලි නමැති ගඟ වසන්නෙමියි කටයුත්තෙක් විය. ඒ මහ සයුර නොවසන්ට නොහැකි වෙමි. එහෙයින් කෙසේනම් එබඳු අවකාශයෙක් වන්නේද, අර්ථයද ධර්මයද විචාරණ ලද්දාවූ මම තොපට කියන්ට නොහැක්කෙමියි, කීයේය.

10 "බ්‍රාහ්මණය, තමහට ජාතකවූ මාගේ ඖරස පුත්‍රවූ භද්‍රකාර නම් මාගේ පුත්‍රයෙක්වේ. ඔබ ඔහුවෙත ගොස් ඒ අර්ථයද ධර්මයද විචාරවයි විධුර පණ්ඩිතතෙම කීයේය.

11 "ඒ භාරද්වාජ ගොත්‍රයෙහිවූ බ්‍රාහ්මණතෙම භද්‍රකාර නම් මානවකයා වෙතට ගියේය. මහාබ්‍රාහ්මණතෙම ස්වකීය ගෘහයෙහි උන්නාවූ ඔහු දුටුවේයයි වදාළේය.

12 "මම යශ පිරිවර ඇත්තාවූ කොරව්‍ය රජුගේ සමීපයෙන් එවන ලද දූතයෙක්මි. යුධිෂ්ඨිල ගොත්‍රයෙහිවූ ඒ රජ තෙම අර්ථයද ධර්මයද හෙවත් ධර්මයාග නම් ප්‍රශ්නය විචාරවයි මට කීයේය. භද්‍රකාර නම් මානවකය ඔබ ඒ අර්ථයද ධර්මයද මට කියවයි ශුචිරථ බ්‍රාහ්මණතෙම කීයේය.

13 "යම්සේ පුරුෂයෙක් මස් කද බිම තබා ගොයෙකු ලුහුබඳීද, එමෙන් මම ගෙයි බිරිඳ සිටියදී පරදාරාවන් වෙත යමි. එහෙයින් අර්ථයද ධර්මයද විචාරණ ලද්දාවූ මම තොපට කියන්ට නොහැක්කෙමි.

14 "ශුචිරථ නම් බ්‍රාහ්මණය, සඤ්ජයනම් මාගේ බාල සහෝදරයෙක් සිටියි. ඔහුවෙත ගොස් ඔබ අර්ථයද ධර්මයද හෙවත් මේ ප්‍රශ්නය අසවයි භද්‍රකාරතෙම කීයේය.

15 "ඒ භාරද්වාජ ගෝත්‍රයෙහිවූ බ්‍රාහ්මණතෙම සඤ්ජය මානවකයා, වෙතට ගියේය. මහා බ්‍රාහ්මණතෙම ස්වකීය ගෘහයෙහි උන්නාවූ ඔහු දුටුවේය.

16 "මම යශ පිරිවර ඇත්තාවූ කොරව්‍ය රජහුගේ සමීපයෙහි එවනලද දූතයෙක්මි. යුධිෂ්ඨිල ගොත්‍රයෙහිවූ ඒ රජතෙම ධර්මයාග නම් ප්‍රශ්නය අසවයි මට කීයේය. සඤ්ජය මානවකය, අසන ලද්දාවූ ඔබ ඒ අර්ථයද ධර්මයද මට කියවයි ශුචිරථ බ්‍රාහ්මණතෙම කීයේය.

17 "එම්බා ශුචිරථ නම් බ්‍රාහ්මණය, හැමකල්හි සවසද උදයද මරුවා මා ගිලියි. එහෙයින් විචාරණ ලද්දාවූ මම අර්ථයද ධර්මයද ඔබට කියන්ට නොහැක්කෙමි.

18 "එම්බා ශුචිරථ නම් බ්‍රාහ්මණය, සම්භාව නම් මාගේ බාල සහෝදරයෙක් සිටියි. ඔබ ඔහුවෙත ගොස් මේ අර්ථයද ධර්මයද විචාරවයි, සඤ්ජය මානවකයා කීයේය.

19 "පින්වත, ඒකාන්තයෙන් මේ ධර්මයතෙම අද්භූතය. අපට මෙය රුචිනොවේ. පියාද පුත්‍රයෝ දෙදෙනද යන තුන් දෙනෙක්වූහ. ඔවුන් අතුරෙන් එකෙකුත් ප්‍රඥාවෙන් මේ ධර්මය නොදකිත්.

20 "අර්ථයද ධර්මයද විචාරණලද ඔව්හු එය කියන්ට නොහැකිවූහ. අර්ථයද ධර්මයද විචාරණ ලද්දාවූ මේ ළදරු තෙමේ කෙසේ නම් එය දන්නේදැයි (ශුචිරථ බ්‍රාහ්මණයා කීයේය.)

21 "බ්‍රාහ්මණය, සම්භව කුමරු නොවිචාරා ළදරුවායයි ඔහුට අවමන් නොකරව, සම්භව කුමාරයන් විචාරා අර්ථයද ධර්මයද දැනගන්නේය.

22 "අහසින් ගමන්කරන්නාවූ නිර්මලවූ චන්ද්‍රතෙමේ යම්සේ ලෝකයෙහි සියලු තාරකා සමූහයන් ආලෝකයෙන් ඉක්මවා බබළාද,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

22 "මෙපරිද්දෙන්ම ළදරු බැවින් යුක්තවූයේද සම්භව කුමාරතෙම ප්‍රඥාව හා යුක්තවීමෙන් සෙස්සන් ඉක්මවා බබළයි. ළදරුයයි සම්භව කුමරු නොවිචාරා ඔහුට අවමන් නොකරව, බ්‍රාහ්මණය, සම්භවකුමරු විචාරා අර්ථයද, ධර්මයද දැනගන්නේය.

24 "බ්‍රාහ්මණය, යම්සේ ග්‍රීෂ්ම මාසයන් සම්බන්ධිවූ සිත්කළුවූ බක්මස සෙසු මාසවලට වඩා ගස්වල පිපි මල්වලින් ඉතාම ශොභමානවේද,

25 "මෙපරිද්දෙන්ම සම්භව කුමාරතෙම ළදරුබැවින් යුක්තවූයේද ප්‍රඥා යෝගයෙන් ශොභමානවේ. එහෙයින් ළදරුවායයි සම්භව කුමරු නොවිචාරාම ඔහුට අවමන් නොකරව, බ්‍රාහ්මණය, සම්භව කුමරු විචාරා අර්ථයද, ධර්මයද දැනගණුව.

26 "බ්‍රාහ්මණය, යම්සේ හිමමෙන් යුක්තවූ නොයෙක් වෘක්ෂවලින් ගැවසීගත්තාවූ දේව සමූහයාට වාසස්ථානවූ ගන්ධමාදන පර්වතයතෙම දිව්‍යවූ ඖෂධ වලින් සියලු දිශාවන් බබුළුවාද, සුවඳහමාද, (මෙහි 25 ඡේදය යෙදිය යුතුයි.)

27 "බ්‍රාහ්මණය, ගිනිසිළු ඇති තේජස් පිරිස ඇත්තාවූ තෘප්තියකට නොපැමිණෙන්නාවූ ගියමග තෘෂ්ණා භාවයට පමුණුවන්නාවූ ගින්නතෙම වනයෙහි දිළිසෙමින් යන්නේද,

28 "ගිතෙල් හා වෙඬරු ලන ලද උතුම් වනලැහැබ දවන්නාවූ බොහෝ දර ඇත්තාවූ පර්වත මුදුනෙහි ගින්න තෙම රාත්‍රියෙහි යම්සේ බබළාද,

29 "එපරිද්දෙන්ම ළදරු බැවින් යුක්තවූයේද, සම්භව කුමාරතෙම ප්‍රඥාවෙන් යුක්ත බැවින් බබළයි. සම්භව කුමරු නොවිචාරා ළදරුයයි ඔහුට අවමන් නොකරව, බ්‍රාහ්මණය, සම්භව කුමරු විචාරා ධර්මයාග නම් ප්‍රශ්නය දැනගණුව.

30 "ආජානීය අශ්වයා ගමන් වේගයෙන් දැනගනිත්. බර ඉසිලීමෙන් වෘෂභයාද දැනගණිත්. කිරිදෙවීමෙන් ධෙනුව කිරි ඇත්තීයයි දැනගණිත්. වචනයෙන් පණ්ඩිතයා දැනගණිත්.

31 "මෙපරිද්දෙන්ම ළදරුබැවින් යුක්තවූයේද සම්භව කුමාරතෙමේ ප්‍රඥාව හා යෙදීමෙන් පණ්ඩිතයායයි දැනගණිත්. සම්භව කුමරු නොවිචාරා ළදරුවායයි ඔහුට අවමන් නොකරව, බ්‍රාහ්මණය, සම්භව කුමරු විචාරා අර්ථයද, ධර්මයද හෙවත් ධර්මයාග නම් ප්‍රශ්නය දැනගන්නේයයි සඤ්ජය මානවක තෙම කීයේය.

32 "ඒ භාරද්වාජ ගොත්‍රයෙහිවූ බ්‍රාහ්මණතෙම සම්භව කුමරුගේ සමීපයට ගියේය. මහා බ්‍රාහ්මණතෙම ගෙයින් පිටත්හි ක්‍රීඩාකරන්නාවූ ඔහු දුටුයේයයි" වදාළේය.

33 "මම යශ පිරිවර ඇත්තාවූ කෝරව්‍ය රජහුගේ සමීපයෙන් එවනලද දූතයෙක්මි. යුධිෂ්ඨිල ගෝත්‍රයෙහිවූ රජතෙම අර්ථයද ධර්මයද හෙවත් ධර්මයාග නම් ප්‍රශ්නය විචාරවයිද මට කීයේය. සම්භව කුමාරයෙනි, විචාරණ ලද්දාවූ ඔබ ඒ අර්ථයද, ධර්මයද මට කියවයි, ශුචීරථ බ්‍රාහ්මණතෙම කීයේය.

34 "එබැවින් ඉතා දක්ෂයෙක් යම්සේද එසේ මම තොපට කියන්නෙමි. රජතෙමේද වනාහි එය දනීද, ඉදින් කරන්නේ හෝ වේවා නොමරන්නේ හෝ වේවා කර එසේ කියන්නෙමියි සම්භව කුමාරතෙම කීයේය.

35 "ශුචිරථ නම් බ්‍රාහ්මණය, අද කටයුත්තක් රජ විසින් විචාරණ ලද්දේ සෙටයයි කියන්නේද, යුධිෂ්ඨිල ගොත්‍රයෙහි වූ රජතෙම එබඳු කටයුත්තක් ඇතිවූකල්හි එය ප්‍රමාද කොට නොවෙසේවා.

36 "ශුචීරථ බ්‍රාහ්මණය, රජහු විසින් විචාරණ ලද්දේ තමන් පිළිබඳවම කියන්නේය. සිත් නැත්තාවූ මුළාවූවෙක් යම්සේද, එමෙන් මිථ්‍යාදෘෂ්ටි සංඛ්‍යාත අසත් මාර්ගයෙහි නො පිහිටු වන්නේය.

37 "තමා ඉක්මවා නොපවත්නේය. අධර්මයෙහි නො හැසිරෙන්නේය. මිථ්‍යාදෘෂ්ටි නම් නොතොටට නොබසින්නේය. අනර්ථයෙහි යුක්තවූවෙක් නොවන්නේය.

28 "යම් රජෙක් තෙමේ මෙකී කරුණු කරන්ට දනීද, ඒ රජතෙම හැමකල්හි පුරපස සඳ මෙන් වැඩේ.

39 "නෑයන්ටද ප්‍රියවේ. මිත්‍රයන් අතරද බබළයි. ශරීරයාගේ බිඳීමෙන් පසු ඒ සප්‍රාඥතෙම ස්වර්ගයෙහි උපදීයයි වදාළේය."

515 "**මහාකපි ජාතකය**:- 1 "බරණැස් නුවර කශීදනව් වැස්සන්ගේ රට වර්ධනය කරන්නාවූ රජෙක් වූයේය. මිත්‍රයන්ගෙන්ද, ඇමැතියන්ගෙන්ද පිරිවරණලද ඒ රජතෙම මිගාජිර නම් උයනට ගියේය.

2 "එහිසේවත කුෂ්ටයෙන් සුදුවූ කබර රෝගයෙන් කැළල්වූ කුෂ්ටරෝග ඇත්තාවූ පිපීගිය කොබෝලීල ගසක් මෙන් විශෙෂයෙන් නැසුනාවූ කෘෂවූ ඉල්පී ගිය නහර ඇත්තාවූ බමුණෙකු දුටුවේය.

3 "ඉතා කරුණා කළයුතුබවට පැමිණියාවූ, දුකට පැමිණියාවූ ඒ මිනිසා දැක විෂ්ම පත්වූ රජතෙම සතුන් අතුරෙන් තෝ කවරෙක්දැයි ඇසීය.

4 "තොපගේ අත් පා සුදු වෙත් හිස, එයට වඩා සුදුය. තොපගේ ශරීරය තිත් සහිතය. තෝ කුෂ්ටය බහුලකොට ඇත්තේද වෙහි.

5 "තොපගේ පිට ඇටවැළක් මෙන් උස් පහත්විය. තොපගේ ශරීරාවයවයෝ කළුවැල් පුරුක් මෙන්වූහ. මෙබඳුවූ අන් පුරුෂයෙකු නොදිටිමි.

6 "රජසින් ගැවසීගත් පා ඇති හටගත් උද්වෙග ඇති කෘෂවූ ඉල්පුනු නහර ඇති සයින් පිඩිතවූ තෝ වියලීගිය ශරීර ඇත්තෙක් වෙහිය. කොයි සිට ආයෙහිද, කොතැන්හි යෙහිද,

7 "දැකිය නොහැකිවූ ශරීරාකාර රහිතවූ දුර්වරණවූ භයානක දැකුම් ඇත්තෙක් වෙහිය. තොපගේ වැදූ මවවූ යම් තැනැත්තියක්වේද, ඒ මවද තා දකින්ට නොකැමැති වන්නේය.

8 "පෙර කිනම් කර්මයක් කෙළේද, කවර වධ නොකොට යුත්තෙකු නැසුයේද, යම් ඒ දරුණු කර්මයක්කොට මේ දුකට පැමිණියේදැයි රජතෙම ඇසීය.

9 "මේ ලෝකයෙහි වනාහි සත්‍ය වචන ඇත්තහුට පණ්ඩිතයෝ ප්‍රශංසාකෙරෙත්. එබැවින් මම දක්ෂ පුරුෂයෙක් යම්සේද, එසේ ඔබට කියන්නෙමි.

10 "මම තනිව ගවයන් සොයා ඇවිදිමින් මුළාවූයේ අරාජකවූ හිස්වූ විවේකයෙන් නොයෙක් හස්තීන් විසින් සේවනය කරණ ලද්දාවූ හිමාලයෙහි මනුෂ්‍යපථය ඉක්මවා හැසුරුණෙමි.

11 "චණ්ඩ මෘගයන් විසින් හැසිරෙනලද වනයෙහි මම මුළාවූයෙමි. එහි සත් දිනක් සා පිපාසා දෙකින් පෙළුනේ හැසුරුනෙමි.

12 "එහි අනුභව කරණු කැමැත්තේ විෂම තැනෙක්හි පිහිටියාවූ ප්‍රපාතයට අභිමුඛව එල්බෙන්නාවූ මිහිරි ඵල දරන්නාවූ තිඹිරි ගසක් දුටුයෙමි.

13 "සුළඟින් වැටුනාවූ ගෙඩි අනුභව කෙළෙමි. ඒ ගෙඩි මට බොහෝ සෙයින් රුචිවූහ. එයින් තෘප්තියට නොපැමිණියේ ගසට නැග එහි හිඳගෙණ උන්නෙමි.

14 "එක ගෙඩියක් මා විසින් අනුභව කරණ ලද්දේවිය. දෙවන ගෙඩියක් කැමතිවන ලදී. එහෙයින් ඒ අත්ත පොරොවෙන් කැපුවාක් මෙන් බිඳුනේය.

15 "ඒ මම අතු සමග උඩුකුරුවූ පා ඇත්තේ යටිකුරුවූ හිස ඇත්තේ පිහිටක් නැති එල්බීමක් නැති පර්වත දුර්ගයෙහි වැටුනෙමි.

16 "යම්හෙයකින් ජලයෙන් ගැඹුරුවීද, එහෙයින් අත් පා බිඳීමට නොපැමිණියෙමි. එහි දුක්වූයේ පිහිටක් නැත්තේ දශ රැයක් සයනය කෙළෙමි.

17 "ඉක්බිති පර්වතයෙහි හැසිරෙන්නාවූ ගෝණාංගුල නම් වඳුරෙක් අත්තෙන් අත්තට පනිමින් ගස්වල ගෙඩිකමින් මෙහි ආයේය.

18 "හෙතෙම කෘෂවූ පඬුවන්වූ මා දැක මා කෙරෙහි කරුණා ඇති බවක් කෙළේය. පින්වත, මෙහි මෙසේ දුකින් පෙළුනාවූ හෙතෙම කවරෙක් නම් වේද, මනුෂ්‍යයෙක් හෝ අමනුෂ්‍යයෙක් හෝ වෙහිදැයි තමා මට කියව.

19 "ඔහුට ඇඳිළිකොට මේ වචනය කීමි. මම ව්‍යසනයට පැමිණියාවූ මිනිහෙක්මි. මට මෙයින් ඒ ගොඩට ගමනක් නැත.

එය ඔබට කියමි ඔබට යහපතක් වේවා. ඔබද මට පිහිට වෙවයි කීයේය.

20 "වඳුරු රජතෙම බරවූ ගලක් ගෙණ ගල හා යෙදීමක්කොට පර්වතයෙහි හැසිරෙමින් මෙය කීයේය.

21 "එව, මාගේ පිටට නැග අත් දෙකින් ග්‍රීවය අල්වා ගනුව, මම තා වේගයෙන් ගිරි දුර්ගයෙන් ගොඩට ලන්නෙමි.

22 "ශ්‍රීමත්වූ ඒ වඳුරු රජහුගේ ඒ වචනය අසා ධෛර්‍ය්‍ය සම්පන්නවූ ඔහුගේ පිටට නැග අත් දෙකින් බෙල්ල අල්වා ගත්තෙමි.

23 "තේජස් ඇත්තාවූ බලවත්වූ ඒ වඳුරුතෙම වෙහෙසෙමින් දුකසේ වේගයෙන් මා ඒ නරකාවාටයෙන් ගොඩ සිටවීය.

24 "මා ගොඩගෙණ වෙහෙසවූ ශ්‍රෙෂ්ඨවූ වඳුරුතෙම යහළුව, මම මොහොතක් කල් නිදන්නෙමි. එබැවින් මා ආරක්ෂා කරවයි මේ වචනය කීයේය.

25 "සිංහයෝද, ව්‍යාඝ්‍රයෝද, දිවියෝද යනාදීවූ මේ වනයෙහි යම් චණ්ඩ මෘගයෝ වෙද්ද, ඔව්හු ප්‍රමාදවූ මට හිංසා කරන්නාහුය. ඔබ ඔවුන් දැක වළක්වව,

26 "මෙසේ මට ආරක්ෂා කරන්ට කියා ඒ වඳුරුතෙම මොහොතක් නිදාගත්තේය. එකල්හි මම නුණුවණින් මෙනෙහිකර ලාමකවූ දෘෂ්ටියක් ලදිමි.

27 "සෙසු වන මෘගයන් මෙන්ම මේතෙමේද මිනිසුන්ගේ ආහාරය වේ. එබැවින් සාදුකින් පෙළුනේ මේ වඳුරා මරා කන්නෙම් නම් යෙහෙක.

28 "අනුභව කරණ ලද්දේද, මාර්ගොපකරණ වශයෙන් මස් හැරගෙණද යන්නෙමි. එහෙයින් වනකතර එතර කරන්නෙමි. මට මාර්ගොපකරණද වන්නේයයි.

29 "ඉක්බිති ගලක්ගෙණ හිසට ගැසුයෙමි. ආහාරයෙන් ක්ලාන්තවූ මාගේ පහර දුර්වලවිය.

30 "වහා නැගිට්ටාවූ ලෙයින් වැකුණාවූ ඒ වඳුරු තෙමේද කඳුළු පිරුණු ඇස්වලින් යුක්තව හඬමින් මා දෙස බැලීය.

31 "පින්වත් තෙමේ මට යහපතක් නොකෙළේය. මට මෙබඳු දෙයක් කෙළෙහිය. උඹට දීර්ඝායුෂ වෙහිවා. සෙස්සන් වළකන්ට සුදුසු වෙහිය. (එසේවූවක් මට කෙළෙහිය.)

32 "එබඳු නපුරු දෙයක් කළාවූ බොල පුරුෂය, මා විසින් මෙබඳු දුර්ගමවූ ප්‍රපාතයෙන් ගොඩනගනලද තෝ මෙබඳු අයුත්තක් කෙළෙහි ඉතා පුදුමය.

33 "පරලොවින් ගෙණෙනලද්දෙකු මෙන් නරාවලෙන් ගොඩගත්තාවූ තෝ මට ද්‍රෝහ කරන්නෙමියි සිතුයෙහිය. ලාමක ස්වභාව ඇත්තාවූ පවිටුවූ තා විසින් ඒ පවිටු සිත සිතනලදී.

34 "අධර්මයෙහි පිහිටි තැනැත්ත තෝ මෙබඳු කටුක වේදනාවක් නොවිඳුව, තා විසින් කළ ඒ පාපකර්මයේ ඵලය තෙම හුණ ගස මෙන් තා නොනසාවා.

35 "ලාමක ස්වභාව ඇති සංයම නැති පුරුෂය, තා කෙරෙහි මාගේ විශ්වාසයෙක් නැත. මාගේ පිටුපසින් එව සමීපයෙහි මා දකිමින්ම යව,

36 "වල් මෘගයන් අතින් මා මුදනලද්දේය. මිනිසුන් වාසය කරණ ප්‍රදෙශයට පමුණුවන ලද්දේ අධර්මිෂ්ටය, මේ මාර්ගය වේ. ඒ මගින් සුවසේ යවයි කීයේය.

27 "පර්වතවාසීවූ වඳුරුතෙම මෙය කියා හිසෙහිවූ රුධිරය සෝදා කඳුළු පිසදමා එතනින් පර්වතයට නැංගේය.

38 "ඒ මම ඒ වඳුරු රජ විසින් සාපකරණලද්දේ දැවීමෙන් පෙළුනේ වෙමි. දැවෙනු ලබන්නාවූ ශරීරයෙන් යුක්තව ජලය පානය කරන්ට එක් විලකට ආයෙමි.

39 "මේ සියලු විල ගින්නෙන් හුණුකරණ ලද්දාක් මෙන්ද ලේ වැකුනාක් මෙන් පූයාලේ සමානව මට වැටහුනේය.

40 "යම්තාක් දිය බින්දු මාගේ ශරීරයෙහි වැටුනාහුද, ඒතාක් අඹ, බෙලි හා සමානවූ ගණ්ඩයෝ හටගත්තාහුය.

41 "මේ ගණ්ඩයෝ කුණුවූවාහු බිඳී පූයා ලේ වැගුරුණාහුය. යම් යම් මගකින්ම ගම්වලද නියම්ගම්වලද මම යෙම්ද,

42 "එහි ස්ත්‍රීහුද පුරුෂයෝද දඩුගත් අත් ඇත්තාහු කුණු ගඳින් ගැවසීගත් හෙයින් මේ දිශාවට නොඑවයි. මා වළකත්.

43 "මාගේ මෙබඳුවූ මේ දුකට දැනට සත් අවුරුද්දක් වෙත්. පූර්වයෙහි තමන් කරණලද මිත්‍රද්‍රෝහි කර්මයවූ ස්වකීය කර්මය විපාක විඳිමි.

44 "එහෙයින් තොපට මම කියමි. තොපට යහපතක් වේවා. යම්තාක් දෙනා මෙහි රැස්වූවාහුද, ඒ සියල්ලෝ යම් හෙයකින් මිත්‍රද්‍රෝහි කර්මය ලාමකවේද, එහෙයින් මිත්‍රයන්ට ද්‍රෝහකරන්නෝ නොවෙත්වා.

45 "මේ ලෝකයෙහි යමෙක් මිත්‍රයන්ට ද්‍රෝහ කෙළේද, හෙතෙම කුෂ්ට රෝගියෙක් කිලාස ඇත්තෙක්වේ. ඒ මිත්‍ර ද්‍රෝහතෙම මරණින් මතු නරකයෙහි උපදීයයි" වදාළේය.

**516 දකරක්ඛස ජාතකයඃ-** මෙය මහා උම්මග්ගජාතකයෙහි ප්‍රකාශ වන්නේය.

**517 පණ්ඩරක ජාතකයඃ-** 1 "විසුරණාවූ වචන ඇති නොසඟවනලද මන්ත්‍රණ ඇති සංයම් නැත්තාවූ මේ කිය යුතුය, නොකිය යුතුයයි පරීක්ෂාවක් නැති, නුවණ නැති ඒ පුද්ගලයා තමා විසින් කරණලද්දාවූම භය අනුව යෙයි. කුමක් මෙන්ද යත්, පණ්ඩරක නාග නම්වූ මේ අනුව ගිය සුපර්ණයා මෙනි.

2 "යම් මිනිසෙක් සැඟවියයුතු රහස් මන්ත්‍රය කථා කරමින් එය රැකිය නොහැක්කහුට මුළාවෙන් කියාද, බිඳුනා වූ මන්ත්‍ර ඇති ඒ පුද්ගලයා වහා භය අනුව යෙයි. කවරෙකු මෙන්ද යත්, පණ්ඩරක නාග නම් වූ මා අනුව ගිය සුපර්ණයා මෙනි.

3 "අනුව පවත්නාවූ මිත්‍රතෙම ගරුවූ සැඟවියයුතු කරුණ දැනගන්ට සුදුසු නොවේ. සුහද මිත්‍රතෙමේද ප්‍රඥා නැත්තේ හෝ ඇත්තේ හෝ අනර්ථ ඇත්තේද රහස දැනගන්ට සුදුසු නොවේ.

4 "මේ අචේලකතෙම ශ්‍රමණයෙක් යයිද, ලෝක සම්මත යයිද, වඩනාලද සිත් ඇත්තේයයිද හඟිමින් මම විශ්වාසයට පැමිණියෙමි. ඔහුට මම සැඟවියයුතු කරුණ ප්‍රකටකොට කීමි. එහෙයින් ඉක්මුණු අර්ථ ඇත්තේ බැගෑපත්ව හඬයි.

5 "උතුම්වූ සුපර්ණය, පළමුකොට මම ඔහුට කියනලද සැඟවියයුතු මේ වචනය ආරක්ෂාකරන්ට නොහැකිවිමි. මේ භය මට ඔහුගේ පාර්ශවයෙන් ආයේයයි ඉකුත්වූ අර්ථ ඇත්තේ බැගෑපත්ව හඬමි.

6 "යම් මිනිහෙක් ඒකාන්තයෙන් සුහෘදයයි හඟිමින් පහත් කුල ඇත්තෙකු කෙරෙහි ද්වෙෂයෙන් හෝ නොහොත් රාගයෙන් ඇළුනේ හෝ සැඟවියයුතු කරුණ කියාද, ඒ අඥාන තෙම සැක නැතිව පෙරලා පැමිණවූයේ නසන ලද්දේ නම්වේ.

7 "සඟවනලද වචනඇති අසත්පුරුෂයන්ට ඇතුලත්වූ යමෙක් සැඟවියයුතු වචනය පිරිස් මැද කියාද, ඒ මිනිසා ආශීර්විෂයෙකු මෙන් අයහපත් මුඛ ඇත්තෙකැයි කියත්. එබඳු පුරුෂයා කෙරෙන් දුරින්ම දුරු වන්නේය.

8 "ආහාරද, පාන වර්ගද, කශීවස්ත්‍රද මනවඩන ස්ත්‍රීන්ද මල්මාලාද, දිව්‍යවූ සුගන්ධ සඳුන්ද යන සියලු කාම සම්පත් හැරදමා යන්නෙමු. පින්වත් සුපර්ණය ඔබට ප්‍රාණයෙන් යුක්තව පැමිණියෙමුයි හඬමින් කීයේය.

9 "මේ ලෝකයෙහි ප්‍රාණියෙකුවූ නාගරාජය, ශ්‍රමණයාද සුපර්ණයාද තවද ඔබද යන මෙහි තුන්දෙනා අතුරෙන් කවරෙක්නම් නින්දාවට පැමිණේද, කවර කරුණකින් සුපර්ණයා විසින් මා ගන්නා ලද්දේදැයි තමාටම නින්දාකෙරෙහිද

10 "ඒ ශ්‍රමණතෙම මා විසින් යහපතැයි සම්මත කරණ ලද්දේ විය. මට ප්‍රියයෙක්ද විය. සිතින් සම්භාවනා කරණ ලද්දෙක්ද විය. එහෙයින් ඔහුට මම සැඟවිය යුතු කරණ ප්‍රකටකොට කිමි. ඒ හේතුකොට ගෙණ දැන් ඉක්මවූ අර්ථ ඇත්තේ බැගෑපත්ව හඬමියි කීයේය.

11 "නාගරාජය, පෘථිවියෙහි නොමැරෙන ස්වභාව ඇති සත්වයෙක් නම් නැත්තේය. ප්‍රඥාව සමානවූ නින්දා නොකට යුත්තක්ද නැත. සත්‍ය වචනයෙන්ද සුචරිත ධර්මයෙන්ද ප්‍රඥාවෙන්ද, ඉන්ද්‍රිය දමණයෙන්ද මේ ලෝකයෙහි මනුෂ්‍යතෙම නොලැබියහැක්ක ලබාගනියි.

12 "මවද, පියාද නෑයන් අතුරෙන් උතුම්වෙත්. මේ පුද්ගලයාට ඔවුන් හැර තුන් වෙනිවූ අනුකම්පා ඇත්තෙක් නම් නැත්තේය. ඔවුන්ටද උතුම්වූ රහස මන්ත්‍රයාගේ බිඳීම සැක කරමින් නොකියන්නේය.

13 "මවද, පියාද, සහෝදරිහුද, සහෝදරයෝද, යහළුවෝද යන යමෙකුගේ ස්ව පක්ෂයෙහිවූවෝ වෙද්ද, ඔවුන්ටද මන්ත්‍රයාගේ බිඳීම සැක කරමින් උතුම්වූ රහස නොකියන්නේය.

14 "ඉදින් ළදැරිවූ ප්‍රිය වචන කියන්නීවූ පුත්‍රයන්ගෙන්ද රූපයෙන්ද යසසින්ද යුක්තවූ භාර්‍ය්‍යාවද ස්වාමි පුරුෂයාට රහස මට කියවයි කියන්නීද, මන්ත්‍රණයාගේ බිඳීම සැක කරන්නේ ඈටද උතුම් රහස නොකියන්නේයයි සුපර්ණතෙම කීයේය.

15 "සැඟවිය යුතු කරුණ ප්‍රකාශ නොකරන්නේය. නිධානයක් මෙන් එය රකින්නේයයි දන්නහු විසින් සැඟවියයුතු කරුණ ප්‍රකාශ කරණ ලද්දේ යහපත් නොවේ.

16 "පණ්ඩිතතෙම රහස ස්ත්‍රියට නොකියන්නේය. පසමිතුරාටද නොකියන්නේය. යමෙක් ආමිෂය හේතුකොට ගෙණ එක්වේද, ඔහුටද යම් මිනිසෙක් සිතෙහි සොරකම ඇත්තේ නම් ඔහුටද නොකියන්නේය.

17 "යම් මිනිසෙක් සැඟවියයුතු කරුණ නොදන්නහුට දක්වාද, හෙතෙම මන්ත්‍ර භේද භයින් ඔහුට දාසවූවෙක්ව ඉවසයි.

18 යම් පමණක් මිනිසාගේ මන්ත්‍රණය කොට ඇති සැඟවිය යුතු කරුණ දනිද්ද, එපමණම උද්වෙගයෝ ඔහුට පැමිණෙත්. එහෙයින් සැඟවිය යුත්ත නොහරින්නේය.

19 "දාවල් රහස් කරුණ විවේකව සිට කියන්නේය. රාත්‍රියෙහි කියන්නේ වේලා නොඉක්මවා හෙවත්, බිත්තියෙන් පිට නොඇසෙනසේ කියන්නේය. යම් හෙයකින් ලඟ අසා සිටියාහු මන්ත්‍රණය අසද්ද, එහෙයින් මන්ත්‍රණය වහා බිඳීමට පැමිණේයයි කීයේය.

20 "දොරටු නැත්තාවූ අයෝමයවූ සොඳුරු ශාලා ඇත්තාවූ හාත්පස කනින ලද දිය අගල ඇත්තාවූ මහත් නුවරක් යම්සේ

වන්නේද, මේ ලෝකයෙහි රහස් මන්ත්‍රණ ඇති ඒ පුරුෂයෝද මෙබඳුයයි මට වැටහෙත්.

21 "නාගරාජය, රහස් මන්ත්‍රණ ඇත්තාවූ නොවිසුරුණු වචන ඇත්තාවූ ස්වකීය අර්ථයන්හි ස්ථිරවූ යම් මනුෂ්‍යයෙක් වෙද්ද, සර්පයෙකු කෙරෙන් ජීවත් වෙනු කැමති මිනිසුන් මෙන් ඔවුන් කෙරෙන් පස මිතුරෝ දුරින් බැහැර වෙත්.

22 "ගිහිගෙය හැර පැවිදිවූ මේ නිගණ්ඨයා නග්නවූයේ හිස මුඩු කරණ ලද්දේ ආහාර හේතුවෙන් හැසිරෙයි. ඔහු කෙරෙහි මම රහස් කරුණ යම්හෙයකින් ප්‍රකාශ කෙළෙම්ද එහෙයින් අර්ථයෙන්ද ධර්මයෙන්ද පිරිහුනෙමු.

23 "එම්බා සුපර්ණ රාජය, මේ ශ්‍රමණයා කෙසේ කරන්නෙක්වේද, කෙබඳු සිල් ඇත්තෙක්වේද, කිනම් ව්‍රතයකින් පවත්නේද, ශ්‍රමණව හැසිරෙමින් මමත්වය කරණ ලද්දවුන් හැර කෙසේ කරන්නෙක් දෙව්ලොවට පැමිණේදැයි නාරජ ඇසීය.

24 "යහළු නාරජ ලජ්ජාවෙන්ද ඉවසීමයයි කියනලද ක්ෂාන්තියෙන්ද ඉන්ද්‍රිය දමනයෙන්ද යුක්තවූ නොකිපෙන ස්වභාව ඇත්තේ කේලාම් කීම හැර මමත්වය කරන ලද්දවුන් හැර හැසිරෙන්නේ ශ්‍රමණයා නම්වේ. මෙසේ කරන්නේ දෙව්ලොවට පැමිණේයයි සුපර්ණතෙම කීයේය.

25 "යම්සේ මවු සිරුරෙන් හටගත් ළදරු පුත්‍රයා දැක ඔහු සියලු සිරුරෙහි පතුරුවාද, පක්ෂි රාජය, මෙපරිද්දෙන්ම පුතුට අනුකම්පා කරන්නාවූ මවක් මෙන් ඔබ මට පහළ විය. (හෙවත් මා බලා ජීවිතය දෙවයි නාගයා කීයේය.)

26 "එම්බා නාගය, එහෙනම් අද තෝ වධයෙන් මිදෙව, සමීපයෙහි වාසය කරන්නාය. අනුන් විසින් දෙනලද තැනැත්තාය. තමහට ජාතකවූ තැනැත්තායයි පුත්‍රයෝ තිදෙනෙක්ම වෙත්. ඉන් අන්‍යවූ පුත්‍රයෙක් නම් නැත්තේය. නුඹ මට ඔවුන්ගෙන් එක්තරා පුත්‍රයෙක් වූයේයයි සිත් ඇළුම් කරවයි, සුපර්ණතෙම කීයේය.

27 "සුපර්ණතෙම මෙසේ මේ වාක්‍ය කියා නාගයා බිම සිටුවා නුඹ අද මිදුනේ සියලු භය ඉක්මවා සිටියේ ගොඩ හා දියෙහි මා විසින් රක්නා ලද්දෙක් වෙව,

28 "රෝග ඇත්තවුන්ට දක්ෂවූ වෙදෙකු යම්සේද, පැන් බොනු කැමැත්තවුන්ට සිහිල් දිය ඇති විලක් යම්සේද, හිම කාලයෙහි සීතලෙන් පීඩා ඇත්තවුන්ට ගෙයක් යම්සේද, එමෙන්ම තොපට මම පිහිට වෙමියි සුපර්ණතෙම කීයේය.

29 "එම්බා නාගරාජය, පසමිතුරුවූ පක්ෂියෙකු හා මිත්‍ර සන්ථානය කොට දළ විවෘත කොට සයනය කෙරෙහිය. කොයින් තට බියක් ආයේදැයි සුපර්ණයා ඇසීය.

30 "සතුරා කෙරෙහි සැක කටයුතුමය. මිතුරුවූ කල්හිද විශ්වාස නොකටයුතුය. අභය ස්ථානයවූ මිත්‍රයා කෙරෙන් භය උපන්නේ ජීවිත සංඛ්‍යාතවූ මුල්ම සිඳියි.

31 "යමෙකු හා කලක කරණ ලද්දේද, ඔහු කෙරෙහි කෙසේනම් විශ්වාස කරන්නේද, නිතර පිළියෙල වී සිටිය යුතුයි. යමෙක් නිතර පිළිවෙළට සිටීනම් හෙතෙම සතුරන් සමග නොඇළෙයි.

32 "විශ්වාසවූ කල්හිද ඔහු විශ්වාස නොකරන්නේය. සැක නොකරණ ලද්දේද, සැක කරණ ලද්දෙක් වන්නේය. නුවණැත්තේ යම් යම් පරිද්දෙකින් උත්සාහ කරන්නේද, ඒ ඒ පරිද්දෙන් අනික් තැනැත්තේ ඔහුගේ ස්වභාවය නොදන්නේයයි නාරජ කීයේය.

33 "දෙවියන්ට බඳු වර්ණ ඇත්තාවූ පිරිසිදු පිංකඳු වැනි වූ ඒ පුරුෂ නාගයෝ දෙදෙන එක්ව රථය උසුලන්නාවූ අශ්වයන් දෙදෙනෙකු මෙන් කදම්බිය නම් නිගණ්ඨයා වෙත පැමිණියාහුය.

34 "ඉක්බිති ඒකාන්තයෙන් පණ්ඩරක නම් නාරජ තෙම අචේලකයා වෙත තෙමේම පැමිණ මෙය කීයේය. අද සියලු භය ඉක්මවූ මිදුනාවූ මම ඒකාන්තයෙන් ඔබගේ සිතට ප්‍රිය නොවීම්දැයි ඇසීය.

35 "පණ්ඩරක නම් නාගයාට වඩා සුපර්ණ රාජතෙම නිසැකයෙන්ම මට ප්‍රියවූයේය, යන මෙය සැබව, රාගයෙන් ඇළුනාවූද ඒ මම දැනගෙණම මේ පාප කර්මය කෙළෙමි. මුළාවෙන් නොදැන නොකෙළෙමියි, අචේලකයා කීයේය.

36 "එම්බා දුශ්ශීල නිගණ්ඨය, මෙලොවද පරලොවද දක්නාවූ පැවිද්දාට වනාහි මට ප්‍රිය හෝ අප්‍රිය හෝ වේයයි අදහසක් නොවේ. ඔබ වනාහි මනා සංයම ඇත්තවුන්ගේ ආකාරයෙන් සංයම නැතිව මේ ලෝකය මුළා කරමින් හැසිරෙන්නෙහිය.

37 "ආර්‍ය්‍යයෙකුට බඳු ස්වභාව ඇත්තෙහිය. එතකුදු වුවත් අනාර්‍ය්‍යයෙක්ද වෙහිය. සංයම නැත්තේ සංයම ඇත්තෙකු බඳුවෙහිය. තෘෂ්ණා ස්වභාව ඇත්තෙහිය. ලජ්ජා නැති ස්වභාව ඇත්තේ ලාමකවූ බොහෝ දුශ්චරිත කෙළේයයි නාරජතෙම නින්දා කෙළේය.

38 "එම්බා නිගණ්ඨය, මිත්‍රද්‍රෝහිවූ නුඹ දූෂ්‍ය නොකළාවූ මිත්‍රයාට ද්‍රෝහ කෙළේද වෙහිය. කේලාම් කියන්නෙක්ද වූයෙහිය. මේ සත්‍ය වචනය කරණකොටගෙණ තොපගේ මස්තකය සත් කඩක්ව පැලේවායි නාරජ ශාප කෙළේය.

39 "මේ ලෝකයෙහි යම්හෙයකින් මිත්‍රද්‍රෝහි කර්මයට වඩා ලාමකවූ අන් කර්මයෙක් නැත්තේද, එහෙයින් මිත්‍රයන්ට ද්‍රෝහ නොකටයුතුයි. ඉසිනලද විෂයෙන් සත්වතෙම නැසුනාක්මෙන් නාරජහුගේ සත්‍ය ක්‍රියාවෙන් සංවරයෙහි සිටි නිගණ්ඨතෙම නැසුනේයයි වදාළේය."

**518 සම්බුලා ජාතකය:-** 1 "වටවූ ඌරු (කලවා) යුග්මයක් ඇත්තීය, මේ පර්වත කඳු රැළියෙහි සීතලින් වෙව්ලමින් එකළාව සිටින්නෙහිය. තී කවර තැනැත්තියක්ද, මිටින් ගතහැකි මධ්‍ය ප්‍රදේශ ඇත්තීය, මා විසින් විචාරණ ලද්දීවෙහිය. තීගේ නමද නෑයන්ද මට කියව.

2 "සුන්දරිය, සිංහ ව්‍යාඝ්‍රයන් විසින් සේවනය කරණ ලද සිත්කළුවූ මේ වනය බබුළුවමින් සිටින්නාවූ තී කවර තැනැත්තියක් හෝ වෙහිද, මනා මැද පෙදෙස් ඇත්තිය, තී

කවරෙකුගේ නෑ තැනැත්තියක් හෝ වෙහිද, සොඳුර, තිට වඳිමි මම අසුරයෙක්මි. තිට නමස්කාර වේවායි. අසුරයා කීයේය.

3 "අසුරය, කශී රජහුගේ යම් පුත්‍රයෙක්වේද, සොත්ථි සේනයයි ඔහු දනිත්. මම ඔහුගේ භාර්‍ය්‍යාවූ සම්බුලා නම් වෙමි. මෙසේ දැනගණුව, වඳිමි. තට යහපතක් වේවා මම සම්බුලා නම් වෙමි. තට නමස්කාර වේවා.

4 "තට යහපතක්වේවා, වේදෙහි පුත්‍රතෙම රෝගාතුරව වනයෙහි වෙසෙයි. එකළාවූ මම රෝගයෙන් පෙළුනාවූ එකළාව උන් ඔහුට උපස්ථාන කෙළෙමි

5 "මමද වනයෙහි ඇවිද සොයාගෙණ මී හා මෘගයන් කා ඉතිරි කළ මස්ද යම් කලක හැරගෙණයම්ද, එය අනුභව කරන්නේවෙයි. ඔහුට අද ඒකාන්තයෙන් එය නොලැබී තැවේයයි (සම්බුලාව කීය.)

6 "සම්බුලාවෙනි, රෝගාතුරවූ දිරීමට පත්වූ ඒ රාජ පුත්‍රයා සමග වනයෙහි කුමක් කරන්නෙහිද, මම තිට ස්වාමි පුරුෂයාවෙමියි (අසුරයා කීයේය.)

7 "ශොකයෙන් පීඩිතවූ දුර්ගතවූ ශරීර ඇති මාගේ කවර රූපයක් විද්‍යමානවේද, අසුරය තට යහපතක්වේවා මට වඩා විශිෂ්ට රූ ඇති අන් අඟනක් සොයාගණුවයි (සම්බුලාව කීය.)

8 "සුන්දරිය, එව මේ පර්වතයට නැගෙව, මාගේ භාර්‍ය්‍යාවෝ සාර සියයක් වෙත්. සියලු කාමසම්පත්තීන් සමෘද්ධවූ තී ඔවුන්ට ප්‍රධාන වෙව,

9 "තාරකාබඳු ආලෝක ඇත්තිය, යම්කිසිවක් සිත කැමැත්තෙහිද, ඒ සියල්ල ඒකාන්තයෙන් මට බොහෝවේ. අද මා සමග අභිරමණය කරව,

10 "සම්බුලාව ඉදින් නුඹ මාගේ මෙහෙසි බව නො කරන්නෙහි නම් උදෑසන ආහාරය පිණිස සුදුසුය මාගේ කෑ යුත්ත වන්නෙහියයි හඟිමි.

11 "ජටා සතක් ඇති රෞද්‍රවූ පිඟුවන්වූ මිනිසුන් කන්නාවූ රකුසුතෙම වනයෙහි පිහිටක් නොදක්නාවූ ඒ සම්බුලාවද අත අල්වාගත්තේය.

12 "රෞද්‍රවූ ක්ලෙශ වශයෙන් ආමිෂයෙහි ලොල්වූ ඇස් ඇති පිශාචයා විසින් යටත් කරණලද සතුරාගේ වසඟයට පැමිණියාවූ ඒ සම්බුලාවද ස්වාමියා අනුවම ශොක කරයි

13 "මාගේ ස්වාමි පුත්‍රයාගේ සිත අන්පරිද්දකින් වන්නේයයි යම්බඳු දුකක්වේද, රාක්ෂස තෙම මා කන්නේය යන යම් දුකක් වේනම් මෙය මට එබඳු දුකක් නොවේ.

14 "මේ ලෝකයෙහි දෙවියෝ නැත්තාහ. ඒකාන්තයෙන් අධිගෘහිතව වාසය නොකරත්. ඒකාන්තයෙන් ලොව රක්නාවූ දෙවියෝ නැත්තාහුය. දරුණුකම් කරන්නාවූ සංයම නැත්තවුන් වළකන්නාහු ඒකාන්තයෙන් නොම ඇත්තාහුයයි (සම්බුලා තොමෝ වැළපුනාය.)

15 "මෝතොමෝ යශස් ඇත්තාවූ ශාන්තවූ විෂමාචාර නැත්තාවූ ගින්නක්මෙන් උග්‍රතේජස් ඇත්තාවූ ස්ත්‍රීන් අතුරෙන් උතුම් තැනැත්තියෙකි. රාක්ෂසය, තෝ ඉදින් ඒ කන්‍යා ස්ත්‍රිය කරන්නෙහි නම් තාගේ මුදුන සත්කඩක්ව පැලෙන්නේය. තෝ මේ පතිව්‍රතාව නොදවව, මුදාහරුව, ඕතොමෝ පතිව්‍රතාවකැයි (ශක්‍ර තෙම කීයේය.)

16 "රකුසාකෙරෙන් මිදුනාවූ ඒ සම්බුලාවද ගොදුරු ගෙණ එන්නාවූ පක්ෂිධෙනුවක් කැදැල්ලට එන්නාක් මෙන්ද නික්ම ගියාවූ වස්සා ඇති ගවගාලට එන්නාවූ ධෙනුවක් මෙන්ද අසපුවට ආයේය.

17 "ශොකයෙන් හටගත් උණුසුමෙන් මත්වූ ඇස් ඇති යශස් ඇති සම්බුලානම් ඒ රාජ පුත්‍රී තොමෝ ඒ වනයෙහි ස්වාමියා නොදක්නී වැළපුනීය.

18 "ශ්‍රමණයන්ද බ්‍රාහ්මණයන්ද චරණ ධර්මයන්ගෙන් යුක්තවූ ඍෂිවරයන්ද මම වඳිමි. රාජපුත්‍රයා නොදක්නී මම නුඹ වහන්සේලාගේ සරණ ගියාවෙමි.

19 "සිංහයන්ද ව්‍යාඝ්‍රයන්ද වනයෙහි සෙසු යම් මෘග කෙනෙක් ඇත්නම් ඔවුන්ද වඳිමි. රාජපුත්‍රයා නොදක්නීවූ මම තොපගේ සරණ ගියාවෙමි.

20 "තෘණ වර්ගද ලතා වර්ගද ඖෂධ ජාතීහුද පර්වතයන්ද වනයන්ද මම වඳිමි. රාජපුත්‍රයා නොදක්නීවූ මම තොපගේ සරණ ගියාවෙමි.

21 "නිළුපුල් බඳු වර්ණ ඇති තාරකා මාලාවන් ගෙන් යුක්තවූ රාත්‍රියද මම වඳිමි. රාජපුත්‍රයා නොදක්නීවූ මම තීද සරණ කොට ගියාවෙමි.

22 "සෙසු ගංගා වන්ගේ ජලය පිළිගන්නාවූ භාගීරථී නම් ගංගාව මම වඳිමි. රාජපුත්‍රයා නොදක්නීවූ මම ඔබගේද සරණ ගියාවෙමි.

23 "හිමවත් පර්වත නම්වූ උතුම්වූ පර්වත රාජයා මම වඳිමි. රාජපුත්‍රයා නොදක්නීවූ මම ඔබගේද සරණ ගියා වෙමියි. සම්බුලා තොමෝ වැළපුනාය.

24 "යශස් ඇත්තාවූ රාජපුත්‍රිය, ඒකාන්තයෙන් තී අද ඉතා සවස්ව ආයෙහිය. අද කවරෙකු හා එක්වූයෙහිද, තිට මට වඩා ඉතා ප්‍රියවූ කවරෙක් ඇත්තේදැයි (රාජපුත්‍ර තෙම ඇසීය.)

25 "ඒ සතුරුවූ රකුසා විසින් අල්වා ගන්නාලද මම වනාහි ඔහුට මෙය කීවෙමි. මාගේ ආර්‍ය්‍ය පුත්‍රයාගේ සිත අන් පරිද්දෙකින් වන්නේයයි යම් දුකක්වේද, රාක්ෂස තෙම මා කන්නේය යන යමක්වේ නම් මෙය මට එබඳු දුකක් නොවේයයි කීවෙමි

26 "සෙරවූ බොහෝ අදහස් ඇත්තාවූ යම් ස්ත්‍රීහු වෙද්ද, ඔවුන් කෙරෙහි සත්‍ය වචනය ඉතා දුර්ලභවේ. ස්ත්‍රීන්ගේ අදහස මත්ස්‍යයාගේ දියෙහි ගමන් මාර්ගය මෙන් දැනීමට දුෂ්කරයයි (රාජපුත්‍රතෙම කීයේය.)

27 "යම්සේ මම ඔබට වඩා ඉතා ප්‍රියවූ අන්‍යයෙකු නොදනිමියි කියම්ද, ඉදින් එසේ මාගේ සත්‍යය රක්නේ නම්, සත්‍ය තෙමේ මා රකීවා මේ සත්‍ය වචනය කරණකොට ගෙණ ඔබගේ ව්‍යාධිය සංසිඳේවායි (සම්බුලා තොමෝ සත්‍ය ක්‍රියා කළාය.)

28 "සොඳුරු සම්බුලාවෙනි, අපගේ යම් සත්සියයක් හස්තීහුද ඔවුන් පිට නැඟී අවි දරන්නාහුද ධනුර්ධරයන්

සොළොස් සියයක්ද මෙනුවර රකිත්. එසේ කල්හි තී කෙබඳු සතුරන් දක්නෙහිදැයි, රජතවුස් තෙම ඇසීය.

29 "පියුම් ගැබ බඳු සෝභාවත් මතුපිට සිවිය ඇත්තාවූ අලංකාරයෙන් සැරසුනාවූ කෘෂ මධ්‍ය ශරීර ඇත්තාවූ හංස ධෙනුන්ගේ මෙන් මිහිරි ස්වර ඇත්තාවූ ස්ත්‍රීන් බබළයි. ඔබගේ ඒ පුත්‍රතෙම ඔවුන්ගේ මිහිරිවූ ගීත වාදිතය අසා පියාණෙනි, පෙර යම්සේද, දැන්මට එසේ නොපවතියි.

30 "පියාණෙනි, ස්වර්ණයෙන් සකස් කරණලද ආභරණ දරන්නාවූ අලංකාර කරණලද මනා සිරුරු ඇත්තාවූ මිනිස් දෙවඟනන් බඳුවූ සොත්ථිසේන රජහට ප්‍රියවූ නින්දා නො කරණලද ශරීරාවයව ඇත්තාවූ ක්ෂත්‍රිය කන්‍යාවෝ ඔහු පොළඹවත්.

31 "පියාණෙනි, ඉදින් මම පෙර මෙන් නැවතද වනයෙහි සිඟා හැසිරීමෙන් ඒ ස්වාමියා පෝෂණය කරන්නෙම් නම් මට බුහුමන් කරන්නේය. අවමන් නොකරන්නේය. ඒ කාරණයෙන්ද පියාණෙනි, මට මෙයට වඩා එය අරණ්‍යය උතුම් වන්නේය.

32 "ආහාර පානය බොහෝකොට පිළියෙලවූ ගෘහයෙහි යම් ස්ත්‍රියක් තොමෝ විශෙෂයෙන් සැරසුනාවූ අබරණ ඇත්තී සියලු ගුණාංගයෙන් යුක්තවූවා ස්වාමියාට ප්‍රිය නොවන්නීද, ඈට ගෙළ වැළ බැඳ ගෙණ මැරීම ඒ ගෘහ වාසයට වඩා උතුම්වේ.

33 "තවද දිළිඳුවූ බැගෑපත්වූ සහල් නැලියක්වත් නැත්තාවූ නිදන කළාල දෙවෙනිකොට ඇත්තාවූ යම් ස්ත්‍රියක් තොමෝ ඉදින් ස්වාමියාට ප්‍රිය වන්නීනම් සියලු ගුණාංගයෙන් යුක්තවූද, ස්වාමියාට අප්‍රියවූ මේ රාජ්‍යසැපතට වඩා ස්වාමියාට ප්‍රියවූ දිළිඳුවූද මෝතොමෝ උතුම් වන්නීයයි සම්බුලා තොමෝ කීවාය.

34 "පුත්‍රය, යම් ස්ත්‍රියක් තොමෝ පුරුෂයාට හිත ඇත්තීද, එබඳු ස්ත්‍රීහුද දුර්ලභවෙත්. යම් පුරුෂයෙක් තෙම ස්ත්‍රිය කෙරෙහි භක්ති ඇත්තේ හිතවත්වේද, එබඳු පුරුෂයෙක්ද දුර්ලභවේ. මේ සම්බුලානම් භාය්‍යීා තොමෝ තොපට හිත ඇත්තීද, සිල්

ඇත්තීදවේ. මහරජ, එහෙයින් සම්බුලාව සමග දැහැමින් වාසය කරවයි, තාපසවූ පිය රජතෙම අවවාද කෙළේය.

35 "සොඳුර සම්බුලාවෙනි, ඉදින් නුඹ මහත්වූ ලබන ලද සම්පත් ඇති කල්හි ඊෂ්‍යීාවට බැස ගත්තී මරණයට පැමිණෙන්නෙහිද, මමද මේ රාජ කන්‍යාවෝද යන ඒ සියල්ලෝම තොපගේ වචනය කරන්නාහු වෙමුයි. (රජ තෙම සියලු සම්පත් ඇයට බාර කෙළේය" යි වදාළේය.)

**519 ගණ්ඩතින්දුක ජාතකයඃ-** 1 "ප්‍රමාද නොවීම නිවනට කරුණු වේ ප්‍රමාදවීම මරණයට කරුණුවේ. අප්‍රමාද වූවාහු නොමියනු ලබත්. මහරජ, යම් කෙනෙක් ප්‍රමාද වූවාහුද, ඔව්හු මළවුන්වැනි වෙත්.

2 මහරජ, ත්‍රිවිධ මදයෙන් ප්‍රමාදය හටගනියි, ප්‍රමාද හේතුවෙන් විනාශය හටගණියි. විනාශ හේතුවෙන් ද්වෙෂයෝ හටගණියි. එබැවින් මදයට නොපැමිණේවා.

3 ප්‍රමාදවූ බොහෝ රජදරුවෝ ධනයද රටද යන මෙයින් පිරිහුනාය. තවද යම් අධිපතීහු ගමින් පිරිහුනාය. ප්‍රව්‍රජිතයෝ පැවිදි පිළිවෙතින් පිරිහුනාහුය.

4 රට වර්ධනය කරන්නාවූ මහරජ, ප්‍රමාදවූ රජහුගේ රටෙහි සියලු සම්පත් විනාශවෙත්. රජුට එය දුකයයි කියනු ලැබේ,

5 මහරජ, සීමාව ඉක්මවා ප්‍රමාද වන්නෙහි නම් මෙතෙම පැරණි රජුන්ගේ ධර්මය නොවේ සමෘද්ධවූද සම්පත්තීන් පිරුණාවූද ඒ ජනපදය සොරු විනාශ කෙරෙත්.

6 ඒ ප්‍රවේනි රක්නා පුත්‍රයෝ නොවන්නාහ. හිරණ්‍යාදී ධනය නොවන්නේය. ඇල් හා සෙසු වී ආදී ධාන්‍යය නොවන්නේය. රට පැහැර ගනු ලබන කල්හි සියලු සම්පත් වලින් පිරිහෙන්නේය.

7 "සියලු සම්පතින් පිරිහුනු ක්ෂත්‍රිය රජවූද ඔහු නෑයෝද මිත්‍රයෝද යහළුවෝද බුහුමන් කටයුතුයයි නොහඟිත්.

8 "ඇතරුවෝද, සේනාවන්හි වූවෝද, රථිකයෝද, පාබලසේනාවෝද යන ඔහු අනුව ජීවත්වන්නාහු ඔහුට බුහුමන් කටයුතුයයි නොහඟිත්.

9 "මනාව විධාන නොකරණලද කර්මාන්ත ඇති අඥානවූ නපුරු මන්ත්‍රණ ඇති මන්ත්‍රීන්ගෙන් යුක්තවූ නුවණ නැති ඔහු සර්පතෙම දිරාගිය හැව දමන්නාක් මෙන් ලක්ෂ්මී තොමෝ හැර දමයි.

10 "මනාව විධාන කරණ ලද කර්මාන්ත ඇති සුදුසු කල්හි වීර්‍ය්‍ය කරණ සුළුවූ අනලස්වූ රජුට සියලු සම්පත් වෘෂභයා සහිත ගවයන් මෙන් අභිමුඛ වෙමින් වැඩෙත්.

11 "මහරජ, රටෙහිද, දනව්වෙහිද, පැවතුම් ඇසීමෙහි හැසිරෙව, එහි දැකද අසාද, ඉන්පසු එය පිළිපදින්නෙහියයි (රුක් දෙවියා අවවාද කෙළේය.)

12 "යම්සේ අද මම කටුවකින් මිදුනා ලද්දේ දුක් විඳිම්ද, මෙසේ පඤ්චාල රජතෙම යුද්ධ භූමියෙහි හීයෙන් විදුනා ලද්දේ දුක් විඳියි (එක්තරා ගම්වැසි මහළු මිනිහෙක් කීයේය.)

13 "එම්බා මහළු පුරුෂය, නුඹ ජරාවට පැමිණියේ දුර්වලවූ ඇස් ඇත්තෙහිය. රූපය මනාකොට නොදක්නෙහිය. කටුවක් හැනුනේය යන ඒ යමක් වේද, එහි බඹදත් රජුගේ කිනම් දෝෂයක්දැයි පුරෝහිත තෙම ඇසීය.

14 "බ්‍රාහ්මණය, යම්බඳුවූ මම කටු ඇති මාර්ගයෙහි කටු ඇනුනෙම්ද, මෙහි එබඳුවූ බඹදත් රජහුගේ බොහෝවූ දෝෂයෝ වෙත්. නොරක්නාලද ජනපදයෝ වෙත්. අධාර්මික අයබදු ගැණීමෙන් නසන ලද්දාහුය.

15 "රාත්‍රි කාලයෙහිද සොරු පැහැර ගණිත්. දහවල් අධර්මයෙන් අයබදු ගන්නෝ පැහැර ගණිත්. පව්ටු රජහුගේ රටෙහි අධාර්මික ජනතෙම බහුලවේ.

16 "පියාණෙනි, මෙබඳු භය ඇතිකල්හි භයින් පීඩිතවූ මිනිස්සු කටුගෙණවුත් දොරටු අවුරා ගෙවල්හැර ගොස් වනයෙහි සැඟවිය යුතු තැන් සාදාගනිත්යයි (මහළු මිනිසා කීයේය.)

17 "යම් රජෙකුගේ රටෙහි ස්වාමීයන් නැත්තාවූ තරුණියෝ මහළු බවට යෙද්ද, ඒ මේ බ්‍රහ්මදත්ත රජ තෙම කවර කලෙක්හි

නම් මැරෙන්නේදැයි (එක්තරා දිළිඳු ස්ත්‍රියක් නින්දා කරමින් කීවාය.)

18 "අනර්ථ පද කීමෙහි දක්ෂවූ ජඩතැනැත්තිය, තී විසින් නපුරක්ම කියනලදී. කොතැන්හි රජතෙම දැරියන්ට ස්වාමියෙකු සොයාදැයි (පුරෝහිතයා ඇසීය.)

19 "බ්‍රාහ්මණය, මා විසින් නපුරක් නොකියන ලදී. මම අර්ථ පද කීමෙහි දක්ෂවෙමි. මේ රජ විසින් දනව් වැස්සෝ නොරක්නා ලද්දාහුය. අධර්මවූ අයබදු ගැනීමෙන් නසන ලද්දාහුය.

20 "රාත්‍රියෙහිද සොරු පැහැර ගනිත්. දාවල් අධර්මයෙන් අයබදු ගන්නෝ පැහැර ගණිත්. පව්ටු රජහුගේ රටෙහි අධාර්මික ජනයා බහුලවේ. දුකසේ ජීවිකාව කරන්නාවූ භාර්‍ය්‍යාවත් දුකසේ පෝෂණය කරන්නාවූ රටෙහි ළදැරියෝ කොයින් ස්වාමියෙකු ලබන්නාහුදැයි (මහළු ස්ත්‍රී කීවාය.)

21 "යම්සේ මේ සාළිය නම් ගවතෙම සීවැලින් හැනුනේ බැගෑපත්ව සයනය කෙරේද, මෙපරිද්දෙන්ම පඤ්චාල රජතෙම යුද්ධ භූමියෙහි හෙල්ලකින් අනින ලද්දේ සයනය කෙරේවායි (ගොවියෙක් ආක්‍රොශ කෙළේය.)

22 "ජඩවූ කර්ෂකය, යම්බඳුවූ තෝ තුමූම අපරාධය කොට රජුට ශාප කරන්නෙහිද, එබඳුවූ තෝ බ්‍රහ්මදත්ත රජුට නිකරුනේ කිපුනෙහියයි (පුරෝහිතයා කීයේය.)

23 "බ්‍රාහ්මණය, මම බඹදත් රජුට කරුණු ඇතිව කිපුනෙමි. රජු විසින් දනව් වැස්සෝ නොරක්නා ලද්දාහ. අධර්මය අයබදු ගැණීමෙන් පෙළන ලද්දාහ.

24 "රාත්‍රියෙහිද සොරු පැහැර ගනිත්. දාවල් අධර්මයෙන් අයබදු ගන්නෝ පැහැර ගනිත්. පව්ටු රජහුගේ රාජ්‍යයෙහි අධාර්මික ජනයා බහුලවේ.

25 "ඒ මාගේ භාර්‍ය්‍යා තොමෝ දෙවනු පියන ලද්දීයයි සිතමි, එහෙයින් විකාලයෙහි බත් ගෙණායේය. බත් ගෙනෙන තැනැත්තිය අපේක්ෂා කරමින් කෙව්ටි කෙළෙමි. එහෙයින් සාලිය නම් මේ ගවතෙම සී වැලින් හැනුනේයයි ගොවියා කීයේය,

26 "යම්සේ අද මම දෙන විසින් පහරණ ලද්දෙම් මාගේ කිරි භාජනයත් පෙරලන ලදද මෙසේම පඤ්චාල රජතෙම යුද්ධ භූමියෙහි කඩුවෙන් ගසන ලද්දේ නැසේවායි (ගොපලුතෙම කීයේය.)

27 "දෙන කිරි භාජනය පෙරලුවේය. ගොපොල්ලාටද හිංසා කෙළේය. යන යමක් ඇද්ද, පින්වතා අපගේ රජුට යම්හෙයකින් නින්දා කෙළේද, එහි බඹදත් රජහුගේ කිනම් දෝෂයෙක්දැයි බමුණු ඇසීය.

28 "බ්‍රාහ්මණය, පඤ්චාල රජතෙම ගැරහිය යුත්තෙක බඹදත් රජහුගේ දනව් වැස්සෝ නොරක්නා ලද්දාහ. අධර්ම අයබදු ගැණීමෙන් පෙළන ලද්දාහ.

29 "රාත්‍රියෙහිද සොරු ධනය පැහැර ගණිත්. දාවල් අධර්මයෙන් අයබදු ගන්නෝ පැහැර ගණිත්. පව්ටු රජහුගේ රාජ්‍යයෙහි අධාර්මික ජනයා බහුලවේ.

30 "චණ්ඩවූ පැනදුවන්නාවූ මේ දෙන පෙර යම්හෙයකින් නොදෙවීමද අද දැන් කිරි කැමැත්තවුන් විසින් උපද්‍රැත හෙයින් ඇය දෙවීමුයි ගොපොල්ලා කීයේය.

31 "යම්සේ බැගෑපත්වූ මේ දෙන පුත්‍රයා නැත්තී වැළපෙමින් ඔබිමොබ දුවයිද, එසේම පඤ්චාල රජතෙම පුත්‍රයන් නැත්තේ හඬාවා පුත්‍රයන් නැතිව වියලේවායි (ගම් දරුවෝ කීහ.)

32 "දරුවෙනි, ගවයා නම් රක්නාවූ ගවපාලයාටම දුවන්නේය. කෝපව තණ නොකෑම හෝ කරනේය යන යමක්වේද, මෙහි බඹදත් රජහුගේ කවරනම් අපරාධයක් ඇත්තේදැයි (පුරෝහිතයා ඇසීය.)

33 "මහාබ්‍රාහ්මණය, බඹදත් රජහුගේ අපරාධයවේ. රජුවිසින් දනව්වැස්සෝ නොරක්නා ලද්දාහ. අධර්ම අයබදු ගැණීමෙන් පෙළන ලද්දාහ.

34 "රාත්‍රියෙහිද සොරු ධනය පැහැර ගනිත් දාවල් අධර්මයෙන් අයබදු ගන්නෝ පැහැර ගනිත්, පව්ටු රජහුගේ

රාජ්‍යයෙහි අධාර්මික ජනයා බහුලවේ. කෙසේ නම් කඩු කොපුව පිණිස කිරිබොන වස්සෝ මරණු ලබත් දැයි (ගම් දරුවෝ කීහ)

35 "යම්සේ අද වනයෙහි උපන් මම ගමෙහි වසන්නාවූ කව්ඩන් විසින් කනු ලබම්ද, මෙසේ පඤ්චාල රජතෙම පුත්‍රයන් සහිතව යුද්ධයෙහි නසන ලද්දේ කනු ලබාවායි මැඩියා කීයේය.

36 "එම්බා මණ්ඩූකය මනුෂ්‍යලෝකයෙහි රජවරු සියලු සතුන් කෙරෙහි ආරක්ෂාව නොපිහිටුවත්, තා වැනි ජීවත් වන්නෙකු කපුටෝ කන්නාහුය යන යමක්වේද, මෙතෙකින් රජතෙම අධාර්මික නොවේයයි පුරෝහිත බමුණා කීයේය.

37 "බ්‍රාහ්මණතෙමේ, ඒකාන්තයෙන් අධර්ම ස්වභාව ඇත්තෙක. රජහුගේ කැමැත්ත අනුව කියන්නෙහිය. බොහෝ සතුන් විනාශ කරණු ලබන කල්හි අතිශයින් දොස් කියයුතු රජ පුදන්නෙහිය.

38 "බ්‍රාහ්මණය, ඉදින් මේ රට සමෘද්ධවූ සතුටු වන්නාවූ විශෙෂයෙන් ප්‍රසන්නවූ ජනයා ඇති යහපත් රාජ්‍යයක් වන්නේ නම් කව්ඩෝ පූජාවවූ අග්‍රපිණ්ඩය අනුභව කොට වාසය කෙරෙත්, මා වැනි ජීවත් වන්නෙකු කව්ඩෝ නො කන්නාහුයයි (රුක්දෙවියාගේ ආනුභාවයෙන් මැඩියා කීයේය.")

---

## චත්තාළීස නිපාතය.

**520 තෙසකුණ ජාතකයඃ-** 1 "වෙස්සන්තර නම් පක්ෂිය තා විචාරමි. තට යහපතක් වේවා. රාජ්‍යය කරවනු කැමැත්තහු විසින් කවරනම් කටයුත්තක් කරණ ලද්දේ උතුම්වේදැයි රජතෙම ඇසීය.

2 "පියවූ කංස නම් බරණැස් රජතෙම බොහෝකලක් ප්‍රමාදවූයේ පෝෂ්‍ය කළාවූ පියතෙම අප්‍රමාදවූද පුත්‍රවූ මා ප්‍රශ්නයක් විචාළේයයි (වෙස්සන්තර නම් බකමූණු පක්ෂියා කීයේය.)

3 "පියරජුනි, රජතෙමේ පළමුවෙන්ම මුසාවාදයද දෙවනුව ක්‍රොධයද තුන්වෙනුව හාස්‍යයද හෙවත් ක්‍රීඩාසීලි භාවයද දුරුකරන්නේය. ඉන්පසු රාජ කෘත්‍යයන් කරවන්නේය. එය රජුන්ගේ වෘත්තයයි පුරාතනයෝ කීහු.

4 "පියාණෙනි, පෙර කරණලද්දාවූ යම් කර්මයක් නිසැකයෙන් ඔබ තැවෙන්නේද, රාගයෙන් රත්වූයේද ද්වෙෂයෙන් දූෂිතවූයේද, යම් කර්මයක් කෙළේනම් ඉන්පසු නැවත ඒ කර්මය නොකරන්නේය.

5 "මහරජ ප්‍රමාදවූ රජහුගේ රාජ්‍යයෙහි සියලු සම්පත් විනාශ වෙත්. රජහුට එය දුකයයි කියනු ලැබේ.

6 "පියාණෙනි, ශ්‍රී කාන්තාවද කාලකන්නීද යන දෙදෙනා විචාරණ ලද්දාහු මෙය කීහ. ඔවුන්ගෙන් ශ්‍රී තොමෝ උට්ඨාන වීර්‍ය්‍ය ඇති අනුන්ට ඊර්ෂ්‍යා නොකරන්නාවූ පුරුෂයා කෙරෙහි මම සිත් අලවන්නෙමියි කීවාය.

7 "මහරජ, සම්පත්ති චක්‍රය බිඳින්නාවූ කාලකන්නි තොමෝ අනුන්ට ඊර්ෂ්‍යා කරන්නාවූ නපුරු සිත් ඇත්තාවූ යහපත් කර්මයන් දූෂ්‍ය කරන්නාවූ පුරුෂයා කෙරෙහි සිත් අලවයි.

8 "මහරජ, ඒ නුඹ සියල්ලන් කෙරෙහි හොඳ හිත් ඇත්තෙක් වෙව, සියල්ලන් රකින්නෙක් වෙව, කාලකන්නිය දුරුකරව. ශ්‍රී කාන්තාවට වාසස්ථාන වෙව,

9 "කශීරටට අධිපතිවූ මහරජ, ලක්ෂමී සහිතවූ ධෛර්‍ය්‍යයෙන් යුක්තවූ මහත් බවට පැමිණියාවූ පුරුෂතෙම වනාහි සතුරන්ගේ මුලද අගද සිඳියි.

10 "මහරජ, ශක්‍රතෙමේද වනාහි උට්ඨාන වීර්‍ය්‍යයෙහි ප්‍රමාද නොවේ. ඒ දෙව් රජතෙම කුශල කර්මයෙහිම ධෛර්‍ය්‍ය කොට අප්‍රමාදව උට්ඨාන වීර්‍ය්‍යයෙහි සිත උපදවයි.

11 "ගන්ධර්වයෝද බ්‍රහ්මයෝද දෙවියෝද යන මොවුහු එබඳු සක්දෙව් රජුට සමාන ජීවිකා ඇත්තෝ වෙත්. උට්ඨාන වීර්‍ය්‍ය ඇත්තාවූ ප්‍රමාද නොවන්නාවූ ඔහුට දේවතාවෝ අනුව පවතිත්.

12 "පියාණෙනි, ඒ නුඹ අප්‍රමාදව ක්‍රොධ නැතුව කටයුතු කරව, රාජකෘත්‍යයන්හි උත්සාහද කරව, අලස තැනැත්තේ සැපය නොලබයි.

13 "මහරජ, ඒ මා කී ප්‍රශ්නයෙහිම ඒ වෘත්ත පදයෝ වෙත්. මෝතොමෝ අනුශාසනාව වේ. මිත්‍රයන් සුවපත් කරන්ටද සතුරන්ට දුක් වීමටද මෙය සමර්ථවේයයි වෙස්සන්තරතෙම කීයේය.

14 "ඛත්ත නම් තැනැත්තහුට නෑවූ කුණ්ඩලිණිය මා විසින් විචාරණ ලද ප්‍රශ්නය කියන්ට හැක්කේයයි හගින්නෙහිද, රාජ්‍යය කරවනු කැමැත්තහු විසින් කවර නම් කටයුත්තක් කරණලද්දේ උතුම්වේදැයි රජතෙම ඇසීය.

15 "පියාණෙනි, යම් පද දෙකක සියලු අර්ථ සමූහය පිහිටියේ ඒ මේ කරුණු පද දෙකක්ම වෙත්. නොලබන ලද්දහුගේ යම් ලාභයක් වේනම් එයද ලදදෙය රැකගැණීමද යන දෙකයි.

16 "පියාණෙනි, දූ කෙළියෙහි නොයෙදෙන්නාවූ කෛරාටික නොවූ සුරාසොඬ නොවූ ඔබ සතු ධනය නොනසන්නාවූ අර්ථයට දක්ෂවූ ප්‍රාඥවූ ඇමතියන් භාණ්ඩාගාරිකාදී කටයුතුවල යෙදියයුතු බව දැනගණුව.

17 "පියාණෙනි, ඔබගේ යම් ධනයකුත් වන්නේ නම්, යම් ඇමතියෙක් එය රක්නේද, රථය සංග්‍රහ කරන්නාවූ සාරථියෙකු වැනිවූ හෙතෙම ඔබගේ කටයුතුවල යෙදවීම කරව.

18 "මොනවට සංග්‍රහ කරණලද ඇතුලත්හිවූ ජනයා ඇතුව තෙමේ වස්තුව කියා තැන්පත් කිරීමද ණය දීමද කරව, අනුන් ලවා නොකරව.

19 "අය වැය දෙක තෙමේ දැනගන්නේය. කළ නොකළ දෙය තෙමෙ දැන ගන්නේය. නිග්‍රහ කටයුත්තට නිග්‍රහ කරන්නේය. උපකාර කළයුත්තාට උපකාර කරන්නේය.

20 "මහරජ, ඒ ඒ තන්හි යෙදුනාවූ අධාර්මිකවූ ඔව්හු ධනයද රටද නොනසත්වායි දනව් වැස්සන්ට තෙමේ අර්ථයෙන් අනුශාසනා කරව.

21 "වහා කටයුතු කරන්නෙක් නොවෙව, අනුන් ලවා කරවන්නෙක් හෝ නොවෙව, වහා කරණලද කටයුතු ඇති අඥානතෙමේ පසුතැවිල්ලට පැමිණේ.

22 "පියාණෙනි, ඔබගේ සිත කුශලය ඉක්මවා යන කල්හි අනුන්ගේ අකුශල කර්මයෙහි ඉතා දැඩිව කෝපයට පැමිණෙන ලදුව කටයුතු නොකරව, ක්‍රෝධයෙන් වනාහි බොහෝ සමෘද්ධවූ කුලයෝ අකුල බවට පැමිණියාහුය.

23 "පියාණෙනි, මම අධිපතිවෙමියි අනුන් අනර්ථයට නොබස්වව, ඔබගේ රාජ්‍යයෙහි ස්ත්‍රීන්ටද පුරුෂයන්ටද දුක් ඉපදීමක් නොවේවා

24 "පහවූ ලොමු ඩැහැගැනුම් ඇති කැමති පරිදි හැසිරෙන්නාවූ රජුගේ රාජ්‍යයෙහි සියලු සම්පත් විනාශවෙත්. රජහුට එය දුකයයි කියනු ලැබේ.

25 "මහරජ, ඔබගේ ඒ ප්‍රශ්නයෙහිම ව්‍රත පදයෝ ඇතුළත් වෙත්. මේ මා විසින් කියන ලද්දීම අනුශාසනාව වේ. දැන් සුරාසොඬ නොවූ ධන විනාශ නොකරන්නාවූ පිං කරන්නාවූ දක්ෂයක් වෙව, සිල්වතෙක් වෙව, මහරජ, දුශ්ශීලයා වනාහි නිරයෙහි වැටෙන්නේ වේයයි කුණ්ඩලිණී කීවාය.

26 "පුත ජමබුකය, තොපගේ කෝශිය ගෝත්‍ර ඇති වෙස්සන්තර නම් සහෝදරයාද එසේම කුණ්ඩලිණී නම් සහෝදරියද රාජ ධර්මය විචාළෙමු. දැන් නුඹ බලයන්ගෙන් උතුම්වූ බලය කවරේද කියවයි. (රජතෙම ජම්බුක නම් ගිරවා ගෙන් ඇසීය.)

27 "මහරජ, මේ ලෝකයෙහි මහත්වූ අදහස් ඇති පුරුෂයා කෙරෙහි පස් වැදැරුම්වූ බලයක්වේ. ඔවුන් අතුරෙන් කාය බලය නම් ලාමකවූ බලයයි කියනු ලැබේ.

28 "දීර්ඝායුෂ ඇත්ත සම්පත් බලයද දෙවෙනි බලයයි කියනු ලැබේ දීර්ඝායු ඇත්ත අමාත්‍ය බලයද තුන්වෙනි බලයයි කියනු ලැබේ. ඒ ජාති සම්පත්තියෙන් ඇතිවූ බලයද නිසැකයෙන් සතරවෙනි බලය වේ.

29 "යම් ඒ බල කෙනෙක් වෙද්ද, ඒ සියලු බලයන්ම පණ්ඩිතතෙම යටපත් කෙරේ.

30 "බලයන් අතුරෙන් ශ්‍රෙෂ්ඨ බලයක්වූ අග්‍රවූ ඒ ප්‍රඥා බලය උතුම්වේ. ප්‍රඥා බලයෙන් යුක්තවූ පණ්ඩිතතෙම අභිවෘද්ධියට පැමිණේ.

31 "ඉදින් මඳ නුවණැත්තේ සම්පත්තියෙන් පිරුණාවූ උතුම්වූ පෘථිවිය ලබාද මොහුගේ නොකැමැත්තෙන් හෝ බලාත්කාරකමින් හෝ අන් ප්‍රඥා ඇත්තෙක් එය පිළිපදියි.

32 "කශීරටට අධිපතිය, ඉදින් විශිෂ්ට ජාති ඇත්තේද ක්ෂත්‍රිය තෙම රාජ්‍යය ලැබ සිටියේ නමුත් දුෂ්ප්‍රාඥවූයේ නම් සියලු රාජ්‍යය සමගම ජීවත් නොවේ.

33 "ප්‍රඥාව අසන ලද දෙය විදින්නිවේ. ප්‍රඥාතොමෝ කීර්ති ඝෝෂාව හා ලාභසත්කාරය වඩන්නීවේ. ප්‍රඥාවෙන් යුක්තවූ මනුෂ්‍යතෙම මේ ලෝකයෙහි දුක්ඇතිවූ කල්හිද සැප ලබයි.

34 "ප්‍රඥාවද වනාහි කිසිවෙක් ඇහුම්කන් නොදී බහුශ්‍රැතයෙකු කරා නොපැමිණ දැහැමි කරුණු විනිශ්චය නොකර නොලබයි.

35 "කුශල ධර්ම විභාග දන්නාවූ සුදුසු කාලයෙහි උත්සාහ කරන්නාවූ අනලස්වූ යමෙක් ඒ ඒ කාලයෙහි ඒ ඒ කටයුත්ත කෙරේද, ඒ පුද්ගලයාගේ කර්ම ඵලය සමෘද්ධවේ.

36 "ලාභාදීන්ට උත්පත්තිස්ථානවූ සිල් ඇත්තාවූ දුශ්ශීල පුද්ගලයන් සේවනය කරන්නාවූ කලකිරී කටයුතු කිරීම ඇත්තාවූ පුද්ගලයාගේ කර්මවල අර්ථය මනාකොට විපාක නොදේ.

37 "තමාකෙරෙහිද අනිත්‍ය භාවනාදී වශයෙන් යෙදුනාවූ එසේම සීලවන්ත පුද්ගලයන් සේවනය කරන්නාවූ නොකලකිරී කටයුතු කරන්නාවූ පුද්ගලයාගේ අර්ථයතෙම මනාකොට විපාකදේ.

38 "යෙදියයුතු කරුණෙහි යෙදීම නම්වූ ප්‍රඥාවද රැස් කරණලද ධනය රක්ෂා කරන්නාවූ ප්‍රඥාවද යන දෙකද පළමු

ප්‍රඥාවන්ද පියාණෙනි, නුඹසේවනය කරව, නිකරුනේ ධනය නොනසව, නුසුදුසු කටයුතු කිරීමෙන්ද නුවණ නැති පුද්ගලතෙම හුනගසින් කළ ගෙයක් දිරා වැටෙන්නාක් මෙන් ගැලේයයි ජම්බුකතෙම කීයේය.

39 "ක්ෂත්‍රියවූ මහරජ, මව්පියන් කෙරෙහි මාතෘපිතෘ උපස්ථාන නම්වූ ධර්මයෙහි හැසිරෙව, මහරජ, මෙලොව ධර්මයෙහි හැසිර මරණින් මතු ස්වර්ගයට පැමිණෙව,

40 "ක්ෂත්‍රියවූ මහරජ, අඹු දරුවන් කෙරෙහි දැහැමින් හැසිරෙව, මහරජ, මෙලොව දැහැමින් හැසිර මතු දෙව්ලොවට යව,

41 "ක්ෂත්‍රියවූ මහරජ, මිත්‍රාමාත්‍යයන් කෙරෙහි දැහැමින් හැසිරෙව, මහරජ, මෙලොව දැහැමින් හැසිර පරලොව ස්වර්ගයට යව,

42 "මහරජ, වාහණයන් කෙරෙහිද බල සෙනග කෙරෙහිද දැහැමින් හැසිරෙව, මහරජ, මෙලොව දැහැමින් හැසිර පරලොව ස්වර්ගයට යව,

43 "මහරජ, ගම්වැස්සන් කෙරෙහිද නියම් ගම්වැස්සන් කෙරෙහිද දැහැමින් හැසිරෙව, මහරජ, මෙලොව දැහැමින් හැසිර පරලොව ස්වර්ගයට යව,

44 "මහරජ, රටවැස්සන් කෙරෙහිද, දනව් වැස්සන් කෙරෙහිද, දැහැමින් හැසිරෙව, මහරජ, මෙලොව දැහැමින් හැසිර මරණින් මතු ස්වර්ගයට යව.

45 "මහරජ, මහණ බමුණන් කෙරෙහිද දැහැමින් හැසිරෙව, මහරජ, මෙලොව දැහැමින් හැසිර මරණින් මතු දෙව්ලොවට යව,

46 "ක්ෂත්‍රියවූ මහරජ, යාග පක්ෂීන් කෙරෙහිද දැහැමින් හැසිරෙව, මහරජ මෙලොව දැහැමින් හැසිර මරණින් මතු දෙව්ලොවට යව.

47 "මහරජ, කුශල ධර්මයෙහි හැසිරෙව, පුරුදුකරණලද ධර්මයතෙම සැපගෙණ දෙන්නේ වෙයි. මහරජ මෙලොව ධර්මයෙහි හැසිර පරලොව දෙව්ලොවට පැමිණෙව.

48 "මහරජ, කුශල ධර්මයෙහි හැසිරෙව. ශක්‍රයා සහිතවූ බ්‍රහ්මයා සහිතවූ දෙවියෝ මනාව පුරුදුකරණලද කුශල ධර්මයෙන් දෙව්ලොවට පැමිණියාහුය. එහෙයින් මහරජ, ධර්මයෙහි ප්‍රමාද නොවෙවයි (රජුට අවවාද කෙළේය)

49 'ඒ ප්‍රශ්නයෙහිම ඒ ව්‍රත පදයෝ ඇතුළත් වෙත්. මෝතොමෝම අනුශාසනාවවේ. ප්‍රඥා සහිත පුද්ගලයන් සේවනය කරන්නාවූ යහපත් ගුණයෙන් යුක්තව ඒ සියල්ල තෙමේ දැනගෙණ අනුශාසනා පරිද්දෙන් පිළිපදුවයි" (නැවතද අවවාද කෙළේය.)

**521 සරභංග ජාතකයඃ-** 1 "අලංකාරයෙන් සැරසුනා වූ පැළඳි කුණ්ඩලාභරණ ඇත්තාවූ හඳනාලද මනා වස්ත්‍ර ඇත්තාවූ වෛඩූර්‍ය්‍ය මැණික්වලින්ද මුතුවලින්ද සැරසූමිට ඇති කඩුවලින් යුක්තවූ රථෛශ්වරවූ ඔබ මෙහි සිටින්නහුය. ඒ ඔබ කවරහුද, මනුෂ්‍ය ලෝකයෙහි ඔබ කෙසේනම් හඳුනත්දැයි (අනුශිෂ්‍ය නම් තාපසතෙම ඇසූයේය.)

2 "මම අට්ඨක නම් වෙමි. මෙතෙම වනාහි භීමරථ නම් වේ. ප්‍රකටවූ මෙතෙම වනාහි කාලිංග රාජ නම්වේ. ස්වාමීනි, අපි මනාව සංයමවූ ඍෂීන් දැකීම පිණිස මෙහි පැමිණියෙමු. සරභංග ශාස්තෘවරයාගෙන් ප්‍රශ්න අසන්ට ආයෙමුයි (ඒ රජවරු කීහ.)

3 "අන්තරීක්ෂ නම්වූ අහසෙහි පසළොස්වක්හි අහස් මැදට පැමිණි චන්ද්‍රයා මෙන් සිටින්නෙහිය. මහත් ආනුභාව ඇති යක්ෂය, ඔබ විචාරමි. මනුෂ්‍ය ලෝකයෙහි ඔබ කෙසේ හඳුනත්දැයි (තාපසතෙම ඇසීය.)

4 "දෙවියන් අතර සුජම්පතීයයි යමෙකුට කියද්ද, මනුෂ්‍ය ලෝකයෙහි මඝවන්තුයයි ඔහුට කියත්. ඒ සක්දෙව් රජවූ මම මනා සංයම ඇත්තාවූ ඍෂීන් දැකීම පිණිස අද මෙතනට පැමිණියේ වෙමියි ශක්‍රතෙම කීයේය.

5 "ස්වාමීනි, දුරසිට අප විසින් මහත් ආනුභාව ඇත්තාවූ ඍද්ධිගුණ වලින් යුක්තවූ ඍෂිවරු රැස්වූවාහුයයි අසන ලද්දාහ.

ස්වාමීනි, මේ මනුෂ්‍ය ලෝකයෙහි මනුෂ්‍යයන් අතර ශ්‍රේෂ්ඨවූ යම් තාපස කෙනෙක් වෙද්ද, ප්‍රසන්න සිත් ඇත්තෙම් ඒ තාපසවරුන් වඳිමියි (ශක්‍රතෙම කීයේය.)

6 "දහසක් නුවණැස් ඇති දිව්‍යරාජය, පැවිදිවූ බොහෝ කල් ඇති තාපසවරුන්ගේ ශරීරයෙන් පිටවූ ගන්ධය සුළඟින් හමායයි. එබැවින් මෙතැනින් ඉවත්වෙව, දිව්‍යරාජය, ඍෂීන්ගේ ගන්ධය, අපවිත්‍රවේයයි තාපසතෙම කීයේය.

7 "ස්වාමීනි, පැවිදිව බොහෝකල්වූ තාපස වරුන්ගේ කයින් ගිලිහුණු ගන්ධය සුලඟින් හමායේවා. මනා සුවඳ ඇත්තාවූ විසිතුරු මවක් මෙන්ද මල්මාලාවක් මෙන්ද අපි මේ ගන්ධය කැමැත්තෙමු. මේ ගන්ධයෙහි දෙවියෝ පිළිකුල් සංඥා ඇත්තෝ නොවෙත්යයි ශක්‍රතෙම කීයේය.

8 "පළමුව දානය දුන් බැවින් පුරින්දද නම්වූ භූතයන් අතර ජ්‍යෙෂ්ඨ බැවින් භූතපති නම්වූ පිරිවර සම්පත් ඇති හෙයින් යශස්සී නම්වූ දෙවියන්ට අධිපතිහෙයින් දේවානමින්ද නම්වූ පෙර ජාති වශයෙන් මඝ නම් ඇත්තාවූ සුජාතා නම් අසුර කන්‍යාවගේ ස්වාමි බැවින් සුජම්පතී නම්වූ දෙවියන්ගේ සිත් අලවන බැවින් දේවරාජ නම්වූ අසුර සමූහයා මඩින්නාවූ ඒ ශක්‍රතෙම ප්‍රශ්න අසන්ට අවකාශ බලාපොරොත්තු වෙමුයි

9 "මෙහි උන්නාවූ මේ පණ්ඩිතයන් අතුරෙන් කවරෙක් නම් රජවරු තුන්දෙනාගේද සක් දෙව් රජහුගේද සියුම්වූ ප්‍රශ්න අසනලද්දේ ප්‍රකාශ කරන්නේදැයි (අනුශිෂ්‍ය නම් තාපසතෙම ඇසීය.)

10 "යශ පිරිවර ඇත්තාවූ උපන් කාලයෙහි පටන් මෙවුන් දමින් වැළකුණාවූ රජහුගේ ආචාර්‍ය්‍ය පුරෝහිත බ්‍රාහ්මණයාගේ පුත්‍රවූ මනා හික්මුණු ස්වභාව ඇති ශරභංග නම් මේ යම් ඍෂිවරයෙක්වේද, හෙතෙම ඔවුන්ගේ ප්‍රශ්න විසඳන්නේයයි (ඍෂි සමූහයා කීයේය.)

11 "කොණ්ඩඤ්ඤ ගොත්‍ර ඇති ඍෂීන්වහන්ස, ප්‍රශ්න විසඳනු මැනව. යහපත් ස්වභාව ඇත්තාවූ ඍෂීහු ඔබට යාඥා

කරත්. කොණ්ඩඤ්ඤතුමනි, මේ ප්‍රශ්න විසඳීමෙහිවූ බර නුවණින් වැඩසිටියහුට පැමිණෙයි යන යමක් වේද මෙතෙම මිනිසුන් අතර ස්වභාව ධර්මයවේයයි (අනුශිෂ්‍යතෙම කීයේය.

12 "පින්වත්නි, කරණලද අවකාශ ඇත්තෝ යම්කිසි ප්‍රශ්නයක් සිතින් කැමතිවනලද නම් එය විචාරත්වා. මම වනාහි මෙලොවද තෙමේ නුවණින් දැන තොපට ඒ ඒ ප්‍රශ්නය කියන්නෙමියි (සරභංග තාපසතෙම කීයේය.

13 "ඉක්බිති අර්ථ දක්නාසුළුවූ පෙරටුව දන් දුන්හෙයින් පුරින්දදවූ මඝවන්තු නම් ශක්‍රතෙම යමක් සිතින් කැමතිවන ලද්දේවීද, ඒ පළමුවන ප්‍රශ්නය විචාළේය.

14 "කොණ්ඩඤ්ඤ ගොත්‍ර ඇත්තාවූ ඍෂින්වහන්ස, කුමක් විනාශකොට කිසිකලෙකත් ශොක නොකෙරේද, කවරක්හුගේ දුරුකිරීම ඍෂීහු වර්ණනා කෙරෙද්ද, මේ ලෝකයෙහි කවරක්හු කියනලද ඵරුෂවචනය ඉවසන්නේද, යන මේ කරුණු තුන මට කියවයි (ශක්‍රතෙම ප්‍රශ්න ඇසීය.)

15 "ක්‍රොධය නසා කිසිකලෙකත් ශොක නොකරයි. අකෘතඥභාවයයි කියනලද ගුණමකුබව දුරුකිරීම ඍෂිහු වර්ණනා කරත්. සියල්ලන්ගේම කියනලද ඵරුෂවචනය ඉවසන්නේය. මේ ඉවසීම උතුම්යයි සත්පුරුෂයෝ කියත් යයි කීයේය.

16 "කොණ්ඩඤ්ඤ තුමනි, සමානවූවහුගේද ඉතා ශ්‍රෙෂ්ඨවූවහුගේද, යන දෙදෙනාගේ වචනය ඉවසන්ට හැකි වේ. කෙසේ නම් හීනයාගේ වචනය ඉවසන්නේද, මෙ කාරණය මට කියව.

17 "භයින් වනාහි ශ්‍රෙෂ්ඨයාගේ වචනය ඉවසන්නේය. කරණොත්තරිය කරණය හේතුකොටගෙණ සමාණවූවහුගේ වචනය ඉවසන්නේය. මේ ලෝකයෙහි යමෙක්තෙම හීනයා ගේ වචනය ඉවසන්නේද, මේ ඉවසීම උතුම්යයි සත්පුරුෂයෝ කියත්යයි කීයේය.

18 "සතර ඉරියව්වෙන් වැසුනු ස්වභාව ඇත්තහු ශ්‍රෙෂ්ඨයයිද සමානයයිද නොහොත් හීනයයිද කෙසේ නම් දැනගන්නේද,

ලාමක පුද්ගලයන්ගේ ස්වරූපයෙන් උතුම්ගුණ ඇති සත්පුරුෂයෝ හැසිරෙත්. එහෙයින්ම සියල්ලන්ගේ වචනය ඉවසන්නේයයි කීමු.

19 'ඉවසීම ඇත්තාවූ සත්පුරුෂතෙම යම් අර්ථයක් ලබන්නේද, යුද කරන්නාවූ රජුන් සහිත මහත්වූද සේනාව මෙබඳු අර්ථයක් නොලබන්නේය. ඉවසීමේ බලයෙන් වෛරයෝ සන්සිඳෙත්යයි කීයේය.

20 "නුඹවහන්සේගේ සුභාෂිතය අනුමෝදන්ව අන් ප්‍රශ්නයක් ඔබ විචාරමි. එබැවින් එය කියනු මැනව, දණ්ඩකී නම් රජද, නාලිකීර නම් රජද, අර්ජුන නම් රජද කලාබුනම් රජද යන මොව්හු යම්සේ වූවාහුද, ඍෂීන්ට වෙහෙස කළාවූ ඔව්හු කොතැනක උපන්නාහුද, අතිශයින් කරණලද පාපකර්ම ඇත්තාවූ ඔවුන්ගේ පරලොව ගමන කියනු මැනවයි ශක්‍රයා කීයේය.

21 "දණ්ඩකී නම් රජතෙම කිසවච්ඡ නම් තාපසයාට අවමන්කොට පිරිවර ජනයා සහිතව රට සහිතව සිඳිනලද මුල් ඇත්තේ හුණුඅළු නරකයෙහි පැසේ. ඔහුගේ ශරීරයෙහි ගිණිඅඟුරු වැටෙත්.

22 "යමෙක්තෙම සමිතපාපීවූ දූෂ්‍ය නොකළයුතුවූ බණ කියන්නාවූ සංයම ඇත්තාවූ තාපස ප්‍රව්‍රජිතයන් වෙහෙසුයේද, ඒ නාලිකීර රජහු පරලොව ශුනඛයෝ එක්ව සලමින් කඩකඩා කත්.

23 "තවද අර්ජුන නම් රජතෙම ඉවසීම ඇති බොහෝ කල් රක්නාලද බඹසර ඇති ගෞතම ගෝත්‍රයෙහිවූ අංගීරස නම් වූ තාපසයන්ට හිංසාකොට සත්තිශූල නම් නරකයෙහි හිස් යටිකුරුව උඩුකුරුවූ පා ඇත්තේ වැටුනේ වෙයි.

24 "යම් රජෙක් ක්ෂාන්තිය කියන්නාවූ සමිතපාපීවූ දූෂ්‍යනොකටයුතුවූ තාපසයා කඩ කඩ වශයෙන් සින්දේද, කළාබු නම් ඒ රජතෙම භයානකවූ කටුකවූ මහත් දුක් ඇත්තාවූ අවීචියෙහි ඉපිද පැසේ.

25 "ශක්‍ර දිව්‍ය රාජය, නුවණ ඇත්තේ මේ නරකයන්ද මෙයින් අන්‍යවූ ඉතා ලාමකවූ නරකයන්ද අසා දැන මෙහි මහණ බමුණන් කෙරෙහි දැහැමින් හැසිරෙන්නේය. මෙසේ කරන්නාවූ පුද්ගලතෙම දෙව්ලොවට පැමිණෙන්නේයයි ප්‍රකාශ කෙළේය.

26 "තාපසයන් වහන්ස, නුඹවහන්සේගේ සුභාෂිතය අනුමෝදන්ව අනික් ප්‍රශ්නයක් ඔබ විචාරමි. එබැවින් එය කියනු මැනව, කෙබඳුවූවහු සිල්වත්යයි කියද්ද, කෙබඳු වූවහු ප්‍රඥාවන්තයායයි කියද්ද. කෙබඳුවූවහු සත්පුරුෂයායයි කියද්ද, කෙබඳු පුද්ගලයෙකු සම්පත්ති තොමෝ අත් නොහරීදැයි (ශක්‍රයා ඇසූයේය.)

27 "මේ ලෝකයෙහි යමෙක් කයින්ද වචනයෙන්ද සිතින්ද සංයමවූයේ කිසි පාපයක් නොකෙරේද, තමා හේතුකොටගෙණද බොරුවක් නොකියාද, එබඳුවූවහු සිල්වතායයි කියත්

28 "ගැඹුරුවූ ප්‍රශ්නය සිතින් සිතමින් යමෙක් අතිශයින් අවැඩදායකවූ රෞද්‍රවූ කර්මය නොකෙරේද, සුදුසු කාලයට පැමිණියාවූ අර්ථපදය හෙවත් දානාදීවූ යහපත් කටයුත්ත නොපිරිහෙළාද, එබඳුවූවහු ප්‍රඥාවන්තයායයි කියත්.

29 "යම් ප්‍රාඥයෙක්තෙම කළගුණ දන්නේ කෘතොපකාර කරන්නේ කළණ මිතුරුවූයේ දෘඪභක්ති ඇත්තේ වේද, දුකට පැමිණියාවූ තම යහළුවාගේ කටයුත්ත සකස් කොට කෙරේද, එබඳු පුද්ගලයා සත්පුරුෂයායයි කියත්,

30 "මේ සියලු ගුණවලින් යුක්තවූ ශ්‍රද්ධා ඇත්තාවූ මෘදු වචන ඇත්තාවූ ශීලාදී සංවිභාගයන්හි ඇළුනාවූ යාචකයන්ගේ වචන දන්නාවූ යමෙක් වේද, සතර සංග්‍රහවස්තුවෙන් සංග්‍රහකරන්නාවූ මිහිරි වචන ඇත්තාවූ සිළුටු වචන ඇත්තාවූ එබඳු පුද්ගලයා සම්පත්තිතොමෝ අත් නොහරී යයි කීයේය.

31 "තාපසයන් වහන්ස, ඔබ වහන්සේගේ සුභාෂිතය අනුමෝදන්ව අන් ප්‍රශ්නයක් ඔබ විචාරමි. එබැවින් එය කියනු මැනව, ශීලයද සම්පත්තියද සත්පුරුෂ ධර්මයද ප්‍රඥාවද යන මොවුන්ගෙන් කවර ධර්මයක් ඉතා ශ්‍රේෂ්ඨයයි කියද්දැයි ශක්‍රතෙම ඇසුයේය.

32 "ශක්‍රය, මොවුන් අතුරෙන් ප්‍රඥාවම තාරකාවන්ට චන්ද්‍රයාමෙන් ශ්‍රෙෂ්ඨයයි බුද්ධාදීහු කියත්, ශීලයද, සම්පත්තියද සත්පුරුෂ ධර්මයද යන මොහු ප්‍රඥා ඇත්තහුට අනුව යන්නාහුවෙත්යයි කීයේය.

33 "තාපසයන් වහන්ස, ඔබවහන්සේගේ සුභාෂිතය අනුමෝදන්ව අන් ප්‍රශ්නයක් ඔබ විචාරමි. එබැවින් එය කියනු මැනව, කෙසේ කරන්නේ කිනම් කර්මයක් කරන්නේ කිමෙක හැසිරෙන්නේ කවරෙකු සේවනය කරන්නේ මේ ලෝකයෙහි ප්‍රඥාව ලබාද, දැන් ප්‍රඥාව ලැබීමට මාර්ගය කියනු මැනව, කෙසේ කරන්නාවූ මනුෂ්‍යතෙම ප්‍රඥාව ඇත්තේ වේදැයි ඇසුයේය.

34 "යමෙක් දක්ෂවූ බහුශ්‍රැතවූ නුවණින් වැඩිසිටියවුන් සේවනය කරන්නේද, ඉගෙණ ගන්නේ ප්‍රශ්න විචාරන්නෙක් වන්නේද, මනාව කියනලද වචනයන් සකස්කොට අසන්නේද, මෙසේ කරන්නාවූ මනුෂ්‍යතෙම ප්‍රඥාව ඇත්තෙක් වේ.

35 "ඒ ප්‍රඥාව ඇති තැනැත්තේ කාමසම්පත් අනිත්‍ය වශයෙන්ද දුක්වශයෙන්ද රෝගවශයෙන්ද බලයි. මෙසේ නුවණින් දක්නේ මහත් භය ඇත්තාවූ දුක් ඇත්තාවූ කාමයන්හි ආලය දුරු කරයි.

36 "ශක්‍රය පහවූ රාග ඇති ඒ පුද්ගලතෙම ද්වෙෂය දුරුකොට සියලු සත්වයන් කෙරෙහි දඬුබහා තබා අප්‍රමානවූ මෛත්‍රී සිතවඩන්නේය. හෙතෙම මෛත්‍රී ධ්‍යානය උපදවා නින්දා නොලබන ලද්දේ හෙවත් නොපිරිහුණු ධ්‍යාන ඇත්තේ බඹලොව උපදීයයි කීයේය.

37 "අට්ඨක නම් රජ ඔබගේද භීමරථ රජහුගේද ප්‍රසිද්ධවූ කළිඟු රජහුගේද මෙහි පැමිණීම මහත් සමෘද්ධි ඇත්තක්වූයේය. ඔබ සියල්ලන්ගේම කාම රාගයතෙම තදංග වශයෙන් ප්‍රහිණවූයේයයි තාපසතෙම කීයේය.

38 "පරසිත් දක්නා තාපසයන් වහන්ස, මෙය එසේ මැයි අප සියල්ලන්ගේ කාමරාගය තදංග වශයෙන් ප්‍රහීණ විය. අපට

අනුග්‍රහ පිණිස අවකාශ කරනු මැනව, ඔබ වහන්සේගේ නිෂ්පත්තිය යම්සේද, එබඳුවූ නිෂ්පත්තියට අපි පැමිණෙන්නෙමුයි රජවරු කීවාහුය.

39 "මහරජුනි, එසේ තොපගේ කාමරාගය ප්‍රහීණ වූයේද, එබැවින් තොපට අනුග්‍රහ පිණිස අවකාශ කරමි. මහත්වූ ධ්‍යාන ප්‍රීතියෙන් කය පිනවව්. මාගේ නිෂ්පත්තිය යම්සේද එබඳු නිෂ්පත්තියට පැමිණෙව්යයි තාපසතෙම කීයේය.

40 "මහත් ප්‍රඥා ඇති තාපසයන් වහන්ස, යම් යම් දෙයක් නුඹවහන්සේ කියන්නෙහි නම් නුඹ වහන්සේගේ ඒ සියලු අනුශාසනය කරන්නෙමුයි මහත්වූ ධ්‍යාන ප්‍රීතියෙන් කය පිනවමු. නුඹවහන්සේගේ නිෂ්පත්තිය යම්සේද එබඳු නිෂ්පත්තියට අපි පැමිණෙන්නෙමුයි රජවරු කීහ.

41 "පින්වත්නි, කිසවච්ඡ තාපසයන්ගේ යම් ආදාහණ පූජාවක් කරණ ලදී. යහපත් ස්වභාව ඇති ඍෂීහු මත තමන් වසන තැන්වලට යෙත්වා, හැමකල්හි එකග සිත් ඇත්තාහු ධ්‍යානයෙහි ඇලී වාසය කරව්. මේ ධ්‍යානයෙහි ඇලීම නම් ප්‍රව්‍රජිතයාහට උතුම්වේයයි සරභංග තාපස තෙම කීයේය.)

42 "පණ්ඩිතවූ ඍෂිහු විසින් මනාකොට කියනලද උත්තමාර්ථයන් ගෙන් යුක්තවූ ගාථාවන් අසා සතුටුවූ යශ පිරිවර ඇත්තාවූ ඒ දෙවියෝ අනුමෝදන් වෙමින් දෙව් ලොවට ගියාහුය.

44 "පණ්ඩිතවූ සරභංග ඍෂීහු විසින් උතුම් අර්ථයන් ගෙන් යුක්තවූ පිරිසිදු ව්‍යඤ්ජන ඇත්තාවූ මේ ගාථාවෝ මනාකොට කියන ලද්දාහ. යම් කිසිවෙක් මේ ගාථාවන් අර්ථවත් කොට හෙවත් මෙනෙහිකොට අසන්නේද, හෙතෙම පූර්වාපරධ්‍යාන විශෙෂය හෙවත් පූර්වාපර මාර්ග විශෙෂය ලබන්නේය. පූර්වාපර මාර්ග විශෙෂය ලබා මාරයා නොදැකීමට යන්නේයයි වදාළේය.

45 "එකල්හි සාලිස්සර නම් තවුස්තෙම දැන් ශාරීපුත්‍ර ස්ථවිර වූයේය. මෙණ්ඩිස්ස නම් තවුස්තෙම කාශ්‍යප ස්ථවිර වූයේය. පබ්බත නම් තවුස්තෙමේද අනුරුද්ධ ස්ථවිර වූයේය. දෙවලනම් තවුස් තෙමේද කච්චායන ස්ථවිර වූයේය.

46 "අනුසිස්ස නම් තවුස් තෙමේද ආනන්ද ස්ථවිර වූයේය. කිසවච්ඡ නම් තවුස් තෙමේද කෝලිත නම් වූයේය. නාරද නම් තවුස් තෙමේ මන්තානි පුත්‍රවූ පුණ්ණ නම් ස්ථවිර වූයේය. සෙසු පිරිස බුදුපිරිසවිය. සරභංග නම් බෝධිසත්ව තෙමේ දැන් බුදුවූ මම වෙමියි. ජාතකය මෙසේ දරාගනිව් යයි" වදාළේය.

**522 අලම්බුසා ජාතකයඃ-** 1 "ඉක්බිති වක්ත්‍ර නම් අසුරයා මැඩ පැවැත්වූ ජයප්‍රාප්තවූ දෙවියන්ගේ පිතෘස්ථානයෙහි සිටියාවූ මහත්වූ ශක්‍ර තෙම සුධර්මා නම් දිව්‍ය සභාවෙහි පරීක්ෂාකොට දැන අලම්බුසා නම් දිව්‍යකන්‍යාවට මෙය කීයේය.

2 "පුරුෂයන් ක්ලෙශයෙන් මිශ්‍රකරණ හෙයින් මිශ්‍රා නම්වූ ඍෂීන් පෙළඹවීමෙහි සමර්ථවූ අලම්බුසාවෙනි, ඉසිසිංග තාපසයා පෙළඹවීමට යවයි ශක්‍රයා සහිතවූ තව්තිසා වැසි දෙවියෝ තිට යාඥා කරත්.

3 "එම්බා අලම්බුසාව වෘත්තයන්ගෙන් යුක්තවූද ශ්‍රෙෂ්ඨ චය්‍යීා ඇත්තාවූද නිවන්මග ඇලුනාවූද ගුණයෙන් වැඩි සිටියාවූද මේ ඉසිසිංග තාපසතෙම යම්තාක් අප ඉක්මවාද, ඉන් පෙර ඔහුගේ දෙව්ලොවට එන මාර්ගයන් වළක්වයි. (ශක්‍රතෙම කීයේය.)

4 "දිව්‍ය රාජයාණෙනි, ඍෂීන් පෙළඹවීම පිණිස යවයි කිමෙක්ද ඔබ මටම කියන්නෙහිද, මේ දිව්‍ය ලෝකයෙහි මාම ඔබ දක්නෙහිද, අන්‍යවූද දිව්‍යප්සරාවෝ ඇත්තාහු නො වෙද්ද,

5 "ශොක රහිතවූ නන්දන වනයෙහි මා වැනිවූද මට වඩා උතුම්වූද දිව්‍යප්සරාවෝ වෙත්. ඔවුන්ට මේ ගමන දවාරය වේවා. ඒ දිව්‍යප්සරාවෝද ඍෂීන් පෙළඹවීමට යෙත්වායි (අලම්බුසාව කීය)

6 "ශොකරහිතවූ නන්දන වනයෙහි තී වැනිවූද තිට වඩා උතුම්වූද අන්‍යවූ දිව්‍යප්සරාවෝ වෙත්යයි ඒකාන්තයෙන්ම සැබවක් කියන්නෙහිය.

7 "සියලු අංගයන්ගෙන් හොබනාවූ අලම්බුසාවෙනි, පුරුෂයෙකු වෙත ගියාවූ ඒ දිව්‍යප්සරාවෝ තී යම්බඳු පාරිචය්‍යීාවක් දන්නෙහි නම් මෙබඳු පාරිචය්‍යීාවක් නොදනිත්.

8 "සුන්දරිය, තී ස්ත්‍රීන්ගෙන් උතුම්ද වෙහිය. තීම එහි යව, තිගේම වර්ණයෙන්ද රූප සම්පත්තියෙන්ද ඒ තාපසයා වසඟයට පමුණුවා ගෙනෙන්නෙහියයි (ශක්‍රයා කීයේය.)

9 "දෙව්රජහු විසින් යවනලද මම නොයන්නෙම්ද, නොවෙමි. එසේවුවත් මේ තාපසයාට ලංවන්ට භයවෙමි. තාපස තෙමේ වනාහි උග්‍රතේජස් ඇත්තේ වෙයි.

10 "බොහෝ දෙනා ඍෂීන් පෙළඹවීමට ලංව මුළාවෙන් සසර දුකට පැමිණියාහු අපායටද පැමිණියාහුය. එහෙයින් මාගේ ලොමු ඩැහැගනිත් යයි අලම්බුසාව කීය.

11 "කැමැතිවන්නාවූ ශරීරවර්ණ ඇති ක්ලේෂයෙන් පුරුෂයන් මිශ්‍රණය කරන්නාවූ අලම්බුසා නම් දිව්‍යප්සරා තොමෝ මෙය කියා ඉසිසිංග තාපසයන් මිශ්‍රණය කරන්ට කැමැත්තී ගියේය.

12 "ඒ අලම්බුසා තොමෝද ඉසිසිංග තාපසයන් විසින් රක්නාලද, රත්කරව් ගසින් ගැවැසී ගත්තාවූ භාත්පස යොදුනක් පමණවූ ඒ වනයට වැද

13 "උදෑසනම පෙරබත් කාලයෙහි ඉර උදාවන වේලෙහිම හමදිමින් ගිනිහල් ගෙයි සිටියාවූ ඉසිසිංග තාපසයන් වෙතට එළඹියේය.

14 "විසිතුරුවූ වස්ත්‍රවලින් හා ආභරණවලින් යුක්තවූ අමුනනලද මිණි කොඬොල් ඇත්තාවූ තී විදුළියක් මෙන්ද ඕසධිතාරකාව මෙන්ද බබළන්නෙහිය, තී කවර නම් තැනැත්තියක්ද,

15 "හිරුරැස් බඳු වර්ණ ඇති රන්වන් සඳුන් සුවඳ ඇති තී මනාවටවූ ඌරුයුග්ම ඇත්තීය. මහත්වූ මායා ඇත්තීය. ළදරුවයස් ඇත්තීය. මනොඥ දර්ශන ඇත්තීය.

16 "තී කෘෂවූ මධ්‍ය ප්‍රදෙශ ඇත්තීය. මෘදුවූවාය. පිරිසිදු වූවාය. තීගේ පාදයෝ මනාව පිහිටියාහුය. තීගේ ගමන කැමැතිවිය යුත්තේය. තීගේ ඒ පාදයෝ මාගේ සිත පැහැර ගණිත්මය.

17 "තීගේ පිළිවෙළින් හටගත්තාවූ ඌරු යුග්මය ඇත් සොඬට බඳු උපමා ඇත්තේය. තීගේ මනාවූ උකුල රන්පෝරුවක් මෙන් විශාලය.

18 "තීගේ මනාව පිහිටියාවූ නාභිය, නීලොත්පල කර්ණිකාවක් බඳුය. කළු අඳුන් වලින් පිරුනාක්මෙන් දුරට දක්නා ලැබේ.

19 "දෙපරිදිවූ ලෙහි හටගත්තාවූ නැටිරහිතවූ මනාව පැන නැගුනාවූ පහස් දරන්නාවූ අප්‍රකටවූ කුඩා ලබු සමානවූ හෙවත් තිඹිරිගෙඩි දෙකක් වැනිවූ පියවුරුවෙත්.

20 දික්වූ මිහිඟු බෙරයකට සමාන බැබලීම් ඇති ග්‍රීවය ඒනි මුවෙකුගේ ග්‍රීවය වැනිය. මනහරවූ දෙතොල් දිවට බඳු පැහැයෙන් යුක්තය.

21 "උඩුකුරුවූ අක් ඇත්තාවූද යටිකුරුවූ අක් ඇත්තාවූද දැහැටිවලින් පිරිමදින ලද්දාවූ දන්තයෝ නිර්දෝෂවූ හනුමස් කෙළවර හටගත්තාහු වෙත්. තීගේ දත් දැකුම් කටයුතුවෙත්.

22 "කළුවූ හුනිද ඇටබඳු ලේවන් කෙළවර ඇති දික්වූද මහත්වූද තීගේ ඇස් දැකුම්කළු වෙත්.

23 "ඉතා දික් නොවූ මනාව මට කරණ ලද්දාවූ රන්පනාවෙන් පීරණ ලද්දාවූ තීගේ හිසෙහි හටගත්තාවූ කේශයෝ සඳුන් සුවඳින් යුක්තවෙත්.

24 "යම්තාක් සීසාන්නාහු ගෙරි රක්නාහුවෙද්ද, වෙළඳුන්ගේද යම් නිෂ්පත්තියක්වේද, සංයම ඇත්තාවූ තපස් රකින්නාවූ ඍෂීන්ගේ යම් පරාක්‍රමයක්වේද,

25 "මේ භූමි මණ්ඩලයෙහි රූපවිලාසාදියෙන් තිට සම වූවෙකු නොදක්නෙමි. තෝ කවරෙක් හෝ වෙහිද, කවරෙකුගේ පුතෙක්ද, අපි තා කෙසේ දනිමුදැයි (ඉසිසිංග තාපස තෙම ඇසීය.)

26 "කාශ්‍යපගොත්‍ර ඇති තාපසයෙනි, මෙසේ ඔබගේ සිත පැවැති කල්හි ප්‍රශ්න කිරීමට කල්නොවෙයි. ඔබට වැඩෙක්වේවා.

යහළු තාපසය, එනුමැනව, අපිදෙදෙන අපගේ අසපුවෙහි අභිරමනය කරන්නෙමු. එව, ඔබ වැළඳ ගන්නෙමියි ඔබ පස්කම් සැප විඳින්නවුන්ගෙන් දක්ෂයෙක් වෙවයි (අලම්බුසාව කීය.)

27 "කැමැතිවූ වර්ණ ඇති පුරුෂයන් ක්ලේශයෙන් මිශ්‍ර කරන්නාවූ අලම්බුසානම් දිව්‍යප්සරා තොමෝ ඉසිසිංග තාපසයන් මිශ්‍රණය කරන්ට කැමැත්තී මෙය කියා ගියේය.

28 "ඒ තාපස තෙමේද සෙමින් යන ගමන සිඳ වේගයෙන් නික්ම ගොස් ඇය වෙතට පැමිණියේ උතුම් කෙස් වැටියෙන් අල්වාගත්තේය.

29 "ඉතා සොභමානවූ කල්‍යාණ දර්ශන ඇති ඕ තොමෝ පෙරලා නැවතී ඒ තාපසයා වැළඳගත්තේය. ඔහු බ්‍රහ්ම චය්‍ර්‍යාවෙන් චුත කල්හි ශක්‍රයා යම්සේ සිතීද එය වූයේය. එකල්හි අලම්බුසා තොමෝද සතුටු වනලද්දීය.

30 "අලම්බුසා තොමෝ නන්දන වනයෙහි වසන්නාවූ ශක්‍රයා වෙත සිතින් පැමිණියේය. හෙවත් ශක්‍රතෙම පය්‍ර්‍යංකයක් එවාවයි සිතීය. දෙවියන්ට උතුම්වූ ශක්‍රතෙම ඇගේ සිතිවිල්ල දැන.

31 "ස්වර්ණමයවූ පිරිවර සහිතවූ මත්තෙහි වසනලද ඇතිරිලි පනසක් සහිතවූ දහසක් කොඳුපලස් අතුරන ලද්දාවූ පය්‍ර්‍යංකයක් වහා එවීය.

32 "ශොභනවූ අලම්බුසා තොමෝ ඒ ඉසිසිංග තාපසයා ඒ දිව්‍ය පය්‍ර්‍යංකයෙහි හිඳ එක මොහොතක් කල් මෙන් තුන් අවුරුද්දක් ලෙහි කොට දැරීය.

33 "පහවූ මුළා සිහි ඇති ඒ තාපසතෙම තුන් හවුරුද්දකින් පිබිද ගිනිහල් ගෙය හාත්පස නිල්වන්වූ ගස් දුටුයේය.

34 "ඒ තාපස තෙම අලුත හටගත් පත්‍ර ඇති පිපුනාවූ කොවුල් සමූහයා විසින් ඝෝෂා කරණලද්දාවූ වනය හාත්පස බලා හඬමින් කඳුළු වැගිරවීය.

35 "යාග නොකෙළෙමි. මන්ත්‍ර ජප නොකෙළෙමි. ගිනිපිදීම නොකරණලදී. කවරෙක් නම් මාගේ පෙර පැවැති සිත ක්ලෙශ පාරිචය්‍ර්‍යාවෙන් පෙළෂීද,

36 "යමෙක් මාගේ ශ්‍රමණ තේජසින් රැස්කරණ ලද්දාවූ අරණ්‍යයෙහි වාසය කරන්නාවූ මාගේ ධ්‍යාන ගුණය නොයෙක් රත්නයෙන් පිරුනාවූ නැවක් සාගරයෙහි ගමන් ගත්තේද, හෙතෙම කවරෙක්දැයි වැළපුනේය.

37 "පින්වත් තාපසය, සක්දෙව් රජහු විසින් මෙහෙයන ලද්දාවූ මම පරිචරියාවෙන් ඔබගේ සිත මැඩලීමි. සිතින් ප්‍රමාදයෙන් ඔබ එය දැනනොගත්තෙහියයි අලම්බුසාව කීය.

38 "මාගේ පියවූ කාශ්‍යපතෙම මට මේ වචන කීයේය. මානවකය, ලිය තඹර මල්වැනි ස්ත්‍රීහු වෙත් ඔවුන් දැන ගනුවයි කීයේය.

39 "ළයෙහි මස්ගඩු දෙකක් ඇති ස්ත්‍රීන් දැන ගණුව මානවකය, ඒ ස්ත්‍රීහු තමන් වසඟයට පැමිණියවුන් නසත්යයි දැනගණුව. මෙසේ පියවූ තාපස තෙම මම් අනුශාසනා කෙළේය. අනුකම්පා ඇත්තෙක් යම්සේද එසේ මට කීයේය.

40 "වෘද්ධවූ ඒ පියාගේ අවවාද වචනය මම නො කෙළෙමි. එබැවින් ඒ මම අද මිනිසුන් නැත්තාවූ වනයෙහි එකලාව වැළපෙමියි.

41 "ඒ මම එසේ කරන්නෙමි. මාගේ ජීවිතයට නින්දාවේවා. නැවත හෝ එබන්දෙක් වන්නෙමියි මට මරණය හෝ වන්නේයයි (තාපසයා වැළපුනේය)

42 "ඒ අලම්බුසා නම් දිව්‍යප්සරාව ඔහුගේ මනාව වඩනාලද ශීල තෙජසද වීය්‍ය්‍යයද ප්‍රඥාවද දැන ඉසිසිංග තාපසයා පා ලඟ හිසින් පිළිගත්තේය.

43 "ඔහු වීරය, මට නොකිපුන මැනව. මහා ඍෂිය මට නොකිපුන මැනව. යශස් ඇත්තාවූ දෙව්ලෝවැස්සන්ට මා විසින් මහත්වූ වැඩක් කරණලදී එකල්හි ඔබ විසින් සියලු දෙව්ලොව අතිශයින් කම්පාකරණ ලද්දක් වීයයි කීය.

44 "තව්තිසා වැසි යම් දෙවි කෙනෙක් වෙද්ද, ඔව්හු සුවපත් වෙත්වා දෙව්ලෝ වැස්සන්ට අධිපති ශක්‍ර තෙමේද සුවපත්වේවා

සොඳුර, තීද සුවපත්වේව, කන්‍යාවෙනි, සුවසේ යවයි (තාපසතෙම කීය.)

45 “ඒ අලම්බුසා තොමෝ ඔහුගේ පාදයන් අල්වාගෙණ ඔහු පැදකුණුද කොට ඇඳිලිබැඳ එතනින් ඉවත්ව ගියේය.

46 “ස්වර්ණමයවූ පිරිවර සහිතවූ මත්තෙහි වසනලද ඇතිරිලි පනසක් ඇත්තාවූ දහසක් කොඳු පලස් අතුරන ලද්දාවූ ඇගේ යම්පයඞ්ංකයක්වීද ඒ දිව්‍යවූ පයඞ්ංකයටම නැග ඕ තොමෝ දෙවියන් වෙතට ගියේය.

47 “පහන් ආලෝකයක් මෙන්ද දුලියක් මෙන් ද බබලමින් එන්නාවූ ඇය දැක ප්‍රීතිමත්වූ සතුටු සිත් ඇති සක්දෙව් රජතෙම වරයක් දුන්නේය.

48 “සියලු භූතයන්ට අධිපතිවූ ශක්‍ර දිව්‍යරාජය, ඉදින් මට වරයක් දෙන්නෙහි නම් ඍෂීන් පෙළඹවීමට නොයන්නෙමි. ශක්‍රය, මම මේ වරය කැමැතිවෙමියි (අලම්බුසාව වර ඉල්වීයයි)” වදාළේය.

516 සංඛපාල ජාතකයඃ- 1 “සුන්දරවූ ශරීරෝභාස ඇත්තේ ප්‍රසන්නවූ ඇස් ඇත්තේ වෙහිය. පින්වත් තෙමේ ශ්‍රෙෂ්ඨ කුලයෙන් පැවිදිවීයයි හඟිමි. සප්‍රාඥය කෙසේනම් වස්තූන්ද සම්පත්ද හැර ගිහිගෙන් නික්ම පැවිදිවීදැයි (බරණැස් රජ ඇසීය.)

2 “නරදේවවූ මහරජ, මහත් ආනුභාව ඇත්තාවූ නාග රාජයාගේ විමානය තෙමේ දැක පුණ්‍යයන්ගෙන් මහත්වූ විපාකයද දැක මම ශ්‍රද්ධාවෙන් පැවිදිවූයෙමියි (තාපසයා කීයේය.)

3 “කැමති දෑ කැමැත්තෙන්ද භයින්ද ද්වෙෂයෙන්ද ප්‍රව්‍රජිතයෝ බොරු බස් නොකියත්. විචාරණ ලද්දේ මට මේ කාරණය කියව, එය අසා මාගේ ප්‍රශාදය හටගන්නේය.

4 “මහරජ, වෙළඳාම පිණිස යන්නාවූ මම මහා මාර්ගයෙහි අතිශයින් වැඩුනාවූ ශරීරය ඇති මහත්වූ නාගයෙකු තඩලාගෙණ සතුටු වෙමින් යන්නාවූ වැදි පුත්‍රයන් දුටුවෙමි.

5 "මහරජ, ඒ මම ඔවුන් හා එක්වීමි. අතිශයින් ඩැහැගත් ලොම් ඇත්තේ භයවූයේ ඔවුන්ට මෙසේ කීයෙමි. බිහිසුනු ශරීරයක් ඇති මේ නාගතෙම කොහි ගෙනියනු ලැබේද, වැදිපුත්‍රයිනි, නාගයාගෙන් කුමක් කරන්නහුදැයි ඇසීමි.

6 "අතිශයින් වැඩුනාවූ ශරීර ඇති උරග නම්වූ මහත්වූ මේ නාගතෙම භෝජනය පිණිස ගෙණයනු ලැබේ. මොහුගේ මාංශය මිහිරිද මහත්ද මෘදුද වේ. වෛදේහි පුත්‍රය, ඔබ මෙහි රස නොදන්නෙහිය.

7 "මෙයින් අපි සිය ගෙදරට ගොස් ශස්ත්‍රයන් ගෙණ කඩ කඩ කොට කපා සතුටුවෙමින් මස් අනුභව කරන්නෙමු. අපි වනාහි ඒකාන්තයෙන් නයින්ගේ සතුරෝ වෙමුයි කීහු.

8 "අතිශයින් වැඩුනාවූ සිරුරු ඇති මහත්වූ මේ සර්ප තෙම ඉදින් භෝජනය සඳහා ගෙණයනු ලැබේ නම්, මම තොපට ගවයන් සොළොස් දෙනෙක් දෙමි. මේ නාගයා බැම්මෙන් මුදා හරිව්යයි කීයෙමි.

9 "ඒකාන්තයෙන්ම මෙතෙම අපගේ මන වඩන්නාවූ ආහාරයවේ. බොහෝවූද නාගයෝ අප විසින් අනුභව කළ විරූහ. විදේහි පුත්‍රවූ ආළාරය, ඔබගේ ඒ වචනය කරමු. ඔබ අපගේ මිත්‍රයාද වෙවයි කීහ.

10 "මහරජ, එකල්හි නාසයෙන් විද කරණලද යම් බැමි වූවාහුද, ඔව්හු ඒ නාගයා බන්ධනයෙන් මිදුවාහුය. බන්ධනයෙන් මිදුනාවූ ඒ නාරජතෙමේද පෙරදිගට අභිමුඛව මොහොතක්කල් ගියේය.

11 "පෙරදිගට අභිමුඛව මොහොතක්කල් ගොස් කඳුළු පිරුණු නෙත්වලින් මා දෙස බැලීය. එකල්හි මම දසැඟිලි ඇඳිලි බැඳ පිටුපසින් ඔහුට අනුව ගියෙමි.

12 "ඔබ ඉක්මන් කොටම යව සතුරෝ තා නැවත අල්වා නොගනිත්වා වැද්දන් හා එක්වීම නැවත දුක්වන්නේ මැයි. භෝජ පුත්‍රනම්වූ වැද්දන්ගේ නොපෙනීමට යවයි කීමි.

13 "ඒ නාරජතෙම විශේෂයෙන් ප්‍රසන්නවූ නිල් පැහැ ඇත්තාවූ සිත්කළුවූ මනාකොට ඇති දඹගස් වලින් හා හොමු වඟුවලින් ගැවසී ගත්තාවූ විලට ගියේය. සතුටු සිත් ඇති එතෙර කළ භය ඇති ඒ නාරජතෙම එහි ඇතුල්වූයේය.

14 "මහරජ, ඒ නාරජතෙම ඒ විලට ඇතුල්ව නොබෝ කලකින්ම දිව්‍ය ශරීරයෙන් යුක්තව මා ඉදිරියෙහි පහළවූහ. පුත්‍රයෙක් පියෙකුට මෙන් හෘදයංගමවූ කනට සැපවූ වචන කියමින් මට උපස්ථාන කෙළේය.

15 "පින්වත් ආළාරය, ඔබ මාගේ මවද වෙහිය. පියාද වෙහිය. අභ්‍යන්තරවූ ප්‍රාණය දුන්නාවූ යහළුවාද වේ. ස්වකීය ඍද්ධියද නැවත ලබාදෙන ලද්දේවෙමි. ආළාරය, බොහෝ කෑ යුතු දෑ ඇති බොහෝවූ ආහාරපාන ඇති ශක්‍රයාගේ දිව්‍යපුරය වැනිවූ මාගේ නිවාසස්ථානයන් බලවයි නාරජතෙම කීයේය.

16 "මහරජ, ඒ නාග භවනය යම්තැනෙක පැමිණියවුන්ගේ ශෝකය දුරුකෙරෙද්ද, එහි කැට කැබිලිති සහිතවූද මෘදුවූද යහපත්වූද නීච තෘණ්ණාවලින් යුක්තවූද රජස් රහිතවූද භූමි තොමෝ ප්‍රශාද එලවන්නීය. එබඳු භූමි භාගවලින් යුක්තවේ.

17 "එහි සමව පිහිටියාවූ භූමියවේ. වෛදූර්‍ය්‍ය බඳු නිල් පැහැ ඇති පොකුණක් වේ. එහි සතරදිශාවෙහි ඉතා රම්‍යවූ අඹ වනයවේ. එහි පැසුනාවූද තරුණවූද ඵල හටගත් අඹගස් වෙත්. ඔව්හු හැම ඍතුවලම ඵල දරත්ය යි කීයේය.

18 "නරදේවවූ රජ්ජුරුවෙනි, ඒ වන මැද ප්‍රභාශ්වර හෙයින් දැකුම් කටයුතු රිදීමය කවුළු දොරවල් ඇති ස්වර්ණමයවූ මහත්වූ ප්‍රාසාදය අහස විදුලියක් මෙන් බබළයි.

19 "මහරජ, එහි මාණික්‍යමයවූද ස්වර්ණමයවූද මහත්වූ නොයෙක් විසිතුරුකම් ඇත්තාවූ නිරන්තරයෙන් මොනවට නිර්මිත කරණලද්දාවූ කූටාගාර හා ගබඩා ගෙවල් ඇත්තාහ. ඔව්හු ස්වර්ණමය අඟු පළඳනා දරන්නාවූ අලංකාරයෙන් සැරසුනාවූ නාග කන්‍යාවන්ගෙන් සම්පූර්ණවූහ

20 "අලාමකවූ ශරීර වර්ණ ඇති ඒ සංඛපාල නාරජ තෙම් ඉක්මන් ස්වභාව ඇත්තේ (මා අතින් අල්වාගෙණ) දහසක් ටැම්

ඇත්තාවූ අතුල්‍ය ආනුභාව ඇත්තාවූ ප්‍රාසාදයට නැග ඔහුගේ අග මෙහෙසිවූ භාර්‍ය්‍යාතොම යම්තැනෙක්හි වීද, එතනට පැමිණෑවී.

21 "එකල්හි එක් ස්ත්‍රියක්තොමෝ ඉක්මන් ස්වභාව ඇත්තී ජාතිමත් මැණික් වලින් යුක්තවූ මාහැඟිවූ වෛඩූර්‍ය්‍යමයවූ යහපත් මැණික් ආසනයක් නොමෙහෙයන ලද්දී එලවීය.

22 "ඉක්බිති නාරජතෙම මා අතින් අල්වාගෙණ උතුම් වූ ආසනයේ හිඳුවීය. මෙය උතුම් ආසනය වේ ඉක්මන් ස්වභාව ඇති ජලය හැරගෙණ පැමිණ පින්වත්තෙමේ මෙහි හිඳීවා. පින්වතා වනාහි මාගේ මව්පියන්ගෙන් එක්තරා කෙනෙකියි කීයේය.

23 "ජනාධිපතිවූ රජ්ජුරුවෙනි, අන් ස්ත්‍රියක්ද ප්‍රියවූ ස්වාමිපුත්‍රයක්හුගේ භාර්‍ය්‍යාවක් මෙන් මාගේ පා සේදීය.

24 "තවද අන්‍ය ස්ත්‍රියක්තොමෝ ඉක්මන් ස්වභාව ඇත්තී ස්වර්ණමයවූ තලියකින් නොයෙක් සැප හා නානාප්‍රකාර ව්‍යඤ්ජන ඇති මනොඥ ස්වභාව ඇතියෙකු හැර ගෙණවුත් මා වෙතට එළවීය.

25 "භාරත දෙශාධිපතිවූ රජ අනුභව කළාවූ ආහාර ඇති මට ඒ දිව්‍යකන්‍යාවෝ ස්වාමි පුරුෂයාගේ සිත් දැන නොයෙක් තූර්‍ය්‍ය වාදනවලින් උපස්ථාන කළාහුය. ඉන්පසු ඒ නා රජ තෙම මහත්වූ දිව්‍යමය කාම සම්පත් වලින් යුක්තව මාවෙතට පැමිණියේය.

26 "පින්වත්වූ ආළාර නම් මානවකයා මාගේ මේ තුන් සියයක් භාර්‍ය්‍යාවෝ සියල්ලෝ මනා මධ්‍ය ප්‍රදෙශ ඇත්තාහ. පියුම් බඳුවූ මතු ශරීර ස්වභා ඇත්තාහ. මොවුන් කෙරෙහි ඔබට කැමති පරිද්දක් කරව, ඔවුන් ඔබට දෙමියි පරිචාරිකාවන් කරගණුවයි කීයේය.

27 "මහරජ, මම හවුරුද්දක් දිව්‍යපඤ්චකාමයන් අනුභවකොට එකල්හි ඒ නා රජුට පසුව මෙසේ කීමි. සංඛපාල නම් නා රජහුගේ මේ සම්පත්තිය කිනම් කර්මයක් කොට කෙසේ ලබන ලද්දේද, මේ ශ්‍රෙෂ්ඨවූ විමානය කෙසේ ලැබුයේද,

28 "නාගරාජය, නුඹ විසින් මේ උතුම් විමානය හේතුවක් නැතුව ලබන ලද්දේද, පිරිනැමීමෙන් ලබන ලද්දක්ද, තමා විසින් කරණ ලද්දක්ද, නොහොත් දෙවියන් විසින් දෙන ලද්දක්ද මේ උතුම් විමානය කෙසේ ලැබුයේදැයි මේ කාරණය ඔබ විචාරමියි කීයේය.

29 "ආළාරය, මා විසින් මේ විමානය අහේතුවෙන් ලබන ලද්දක් නොවේ. පිරිනැමීමෙන් ලබන ලද්දක් නොවේ. තමා විසින් කරණ ලද්දක්ද නොවේ. දෙවියන් විසින් දෙනලද්දක්ද නොවේ. අළාමකවූ ස්වකීයවූ පුණ්‍ය කර්මවලින් මා විසින් මේ විමානය ලබන ලදැයි නා රජතෙමකීයේය.

30 "ඔබගේ වෘත්ත සමාදානය කුමක්ද, කිනම් ශ්‍රෙෂ්ඨ චයර්‍ය්‍යාවක්ද කරණ ලද කවර කර්මයක්හුගේ මේ විපාකයවේද, නාග රාජය මේ කාරණය මට කියව. ඔබ විසින් මේ විමානය කෙසේ ලබන ලද්දේ දැයි ඇසීමි.

31 "ආළාරය, මම මහත් ආනුභාව ඇත්තාවූ මගධෛශ්වරවූ දුයෙර්‍ය්‍යාධන නම් රජෙක් වීමි. ඒ මම මේ මනුෂ්‍ය ජීවිතය ස්වල්පය බොහෝ කල් නොපවත්නේය. පෙරලෙන ස්වභාවයයි දැන,

32 "ප්‍රසන්නවූ සිත් ඇත්තේ ආහාරද පානවර්ගද සකස් කොට මහත්වූ දානය දුනිමි. එකල්හි මාගේ ගෘහය පැන් පොකුණක් මෙන් වීය. ශ්‍රමණ බ්‍රාහ්මණයෝද මා විසින් සන්තර්පනය කරණ ලද්දාහ.

33 "මල් ද සුවඳ ද විලවුන් ද පහන් උපකරණ ද යානෝප කරණද ආවාසද වස්ත්‍රද ශයනාසනද නැවත ආහාර පානද එහි සකස්කොට දානයන් දුනිමු.

34 "ඒ මාගේ ව්‍රත සමාදානයවේ. ඒ වනාහි ශ්‍රෙෂ්ඨ චයර්‍ය්‍යාවවේ. කරණලද ඒ කර්මයාගේ මේ විපාකයවේ. ඒ කුශල කර්මයෙන්ම බොහෝවූ කෑයුතු දෙය ඇති බොහෝ ආහාරපාන ඇති නෘත්‍ය ගීත වලින්ද යුක්තවූ බොහෝ කල් පවත්නාවූ මේ විමානය මා විසින් ලබන ලදී. මේ තෙමේද සදාකාලික නොවේයයි නා රජතෙම කීයේය.

35 "දළම ආයුධකොට ඇත්තාවූ නාගරාජය, තද ආනුභාව නැත්තාවූ තේජස් නැත්තාවූ ඒ වැදිපුත්‍රයෝ මහත් ආනුභාව ඇති තේජසින් යුක්තවූ ඔබට කුමක් හෙයින් හිංසා කළාහුද, කුමක් නිසා වැද්දන්ගේ අතට අසුවූයේද?

36 "දළ ආයුධකොට ඇත්තාවූ නාගරාජය, කිම ඔබගේ තේජස් ඔවුන්දැක මහත්වූ භය අනුව ගියේද, ඔබගේ විෂ දත්මුල් අනුව නොගියේද, කුමක් නිසා වණිබ්බකයන් අත වෙහෙසට පත්වූයේදැයි ඇසීය.

37 "නාගේ තේජස් මහත්වූ භය අනුව ගියේනොවේ. මාගේ තේජස් නසන්ට ඔව්හු නොහැකි වෙත්. මනාකොට ප්‍රකාශ කරණ ලද්දාවූ සත්පුරුෂ ධර්මයෝද මුහුදුවෙරළ මෙන් නොඉක්ම විය හැක්කාහුවෙත්.

38 "ආළාරය, මම තුදුස්වක්දිනද පසළොස්වක් දිනද නිතර පෙහෙවස් සමාදන්ව වසමි. එකල වැදිපුත්‍රයෝ සොළොස් දෙනෙක් රැහැන්ද දැඩිවූ මලපුඩුද ගෙණ ආවාහුය.

39 "මාගේ නාසය විද රැහැණක් ඇද හෙවත් රැහැනකින් බැඳ වැදි පුත්‍රයෝ මා තඩලාගෙණ ගියාහුය. මා සමාදන්වූ පෙහෙවස නොනසා රක්නා කල්හි මම මෙබඳුවූ දුකක් ඉවසීමි.

40 "නාගරාජය, බලයෙන්ද ශරීරවර්ණයෙන්ද යුක්තවූ තපස් රකින්නාවූ ඔබ ඒක පදික මාර්ගයෙහි වැද්දෝ දුටුවාහුය. නාගරාජය, සම්පත්තියෙන්ද ප්‍රඥාවෙන්ද වැඩුනේ වෙහිය. කුමක් සඳහා තපස් කෙරෙහිදැයි ඇසීය.

41 "ආළාරය, පුත්‍රයන් හේතුකොටගෙණ නොවේ. ධනය හේතුකොට ගෙණද නොවේ. ආයුෂය හේතුකොට ගෙණද නොවේ. මනුෂ්‍ය යෝනිය ප්‍රාර්ථනා කරන්නෙම් වෙමි. එහෙයින් උත්සාහකොට තපස් රකිමියි කීයේය.

42 "නාගරාජය, ඔබ ලේවන් ඇස් ඇත්තේ නසනලද අන්තරා ඇත්තේ අලංකාරයෙන් සැරසුනේ කපන ලද හිසකේ රැවුල් ඇත්තේ රත්සඳුන්වලින් විලවුන් ගල්වන ලද්දේ ගාන්ධර්ව රාජයාමෙන් දිශාවන් බබුළුවන්නෙහිය.

43 "සියලු කාම සම්පත්තියෙන් යුක්තවූයේ මහත් ආනුභාව ඇත්තේ දිව්‍යමය ඍධියට පැමිණියේ වෙහිය. නාගරාජය, මේ කාරණය ඔබ විචාරමි. කවර කරුණකින් මනුෂ්‍ය ලෝකය සේම මීට වඩා උතුම් වේදැයි ඇසීය.

44 "ආළාරය, මනුෂ්‍යලෝකයෙන් අන්තැනක පිරිසිදු වීම හෝ ශීලසංයමය හෝ විද්‍යමාන නොවේ. මමද මනුෂ්‍යාත්මය ලැබ ජාතිමරණයන්ගේ කෙළවර කරන්නෙමියි නාරජතෙම කීයේය.

45 "නාගරාජය, මාවිසින් ඔබගේ සමීපයෙහි අවුරුද්දක් කල් වසන ලදී. ආහාරයෙන්ද පානයෙන්ද උපස්ථාන ලද්දෙමි. දැන් ඔබට කියායමි. නාගරාජය, මම බොහෝ කලක් වාසය කෙළෙමියි කීයේය.

46 'ආළාරය, මාගේ පුත්‍රයෝද අඹුවෝද අනුව ජීවත් වන්නෝද නිතර අනුශාසනා කරණ ලද්දාහු ඔබට උපස්ථාන කිරීමට පැමිණ සිටින්නාහ. කිමෙක්ද ඔවුන්ගෙන් කිසිවෙක් ඔබට අසතුටක් කෙළේද, ඔබගේ දැක්ම මට ප්‍රිය වේමැයි නාරජතෙම කීයේය.

47 "යම්සේ මවගේද පියාගේද ගෘහයෙහි උතුම්වූ ප්‍රිය පුත්‍රයෙක් තෙම පෝෂ්‍ය කරණ ලද්දේම වේද, නාග රාජය, යම්හෙයකින් ඔබගේ සිත මා කෙරෙහි ප්‍රසන්න වීද, එහෙයින් මට මෙයම උතුම්වේයයි ආළාරතෙම කීයේය.

48 "ආළාරය, ධනය ලබාගන්නාවූ ලොහිතංක නම් මාගේ මාණික්‍යයක් ඇත්තේය. ඒ මහත්වූ මාණික්‍යරත්නය ස්වකීය ගෙදරට හැරගෙණයව, එයින් ධනය ලබාගෙණ නැවත එය මා වෙතටම පමුණුවවයි. නා රජතෙම කීයේය.

49 "මහරජ, මාවිසින් මිනිසුන් අයත්වූද දිව්‍යවූද කම්සැප දක්නා ලදහ. ඒ කාමයෝ බොහෝකල් නොපවත්නාහ. පෙරලෙන ස්වභාවය ඇත්තාහ, මෙසේ කාමගුණයන්හි දෝෂ දැක මම ශ්‍රද්ධාවෙන් පැවිදිවූයේ වෙමි.

50 "මහරජ ගස්වල පැසුනාවූද නොපැසුනාවූද ගෙඩි මෙන් තරුණවූද මහළුවූද සත්වයෝ ශරීර භෙදයෙන් වැටෙන්නාහ.

මෙයද දැක නොවරදින්නාවූ මහණකමම උතුම් වේයයි පැවිදිවූයේ වෙමියි තාපසතෙම කීයේය.

51 "ආළාරනම් තාපසය, යම් කෙනෙක් බොහෝ කරුණු සිතන්නාවූ බොහෝ ඇසූ පිරූ තැන් ඇත්තාහු වෙද්ද ඒ සප්‍රාඥයෝ ඒකාන්තයෙන් සේවනය කටයුත්තාහ. අළාරය, ඒ නාගරාජයාද ඔබගේ පැවැත්මද අසා මම බොහෝවූ පින් කරන්නෙමියි රජතෙම කීයේය.

52 "මහරජ, බොහෝ කරුණු සිතන්නාවූ බොහෝ ඇසූ පිරූ තැන් ඇත්තාවූ යම් කෙනෙක් වෙද්ද, එබඳුවූ සප්‍රාඥයෝ ඒකාන්තයෙන්ම සේවනය කටයුත්තාහ. සංඛපාල නම් නාගරාජයා ගැනද මා පිළිබඳවද තොරතුරු අසා බොහෝවූ පිංකම් කරවයි තාපසතෙම අවවාද කෙළේය" යි වදාළේය.

**524 චුල්ලසුතසෝම ජාතකය:-** 1 "නියම්ගම් වැසි ජනයාද මිත්‍රාමාත්‍යයන්ද පිරිස් වැස්සන්ද කැඳවා දන්වමි. මාගේ හිසෙහි නර කෙසක් හටගත්තේය. පින්වත්නි, මම දැන් පැවිදිවීම කැමති වන්නෙමියි. සුතසෝම නම් රජ තෙම කීයේය.

2 "දේවයන් වහන්ස, කෙසේ නම් මට අවැඩක් කියන්නෙහිද, මාගේ ලයෙහි අනින ලද හුලක්මෙන් කෙළෙහිය. ඔබගේ සත් සියයක් භාර්‍ය්‍යාවෝ වෙත්. ඔබ පැවිදිවූ කල්හි අනාථවූ ඔබගේ භාර්‍ය්‍යාවෝ කෙසේ නම් වන්නාහුදැයි (ඔවුන් අතුරෙන් එකෙක් ඇසුවේය.)

3 "මේ තරුණවූ භාර්‍ය්‍යාවෝ තම තමන්ගේ කටයුතු වලින් ප්‍රකට වන්නාහ. ඔව්හු අන්හිමියෙකු වෙතද යන්නාහ. මම ස්වර්ගයද පතන්නෙම් වෙමි. එහෙයින් පැවිදි වන්නෙමියි. රජතෙම කීයේය.

4 "දේවයෙනි, යම්හෙයකින් මා වැළපෙද්දී අපේක්ෂා රහිතව පැවිදිවන්නෙහිද, සුතසෝමය, එහෙයින් මම යම් බඳුවූ ඔබගේ මව්වීම්ද මෙය මාවිසින් නපුරුකොට ලබන ලද්දෙක්විය.

5 "දේවයෙනි, යම්හෙයකින් මා වැළපෙද්දී අපේක්ෂා නැතුව පැවිදි වෙහිද, එහෙයින් සුතසෝම නම් පුත්‍රය, මම යම්

බඳුවූ තොප ප්‍රසූත කෙළෙම්ද මෙය මා විසින් නපුරු කොට ලබන ලද්දක් වීයයි මච්චිසව කීවාය.

6 "දේවයෙනි, යම් හෙයකින් ජරාවට ගියාවූ අප නොබලා පැවිදි වෙහිද සුතසෝම නම්වූ පුත්‍රය, මේ කිනම් ස්වභාව ධර්මයෙක්ද කවර නම් ප්‍රව්‍රජ්‍යාවක් දැයි පියරජ තෙම ඇසීය.

7 "පුත්‍රය, ඔබගේ ළදරුවූ නොපැමිණි යොවුන් වයස් ඇත්තාවූ බොහෝවූද දරුවෝ වෙත්. මිහිරි වචන ඇත්තාවූ ඒ දරුවෝ ඔබ නොදක්නාහු දුකට පැමිණෙත්යයි සිතමියි පියරජතෙම කීයේය.

8 "ළදරුවූ නොපැමිණි යොවුන් වයස් ඇත්තාවූ මිහිරි වචන ඇති මාගේ මේ පුත්‍රයන් කෙරෙන්ද නුඹලා සියල්ලන්ගෙන්ද බොහෝ කාලයක් නමුත් සිට වෙන්වීම වන්නේයයි මහාසත්වතෙම කීයේය.

9 "දේවයන්වහන්ස, යම්හෙයකින් හඬන්නාවූ අප කෙරෙහි අපේක්ෂාවක් නැතිව පැවිදි වෙහිද එහෙයින් අප කෙරෙහි ඔබගේ ආදර සිත සිඳීගියේද, නොහොත් කරුණාවක් වත් නැද්දැයි ඒ භාර්‍ය්‍යාවෝ ඇසූහ.

10 "තොප කෙරෙහි මාගේ ආදර සිත සිඳී ගියේද, නොවෙයි. තොපකෙරෙහි මාගේ කරුණාවද ඇත්තේය. මම ස්වර්ගයද පතන්නෙම් වෙමි. එහෙයින් මම පැවිදිවන්නෙමියි ඔවුන් අස්වැසීය.

11 "දේවයන් වහන්ස, යම්හෙයකින් මා වැළපෙද්දී අපේක්ෂාවක් නැතුව පැවිදි වෙහිද එහෙයින් යම්බඳුවූ ඔබට මම භාර්‍ය්‍යාවීම්ද, සුතසෝම රජ්ජුරුවෙනි, මාවිසින් මෙය නපුරුකොට ලබන ලද්දක් විය.

12 "දේවයන් වහන්ස, යම්හෙයකින් මාගේ කුස පිළිසිඳගත් දරුගර්භය අපේක්ෂා රහිතව පැවිදිවෙහිද එහෙයින් යම්බඳුවූ ඔබගේ මම භාර්‍ය්‍යාවීම්ද, සුතසෝම රජ්ජුරුවෙනි, මා විසින් මෙය නපුරුකොට ලබන ලද්දක්විය.

13 "දේවයෙනි, මාගේ කුසෙහිවූ දරුගර්භයතෙම මුහුකුරා ගියේ වෙයි. යම්තාක් එය ප්‍රසූත කරම්ද, ඒතාක් ඉවසුව මැනව,

එකළාවූ මම වැන්දඹු නොකෙරේවා. පසුව දුක් දකිමියි අගමෙහෙසිය කියා වැළපුනාය.

14 "සොඳුර, තීගේ කුසයෙහිවූ දරුගර්භය මුහුකුරා ගියේයයි දනිමි. එබැවින් තී පුත්‍රයෙකු ප්‍රසූත කරව, අලාමකවර්ණවූ පුත්‍රයාද තීද හැර මම පැවිදි වන්නෙමියි මහ බෝසත්තෙම කීයේය.

15 "සොඳුරු චන්ද්‍රාදේවිය තී නොහඬව, ගිණිහිරිමල් බඳු ඇස් ඇත්තිය සොක නොකරව, උතුම් ප්‍රාසාදයට නැගෙව, අපේක්ෂාවක් නැතිව මම යන්නෙමියි කීයේය.

16 "මැනියෙනි, කවරෙක් ඔබ කෝප කෙළේද, කුමක් හෙයින් හඬන්නෙහිද මා දෙස දැඩිව බලන්නෙහිද, වධ නොකට යුතු කවරෙකු නෑයන් බලා සිටියදීම නසම් දැයි වැඩි මහළු පුත්‍රතෙම ඇසීය.

17 "පුත්‍රය, ලබනලද ජය ඇත්තාවූ යමෙක් මා කෝප කෙළේද, හෙතෙම නසන්ට නොහැක්කේය. පුත්‍රය ඔබගේ පියරජතෙම අපේක්ෂාවක් නැතිව මම යන්නෙමියි මට කීයේයයි මව් බිසව කීය.

18 "යම්බඳුවූ මම පෙර උයනට යෙම්ද, මතැතුන්ට පහර දෙම්ද, සුතසෝම රජ පැවිදිවූ කල්හි දැන් කෙසේ නම් එබඳු ක්‍රීඩාවක් කරන්නෙම්දැයි පුත්‍රයා වැළපුණේය.

19 "පියාණෙනි, මාගේ මව හඬද්දී වැඩිමහල් සොහොයුරුද නොකැමැතිව සිටියදී පැවිදි වෙහිද, ඔබගේ අත්දෙකද අල්වාගන්නෙමි. අප අකැමැතිව සිටියදී නොම යන්නෙහි යයි (බාලපුත්‍රයා පියරජහු ග්‍රීවයෙන් දැඩිකොට අල්වා ගත්තේය.)

20 "එම්බා කිරි මව තී නැගිටුව, මේ කුමරු අන් තැනකට ගෙණ ගොස් සිත් අලවව, ස්වර්ගසම්පත්තිය ප්‍රාර්ථනා කරන්නාවූ මාගේ මේ ගමනට උවදුරක් නොකෙරේවායි රජතෙම කීයේය.

21 "මේ දිළිසෙන්නාවූ මැණික දෙන්නෙම් නම් යහපති මට මෙයින් කවර ප්‍රයෝජනයෙක්ද, සුතසෝම රජු පැවිදිවූ කල්හි මේ මැණික ගෙණ මම කුමක් කරන්නෙම්දැයි කිරි මව වැළපුනීය.

22 "දේවයන්වහන්ස, ඔබගේ භාණ්ඩාගාරයද මහත්වේ. ඔබගේ කොටුගුල්ද පිරීඇත්තේය. ඔබ විසින් පෘථිවියද දිනන ලදී. එහෙයින් සිත් අලවා වාසය කරණු මැනව, පැවිදි නොවෙවයි. මහ ඇමතිතෙම කීයේය.

23 "මාගේ භාණ්ඩාගාරයද මහත්වේ. මාගේ කොටුගුල්ද පිරීඇත්තේය. මා විසින් පෘථිවියද දිනන ලදී. ඒ සියල්ල හැරදමා මම පැවිදිවන්නෙමියි මහසත්තෙම කීයේය.

24 දේවයන් වහන්ස, මාගේද ධනය බොහෝ වෙයි. ගණන් කරන්ටද නොහැක්කෙමි. දේවයන් වහන්ස, ඒ සියල්ලද ඔබට දෙමි. සිත් අලවා වාසය කරණු මැනව. දේවයන් වහන්ස, පැවිදි නොවෙවයි කුලවඩ්ඪන නම් සිටු තෙම කීයේය.

25 "එම්බා කුලවඩ්ඪන සිටාණෙනි, තොපට බොහෝ ධනය ඇතැයි දනිමි. මම තා විසින්ද පුදන ලද්දේ වෙමි. මම ස්වර්ගයද ප්‍රාර්ථනා කරන්නේ වෙමි. එහෙයින් පැවිදි වන්නෙමියි රජ තෙම කීයේය.

26 "සෝමදත්ත නම් මළනුවෙනි, මම බොහෝ සෙයින් කලකිරුනේවෙමි. ගිහිගෙයි නොඇල්ම මා මැඩ පවත්වයි. බොහෝ ආහාරයෝද වෙත්. අදම මම පැවිදි වන්නෙමියි බාල සොහොයුරු කැඳවා කීයේය.

27 "සුතසෝම රජ්ජුරුවෙනි, අදම පැවිදිවෙමියි මෙයම ඔබ විසින් කැමතිවන ලදී. එහෙයින් අදම ඔබ පැවිදිවුව මැනව, මමද පැවිදිවන්නෙමියි ඔබගෙන් වෙන්ව සිටින්ට මම නොහැකි වන්නෙමියි බාල සහෝදරයා කීයේය.

28 "අප දෙදෙනාටම පැවිදිවන්ට නොහැකිය. දැනුදු නගරයෙහිද ජනපදයෙහිද නොපිසනු ලැබේ හෙවත් උදුන්වල ගිනි නොදල්වයි. සුතසෝම රජහු පැවිදිවූ කල්හි අපි දැන් කෙසේ කරන්නෙමුදැයි මහජනයා වැළපේ,

29 "මේ ජීවිතය රදවුන්ගේ අළු පෙරහනෙහි ස්වල්පවූ ජලයක් මෙන් හැර ගනීයයි සිතමි. මෙසේ ජීවිතය ඉතා ස්වල්පවූ කල්හි ප්‍රමාදවන්ට සුදුසු කාලය නොවේ.

30 "මේ ජීවිතය රදවුන්ගේ අළු පෙරහනෙහි ස්වල්පවූ ජලයක් මෙන් අල්වා ගනීයයි සිතමි, මෙසේ ස්වල්පවූ ජීවත්වීම ඇති කල්හි ද අඥාන සත්වයෝ ප්‍රමාදවෙත්,

31 "ඔව්හු නරකය වඩත්, තිරිසන් යෝනියද ප්‍රේත අපායද දියුණු කෙරෙත්, තෘෂ්ණා බන්ධනයෙන් බැඳුනාවූ ඔව්හු කාලකඤ්ජ නම් අසුර නිකායද වඩත්යයි මහබෝසත් තෙම කීයේය.

32 "නුදුරු තන්හිවූ පුප්ඵක නම් ප්‍රාසාදය සමීපයෙහි රජස් සමූහය උස්ව නැගේ. අපගේ යශස් ඇත්තාවූ දැහැමිවූ රජහුගේ කෙශයෝ සිඳින ලද්දාහු යයි හඟිමියි මහ ජනතෙම වැළපුනේය.

33 "අන්තඃපුර ස්ත්‍රීන් විසින් පිරිවරණලද රජතෙම යම් තැනෙක්හි හැසුරුණේද, මනාවර්ණ ඇත්තාවූ මල්වලින්ද නොයෙක් මල්මාලාවන්ගෙන්ද ගැවසී ගත්තාවූ මේ තෙම ඒ රජහුගේ ප්‍රාසාදයවේ.

34 "නෑ සමූහයා විසින් පිරිවරණ ලද රජතෙම යම් තැනෙක්හි හැසුරුනේද, යහපත් වර්ණ ඇත්තාවූ මල්වලින් හා නොයෙක් මල්වලින් ගැවසී ගත්තාවූ මෙ ප්‍රාසාදය තෙම ඒ රජහුගේ ප්‍රාසාදයවේ.

35 "අන්තඃපුරවාසීන් විසින් පිරිවරණලද්දාවූ රජතෙම යම් තැනෙක හැසුරුනේද, යහපත් වර්ණ ඇත්තාවූ මල්වලින් හා නොයෙක් මල්මාලාවලින් ගැවසීගත්තාවූ මෙය ඒ රජහුගේ කූටාගාරයවේ.

36 "නෑ සමූහයා විසින් පිරිවරණ ලද්දාවූ රජතෙම යම්තැනෙක්හි හැසුරුනේද, යහපත්වර්ණ ඇති මල්වලින් හා නොයෙක් මල්මාලාවන්ගෙන් ගැවසී ගත්තාවූ මේ කූළුගෙය ඒ රජහුගේ කූළුගෙයවේ.

37 "අන්තඃපුරවාසීන් විසින් පිරිවරණ ලද්දාවූ රජ තෙම යම් තැනෙක්හි හැසුරුනේද, සිත්කළුවූ සියලු කල්හි මනාව පිපියාවූ මේ උද්‍යාන භූමි තොමෝ ඒ රජහුගේ අශොක වන භූමියවේ.

38 "නෑ සමූහයා විසින් පිරිවරණ ලද්දාවූ රජතෙම යම්තැනෙක්හි හැසුරුනේද, හැමකල්හි මනාව පිපියාවූ සිත් කළුවූ මෝතොමෝ ඒ රජුගේ අශොකවන භූමියවේ.

39 "අන්තඃපුරවාසීන් විසින් පිරිවරණ ලද්දාවූ රජතෙම යම් තැනෙක හැසුරුනේද, රම්‍යවූ හැම කල්හි මනාව පිපියාවූ මේ උයන ඒ රජහුගේ උයනවේ.

40 "නෑ සමූහයා විසින් පිරිවරණ ලද්දාවූ රජතෙම යම් තැනෙක්හි නිතර හැසුරුනේද, සිත්කළුවූ සියලු කල්හි මනාව පිපියාවූ මේ උයන ඒ රජුගේ උයනවේ.

41 "අන්තඃපුරවාසීන් විසින් පිරිවරණ ලද්දාවූ රජ තෙම නිතර හැසුරුනේද, ඒ රජහුගේ හැම කල්හි මනාව පිපියාවූ සිත්කළුවූ ඒ මේ කිණිහිරි වනයවේ.

42 "නෑ සමූහයා විසින් පිරිවරණ ලද්දාවූ රජතෙම යම් තැනෙක්හි නැවත නැවත හැසුරුනේවේද, ඒ රජහුගේ සිත්කළුවූ සියලු කල්හි මනාව පිපියාවූ ඒ මේ කිණිහිරි වනයවේ.

43 "යම්තැනෙක්හි අන්තඃපුරවාසීන් විසින් පිරිවරණ ලද්දාවූ රජතෙම නැවත නැවත හැසුරුනේද ඒ රජහුගේ සිත්කළුවූ හැම කල්හි මනාව පිපියාවූ ඒ මේ පළොල් වනයවේ.

44 "යම් තැනෙක්හි නෑ සමූහයා විසින් පිරිවරණ ලද්දාවූ රජතෙම නැවත නැවත හැසුරුනේද, ඒ රජහුගේ සිත්කළුවූ හැම කල්හි මනාව පිපියාවූ ඒ මේ පළොල් වනයවේ.

45 "යම්තැනෙක්හි අන්තඃපුරවාසීන් විසින් පිරිවරණ ලද්දාවූ රජතෙම නැවත නැවත හැසුරුනේද, ඒ රජහුගේ සිත්කළුවූ සියලු කල්හි මනාව පිපියාවූ ඒ මේ අඹවනයවේ.

46 'යම් තැනෙක්හි ඥාති සමූහයා විසින් පිරිවරණ ලද්දාවූ රජතෙම නැවත නැවත හැසුරුනේද, ඒ රජහුගේ සිත්කළුවූ හැමකල්හි මනාව පිපියාවූ ඒ මේ අඹවනයවේ.

47 "යම් තැනෙක්හි අන්තඃපුරවාසීන් විසින් පිරිවරණ ලද්දාවූ රජතෙම නැවත නැවත හැසුරුනේද, ඒ රජහුගේ පක්ෂීන්

විසින් පිරිවරණ ලද්දාවූ නොයෙක් පුෂ්පයෙන් ගැවැසී ගත්තාවූ මේ පොකුණවේ.

48 "යම්තැනෙක්හි ඥාති සමූහයා විසින් පිරිවරණ ලද්දාවූ රජතෙම නැවත නැවත හැසුරුනේද, ඒ රජහුගේ පක්ෂීන් විසින් පිරිවරණලද්දාවූ නොයෙක් මලින් ගැවසී ගත්තාවූ මේ පොකුණ වේයයි. (පිරිවර ජනයා වැළපෙමින් හැසුරුනේය.)

49 "සුතසෝම රජතෙමේ වනාහි මේ රාජ්‍යය හැර දමා පැවිදිවූයේ හඳනාලද කසටවත් ඇත්තේ හස්ති රාජයෙකු මෙන් තනිවම හැසිරේයයි කීයේය.

50 "පෙර තොප විසින් කරණලද කාමරතී ක්‍රීඩාවන් නොවෙත්වා සිනහ කාරණයන්ද සිහිනොකරව්. වස්තුකාම ක්ලේශ කාමයෝ තොපට හිංසා නොකරත්වා. සුදස්සන නම් නුවර වනාහි සිත්කළුවේමැයි.

51 "දාවල්ද, රාත්‍රියෙහිද අප්‍රමානවූ මෛත්‍රී සිතද වඩව්. ඉක්බිති කරණලද පින්කම් ඇත්තවුන්ගේ වාසස්ථානයවූ දෙව්ලොවට පැමිණෙව්යයි පිරිසට අවවාද කෙළේය."

---

## පණ්ණාස නිපාතය

**525 නලිනී ජාතකය:-** 1 "නලිනී කුමරිය මෙහි එව, ජනපදය නියගෙන් දා ගියාක්මෙන් වේ. රටද විනාශ වේ. යව, ඒ මාගේ රටට වැසි වළක්වන්නාවූ බ්‍රාහ්මණයා හෙවත් ඉසිසිංග තාපසයා වසඟකරගෙණෙවයි රජතෙම කීයේය.

2 "මහරජ, මම දුක් නොඉවසිය හැක්කෙමි. මම මාර්ගය දැනීමෙහිද දක්ෂ නොවෙමි. වනැතුන් විසින් සේවනය කරණ ලද මහ වනයෙහි මම කෙසේ යන්නෙම්දැයි නලිනී කුමරිය ඇසුවාය.

3 "එම්බා නලිනී කුමරිය, හස්ති යානාවෙන්ද රථයානාවෙන්ද සමෘද්ධවූ ජනපදයට ගොස් සුදුසුතැන්හි දැවමය යානාවෙන්දැයි මෙසේ යව.

4 "හස්ති සේනාවද, අශ්ව සේනාවද, රථ සේනාවද, පාබල සේනාවද ක්ෂත්‍රියයන්ද හැරගෙන යව, තීගේම වර්ණයෙන් හා රූපයෙන් ඒ තාපසයා වසඟයට පමුණුවාගෙණ එන්නෙහියයි රජතෙම කීයේය.

5 "කදලී නම් ධ්වජ සලකුණු ඇත්තාවූ ආභූජිපත්‍ර වනයෙන් පිරිවරණලද්දාවූ සිත්කළුවූ ඉසිසිංග තාපසයාගේ මේ ආශ්‍රමයතෙම දක්නාලැබේ.

6 "මේතෙම ඒ තාපසයා විසින් පුදනලද ගින්නවේ. එහි මේ දුම දක්නාලැබේ. මහත් ඍද්ධි ඇත්තාවූ ඉසිසිංග තාපසතෙම ගිනිපුදායයි සිතමියි කීයේය.

7 "ඉසිසිංග තාපසතෙම අමුනනලද මිණිකොඩොල් ඇති එන්නාවූ ඇයද දැක බියවූයේ කොළ සෙවිලි කළාවූ අසපුවට පිවිසියේය.

8 "මේ තාපසයාගේ අසපුව දොරටුවෙහිද ඕතොමෝ අවයව දක්වමින් රහස් අවයවද ප්‍රකට කෙරෙමින් පන්දුවකින් ක්‍රීඩාකරයි. පන්සලට වැදුනාවූ තපස්වීතෙම ක්‍රිඩාකරන්නාවූ ඇයද දැක අසපුවෙන් නික්ම මේ වචනය කීයේය.

9 "පින්වත, යම්බඳුවූ ඔබගේ මෙසේ ගියාවූ පන්දුව දුරටද දමනලද්දේ පෙරලා එයද, ඔබහැර නොයයිද, එබඳු ඵල ඇති ගස කිනම්වේදැයි (පන්දුව සඳහා ඇසීය)

10 "එම්බා තාපසය, ගන්ධමාදන පර්වතයෙහිවූ මාගේ අසපුව සමීපයෙහි යම් ගසක මෙසේ ගියාවූ ඵලය දුරටද දමා ගසනලද්දේ පෙරලා ඒද, මා හැරදමා නොයයිද, එබඳු වෘක්ෂයෝ එහි ඇත්තාහයි මෙසේ බොරු කීවාය.

11 "පින්වත්තෙමේ මේ අසපුවට ඒවා, පලවැල අනුභව කෙරේවා. පා දෝනා පැන්ද, කෑයුතු පලවැලද, පිළිගණුව. තොපට දෙමි. මේ ආසනයවේ. පින්වත් තෙමේ මෙහි හිඳගනීවා. පින්වත් තෙමේ මෙයින් අල මුල් හා පලවැල අනුභව කෙරේවායි කියේය.

12 "පින්වත ඔබගේ ඌරුයුග්මය අතර මනාස්පර්ශ ඇති කළුවූවක් මෙන් මේ කුමක්නම් පෙනේද, විචාරණ ලද්දේ මේ

කාරණය මට කියව, ඔබගේ උතුම් අවයවය හෙවත් ලිඟු සටහන ශරීර සංඛ්‍යාත කෝශයෙහි ඇතුල්වීදැයි ඇසීය.

13 "පින්වත් තාපසය මම වනයෙහි අල මුල් හා පලතුරු සොයමින් හැසිරෙන්නේ ඉතා දරුණු ස්වභාව ඇති වලසෙකුට ලංවිමි. ඒ වලසා මා වෙතට පැනගෙණ වහා පැමිණියේ මා පෙරලා මාගේ උතුම් අවයවය කටින් ඩැහැ උදුරා ගත්තේය.

14 "ඒ මේ වනයතෙම සෑරෙයි. කැසීමද කෙරෙයි එහෙයින් සියලුකල්හිම මම සුවයක් නොලබමි. පින්වත් තෙමේ මේ කැසීම දුරුකරන්ට සමර්ථවේ. මා විසින් යාඥා කරණලද පින්වත්තෙමේ බ්‍රාහ්මණයාගේ මේ කටයුත්ත කෙරේවායි (තාපස කන්‍යාව කීවාය.)

15 "පින්වත ඔබගේ මේ වනයතෙම ගැඹුරු ස්වභාව ඇත්තේය. රතු පැහැ සහිතය. කුණුමස් නැත්තේය. මඳ මද ගඳ ඇත්තේය. මහත්වූයේද වේ. පින්වතා යම්සේ අතිශයින් සුවපත්වූවෙක් වන්නේද, එසේ ඔබට කිසියම් කෂාය යෝගය කරමියි ඉසිසිංග තාපසයා කීයේය.

16 "පින්වත් බ්‍රහ්මචාරීය, මන්ත්‍ර යෙදීම්ද, කෂාය යෙදීම්ද, ඖෂධයෝද යන මොහු මෙය පහසු බවට නො පමුණුවත්. යම්සේ මම ඉතා සුව ඇත්තෙක් වන්නෙම්ද එපරිද්දෙන් ඔබගේ මෘදුවූ යම් අවයවයක්වේද, එයින් මේ කැසීම දුරුකරවයි නලිනීතොමෝ කීවාය.

17 "මෙතනින් කවර දිශාවෙක්හි පින්වතාගේ අසපුව වේද, කිම පින්වතා වනයෙහි සිත්අලවන්නෙහිද, කිම ඔබට අල මුල් හා පලතුරු බොහෝ වේද, කිමෙක පින්වතාට වන මෘගයෝ හිංසා නොකෙරෙද්දැයි ඉසිසිංග තාපසයා ඇසූයේය.

18 "පින්වත, මෙතැනින් ඍජුව උතුරුදිශාවෙහි ඛෙමා නම් ගංගාව හිමවත් පර්වතයෙන් ගලාබසියි. ඒ ගඟ ඉවුරෙහි මාගේ සිත්කළු අසපුව වේ. පින්වතා මාගේ අසපුව දක්නේ නම් යහපති.

19 "එහි අඹ ගස්ද, සල් ගස්ද, එරහැන්ද ගස්ද, දඹ ගස්ද, ඇසල ගස්ද, පළොල් ගස්ද, පිපියාහුවෙත්. හාත්පස කිඳුරන්

විසින් ගායනාකරණ ලද්දේද වේ. පින්වත්තෙමේ මාගේ අසපුව දක්නේනම් යහපති.

20 "මෙහි වර්ණයෙන් හා සුවඳින් යුක්තවූ තල්ගස්ද, තල් අලද, තල් ගෙඩිද, ඇත්තාහ. ඒ ආශ්‍රමය මෙබඳු භූමි ප්‍රදෙශයන්ගෙන් යුක්තවේ. පින්වත් තෙමේ මාගේ අසපුව දක්නේ නම් යහපති.

21 "මෙහි වර්ණයෙන්ද, ගන්ධයෙන්ද, රශයෙන්ද යුක්තවූ පලතුරුද, අල මුල්ද, බොහෝ වෙත්. ඒ ප්‍රදේශයට වැද්දෝද එන්නාහ. එයින් මාගේ අල මුල් හා පලතුරු ඒ වැද්දෝ හැරනොගනිත්වායි නලිනී තොමෝ කීවාය.

22 "යහළු තාපසය, මාගේ පියා අල මල් හා පලතුරු සෙවීමට ගියේ දැන්. සවස්වූකල්හි එයි. පියතෙමේ යම්තාක් කල් අල, මුල් හා පලතුරු සෙවීමෙන් පැමිණේද, ඒතාක් සිටුව ආකල්හි කියා අපි දෙදෙනම ඒ අසපුවට යන්නෙමුයි ඉසිසිංගතෙම කීයේය

23 "යහළු තාපසය, අන්‍යවූද බොහෝ යහපත් ස්වභාව ඇති බ්‍රාහ්මණ ඍෂීහුද රාජඍෂීහුද මාගේ අසපුවට යන මග දෙපස වාසය කරත්. මාගේ ඒ අසපුව ඔවුන් අතින් විචාරව ඔව්හු ඔබ මාගේ සමීපයට පමුණුවන්නාහුයයි කියා ගියාය.

24 "පුත්‍රය, නුඹ විසින් දර නොකඩනලදහ. නුඹවිසින් දිය නොගෙණෙනලදී නුඹ විසින් ගින්නද නොදල්වන ලද්දේය. කුමක් හෙයින් බාලයෙකු මෙන් සිතන්නෙහිද,

25 "බ්‍රහ්මචාරීවූ ඉසිසිංග තාපසය, පෙර දවස් නුඹ විසින් දර බිඳිනලදහ. ගිනිද පුදන ලද්දේමවේ. ගිනිතපින උපකරණද තා විසින්ම සපයනලදහ. මට හිඳගැනීමට පුටුවද තබනලද්දේවේ. පා දෝනා දියද එළවනලද්දේවේ. නුඹ ශ්‍රෙෂ්ඨයෙක්ව මේ අසපුවෙහි සිත් ඇලවූයෙහිය.

26 "මාගේ පුත්‍රය, අද නුඹ නොබිඳිනලද දර ඇත්තේ වෙහිය. නොගෙණෙනලද දිය ඇත්තේවෙහිය. නොදල්වන ලද ගිනි ඇත්තේ වෙහිය. පිළියෙළ නොකරණ ලද භෝජන

ඇත්තේවෙහිය. මා හා නුඹ කථා නොකරන්නෙහිය නුඹගේ කුමක්නම් නැතිවූයේද සිතෙහි හටගත්තාවූ කෙබඳු දුකක් හෝ වීදැයි පිය තවුස්තෙම ඇසීය.

27 "පියාණෙනි, ජටාධරවූ තාපසයෙක් මෙහි ආයේය. ඉතා දැකුම්කටයුතුවූ මනා ශරීරයක් ඇත්තාවූ හෙතෙම මේ අසපුව බබුලුවයි. ඉතා දික් නොවූයේද, ඉතා කොට නොවූයේදවේ. ඒ පින්වත් තාපසයාගේ ඉතා කළු පැහැ ඇත්තාවූ හිසකෙස්වලින් වැසුනු හිසවේ

28 "රැවුල හටනොගන්නේය පැරැණි ස්වභාව ඇත්තෙක් නොවේ. ඔහුගේ බොටුවෙහි වනාහි පාත්‍රාධාරබඳු වූවක්දවේ (මුතුහර සඳහා කීය.) ඔහුගේ ලයෙහි උභය පාර්ශවයෙහි මනාව හටගත්තාවූ රන් පන්දු වැනිවූ පැහැ විහිදෙන්නාවූ ගණ්ඩයෝ දෙදෙනෙක්ද වෙත්. (පියවුරු සඳහා කීය.)

29 "ඔහුගේ මුහුණද බොහෝසෙයින් දැකුම්කටයුතුවේ. කන්වල අගින් නැමුනාහුද එල්බෙත් (කුණ්ඩල සඳහා කීය) එහා මෙහා යන්නාවූ මානවකයාගේ ඒ කුණ්ඩලයෝ ජටාවන් එකතුකළාවූ යම්හුයක් ඇද්ද, එයද බබුළුවත්.

30 "ඔහුගේ අන්‍යවූද, නිල්වූද, රන්වන්වූද රතුපැහැවූද සුදුපැහැවූද පළඳනා සතරක් වෙත්. එහා මෙහා යන්නාවූ මානවකයාගේ ඒ පළඳනාවෝ වර්ෂා කාලයෙහි රැහි සමූහයා මෙන් නාද කෙරෙත්. (මෙවුල්දම සඳහාකීය.)

31 "හෙතෙම මුදුතණවලින් කළ මෙවුල්දම් නොදරයි. කෙඳිවලින් වියනලද මෙවුල්දම්ද නොදරයි. බබුස්තණවලින් කළ මෙවුල්දමද නොදරයි. උකුළු අතරෙහි විශෙෂයෙන් ඇළුනාවූ ඔහුගේ වැහැරි අහසෙහි සිය රැලි විදුළියක් මෙන් බබළත්.

32 "පියාණෙනි, ඔහුගේ නාභියෙන් යට කටියෙහි බඳනාලද්දාවූ සවිනොකරණ ලද්දාවූ නටු නැත්තාවූ ඵල කෙනෙක් වෙත්. නොගටන ලද්දාවූ ඒ ඵලයෝ නිතර කිලින් යන අනුකරණ කෙරෙත්. පින්වත් පියාණෙනි, ඒ කිනම් ගස්වල ගෙඩිද,

33 "පියාණෙනි, ඔහුගේ ජටාවද බොහෝ සෙයින් දැකුම් කටයුතු සියයකටත් වැඩි වක්වූ අග ඇති සුවඳ ඇත්තීදවේ. දෙපරිදිකොට හිස මනාව බෙදනලද ස්වභාව ඇත්තේය. මගේ ජටාවද එසේ වන්නේ නම් යහපති.

34 "යම් කලෙක්හි හෙතෙම වර්ණයෙන්ද, ගන්ධයෙන්ද යුක්තවූ ඒ ජටාවන් විසුරුවාද, එකල්හි වාතයෙන් කම්පා කරණලද නිළුපුල් වනය පැතිරෙන්නාක්මෙන් මේ වන අසපුව සුවඳ හමයි.

35 "ඔහුගේ ඉතා දැකුම්කටයුතුවූ කය මඩ ඇත්තාවූ මාගේ කය මෙන් නොවේ. හෙතෙම සුළඟින් කම්පාකරණ ලද්දේ වසත්කල්හි මනාව පිපි වනයක් මෙන් සුවඳ හමයි.

36 "හෙතෙම ඉතා විසිතුරුවූ මනොඥවූ දැකුම්කටයුතු වූ ගසක ඵලයක් පොළොවෙහි නැවත නැවත ගසයි. දුරට ගසනලද්දේද ඔහුගේ අතට නැවත පැමිණෙයි. පින්වත් පියාණෙනි, ඒ කවර ගසක පලයක්ද,

37 "ඔහුගේ පිරිසිදු සමවූ සක් ඇට මෙන් පිහිටියාවූ දන්තයෝද අතිශයින් දැකුම්කටයුතු වෙත්. විවෘතකරන්නාවූ ඒ දත් මාගේ සිත පහදවත්. හෙතෙම ඒ දත්වලින් පලා කොළ අනුභව නොකෙළේයයි සිතමි.

38 "ඔහුගේ වචනය කර්කශ නොවෙයි නොගිලිහුනේ වෙයි. නැවත කියන්නේද මෘදුවෙයි. ඍජුවෙයි. උඩඟු නොවෙයි. චපල නොවෙයි. කුරවි කෙවිල්ලන්ගේ මනා ස්වරය වැනිවූ මනොඥවූ සිත් කාවදින්නාවූ හඬ මාගේ සිත අලවාමය.

39 "ඉතා විහිදී නොගියාවූ වචන ඇති අප්‍රකටවූ ස්වරය ඇති හෙතෙම හැදෑරීමෙහි අධිකව යෙදුනේයයි නොසිතමි. ඔහු නැවත දැකීමට කැමැත්තෙමි. ඒ මානවකතෙම පළමු මාගේ මිත්‍රයාවිය.

40 "මනා ගැළපීම් ඇති සියලු තන්හි විශෙෂයෙන් වටවූ මහත්ව හටගත්තාවූ නෙළුම් කැකුලකට බඳුවූ ඔහුගේ මේ වණයක් වීය. ඒ මානවකතෙම මා මත්තෙහි කොට උරු යුග්මය විවෘතකොට ඒ වනයෙන්ම තදකොට කටියෙන් පෙළීය.

41 "ඒ මානවකයාගේ සිරුරෙන් නික්මෙන්නාවූ රශ්මීහු අහස සියරැලි විදුලි මෙන් දිළිසෙත්, ආලෝකකරත්. බැබලීමද කරත්. අඳුන්වන් ලොම් වැනි ලොම් ඇත්තාවූ විසිතුරුවූ වටවූ ඇඟිලි ඇත්තාවූ මෘදුවූ ඔහුගේ බාහුද බබළත්.

42 "ඒ මානවකතෙම කර්කශ නොවූ ශරීර අවයව ඇත්තේ දික්වූ ලොම් නැත්තේද වෙයි. ඔහුගේ නිය දික්වූවාහුද රත් පැහැවූ අත් ඇත්තාහ. යහපත් ස්වභාව ඇත්තාවූ හෙතෙම මෘදුවූ අත්වලින් වැළඳ ගෙණ අභිරමණය කරමින් මට උපස්ථාන කෙළේය.

43 "ගසක පුලුන් වැනිවූ පැහැ විහිදෙන්නාවූ ස්වර්ණමය බඳු මනා සිවිය ඇති ඔහුගේ හස්තයෝ මෘදුවෙත්. ඒ අත්වලින් මා වැළඳගෙණ මෙයින් ගියේය. පියාණෙනි, ඒ ස්පර්ශයෝ මා දවත්.

44 "පියාණෙනි, ඒ මානවකතෙම ඒකාන්තයෙන් තවුස් පිරිකර කද ගෙණ නොගියේය. තෙමේ කෘෂ්ටයන් නොබින්දේ යයි සිතමි. හෙතෙම පොරොවෙන් ගස් නොකැපීයයි සිතමි. ඔහුගේ අත්වල කරගැටද නැත.

45 "වළසෙක් වනාහි ඔහුගේ වනයක් කෙළේය. හෙතෙම මට මා සුවපත් කරවයි කීයේය. මම එය කෙළෙමි. එයින් මටද සැපයක් විය. තාපසයෙනි මම සුවපත්වීමියි හෙතෙම මට කීයේය.

46 'පියාණෙනි, මේ ඔබගේ මාළුවා කොළ ඇතිරියද මා විසින්ද ඔහු විසින්ද විසුරුවන ලද ස්වභාව ඇත්තීමය. ක්ලාන්ත ස්වභාව ඇත්තාවූ ජලයෙහි රමනය කොට නැවත නැවත පන්සලට වැදුනෙමි.

47 'පියාණෙනි, අද මට මන්ත්‍ර නොවැටහෙත්. ගිනි පිදීමද නොවැටහෙයි යාග කිරීමද නොවැටහෙයි. යම්තාක් ඒ තාපසයා නොදක්නෙම්ද, ඒතාක් ඔබගේ අලමුල් හා පලතුරුද අනුභව නොකරන්නෙමි.

48 'පියාණෙනි, ඒකාන්තයෙන් යම් දිශාවෙක්හි ඒ තාපසයා වෙසේයයි ඔබ දන්නෙහිද පියාණෙනි, ඒ දිශාවට මා වහා පමුණුවනු මැනව, ඔබගේ අසපුවෙහි මම නොමැරෙම්වා

49 "විසිතුරු මල් ඇත්තාවූ පක්ෂීන් විසින් සෝෂා කරණ ලද්දාවූ පක්ෂි සමූහයා විසින් සේවනය කරන ලද්දාවූ වනයකැයි මා විසින් අසනලදී. පියාණෙනි, මා ඒ වනයට ඔබගේ අසපුවෙහි දිවි හැරීමට පළමු වහා පමුණුවනු මැනවැයි වැළපෙමින් කීයේය.

50 "හෝමාග්නියෙන් බබළන්නාවූ ගාන්ධර්වයන්ගේ හා දෙවියන්ගේ අප්සරා සමූහයා විසින් සේවනය කරණ ලද්දාවූ පැරණිවූ ඍෂීන්ගේ වාසස්ථානවූ මේ වනයෙහි කිසිවෙක් මෙබඳුවූ නොඇල්මකට නොපැමිණියේය.

51 "ලොව සමහරුන්ට මිත්‍රයෝද වෙත්. තවද සමහරෙකුට මිත්‍රයෝද නොවෙත්. ඔවුන්ගෙන් සමහරු නෑයන් කෙරෙහිද මිත්‍රයන් කෙරෙහිද ප්‍රෙමය කරත්. යමෙක්තෙම කොයින් ආයෙම්දැයි නොම දන්නීද, ඒ මේ ලාමකවූ ඉසිසිංග තෙම කුමක් හෙයින් මේ මාගම කෙරෙහි මිත්‍රයාය යන සංඥාවෙන් ඇතුළත් වූයේදැයි සිතීය.

52 "පුත්‍රය, එක්ව වාසය කිරීමෙන් වනාහි මිත්‍රයෝ නැවත නැවත එක්වෙත්. ඒ මිත්‍රතෙමේම එකතු නොවන්නහුගේ එක්ව වාසය නොකිරීමෙන් වැනසේ.

53 "පුත්‍රය, එහෙයින් ඉදින් නුඹ ඒ තපස්වීහු දන්නෙහි නම් ඉදින් නුඹ ඒ තාපසයා සමග කථා කරන්නෙහි නම් සමෘද්ධවූ සශ්‍යය මහත් ජලයකින් හැර ගන්නාක්මෙන් මේ තමන්ගේ තපො ගුණය වහා පැහැර ගන්නේය.

54 "පුත්‍රය, ඉදින් නැවතද ඒ තපස්වියා දක්නෙහිද, ඉදින් නැවතද තපස්වියා හා කථා කරන්නෙහිද, සමෘද්ධවූ සශ්‍යයක් මහ ජලයකින් හැරගෙණ යන්නාක්මෙන් මේ ශ්‍රමණ තේජස වහා හැරගන්නේය.

55 "පුත්‍රය, මනුෂ්‍යලෝකයෙහි මේ යක්ෂණී සංඛ්‍යාතවූ භූතයෝ විවිධ රූපවලින් යුක්තව හැසිරෙත්. සප්‍රඥවූ මනුෂ්‍යයෙක්තෙම ඔවුන් සේවනය නොකරන්නේය. බ්‍රහ්මචාරීවූ තාපසතෙම ඇයට ලංව නස්නේයයි තාපසතෙම පුත්‍රයාට අවවාද කෙළේයයි" වදාළේය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**526 උම්මදන්ති ජාතකය:-** 1 "එම්බා සුනන්ද නම් සාරථිය, පඬුවන්වූ හෙවත් රතු ගඩොලින් නිමවූ ප්‍රාකාරයෙන් වට කරණලද මේ ගෘහය කවරෙකුගේද, අහසෙහි පර්වත මුදුනෙක්හිවූ බබළන්නාවූ ගිනි කඳක් මෙන් දුර කවුළුව සමීපයෙහි සිටියාවූ කවර තැනැත්තියක් ගිනි සිලක් මෙන් දක්නා ලැබේද,

2 "සුනන්දය, මෝතොමෝ කවරෙකුගේ දියණියක් වේද, මෝතොමෝ කවරෙකුගේ යෙහෙළියක්ද නොහොත් කවරෙකුගේ බිරිඳක්ද මෝතොමෝ අපගතවූ ආවරණ ඇත්තියක්ද නොහොත් මැට ස්වාමියෙක් ඇත්තේදැයි විචාරණ ලද්දේ මෙහිදීම මට වහා කියවයි, (සිවීරජතෙම උමතුවෙන් ඇසීය)

3 "ජනාධිපතිවූ මහරජ, මව් පසින්ද පිය පසින්ද මෑ වනාහි මම දනිමි. තවද මෑගේ ස්වාමියාද දනිමි. දේවයන් වහන්ස, රෑ දාවල් දෙක්හි ඔබගේ වැඩෙහි අප්‍රමාදවූ හෙතෙම ඔබගේම පුරුෂයෙකි.

4 "ජනාධිපතිවූ මහරජ, සමෘද්ධවූද වස්ත්‍රාලංකාරයන් ගෙන් පිරුණාවූද මනාව ආඪ්‍යවූද හෙතෙම ඔබගේ එක්තරා ඇමතියෙක්ම වේ. මහරජ, දුටුදුටු පුරුෂයන් උමතු කරවන හෙයින් නමින් උම්මාදන්තී නම්වූ මෝතොමෝ ඒ අභිපාරක නම් ඇමතියාගේ භාර්‍ය්‍යාව වේයයි සාරථිතෙම කීයේය.

5 "පින්වත, පින්වත, මෑගේ මේ නම මව විසින්ද පියා විසින්ද ඉතා යහපත් කොට කරණලදී. ඒ එසේමැයි මා දෙස බලන්නීවූ උම්මාදන්තී තොමෝ මා උමතුවූවෙකු කෙළේ යයි (රජතෙම කීයේය.)

6 "පූර්ණ චන්ද්‍රයාගෙන් යුත් රාත්‍රියෙහි මුවදෙනක මෙන් මද බැළුම් ඇත්තාවූ රත්පියුම් බඳු ශරීර ඇති යම් ස්ත්‍රියක් තොමෝ කවුළුව සමීපයෙහි හුන්නීද, පරෙවි පා වැනි රතු වස්ත්‍ර හැන්දාවූ ඇය දැක එදවස්හි චන්ද්‍රයෝ දෙදෙනෙක් වූහයි සිතුවෙමි.

7 "යම් කලෙක්හි ඕතොමෝ මනොඥවූ යහපත්වූ මහත්වූ ඇස් හෙළීම්වලින් මා පොළඹවමින් බැලීද, එකල්හි කම්පාවන්නාවූ ඕතොමෝ වනයෙහිවූ පර්වතයෙක්හි උපන්නාවූ කිඳුරු ධෙනුවක්මෙන් මාගේ සිත හැර ගැනීමය.

8 "එකල්හි වනාහි මහත්වූ ස්වර්ණමෙන් ශ්‍යාමවර්ණවූ අමුනනලද මිණි කොඬොල් ඇත්තාවූ එක් වස්ත්‍රයක් හැන්දාවූ ඒ ස්ත්‍රීතොමෝ භ්‍රාන්තවූ මුවදෙනක් මෙන් මා දෙස බැලීය.

9 "තඹවන් නිය ඇත්තාවූ යහපත් ලොම් ඇත්තාවූ මෘදුවූ බාහු ඇත්තාවූ සඳුන් කල්ක ගල්වන ලද්දාවූ වට ඇඟිලි ඇත්තාවූ යහපත්වූ ඒ ස්ත්‍රීතොමෝ කවර කලෙක්හි දක්ෂව කටයුතු කිරීමෙන් මා සතුටු කරන්නේදැයි (කියමින් රජතෙම වැළපුනේය.)

10 "කවර කලෙක්හි ස්වර්ණමය උරවැස්මෙන් අලංකාරවූ කෘශවූ මධ්‍ය ප්‍රදේශ ඇති තිරිටි නම් සිටුහුගේ ධීතෘතොමෝ මහත්වූ වනයෙහි හටගත් වෘක්ෂයක් මාළුවා වැලමෙන් මෘදුවූ අත්වලින් මා වැළඳගන්නේද,

11 "කවර කලෙක්හි ලාක්ෂාරශ පොවන ලද්දක් මෙන් මනා සිවි ඇත්තාවූ දියබුබුල් මෙන් වටවූ පයෝධර ඇත්තාවූ රත්පියුම් බඳු ශරීර ඇති ඕතොමෝ සුරාසොඬ වූවෙකුට සුරා සොඬ වූවෙක් මෙන් සුරාපානය පිණිස තලු තැටිය මෙන් මුඛයෙන් මුඛයට ලංවන්නේද,

12 "යම් කලෙක්හි සිත් කළුවූ සියලු ශරීර අවයව ඇති සිටින්නාවූ ඇය දිටීම්ද, එතැන්සිට මාගේ සිතට මම අධිපති නොවෙමි. කිසිවකුත් මම නොදනිමි.

13 "අමුනන ලද මිණි කොඬොල් ඇති උම්මාදන්තීය දැක මම දහසක් පැරදුනෙකුමෙන් රෑ දාවල් නිදි නොලබමි.

14 "එක රැයක් හෝ දෙරැයක් හෝ අභිපාරක වන්නෙම්වා. උම්මාදන්තීය සමග අභිරමනය කොට ඉන්පසු සිවි රජ වන්නෙම්වායි ශක්‍රතෙමේ මට වරයක් දෙන්නේනම් මම ඒ වරය ලබන්නෙමියි රජතෙම උමතුව වැළපුනේය.

15 "මහරජ, බලිකර්ම වශයෙන් භූතයන් නමස්කාර කරන්නාවූ මට යක්ෂතෙම පැමිණ රජහුගේ සිත උම්මාදන්තිය කෙරෙහි ඇතුළත්වීය යන මේ කාරණයම කීයේය. ඔබට ඒ උම්මාදන්තිය දෙමි. පරිචාරිකා කරවයි. (ඇමති තෙම කීයේය.)

16 "යහළු අභිපාරකය, එසේ ඇතිකල්හි මම පිනෙන් පිරිහෙන්නෙම් අමරනීයද නොවෙමි. මහජනතෙමේද මාගේ මේ ලාමක කමයයි දැනගන්නේය. ප්‍රියවූ උම්මාදන්තිය දී පසුව නොදැක්මෙන් ඔබගේ සිතටද මහත්වූ දුක්වන්නේයයි (රජතෙම කීයේය.)

17 "ජනාධිපතිය, ඔබද මාද හැර අන් සියල්ලෝම මා විසින් ඔබට උම්මාදන්තිය දෙන ලද්දීය යන යමක්වේද, කළාවූ ඒ කර්මය නොදනිත්. එහෙයින් රජතෙමේ ඒ ආශාව දියුණු කරණු මැනව. ඉන්පසු මා වෙත හැර දමනු මැනව

18 "ලාමකවූ කර්මයන් කරන්නාවූ යම් මනුෂ්‍යයෙක් වේද, හෙතෙම අන්‍යයෝ මේ කර්මය නොදනිත්වායි සිතයි. ලෝකයෙහි යම් ඍද්ධිමත් මනුෂ්‍යයෝ වෙද්ද, ඔව්හුද භූතයෝද මේ පාප කර්ම කරන්නහු දකිත්.

19 "අභිපාරකය, ලෝකයෙහි අන්කිසි මිනිසෙක් උම්මාදන්තිය මට ප්‍රිය නැතැයි තොපගේ මේ අදහස අදහන්නේද, ප්‍රියවූ උම්මාදන්තිය දී පසුව නොදැකීමෙන් තොපගේ සිතටද මහත් දුකක් වන්නේය.

20 "ජනාධිපතිවූ මහ රජ්ජුරුවෙනි, ඒකාන්තයෙන් මෝ තොමෝ මට ප්‍රිය වන්නීය. ඕතොමෝ මට අප්‍රිය නොවන්නීය. ස්වාමීනි, ගල් ගුහාවකට පැමිණෙන්නාවූ සිංහයෙකු මෙන් ඔබවහන්සේ උම්මාදන්තිය වෙතට යනු මැනවැයි ඇමතිතෙම කීයේය.

21 "ප්‍රාඥයෝ තමහටවූ දුකින් පෙළුනාහු සැප විපාක ඇති කර්මය හැර නොදමත්. සැපයෙන් මත්ව මුළාවූවහු හෝ පාප කර්මයද නොකරත්යයි රජතෙම කීයේය.

22 "සිවි මහරජුනි, ඔබ වනාහි මාගේ මවද පියාද ස්වාමියාද පෝෂණ කරන්නාද දේවතාද වේ. පුත්‍ර දරාවන් සහිතවූ මම

ඔබගේ දාසයා වෙමි. සැපවූ පරිදි ඔබ කැමැත්තක් කරවයි, ඇමතිතෙම කීයේය.

23 "යමෙක් අධිපති වෙමියි පාප කර්මයක් කෙරේද, හෙතෙම පාප කර්මය කොටද අනුන්ගේ අපවාදයට බිය නොවේද, කර්මයෙන් හෙතෙම දීර්ඝ කාලයක් ජීවත් නොවේ දෙවියෝද ඔහු ලාමක වශයෙන් සලකත්යයි රජතෙම කීයේය.

24 "මහරජ, අන් සතු හිමියන් විසින් දෙනලද්දාවූ දානයක් ධර්මයෙහි පිහිටියාවූ යම් කෙනෙක් පිළිගනිද්ද, එහි පිළිගන්නෝද දෙන්නාහුද සැප විපාක ඇත්තාවූම කර්මයක් කරත්යයි ඇමතිතෙම කීයේය.

25 "අභිපාරකය, මේ ලෝකයෙහි යම්කිසි මිනිසෙක් ඕතොමෝ මට ප්‍රිය නොවන්නීයයි තොපගේ මේ කීම අදහන්නේද, ප්‍රියවූ උම්මාදන්තිය දී පසුව නොදැක්මෙන් තොපගේ සිතටද මහත් දුකක් වන්නේයයි රජතෙම කීයේය.

26 "ජනාධිපතිය, ඒකාන්තයෙන් මට මෝතොමෝ ප්‍රිය වන්නීය මහරජ, ඕතොමෝ මට අප්‍රිය වන්නී නොවෙයි. යම්හෙයකින් මා විසින් ඔබට උම්මාදන්තිතොමෝ දෙන ලද්දීද, එහෙයින් රජතෙමේ කාම තෘෂ්ණාව වර්ධනය කරව, නැවත මා වෙත හැර දමවයි ඇමතිතෙම කීයේය.

27 "යමෙක් තමහට වූ දුකින් අනුන් හට දුකක් හෝ සැපයෙන් තමහට සැපයක් හෝ පිහිටුවාද, මට මෙය යම්සේ වේද, අනුන්ටද එසේමයයි යමෙක් කෙසේ දනීද, හෙතෙම ධර්මය දන්නේවේයයි රජතෙම කීයේය.

28 "අභිපාරකය, මේ ලෝකයෙහි අන්‍යවූ කිසි මිනිසෙක් මට මෝතොමෝ ප්‍රිය නොවන්නීයයි තොපගේ කීම් අදහන්නේද, ප්‍රියවූ උම්මාදන්තිය දී පසුව නොදැක්මෙන් තොපගේ සිතටද මහත් දුකක් වන්නේය.

29 "ජනාධිපතිය, මෝතොමෝ මට ප්‍රිය වන්නීයයි දන්නෙහි. දේවයන් වහන්ස, මට ඈ අප්‍රිය නොවන්නීය.

ජනාධිපතිය, මට ප්‍රියවූවකින් ඔබට ප්‍රියවූවක් දෙමි. දේවයන් වහන්ස, ප්‍රියවූවක් දෙන්නාහු පසුව ප්‍රියවූවක් ලබත්.

30 "ඒ මම ඒකාන්තයෙන් කාම හේතුවෙන් තමන්ට හිංසා නොකරන්නෙමි. මම වනාහි අධර්මයකින් ධර්මයක් නසන්ට උත්සාහ නොකරන්නෙමි.

31 "ජනාධිපතිවූ නරවීර ශ්‍රෙෂ්ඨය, ඉදින් ඔබ මාගේ ඒ බිරිඳ නොකැමැත්තෙහි නම් සිවි රජතුමනි මම ඇය සියලු දෙනාට හැර දමමි. මා විසින් මුදන ලද්දාවූ ඇය ඉන්පසු කැඳවා ගණුමැනවැයි අභිපාරකතෙම කීයේය.

32 "හිතකාරීවූ අභිපාරකය, ඔබ ඉදින් දූෂ්‍ය නොකට යුතු ඇය හැර දමන්නෙහි නම් එය තොපට අහිත පිණිස වන්නේය. තොපට මහත්වූ උපවාදයෙක්ද වන්නේය. නගරයෙහිද තොපට ජනයා පක්ෂ නොවන්නේයයි රජතෙම කීයේය.

33 සිවි මහරජාණෙනි, මේ දෝෂයද නින්දාවද ප්‍රශංසාවද ගැරහීමද යන සියල්ල මම ඉවසන්නෙමි මට මෙය පැමිණේවා. සැපවූ පරිදි ඔබ කැමැත්තක් කරවයි, අභිපාරක තෙම කීයේය.

34 "යමෙක් නින්දාව නොමගනීද, නැවත ප්‍රශංසාව නොගනීද, ගැරහීම නොගනීද, පූජාව නොගණීද ගොඩබිමින් මනාව වර්ෂා කළාවූ ජලයක් මෙන් ඒ පුරුෂයා කෙරෙන් ඓශ්වර්‍ය්‍ය නම්වූ ශ්‍රී තොමෝද ප්‍රඥා නම්වූ ලක්ෂ්මී තොමෝද පහව යේයයි රජතෙම කීයේය.

35 "මෙපමණකින් යම්කිසි දුකක්ද සැපක්ද ධර්මය ඉක්ම යාමක්ද සිතට දුකක්ද වේනම් ඒ සියල්ල රහතුන්ගේද පෘථග්ජනයන්ගේද සියල්ල පිළිගන්නාවූ පෘථිවිය මෙන් මම හෘදයෙන් පිළිගන්නෙමියි ඇමතිතෙම කීයේය.

36 "අන්‍යයන්ගේ ධර්මය ඉක්ම යාමද සිතට වන්නාවූ දුකද කායික දුකද මම නොකැමැත්තෙමි. එකළාවූද මම ධර්මයෙහි පිහිටියේ කිසිවකුත් නොපිරිහෙළමින් මේ දුඃඛ භාරය එතෙර කරන්නෙමියි රජතෙම කීයේය.

37 "ජනාධිපතිය, ඔබ මට අන්තරායක් නොකෙළේද එය ස්වර්ගයට පැමිණෙන්නාවූ පුණ්‍යකර්මයකි. බමුණන්ට රජෙක් යාග පිණිස දෙන්නාවූ ධනයක් මෙන් ප්‍රසන්නවූ මම උම්මදන්තිය ඔබට දෙමියි ඇමති තෙම කීයේය.

38 "හිතකාරීවූ සේනාපතිය, ඒකාන්තයෙන් ඔබ මට වැඩ කැමැත්තෙහිය. උම්මදන්තී තොමෝද ඔබද මාගේ යහළුවෝය. දෙවියෝද බ්‍රහ්මයෝද සියලු රටවැස්සෝද මෙය දැන නින්දා කරන්න හුය. පරලොව විපාක දෙන්නාවූ පාපයක්ද දක්නෙමියි රජතෙම කීයේය.

39 "සිවිරජතුමනි, නියම්ගම් වැස්සන් සහිතවූ දනව් වැසි සියල්ලෝද මා විසින් ඔබට උම්මදන්තී තොමෝ දෙන ලද්දීය යන යමක් වේනම් මෙය අධර්මයකැයි නොකියන්නා හුය, එබැවින් රජතෙමේ ඒ කාම තෘෂ්ණාව දියුණු කෙරේවා නැවත ඇය මා වෙතට හැර දමාවායි ඇමතිතෙම කීයේය.

40 "හිතකාරීවූ සේනාපතිය, ඒකාන්තයෙන් ඔබ මට වැඩ කැමැත්තෙහිය. උම්මදන්තී තොමෝද ඔබද මාගේ යහළුවෝය. මනාකොට ප්‍රකාශ කරණලද්දාවූ සත්පුරුෂ ධර්මයෝ මුහුදු වෙරල මෙන් නොඉක්මවිය හැක්කාහුයයි රජතෙම කීයේය.

41 "දේවයන් වහන්ස, ඔබ මාගේ පිදිය යුත්තාද වෙහිය. හිතානුකම්පා ඇත්තාද වෙහිය. දරන්නාද වෙහිය. විධාන කරන්නාද වෙහිය. කැමති දෑ පාලනය කරන්නාද වෙහිය. එහෙයින් ඔබ කෙරෙහි පුදනලද්දී මහත්ඵල වන්නීය මාගේ කැමැත්තෙන් උම්මාදන්තිය පිළිගණු මැනවැයි, ඇමතිතෙම කීයේය.

42 "කතා නමැත්තහුගේ පුත්‍රවූ අභිපාරකය ඔබ ඒකාන්තයෙන්ම මට හිතවූ සියලු ධර්මයෙහි හැසුරුණේය. මේ මනුෂ්‍ය ලෝකයෙහි දෙපා ඇත්තාවූ අන් කවරනම් මිනිසෙක් මේ අරුණෙහි ඔබට සුවයක් කරන්නේ දැයි" රජ තෙම ඇසීය.

43 "මහරජ, ඔබ ශ්‍රෙෂ්ඨද වෙහිය. ඔබ උතුම්වූවෙක්ද වෙහිය ඔබ ධර්මය රක්නා ලද්දෙක්ද ධර්මය දක්නෙක්ද මනානුවණ

ඇත්තේද වෙහිය. ධර්මය රක්නාලද්දාවූ ඒ ඔබ බොහෝ කලක්ද ජීවත්වුව මැනව. ධර්මය රක්නාවූ දේවයන් වහන්ස, මටද ධර්මය දෙශනා කරණු මැනවැයි" ඇමැති තෙම කීයේය.

44 "අභිපාරකය, එසේ නම් මාගේ වචනය අසව, සත් පුරුෂයන් විසින් සේවනය කරණලද්දාවූ ඒ ධර්මය මම තොපට දෙශනා කරන්නෙමි.

45 "දහම් කැමැති වන්නාවූ රජතෙම යහපත්වේ. නුවණැති මනුෂ්‍යතෙම යහපත්වේ. මිත්‍රයන් දූෂණය නොකරන්නා යහපත්වේ. පව්නොකිරීම සැපයට කරුණුවේ.

46 "නොකිපෙන සුළුවූ ධර්මයෙහි පිහිටියාවූ රජහුගේ රාජ්‍යයෙහි මිනිස්සු ස්වකීය ගෘහයෙහි සිහිල් සෙවනින් යුක්තව සුවසේ වාසය කරන්නාහුය.

47 "අපරීක්ෂාවෙන් කරණලද මේ කර්මයද මම කැමති නොවෙමි. යම් කෙනෙක් හෝ සොයා දැන තුමූ කටයුතු කෙරෙත් නම් එය කැමැත්තෙමි. මෙහි මාගේ මේ උපමාවන් නුඹ අසව,

48 ඉදින් ගමන් කරන්නාවූ ගවයන්ගෙන් ප්‍රධාන ගව තෙම වක්ව යේනම් පෙරටුව යන්නා වක්ව යන කල්හි ඒ සියලු ගවයෝ වක්ව යෙද්ද,

49 "මෙපරිද්දෙන්ම ශ්‍රෙෂ්ඨයයි සම්මතවූ යමෙක් වේද, ඉදින් හෙතෙම අධර්මයෙහි හැසිරේ නම් සෙසු සත්වයෝ කියනුම කවරේද? රජතෙමේ ඉදින් අධාර්මික වේ නම් සියලු රටවැසියා දුකසේ වාසය කරයි.

50 "ගමන් කරන්නාවූ ගවයන්ගෙන් ඉදින් ප්‍රධාන ගවතෙම ඍජුවයේද, ඉදිරියෙහි යන්නාවූ ගවයා ඍජුව ගිය කල්හි ඒ සියලු ගවයෝ ඍජුව යෙද්ද,

51 "මෙපරිද්දෙන්ම මිනිසුන් අතරෙහි ශ්‍රෙෂ්ඨයයි සම්මතවූ යමෙක්වේද, ඉදින් හෙතෙමේද ධර්මයෙහි හැසිරේ නම් අවශෙෂ ප්‍රජාව කියනුම කවරේද? ඉදින් රජතෙමේ ධාර්මිකවේ නම් සියලු රට වැසියා සුවසේ වාසය කරයි.

52 "අභිපාරකය, මමද අධර්මයෙන් දෙවත්වය නො පතන්නෙමි. මේ සියලු පෘථිවිය හෝ දිනන්ට නො කැමැත්තෙමි.

53 "මේ ලෝකයෙහි මිනිසුන් අතර ගවයන්ද දාසයන්ද අමුරන්ද වස්ත්‍ර ජාතිද රන්වන් සඳුන්ද යන යම්කිසි රත්න ජාතියක් විද්‍යමානවේද,

54 "අශ්වයෝද ස්ත්‍රීහුද සප්තවිධ රත්නද මා හැඟි භාණ්ඩද යන යමකුත් මේ චන්ද්‍ර සූර්‍ය්‍යයෝ එලිය කරමින් රකිත්ද, ඒ සක්විති රජය හේතුකොට ගෙණද විෂමව නොහැසිරෙන්නේය. යම් හෙයකින් මම සිව්රජුන් අතර ශ්‍රෙෂ්ඨයෙක්ව උපන්නෙම්ද එහෙයිනි.

55 "මම නායක වූවෙක්ද පියවූවෙක්ද ප්‍රසිද්ධ වූවෙක්ද රට පාලනය කරන්නෙක්ද සිව්රජුන්ගේ ප්‍රවේනි ධර්මය පුදන්නෙක්ද වෙමි. ඒ මම ධර්මය ඒ අනුවම සිතන්නෙමි. එහෙයින් තමන්ගේ චිත්ත වසඟයෙහි නොපවත්නෙමියි" (රජතෙම කීයේය.)

56 "මහරජ, ඒකාන්තයෙන් ඔබ සතතයෙන් ව්‍යසන රහිතව නිර්භයව බොහෝ කලක් රාජ්‍යය කරන්නෙහි කුමක් හෙයින්ද ඔබගේ ප්‍රඥාව එබඳු මැයි.

57 "ධර්මයෙහි ප්‍රමාද නොවෙහිය යන යමක්වේද ඔබගේ මෙයට මම සතුටුවෙමි. අධිපතිවූ ක්ෂත්‍රියතෙම ධර්මයෙහි ප්‍රමාදව ස්ථානයෙන් චුතවේ.

58 "ක්ෂත්‍රියවූ මහරජ, මව්පියන් කෙරෙහි දැහැමින් හැසිරෙව, මහරජ, මෙලොව ධර්මයෙන් හැසිර පරලොව ස්වර්ගයට පැමිණෙන්නෙහිය.

59 "ක්ෂත්‍රියවූ මහරජ, අඹුදරුවන් කෙරෙහි දැහැමින් හැසිරෙව. මහරජ, මෙලොව දැහැමින් හැසිර පරලොව ස්වර්ගයට පැමිණෙන්නෙහි.

60 "ක්ෂත්‍රියවූ මහරජ, මිත්‍රාමාත්‍යයන් කෙරෙහි දැහැමින් හැසිරෙව. මහරජ, මෙලොව දැහැමින් හැසිර පරලොව ස්වර්ගයට පැමිණෙන්නෙහි.

61 "මහරජ වාහණයන් කෙරෙහිද බල සේනාවන් කෙරෙහිද දැහැමින් හැසිරෙව. මහරජ, මෙලොව දැහැමින් හැසිර පරලොව ස්වර්ගයට පැමිණෙන්නෙහි

62 "මහරජ, ගම්වැස්සන් කෙරෙහිද, නියම් ගම්වැස්සන් කෙරෙහිද දැහැමින් හැසිරෙව. මහරජ, මෙලොව දැහැමින් හැසිර පරලොව ස්වර්ගයට පැමිණෙන්නෙහි.

63 "මහරජ, රට වැස්සන් කෙරෙහිද දනව්වැස්සන් කෙරෙහිද දැහැමින් හැසිරෙව. මහරජ, මෙලොව දැහැමින් හැසිර පරලොව ස්වර්ගයට පැමිණෙන්නෙහි

64 "මහරජ, ශ්‍රමණ බ්‍රාහ්මණයන් කෙරෙහිද දැහැමින් හැසිරෙව. මහරජ, මෙලොව දැහැමින් හැසිර පරලොව ස්වර්ගයට පැමිණෙන්නෙහි.

65 "ක්ෂත්‍රියවූ මහරජ, මෘග පක්ෂීන් කෙරෙහි දැහැමින් හැසිරෙව. මහරජ, මෙලොව දැහැමින් හැසිර පරලොවට ස්වර්ගයට පැමිණෙන්නෙහි.

66 "මහරජ, දැහැමින් හැසිරෙව, පුරුදු කළ ධර්මයතෙම සුව එළවන්නේ වෙයි. මහරජ, මෙලොව දැහැමින් හැසිර පරලොව ස්වර්ගයට පැමිණෙන්නෙහි.

67 "මහරජ, දැහැමින් හැසිරෙව, ශක්‍රයා සහිතවූ බ්‍රහ්මයා සහිතවූ දෙවියෝ මනාව කරණලද සුචරිතයෙන් දෙව්ලොවට පැමිණියාහුය. මහරජ එහෙයින් සුචරිත ධර්මයෙහි ප්‍රමාද නොවෙවයි" (අභිපාරක නම් සෙනෙවිතෙම රජ හට ධර්මය දේශනා කෙළේය" යි) වදාළේය.

**527 මහාබොධි ජාතකයඃ-** 1 "ස්වාමීනි තාපසයන් වහන්ස, කවර කරුණකින් දණ්ඩක් ද කුමට අඳුන් දිවිසමක් ද කිම කුඩයක් ද කිමෙක්ද උපාහනයද කුමක් සඳහා අකුස්සක්ද පාත්‍රයද සඟල සිවුරද යන මේ සියල්ල ඉක්මන්ව ගන්නෙහිද, කවර දිශාවකට යනු කැමැත්තෙහිදැයි?යි" රජතෙම ඇසීය

2 "මහරජ, මේ දොළොස් අවුරුද්දක් ඔබ සමීපයෙහි වාසය කරණලදහ. මෙපමණ කල් පිංගල නම්වූ ඔබගේ ශුනඛයා විසින් මෙසේ මහත් ශබ්දයෙන් ශබ්ද කිරීමක් නොදනිමි.

3 "ඒ මේ ශුනඛතෙම පහවූ ශ්‍රද්ධා ඇති භාර්‍ය්‍යාව සහිතවූ ඔබගේ මා පිළිබඳවූ කථාව අසා දර්පිතයෙකු මෙන් හෙවත් එඩිතරවූවෙකු මෙන් ඉතා සුදු දත් විහිදුවමින් නාද කෙරේ යයි" තාපසතෙම කීයේය.

4 "තාපසයන් වහන්ස, යම්සේ කියන්නෙහිද, එසේ මේ දෝෂය අප විසින් කරණලදී. ඒ මම දැන් වැඩියක් පැහැදුනෙමි. බ්‍රාහ්මණය මෙහිම වාසය කරණු මැනව, අන් තැනකට නොයවයි" රජතෙම කීයේය.

5 "මහරජ, පළමු ඔබගේ බත සියල්ල සුදුවිය. ඉන් පසුව ඒ බතද මිශ්‍රකවිය. දැන් එය සියල්ල ලේවන් වූයේය. එබැවින් මට බැහැර යන්ට සුදුසු කාලයවේ.

6 "පළමු මට අභ්‍යන්තරයෙහිවූ අස්නක් වීය. ඉන්පසු මධ්‍යයෙහි හෙවත් හිණ මත්තෙහි ආසනය විය. ඉන්පසු පිටත්හි ආසනය විය. ඇද දැමීමට මත්තෙන් මම තෙමේම යන්නෙමි.

7 "පහවූ ශ්‍රද්ධා ඇත්තහු දිය නැත්තාවූ ළිඳක් මෙන් සේවනය කටයුතු නොවන්නේය. ඉදින් ඒ ළිඳ නැවත සාරන්නේ නම් මඩ හා ගඳ ඇත්තාවූ ජලය ඇතිවන්නේද,

8 "එසේම පහවූ ශ්‍රද්ධා ඇත්තහු දිය නැත්තාවූ ළිඳ මෙන් සේවනය නොකටයුතුයි. ඉදින් ඔහු නැවත සේවනය කරන්නේ නම් මඩ හා ගඳින් යුත් ජලය මෙන් පරිභොග නොකටයුතු ප්‍රත්‍ය ලබන්නේය.

9 'මහරජ, එහෙයින් ප්‍රසන්නවූවෙකුම සේවනය කටයුතු වන්නේය. අප්‍රසන්නවූවහු දුරුකටයුතුය දියෙන් ප්‍රයෝජන ඇත්තේ ප්‍රසන්නවූ විලක්මෙන් ශ්‍රද්ධා ඇත්තහුම සේවනය කටයුතු වන්නේය.

10 "තමන් භජනය කරන්නාවූ පුරුෂයෙකු භජනය කරන්නේය. භජනය නොකරන්නහු භජනය නොකටයුතුය. යමෙක් තමන් භජනය කරන්නහු භජනය නොකෙරේද හෙතෙම අසත් පුරුෂ ස්වභාව ඇත්තෙකි.

"යමෙක් භජනය කරන්නහු භජනය නොකෙරේද, සේවනය කරන්නහු සේවනය නොකෙරේද, හෙතෙම ඒකාන්තයෙන් ගස්වල අතු ඇසුරු කළාවූ ශාඛාමෘගයෙකු මෙන් මිනිසුන්ගෙන් පවිටුවූවෙකි.

11 "වැඩියක් නිතර සංසර්ගයෙන්ද එක්ව නොහැසිරීමෙන්ද නුසුදුසු කාලයෙහි යමක් ඉල්වීමෙන්ද යන මේ කරුණු තුනෙන් මිත්‍රයෝ දිරත් හෙවත් මිතුරුකම් නැති වෙත්.

12 "එහෙයින් නිතර නොපැමිණෙන්නේය. බොහෝ කලක් ඉක්මවා බොහෝ කලකින්ද නොපැමිණෙන්නේය. සුදුසු කාලයෙහි ඉල්විය යුත්තක් ඉල්වන්නේය. මෙසේ ඇතිකල්හි මිත්‍රයෝ නොදිරත්.

13 "ඉතා බොහෝ කලක් එකතැන වාසය කිරීමෙන් ප්‍රිය තැනෙත්තේ අප්‍රියවේ. මහරජ, ඔබට අප්‍රියවන්ට පළමු ඔබ හා කථාකොට යන්නෙමුයි" තාපස තෙම කීයේය.

14 "ස්වාමීනි, ඉදින් මෙසේ යාඥා කරන්නාවූ අපගේ ඇදිලි කිරීම නොපිළි ගන්නෙහි නම් සමීපයෙහි හැසිරෙන්නාවූ අපගේ කීම නොකරන්නෙහි නම් මෙසේ ඔබගෙන් ඉල්වමි. නැවත එකවරක් මෙහි පැමිණීම කරණු මැනවැයි" රජතෙම යාඥා කෙළේය.

15 "ඉදින් මහරජ, මෙසේ වෙන්ව වාසය කරන්නාවූ අපට අන්තරායෙක් නොවන්නේ නම් ඔබගේද මාගේද ජීවිතය පවත්නේනම් කල්‍යාමෙහි දක්නෙමු නම් ඉතා මැනවැයි" තාපසතෙම කීයේය.

16 "ඉදින් මේ ලෝකයතෙම සංගතියෙන්ද ස්වභාවයෙන්ද අනුවම පවතී. කැමැත්තක් නැතිව නොකටයුතු පාපය හෝ කටයුතු කුශලය හෝ කරයි, යන ඔබගේ මේ කථාව වේනම් මෙසේ නොකැමැත්තෙන් කරණ කටයුතු ඇතිකල්හි මෙහි කවරෙක් පාප කර්මයෙන් තැවරේද, හෙවත් මිශ්‍රවේද,

17 "ඒ අහේතුක වාදය තෙම ඉදින් අර්ථයද ධර්මයද යහපතද වේනම් ලාමකද නොවේ නම් ඉදින් පින්වත්හුගේ

කීම සත්‍යනම් මා විසින් වඳුරුතෙම මනාව නසන ලදී. මෙහි මාගේ කවර දොසක් වේද?"

18 "යහළුව, ඉදින් නුඹ තමන්ගේ වාදයෙහි දෝෂය දන්නෙහි නම් මට නොගරහන්නෙහිය. පින්වතාගේ වාදය එබඳු වේමැයි.

19 "ඉදින් ඊශ්වරයෙක් සියලු ලෝකයාගේ දිවි පැවැත්ම කරයි. සමෘද්ධියද ව්‍යසනවලට පැමිණීමද සෙසු යහපත්වූ ලාමකවූ කර්මද යන සියල්ල කරයි. පුරුෂ තෙම ඔහුගේ නියෝගය කරන්නේ නම් ඊශ්වරතෙම ඒ කර්මයෙන් මිශ්‍රවේ.

20 "ඉදින් ඒ ඊශ්වර නිර්මාන වාදය තෙම අර්ථයද ධර්මයද යහපතද වේනම් ලාමක නොවේනම් ඉදින් පින්වතාගේ කීම සත්‍යනම් මා විසින් වඳුරුතෙම මනාකොට නසන ලදී. (මෙහි මට) කවර දොසෙක්ද?"

21 "යහළුව නුඹ තමන්ගේ වාදයෙහි වරද දන්නෙහි නම් මට නොගරහන්නෙහිය. පින්වතාගේ වාදය එබඳුම වේයයි" තාපසතෙම කීයේය.

22 "ඉදින් සත්වතෙම පෙර කළාවූ කර්මය හේතුකොට ගෙණ සුවදුක් දෙකට පැමිණෙයි. පුරාණයෙහි කරණලද යම් පාපයක් වේනම් මේ සත්වතෙම ඒ නය මුදයි යනු ඔබගේ වාදය වේනම් මාගේද මෙය පුරාණ නය මිදීමවේ. මෙහි කවරෙක් පාපකර්මයෙන් මිශ්‍රවේද?"

23 "ඉදින් ඒ පුබ්බෙකත හේතුවාදයතෙම අර්ථයද ධර්මයද යහපත්ද වේනම් ලාමක නොවේ නම් ඉදින් පින්වතාගේ වචනය සත්‍යනම් මාවිසින් වඳුරුතෙම මනාකොට නසන ලදී. මෙහි මාගේ කවර දොසෙක්ද?"

24 "යහළුව, ඉදින් නුඹ තමන්ගේ වාදයෙහි වරද දන්නෙහි නම් මට නොගරහන්නෙහිය. පින්වතාගේ වාදය එබඳුම වේයයි" කීයේය

25 "සතර මහාභූතයන් නිසාම සත්වයන්ගේ රූප ස්කන්ධය හටගණියි. යමකින් ඒ රූපය හටගණීද එහිම එය නැවත ඇතුළත් වෙයි.

26 "මේ ලෝකයෙහිම සත්වතෙම ජීවත්වේ. පරලොවට පැමිණ පරලොවදී විනාශවේ. මේ ලෝකයතෙම විනාශවේ. යම් බාලයෝද යම් පණ්ඩිතයෝද වෙත් නම් ඔව්හුද විනාශ වෙත්. මෙසේ ලෝකය විනාශවනු ලබන කල්හි මෙහි කවරෙක් පාපයෙන් මිශ්‍රවේද?

27 "ඉදින් ඒ උච්ඡේදවාදයතෙම අර්ථයද ධර්මයද කල්‍යාණද වේනම් ලාමක නොවේ නම් ඉදින් පින්වතාගේ වචනය සත්‍ය නම් මා විසින් වඳුරා මනාව නසන ලදී. මෙහි මාගේ කවර දොසෙක්ද"

28 "යහළුව, ඉදින් නුඹ තමන්ගේ වාදයෙහි දෝෂය දන්නෙහිනම් මට නොගරහන්නෙහිය. පින්වතාගේ වාදය එබඳුම වේයයි" කීයේය.

29 "ලෝකයෙහි ක්ෂත්‍ර විද්‍යා දන්නාවූ පණ්ඩිත යයි යන හැඟීම් ඇත්තාවූ අඥානයෝ ඉදින් එබඳු අර්ථයක් වන්නේ නම් මවද පියාද නැසිය යුතුය. තවද වැඩිමහළු සොහොයුරාද නැසිය යුතුය. අඹුදරුවන්ද නැසිය යුතුයයි කියත්.

30 "යම් ගසක්හුගේ සෙවනයෙහි හිඳින්නේද සයනය හෝ කරන්නේද, ඒ ගසෙහි අත්ත නොබිඳින්නේය කුමක් හෙයින්ද මිත්‍ර ද්‍රෝහිකම වනාහි ලාමකවේ.

31 "තවද කටයුත්තක් ඇතිවූ කල්හි මුල සහිතවද උදුරන්නේයයි ඔබ කියන්නෙහිය. මටද මාර්ගොපකරණයෙන් ප්‍රයෝජන ඇත්තේ විය.

32 එහෙයින් මා විසින් වඳුරා මනාව නසන ලදී. මෙහි මාගේ කවර දොසක්ද, ඉදින් ඒ ක්ෂත්‍ර විද්‍යාවාදයතෙම අර්ථයද ධර්මයද යහපතද වේනම් ලාමකද නොවේනම් ඉදින් පින්වතාගේ වචනය සත්‍ය නම් මා විසින් වඳුරා මනාව නසනලදී."

33 "යහළුව, ඉදින් නුඹ තමන්ගේ වාදයෙහි වරද දන්නෙහි නම් මට ගර්හා නොකරන්නෙහිය. පින්වතාගේ වාදය එබඳුම වේයයි" කීයේය.

34 "අහේතුවාද ඇත්තාවූ යම් පුරුෂයෙක් වේද ඉස්සර නිම්මාණවාද ඇත්තාවූ යමෙකුත් වේද, පුබ්බෙකත හේතුවාද ඇත්තාවූ යමෙකුත් වේද, උච්ඡේදවාද ඇති යමෙකුත් වේද, ක්ෂත්‍ර විද්‍යාදීන්වූ යම් මනුෂ්‍යයෙකුත් වේද,

35 "ලෝකයෙහි පණ්ඩිතයයි හැඟීම් ඇත්තාවූ අඥානවූ මොව්හු අසත්පුරුෂයෝ වෙත්. මහරජ, එබඳු අසත්පුරුෂ තෙම පාපය කරන්නේය. තවද අනුන් ලවාත් කරවන්නේය. අසත්පුරුෂයන් හා එක්වීම නපුරුකොට කරණ ලද්දක් කටුක විපාක වැඩෙන්නක් වේයයි" කීයේය.

36 "පෙර වනාහි වෘකයෙක් එළුවෙකුගේ ස්වභාවයෙන් සැක නැතිව එළු රැලකට පැමිණෙයි. තිරළුදෙනක්ද, එළු දෙනක්ද, එළුවෙකුද නසා අනුභවකොට කැමැතිසේ පැනයයි.

37 "එබඳුවූ සමහර ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙක් වෙත්. ඔව්හු පැවිද්දන්ගේ ආකාරයෙන් සිරුරු වැසුම්කොට මිනිස්සු වඤ්චාකරත්. අනුභව නොකරන්නාහුද ගොඩැලි හිස්බිම්වල සයනය කරන්නාහුද, රජස් දැලිවලින් යුක්තවූවහුද උක්කුටුකයෙන් තපස් කරන්නාහුද වාර පිළිවෙළින් බත් අනුභව කරන්නාහුද පානය නොකරන්නාහුද අපි රහත් යයි කියමින් මෙසේ ලාමක පැවතුම් ඇත්තාහුයයි හැසිරෙත්.

38 "මොව්හු ලෝකයෙහි පණ්ඩිතය යන හැඟීම් ඇත්තාවූ අඥානවූ අසත්පුරුෂයෝ වෙත්. එබඳු පුරුෂතෙම පව්කරන්නේය. තවද අනුන්ලවාත් කරවන්නේය. අසත්පුරුෂයන් හා එක්වීම දුෂ්කෘතයක්වේ. කටුකවූ විපාක වඩන්නෙක්වේ.

39 "වීර්‍ය්‍යයක් නැතැයි යම් කෙනෙක් කියද්ද, යම් කෙනෙක් හේතුවක්ද නැතැයි කියද්ද, අනුන්ගේ කටයුතුද තමන්ගේ කටයුතුද සිස්යයි යම්කෙනෙක් කියන්නාහුද,

40 "මොව්හු ලෝකයෙහි පණ්ඩිතයයි හැඟීම් ඇත්තාවූ අඥානවූ අසත්පුරුෂයෝවෙත්. එබඳු පුරුෂතෙම පාපය කරන්නේය. තවද අනිකා ලවාත් කරවන්නේය අසත් පුරුෂයන් හා එක්වීම දුෂ්කෘතයක්වේ. කටුක දුක් වැඩෙන්නක්වේ.

41 "මහරජ, ඉදින් එබඳු වීයයීයක් නොවන්නේ නම් යහපත්වූද, ලාමකවූද, ධර්මයකුත් නොවන්නේ නම් රජතෙම වඩුවෙකු පෝෂණය නොකරන්නේය. ප්‍රාසාදාදී යන්ත්‍රද නො කරවන්නේය.

42 "යම්හෙයකින් වීයයී ඇත්තේද යහපත්වූ ලාමකවූ කර්ම ඇත්තේද එහෙයින් රජතෙමේ ප්‍රාසාදාදී යන්ත්‍රයන් කරවයි. වඩුවාද පෝෂණය කරයි.

43 "මහරජ, ඉදින් අවුරුදු සියයක් වර්ෂාව නොවස්නේද, හිම නොවැටෙන්නේද, එකල්හි මේ ලෝකය තෙම සිඳී යන්නේය. මේ ප්‍රජාව විනාශවන්නේය.

44 "යම්හෙයකින් වර්ෂාව වසීද, හිම ස්පර්ශ කෙරේද, එහෙයින් සශ්‍යයෝ හටගණිත්. රටද බොහෝකලක් පාලනය කරණුලැබේ.

45 "ඉදින් ගමන්කරන්නාවූ ගවයන් අතුරෙන් ශ්‍රෙෂ්ඨවූ ගවතෙම වක්වූයේ නම් ඒ සියලු ගවයෝ වක්වයෙත්. ඉදිරියෙහි යන්නහු වක්ව ගියකල්හි පසුව යන්නාහුද වක්වයෙති.

46 "මෙපරිද්දෙන්ම මිනිසුන් අතර යමෙක් ශ්‍රෙෂ්ඨයයි සම්මතවේද, හෙතෙමේ වනාහි අධර්මයෙහි හැසිරේනම් සෙසු ප්‍රජාව කියනුම කවරේද, ඉදින් රජතෙමේ අධර්මික වේනම් සියලු රටවැසියා දුකසේ වාසයකරයි.

47 "ඉදින් ගමන්කරන්නාවූ ගවයන් අතුරෙන් ශ්‍රෙෂ්ඨ වූ ගවතෙම ඍජුව යේනම් පසුව යන්නාවූ ඒ සියලු ගවයෝ ඍජුවයෙත්. ඉදිරියෙහි යන්නහු ඍජුව ගියකල්හි සෙස්සෝද ඍජුව යෙත්.

48 "මෙපරිද්දෙන්ම මිනිසුන් අතර ශ්‍රෙෂ්ඨයයි සම්මතවූ යමෙක් වේද, හෙතෙමේ ධර්මයෙහි හැසිරේනම් සෙසු ප්‍රජාව කියනුම කවරේද? ඉදින් රජතෙමේ ධාර්මිකවේනම් සියලු රට වැසියා සුවසේ වාසයකරයි.

49 "යමෙක් ඵල ඇත්තාවූ මහත් අඹ රුකක අමු ගෙඩියක් කඩයිද, ඔහු රසයද නොදනියි. බීජයද විනාශවේ.

50 "එපරිද්දෙන් යම් රජෙක් මහත්වූ අඹගසකට බඳු රට අධර්මයෙන් අගතිගාමීව අනුශාසනා කෙරේද, හෙතෙම ඔහුගේ රසයද නොදනියි. හෙවත් අයබදු නොලබයි. ඔහුගේ රටද විනාශවේ.

51 "යමෙක් ගෙඩි ඇත්තාවූ මහත්වූ අඹගසක පැසුනාවූ ගෙඩිය කඩාද හෙතෙම එහි රසයද දනියි. ඔහුගේ බීජයද විනාශ නොවේ.

52 "එපරිද්දෙන් යම් රජෙක් මහත්වූ අඹගසකට බඳු උපමා ඇති රට අනුශාසනා කෙරේද, හෙතෙම ඒ රටේ රසයද දනියි. හෙවත් අයබදු ලබයි. ඔහුගේ රටද විනාශ නොවේ.

53 "යම් රජෙක් වනාහි ජනපදය අධර්මයෙන් අනුශාසනා කෙරේද, ක්ෂත්‍රියවූ ඒ රජතෙම සියලු ඖෂධයන් හා විරුද්ධවේ. හෙවත් ඔහුට ඖෂධ සම්පාදනය නොවෙත්.

54 "එසේම නියම්ගම් වැස්සන්ට හිංසා කරන්නේ වෙළඳාමෙහි යෙදුනාවූ යම්කෙනෙක් වෙද්ද, අයබදු අයකරන්නාවූ යම්කෙනෙක් වෙද්ද, ඔවුන්ට හිංසා කරන්නේ ඒ රජතෙම කෝෂ්ඨාගාරය හා විරුද්ධවේ. හෙවත් ධනධාන්‍යවලින් පිරිහේ.

55 "පහරදීමට සුදුසුතැන් දන්නාවූ යුද්ධභූමියෙහි කරණලද කටයුතු ඇත්තවුන්ටද උසස්වූ ඇමැතියන්ටද හිංසා කරන්නාවූ ඒ රජතෙම බල සෙනග හා විරුද්ධවේ.

56 "එපරිද්දෙන්ම කායාදී සංයම ඇත්තාවූ බ්‍රහ්මචාරීවූ ඍෂීන්ට හිංසා කරන්නාවූ අධර්මයෙහි හැසිරෙන්නාවූ ඒ රජතෙම ස්වර්ගය හා විරුද්ධවේ.

57 "යම් රජෙක් අධර්මිෂ්ටවූයේ දූෂණය නොකටයුතුවූ භාර්‍ය්‍යාව නසාද, හෙතෙම දරුණුවූ පාපය රැස්කරයි. පුත්‍රයන් සමගද විරුද්ධවේ.

58 "මහරජ, යමෙක් දනව් වැස්සා කෙරෙහිද නියම්ගම් වැස්සන් කෙරෙහිද බලසේනාවන් කෙරෙහිද, දැහැමින්

හැසිරෙන්නේද, සෘෂීන්ට හිංසා නොකරන්නේද, අඹු දරුවන් කෙරෙහි සමව හැසිරෙන්නේද,

**59** "එබඳුවූ රට පාලනය කරන්නාවූ නොකිපෙනසුළුවූ රජතෙම අසුරපුරයට අධිපතිවූ ශක්‍රයාමෙන් සාමන්ත රජුන් අතිශයින් කම්පා කෙරේයයි" මෙසේ ධර්මදෙශනා කෙළේය.

---

## සට්ඨි නිපාතය.

**528 සොණක ජාතකයඃ-** 1 "සොනක නම් යහළුවා වසන තැන අසා කියන්නාවූ කවරෙකුට මම සියයක් දෙම්ද, දැක කියන්නාවූ කවරෙකුට දහසක් දෙම්ද, වැලිකෙළියෙහි පටන් යහළුවූ සොණක නම් මිත්‍රයා ගැන මට කවරෙක් කියන්නේදැයි" යන ගාථාව රජතෙම කීයේය.

2 "ඉක්බිති තරුණවූ පඤ්ච චූලක නම් මානවකතෙම ප්‍රතිගායනා වශයෙන් මේ ගාථාව කීයේය. "මහරජ, එය අසා මට සියය දුනමැනව. සෝණක නම් තැනැත්තා දැක කියන්නාවූ මට දහසද දුනමැනව. වැලිකෙළියෙහි පටන් යහළුවූ ඔබගේ සෝනක නම් ප්‍රිය මිත්‍රයා මම කියන්නෙමියි" කීයේය.

3 "මානවකය, කවරනම් ජනපදයක්හි රටවලද, නියම් ගම්වලද, කවර තැනෙක්හි ඒ සෝනකතෙම තොප විසින් දක්නා ලද්දේදැයි විචාරණ ලද්දාවූ මට එය කියවයි" රජතෙම කීයේය.

4 "දේවයන් වහන්ස, ඔබවහන්සේගේම රටෙහි ඔබගේම උද්‍යානභූමියෙහි ඍජුවූ කඳ ඇති නීලවර්ණ ඇත්තාවූ සිත්කළුවූ වළාකුලක් බඳුවූ, රම්‍යවූ ඔවුනොවුන් එකට වෙලී පවත්නාවූ මහත්වූ සල්ගස් දෙකක් තිබෙත්.

5 "ඒ සල්ගස් දෙක මුල කාමූපාදාන ඇත්තාවූ එකොළොස් ගින්නකින් දනුලබන්නාවූ ලෝක සත්වයන් අතර උපාදාන රහිතව නිවියාවූ සෝණක නම් ඒ යහළුතෙම ධ්‍යාන කෙරේයයි" මානවකයා කීයේය.

6 "ඉක්බිති ඒ අරින්දම නම් රජතෙම සිව්රඟ සෙනඟ සමග පිටත්වූයේය. මාර්ගය සමකරවා සෝණක නම් තාපස තෙම යම් තැනෙක්හිද එතැනට ගියේය.

7 "උද්‍යාන භූමියට ගොස් මහත්වූ වනයෙහි හැසිරෙන්නේ එකොළොස් ගින්නකින් දනු ලබන්නාවූ සත්වයන් අතර නිවී වැඩඋන්නාවූ සෝණක නම් පසේබුදුන් දුටුයේය.

8 "ඒකාන්තයෙන් දිළිඳුවූ සඟල සිව්රක් පෙරෙව්වාවූ මව් නැත්තාවූ, පියා නැත්තාවූ මේ මුඩුමහණතෙම ගස්මුල ධ්‍යාන කෙරේයයි" රජතෙම කීයේය.

9 ඔහුගේ මේ වචනය අසා සොණක නම් පසේබුදු තෙම මෙය වදාළේය. මහරජ, ආර්‍ය්‍ය මාර්ග ධර්මය නාම කයින් ස්පර්ශ කරන්නේ දිළින්දෙක් නොවේ.

10 "මේ ලෝකයෙහි යමෙක් දශකුශල ධර්මය බැහැර කොට අකුශල ධර්මය අනුව පවතීද, මහරජ, පව්වූවූ පාපයන්ට පිහිටවූ හෙතෙම දිළිඳු නම් වේයයි" වදාළේය.

11 "අරින්දමයයි මාගේ නාමය වේ. කශී රජයයි මා දනිත්. පින්වත් සෝණකයන් වහන්ස, මෙහි පැමිණියාවූ පින්වතුන් වහන්සේට කිම සැපවූ සයනයක් වීදැයි" රජතෙම ඇසීය.

12 "මහරජ, ගිහිගෙන් නික්ම අනගාරික භාවයට පැමිණියාවූ ධනය නැත්තාවූ භික්ෂුහට හැමකල්හිම යහපත් වේ. මහරජ, ඔවුන්ගේ කෝෂ්ඨාගාරයෙහි ධන ධාන්‍ය තැන්පත් නොකරත්. සැලෙහිද නොදමත්. පැසෙහිද නොතබත්. අනුන් විසින් නිමවනලද්ද සොයමින් මනා පැවතුම් ඇත්තාවූ ඔව්හු එයින් යැපෙත්.

13 "යම් හෙයකින් නිරවද්‍යවූ ආහාරය වැළඳියයුතු වේද, කිසියම් ක්ලේශයෙක් පීඩා නොකෙරේද, එහෙයින් අනගාරික භාවයට පැමිණියාවූ ධන නැත්තාවූ භික්ෂූහට මේ දෙවෙනි යහපතදවේ.

14 "යම් හෙයකින් නිවී ආහාරය වැළඳිය යුතුවේද, ඒ හේතුවෙන් කිසියම් ක්ලෙශයෙක් පීඩා නොකෙරේද එහෙයින් ධන නැත්තාවූ අනගාරික භික්ෂුහට මේ තුන්වන යහපතද වේ.

15 "මුක්තවූ හෙවත් උපස්ථායක කුලාදීන්හි ඇල්මෙන් මිදුනාවූ රටෙහි හැසිරෙන්නාවූ යමෙකුගේ කිසිත් සංගයක් විද්‍යමාන නොවේද, ධන නැත්තාවූ අනගාරික ඒ භික්ෂුහට මේ සතරවන යහපතදවේ.

16 "නගරය ගින්නෙන් දනුලබන කල්හි මේ භික්ෂුහුගේ කිසිවකුත් ගින්නෙන් නොදැවෙන්නේද, එහෙයින් ධන නැත්තාවූ අනගාරික භික්ෂූහට මේ පස්වන යහපතදවේ.

17 "යම්හෙයකින් රටෙහි සොරු පැහැරගනු ලබන කල්හි මේ භික්ෂූහුගේ කිසිවකුත් පැහැර නොගන්නේද එහෙයින් ධන නැත්තාවූ අනගාරික භික්ෂුහට මේ සවන යහපතදවේ.

18 "යම්හෙයකින් සොරුන් විසින් රක්නා ලද මාර්ගයෙහිද අන්‍යවූ යම් මාර්ගොපද්‍රව ඇත්නම් එබඳු තන්හිද මනා පැවතුම් ඇති භික්ෂුතෙම පා සිවුරු ගෙණ සුවසේ යේද, එහෙයින් ධන නැත්තාවූ අනගාරිකවූ භික්ෂුහට මේ සත්වන යහපතදවේ.

19 "යම්හෙයකින් භික්ෂුතෙම යම් යම් දිශාවකට පිටත්වයේද, ඒ ඒ දිශාවට අපේක්ෂාවක් නැතුවම යන්නේද, එහෙයින් ධන නැත්තාවූ අනගාරික භික්ෂූහට මේ අටවන යහපතද වේයයි" (මේ සමණභද්‍රක නම් ගාථාව වදාළේය.)

20 "භික්ෂුන් වහන්ස, නුඹ වහන්සේ යම් ශ්‍රමණයන්ට යහපත් කරුණුවලට ප්‍රශංසා කරන්නෙහිද, එබඳුවූ සමණභද්‍ර කාරණයන් බොහෝ වෙත්. සෝණකයන් වහන්ස, මමද කාම සම්පත්වල ගිජුවූයෙම් කෙසේ නම් එය කරන්නෙම්ද,

21 "මනුෂ්‍යයන් අයත්වූ කාමයෝද මට ප්‍රිය වෙත්. තවද දෙවියන්ට අයත්වූ කාමයෝද මට ප්‍රියවෙත්. එකල්හි කවර ආකාරයකින් දෙලොවම කාම සම්පත් ලබන්නෙමුදැයි" රජතෙම කීයේය.

22 "මහරජ, කාමයන්හි ගිජුවූ කාමසම්පත්වල ඇළුනාවූ කාම සම්පත්හි අධික වශයෙන් මුසපත්වූ මනුෂ්‍යයෝ පාප කර්මයන් කොට දුර්ගතියට පැමිණෙත්.

23 "යම් කෙනෙකුන් කාමසම්පත් හැර ගිහිගෙන් නික්මුනාහු කොයිනුත් බියක් නැත්තාහු එකලාව වාසය කරණ බවට පැමිණියාහුද, ඔව්හු දුර්ගතියට නොපැමිණෙත්."

24 "අරින්දම නම් රජ, නුඹට උපමාවක් ගෙණහැර දක්වන්නෙමි. එය අසව, මේ ලෝකයෙහි සමහර නුවණැත්තෝ උපමාවෙන්ද අර්ථය දැනගනිත්.

25 "නුවණ නැත්තාවූ සිතිවිලි රහිතවූ එක් කව්ඩෙක් ගංගාවෙහි මහත්වූ දියෙහි ගසාගෙණ යන්නාවූ ඇත්කුණක් දැක මෙසේ සිතුයේය.

26-27 "ඒකාන්තයෙන් මා විසින් යානාවක්ද ලබන ලදී. මෙතෙම මහත්වූ ආහාරයදවේ. එහි රාත්‍රියෙහිද එහි දාවල්ද එහිම ඇළුනු සිත් ඇත්තේ. ඇතාගේ මස් අනුභව කරමින් භාගීරථී නම් ගඟෙහිදිය පානය කරමින් දෙපස වනයෙහි චෛත්‍ය වෘක්ෂයන් බලමින් අහසින් යන්නාවූ කවුඩුතෙම පිටත නොගියේය.

28 "ගලාබස්නාවූ ගංගාතොමෝ ඇත්කුණෙහි ඇළුනාවූ ප්‍රමාදවූ ඒ කව්ඩාද යම් තැනෙක්හි පක්ෂීන්ට යා නොහැකිද, එබඳුවූ මහා සමුද්‍රයට ඇදගෙණ ගියේය.

29 "ආහාරය ගෙවීගියාවූ ඒ කව්ඩුතෙමේද අහසට පැන පසු භාගයෙන්ද පිහිටක් නොලැබීය. ඉදිරියෙන්ද පිහිටක් නොවීය. උතුරුදිශාවෙහිද නොවීය. දකුණු දිශාවෙහිද නොවීය.

30 "යම් සාගරයක්මැද පක්ෂීන්ට යානොහැකිද, එහි ඒ කව්ඩුතෙම ද්වීපයකට නොපැමිණියේය. ඒ කව්ඩුතෙමේද දුර්වලයෙකු යම්සේද, එමෙන් එහිම වැටුනේය

31 "මුහුදෙහි වාසය කරන්නාවූ කුම්භීලයෝද මෝරුද සුසුනම් ඇත්තාවූ චණ්ඩ මත්ස්‍යයෝද විනාශවූ පියාපත් ඇති ඇලෙමින් සිටියාවූ ඒ කව්ඩා බලාත්කාරයෙන් කෑවෑහුය.

32 "මහරජ, මෙපරිද්දෙන්ම ඔබද කාමයන්හි ගිජුවූ යම් අනික් කෙනෙක් ඇත්නම් ඔව්හුද ඉදින් කාමයන්හි ගිජුවූවාහු වෙත් නම් කාමයන් හැර නොදමන්නාහු නම් ඔව්හු කව්ඩාගේ ප්‍රඥාවට බඳු ප්‍රඥා ඇත්තෝයයි පණ්ඩිතයෝ දනිත්.

33 "මහරජ, මා විසින් කරුණු දක්වන්නාවූ මේ උපමාව තොපට ගෙණහැර දක්වනලදී. නුඹද ඉදින් එය කරන්නෙහි හෝ වේවා, නොකරන්නෙහි හෝ වේවා, ඒකාරණයෙන් පැනෙන්නෙහියයි හෙවත් ප්‍රකට වන්නෙහි යයි" අවවාද කෙළේය.

34 "අනුකම්පා ඇත්තේ එක්වරක් කීමද දෙවරක් කීමද කියන්නේය. ස්වාමිහුගේ සමීපයෙහි දාසයෙකු මෙන් ඉන් මත්තෙහි නොකියන්නේයයි" කීයේය.

35 "අප්‍රමාණවූ බුද්ධි ඇති සෝණක නම් පසේ බුදුතෙම මෙය කියා රජහුට අනුශාසනාකොට අන්තරීක්ෂ නම්වූ අහසට නැගී වැඩියේය.

36 "සමර්ථවූද ව්‍යක්ත භාවයට පැමිණියාවූද මේ රාජ්‍ය කරන්නෝ කොහිවෙද්ද, රාජ්‍ය පාවාදෙන්නෙමි. මම රාජ්‍යයෙන් ප්‍රයෝජන ඇත්තෙක් නොවෙමි.

37 "අදම පැවිදී වන්නෙමි හෙට මරණය වේයයි කවරෙක් දන්නේද මම දුෂ්ප්‍රාඥවූ කව්ඩා මෙන් කාමයන් ගේ වසඟයට නොයමියි" රජතෙම කීයේය

38 "දෙවයන් වහන්ස, රට වර්ධනය කරන්නාවූ දීඝාවූ නම් තරුණවූ පුත්‍රයෙක් ඔබට ඇත්තේය. ඒ කුමරු රාජ්‍යයෙහි අභිෂෙක කරණු මැනව, හෙතෙම අපගේ රජවන්නේයයි" ඇමැතියෝ කීහ.

39 "රට වර්ධනය කරන්නාවූ දීඝාවූ නම් කුමාරයා වහා ගෙනෙව්. ඔහු රාජ්‍යයෙහි අභිෂෙක කරන්නෙමි. හෙතෙම තොපගේ රජවන්නේයයි" රජතෙම කීයේය.

40 "ඉක්බිති රටවර්ධනය කරන්නාවූ දීඝාවු නම් කුමාරයා ගෙණාවාහුය. රජතෙම සිත්කළුවූ එකම පුත්‍රයාවූ ඔහු දැක මෙසේ කීයේය.

41 "සියල්ලෙන් සම්පූර්ණවූ ගම් සැටදහසක් වෙත්. පුත්‍රය, ඒ ගම් පිළිපදුව ඔබට රාජ්‍යය පාවා දෙමි.

42 "අදම මම පැවිදි වන්නෙමි. සෙට මරණයවේයයි කවරෙක් දන්නේද, මම දුෂ්ප්‍රාඥවූ කව්ඩා මෙන් කාමයන්ගේ වසඟයට නොයමි.

43 "සියලු අලංකාරයෙන් සැරසූ රන් පොරොදු ඇත්තාවූ රණින් විසිතුරු කළ වස්ත්‍රවලින් වැසූ මාතංග නම්වූ හස්තීහු සැටදහසක් වෙත්.

44 "පුත්‍රය, තෝමර හා අංකුස ගත් ඇත් ඇති ඇතරුවන් විසින් නගින ලද ඒ ඇතුන් පිළිපදුව, තොපට රාජ්‍යය පාවාදෙමි.

45 "අදම මම පැවිදිවන්නෙමි සෙට මරණයයි කවරෙක් දන්නේද, මම දුෂ්ප්‍රාඥවූ කව්ඩාමෙන් කාමයන්ගේ වසඟයට නොයමි.

46 "සියලු අලංකාරයෙන් සැරසූ ස්වාමීහුගේ අදහස් දන්නාවූද උත්පත්තියෙන් සෛන්ධවවූද, ශීඝ්‍ර ගමන් ඇත්තාවූද අසුන් සැටදහසක් වෙත්.

47 "පුත්‍රය, ආයුධද දුනුදු දරන්නාවූ අශ්වාරෝහකයන් විසින් නගිනලද ඒ අසුන් පිළිපදුව. තොපට රාජ්‍යය පාවාදෙමි

48 "අදම මම පැවිදි වන්නෙමි. සෙට මරණයයි කවරෙක් දන්නේද, දුෂ්ප්‍රාඥවූ කව්ඩාමෙන් මම කාමයන්ගේ වසඟයට නොයමි.

49 "සැරසූ ඔසවනලද ධ්වජ ඇත්තාවූ අතුරණලද දිවි සම් ඇත්තාවූ තවද ව්‍යාඝ්‍ර සම් ඇත්තාවූ සියලු අලංකාරයෙන් සැරසූ රථ සැට දහසක් වෙත්

50 "පුත්‍රය, දුනුගත් අත් ඇත්තාවූ යුද්ධ සැට්ට දරන්නාවූ රථිකයන් විසින් නගිනලද ඒ රථයන් පිළිපදුව, තොපට රාජ්‍යය පාවාදෙමි,

51 "අදම මම පැවිදිවන්නෙමි. සෙට මරණයයි කවරෙක් දන්නේද? දුෂ්ප්‍රාඥවූ කවුඩාමෙන් මම කාමයන්ගේ වසඟයට නොයමි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

52 "පුත්‍රය, රතු පැහැ ඇත්තාවූ වෘෂභරාජ නම් ශ්‍රෙෂ්ඨ ගවයන් ඇත්තාවූ දෙනුන් සැට දහසක් වෙත්. ඔවුන් පිළිපදුව තොපට රාජ්‍ය පාවාදෙමි.

53 "අදම මම පැවිදිවන්නෙමි. සෙට මරණයයි කවරෙක් දන්නේද, දුෂ්ප්‍රාඥවූ කවුඩා මෙන් මම කාමයන්ගේ වසඟයට නොයමි.

54 "සියලු අලංකාරයෙන් සැරසුනාවූ විසිතුරු වස්ත්‍රාභරණ ඇත්තාවූ අමුනනලද මිණිකොඩොල් ඇත්තාවූ සොළොස් දහසක් ස්ත්‍රීහු වෙත්. පුත්‍රය, ඔවුන් පිළිපදුව. තොපට රාජ්‍ය පාවාදෙමි.

55 "අදම මම පැවිදිවන්නෙමි. සෙට මරණයයි කවරෙක් දන්නේද, දුෂ්ප්‍රාඥවූ කවුඩා මෙන් ම කාමයන්ගේ වසඟයට නොයමියි" රජතෙම කීයේය.

56 "පියාණෙනි, මා ළදරුකල්හිම මාගේ මව මළායයි අසනලදී. පියාණෙනි, මම ඔබ හැර ජීවත්වන්ටද නො හැක්කෙමි.

57 "යම්සේ සමවූද විෂමවූද පර්වත දුර්ගයන්හි හැසිරෙන්නාවූ වනයෙහිවූ හස්තියෙකු අනුව පස්සෙන් ඇත්පැටියෙක්යේද,

58 "එපරිද්දෙන් ඔබ අනුවයමි. පුතෙකු පස්සෙන් හැරගෙණ යන්නාවූ ඔබට පෝෂණය කිරීමට පහසු වූවෙක් වන්නෙමි. ඔබට පෝෂණය කිරීමට දුෂ්කරවූවෙක් නොවන්නෙමියි" කුමාරතෙම කීයේය.

59 "ධන සොයන්නාවූ වෙළඳුන්ගේ මුහුදෙහි ගමන් කරන්නාවූ නැවක් යම්සේ නපුරු මගක් ගන්නේ නම් වෙළෙන්දෝ ව්‍යසනයට පැමිණෙන්නාහුද, එමෙන්ම කාලකන්නි පුත්‍රය, නුඹ මාගේ ප්‍රව්‍රජ්‍යාවට අන්තරාය කරන්නෙකි" රජතෙම කීයේය.

60 "ඇමැත්තෙනි, මේ කුමරු ඇලුම් වඩන්නාවූ ප්‍රාසාදයට පමුණුවව්. ඒ එහි ස්වර්ණාභරණයෙන් සැරසුනාවූ ඒ ස්ත්‍රීහු

යම්සේ දිව්‍යප්සරාවෝ සක්දෙව් රජහු විසින් සිත් අලවද්ද එමෙන් ඒ කුමරු එහි සිත් අලවන්නාහුය. මේ කුමාරතෙමේද ඒ ස්ත්‍රීන් සමග අභිරමනය කරන්නේයයි” රජතෙම කීයේය.

**61** ඉක්බිති කුමරු ඇලුම් වඩන්නාවූ ප්‍රාසාදයට පැමිණවූහ. එහි නායක ස්ත්‍රීහු රට වර්ධනය කරන්නාවූ ඒ කුමාරයා දැක මෙසේ කීවාහුය.

**62** “නුඹවහන්සේ දේවතාවෙක් වෙහිද, ගන්ධර්වයෙක් වෙහිද නොහොත් පුරින්දද නම් ශක්‍රයාවෙහිද, කවරෙක් හෝ වෙහිද කවරෙකුගේ පුතෙක් හෝ වෙහිද අපි ඔබ කෙසේ දනිමුදැයි” කීහ.

**63** “මම දෙවියෙක් නොවෙමි. ගන්ධර්වයෙක්ද නොවෙමි. පුරින්දද නම් ශක්‍රයාද නොවෙමි. කශී රජුගේ පුත්‍රවූ රට වර්ධනය කරන්නාවූ දීඝාවූ නම් කුමාරයා වෙමි. මා කැමති තොපට යහපතක්වෙව. මම තොපගේ ස්වාමිපුරුෂයා වෙමියි” කුමාරතෙම කීයේය.

**64** එහි ඒ ස්ත්‍රීහු රට වර්ධනය කරන්නාවූ දීඝායු නම් ඒ කුමරුට මෙසේ කීවාහුය. රජතෙමේ මේ කොහිපැමිණියේද රජතෙමේ මෙයින් කොහි ගියේදැයි” කීවාහුය.

**65** “රජතෙම රාගාදීවූ ක්ලේශ පංකය ඉක්ම වූයේය. රජතෙම පැවිද්ද නම්වූ ගොඩබිම පිහිටියේය. රාගාදී කටු නැත්තාවූ මිථ්‍යාදෘෂ්ටි ආදී කැලෑ නැත්තාවූ ස්වර්ගමොක්ෂගාමීවූ මහාමාර්ගයට රජතෙම පැමිණියේය.

**66** “මම වනාහි කටුසහිතවූ වනගහණ සහිතවූ යම් මිථ්‍යා මාර්ගයකින් දුර්ගතියට යෙද්ද, එබඳු දුර්ගතියට යන්නාවූ මාර්ගයට පැමිණියේ වෙමි”

**67** “මහරජ, සිංහරාජයෙකුගේ පර්වත ගුහාවට පැමිණීම මෙන් ඒ ඔබගේ මෙහි පැමිණීම යහපත් පැමිණීමකි. මහරජ්ජුරුවෙනි, අපට අනුශාසනා කරණුමැනව. ඔබ අප සියල්ලන්ගේ ස්වාමි වේයයි කීවාහුයයි” වදාළේය.

**529 සංකිච්ච ජාතකය:- 1** උද්‍යානපාල තෙම රාජ සභාවෙහි උන්නාවූ රට ශ්‍රෙෂ්ඨවූ බ්‍රහ්මදත්ත නම් රජු දැක අනතුරුව රජතෙම යමෙකුට අනුකම්පා ඇත්තේවීද, ඔහු සම්බන්ධව දැන්වූයේය.

**2** "මහරජ, ඍෂීන් අතර යහපතැයි සම්මතවූ මේ සංකිච්ච නම් තාපසතෙම ඔබගේ උයනට පැමිණියේවෙයි. ඉක්මන් ස්වභාව ඇත්තේ වහා යව, ඒ මහර්ෂීහු දැකගණුවයි" කීයේය.

**3** ඉක්බිති රට ශ්‍රෙෂ්ඨවූ රජතෙම ඉක්මන්ව සුදුසුවූ යානාවකට නැග මිත්‍රාමාත්‍යයන් විසින් පිරිවරන ලදුව එහි ගියේය.

**4** කශී රටවැස්සන්ගේ රට වර්ධනය කරන්නාවූ රජ තෙම උයන් දොරටුවට පැමිණ වල්විදුනාවද නළල්පටද කඩුවද ඡත්‍රයද උපාහනයද යන පඤ්චරාජ කකුධභාණ්ඩයන් බහා තබා

**5** රජතෙම යානාවෙන් බැස පඤ්චරාජ කකුධ භාණ්ඩාගාරික ඇමතියා අතටදී දායපස්ස නම් උයනෙහි වැඩහුන් සංකිච්ච තාපසයන් වෙතට ගියේය

**6** ගොස් ඒ රජතෙම ඍෂීහු හා සතුටුවූයේය. ඒ සිහි කටයුතු කථාවකොට නිමවා එකත්පස්ව හිඳගත්තේය.

**7** "එකත්පස්ව හුන්නේම අනතුරුව දැන් ප්‍රශ්න ඇසීමට සුදුසු කාලයයි දැනගත්තේය. ඉක්බිති පාපකර්මයන් විචාරීමට පිළිපන්නේය.

**8** "ඍෂීන්ගෙන් යහපතැයි සම්මතවූ දායපස්ස නම් උයනෙහි වැඩඋන්නාවූ ඍෂි සමූහයා විසින් පෙරටුකරණ ලද්දාවූ සංකිච්ච නම් ඍෂීන් වහන්සේ මම විචාරමි.

**9** "දශකුශල ධර්මයෙහි ඉක්මවා හැසිරෙන්නාවූ මනුෂ්‍යයෝ පරලොව කවර ගතියකට යෙද්ද, මා විසින් ධර්මය ඉක්මවා හැසිරෙනලද්දේවේ. විචාරණලද්දාවූ මට කියවයි" රජතෙම කීයේය.

**10** සංකිච්ච නම් ඍෂිතෙම දායපස්ස නම් උයනෙහි උන්නාවූ කශී රටවැස්සන්ගේ රට වර්ධනය කරන්නාවූ රජුට මෙසේ කීයේය." මහරජ මාගේ වචනය අසව,

11 "සොරුු ඇත්තාවූ මගකින් යන්නහුට යමෙක් නිර්භයවූ මාර්ගය කියාද, ඉදින් ඔහුගේ වචනය කරන්නේ නම් සොරුු නමැති කටු ඔහුට මුහුණ නොදෙන්නේය.

12 "අධර්මයෙන් පිළිපන්නෙකුට යමෙක් සුචරිත ධර්මයෙන් අනුශාසනාකෙරේද, ඉදින් ඔහුගේ වචනය කරන්නේ නම්, හෙතෙම දුර්ගතියට නොයන්නේයයි" අවවාද කෙළේය.

13 "මහරජ, දශකුශල ධර්මයතෙම සුගතියට මාර්ගයවේ. අධර්මය වනාහි දුර්ගතියට මාර්ගයවේ. අධර්මයතෙම නරකයට පමුණුවයි. ධර්මය තෙමේ සුගතියට පමුණුවයි.

14 "මහරජ, අධර්මයෙන් හැසිරෙන්නාවූ විෂමවූ දිවි පැවතුම් ඇති මනුෂ්‍යයෝ පරලොව යම්ගතියකට පැමිණෙත්ද, ඒ නරකයන් මාගෙන් අසව,

15 "සඤ්ජීව නම් නරකයද කාලසූත්‍ර නම් නරකයද සංඝාත නම් නරකයද, රෞරුව නම් වූ නරක දෙකක්ද, තවද අන්‍යවූ මහාවීචි නරකයද, තපන නම් නරකයද පතාපන නම් නරකයද,

16 "යන මේ අටමහා නරකයෝ ඉක්මවිය නොහැක්කාහුයයි කියනලද්දාහ. රෞද්‍ර කර්මයෙන් ගැවැසීගත්තාවූ වෙන සොළොස් ඔසුපත් නරකයෝද වෙත්,

17 "සියලු ඒ නරකයෝ තද මසුරන් තවන්නාහුද බලවත් දුක් ඇත්තාහුද ගිනිසිළු ඇත්තාහුද මහත් භය ඇත්තාවූ ලොමුඩැහැගන්නා ස්වභාව ඇත්තාහුද බිහිසුනු වූවාහුද භය ජනකවූවාහුද වෙත්. දුක් ඇත්තාහුද වෙත්.

18 "කොන් සතරක් ඇත්තාහුද දොරටු සතරක් ඇත්තාහුද කොටස් වශයෙන් ප්‍රමාණකොට බෙදන ලද්දාහුද අයොමය ප්‍රාකාරයකින් වටකරණ ලද්දාහුද යපියනකින් වසනලද්දාහුද වෙත්.

19 "ඒ නරකයන්ගේ අයෝමයවූ ගින්නෙන් දිළිසෙන්නාවූ තෙජසින් යුක්තවූ භූමියවේ. හාත්පස යොදුන් සියයක් හැම කල්හි පැතිර සිටිත්.

20 "තපස් ඇත්තාවූ කායාදී සංයම ඇත්තාවූ ඍෂීන්ට එරුෂ වචනවලින් ඉක්මවා බනින්නාහු මේ නිරයවල උඩුකුරුවූ පා ඇත්තෝ යටිකුරුවූ හිස් ඇත්තෝ වැටෙත්.

21 "තමහට අවැඩකළාවූ අපරාධකාරීවූ ඒ මනුෂ්‍යයෝ කොටස් කළ මසුන් මෙන් අසංඛ්‍ය ගණන් අවුරුදු එහිපැසෙත්.

22 "නිතර ඇතුළත පිටත සහිතව දනුලබන්නාවූ ශරීරයෙන් යුක්තව නරකයෙන් නික්මයාම සොයන්නාහුද දොරටුව නොලබත්.

23 "පූර්වදිශාවටද දුවත්. ඉන්පසු පසුදිශාවටද දුවත්. උතුරු දිශාවටද දුවත්. ඉන්පසු දකුණු දිශාවටද දුවත්. යම් යම් දිශාවෙක්හි දොරටුවකට පැමිණෙද්ද, ඒ ඒ දොරටුවම වැසෙනුලැබේ.

24 "නිරයට යන්නාවූ ජනයෝ මහත්වූ දුකට පැමිණ බොහෝවූ අවුරුදු දහස්ගණන් හිස අත්බැඳගෙණ හඬත්.

25 එහෙයින් තේජස් ඇති ඉක්මවිය නොහැකි කිපියාවූ ආශීර්විෂයෙකු මෙන් සංයම ඇත්තාවූ තපස් ඇත්තාවූ යහපත් ස්වභාව ඇති ඍෂීන්ට ගැටීම පිණිස නොලංවිය යුතුයි

26 "මහත්වූ ශරීර ඇති මහාධනුර්ධරවූ දහසක් බාහු ඇති හෙවත් පන්සියයක් විසින් නැගිය යුතු දුනුදිය නගන්නාවූ කේතක රටට අධිපතිවූ අර්ජුන නම් රජතෙම ගෞතම නම් ඍෂීහට ගටා මුළින්ම සිඳුනේය. හෙවත් විනාශයට පැමිණියේය.

27 "රජස් රහිතවූ කිසිවච්ඡ නම් තාපසයන්ට රජසින් අවඥාකොට දණ්ඩකී නම් ඒ රජතෙම මුලින් සිඳින ලද තල් ගසක්මෙන් විනාශයට ගියේය.

28 "යශස් ඇත්තාවූ මාතංග පණ්ඩිතයා කෙරෙහි සිත ප්‍රදුෂ්‍යකොට මේධ්‍ය නම් රජතෙම පිරිස් සහිතව මුලින් සිඳුනේ එකල්හි මේධ්‍යාරණ්‍ය වූයේය.

29 "අන්ධක වෙන්හු නම් රජහු තණ්ගදීපායත නම් ඍෂීන්ට ගටා ඔවුනොවුන් මොහොලින්, නසා යම පුරයට පැමිණියාහුය.

30 "තවද පෙර අහස හැසුරුනාවූ චෙතිය නම් මේ රජතෙම කපිල ඍෂීන් හා විරුද්ධවූයේ පිරිහුනු ඍද්ධි ඇත්තේ මරණ කාලයට පැමිණ පෘථිවියට ප්‍රවිෂ්ට වූයේය.

31 "එහෙයින්ම ඡන්දාදීන් අගතියට යාම නුවණැත්තෝ ප්‍රශංසා නොකරත්. දූශ්‍යනොවූ සිත් ඇත්තේ සත්‍යයෙන් යුක්තවූ වචනය කියන්නේය.

32 "ඉදින් යම් මිනිසෙක් ප්‍රදූශ්‍යවූ සිතින් අෂ්ට විද්‍යාවෙන් හා පසළොස් චරණයන්ගෙන් යුක්තවූ මුනිවරයන් බලාද, හෙතෙම ඒ කර්මයෙන් යට දිශාවෙහිවූ නරකයට යන්නේය.

33 නපුරු ගති ඇත්තෝ වයොවෘර්ධ ගුණවෘර්ධයන්ට පරිභව කෙරෙද්ද, ඔව්හු දරුවන් නැත්තාහු දායාද නැත්තාහු මුල් සිඳිනලද තල්වතුමෙන් වෙත්.

34 "යමෙක් වනාහි කරණලද ප්‍රව්‍රර්ජිත කෘත්‍ය ඇත්තාවූ මහාර්ෂීවූ ප්‍රව්‍රර්ජිතයෙකු නසාද, හෙතෙම කාල සූත්‍ර නම් නරකයෙහි බොහෝ කලක් පැසෙනු ලැබේ.

35 යම් රජෙක් වනාහි අධර්මයෙහි පිහිටා රට වනසන්නේ වේද ජනපදය පෙළා මෙයින් චුතවූ හෙතෙම පරලොව තාපන නම් නරකයෙහි පැසේ.

36 හෙතෙමේද ගිනිසිළු සමූහයා විසින් වටකරණ ලද්දේ දිව්‍යවූ අව්රුදු සියක් දහසක් එහි පැසේ. හෙතෙම දුක්වූ වේදනාව විඳියි.

37 "ගිනිම අනුභව කරන්නාවූ ඔහුගේ ශරීරයෙන් පැහැ විහිදෙන්නාවූ ගිනිසිළු නික්මෙත්. ලෝමාග්‍රයන්ද නියපොතුද සමග ශරීරාවයවයෝ ගිනිගෙණ දිළිහෙත්.

38 "නිතර ඇතුළත පිටත සහිතව දනුලබන්නාවූ දුකින් පෙළුනාවූ හෙතෙම අකුසුවලින් මඩනාලද ඇතෙකු මෙන් නාද කෙරෙයි.

39 "යම් අධර්මවූ පුරුෂයෙක් තෙම ලෝභය හේතුකොට ගෙණ හෝ ද්වෙෂය හේතුකොටගෙණ හෝ පියා මරාද, හෙතෙම කාලසූත්‍රනම් නරකයෙහි බොහෝ කලක් පැසේ.

40 "එබඳුවූ හෙතෙම ලෝකුම්භ නිරයෙහි පැසේ. පැසුනාවූද සම නැත්තාවූද ඔහු හුල්වලින් නසත්. එබඳු සත්වයා අන්ධයෙකු මළමුත්‍ර අනුභව කරන්නෙකු කොට ලෝදියෙහි ගල්වත්.

41 "නිරය පාලයෝ රත්වූ පැසවනලද යගුලිද බොහෝ කලක් තවන ලද්දාවූ දික්වූ සී වැලින් මැඩගෙණ රැහැන්වලින් දිව එළියට ඇද හරින ලද මුඛයෙහි බහාලත්.

42 "ශ්‍යාමවර්ණවූ ශුනඛයෝද තඹුරුවන්වූ ගිජුලිහිණියෝද වන කවුඩු සමූහයෝද අයෝමය මුඛ ඇත්තාවූ පක්ෂීහුද එක්ව කම්පාකරමින් දිව පිටතට ඇද ලේ සහිතව කඩ කඩා කත්.

43 දැවෙන්නාවූ තල්ගසක් වැනි හාත්පසින් බිඳුනු ශරීර ඇති ඔහුට නිරය පාලයෝ තලමින් අනුව හැසිරෙත්. ඒ නිරය පාලයන්ට වනාහි එය ක්‍රීඩාවක්වේ. අන්‍යවූ නිරි සත්තු දුක් ඇත්තාහු වෙත්. මේ ලෝකයෙහි පියා මරන්නාවූ යම්කිසි කෙනෙක් වෙද්ද, ඔව්හු මෙබඳුවූ නරකයෙහි වාසය කෙරෙත්.

44 "පුත්‍ර තෙමේද මව මරා මෙලොවින් යමපුරයට ගොස් තමන්ගේ කර්ම විපාකයෙන් පැමිණියාවූ හෙතෙම මහත්වූ දුකට පැමිණේ.

45 "අධික බල ඇත්තාවූ නිරය පාලයෝ මව මැරූවහු අයෝමය කෙඳිවලින් බැඳ නැවත නැවත පීඩා කරත්.

46 මව් මැරූ ඔහුට ස්වකීය ශරීරයෙන් වැගිරෙන්නාවූ තමාගෙන්ම හටගත්තාවූ රුධිරය රත්වූ දියව ගියාවූ තඹ ලෝදිය මෙන් පොවත්.

47 පිළිකුල්වූ කුණපවූ කුණුවූ දුර්ගන්ධවූ අශුචි කලල් ඇත්තාවූ පූයා ලේබඳුවූ ජලය ඇති විලට හෙතෙම බැසසිටියි.

48 "එහි මහත්වූ ශරීර ඇති අයොමය මුඛ ඇති කාමීහු මසෙහි ලෙයෙහි ඉතා ගිජුවූවාහු සිව්ය සිඳ ඔහු කත්.

49 "හෙතෙමේද ඒ නරකයට පැමිණියේ පුරුෂ ප්‍රමාණ සියයක් පමණ ගැඹුනේවේ. එහි කුණුවූ කුණපගන්ධය හාත්පස යොදුන් සියයක් හමයි.

50 "ඇස් ඇත්තේද වනාහි ඒ ගන්ධය කරණකොට ගෙණ ඇස්වලින් දිරණු ලැබේ. බ්‍රහ්මදත්ත නම් රජ මව් මැරූ තැනැත්තේ මෙබඳුවූ දුක ලබන්නේය.

51 "ගැබ් හෙළන්නාවූ ස්ත්‍රීහු තියුණුවූ ලංවිය නොහැකිවූ ඛුරධාර නම් නරකය නොඉක්මවා දුර්ගමවූ වේතරණී නම් නදියෙහි වැටෙත්.

52 "අයොමයවූ සොළොස් අඟුල් පමණ කටු ඇති හිඹුල්ගස් දුර්ගමවූ වේතරණී නම් ගඟ දෙපස එල්වෙත්.

53 ඒ නිරිසත්තු ගිනිසිළු ඇත්තාහු දුරවූ ගිනි කඳන් මෙන් සිටිත්. ගින්නෙන් ඇවිලුනාහු උඩට යොදුනක් උස්වූවාහු වෙත්.

54 "ස්වාමියා ඉක්ම පවත්නාවූ ස්ත්‍රීහුද පරදාරාවන් වෙත යන්නාවූ පුරුෂයෝද තියුණු කටු ඇත්තාවූ මේ නරකයෙහිවූ හිඹුල් ගස්වල නගිත්.

55 "බොහෝ කල්ගියාවූ ඔව්හු නිරය පාලයන් විසින් පෙළනලද්දාහු පෙරලී යටිකුරු හිස් ඇත්තාහු වෙත්. හුල්වලින් විනිවිද ගියාවූ ශරීරාවයව ඇත්තෝ සයනය කෙරෙත්. දීර්ඝවූ කාලයක් රෑ නිදි වර්ජිත කෙරෙත්.

56 "ඉන්පසු රාත්‍රීන්ගේ ඉක්ම යාමෙහි මහත්වූ පර්වතයක් බඳුවූ ගිනි හා සමානවූ ජලය ඇති ලෝහකුම්භි නම් නරකයෙහි වැටී පැසෙත්.

57 "මෙසේ රෑද දවල්ද මෝහයෙන් මුළාවූ පරදාර කර්ම කළාවූ දුශ්ශීලයෝ පෙර ජාතියෙහි තමන් විසින් නපුරුකොට කරණ ස්වකීයවූ කර්මය අනුභව කරත්.

58 "ධනයෙන් මිලදී ගත්තාවූ යම් භාර්‍ය්‍යාවක් තොමෝ ස්වාමියා ඉක්මවා හඟීද, නැන්දාට හෝ මාමාට හෝ ස්වාමියාගේ වැඩිමහළු සහෝදරයාට හෝ සහෝදරියට හෝ කටයුතුවත් නොකිරීමෙන් ඉක්මවා පවතීද,

59 "ඇගේ ජීහ්වාග්‍රය, වක්වූ හුලින් බැඳුම් සහිතව පිටතට අදිත්. ඒ නිරි සතා බඹයක් පමණවූ පණුවන් ඇති තමන්ගේ දිව

දකියි. කිසිවක් භගවන්ට නොහැකිවෙයි. ඉන්පසු තාපන නරකයෙහි පැසේ.

**60** "එළුවන් මරා ජීවත්වන්නාහුද උෟරන් මරා ජීවත් වන්නාහුද මසුන් මරා ජීවත්වන්නාහුද මුවන් මරා ජීවත්වන්නාහුද සොරකම් කරන්නාහුද ගවයන් මරන්නාහුද රෞද්‍රවූවාහුද, නුගුණ කියයුත්තෙහි ගුණ කියන්නාහු හෙවත් කේලාම් කියන්නාහුද,

**61** "අඩයටිවලින්ද ලෝහකූටවලින්ද කඩුවලින්ද හීවලින්ද හනිනු ලබන්නාහු යටිකුරුවූ හිස් ඇත්තාහු වේතරණී නම් නරකයෙහි වැටෙත්.

**62** "කූට විනිශ්චය ආදිය කළ තැනැත්තේ සවසද උදයද යකුළුවලින් නසනු ලැබේ. ඉන්පසු දුර්ගතවූ ආත්ම ඇති අනුන් වමාල දෙය හැමකල්හි අනුභව කෙරේ.

**63** "කව්ඩෝද සිවල්ලුද ගිජුලිහිණියෝද වන කව්ඩෝද යන අයොමය මුඛ ඇත්තාහු පව් කළාවූ නිරිසතා ඔබමොබ සල්වමින් කත්.

**64** "යම්කෙනෙක් ඇතිකරගත් මුවෙකු නිසා මුවෙකු නසාද, සේවටු ආදී පක්ෂියෙකු නිසා පක්ෂියෙකු හෝ නසද්ද, අසත්පුරුෂවූ රජසින් ගැවැසීගත් ඔව්හු ඔසුපත් නරකයට යන්නාහු වෙත්යයි" වදාළේය.

**65** "මේ ලෝකයෙහි සාන්තවූවාහුද, දෙව්ලොවට යත්, මනාව කරණ ලද කර්මයාගේ විපාකය බලව. ශක්‍රයා සහිතවූ බ්‍රහ්මයා සහිතවූ දෙවියෝ එහි වෙත්.

**66** "මහරජ, එහෙයින් ඔබට කියමි. රටට අධිපතිය කුශල ධර්මයෙහි හැසිරෙව, මහරජ, යම්සේ මනාව පුරුදු කරණලද සුචරිත ධර්මය පසු තැවිලි නොකරන්නේද, ඒ ඒ පරිද්දෙන් කුශලධර්මයෙහි හැසිරෙවයි, ධර්මදෙශනා කෙළේයයි" වදාළේය.

**530 කුශජාතකයː- 1** "ඔබගේ මේ රට ධන සහිතය. ඇත්සමූහය බලකාය සහිතය. පඤ්චරාජකකුධ භාණ්ඩ සහිතය.

සියලු කැමති සම්පත් ඇත්තේවේ. මැණියෙනි, ඔබගේ මේ රාජ්‍යය අනුශාසනා කරනු මැනව, මාගේ ප්‍රියවවූ ප්‍රභාවතී තොමෝ යම් තැනෙක්හිද, මම එහි යමියි" (කුස රජතෙම මවට කීයේය.)

2 "මහරජ, ඔබ දාවල්ද රාත්‍රියෙහිද මධ්‍යම රාත්‍රී කාලයෙහිද ඍජු නොවූ සිතින් කදගෙනෙමින් මහත් දුක අනුභව කරන්නෙහිය. කුසරජතුමනි ඔබ වහා කුසාවතියට පෙරලා යව, දුර්වර්ණවූ මෙහි වසන්නහු මම නොකැමැත්තෙමියි" ප්‍රභාවතී තෙමෝ කීවාය.

3 "එම්බා ප්‍රභාවතිය, තීගේ වර්ණයෙන් පෙළඹුනාවූ මම මේ රට හැර කුශාවතී රාජධානියට නොයන්නෙමි. ස්වකීය රටහැර තීගේ දර්ශනයෙහි ඇළුනාවූ මම මදුරජහුගේ සිත්කළුවූ ගෘහයෙහි සිත් අලවමි.

4 "ප්‍රභාවතිය, තීගේ වර්ණයෙහි ප්‍රලෝභීවූ මම ක්ලෙශයන්ගෙන් මුළාවූ ස්වභාව ඇත්තෙක්ව පෘථිවියෙහි හැසිරෙමි. මෘගධෙනූන්ට බඳු මන්දලෝචන ඇත්තිය, තී විසින් මත් කරණ ලද්දේවෙමි. කොයි දිශාවෙන් ආයෙම් දැයි දිසාවක් නොදනිමි.

5 "රනින් කළ වස්ත්‍ර හැන්දාවූ ස්වර්ණමය මෙබලාදාම ඇති යහපත් කටි ප්‍රදෙශ ඇති ප්‍රභාවතිය, තිට කැමැත්තෙන් මෙහිම සිටිමි. මම රාජ්‍යයෙන් ප්‍රයෝජන ඇත්තේ නොවෙමියි රජතෙම කීයේය.

6 "පින්වත් කුසරජ තුමනි, යමෙක් නොකැමැති වන්නහු කැමතිවේද, ඔහුට අවැඩක්ම වේ. මහරජ, ඔබ නොකැමැතිවූ මා කැමැති වෙහි. අකාන්තවූයේ කාන්තවූවෙකු කැමැත්තෙහියයි පරිහාස වශයෙන් කීයේය.

7 "යම් මිනිසෙක් කැමැත්ත නැත්තාවූ හෝ කැමැත්ත ඇත්තාවූ හෝ ප්‍රියාවක් ලබාද, මෙහි ලැබීමට ප්‍රශංසා කරමි. එහි නොලැබීම ලාමක වේයයි" රජතෙම කීයේය.

8 "යමෙක් නොකැමැත්තියක කැමති වන්නෙහි නම් හෙතෙම කිනිසිරි දැව කඩකින් ගල්මද හාරන්නෙහිය දැලින් සුලං බඳනෙහියයි" ප්‍රභාවතී තොමෝ කීවාය.

9 "මෘදුවූ ලක්ෂණ ඇත්තිය, ස්වකීය ජනපදයෙන් පිටව ආ යම්බඳුවූ මම තීගේ සමීපයෙහි සුවයක් නොලබම්ද, ඒ මම තීගේ හෘදයෙහි ගලක් බහාලන ලද්දේයයි සිතමි.

10 "එම්බා රාජපුත්‍රිය, යම් කලෙක බැම හකුළුවා මා බලන්නෙහිද, එකල්හි මදුරජහුගේ අන්තඃ පුරයෙහි අරක්කැමියෙක් වෙමි.

11 "රාජපුත්‍රිය, යම් කලෙක සතුටුව සිනාසෙමින් මා බලන්නෙහිද, එකල්හි මම අරක්කැමියෙක් මෙන් නොවෙමි. එකල්හි කුසරජ මෙන් වෙමියි" රජතෙම කීයේය.

12 "මහරජ, ඉදින් නිමිත්ත පාඨකයන්ගේ කීම වනාහි සත්‍ය වන්නේ නම් ඒකාන්තයෙන් සත්කඩක් කොට කපත්වා ඔබ මාගේ ස්වාමියා නොවන්නේම යයි" කීවාය.

13 "ඉදින් අනික් නිමිත්ත පාඨකයන්ගේ කීම සත්‍ය නම් නොහොත් මාගේ කීම සත්‍ය නම් සිංහස්වර ඇත්තාවූ කුසරජු හැර අන්‍යවූ ස්වාමියෙක් නම් තිට නැත්තේමයයි" කුසරජතෙම කීයේය.

14 "එම්බා කුදිය, ඉදින් ඇත්සොඬට බඳු ඌරුයුග්ම ඇති ප්‍රභාවතී තෙමෝ තීගේ කීමෙන් මා බලන්නේ නම් මම කුසාවතී රාජධානියට පැමිණ ස්වර්ණමයවූ ග්‍රීවාභරණයක් තිට කරවන්නෙමි.

15 "එම්බල කුදිය, ඇතුන්ගේ සොඬට බඳු ඌරුයුග්මයක් ඇති ප්‍රභාවතී තොමෝ තිගේ වචනයෙන් මා හා කථා කරන්නේ නම් මම කුසාවතී රාජධානියට පැමිණ තිට ස්වර්ණමයවූ ග්‍රීවාභරණයක් කරවන්නෙමි.

16 "එම්බල කුදිය, ඇත්සොඬට බඳු ඌරුයුග්මය ඇති ප්‍රභාවතී තොමෝ මා හා සිනහ කරවන්නේ නම් මම කුසාවතී

රාජ්‍යධානියට පැමිණ තිට ස්වර්ණමයවූ ග්‍රීවාභරණයක් කරවන්නෙමි.

17 "එම්බල කුදිය, ඉදින් ඇත්සොඬට බඳු ඌරුයුග්ම ඇති ප්‍රභාවතිය ලවා මට මහත් කොට සිනහ කරවන්නේ නම් මම කුසාවතී රාජධානියට පැමිණ තිට ස්වර්ණමයවූ ග්‍රීවාභරණයක් කරවන්නෙමි

18 "එම්බා කුදිය ඉදින් ඇත් සොඬට බඳු ඌරු යුග්ම ඇති ප්‍රභාවතිය ලවා අත්වලින් මා ස්පර්ශ කරවන්නේ නම් මම කුශාවතී රාජධානියට පැමිණ තිට ස්වර්ණමයවූ පළඳනාවක් කරවන්නෙමියි" කුශ රජතෙම කීයේය.

19 "මේ රාජපුත්‍රීතොමෝ කුශරජු කෙරෙහි ස්වල්ප තරම්වූද සැපයක් නොලැබීයයි සිතමි. එහෙයින් අරක්කැමිව බැළමෙහෙ කරන්නාවූ මේ පුරුෂයා කෙරෙහි වැටුප් මිළයකින්ද ප්‍රයෝජන නැත්තෙකු වනකල්හි පිළිසඳර පමණකුත් නොකෙළේයයි" කුදී කීවාය.

20 "ඒකාන්තයෙන් මේ කුදී මෙසේ නපුරු තෙපුල් කියන්නී ඉතා සියුම් ආයුධයකින් කුමක් හෙයින් දිව කැපීම නොලබාදැයි" ප්‍රභාවතිය කීවාය.

21 "එම්බා ප්‍රභාවතිය, ඒ කුස රජහු තීගේ රූපයෙන්ද ආරෝහ පරිනාහ සම්පත්තියෙන්ද ප්‍රමාන නොකරව, ප්‍රිය දර්ශන ඇත්තිය. හෙතෙම මහත්වූ යශ පිරිවර ඇත්තෙකැයි හෘදයෙහි කොට ප්‍රිය කරව,

22 "එම්බල ප්‍රභාවතිය, ඒ කුශ රජතුමා තිගේ රූප ලක්ෂණයෙන්ද උස මහතින්ද පමණ නොකරව, ප්‍රිය දර්ශන ඇත්තීය. හෙතෙම මහත් සම්පත් ඇත්තෙකැයි සිතෙහි කොට ප්‍රිය කරව.

23 "එම්බල ප්‍රභාවතිය, ඒ කුශ රජතුමා තිගේ රූප ලක්ෂණයෙන්ද උස මහතින්ද පමණ නොකරව, මනොඥ තැනැත්තිය. හෙතෙම මහත් ශක්ති ඇත්තෙකැයි මෙනෙහි කොට ඔහුට ප්‍රිය කරව,

24 "එම්බල ප්‍රභාවති, ඒ කුශරජතුමා තිගේ රූප ලක්ෂණයෙන්ද උස මහතින්ද ප්‍රමාණ නොකරව, මනොඥ තැනැත්තිය, හෙතෙම මහත් රටවල් ඇත්තෙකැයි සිතෙහි කොට ප්‍රිය කරව,

25 "එම්බල ප්‍රභාවතිය, ඒ කුශ රජතුමා තිගේ ලක්ෂණ රූපයෙන්ද උස මහතින්ද ප්‍රමණ නොකරව, රුචිර තැනැත්තිය, හෙතෙම සියලු දඹදිව අග රජයයි මෙනෙහි කොට ඔහුට ප්‍රිය කරව,

26 "එම්බල ප්‍රභාවතිය, ඒ කුශ රජතුමා තිගේ ලක්ෂණ රූපයෙන්ද උස මහතින්ද ප්‍රමාණ නොකරව, ප්‍රිය දර්ශන ඇත්තිය, හෙතෙම සිංහයන්ගේ ශබ්දයට සමාන ශබ්ද ඇත්තෙකැයි සිතෙහි කොට ඔහුට ප්‍රිය කරව.

27 "එම්බල ප්‍රභාවතිය, ඒ කුශරජතුමා තීගේ රූප ලක්ෂණ රූපයෙන්ද උස මහතින්ද ප්‍රමාණ නොකරව, මනොඥ තැනැත්තිය, හෙතෙම ලීලාවෙන් යුක්ත ස්වර ඇත්තෙකැයි ඔහුට ප්‍රිය කරව.

28 "එම්බල ප්‍රභාවතිය, ඒ කුශ රජතුමා තීගේ ලක්ෂණ රූපයෙන්ද උස මහතින්ද ප්‍රමාණ නොකරව, ප්‍රිය දර්ශන ඇත්තිය, ඒ රජතෙම මනාව එක්වූ ඝන ස්වර ඇත්තෙකැයි සිතෙහි කොට ඔහුට ප්‍රිය කරව,

29 "එම්බල ප්‍රභාවතිය, ඒ කුශරජතුමා තීගේ ලක්ෂණ රූපයෙන්ද උස මහතින්ද ප්‍රමාණ නොකරව, මනොඥ තැනැත්තිය, ඒ කුශ රජතෙමේ සුන්දරවූ ස්වර ඇත්තෙකැයි සිතෙහි කොට ඔහුට කැමතිවෙව,

30 "එම්බල ප්‍රභාවතිය, ඒ කුශ රජතුමා තීගේ ලක්ෂණ රූපයෙන්ද ආරෝහ පරිනාහ සම්පත්තියෙන්ද ප්‍රමාණ නොකරව, රුචිර තැනැත්තිය, ඒ රජතෙම මිහිරි බැවින් යුත් ස්වර ඇත්තෙකැයි සිතෙහි කොට ඔහුට කැමැතිවෙව.

31 "එම්බල ප්‍රභාවතිය, ඒ කුශ රජතුමා තීගේ ලක්ෂණ රූපයෙන්ද ආරෝහ පරිනාහ සම්පත්තියෙන්ද ප්‍රමාන නොකරව,

ප්‍රිය දර්ශන ඇත්තිය, ඒ රජතෙම සිය ගණන් ශිල්ප දත්තෙකැයි සිතෙහි කොට ඔහුට කැමතිවෙව.

32 "එම්බල ප්‍රභාවතිය, ඒ කුශ රජතුමා තීගේ රූප ලක්ෂණයෙන්ද ආරෝහ පරිනාහ සම්පත්තියෙන්ද ප්‍රමාණ නොකරව, රුචිර තැනැත්තිය, ඒ රජතෙම නොබිඳුන ක්ෂත්‍රිය වංශ ඇත්තෙකැයි සිතෙහි කොට ඔහුට කැමතිවෙව.

33 "එම්බල ප්‍රභාවතිය, ඒ කුශ රජතුමා තීගේ ලක්ෂණ රූපයෙන්ද ආරෝහන පරිනාහයෙන්ද ප්‍රමාණ නොකරව, ප්‍රිය දර්ශන ඇත්තිය. ඒ රජතෙම ශක්‍රයා විසින් දෙනලද කුශතණවලට සමාන නම් ඇත්තෙකැයි හෘදයෙහි කොට ප්‍රිය කරවයි" කුදී කීවාය.

34 "දේවයන් වහන්ස, මේ රජවරු සත්දෙනා දර්පිත වූවාහු සියල්ලෝ යුද්ධයට සැරසී සිටිත්. ප්‍රාකාරය මැඩගෙණ ඇතුල්වන්ට පෙර මේ ප්‍රභාවතිය ඔවුන්වෙත පමුණුවත්වායි" ඇමතියෝ කීහ.

35 "යම්කෙකෙක් මා නසන්ට මෙහි පැමිණියාහුද, ඒ රජුන් සත් දෙනාට මම මේ ප්‍රභාවතිය සත් කඩක් කොට කපා දෙන්නෙමියි" පිය රජතෙම කීයේය.

36 රන්වන්වූ ස්වර්ණයෙන් සැරසිලි කරණ ලද කෝශෙය්‍ය වස්ත්‍ර හැන්දාවූ රාජපුත්‍රීතොමෝ හුන් තැනින් නැගිට්ටේය. කඳුළු පිරුනාවූ ඇස්වලින් යුක්තව දාසී සමූහයා විසින් පිරිවරණ ලද්දී (මව ලඟට ගොස් වැද හඬමින් මෙසේ කීවාය.)

37 "මෑණියෙනි, ඒකාන්තයෙන් පස්වැදෑරුම්වූ සුනු වලින් ගල්වන ලද දළමය මට ඇති කැඩපතෙහි බලා සරසන ලද යහපත්වූ නේත්‍ර ඇති පහවූ රජස් ඇති පිළිකාදී දෝෂ නැත්තාවූ ඒ මාගේ යහපත් මුහුණ රජුන් විසින් වනයෙහි හැර දමන ලදුව තබන්නේය.

38 "මෑණියෙනි, කාලවර්ණවූ උස්වූ කෙළවරවල් ඇති මෘදුවූ සඳුන් කල්ක ගල්වන ලද්දාවූ මාගේ ඒ කේශයන් සොහොන් මැද රැස්වූ ගිජුලිහිණියෝ පා වලින් පැහැර අදින්නාහුයයි සිතමි.

39 "තඹවන් නිය ඇත්තාවූ මනා ලොම් ඇත්තාවූ මෘදුවූ සඳුන් කල්ක ගල්වන ලද්දාවූ මාගේ ඒ බාහු යුග්මය සිඳින ලද්දාවූ රජුන් විසින් වනයෙහි හැර දමන ලද්දාහු වෙත්. මෑණියෙනි, ඒ මාගේ බාහු යුග්මය කව්ඩා හැරගෙණ කඩ කඩා කමින් කැමති පරිදි යන්නේයයි සිතමි.

40 "මෑණියෙනි, ස්වර්ණමය තල් ගෙඩි බඳුවූ නොඑල්බෙන්නාවූ සියුම් වූ කශී සඳුන්වලින් නිතර සේවනය කරණ ලද මාගේ ඒ පයෝධර වෙත්. මාගේ පයෝධරයන්හි සිවල් තෙම කුශයෙන් උපන්නාවූ ළදරු පුත්‍රයෙක් මවගේ පයෝධරයන්හි මෙන් එල්ඹෙන්නේ යයි සිතමි.

41 "මෑණියෙනි, පුළුල්වූ මනාව තලා වඩනලද රුවන් මෙවුල්දමින් නිතර සෙවිනාලද ඒ මාගේ උකුල රජුන් විසින් විසින් සිඳිනලද නිර්වස්ත්‍රව වනයෙහි දමනලද්ද හිවල් සමූහයෝ එහා මෙහා අදිත්යයි සිතමි.

42 "මෑණියෙනි, ශුනකයෝද කව්ඩෝද සිවල්ලුද යම් අන්‍යවූ දළ ඇති සත්තු වෙත්නම් ඔව්හුද යන සියල්ලෝ ප්‍රභාවතීවූ මාගේ මස් අනුභවකොට ජරා නැත්තෝ වන්නාහු යයි සිතමි.

43 "මෑණියෙනි, ඉදින් දුර යන්නාවූ රජවරු මාගේ මස් ගෙණ යන්නාහු නම් ඇට ඉල්වාගෙණ මාර්ගයන් අතර එය දවව්යයි" ප්‍රභාවතී තොමෝ අඩමින් කීවාය.

44 "මෑණියෙනි, ඒ දැවූ තැන මල්වතු කරවා එහි කිනිහිරි ගස් රෝපනය කරව, හිම ඍතුන්ගේ හිම වැටෙන කාලය ඉක්මගිය කල්හි හෙවත් මැදින් මාසයෙහි යම් කලෙක ඒ ගස් මල් පිපෙන්නාහුද එකල්හි මෑණියෙනි ප්‍රභාවතී තොමෝ මෙබඳු වර්ණ ඇත්තීයයි මා සිහි කරවයි" මෙසේ වැළපුනාය.

45 ඒ ප්‍රභාවතියගේ මවවූ දෙවඟනකට බඳු වර්ණ ඇති රජ මෙහෙසිතොමෝ ආසනයෙන් නැගිට රජු වෙතට ගොස් සිටියාය. මද්‍ර රජහුගේ අන්තඃපුරයෙහි රජු ඉදිරියෙහි තබන ලද පොරොවද මස්ළොඹුවද දැක වැළපෙමින් මෙසේ කීවාය.

46 "මනා සංයමවූ කෘෂවූ මධ්‍ය ප්‍රදේශ ඇති මාගේ දුව මේ පොරොවෙන් නසා රජුන්ට දෙන්නෙහි යයි සිතමියි දේවීතොමෝ කීවාය.

47 "එම්බා දියණිය, වැඩ කැමතිවූ මාගේ වචනය නො කෙළේය. එබැවින් ඒ නුඹ අද ලේවලින් ගැවසුනි මාතෘ රාජයාගේ භවනයට යන්නෙහිය.

48 "යමෙක් ඒකාන්තයෙන් කරුණු දක්නාවූ හිතවතුන්ගේ කීම නොකරන්නේද, එබඳු පුරුෂතෙම මෙසේ ව්‍යසනයට පැමිණේ. මෙයින් වැඩි දුකටද පැමිණේ.

49 "දියණියනි, ඉදින් ඔබ කුශරජු විසින් ජාතක කළා වූ මනොඥ දර්ශන ඇත්තාවූ රන්මිණි මෙවුල් දරන්නාවූ නෑ සමූහයා විසින් පුදනලද ක්ෂත්‍රිය කුමාරයෙකු දරන්නෙහි නම් යමයාගේ ගෙදරට නොයන්නෙහිය.

50 "සුන්දරවූ යම් කුශරාජ භවනයෙක්හි බෙර වැයීම් ආදී තූර්‍ය්‍ය නාද පවතියිද මංගල හස්තිතෙම කුඤ්ච නාද කෙරේද, ඊට වඩා මෙහි කිනම් සැපයක්ද?

51 "සුන්රදවූ යම් කුශරාජ භවනයෙක්හි මංගල අශ්ව තෙම හේසාරව කෙරේද, දොරටුව වෙත මනාව හික්මුණු ගාන්ධර්ව කුමාරයෙක් නොයෙක් තූර්‍ය්‍යභාණ්ඩ ගෙණ උපහාර කෙරේද, ඊට වඩා මෙහි කිනම් සුවයක්ද?,

52 "මොනරුන් හා කොස්වා ලිහිණින් කළ හඬ ඇති කොවුලන් විසින් මනාව පවත්වන ලද නාද ඇති සුන්දරවූ කුශරාජ කුලයෙහිවූ ඒ සැපතට වඩා මෙහි කිනම් සැපයක් දැයි" මව් බිසව කීවාය

53 "යම් රජෙක් අප මේ දුකින් මුදන්නේද, සතුරන් මඩින්නාවූ අන් රජුන්ගේ රටවල්යටත් කරන්නාවූ මහත් ප්‍රඥා ඇති ඒ කුශ රජතෙම දැන් කොහිවෙසේදැයි" මව කීවාය.

54 "යම් රජෙක් අප මේ දුකින් මුදන්නේද ඒ සතුරන් මඩින්නාවූ අන් රජුන්ගේ රටවල් යටත් කරන්නාවූ මහත් ප්‍රඥා ඇති කුශ රජතෙම මෙහිම වෙසේයයි ප්‍රභාවතී" කීවාය.

55 "තී උමතුව කියන්නෙහිද, නොහොත් අඥාන බැවින් මුළාවම කියන්නෙහිද, ඉදින් කුසරජතෙම ආයේ නම් කුමක් හෙයින් අපි එය නොදනිමුදැයි?" මව කීවාය.

56 "මේ කුශරජතෙම අරක්කැමිකම් කරන්නාවූ පුරුෂයෙක් වූයේ කුමරියන්ගේ අන්තඃපුර අතර කැසපට දැඩිකොට බැඳගෙණ නැබුරුව වලන් සෝදායයි" ප්‍රභාවතී තොමෝ දැක්වූවාය.

57 "තී කුළුපොතු ස්ත්‍රියක්වෙහිද, නැතහොත් සැඩොලියක්වෙහිද, නොහොත් කුලය දූෂණය කරන්නියක් වෙහිද මද්‍රරජකුලයෙහි උපන්නාවූ තී තම ස්වාමියා කෙසේ නම් දාසයෙකු කරන්නෙහිදැයි" මව පරිහාස කළාය.

58 "මෑණියෙනි, ඔබට යහපතක් වේවා. මම කුළුපොතු ස්ත්‍රියක් නොවෙමි. සැඩොලියක්ද නොවෙමි. කුල දූෂණ කරන්නියක්ද නොවෙමි. මේ තෙම ඔක්කාක රාජ පුත්‍රවූ කුශරජවේ. නුඹ වනාහි දාසයෙකැයි හඟින්නෙහියයි" ප්‍රභාවතී කීවාය.

59 "මෑනියෙනි, ඔබට යහපතක් වේවා. යම් රජෙක් හැම කල්හි විසිදහසක් බමුණන්ට වළඳවාද, ඒ ඔක්කාක පුත්‍රවූ මේ කුශරජවේ. නුඹදාසයෙකැයි හඟින්නෙහිද,

60 "මෑනියෙනි, ඔබට යහපතක්වේවා, යම් රජකුගේ හැමකල්හි ඇතුන් විසිදහසක් යොදද්ද, ඒ මේ ඔක්කාක පුත්‍රවූ කුශරජවේ. නුඹ දාසයෙකැයි සිතන්නෙහිද,

61 "මෑනියෙනි, ඔබට යහපතක්වේවා යම් රජකුගේ හැමකල්හි අසුන් විසිදහසක් යොදද්ද, ඒ මේ ඔක්කාක පුත්‍රවූ කුශරජවේ. නුඹදාසයෙකැයි හඟින්නෙහිද,

62 "මෑනියෙනි, ඔබට යහපතක්වේවා යම් රජකුගේ හැමකල්හි රථ විසිදහසක් යොදද්ද ඒ මේ ඔක්කාක පුත්‍රවූ කුශරජවේ නුඹ දාසයෙකැයි හඟින්නෙහිද?

63 "මෑනියනි, ඔබට යහපතක්වේවා, යම්රජකුගේ හැම කල්හි වෘෂභයන් විසිදාහක්යොදද්ද, ඒ මේ ඔක්කාක පුත්‍රවූ කුසරජවේ. නුඹ දාසයෙකැයි හඟින්නෙහිද?

64 "මෑනියෙනි, ඔබට යහපතක්වේවා. යම් රජෙකුගේ හැමකල්හි දෙනුන් විසිදාහක් දෙවනු ලබද්ද, ඒ මේ ඔක්කාක පුත්‍රවූ කුශරජවේ. නුඹ දාසයෙකැයි හගින්නෙහිදැයි" ප්‍රභාවතී කීවාය.

65 "අඥාන තැනැත්තිය, යම්හෙයකින් මහත් බල ඇත්තාවූ මැඩියෙකුගේ වෙසින් ආ නාගයෙකු මෙන් ආවාවූ ඒ ක්ෂත්‍රිය රජහු මට නොකීයෙහිද, එහෙයින් ඒකාන්තයෙන් තී විසින් නපුරක් කරණලදැයි" පියරජ ගරහමින් කීයේය.

66 "රථෛශ්වරවූ මහරජ, අප්‍රසිද්ධ වේශයෙන් මෙහි පැමිණියාවූ ඔබ දැන නොගත්තෙමු, යන යමක්වේද, නුඹ වහන්සේ අපගේ ඒ වරද ක්ෂමාකළ මැනවැයි" මද්‍රරජතෙම කීයේය.

67 "දේවයෙනි, යම්බඳුවූ මම අරක්කැමියෙක් වූයෙම්ද, මා වැන්නෙකුට එය සුදුසු නොවේ. එහෙයින් ඔබම මට පැහැදෙනු මැනව. තොප විසින් නපුරුකොට කරණලද්දක් නැත්තේයයි" කුසරජ තෙම කීයේය.

68 "අඥාන තැනැත්තිය, යව මහත්බල ඇත්තාවූ කුසරජු ක්ෂමාකරව, ක්ෂමාකරණලද්දාවූ ඒ කුසරජතෙම තිට ජීවිතය දෙන්නේයයි" පියරජ කීයේය.

69 දෙවඟනකට බඳුවූ ප්‍රභාවතී තොමෝ පියරජුගේ වචනය අසා සිරසින් වැටී මහත්බල ඇත්තාවූ කුසරජහු පා අල්වාගත්තේය.

70 "දේවයන් වහන්ස, යම් මේ රාත්‍රීහු ඉක්ම ගියාහුද, ඒ මේ සියලුම රාත්‍රීහු ඔබගෙන් වෙන්ව ඉක්ම ගියාහුය. ඔබගේ පාදයන් හිසින් වඳිමි. රථ ශ්‍රෙෂ්ඨය, මට නොකිපුන මැනව,

71 "මහරජ, ඔබට සත්‍යවූ ප්‍රතිඥාවක්දෙමි. මාගේ ඒ ප්‍රතිඥාව අසනු මැනව, මම නැවත ඔබට අප්‍රියවූවක් නොකරන්නෙමි.

72 "මහරජ, ඉදින් මෙසේ යාඥාකරන්නාවූ මාගේ වචනය නොකරන්නෙමි නම් දැන් පිය රජතෙම මා මරා සත් රජුන්ට දෙන්නේයයි" ප්‍රභාවතී කීවාය.

73 "තී විසින් මෙසේ යාඥා කරණු ලබන කල්හි කුමක් හෙයින් තීගේ වචනය නොකරන්නෙම්ද, සුන්දරිය, තිට කෝප නැත්තේවෙමි. ප්‍රභාවතිය, තී භය නොවෙව,

74 "රාජපුත්‍රිය, මමද තිට සත්‍යවූ ප්‍රතිඥාවක්දෙමි මාගේ ප්‍රතිඥාව අසව, මම නැවත තිට අප්‍රියවූවක්ද නොකරන්නෙමි.

75 "මනා කටිප්‍රදෙශ ඇත්තිය, තිට කැමැත්තෙන්ම බොහෝවූ දුක ඉවසමි ප්‍රභාවතිය මද්ද රාජකුලය නසා තී ගෙණයන්ට පොහොසත්ද වෙමියි" කුස රජතෙම කීයේය.

76 "නොයෙක් අලංකාරයෙන් විසිතුරුවූ රථවල මනාව හික්මුනු අසුන් යොදත්වා එකල්හි සතුරන් නසන්නාවූ මාගේ පරාක්‍රමය බලව්යයි" කුස රජතෙම කීයේය.

77 එහි මදුරජහුගේ අන්තඃපුරයෙහි සිංහයෙකු මෙන් බැබලීම් කරන්නාවූද අත්පොළොසන් දෙන්නාවූද ඔහු ස්ත්‍රීහු කවුළු හැර බැළුවාහුය.

78 ඉක්බිති කුසරජතෙම හස්තිරාජයෙකු පිටට නැග ප්‍රභාවතියද නංවාගෙණ යුද්ධ භූමියට බැස සිංහනාදයෙන් නාද කෙළේය.

79 නාදකරන්නාවූ ඔහුගේ ඒ නාදය අසා සිංහයෙකුගේ නාදය ඇසූ සෙසු මෘගයන් මෙන් කුස රජහුගේ ශබ්දයට භයින් පෙළුනාවූ රජවරු සිහිනැතිව පැන දිව්වාහුය.

80 හස්ත්‍යාරෝහකයෝද සේනාවෙහි සිටියාහුද රථිකයෝද පාබල සේනාවෙහි වූවෝද යන සියල්ලෝ කුස රජුගේ හඬනිසා බියෙන් පෙළුනාහු ඔවුනොවුන් සිඳ ගණිත්.

81 ඒ යුද්ධ භූමියෙහි කුස රජහුගේ පරාක්‍රමය දැක සතුටුසිත් ඇතිවූ සක්දෙව් රජතෙම වේරෝචන නම් මැණිකක් දුන්නේය.

82 ඇත්කඳ පිටට නැංගාවූ ඒ කුසරජතෙම ඒ යුද්ධය දිනා වෙරෝචන නම් මැණිකක් ලැබ නගර නම් පුරයට ඇතුල්වූයේය.

83 ඒ සත්රජුන් ජීවග්‍රාහයෙන් අල්වාගෙණ ඔවුන්ගේම උතුරු සළුවලින් පිටි අත්කොට "බැඳ දේවයන් වහන්ස, මේ ඔබගේ සතුරෝ යයි" මයිලනුවූ මදුරජහට පාවා දුන්නේය.

84 "මේ සියල්ලෝම ඔබගේ වසඟයට පැමිණියාහුය. ඔබගේ සතුරෝ විනාශ කරණලදහ. ඔබට කැමැත්තක් කරව. ඔබ විසින් ඔවුන් මුදන්නේ හෝ වේවා. නසන්නේ හෝ වේවායි" කීයේය.

85 "මහරජ මොව්හු ඔබගේම සතුරෝ වෙත්. ඔව්හු මාගේ සතුරෝ නොවෙත්. ඔබම අපගේ අධිපතියාවෙයි. එබැවින් ඔවුන් මුදනු හෝ වේවා නසනු හෝ වේවායි" මද්‍ද රජතෙම කීයේය.

86 "දේවයෙනි, මේ දිව්‍ය කන්‍යාවන් බඳු යහපත්වූ ඔබගේ දූවරු සත් දෙනෙක් වෙත් ඔවුන්ගෙන් එක එකා බැගින් ඒ රජවරුන්ට දෙව, ඒ රජවරු සත්දෙනා ඔබගේ බෑනාවරුවෙත්වායි" කුසරජතෙම කීයේය.

87 "මහරජ, අපටද ඔවුන්ටද යන අපි සියල්ලන්ටම ඔබ වහන්සේ අධිපතිවෙහියි නුඹ වහන්සේම ඔවුන්ගෙන් යම්රජෙකුට යම්කුමරියක් කැමැත්තෙහි නම් ඇය ඔහුට දෙවයි." මද්‍දරජතෙම කීයේය.

88 "එකල්හි සිංහස්වර ඇත්තාවූ කුසරජතෙම මද්‍ද රජගේ දූවරු ඒ රජුන්ගෙන් එක එක රජෙකුට එක එක කුමරිය දුන්නේය.

89 එකල්හි ඒ රජවරු සත්දෙනා ඒ ස්ත්‍රී ලාභයෙන් සිංහස්වර ඇති කුස රජු කෙරෙහි සතුටුවූවාහු පිනා ගියාහු ස්වකීය රටවලට ගියාහුය.

90 මහත් බල ඇත්තාවූ කුසරජතෙම ප්‍රභාවතී දේවියද වේරෝචන නම්වූ යහපත් මැණිකද ගෙණ කුශාවතී රාජධානියට ගියේය.

91 "එක රථයෙක්හි යන්නාවූ කුශාවතී රාජධානියට ප්‍රවිෂ්ට වන්නාවූ ඒ දෙදෙනා වර්ණයෙන් හා රූපයෙන් සමානවූහ. මාණික්‍යරත්නයාගේ ආනුභාවයෙන් ඔවුනොවුන් ඉක්මවා නොබැබළූහ.

92 "මව්තොමෝ පුත්‍රයා හා එක්වීය. ඒ අඹු සැමි දෙදෙනාද එකල්හි සමගිවූවාහුය. එතැන්පටන් දිවි ඇතිතාක් සමෘද්ධවූ පෘථිවියෙහි සතුටින් වාසය කළාහුයයි" වදාළේය.

**531 සොණනන්ද ජාතකය:-** 1 "ස්වාමීනි, තාපසයන් වහන්ස, ඔබ වහන්සේ දෙවතාවෙක් වෙහිද ගන්ධර්වයෙක් වෙහිද, නොහොත් පුරින්දද නම්වූ ශක්‍රයා වෙහිද, මනුෂ්‍යවූ ඍද්ධි ඇත්තෙක් වෙහිද, අපි ඔබ වහන්සේ කෙසේ දනිමුදැයි" මනොජ නම් රජතෙම ඇසීය.

2 "රාජ්‍ය භාරය දරණ බැවින් භාරත නම් රජතුමනි, මම දෙවියෙක් නොවෙමි. ගන්ධර්වයෙක්ද නොවෙමි. පුරින්දද නම් ශක්‍රයාද නොවෙමි. මනුෂ්‍යවූ ඍර්ධි ඇත්තෙක්වෙමි. මෙසේ මාදනුවයි" නන්ද නම් තාපසතෙම කීයේය.

3 "පින්වතා විසින් මේ මහත්වූ කාය වෙයාාවතික කර්මය කරණලද ස්වභාව ඇත්තේය. එනම් පින්වතා වර්ෂාව වස්නා කල්හි වර්ෂාව වැළකීම කෙළේය.

4 "තවද පින්වත් තෙමේ දරුණුවූ සුළඟ හා අව්ව ඇතිකල්හි සිහිල් සෙවන කෙළේය. තවද පින්වත් තෙමේ සතුරන් මධ්‍යයෙහි ඊ පහරින් රැක්මද කෙළේය.

5 "තවද පින්වතා ඒ සමෘද්ධ රටවල්වල වැසියන් අපට වසඟවූවන් කෙළේය. තවද පින්වතා ඒ සියයක් රජුන් අප අනුව යන්නවුන් කෙළේය.

6 "අපි පින්වතාට සතුටු වූවාහුය. පින්වතා යම් සම්පත්තියක් කැමැත්තෙහි නම් එය ඉල්වාගනු මැනව. ඇත්යානාවක්ද අශ්වරථයක්ද අලංකාරයෙන් සැරසූ ස්ත්‍රීන්ද සිත්කළුවූ ගෙවල්ද යන මොවුන් පින්වතාට අපි දෙන්නෙමු.

7 "නොහොත් අඟුරටෙහි රාජ්‍යය හෝ මගධරට රාජ්‍යය හෝ අපි පින්වතාට දෙන්නෙමු. තවද අස්සක නම් රට හෝ අවන්ති නම් රට හෝ සතුටු සිත් ඇත්තාවූ අපි ඔබට දෙමු.

8 "රාජ්‍යයෙන් භාගයක් හෝ අපි පින්වතාට දෙන්නෙමු ඉදින් සියලු දඹදිව රාජ්‍යයෙන් ප්‍රයෝජන ඇත්තේ නම් එයද දෙමි. යමක් කැමැත්තෙහිද එය අනුශාසනා කරවයි." රජතෙම කීයේය.

9 "මහරජ, මට රාජ්‍යයෙන් හෝ නගරයෙන් හෝ ධනයෙන් හෝ ප්‍රයෝජන නැත්තේය. තවද ජනපදයෙන් ප්‍රයෝජනයක් මට විද්‍යමාන නොවේයයි" නන්ද පණ්ඩිතතෙම කීයේය.

10 "මහරජ, පින්වත්හුගේම රාජ්‍යයෙහි අණ පවත්නා තන්හිවූ ආරණ්‍යයෙහි එක් අසපුවක් ඇත්තේය. ඒ අසපුවෙහි මගේ පියාද, මවද යන දෙදෙන වසත්.

11 "ඒ පූර්වාචාර්‍ය්‍යයන් කෙරෙහි පිනක් කරන්ට මම නොලබමි. එබැවින් පින්වත්හු අධිපතිකොට ඇති පිරිවර සමග ගොස් සොණපණ්ඩිතයන් ආයතිසංවරය ඉල්ලමුයි හෙවත් ක්ෂමා කරවන්නෙමුයි" නන්ද පණ්ඩිතතෙම වර ඉල්විය.

12 "බ්‍රාහ්මණය, මට යමක් කියන්නෙහිද ඔබගේ ඒ මවනය කරමි. මේ කරුණද අපට කියනු මැනව. ඒ ක්ෂමාව ඉල්වන්නෝ කෙතෙක් වෙත්වායි කියන්නෙහිද?

13 "සියයකින් වැස්වූ දනව්වැසි ගෘහපතියෝද මහාසාර වූ මනාව උපන්නාවූ යස පිරිවර ඇත්තාවූ මේ සියලු රජවරුද මනොජ නම් රජවූ පින්වත් තෙමේද, යන සමාව ඉල්වන්නෝ වන්නාහු නම් ප්‍රමාණ වෙත්යයි" නන්ද පණ්ඩිතතෙම කීයේය.

14 "ඇතරුවෝ ඇතුන්ද අසරුවෝ අසුන්ද යොදත්වා. සාරථිය රථය සරසව, ඇතුන් අසුන් රථයන් සැරැසියයුතු භාණ්ඩයන් ගනිව්. රථයෙහි තිබූ ධ්වජ පාදයන්හි ධ්වජ ඔසවත්වා. යම් අසපුවෙක්හි කොශිය ගොත්‍ර ඇති තාපසතෙම වාසයකෙරේද, ඒ අසපුවට යන්නෙමියි" රජතෙම විධාන කෙළේය.

15 ඉක්බිති ඒ රජතෙම සිව්රඟ සෙනගින් පිරිවරණ ලද්දේ නුවරින් පිටත්වූයේය. කොශිය ගොත්‍ර ඇති තාපස තෙම යම් අසපුවෙක්හි වෙසේද, රජතෙම පිරිවර සමග සිත්කළුවූ ඒ අසපුවට ගියේය.

16 "කොළොම් ලීයෙන් කළාවූ කද සතර අඟුලක් උරහිස ස්පර්ශනොකරමින් එයි. දියගෙණර්මට යන්නා වූ කවර නම් කෙනෙකුන්ගේ මේ කදදැයි" මනෝජ රජතෙම ඇසීය.

17 "මහරජ, සීලාචාරසම්පන්න තාපසයෙක්වූ මම සෝණ නම් වෙමි. රෑ දාවල් අනලස්ව මව් පියන් පෝෂණය කරමි.

18 "මහරජ, වනයෙහිවූ පලවැලද අලමුල්ද හැර ගෙණවුත් පෙර කළගුණ සිහිකරමින් මම මව්පියන් පෝෂණය කරමියි" සෝණ පණ්ඩිතතෙම කීයේය.

19 "යම් අසපුවෙක්හි කෝශිය ගොත්‍ර ඇති තාපස තෙම වාසය කෙරේද, අපි ඒ අසපුවට යන්ට කැමැත්තෙමු. සෝණපණ්ඩිතයෙනි, යම් මගකින් ඒ අසපුවට යමුද, අපට ඒ මගකියනු මැනවැයි" රජතෙම කීයේය.

20 "මහරජ, මේ ඒකපදික මාර්ගයවේ. මේ මගින් යව්. යම් දිශාවෙක්හි මේ මේඝයකට බඳු පැහැඇති මනාව පිපි කොබෝලීල ගස්වලින් ගැවසීගත් වනලැහැබ පෙනේද, මෙහි මාගේ පියවූ කෝශියගෝත්‍ර ඇති තාපසතෙම වෙසේ යයි" සෝණ පණ්ඩිතතෙම කීයේය.

21 මහාර්ෂිවූ සෝණ පණ්ඩිතතෙම මෙය කියා රජුන්ට අනුශාසනා කොට ඉක්මන්ව අන්තරීක්ෂ නම්වූ අහසට පැනනැගී අනොතත්ත විලට ගියේය.

22 වහා පැන්ගෙණ අවුත් අසපුව හැමද අස්නක් පනවා පන්සැලට පිවිස පියාට දැන්වූයේය.

23 "පියාණෙනි, මනා ඉපදීම් ඇත්තාවූ යශ පිරිවර ඇත්තාවූ මේ රජවරු ඔබ දැකීමට එත්. මහාර්ෂිය අසපුවෙන් බැහැරව හිඳගනු මැනව."

24 ඔහුගේ ඒ වචනය අසා ඒ මහාතවුස්තෙම ඉක්මන්ව අසපුවෙන් බැහැරව දොරටු සමීපයෙහිවූ අස්නෙහි හිඳගත්තේය

25 ක්ෂත්‍රිය සමූහයා විසින් පිරිවරණලද තේජසින් දිළිසෙන්නාක්මෙන් එන්නාවූ ඒ රජුද දැක කොශිය ගොත්‍ර ඇති තවුස්තෙම මෙය කීයේය.

26 "බෙරද, මිහිඟු බෙරද, සක්ද, පනාබෙරද, ගැට බෙරද යන මෙයින් යුක්තවූවාහු රථශ්‍රෙෂ්ඨයන් සතුටු කරමින් කවරෙකුගේ ඉදිරියෙන් එන්නාහුද?

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

27 "මහත්වූ විදුළියක් බඳු ස්වර්ණමය නළල් පටින් කවරකුගේ නළල් කෙළවර සෝභමානවේද, දුනුහියවුරු වලින් සැරසුණාවූ තරුණවූ කවරෙක් සෝභාවෙන් දිලිසෙමින් එන්නේද?

28 "කඹුරු උදුනෙහි ඔපකරණලද ස්වර්ණයක් මෙන් කිහිරඟුරු බඳුවූ මුහුණද මනොඥ ලෙස බබළයි. සෝභාවෙන් දිලිසෙන්නාවූ මේ කවරෙක්නම් ඒද?

29 "සූයර්‍ය්‍යරශ්මිය වළක්වන්නාවූ සිත්කළුවූ සළාක සහිතවූ චිත්‍රයක් කවරෙකුට අල්වනලදද, සෝභාවෙන් දිලිසෙමින් මේ කවරෙක්නම් ඒද?

30 "ඇතුපිට නැග එන්නාවූ කවරනම් උතුම් නුවණැත්තෙකුගේ සිරුර පිරිවරාගෙණ උතුම්වූ වල් විදුනාව හසුරු වද්ද?

31 "සැට්ට ලන ලද්දාවූ ආජානීය අසුන් පිට නැග්ගාහු කවරෙකුගේ හාත්පස ශ්වෙතච්ඡත්‍ර අල්වා සිටිද්ද, සෝභාවෙන් දිලිසෙමින් මේ කවරෙක් ඒ ද?

32 "අනුව ගමන් කරන්නාවූ යශපරිවාර ඇත්තාවූ ඒ සියයක් ක්ෂත්‍රියයෝ කවරෙකුගේ හාත්පස අනුව පිරිවරා යෙද්ද, සෝභාවෙන් දිලිසෙමින් කවරෙක් මෙහි ඒ ද?

33 "හස්තීහුය, අශ්වයෝය රථය පාබල සෙනගය යන චතුරංගිනී සේනාව කවරෙකුගේ හාත්පස පිරිවරා එද්ද, සෝභාවෙන් දිලිසෙමින් කවරෙක් මෙහි ඒද?

34 "මේ මහත්වූ සේනාව සාගරයේ නොකැළඹුනාවූ රළමෙන් කවරෙකුගේ පිටිපස අනුව ගමන් කෙරේදැයි" පිය තෙම ඇසීය.

35 "රාජාධිරාජවූ මේ මිනෝජ නම් රජතෙම ජයට පැමිණියාවූ තව්තිසා වැසි දෙවියන්ගේ අධිපතිවූ ශක්‍රයා මෙන් නන්දයාගේ පැරැත්තයෙන් ක්ෂමාව ඉල්වීමට බ්‍රහ්මචාරීවූ අපගේ මේ අසපුවට එන්නේය.

36 "ඔහුගේ මේ මහත්වූ සේනාව නොකැළඹුනාවූ බොහෝවූ සාගරයාගේ රළමෙන් පිටුපසින් අනුව ගමන් කෙරේයයි" සොණ පණ්ඩිතතෙම කීයේය.

37 කශී සඳුන් ඇඟගැල්වූ උතුම් කශීසළු දරන්නාවූ ඒ සියලු රජවරු ඇදිලි බැඳගෙණ ඍෂින් සමීපයට පැමිණියාහුය.

38 "කිමෙක්ද, පින්වතුන් වහන්සේට සැපද, කිම පින්වතුන් වහන්සේට රෝග නැද්ද කිම, ආහාර සොයා යාමෙන් යැපෙන්නහුද කිම, අල මුල් හා පලවැල බොහෝ වෙද්ද,

39 "කිමෙක්ද ඩැහැලේ බොන මැස්සෝද මදුරුවෝද දීර්සජාතික සර්පයෝද මදවූවාහුම වෙද්ද, වල්මෘගයන්ගෙන් ගැවසීගත් මේ වනයෙහි කිම හිංසාවක් නැත්තේදැයි" රජ තෙම ඇසූයේය.

40 "මහරජ, අපට සැපද වේ. තවද මහරජ, රෝග නැත්තේය. තවද ආහාර සෙවීමෙන් යැපෙමු තවද අල මුල් හා පලවැල බොහෝ වෙත්.

41 "තවද ඩැහැලේ බොන මැස්සෝද මදුරුවෝද දීර්ඝ ජාතික සර්පයෝද ස්වල්පවූවාහුම වෙත්. වල්මෘගයන්ගෙන් ගැවැසීගත් මේ වනයෙහි අපට හිංසාවක් නැත්තේය.

42 "බොහෝ අව්රුදු ගණන් මේ අසපුවෙහි වසන්නාවූ මට උපන්නාවූ අමනෝඥ ආබාධයක් නොදනිමි.

43 "මහරජ, ඔබගේ යහපත් ඊමකි. තවද ඔබගේ අයහපත් ඊමක් නොවේ. මෙහි පැමිණියාවූ ඔබ අධිපතිවෙහිය. මෙහි යමක් ඔබ කැමැත්තේද, එය කියව

44 "මහරජ, මීමෙන් මිහිරි රස ඇති රන්වන් තිඹිරිය පියාලය කටුඑරමිණිය යන කුඩා ඵලවර්ගවෙත්. එයින් හොඳ හොඳ ගෙඩි අනුභව කරව.

45 "කඳුරැළින් හෙවත් අනවතත්ත විලෙන් ගෙනෙන ලද සිහිල්වූ මේ බොන පැන්දවේ. මහරජ; ඉදින් ඔබ කැමැත්තෙහි නම් එයින් පානය කරව.

46 "තාපසයන් වහන්ස, අපට යමක් දෙන ලද්දේ නම් එය පිළිගන්නාලදී. අප සියල්ලට නුඹ වහන්සේලා විසින් ආගන්තුග සත්කාරය කරණ ලදී. නන්ද පණ්ඩිතතෙමේ යමක් කියානම් ඔහුගේ කීමද අසව්.

47 "නන්දපණ්ඩිතයාගේ පැරැත්ත කිරීමෙන් පින්වතා සමීපයට ආවෝවෙමු. පින්වත් සොණ පණ්ඩිතතෙමේ මාගේ වචනය අසාවා. නන්ද පණ්ඩිතයාගේද පිරිසගේද වචනය අසාවායි" රජතෙම කීයේය.

48 "සියයකට අධිකවූ දනව්වැසි ගෘහපතියෝද මහා සාරවූ බ්‍රාහ්මණයෝද මනාව උපන්නාවූ යශස් ඇත්තාවූ මේ සියලු ක්ෂත්‍රියයෝද පින්වත් මනෝජ රජතෙමේද මාගේ වචනය අනුදනිත්වා.

49 "මේ ආශ්‍රමයෙහි රැස්වූ යම් අමනුෂ්‍ය කෙනෙක් වෙද්ද, මේ වනයෙහි භූතභාවයට පැමිණියාවූ ඒ දෙවියෝ මාගේ වචනය අසත්වා.

50 "දෙවියන්ට නමස්කාරකොට යහපත් පැවතුම් ඇති සෝණනම් ඍෂිහට කියන්නෙමි. කෝෂිය ගෝත්‍ර ඇති ඍෂිය, ඒ මම දකුණු අතයයි සම්මතවූ ඔබගේ සහෝදරයා වෙමි.

51 "මාගේ පියාද මවද පෝෂණය කරණු කැමැත්තාවූ මට ක්ෂමාවුව මැනව, වීරයන් වහන්ස, මේ මව්පිය උපස්ථානය නම් පින ස්වර්ගයෙහි ඉපදීමට කරුණුවේ. කොශිය ගොත්‍ර ඇත්ත එයින් මා නොවළක්වනු මැනව.

52 "මේ මව්පිය උපස්ථානය නම් සත්පුරුෂයන් විසින් පනවන ලදී. හෙවත් වර්ණනාකරණලදී. මට මෙය හැරදමව, උත්සාහයෙන් අත් පා මෙහෙවර කිරීමෙන්ද ඔබවිසින් බොහෝ කලක් එය කරණ ලදී දැන් මම මව්පියන් කෙරෙහි පින් කරණු කැමැත්තෙමි. මට දෙව්ලොව දෙන්නෙක්වුව මැනව"

53 "ඍෂිවරය, නුඹවහන්සේ යම්සේ දන්නෙහිද, එසේම ධර්මයත් දන්නාවූ සෙසු මිනිස්සුද මෙහි වෙත්. ඔව්හුද මේ

වැඩිමහල්ලන්ට උපස්ථාන කිරීම නම්වූ ධර්ම කොටස දෙව්ලොවට මාර්ගයයි කියත්.

54 "උත්සාහයෙන්ද අත්පා මෙහෙවර කිරීමෙන්ද මව්පියන්ට සුව එළවන්නාවූ ඒ මා යමෙක් ඒ පිනෙන් වළකාද, ඒ මනුෂ්‍යතෙම ආර්‍ය්‍ය මාර්ගය වළක් වන්නෙක් වේයයි" නන්ද පණ්ඩිතතෙම කීයේය.

55 "මාගේ සහෝදරයාගේ පැරැත්ත කිරීම පිණිස පිරිසට ඇතුළත්ව ආවාවූ මේ සියලු පින්වත්හු මාගේ වචනය අසත්වා මහරජ, පැරණිවූ කුල පරම්පරාව පිරිහෙළන්නාවූ අධර්මයෙහි හැසිරෙන්නාවූ යම් වැඩිමහල්ලෙක්වේද, හෙතෙම නරකයෙහි උපදී.

56 "මහරජ, පුරාතනවූ ජෙට්ඨාපචායන නම් ප්‍රවේනි ධර්මයට දක්ෂවූ යම් කෙනෙකුන් චාරිත්‍ර ශීලයෙන් යුක්තවූවාහු වෙද්ද, ඔව්හු දුර්ගතියට නොපැමිණෙත්.

57 "රාජ්‍යභාරය උසුලන්නාවූ මහරජ, මව්පියෝද සහෝදරයෝද, සහෝදරියෝද, නෑ බන්ධුහුද යන ඒ සියල්ලෝ වැඩිමලාට භාරවෙත්යයි මෙසේ දනුව.

58 "රථෛශ්වරය, මහත්වූ බරක් ගෙණ උත්සාහ කරන්නාවූ නැවියෙකුමෙන් මමද උත්සාහ කරන්නෙමි. ජෙට්ඨපචායන ධර්මයෙහිද ප්‍රමාද නොවෙමි. මේ සියල්ලන්ට මම වැඩිමලාද වෙමියි" සෝණපණ්ඩිතතෙම කීයේය.

59 "වැසී තිබූ ජෙට්ඨාපචායන ධර්මයෙහි දැනීම ගින්නෙන් පැන නැගී බැබලීමක් මෙන් යම්සේ අපි ලැබූයෙමුද, එපරිද්දෙන්ම පින්වත් කෝශීය ගොත්‍ර ඇති සෝණ පණ්ඩිතතෙම අපට ධර්මය ප්‍රකාශ කෙළේය.

60 "පෘථිවිය බබුළුවන්නාවූ ආලෝක කරන්නාවූ සූර්‍ය්‍ය තෙම උදාවෙමින් යම්සේ සත්වයන්ට යහපත්වූද අයහපත්වූද රූප ප්‍රකාශ කෙරේද, මෙපරිද්දෙන්ම පින්වත් කොශියතෙම අපට ධර්මය ප්‍රකාශ කෙළේයයි" ඒ රජහු කීහ.

61 "මෙසේ සමාව ඉල්වන්නාවූ මාගේ ඇඳිලි කිරීම නොපිළිගන්නාහු නම් මම ඔබට බැඳී හැසිරෙන්නාවූ අනලස්ව වතාවත් කරන්නෙක් වන්නෙමියි" නන්ද පණ්ඩිත තෙම කීයේය

62 "නන්දය, නුඹ ඒකාන්තයෙන් සත්පුරුෂයන් විසින් දෙශනා කරණ ලද සද්ධර්මය දන්නෙහිය. සුන්දරය, සුන්දරවූ හැසුරුම් ඇත්තෙක, ඔබ මට ඉතාම රුචිවෙහිය

63 "පින්වත් පියානන්ටද පින්වත් මෑනියන්ටද කියමි. මාගේ වචනය අසව්. මේ මව්පිය උපස්ථානය කිසිකලෙක මට ස්වල්පවූ බරකුත් නොවූයේය.

64 "මව්පියන්ට සුව එළවීමකොට උපස්ථාන කරණ ලද්දාවූම ඒමට නන්දතෙම පැරැත්තකොට උපස්ථාන කිරීම පිණිස ඉල්වයි.

65 "ශාන්තවූ බ්‍රහ්මචාරීවූ නුඹලා දෙදෙනාගෙන් යමෙක් කැමතිවේද, ඔහුගේ කැමැත්තෙන් නන්දතෙම කවරෙකුට උපස්ථාන කෙරේ දැයි නියම කරගනු මැනවැයි" සෝණ පණ්ඩිතතෙම කීයේය.

66 "පුත්‍රවූ සෝණය අපි ඔබ ඇසුරු කළාහු වෙමු. ඔබ විසින් අනුදන්නාලද මම බ්‍රහ්මචාරීවූ නන්දයා මස්තකයෙහි සිඹගන්ට ලබන්නෙමියි" මව කීවාය.

67 "පවනින් කම්පාවනලද ඇසතු දළුවක්මෙන් බොහෝ කලකින් නන්දයා දැක මාගේ හෘදය වෙව්ලයි.

68 "යම් කලෙක නිදන ලද්දීද, මම ආවාවූ නන්දයා ස්වප්නයෙහි දකිම්ද, එකල්හි ඔද වැඩී ගියාවූ සතුටුසිත් ඇත්තියක් වෙම්ද, අපගේ ඒ මේ නන්දතෙම දැන් මෙහි ආවේය.

69 "යම් කලෙකත් පිබිද ආවාවූ නන්දයා නොදකිම්ද, එකල්හි බොහෝ සෙයින් ශොකය වැඩේ. මහත්වූ දොම්නසටද, පැමිණෙමි.

70 "ඒ මම අද බොහෝ කලකින් පැමිණියාවූද නන්දයා දකිමි. ස්වාමියාටද මටද ප්‍රියවූ අපගේ නන්දතෙම ගෘහයට පිවිසේවා.

71 "යම්හෙයකින් නන්දතෙම පියාටද මනා ප්‍රියවූවෙක් වේද, එහෙයින් නැවත ගෘහයෙන් පිට නොවෙසේවා පුත්‍රය, නන්දතෙම එය ලබාවා. නන්දතෙමේ මට උපස්ථාන කෙරේවායි මව කීවාය.

72 "ඍෂිය, අනුකම්පා ඇත්තාවූද පිහිටවූද, පූර්වයෙහි කිරිදුන්නාවූද අපගේ මව්තොමෝ ඔබකැමති වෙයි. ඒ මව්ට උපස්ථාන කිරීම දෙව්ලොවට මාර්ගයවේ.

73 "පූර්වයෙහි කිරිදුන්නාවූද, ආරක්ෂා කරන්නාවූද, මව්තොමෝ පින් රැස්කර දෙන්නීවේ. ඒ මව්ට උපස්ථාන කිරීම දෙව්ලොවට මාර්ගයවේ. ඍෂීය මව්තොමෝ ඔබ කැමති වේයයි" සෝණ පණ්ඩිතතෙම කීයේය.

74 "පුත්‍ර ඵලය කැමැතිවන්නාවූ මව්තොමෝ දෙවියන්ට නමස්කාර කරයි. නැකැත්ද ඍතු හා අවිරුදුද විචාරයි.

75 "ඔසප්ව ස්නානය කළාවූ ඇයට ගැප් පිහිටීමවේ. ඒ ගැප් පිහිටීමෙන් දොළදුක් ඇත්තීවේ. එකල්හි ස්නෙහය උපදියි එහෙයින් සුහදායයි කියනු ලැබේ.

76 "අවුරුද්දක් හෝ ඉන් අඩුකාලයක් හෝ ගැබ පරිහරණයකොට දරුවා වදනු ලැබේ. ඒ කාරණයෙන් ඕ තොමෝ දරුවන් වදත්හුයි ජනෙත්තීයයි කියනු ලැබේ.

77 "තනකිරිදීමෙන් ගී කිමෙන්ද, ශරීරය ආවරණය කිරීමෙන්ද හඬන්නාවූ පුත්‍රයා සතුටු කරයි. එහෙයින් තොසෙන්තීයයි කියනු ලැබේ.

78 "තවද දරුණුවූ අව් සුළං ඇති කල්හි මමත්වයකොට නොදන්නාවූ දරුවා බලයි. එහෙයින් පොසෙන්තීයයි කියනු ලැබේ.

79 "මවගේ යම් ධනයක් වේද, පියාගේ යම් ධනයකුත් වේද, ඒ දෙයාකාරවුම ධනය මොහු සඳහා අපගේ පුතුට මේ ධනය වන්නේයයි ආරක්ෂා කරයි. පුත්‍රය, මෙසේ හැසිරෙව, පුත්‍රය, මේ කටයුත්ත කරවයි මෙසේ මව වෙහෙසයි.

80 "යොවුන් වයසට පැමිණි කල්හි රාත්‍රියෙහි පරදරාවන් වෙත ප්‍රමාදවූ සවස ගෙදර නොඑන්නාවූ පුත්‍රයා බලමින් මෙසේ මව වෙහෙසෙයි.

81 "මෙසේ දුකසේ පෝෂණය කළාවූ යම් පුරුෂයෙක් මවට අත්පා මෙහෙවර නොකරන්නේද හෙතෙම මව කෙරෙහි වරදවා පිළිපැද නරකයෙහි උපදියි.

82 "මෙසේ දුකින් ඇතිදැඩි කළාවූ යම් පුරුෂයෙක් පියාට අත් පා මෙහෙවර නොකෙරේද, හෙතෙම පියා කෙරෙහි වරදවා පිළිපැද නරකයෙහි උපදියි.

83 "ධන කැමැත්තවුන් අතුරෙන් යමෙක් මවට අත් පා මෙහෙවර නොකෙරේද, හෙතෙම ධනයෙන්ද පිරිහේ. දුකට හෝ පැමිණේයයි මා විසින් මෙසේ අසනලදී.

84 "ධනය කැමැත්තවුන්ගෙන් යමෙක් පියාට අත් පා මෙහෙවර නොකෙරේද, හෙතෙම ධනයෙන්ද පිරිහේ දුකට හෝ පැමිණේයයි මා විසින් මෙසේ අසන ලදී.

85 "සන්තෝෂයද ප්‍රමෝදයද හැමකල්හි සිනාව හා ක්‍රීඩාවද යන මේ සුවය මවට මෙහෙවරකොට නුවණැත්තහු විසින් ලැබිය හැක්කේය.

86 "සතුටද ප්‍රීතියද හැමකල්හි සිනාව හා ක්‍රීඩාවද යන මේ සුවය පියාට අත්පා මෙහෙවරකොට නුවණැත්තහු විසින් ලැබිය හැක්කේය.

87 "මේ ලෝකයෙහි දීමද ප්‍රිය වචන කීමද වැඩෙහි හැසිරීමද ජෙට්ඨාපචායන ධර්මයන් හි ඒ ඒ තැන සුදුසු පරිද්දෙන් පැවති සමානාත්මතාවය යන යමක්හු වෙද්ද

88 "ඒ මේ සංග්‍රහයෝ වනාහි ලෝකයෙහි ගමන්කරන්නාවූ රථයේ කඩ ඇණය මෙන් වෙත්. මේ සංග්‍රහයෝද නොවන්නාහුනම් පුත්‍රයා කරණ කොටගෙණ මවද බුහුමන් කිරීමක් හෝ පිදීමක් හෝ නොලබන්නේය. පුත්‍රයා කරණ කොටගෙණ පියාද නොලබන්නේය.

89 "යම්හෙයකින් මේ සතර සංග්‍රහවන් නුවණැත්තෝ මනාකොට දකිද්ද, එහෙයින් ඔව්හු ශ්‍රෙෂ්ඨබවට පැමිණෙත්. ප්‍රශංසා කටයුත්තෝද වෙත්.

90 "පුත්‍රප්‍රජාව කෙරෙහි අනුකම්පා ඇත්තාවූ මව්පියෝ බ්‍රහ්මයා හා සමාන උත්තමයෝයිද පළමු ගුරුවරුයයිද දරුවන්ගේ සත්කාර ලැබීමට සුදුස්සෝයයිද කියනු ලැබෙත්

91 "එහෙයින්ම නුවණැත්තේ ඔවුන්ට නමස්කාර කරන්නේය. නැවත සත්කාර කරන්නේය ආහාර දීමෙන්ද තවද පානවර්ග දීමෙන්ද වස්ත්‍ර දීමෙන්ද ශයනාසන දීමෙන්ද ඇඟ ඉලීමෙන්ද නැවීමෙන්ද පාසේදීමෙන්ද (සත්කාර කරන්නේය.)

92 "මව්පියන් කෙරෙහි ඒ අත් පා මෙහෙකිරීමෙන් ඔහුට නුවණැත්තෝ මෙලොවම ප්‍රශංසා කරත්. පරලොවට පැමිණ හෙතෙම ස්වර්ගයෙහිද සතුටුවේයයි" ධර්මදෙශනා කෙළේය.

---

## ආසීති නිපාතය

525 **චුල්ලහංස ජාතකයː-** 1 "සුමුඛය, ආදරවශයෙන් නොබලන්නාවූ මේ හංසයෝ බැහැරයෙත්. තෝද යව, බලාපොරොත්තු නොවෙව. පාපයෙහි බැඳුනාහු කෙරෙහි සහාය බවක් නැත්තේයයි හංස රජතෙම කීයේය.

2 "හංස රාජය, මම යන්නෙම් හෝ වේවා නොයන්නේ හෝ වේවා එයින් නොමැරෙන්නෙක් නොවන්නෙමි. සුවපත්වූ ඔබ ඇසුරුකොට දැන් දුකට පැමිණියාවූ ඔබ කෙසේ හරනෙම්ද,

3 "මෙහි ඔබ සමග මරණය හෝ ඔබගෙන් වෙන්ව ගොස් ජීවත්වීම හෝ වන්නේය ඉදින් ඔබගෙන් වෙන්ව ජීවත්වන්නෙම් යන යමක්වේද ඊට වඩා ඔබ හා ඒ මරණය ශ්‍රෙෂ්ඨවන්නේය.

4 "මහරජ, මෙසේ දුකට පැමිණියාවූ ඔබ අත් හරින්නේය යන යමක්වේද, මෙතෙම සත්පුරුෂ ධර්මය නොවේ. හංසරාජය, ඔබට මෙහි යම් නිෂ්පත්තියක්වේද ඒ මට රුචිවේයයි" සුමුඛ නම් හංසතෙම කීයේය.

5 "සුමුඛය, පාසයෙන් බැඳුනහුට මුළුතැන්ගෙය යාම හැර අන්‍යවූ කවර ගතියක්වේද, සිතිය හැක්කාවූ නුවණ ඇති පාසයෙන් මිදුනාවූ තට ඒ කෙසේනම් රුචිවේද?

6 "පියාපත් ඇති සුමුඛය මගේද, තොපගේද යන දෙදෙනාගේ ජීවිත විනාශය ඇතිකල්හි අපදෙදෙනාට හෝ සෙසු නෑයන්ට හෝ කවරනම් වැඩක් තෝ දන්නෙහිද?

7 "රන්වන් පියාපත් දෙක ඇති සුමුඛය අන්ධයෙකු විසින් අඳුරෙහි කරණ ලද්දක් මෙන් ඔබ විසින් යම් ප්‍රාණ ත්‍යාගයක් කරණලද්දේද, එබඳුවූ ප්‍රාණත්‍යාගයෙහි ඔබ කවර වැඩක් දක්නෙහිද?

8 "පක්ෂිරාජය, කෙසේනම් ධර්මයෙහි අර්ථය නොදන්නෙහිද, ධර්මයතෙම පුදනලද්දේම සත්වයන්ට අභිවෘද්ධිය දක්වයි.

9 "ඒ මම ධර්මයද ධර්මයෙන්ම ඇතිවූ අර්ථයද දකිමින් ඔබ කෙරෙහි භක්තියද දකිමින් ජීවිතයෙහි සැක නොකරමි.

10 "සුමුඛය, යම් මිත්‍රයෙක් මිත්‍රයාට පැමිණි විපතෙහි ධර්මය සිහිකරමින් ජීවිතය හේතුකොටගෙණද අත්නොහරින්නේද, මෙතෙම ඒකාන්තයෙන් සත්පුරුෂයන්ගේ ස්වභාව ධර්මයවේ

11 "ඒ මේ ධර්මයද නුඹ විසින් පුරුදුකරණලදී. මා කෙරෙහි භක්තියද ප්‍රකට කරණලදී. මලපතෙහි බැඳුනු මට මේ වැද්දා කැමැත්තක් කෙරේවා. මා විසින් අනුදන්නා ලද්දේම නුඹ යව.

12 "තවද මෙසේ කල්ගිය කල්හි මා හේතුකොටගෙණ අපගේ නෑයන්ට යම් අඩුවක් වේනම් ප්‍රඥා ඇති සුමුඛය එය තොප නිසා අතිශයින් වැසෙනලද්දක් වන්නේය"

13 ආයඅීවූ පැවතුම් ඇති උතුම්වූ හංසයන් දෙදෙනා මෙසේ කථාකරමින් සිටියදීම ගිලනුන්ට මාරයා මෙන් වැද්දා පෙනුනේය.

14 බොහෝ කලක් හිතවත්වූ ඒ පක්ෂින් දෙදෙනා සතුරු වැද්දා දැක නිශ්ශබ්දවූහ. හුන් තැනින් නොසෙල් වුනාහුය.

15 පක්ෂීන්ට සතුරුවූ වැදිතෙම ඒ ඒ තැනින් අහසට නගින්නාවූ හංසයන් ද දැක ඒ හංසරාජයන් දෙදෙනා වෙත වහා පැමිණියේය.

16 ඒ වැද්දා වහා පැමිණ උතුම් පක්ෂිරාජයන් දෙදෙනාට ලංව බැඳුනාහුයයි සිතමින් සෙමින් ළංවූයේය.

17 මලපතෙහි බැඳීඋන්නාවූ එකෙකුද නැවත බැඳී උන්නහුට ළංව දීන නොව බලමින් හුන්නාවූ නොබැඳුනාවූ අනිකාද දිටී.

18 "එහෙයින් හෙතෙම හටගත් විමති ඇත්තේම ඉතා වැඩුනු ශරීර ඇති හුන්නාවූ පක්ෂි සමූහයාට අධිපතිවූ ඒ ශ්වෙත හංසයන් දෙදෙනාට මෙසේ කීයේය.

19 "මහත්වූ පාශයෙන් බැඳුනාවූ මෙතෙම යම් හෙයකින් දිසාවකට පළායාම නොකෙරේද, එකල්හි බලවත් වූ පක්ෂ ඇත්තාවූ නොබැඳුනාවූ නුඹ කවර හෙයකින් නොයන්නෙහිද?

20 "මිදුනාවූ නුඹ බැඳුනාවූ මොහු ඇසුරුකෙළෙහිය. මේ පක්ෂිතෙම නුඹට කවරෙක්වේද, සෙසු පක්ෂීහු මොහු හැරයත්. නුඹ තනිව කුමට පසුබස්නෙහිදැයි" ඇසීය.

21 "පක්ෂීන්ගේ සතුරුවූ වැදිපුත්‍රය, මෙතෙම මාගේ රජය මාගේ ප්‍රාණය හා සමානවූ යහළුවාද වේ. මරණ වාරය පැමිණෙනතුරු ඔහු නොම අත්හරින්නෙමි.

22 "කෙසේනම් මේ පක්ෂිරාජතෙම අටවනලද පුඩුමලය නොදැක්කේද, මහත් බවට පැමිණියවුන් විසින් පැමිණියාවූ මේ විපත්ති කාරණය දැනගන්ට සුදුසුවෙත්මැයි.

23 "යම්කලෙක්හි පිරිහීමක්වේද, ජීවිත විනාශය පැමිණියාවූ ඒ කාලයෙහි පුරුෂතෙම දැලටද, මලපුඩුවටද ලංවීත් නොදනියි

24 "මහනුවණැත්ත, එතකුදුවුවත් අනෙකප්‍රකාරවූ පුඩුමල අටවනලද්දාහ. ඉක්බිති මෙසේ ජීවිත විනාශය පැමිණි කල්හි එයින් සැඟවීතුබූ පුඩුමලයට පැමිණ බැඳෙත්යයි" කීයේය.

25 "වැද්දාණෙනි, තොප සමග මේ සම්භාෂණය සැපවූ විපාක ඇත්තක් වන්නේනම් අපට යාමට අවසර දෙන්නෙහිය. අපගේ ජීවිතයද දෙන්නේයයි" ප්‍රමුඛතෙම කීයේය.

26 "මා විසින් ඔබ නොමබඳනා ලද්දෙහිය. ඔබට හිංසා කිරීමටද නොකැමැත්තෙමි. ඔබ කැමති පරිදි වහා මෙයින් ගොස් නිරුපද්‍රව බොහෝ කලක් ජීවත්වෙවයි" වැද්දා කීයේය.

27 "මොහුගේ ජීවත්වීමහැර මාගේ මේ ජීවත්වීමට මම නොකැමැත්තෙමි. ඉදින් නුඹ එකෙකු කරණකොට ගෙණ සතුටුවෙහිනම් මොහු මුදව, මාද අනුභව කරව.

28 "උස මහතින්ද වයසින්ද අප දෙදෙනා සමානවම්හ. මේ මාරුකිරීමෙන් තොපගේ ලාභයෙන් තෝ පාඩු ඇත්තෙක් නොවේ

29 "එබැවින් සලකා බලව. තොපගේ අප කෙරෙහි ආසාවක් වේනම් පළමුව මා පුඩුවෙන් බඳුව. පසුව පක්ෂි රාජයා මුදව.

30 "එකල්හි තොපට ලාභයද වේ. මාගේ ඉල්ලීමද කරණලද්දී වන්නේය. හංසයන් සමග දිවි ඇතිතාක් තොපගේ මිත්‍රකමද ඇතිවන්නේයයි" සුමුඛතෙම කීයේය.

31 "පින්වත් පක්ෂිරාජය, ඔබ විසින් මුදන ලද්දාවූ මෙයින් ගියාවූ මොහු මිත්‍රාමාත්‍යයෝද ස්වාමීහුද පුත්‍රදාරාවෝද නෑයෝද, යන මහත් සමූහයෝ දකිත්වා.

32 "යම්සේ නුඹ ධෘතරාෂ්ට නම් පක්ෂිරාජයාහට ප්‍රාණය හා සමානවූ යහළුවා වෙහිද ඒ එබඳු මිත්‍රයෝ මේ ලෝකයෙහි බොහෝ දෙනෙකුන්ට විද්‍යමාන නොවෙත්.

33 "ඒ මම ඔබගේ යහළුවා මුදමි. ඔබගේ රජතෙම ඔබ අනුව යන්නෙක් වේවා. කැමති පරිදි වහා මෙයින් ගොස් නෑයන් මැද බබළව්යයි" කියා වැද්දා හංස රජු මුදාහැරියේය.

34 මුදනලද්දාවූ ස්වාමියා කරණකොටගෙණ සතුටුවූ ස්වාමියා කෙරෙහි ගෞරව ඇත්තාවූ ඒ සුමුඛ නම් හංස සේනාපතිතෙම කණට සැපවූ වචන කියමින් වැද්දාට මෙසේ කීයේය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

35 "පින්වත් වැදිපුත්‍රය, යම්සේ මම අද පාසයෙන් මිදූ පක්ෂිරාජයා දැක සතුටුවෙම්ද, මෙසේ නුඹද සියලු නෑයන් සමග සතුටුවේවායි" ස්තුති කෙළේය.

36 "මෙහි එව යම්සේ තෝද ලාභය ලබන්නෙහිද, මේ ධ්‍රතරාෂ්ට හංසතෙමේද යම්සේ කිසි ලාමකවූවක් නොදක්නේද, එසේ තට අනුශාසනා කරමි.

37 "නොබඳිනලද්දාවූ ප්‍රකෘතිභාවය ඇත්ත වූ කදෙහි දෙපසින් සිටියාවූ අප දෙදෙන අන්තඃපුරයට ගෙණගොස් රජහට වහා දක්වව්.

38 "මහරජ, මොව්හු ධ්‍රතරාෂ්ට නම්වූ හංසයන්ගේ අධිපතීහු වෙත්. මෙතෙම වනාහි හංසයන්ගේ රජවේ. මේ අනික් තැනැත්තා සේනාපති වේ."

39 රජතෙමේ මේ හංස රජු දැක ප්‍රීතිමත් වූයේ මනා සිත් ඇත්තේ සතුටුවූයේ "සැක නැතුව තොපට බොහෝ ධනය දෙන්නේයයි" සුමුඛතෙම කීයේය.

40 ඔහුගේ ඒ වචනය අසා වැදිතෙම කී පරිදි කටයුතු සම්පාදනය කෙළේය. වහා අන්තඃපුරයට ගොස් නොබැඳි ප්‍රකෘතිවූ කද දෙපස සිටියාවූ හංසයන් දෙදෙන රජහට දැක්වීය.

41 "මහරජ, මොව්හු ධ්‍රතරාෂ්ට නම් හංසාධිපතීහු වෙත්. මෙතෙම වනාහි හංසයන්ගේ රජය. මේ අනික් තැනැත්තේ සේනාපතිය."

42 "මේ පක්ෂීහු කෙසේනම් තොපට අත්පත්වූවාහුද, කෙසේනම් වැදිතෙමේ මහත්බවට පැමිණියවුන්ගේ අධිපතියන් මෙහි ලැබුයේදැයි" රජතෙම ඇසීය.

43 "මහරජ, පක්ෂීන්ගේ දිවි වළක්වන්නාවූ යම් යම් රැස්වන තැන් දනිම්ද, එබඳු විල්වල මා විසින් මලපුඩු තබන ලද්දාහු වෙත්.

44 "හංස රජතෙමේ එබඳු මලපුඩුවකට ලංව බැඳුනේය. ඔහු ළඟ උපන්නාවූ නොබැඳුනාවූ මේ හංසතෙම මට මෙසේ කීයේය.

45 "ස්වාමියාගේ වැඩෙහි උත්සාහකරන්නාවූ ධර්මයෙහි යෙදුනාවූ මේ පක්ෂීතෙම අනායඝියන් විසින් කරන්ට නො හැකිවූ උතුම්බවක් ප්‍රකාශ කෙළේය.

46 "ජීවත්වීමට සුදුසුවූ මේ හංසතෙම තමන්ගේ ජීවිතය හැරදමා ස්වාමියාගේ ගුණ කියමින් ලඟ හිඳගෙණ ස්වාමිහුගේ ජීවිතය මගෙන් ඉල්විය.

47 "ඔහුගේ වචනය අසා මම ප්‍රසාදයට පැමිණියෙමි. ඉන්පසු ඔහු බැම්මෙන් මිදුයෙමි. සුවසේ යවයිද, අවසර දුනිමි.

48 "සතුටු සිත් ඇත්තාවූ ස්වාමියා කෙරෙහි ගෞරවයෙන් යුක්තවූ ඒ හංසතෙම මුදනලද ස්වාමියා සමග කනට සැපවූ වචන කියමින් මට මෙසේ කීයේය.

49 "එම්බා වැදිපුත්‍රය, යම්සේ මේ අද මුදනලද හංස රාජයා දැක සතුටුවෙම්ද, මෙපරිද්දෙන්ම නුඹ සියලු නෑයන් සමග සතුටුවෙව.

50 "මෙහි එව, යම්සේ තෝද ලාභයක් ලබන්නෙහිද, යම්සේ මේ ධ්‍රතරාෂ්ට නම් හංසතෙම කිසි පාපයක් නොදක්නේද එසේ තට අනුශාසනා කරමි

51 "වහා අන්තඃපුරයට ගෙණගොස් නොබැඳි ප්‍රකෘතිවූ කද දෙපස සිටියාවූ අප දෙදෙන රජහට දක්වව.

52 "මහරජ, මොව්හු ධ්‍රතරාෂ්ටනම් හංසාධිපතීහු වෙත්. මෙතෙම වනාහි හංසයන්ගේ, රජය මේ අනික් තැනැත්තේ සේනාපතිය.

53 "රජතෙමේ මේ හංස රජු දැක සැක නැතිව ප්‍රීතියට පැමිණියේ යහපත් සිත් ඇත්තේ සතුටුව තොපට බොහෝ ධනය දෙන්නේය.

54 "මෙසේ මොහුගේ කීමෙන් මා විසින් මේ දෙදෙනා ගෙනෙන ලදහ. මේ මානස නම් විලෙහිදීම මොහු දෙදෙනා චිත්‍රකූට පර්වතයට යවයයි අනු දන්නා ලද්දෝ වන්නාහ.

55 "මෙසේ සතුරන් අතට පැමිණියාවූ උතුම් ස්වභාව ඇති ද්විජ නම්වූ ඒ මේ පක්ෂිතෙම මා වැනි රෞද්‍රවූ වැද්දෙකුට පවා මෘදු බව ඉපදෙව්වේය.

56 "දේවයන් වහන්ස, මෙය නුඹවහන්සේට සතුටු පඬුරක් මැයි සියලු ලිහිණි වැද්දන් ඇති ගමෙහි මෙබඳු අන් පඬුරක් නොදකිමි. මහ රජතුමනි, මා ගෙනා ඒ පඬුර බැලුව මැනවැයි" වැද්දා කීයේය.

57 හංස රජතෙම ස්වර්ණමයවූ යහපත්වූ පුටුවෙහි හුන් සකුල නම් ඒ රජහු කණට සැපවූ වචන කියමින් මෙසේ කීයේය.

58 "කිම පින්වත් රජහට යහපතද, කිම පින්වතාට ආරෝග්‍යද, කිම සමෘද්ධවූ මේ රට දැහැමින් අනුශාසනා කරණු ලබන්නේද?"

59 "හංස රාජය, මට යහපතද වේ. අර්ථයද වේ. හංසය නීරෝගද වේ. තවද සමෘද්ධවූ මේ රට මා විසින් දැහැමින් අනුශාසනා කරණු ලැබේයයි" රජතෙම කීයේය.

60 "කිම පින්වත්හුගේ ඇමතියන් අතර කිසියම් අපරාධයෙක් නැත්තේද, කිමෙක්ද ඔව්හු ඔබගේ අර්ථයන්හි ජීවිතය නොබලා කටයුතු කෙරෙද්දැයි" හංසරජ ඇසීය.

61 "තවද මාගේ ඇමතියන් අතර කිසි අපරාධයෙක් නැත්තේය. තවද මොව්හු මාගේ අර්ථයන්හි ජීවිතය නොබලා කටයුතු කරත්යයි" රජතෙම කීයේය.

62 "කිමෙක්ද ඔබගේ භාර්‍ය්‍යාතොමෝ සමාන ජාති ඇත්තී කීකරුවූ ප්‍රිය තෙපුල් කියන්නී පුත්‍රයන්ගෙන් හා රූප ලක්ෂණයෙන් යුක්තවූ ඔබගේ කැමැත්ත අනුව පවත්නියක්දැයි" ඇසීය.

63 "තවද මාගේ භාර්‍ය්‍යාතොමෝ සමාන ජාති ඇත්තීය. කීකරුය. ප්‍රිය තෙපුල් කියන්නීය. පුත්‍රයන්ගෙන් හා රූප ලක්ෂණයෙන් යුක්තය. මාගේ කැමැත්ත අනුව පවත්නීයයි" රජතෙම කීයේය.

64 "කිමෙක්ද, පින්වතා වනාහි මහත්වූ සතුරාට අත්පත්වූයේ ඒ පළමු විපතෙහි මහත්වූ දුකට පැමිණියේද?"

65 "කිමෙක්ද මේ වැද්දා පැන නොයන්ට දණ්ඩකින් පෙළුයේද මෙසේ මේ ජඩයන්ගේ එවේලෙහි ස්වභාවය වේ."

66 "මහරජ, මෙසේ විපත්තිය පැමිණි කල්හි නිර්භය වූයේය. මෙතෙම අප කෙරෙහි සතුරෙකු මෙන් කිසිවක් නොකෙළේය.

67 "මහරජ, මේ වැදිතෙම හෙමිහිට ලංවිය. පළමු කොටම මෙතෙම කථා කෙළේය. එකල්හි මේ පණ්ඩිතවූ සුමුඛතෙමේම පිළිතුරු දුන්නේය.

68 "ඔහුගේ ඒ වචනය අසා මෙතෙම ප්‍රශාදයට පැමිණියේය. ඉන්පසු මා බැම්මෙන් මිදූයේය. සුවසේ යව්යයිද අවසර දුන්නේය.

69 "මේ වැද්දාට ධනය කැමැතිවූ සුමුඛයා විසින්ම පින්වත්හුගේ සමීපයට මේ පැමිණීමද මොහුගේ ප්‍රයෝජනය පිණිස සිතනලදියි" හංසරජ කීයේය.

70 "පින්වතුන්ගේ මේ ඊම් යහපත් ඊමකි. ඔබ දැක්මෙන් සතුටුවූයේද වෙමි මේ වැද්දාද කැමතිතාක් බොහෝ වස්තුව ලබාවායි" රජතෙම කීයේය.

71 රජතෙම සම්පත්වලින් වැද්දා සතුටුකොට කණට සුවවූ වචන කියමින් හංස රජුට මෙසේ කීයේය.

72 "පින්වත් හංස රාජය, ඒකාන්තයෙන් යම් කිසිවක් මට වසඟව පවතීද, ඒ සියල්ල ධර්මයට අයත්කොට හෙවත් ධර්මපූජා වශයෙන් දෙමි. ඒ සියලු සම්පත් පින්වතාට වේවා. කැමති පරිද්දෙන් අනුශාසනා කරව්

73 "දානය පිණිස හෝ පරිභෝග කිරීමට හෝ අන්‍යවූ යමකට හෝ වැටහේ නම් එය කරව්. මේ සම්පත ඔබට දෙමි. මාගේ අධිපති භාවය ඔබට හැර දමමියි" රජතෙම කීයේය.

74 "ඉදින් මට පණ්ඩිතවූ ප්‍රඥා සම්පන්නවූ මේ සුමුඛ තෙමේද යමක් කියන්නේ නම් එය මට ඉතාම ප්‍රිය වන්නේ යයි" රජතෙම කීයේය.

75 "මහරජ, මම ඒකාන්තයෙන් ගල් දෙකක් අතරට අසුවූ නාග රාජයෙක් මෙන් ඔබ අතර කථා කරන්ට නොහැක්කෙමි. එසේ කථා කරන්නේ නම් එය මාගේ හික්මීමෙක්ද නොවන්නේය.

76 "අපගේද ශ්‍රෙෂ්ඨවූ යමෙක්වේද, මිනිසුන්ගේ අධිපතිවූ පෘථිවී පාලවූ උත්තම සත්වයෙක්වූ නුඹවහන්සේද යන දෙදෙනා බොහෝ කරුණු වලින් අප විසින් පිදිය යුත්තාහු වෙත්.

77 "මහරජ, ඔවුන් දෙදෙනා කථා කරද්දී විනිශ්චය පවත්නා කල්හි මෙහෙකරුවූ මා විසින් අතරතුර කථා නොකළයුතුයයි" සුමුඛ හංසතෙම කීයේය.

78 "වැදිතෙම ස්වභාව වශයෙන්ම පණ්ඩිතවූ පක්ෂියෙකැයි කීයේය. සම්පාදනය නොකළාවූ ආත්ම ඇත්තෙකුගේ මෙබඳුවූ නුවණැති බවක් නොවන්නේමය.

79 "මෙතෙම මෙසේ උතුම් ස්වභාව ඇත්තෙක් මෙබඳු උත්තම සත්වයෙක් වේ. මා විසින් දක්නා ලද්දවුන් යම් පමණ වෙද්ද, ඔවුන් අතර මෙබඳු අනිකෙකු නොදකිමි.

80 "යහළු හංස රාජය, ස්වභාවයෙන්ම තොපට සතුටුවූයෙමි. දැන් තොපගේ මිහිරි වචනයෙන්ද සතුටු වෙමි. මෙයද මාගේ කැමැත්ත වේ. බොහෝකලක් තොප දෙදෙනා දක්නෙම්වායි" රජතෙම කීයේය.

81 "මහරජ, උතුම් මිත්‍රයෙකු කෙරෙහි කටයුතු යමක් වේද, ඔබ විසින් ඒ සියල්ල අප කෙරෙහි කරණ ලදී. අප කෙරෙහි ඔබගේ යම් භක්තියක් වේද, එයින් නිසැකව අපි ඔබගෙන් එය ලැබූයෙමු.

82 "මේ ඒකාන්තයෙන් ඉතා මහත්වූ අපගේ නෑ සමූහයා අතර බොහෝවූ පක්ෂීන් කෙරෙහි අප නොදැක්මෙන් දුකක් උපන්නේය.

83 "මහරජ, ඔවුන්ගේ ශෝකය දුරුකිරීම පිණිස ඔබ විසින් අනු දන්නාලද අපි ඔබට ප්‍රදක්ෂිණා කොට නෑයන් දක්නෙමු.

84 "ඒකාන්තයෙන් මම පින්වතුන්ගේ දැක්මෙන් මහත්වූ ප්‍රීතියක් ලැබුයෙමි. යම් නෑයන් දැකීමක් වන්නේනම් මෙයද මහත් අභිවෘද්ධියෙක්වේයයි" හංස රජ තෙම කීයේය.

85 ධ්‍රතරාෂ්ට නම් හංස රජහු රජුට මෙය කියා උතුම්වූ ජව වේගයෙන් නෑ සමූහයා වෙත පැමිණියාහුය.

86 නිරෝගවූ පැමිණියාවූ ඒ උතුම් හංස රජුන් දැක හංසයෝ කේකාධ්වනි කළාහුය. එයින් මහත් ශබ්දයෙක් උපන්නේය.

87 පාශයෙන් මිදුනාවූ ස්වාමියා සමග සතුටුවූ ස්වාමියා කෙරෙහි ගෞරව ඇත්තාවූ ලබනලද පිහිට ඇත්තාවූ ඒ හංසයෝ ඔහු හාත්පස පිරිවරා ගත්හ

88 "මෙසේ කල්‍යාණ මිත්‍රයන් ඇත්තවුන්ගේ සියලු කටයුතු සමෘද්ධවෙත්. ධ්‍රතරාෂ්ට නම් හංසයෝ යම්සේ නෑසමූහයා වෙතට පැමිණියාහුද, එමෙනැයි" වදාළේය.

533 **මහාහංස ජාතකයඃ-** 1 "රන්වන් සිවිය ඇති ස්වර්ණ වර්ණවූ සුන්දරමුඛ ඇත්තාවූ සුමුඛය, භයින් කම්පාවූවක්වූ අවයව ඇති මේ හංසයෝ බැහැරයෙත්. තෝද ඒකාන්තයෙන් බැහැර යව.

2 "තනිව මලපුඩුවෙහි අසුවූ මා හැර නෑ සමූහයෝ අපෙක්ෂාවක් නැතුව යෙත්. තනිවූ තෝ කුමක් හෙයින් පසුබස්නෙහිද?"

3 "පක්ෂි ශ්‍රෙෂ්ඨය, තෝද පැනයව, බැඳුනහු කෙරෙහි සහාය බවක් නැත්තේය. නිදුක් බැවින් නොපිරිහෙව. සුමුඛය ඒකාන්තයෙන් බැහැර යවයි" හංස රජතෙම කීයේය.

4 "ධ්‍රතරාෂ්ට නම් මහරජ, මම දුකින් පෙළුනේයයි ඔබ නොහරින්නෙමි. මාගේ ජීවත්වීම හෝ මරණය හෝ ඔබ සමග වන්නේය

5 "ධ්‍රතරාෂ්ට නම් රජ, මම දුකින් පෙළුනේ යයි ඔබ නොහරින්නෙමි අනාර්‍ය්‍යයන් විසින් යෙදෙන්නාවූ කර්මයෙහි මා යොදවන්ට නුසුදුස්සෙහිය.

6 "හංසරාජය, මම ඔබගේ සමාන කුමාර බැව් ඇති යහළුවාද වෙමි. ඔබගේ ස්වකීය සිතෙහි පරිදි සිටියෙක්ද වෙමි. සේනාපතියයිද ප්‍රකටවූයෙමි.

7 "මෙයින් ගියාවූ මම නෑයන් මැද කෙසේ නම් කියන්නෙම්ද? පක්ෂිරාජය, ඔබ හැර මෙයින් ගියාවූ මම ඔවුන්ට කුමක් නම් කියන්නෙම්ද? මෙහි ප්‍රාණය හැර දමන්නෙමි අනායඹීවූවක් කරන්ට නොහැකිවන්නෙමියි" සුමුඛතෙම කීයේය.

8 "එම්බා සුමුඛය, ආයඹීමාර්ගයෙහි සිටියාවූ ඔබ යමක් කීයෙහිද, යමෙක් ස්වාමියාවූද යහළුවාවූද මා හැරදමන්ට උත්සාහ නොකරන්නේද, මේ වනාහි පුරාතන පණ්ඩිතයන්ගේ ස්වභාවයවේ.

9 "නුඹ දක්නාවූ මට වනාහි භයක් නොම උපදී. මෙසේ පාසයෙහි බැඳුනාවූ මාගේ ජීවිතය නුඹ ලබා දෙන්නෙහියයි" හංසරාජතෙම කීයේය.

10 ආයඹී පැවතුම් ඇත්තාවූ මේ උතුම්හංසයන් දෙදෙනා මෙසේ කථාකරමින් සිටියදීම වැදිතෙම දැඩිවූ දණ්ඩක් ගෙණ වහා පැමිණියේය.

11 එන්නාවූ ඔහු දැක සුමුඛතෙම මහත් ශබ්ද කෙළේය. සුමුඛනම් හංස තෙම බියපත්වූ රජුට විශ්වාස වෙමින් රජුගේ ඉදිරියෙන් සිටියේය.

12 "පක්ෂි ශ්‍රෙෂ්ඨය, බිය නොවෙව, තොපවැන්නෝ නොම බියවෙත්. මම දැහැමින් යුක්තවූ සුදුසුවූ උත්සාහයක් කරන්නෙමි ඒ උත්සාහය යෙදීමෙන් ඔබ වහා බන්ධනයෙන් මිදෙන්නෙහියයි" සුමුඛතෙම කීයේය.

13 ඒ සුමුඛ නම් හංස සේනාපතියාගේ ඒ මනාකොට කියනලද වචනය අසා ලොමු ඩැහැගත් වැදිතෙම ඔහුට ඇඳිළිබැඳ සිටියේය.

14 "යහළු පක්ෂිරාජය, ද්විජවූම නුඹ අද මා විසින් මිනිස් තෙපුලෙන් කථාකරමින් නිර්දෝෂ ලෙස මනුෂ්‍ය වචන නිකුත්

කරමින් කියන්නේ ඇසින් දක්නා ලදී. මින් පෙර මෙබඳු ආශ්චර්‍යයක් නොම අසනලදී. නොම දක්නා ලදී.

15 "මිදුනාවූ ඔබ පාශයෙහි බැඳුනාවූ මොහු යම් හෙයකින් ඇසුරුකෙරෙහිද, එහෙයින් මේ පක්ෂිතෙම ඔබගේ කවරෙක්වේද, සෙසු පක්ෂීහු ඔහු හැරයත්, තනිවූ ඔබ කුමක් හෙයින් පසුබස්නෙහිදැයි" වැද්දා ඇසීය.

16 "එම්බා පක්ෂීන්ට සතුරුවූ වැදිපුත්‍රය, මෙතෙම මාගේ රජය. මම මොහුගේ සේනාපති බව කරවමි. විපත් පැමිණිකල්හි ඒ පක්ෂිරාජයා හැරයන්ට නොහැකිවන්නෙමි.

17 "මහත්වූ හංස සමූහයාගේද මාගේද ස්වාමීවූ මෙහෙම තනිව විපත්තියට නොපැමිණේවා. යහළු වැදි පුත්‍රය, එය එසේමය. මේ තෙම මාගේ ස්වාමියාවේ. මම මොහු සමීපයෙහි සිත් අලවන්නෙමියි" සුමුඛ තෙම කීයේය.

18 "එම්බා පක්ෂිය, යමෙක් ස්වාමියාගෙන් ලැබූ ආහාරයට පුදන්නෙහිද, ඒ නුඹ ආර්‍යයන්ගේ පැවතීමෙන් යුක්ත වෙහිය. මම ඔබගේ ඒ ස්වාමියා හරිමි දෙදෙනා සුවසේ යව්යයි" වැද්දා කීයේය.

19 "යහළුව, ඉදින් ඔබ විසින් තමාගේ ප්‍රයෝජනය පිණිස හංසයන්ට හා පක්ෂීන්ට උගුල් අටවන ලද්දේ නම් ඔබගේ මේ අභය දානය පිළිගනිමි.

20 "තමන්ගේ ප්‍රයෝජනය සඳහා හංසයන්ට හා පක්ෂීන්ට උගුල් අටවන ලද්දේ නොවේ නම් එහි අධිපති නොව අප මුදා හරින්නේ වැදි පුත්‍රය, නුඹ සොර කමක් කරන්නෙහියයි" සුමුඛතෙම කීයේය.

21 "වැදිපුත්‍රය, යම් රජෙකුට නුඹ බැලමෙහෙ කරන්නෙක්වෙහිද, ඒකාන්තයෙන් ඔහු වෙතටම අප පමුණුවව, එහිදී සංයම සිත් ඇති රජතෙම කැමති පරිදි කරන්නේයයිද" කීයේය.

22 මෙසේම කියන ලද්දාවූ වැදිතෙම රන්වන්වූ රන්වන් සිවි ඇත්තාවූ ඒ හංසයන් දෙදෙන දෙඅතින් අල්වා ගෙණ කූඩුවල තැන්පත් කෙළේය.

23 කුඩුවලවූ පැහැ විහිදෙන වර්ණ ඇති සුමුඛද ධන රට්ඨද යන ඒ හංස පක්ෂීන් දෙදෙන හැරගෙණ වැදිතෙම කීයේය.

24 ගෙණ යනු ලබන්නාවූ ධ්‍රතරාෂ්ට නම් හංසතෙම සුමුඛ නම් හංසයාට මෙය කීයේය. "එම්බා සුමුඛය, රන්වන්වූ ලක්ෂණවූ ඌරුයුග්මයක් ඇති භායර්‍යාවගේ මරණයට භයවෙමි. අපගේ මේ නැසීම අසා ඉක්බිති ඕ තොමෝ තමන් නැසෙන්නේය.

25 "සුමුඛය, පාකහංසරාජධිතෘවූ රන්වන් මනාසිවිය ඇත්තාවූ සුහේමා නම් ඕ තොමෝ හිමියා මලකල්හි මුහුදු ඉව්රෙහි බැගෑපත්ව හඬන්නාවූ කොස්වාලිහිණියක මෙන් හඬන්නේයයි සිතමි.

26 "මෙසේ හංස ලෝකයාට මහත්වූ අපමණ ගුණ ඇති මහත් සමූහ ඇත්තාවූ පින්වත් තෙමේ එක් ස්ත්‍රියක් අනුව ශොක කරන්නේය. මෙය ප්‍රඥා ඇත්තෙකුගේ කටයුත්තක් මෙන් නොවේ."

27 "මහරජ, යම්සේ වාතය තෙම යහපත්වූද අයහපත්වූද යන ගඳ දෙකම ගණීද, යම්සේ ලොල්වූ බාල තෙමේ අමුවූද පැසුනාවූද ඵලය ගණීද, ලොල්වූ අන්ධතෙම ආහාරය ගනීද ස්ත්‍රීහු එබඳු වෙත්.

28 "යම්හෙයකින් මරණ අවස්ථාවට පැමිණියේ කටයුත්ත නොකටයුත්ත නොදන්නෙහිද, එහෙයින් කාරණ කාරණයන්හි විනිශ්චය නොදන්නාවූ ඔබ අන්ධ බාලයෙකු මෙන් මට වැටහෙන්නේය.

29 "යමෙක් ස්ත්‍රීන් උතුම්යයි හඟින්නෙහිද, හෙතෙම අඩක් උමතුවූවෙකු මෙන් කථා කරන්නේය. මේ ස්ත්‍රීහු නම් සුරාසොඬුන්ගේ සුරාසැළ මෙන් බොහෝ දෙනාට සාධාරණවෙත්.

30 "දෙවයන් වහන්ස, වඤ්චාකරණ හෙයින් මායාවක් වැන්න. අතට අසුනොවන හෙයින් මිරිඟුවක් වැන්න ශොකය රෝගය යන නොයෙක් උපද්‍රව ඇත්තේය. ක්‍රොධාදීන් තද

බැවින් කෲරය. සිරබන්ධනාදියට කරුණුය. මේ ස්ත්‍රීහු නම් ශරීර ගුහාව ඇසුරු කරන්නාවූ මරහුගේ පාශයවේ. එබඳු ස්ත්‍රීන් කෙරෙහි යම් පුරුෂයෙක් විශ්වාස කරන්නේ නම් හෙතෙම මිනිසුන් අතර අධමවූ මිනිසෙක් වේයයි" සුමුඛතෙම කීයේය.

31 "යම් ස්ත්‍රියක් නුවණින් වැඩි සිටියවුන් විසින්ම දන්නාලදද, ඒ ස්ත්‍රියට නින්දා කරන්ට කවරෙක් සුදුසුවේද, මහත් ගුණැති ස්ත්‍රීහු නම් ලෝකයෙහි පළමු කොට උපන්නාහුය.

32 "සුමුඛය, ඒ ස්ත්‍රීන් කෙරෙහි ක්‍රීඩාවෝද පිහිටියාහුය. ඒ ස්ත්‍රීන් කෙරෙහි පස්කම් ගුණයෙහි ආලයෝද පිහිටියාහුය. යම් මේ සත්ව කෙනෙක් උපදිත් නම් ඒ බීජයෝද ඔවුන් කෙරෙහිම හටගනිත්.

33 "තමන්ගේ ප්‍රාණයෙන් ඔවුන්ගේ ප්‍රාණය ආසාදනය කොට හෙවත් දිවිහරිමින්ද කවරනම් පුරුෂයෙක් ඔවුන් කෙරෙහි කලකිරෙන්නේද?

34 "සුමුඛය, අනිකෙක් නොවේ. නුඹම ස්ත්‍රීන්ගේ කටයුතුවල යෙදෙන්නෙහිය. ඒ නුඹට අද බිය ඇතිවූ කල්හි මේ මරණ බියෙන් තියුණු නුවණක් ඇතිවීයයි" හඟිමි.

35 "ජීවිත සැකයට පැමිණියාවූ සියලු දෙනම බියපත් වූයේද භය ඉවසාද, පණ්ඩිතයෝද මහත්වූවෝ දුකසේ යෙදිය යුතුවූ අර්ථයෙහිද යෙදෙත්.

36 "ශූර තෙමේ යම්හෙයකින් විපත්තිය දුරුකෙරේද, ආත්මාරක්ෂාව කෙරේද, එහෙයින් මේ සඳහා රජහු ශූරවූ මන්ත්‍රියෙකු කැමතිවෙත්.

37 "අද රජහුගේ අරක්කැමියෝ මුළු තැන්ගෙයි අප නොකපත්වා. අපගේ පත්‍රයන්ගේ වර්ණය එබඳුමය. යම්සේ එලය හුණ ගස නසාද, එමෙන් ඔබද මාද නොනසාවා

38 "වැදිපුත්‍රයා විසින් මුදනලද්දේද, පියාඹායන්ට නොකැමැතිවිය. තෙමේම නැවත බන්ධනයට පැමිණියේය. එයද දැන් ජීවිත සැකයට පැමිණියේය. මිදෙන කරුණ

සිතාගණුව, ස්ත්‍රීන්ට නින්දා පිණිස මුඛය නොහරුවයි" හංස රජතෙම කීයේය.

39 "යහළු සුමුඛය ඒ තෝ පළමු කී දැහැමින් යුක්තවූ උත්සාහය, දැන් යොදව, තොපගේ ඒ පිරිසිදුවූ ප්‍රයෝගයෙන් මාගේ ජීවිතය සෙවීම කරවයි" හංස රජ කීයේය.

40 "එම්බා පක්ෂි ශ්‍රෙෂ්ඨය, බිය නොවෙව. තා බඳුවූවෝ බිය නොවෙත්මය. මම දැහැමින් යුක්තවූ සුදුසු ප්‍රයෝගයක් යොදන්නෙමියි මාගේ ඒ පිරිසිදු ප්‍රයෝගයෙන් ඔබ වහා බැම්මෙන් මිදෙන්නෙහියයි" සුමුඛතෙම කීයේය.

41 ඒ වැදිතෙම හංසයන් රැගත් කදින් යුක්තව රජ ගෙදරට පැමිණියේය. "මා පැමිණියහු රජුට දන්වව්. මේ ධ්‍රතරාෂ්ට නම් හංස රජතෙම ආයේයයිද රජුට කියව්යයි" දොරටු පාලයාට කීයේය.

42 තමන්ගේ පින බඳුවූ ශ්‍රෙෂ්ඨයයි සම්මතවූ ඒ හංසයන් දෙදෙන දැකම සංයම සිත් ඇති රජතෙම ඇමතියන්ට මෙසේ කීයේය.

43 "මේ වැද්දාට වස්ත්‍රද ආහාරපානද භෝජනයද දෙව්. රජතෙම යම්තාක් කැමතිවේද, මොහුට කැමති තරම් හිරණ්‍ය දෙව්යයි රජ කීයේය.

44 කශී රජතෙම ප්‍රසන්න බවට පැමිණි වැද්දා දැක මෙය කීයේය. "යහළු ඛෙමකය, ඉදින් අපගේ පොකුණ හංසයන්ගෙන් පිරී තිබේද?"

45 "කෙසේනම් රුචිවූ හංසයන් මැදට ගියාවූ නෑ සමූහයා විසින් පිරිවරණ ලද්දාවූ මේ හංස රජහු වෙතට මළ පුඩුව ගත් අත් ඇතිව පැමිණියේද, කෙසේ මොහු අල්ලා ගත්තේදැයි" රජ ඇසූයේය.

46 "මොහු ගොදුරු ගන්නා තැන් සොයන්නාවූ මට අද සත්වැනි රැයවිය. මම මොහුගේ පියවර සොයමින් අප්‍රමාද වූයේ චාටි පඤ්ජරයක් ඇසුරු කෙළෙමි. හෙවත් සැළක් තුළ සිටියෙමි.

47 "ඉක්බිති ගොදුරු පිණිස හැසිරෙන්නාවූ මොහුගේ පියවර දිටීමි. එහි මම මළපුඩුවක් තැබුයෙමි. මෙසේ මේ පක්ෂි රාජයා අල්වා ගතිමියි" වැද්දා කීයේය.

48 "එම්බල වැදිපුත්‍රය, මේ පක්ෂීහු දෙදෙනෙක් වෙත්. එසේ ඇති කල්හි එකෙකැයි කියන්නෙහිය. තාගේ සිත විපර්‍යාස බවට පැමිණියේද නොහොත් කිම අනිකා ගණු කැමැත්තෙහි දැයි" රජ ඇසීය.

49 "මහරජ, යමෙකුගේ මේ රතු පැහැ ඇති ස්වර්ණ බඳු යහපත්වූ රේඛාවෝ බෙල්ල වටා උරයට හැපී සිටිද්ද, ඒ මේ හංස රජතෙම මාගේ පාශ බන්ධනයට පැමිණියේය.

50 "ඉක්බිති මේ ප්‍රභාස්වරවූ පක්ෂිතෙමේ නොබැඳී බන්ධනයෙන් පීඩිතවූ ස්වාමියා සනසමින් ඉදිරියට පැමිණ මා සමග මිනිස් තෙපුලෙන් කථා කරමින් සිටියේයයි" වැද්දා කීයේය.

51 "එම්බා සුමුඛය, එසේ ඇතිකල්හි කුමක් හෙයින් දැන් හනු එකට හපා කට පියාගෙණ සිටිනෙහිද? කිමෙක්ද, මාගේ පිරිසට පැමිණියාවූ නුඹ භයින් යුක්තවූයේ කථා නොකරන්නෙහිදැයි" රජතෙම ඇසීය.

52 "එම්බා කශීරජ, ඔබගේ පිරිසට වැද මම බියපත් නුවූයෙමි. මම භයින් කථා නොකරන්නෙම් නොවෙමි. එබඳු කරුණක් ඇතිකල්හි කථා කළයුතු යයි" සුමුඛතෙම කීයේය.

53 "තොපගේ ආරක්ෂක පිරිසක් නොදකිමි. රථයන්ද නොදකිමි. පාබල සෙනඟද නොදකිමි. පලිහක්ද නොදකිමි. කීටයක්ද නොදකිමි. සැට්ට ලන ලද්දවුන්ද ධනුර්ධරයන්ද නොදකිමි.

54 "අමු රන්ද රත්රන්ද නොදකිමි. දිය අගලකින් යුක්තවූ දුර්ගෂවූ දැඩි අටළු හා කොටුඇති මනාව ගොඩ නගන ලද නගරයක්ද නොදකිමි. සුමුඛය යම්තැනෙක්හි පැමිණියේ බිය නොවේයයි කිය යුතුද, එබඳු තැනක් නොදකිමියි රජතෙම කීයේය"

55 "මහරජ, ආරක්ෂක පිරිවරින් මට ප්‍රයෝජන නැත්තේය. නුවරින් හෝ ධනයෙන් හෝ මට ප්‍රයෝජනයෙක් නැත. අහසින් ගමන් කරන්නාවූ අපි අමාර්ගයෙහි මාර්ගකොට යෙමු.

56 "අපි නුවණැත්තෝය, දක්ෂයෝය, කරුණු සිතන්නාහුයයි ඔබ විසින් අසන ලද්දේද වෙමු. ඉදින් නුඹ සත්‍යයෙහි පිහිටියෙක් වන්නේ නම් කරුණු සහිතවූ වචනයක් කියන්නෙමි.

57 "සත්‍ය විරහිතවූ අනාර්‍ය්‍යවූ බොරු කියන්නාවූ රෞද්‍රවූ ඔබට කියනලද සුභාෂිතයද කුමක් කරන්නේදැයි" සුමුඛතෙම ඇසීය.

58 "මහරජ ඔබ බමුණන්ගේ කීමෙන් මේ බෙමිනම් විල කරවීය. මේ දශ දිශාවන්හි ඔබ විසින් අභයද ප්‍රකාශ කරණලදී.

59 "ඔබගේ පොකුණට බැස පිරිසිදුවූ නිර්මල ජලයද බොහෝවූ ආහාරද එහි ලබත්. එය ලබන්නාවූ පක්ෂීන්ට මෙහි අවිහිංසාවද ප්‍රකාශ කරණලදී.

60 "මේ ඝෝෂාව අසා ඔබගේ සමීපයෙහි කරණලද විලට ආයෙමු ඒ අපි ඔබගේ පාසයෙන් බැඳුනෙමු. මෙය ඔබ විසින් කියනලද බොරුවයි.

61 "බොරු කීම පෙරදැරි කොට ආසාව යයි කියනලද පවිටු ලෝභයද කොට දිව්‍ය මනුෂ්‍ය යන ප්‍රතිසන්ධි දෙක ඉක්මවා නිරය දුකට පැමිණේයයි" මෙසේ රජහු ලජ්ජා කරවූයේය.

62 "එම්බා සුමුඛය, තොපට අපරාධ නොකරමු. ලෝභයෙන්ද තොප නොගත්තෙමි. තෙපි පණ්ඩිතය, නිපුණය, අර්ථ චින්තකයෝ යයි අසන ලද්දෝද වව්.

63 "මෙහි පැමිණියාවූ කරුණු සහිත වචන ප්‍රකාශ කරන්නාහු නම් මැනව, යහළුව ඒ කාරණයෙන් ඒ සුමුඛ නම් හංසයා අල්වාගත්තේ යයි වැදි තෙම කීයේයයි" රජ කීයේය.

64 "එම්බා කශීරජ, ජීවිතය මරණය සමීපයට පැමිණි කල්හි බිය වූවාහු මරණ කාලයට පැමිණියාහු කරුණු සහිත වචනය නොකියමු.

65 "යමෙක් දීපක මුවෙකු කරණකොට ගෙණ මුවෙකු නසාද, දීපක පක්ෂියෙකු කරණකොට ගෙණ පක්ෂියෙකු හෝ නසාද, ප්‍රසිද්ධවූවකින් හෝ ප්‍රසිද්ධවූවෙකු පෙළන්නේද, එයට වඩා ඉතා අනාර්‍ය්‍යවූවක් කවරේද?

66 "යමෙකුත් අනාර්‍ය්‍යවූ ධර්මයෙහි පිහිටියේ ආර්‍ය්‍යවූ වචන කියන්නේද, හෙතෙම මෙලොවද පරලොවද යන දෙලොවින්ම පිරිහෙන්නේය.

67 "යශසට පැමිණියාවූද යමෙක් එයින් මත් නොවන්නේද, පැමිණියාවූ ජීවිතයෙහි සැක ඇත්තහු නොපෙළන්නේද, කටයුතුවලම උත්සාහ කරන්නේද, තමන්ගේ සිදුරු වසන්නේද,

68 "ගුණයෙන් වැඩිහිටියාවූ මරණ කාලයට පැමිණියාහු මේ මිනිස් ලොව ඉක්ම ගියාහුද, මෙලොව කුශල ධර්මයෙහි හැසිර මෙසේ මොව්හු දෙව් ලොවට පැමිණියාහු වෙත්.

69 "කශීරජතුමනි, මෙය අසා තමා කෙරෙහිවූ ධර්මය ආරක්ෂා කරව. ධෘතරාෂ්ට නම්වූ හංස රාජයාද මුදා හරුවයි සුමුඛතෙම කීයේය.

70 "පා දෝනා දියද පා ගල්වන තෙල්ද මාහැඟි අස්නක්ද ගෙනෙත්වා. යශස් ඇත්තාවූ ධෘතරාෂ්ට නම් හංසයා මැදිරියෙන් මුදන්නෙමි.

71 "යමෙක් රජුගේ සැපයෙහි සුවපත් වූයේද, දුකට පැමිණි කල්හි දුප්පත්වූයේද, ධෛර්‍ය්‍ය සම්පන්නවූ දක්ෂවූ අර්ථ සිතන්නාවූ ඒ සේනාපතියාද මුදන්නෙමි.

72 "යම්සේ මේ සුමුඛතෙම රජහුට ප්‍රාණය හා සමානවූ යහළුවෙක් වීද, මෙබඳුවූවාහු ස්වාමිහුගේ ආහාරය අනුභව කරන්ට සුදුසුම වෙත්."

73 සියල්ල ස්වර්ණමයවූ පා අටක් ඇති සිත්කළුවූ මට කරණලද කශී සළුවකින් අතුරණ ලද පුටුවෙක්හි ධෘතරාෂ්ටතෙම හිඳගත්තේය.

74 සියල්ල ස්වර්ණමයවූ ව්‍යාඝ්‍ර සමින් පිරිමසනලද බඳ වෙළුවෙක්හි හෙවත් අග මෙහෙසුන් හිඳිනා පුටුවෙහි ධෘතරාෂ්ටයාට අනතුරුකොට සුමුඛතෙම හිඳවූයේය.

75 කශීරටවැසි බොහෝදෙනා ස්වර්ණ භාජනවලින් ගෙණවුත් රජුට පිළියෙළ කරණලද අග්‍රභෝජනය ඒ හංසයන්ට දුන්හ.

76 "කශීරට විසින් මෙහෙයවන ලද තමන්වෙත දෙනලද ඒ අග්‍රභෝජනය දැක ක්ෂත්‍රිය ධර්මයන්ට දක්ෂවූ හංසරජතෙම ඉන්පසු පිළිවෙළින් විචාළේය.

77 "මහරජ කිමෙක්ද, පින්වතාට සුවද, කිම පින්වතාට නිදුක්ද, කිම සමෘද්ධවූ මේ රාජ්‍යය දැහැමින් අනුශාසනා කරණු ලැබේද?"

78 "එම්බා හංස රාජය, මට සුවයද වේ. තවද හංසය, නිදුක්ද වේ. මේ සමෘද්ධවූ රාජ්‍යයද දැහැමින් අනුශාසනා කරනු ලැබේ."

79 "කිමෙක්ද, පින්වත්හුගේ ඇමතියන් අතර කිසි දෝෂයෙක් නැත්තේද, කිම ඔව්හු ඔබගේ කටයුතුවල දිවි නොතකන්නාහු වෙද්ද?'

80 "තවද මාගේ ඇමැතියන් කෙරෙහි කිසි දෝෂයෙක් නැත්තේය. තවද ඔව්හු මාගේ කටයුතුවල දිවි නොතකා පවත්නාහු වෙත්."

81 කිම ඔබගේ සමාන ජාති ඇත්තාවූ භාර්‍ය්‍යාතොමෝ කීකරුද, ප්‍රිය තෙපුල් කියන්නීද, පුත්‍රයන්ගෙන් හා රූප ලක්ෂණයෙන් යුක්තවූවා ඔබගේ කැමැත්ත අනුව පවත්නීද?

82 "තවද මාගේ සමාන ජාති ඇති භාර්‍ය්‍යාතොමෝ කීකරුය, ප්‍රිය තෙපුල් කියන්නීය. පුත්‍රයන් ගෙන් හා රූප ලක්ෂණයෙන් යුක්තවූ ඕතොමෝ මාගේ කැමැත්ත අනුව පවත්නීවේ."

83 "කිමෙක්ද රටවැසියා නොපෙළෙනේද, කොයිනුත් උවදුරක් නැද්ද, සාහසික නොවූ ඔබ විසින් දැහැමින් සෙමෙන් රට අනුශාසනා කරණු ලැබේද?"

84 "තවද රටවැසියා නොපෙළෙනේය. කොයිනුත් උපද්‍රවයක් නැත්තේය සාහසික නොවූ මා විසින් දැහැමින් සෙමින් රට අනුශාසනා කරණු ලැබේ."

85 "කිමෙක්ද, ශීලාදී ගුණ ඇති සත්පුරුෂයෝ ඔබ විසින් පුදන ලද්දාහුද, අසත් පුරුෂයෝ දුරු කරණ ලද්දාහුද, ඉදින් ධර්මය හැරදමා අකුශල ධර්මයෙහි පවත්නෙහිද?"

86 "මා විසින් සත්පුරුෂයෝද, පුදන ලද්දාහුය, අසත් පුරුෂයෝද දුරුකරණ ලද්දාහුය. මම කුශල ධර්මයෙහිම පවතිමි. අධර්මයතෙම මා විසින් හැරදමන ලද්දේය."

87 "කිමෙක්ද, මහරජ, නොපැමිණියාවූ දිවි පැවැත්ම දීර්ඝයයි සලකන්නෙහිද, කිම මත්විය යුතු අරමුනෙහි මත් නොවීද පරලොවට භය නොවෙහිද?"

88 "පක්ෂිරාජය, මම නොපැමිණියාවූ ජීවිත ප්‍රවෘත්තිය දීර්ඝයයි නොසලකන්නෙමි. දසරාජ ධර්මයන්හි පිහිටියාවූ මම පරලොවට භයනොවන්නෙමි.

89 "දන්දීමය, සිල්රැකීමය, පරිත්‍යාගය ඍජු බවය මෘදු බවය, තපසය, ක්‍රොධ නොකිරීමය, හිංසා නොකිරීමය, ඉවසීමය, විරුද්ධ නොවීම්ය යන මොහුයි.

90 "යන මේ කුශල ධර්මයන් මා කෙරෙහි සිටියවුන් දකිමින් ඒ හේතුවෙන් මට ප්‍රීතිය උපදියි රහත්වූ සොම්නසද හටගිනියි.

91 "මේ සුමුඛනම් පක්ෂිතෙමේද මාගේ ගුණය නොසිතා අපගේ චිත්ත දෝෂය නොදැන විරූපවූ වචන පිට කෙළේය.

92 "හෙතෙම කිපියේ අප කෙරෙහි යම් වරදක් නොවෙද්ද, අනුවණින් එය නොසලකා ඵරුෂ වචන නිකුත් කෙළේය. එහෙයින් මේ කීම ප්‍රඥා ඇත්තෙකු විසින් කියන ලද්දක් නොවේයයි" රජතෙම කීයේය.

93 "මහරජ ධ්‍රතරාෂ්ට රජහු මලපත බැඳුනු කල්හි මට මහත් දුකක් විය. එහෙයින් වේග වශයෙන් මා විසින් කියන ලදී. මේ මාගේ දෝෂය ඇත්තේය.

94 "ඔබ අපට දරුවන්ට පියාමෙන්ද සත්වයන්ට පොළොව මෙන්ද උපකාරවේ. රාජොත්තමය, වරදට යටත්වූ අපට ක්ෂමා කළ මැනවැයි" සුමුඛතෙම කීයේය.

95 "එම්බා පක්ෂිරාජය, යම් හෙයකින් නුඹ අදහස නොසඟවන්නෙහිද, සිතෙහි හුල බිඳින්නෙහිද, එහෙයින් ඔබගේ මේ දෝෂය ක්ෂමා කරමි. පක්ෂිය, නුඹ සැපවූවෙක් වෙහියයි" රජතෙම කීයේය.

96 "කශීරට රජුගේ ගෘහයෙහි යම්කිසි රත්න සමූහයක් නිධන්කොට ඇත්තේද එනම් රිදීද රත්රන්ද මුතුද බොහෝ වෛඩූර්‍ය්‍යද,

97 "මාණික්‍යමය භාණ්ඩද සක් හා මුතු වර්ගද කශි සළුද රත්සඳුන්ද අඳුන් දිවිසම්ද දලකඩ භාණ්ඩද තඹලෝ බඩුද කාල ලෝහයෙන් කළ බඩුද බොහෝ ඇත. මේ සියලු වස්තුව ඔබට දෙමි. මෙහි මාගේ අධිපති භාවය ඔබට දෙමි. මෙහි මාගේ අධිපතිභාවය ඔබට හැරදමමියි" රජතුමා කීයේය.

98 "එම්බා රථශ්‍රෙෂ්ඨවූ රජ, ඔබ විසින් අපි ඒකාන්තයෙන් පුදන ලද්දාහුද සත්කාර කරණ ලද්දාහුද වෙමු. කුශල ධර්මයන්හි පවත්නවුන්ගෙන් කෙනෙක්වූ ඔබ අපට ආචාර්‍ය්‍ය වෙව."

99 "මහරජ, ආචාර්‍ය්‍යවූ ඔබ විසින් අවසර දෙන ලද්දාවූ අනුමත කරණ ලද්දාවූ අපි ඔබට ප්‍රදක්ෂිණාකොට නෑයන් දකිමුයි" හංසරජ කීයේය.

100 කශීරජතෙම යම්සේ සිතිය යුතුද එසේ සියලු රාත්‍රිය සිතා මතා හංස රාජයාට අවසර දුන්නේය.

101 ඉක්බිති රාත්‍රිය ඇවෑමෙහි හිරුඋදාවන වේලෙහි කශීරජු බලාසිටියදීම ඒ හංසයෝ දෙදෙන භවනයෙන් අහසට නැග ගියාහුය.

102 "නිරෝගව පැමිණියාවූ ඒ උතුම් හංසයන් දෙදෙනා දැක සෙසු හංසයෝ කෙකානද පැවැත්වූහ. එයින් මහත්වූ ශබ්දයක් හටගත්තේය.

103 පාශයෙන් මිදුනාවූ ස්වාමියා සමග සතුටුවූ ස්වාමියා කෙරෙහි ගෞරව ඇත්තාවූ ලබන ලද පිහිට ඇති ඒ හංසයෝ ස්වාමියා හාත්පස පිරිවැරූහ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

104 යම්සේ ධ්‍රතරාෂ්ට නම් හංසයෝ නෑ සමූහයා වෙතට පැමිණියාහුද මෙපරිද්දෙන් මිත්‍රයන් ඇත්තවුන්ගේ සියලු අර්ථයෝ සමෘද්ධවෙත්ය”යි වදාළේය.

534 **සුධාභෝජන ජාතකය**:- 1 “(1-21 මේ ගාථා 12 නිපාතයෙහි කොශිය ජාතකයෙහි 1-21 ගාථා මෙන් වෙත්.)

22 පර්වතයන්ට අධිපතිවූ ගන්ධමාදන නම් උතුම් පර්වතයෙහි සක්දෙව් රජහු විසින් රක්නාලද ඒ දිව්‍ය ස්ත්‍රිහු සතුටු වෙත්. ඉක්බිති සියලු ලොව ගමන් කරන්ට හැකිවූ ඍෂිවරයෙක් මනාව පිපුනාවූ උතුම් ගසක මලක් හැරගෙණ ආයේය.

23 පවිත්‍රවූ සුවඳ ඇත්තාවූ දෙවියන් විසින් සත්කාර කරණ ලද්දාවූ ශක්‍රයා විසින් සේවනය කරණලද්දාවූ මේ උතුම් මල දෙවියන් හැර සෙසු මිනිසුන් විසින් හෝ අසුරයන් විසින් හෝ නොලැබිය හැක. මෙය දෙවියන්ටම සුදුසුවේ.

24 ඉක්බිති ස්වර්ණයට බඳු සිවිය ඇත්තාවූ ආසා නම් ඇත්තාවූද සද්ධා නම් ඇත්තාවූද තවද සිරි නම් ඇත්තාවූද හිරි නම් ඇත්තාවූද ස්ත්‍රින්ට උතුම්වූ මේ ස්ත්‍රිහු සතරදෙන නැගිට නාරද දේව බ්‍රාහ්මණ නම්වූ මේ ඍෂීහට මෙසේ කීවාහුය.

25 “මහා ඍෂිවූ බ්‍රාහ්මණය, මේ පරසතු මල ඔබ විසින් කිසිවෙකුට නොඋදෙසනලද නම් අපට දෙව, නුඹවහන්සේ ගේ සියලු අදහස් සමෘද්ධ වේවා. ශක්‍රතෙම අපට යම්සේ වේද, නුඹවහන්සේද අපට එසේ වුවමැනව”

26 ඒ මල දැක ඉල්ලන්නවුන්ට නාරද ඍෂිතෙම මෙසේ කීයේය. “එයින් මහත් කලහ වැඩෙන කථාවක් ඇතිවිය. මට මේ මලින් කිසි ප්‍රයෝජනයක් නැත්තේය. තොප අතුරෙන් යම් තැනැත්තියක්ම ශ්‍රෙෂ්ඨවෙහි නම් ඕතොමෝ මෙය පළඳීවායි” ඍෂිතෙම කීයේය.

27 “උතුම්වූ නාරද නම් මහඍෂිය, නුඹවහන්සේම අප බලා යමකට දෙනු කැමැත්තෙහිනම් ඇයට දුන මැනව, නාරද

ඍෂිය, නුඹවහන්සේ වනාහි අපගෙන් යමකට දෙන්නෙහි නම් අප අතුරෙන් ඕතොමෝම ශ්‍රේෂ්ඨ සම්මත වන්නේයයි" කීවාහුය.

28 "මනා සිරුරු ඇති සොඳුර, මේ කීම නුසුදුසුය. කවර නම් බ්‍රාහ්මණයෙක් එය ගනීද, කවරෙක් නම් කලහ වඩන්නේද, ඉදින් මෙහි තොප අතුරෙන් උතුම් තැනැත්තිය හෝ අධම තැනැත්තිය නොදනිව් නම් භූතයන්ට අධිපතිවූ ශක්‍රයා වෙතම ගොස් විචාරව්යයි" ඍෂිතෙම කීයේය

29 නාරද ඍෂීහු විසින් ඉතා කෝප කරණ ලද්දාවූ ශක්‍රයාගෙන්ම අසව් කියන ලද්දාවූ වර්ණමදයෙන් මත්වූ ඒ දිව්‍යප්සරාවෝ ශක්‍රයා වෙතට ගොස් "අප අතුරෙන් කවර තැනැත්තියක් උතුම්දැයි" ශක්‍රයාගෙන් විචාළාහුය

30 උත්සාහවත්වූ සිත් ඇති ඔවුන් දැක දෙවියන් විසින් කරණ ලද ඇඳිලි ඇති පුරින්දද නම්වූ සක්දෙව් රජතෙම මෙසේ කීයේය. "මනා ශරීර ඇත්තියනි තොප සියල්ලෝම සමාන වන්නාහුය. සොඳුර, කවරෙක්නම් මෙසේ කලහයක් ඇතිකෙරේදැයි" ඇසීය.

31 "සත්‍යවූ පරාක්‍රම ඇති ධර්මයෙහි පිහිටියාවූ සියලු ලොව හැසිරෙන්නාවූ නාරද නම් මහා ඍෂිවරයෙක්වේද, හෙතෙම ඉදින් මෙහි තොප අතුරෙන් උත්තම තැනැත්තිය හෝ අධම තැනැත්තිය නොදනිව් නම් ශක්‍රයා වෙතටම ගොස් අසව්යයි" ගන්ධමාදන නම් උතුම් පර්වතයෙහිදී අපට කීයේය.

32 "උතුම් ගාත්‍ර ඇත්තියෙනි, මහවනයෙහි වාසය කරන්නාවූ අසවල් මහා ඍෂිතෙම අනිකෙකුට නොදී බත නොවළඳයි. ඒ කෝශිය තාපසතෙම පරීක්ෂාකොට දන්දෙයි. හෙතෙම තොපගෙන් යමකට වනාහි දෙන්නේ ඕතොමෝ ශ්‍රේෂ්ඨ වේයයි" ශක්‍රතෙම කීයේය.

33 "එම්බා දේවසාරථිය, යම් අසවල් තාපසයෙක් වනාහි දකුණු දිග ගං ඉවුරෙහි හිමවත් පාර්ශවයෙහි වාසය කෙරේද, ඒ කෝශිය තාපසතෙම දුර්ලභවූ ආහාරපාන ඇත්තේය. ඔහුට සුධා භෝජනය පමුණුවයි" කීයේය.

34 ඒ මාතලී නම් දිව්‍යපුත්‍රතෙම ශක්‍රයා විසින් මෙහෙයවන ලද්දේ දහසක් අසුන් යෙදූ යානයකට නැග ගියේය. හෙතෙම වහාම අසපුවට පැමිණ අදෘශ්‍යමාන ශරීර ඇතිව තපස්වීන්ට සුධා භෝජනය දුන්නේය.

35 උදෑසන ගිනිදෙවියා පුදා ආලෝක කරන්නාවූ ලොව අඳුරු දුරුකරන්නාවූ උතුම්වූ හිරුවෙත එළඹ සිටියාවූ මට සියලු භූතයන් ඉක්මවා සිටියාවූ ශක්‍ර තෙමේ හෝ කවරෙක් නම් මාගේ අත්වල මේ කුමට නම් සුධා භෝජනය තැබීද,

36 "සක්ගෙඩියක් බඳු සුදු අසමාන දැකුම් ඇති පවිත්‍රවූ සුවඳවූ ප්‍රිය ස්වභාවය ඇත්තාවූ ආශ්චර්‍ය්‍යවූ මාගේ උපන් ඇස්වලින් නුදුටුවිරූ මේ සුධා භොජනය කවර දේවතාවෙක් මාගේ අත්වල කුමට තැබීදැයි" කීයේය.

37 "මහර්ෂීවූ මහාමුනිවරය, සක්දෙව් රජහු විසින් මෙහෙයනලද මම වහා සුධා භෝජනය ගෙණ යම් මා මාතලී නම් දේව සාරථියයි දනුමැනව. මේ උතුම්වූ බත වළඳනු මැනව. නොවිචාරව හෙවත් ප්‍රමාද නොකරව.

38 වළඳන ලද්දාවූද ඒ සුධාභෝජනය ලාමක කරුණු දොළහක් නසයි. එනම් බඩගින්නය, පිපාසය, නොඇල්මය, කයේ විඩාව, ක්ලාන්ත බව, ක්‍රොධය, බද්ධ වෛරය, විවාදය, කේලාම් කීමය, ශීතය, උෂ්ණය, අලස බවය යනමේ දොළොස මේ උතුම් රස ඇති සුධාභෝජනය නසයි.

39 'එම්බා මාතලී දිව්‍යපුත්‍රය, දානය නොදී පළමුකොට අනුභව කරන්ට සුදුසු නොවේ. මෙසේ මා විසින් උතුම් වතක් සමාදන්වනලදී. තනිව වැළඳීමද ආර්‍ය්‍යයන් විසින් නොපුදනලදී. බෙදා දී නොවළඳන්නේද සැපයක් නොලබා යයි" තවුස්තෙම කීයේය.

40 "යම් මේ ස්ත්‍රීන් නසන්නෝ පරදාරාවන් කරා යන්නෝ වෙද්ද, යම් කෙනෙක් මිත්‍ර ද්‍රෝහිවෙද්ද, යම් කෙනෙකුත් ධාර්මික ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට ආක්‍රොෂ කෙරෙද්ද, මසුරුකම් ඇත්තාහු පස්වෙනිකොට ඇති ඒ සියල්ලෝම අධමයෝ නම් වෙත්.

එහෙයින් මම නොදී ජලය පමණවත් නොවළඳවන්නෙමියි (මේ වත සමාදන්වීමි.)

41 "යම්බඳුවූ මම ස්ත්‍රියකට හෝ පුරුෂයෙකුට හෝ පණ්ඩිතයන් විසින් වර්ණනා කරණලද දානය දෙන්නෙම්ද, මේ ලෝකයෙහි ශ්‍රද්ධා ඇත්තාවූ ප්‍රතිග්‍රාහකයන්ගේ වචන දන්නාවූ පහව ගියාවූ මසුරුමල ඇති මේ පුරුෂයෝ පවිත්‍ර වූවාහුද, උතුම්යයි සම්මත වූවාහුද වෙතියි" තාපසතෙම කීයේය.

42 ඉක්බිති සක්දෙව් රජ විසින් අනුදන්නාලද මෙහෙයවනලද ස්වර්ණයට බඳු සිවි ඇත්තාවූ ආසාද ශ්‍රද්ධාද ශ්‍රීද හිරිද යන දිව්‍ය කන්‍යාවෝ සතර දෙන කොශිය තාපස තෙම යම් තැනෙක්හිද ඒ අසපුවට පැමිණියාහුය.

43 සොභනවූ වර්ණයෙන් ගිනි සිළුමෙන් සතර දිශාවෙහි සිටියාවූ දක්ෂවූ ඒ දිව්‍යප්සරාවන් සතර දෙනා දැක සියලු ආකාරයෙන් සතුටුවූ සිත් ඇති තාපස තෙම මාතලී නම් දිව්‍යපුත්‍රයාගේද හමුවෙහි මෙසේ කීයේය.

44 "එම්බා දෙව්දුව, ඔෂධීනම් උතුම් තාරකාව මෙන් සැරසුනාවූ නුඹ පළමු දිශාව බබුළුවන්නෙහිය. නුඹ කවර තැනැත්තියක්ද? රත්රන් රූපයකට බඳු ශරීර ඇත්තිය තී විචාරමි. නුඹ කවරනම් දෙවතාදුවක් වෙහිදැයි මට කියව.

45 "හැම කල්හි අලාමකවූ සත්වයන් සේවනය කරන්නාවූ මිනිසුන් කෙරෙහි පුදනලද්දාවූ මම ශ්‍රීනම් දේවිය වෙමි. උතුම් ප්‍රඥා ඇති තාපසයෙනි, සුධාභෝජනය පිළිබඳ විවාදයෙන් ඔබවෙතට ආමි. ඒ මට සුධාභෝජනය දුනමැනව.

46 "මහා මුනිවරය, මම යමෙකුට සැප කැමැති වෙම්ද, ඒ මනුෂ්‍යතෙම සියලු කැමති දෙයින් සතුටුවෙයි. ගිනි පුදන්නවුන්ගෙන් උත්තමය. ශ්‍රීයයි මා දනුව, උතුම් ප්‍රඥා ඇත්ත ඒමට සුධාභෝජනය දුන මැනවැයි" කීවාය.

47 "ශිල්ප දැනීමෙන්ද විද්‍යාවෙන් හා චරණනම් ශීලයෙන්ද බුද්ධි මහිමයෙන්ද යුක්තවූ ස්වකීය කර්මයෙන් ප්‍රගුණවූ මනුෂ්‍යයෝ තීගෙන් තොරවූවාහු කිසි ස්වල්ප තරම් සැපයකුත්

නොලබද්ද, තී විසින් කරණලද මේ යමක්වේද, තීගේ මෙය යහපත් නොවේ.

48 "අලසවූ බොහෝකොට අනුභව කරන්නාවූ ඉතා පහත් කුල ඇත්තාවූද විරූපවූ මනුෂ්‍යයෙකු තී විසින් රක්නා ලද්දේ සම්පත් ඇති ජාතිසම්පන්නයෙකුවූද පුරුෂයෙකු දකිමි. සම්පත් ඇති සුව ඇත්තේද දාසයෙකු මෙන් මෙහෙකරුවෙකුමෙන් කෙරෙයි.

49 "ඒ අසත්‍යභාවයෙන් යුක්තවූ විභාගයක් නොකොට සේවනය කිරීම් ඇත්තාවූ මුළුවූ පණ්ඩිතයන් පහත හෙලන්නාවූ තී දනිමි. තා බඳුවූවා අසුන්ද, ජලයද ලැබීමට සුදුසු නොවේ. සුධා භෝජනය ලැබීමට කොයින් සුදුසුවේද, මෙතැනින් යව, මට රුචි නොවෙහියයි" තවුස් තෙම කීයේය.

50 "ශ්වෙතවර්ණ දත් ඇති බහාලනලද කුණ්ඩලාභරණ ඇති විසිතුරු අඟු පළඳනාවලින් යුත් විශෙෂයෙන් මට්ටම් කරණලද ස්වර්ණමය ආභරණ දරන්නාවූ තී වත්කළ ජල ධාරාවක් වැනි දිව දුහුළක් හැඳ කුශතෘණයෙන් කළ ගිනිසිළුවක් බඳු පත්‍ර සහිත හෝපලු තුණක් කණෙහි පැළඳ සොභමානවෙහිය, තී කවර තැනැත්තියක්ද?

51 "වැද්දා විසින් විදිනලද පහර වැළැක්කාවූ භ්‍රාන්තවූ මුවදෙන මඳකොට බලන්නාක් මෙන් බලන්නෙහිය. මඳ බැළුම් ඇත්තීය, මෙහි ඔබගේ කවර දෙවැන්නෙක්වේද, කානන නම්වූ වනයෙහි එකළාවූ තී භය නොවන්නෙහිදැයි" තාපසයා ඇසීය.

52 "කෝශිය නම් තාපසය, මෙහි මට දෙවැන්නෙක් නැත්තේය. මම තව්තිසා භවනයෙහි උපන් දෙව්දුවක්මි. ආසා නම්වූ ඒ මම සුධාභෝජනයෙහි ආශාවෙන් ඔබ සමීපයට ආවාවෙමි. උතුම් ප්‍රඥා ඇති තාපසය ඒ මට සුධාභෝජනය දුනමැනවයි" කීවාය.

53 "ධන සොයන්නාවූ වෙළෙන්දෝ ධනාසාවෙන් නැව් නැග යෙත්. මුහුදු තරණය කෙරෙත්. ඔව්හු එහි ගිලෙත්. තවද සමහර කලෙක්හි නැසුනාවූ මාර්ගොපකරණ ඇත්තාහු පිරිහුනු ධන ඇත්තාහු වෙත්.

54 "තවද ගොවියෝ ආසාවෙන් කුඹුරුසාත්. බිජුවට වපුරත් උපාය වශයෙන් කටයුතු කෙරෙත්. උපද්‍රව පැමිණීමෙන් හෝ වර්ෂාව නොවැසීමෙන් හෝ එයින් කිසි ඵල විඳීමක් නොලබත්.

55 "තවද සැප සොයන්නාවූ මිනිස්සු ආසාව පෙරදැරි කොට ස්වාමිවරුන් පිළිබඳ යුද්ධභූමිවල පුරුෂ වීයර්‍ය කරත්. ස්වාමිවරුන් සඳහා අතිශයින් පීඩාවට පැමිණියාවූ ඔව්හු කිසි දෙයකුත් නොලබා දිසාවන්ට පැනයන්නාහ.

56 "ස්වර්ගයට යන සිත් ඇත්තාවූ සුව සොයන්නාවූ සමහරු ධාන්‍යයද ධනයද නෑයන්ද හැරදමා සැප ආසාවෙන් බොහෝ කලක් මුළුල්ලෙහි රූක්ෂවූ තපසද කෙරෙත්. මොව්හු අයහපත් මාර්ගයට බැස දුර්ගතියට පැමිණෙත්.

57 "මේ සත්වයෝ ආසාව නිසා රැවටෙන්නාහුයයි සම්මත වෙත්. එබැවින් ආසාවෙනි, සුධාභෝජනය පිළිබඳ තමා කෙරෙහිවූ ආසාව දුරුකරව, තා බඳුවූවා අසුන් හා ජලය ලැබීමට සුදුසු නොවේ. සුධාභෝජනය ලැබීමට කොයින් සුදුසුද මෙතැනින් යව, තී මට රුචිනොවන්නෙහියයි" තාපස තෙම කීයේය.

58 "යශසින් දිළිසෙමින් පැසුළු දිසාවෙහි සිටින්නාවූ යශස් ඇත්තාවූ තී කවර තැනැත්තියක්ද? රත්රන් රූපයකට බඳු සිරුරු ඇත්තිය, තී විචාරමි. මට කියව තී කවරනම් දෙව්දුවක් වෙහිදැයි" තාපසතෙම ඇසීය.

59 "තාපසයන් වහන්ස, මිනිසුන් කෙරෙහි පුදන ලද්දාවූ හැමකල්හි අලාමක සත්වයන් විසින් සේවනය කරණු ලබන්නාවූ ශ්‍රද්ධා නම් දෙව්දුවවූ මම සුධාභෝජනය පිළිබඳ විවාදයෙන් ඔබ වෙතට ආවාවෙමි. උතුම් ප්‍රඥා ඇත්ත, ඒ මට සුධාභෝජනය දුන මැනව"

60 "දන්දීමය ඉන්ද්‍රිය දමනය පරිත්‍යාගය තවද සීලය යන මෙය සමහර කලෙක්හි ශ්‍රද්ධාවෙන් ගෙණ කරත්. නැවත තීගෙන් ගිලිහුනාවූ සමහරු සොරකමද බොරුකීමද කූට කර්මයද නැවත කේලාම් කීමද කෙරෙත්.

61 "සමාන ජාති ඇත්තාවූ සීලයෙන් යුක්තවූ පතිව්‍රතා ඇත්තාවූද කුලධිතෘන්වූද, භාර්‍ය්‍යාවන් කෙරෙහි අපෙක්ෂා ඇති පුරුෂතෙමේ ආලය දුරුකොට කුම්භදාසියගේ වචනයෙහිද, ශ්‍රද්ධාව කෙරේ.

62 "ශ්‍රද්ධාවෙනි, නුඹම පරදාර සේවනය කරන්නී වේ. පව කරන්නෙහිය. කුශලයද සිස් කෙරෙහිය. තී බඳුවූ තැනැත්ති අසුන් හා ජලයද ලැබීමට නුසුදුස්සෙහිය. සුධා භෝජනය ලැබීමට කොයින් සුදුසුවේද, මෙතැනින් යව. තී මට රුචි නොවෙහියයි" තාපසයා කීයේය.

63 "පශ්චිම රාත්‍රියෙහි අරුණ නැගි කල්හි උතුම් රූපයෙන් හා වර්ණයෙන් යුක්තවූ යම් පූර්වදිසාවක් දක්නා ලැබේද, දෙවතා දුව තී එබඳුයයි මට වැටහේ. තී කවර නම් දිව්‍යාප්සරාවෙක් වෙහිදැයි මට කියව.

64 "නියම් කාලයෙහි පළමුවම හටගත්තාවූ සුළඟින් කම්පාවූ රක්තවර්ණ පත්‍ර හා මල් ඇති කළුවැල් නම් වැලක් මෙන් මද බැල්මෙන්ම බලමින් කවර නම් තී සිටින්නෙහිද කියන්නට සොයමින්ම වචනය නොමුදන්නෙහියයි තාපසයා කීයේය.

65 "හැමකල්හි මිනිසුන් කෙරෙහි පුදනලද අලාමක සත්වයන් සේවනය කරන්නීවූ මම හිරිනම් දෙව්දුව වෙමි. සුධාභෝජනය පිළිබඳ විවාදයෙන් ඔබ සමීපයට ආවාවූ ඒ මම ඔබගෙන් සුධාභෝජනය ඉල්වන්ට නොහැක්කෙමි. ස්ත්‍රිය ගේ ඉල්වීම යම්සේ රහස එළිදරව් කිරීමක් වැනිද එහෙයිනි."

66 "මනා ශරීර ඇත්තිය, ස්වභාවවූ කාරණයෙන් සුධා භෝජනය ලබන්නෙහිය. ඉල්වීමෙන් සුධාභෝජනය නොලබන්නේය. මේ වනාහි ස්වභාව ධර්මයවේ. එහෙයින් නොඉල්වන්නාවූ තිට මම සුධාභෝජනයෙන් නිමන්ත්‍රණය කරමි. එපමණක්නොව යමකුත් තී කැමැත්තෙහි නම් එයද තිට දෙමි.

67 "රුවන් රැසකට බඳු ශරීර ඇත්තිය, ඒ නුඹ මා විසින් අද ස්වකීය අසපුවෙහි නිමන්ත්‍රණය කරණලද්දීය. තී වනාහි

මා විසින් සියලු රශවලින් පිදියයුත්තීය. තිට පූජාකොට මමද සුධාභෝජනය වළඳන්නෙමියි" තාපසතෙම කීයේය

68 ආනුභාසම්පන්නවූ කෝශිය නම් තාපසයා විසින් අනුදන්නාලද්දාවූ ඒ හිරී නම් දිව්‍යප්සරාතොමෝ ඒකාන්තයෙන් ඒ ඒ තන්හි දිය ඇත්තාවූ නොයෙක් පලතුරුවලින් යුත් ආයර්‍යයන් විසින් පුදනලද හැමකල්හි අලාමක සත්වයන් විසින් සේවනය කරණලද සිත්කළුවූ අසපුවට ඇතුල් විය.

69 මෙහි පිපියාවූ වෘක්ෂ සමූහයෝ බොහෝ වෙත්. අඹද, පියාලගස්ද, පනාගස්ද, කැලගස්ද, මුරුංගාද, ලොත් ගස්ද තවද පද්මගස්ද, කේතය භංගය නම් ගස්ද පිපියාවූ එරහැන්දගස්ද වෙත්.

70 සල්ගස්ද ලුනුවරණද මෙහි බොහෝ වූ දඹගස්ද වෙත් ඇසතුය, නුගය, මීගස්ය, ඇටඹගස්ය, යන මොහුද ඇසලය. පලොල්ය, නිකගස්ද, මනහර සුවඳ ඇති මිදෙල්ල, වැටකේ යන මොහුද වෙත්.

71 අපරාන්ත ජාතිවූ වංයචොරක නම් ධාන්‍යද වන මැද, තිඹිරිද, සිහින් මුංද, බොඩහමුද, උෟරුහැල්ද, ඇට කෙහෙල්ද, කෙසෙල්ද වෙත්. මෙහි බොහෝවූ හැල්ද නොයෙක් වී වර්ගද භූජපත්‍රද, සහල්ද වෙත්.

72 "ඒ අසපුවටද උතුරු පැත්තෙහි හටගත්තාවූ කර්කශ නොවූ ප්‍රාග්භාර නැත්තාවූ මනාව පිහිටියාවූ සුගන්ධ ජලයෙන් යුක්තවූ නිර්භයවූ පොකුණක්ද වේ.

73 ඒ පොකුණෙහි භය නැත්තාවූ බොහෝ අනුභව කරන්නාවූ මත්ස්‍යයෝ නිතර වාසය කෙරෙත් සිංගුය, සවංකය, සකුලය, සතවංකය, රෝහිතය, ආලිය, ගග්ගරකය, පාඨීනය, කාකමච්ඡකය යන මොවුන්ගෙන් ගැවැසීගත්තීය.

74 එහි භය නැත්තාවූ බොහෝ අනුභව කරන්නාවූ හංසයෝය, කොස්ලිහිණිය, මොණරුය, සක්වාලිහිණිය, ඇටිකුකුළෝය, කොව්ලෝය, බොහෝ විසිතුරු මුදුන් ඇති පක්ෂීහුය. ජීවං ජීවකය යන පක්ෂීහු නිතර ගැවසෙත්.

75 එහි බොහෝවූ නොයෙක් මෘග සමූහයෝ පැන් බීමට එත්. එනම් සිංහයෝද ව්‍යාඝ්‍රයෝද හූරෝද වලස්සුද කොක්නාවෝද කළුහිස් වලස්සුද,

76 කඟවේන්නුද ගවරුද මහිසයෝද රෝහිත මෘගයෝද හූරු නම් මෘගයෝද ඒනි මුවෝද වරාහ නම් මෘගයෝද ගෝන්නුද නිංක නම් ශූකරයෝද,

77 කදලි මුවෝද බිලාරයෝද සාවෝද කර්ණික මෘගයෝද මෙහි බොහෝ වෙත්. විසිතුරු මල් අතුරණ ලද භූමි පාෂාණය පක්ෂීන් විසින් ඝෝෂා කරණලද්දේ පක්ෂි සමූහයා විසින් සේවනය කරණ ලද්දේවේ.

78 මනා සිව් ඇත්තාවූ ඕතොමෝ නිල්වන් වෘක්ෂයන් බලන්නී එහි එල්බෙන්නී මහා මේඝයකින් විදුලියක් මෙන් පහළවූවාය. ඇට මනාව සම්බන්ධ කළ හිස ඇති කුශ තෘණා දියෙන් කළාවූ පවිත්‍රවූ සුවඳවූ අඳුන් දිවිසමින් සේවනය කරණලද ඉතා කැමතිවිය යුතු කොච්ඡ නම් ආසනයක් පනවා "සුන්දරිය මේ ආසනය සුවවේ. මෙහි ඉඳ ගණුවයි" තාපස තෙම හිරිනම් දෙව් දුවට මෙය කීයේය

79 එකල්හි ඒ කොච්ඡ නම් ආසනයෙහි උන්නාවූ සුධා භෝජනය කැමැතිවූ හිරිනම් දෙව්දුවට දළමඬුළු අඳුන් දිවිසම් දරන්නාවූ කෝශිය නම් මහා තවුස්තෙම අලුත් නෙළුම් පත්වලින් තෙමේ ගෙණෙනලද දිය සහිතව සුධා භෝජනය ඉක්මන් කොට එලවීය.

80 ඕතොමෝ එය දෑතින් පිළිගෙණ සතුටු සිත් ඇත්තී තාපසයාට මෙසේ කීයේය. 'තාපසයෙනි, දැන් ඔබ විසින් මම පුදනලද්දී වෙමි. එබැවින් දිනනලද දිනුම් ඇති මම දෙව්ලොවට යන්නෙමියි."

81 ආනුභා සම්පන්නවූ කෝශිය තාපසයා විසින් අනු දන්නා ලද වර්ණ මදයෙන් මත්වූ ඕතොමෝ සක්දෙව් රජහුගේ සමීපයට ගොස් "ශක්‍රය, මේ සුධා භෝජනය වේ. එය මට දෙවයි" කියන ලද්දීය.

82 ඇඳිලි බැඳගත් දෙව් මිනිසුන් විසින් පුදන ලද්දාවූ ඕතොමෝ යම් කලෙක අලුත්වූ කොච්ඡ නම් ආසනයෙහි හිඳ ගත්තේද එකල්හි ශක්‍රතෙමේද, ඒ උතුම් දිව්‍ය කන්‍යාවට පූජා කෙළේය. ඉන්ද්‍රයා සහිත සෙසු දෙවියෝද පරසතු මල් ආදීන් ඈට පිදූහ.

83 දහසක් ඇස් ඇත්තාවූ දෙවියන්ට අධිපතිවූ ශක්‍ර තෙම ඒ මාතලී දිව්‍ය පුත්‍රයාටම නැවතද මෙසේ කීයේය "මාතලිය, කෝශිය තාපසයා වෙතට ගොස් මාගේ මේ වචනය කියව. 'කෝශිය තාපසයෙනි, ආසාය සද්ධාය සිරිය යන මොවුන් හැර කවර හේතුවකින් හිරී නම් දෙව්දුවම සුධා භෝජනය ලැබීදැයි' අසවයි" කීයේය.

84 උපකරණවලට සමානව දිළිසෙන්නාවූ රත් කළ දඹ රත්රන් බඳු රථ හිස් ඇත්තාවූ ස්වර්ණමය විසිතුරු අට මගලයකින් යුක්තවූ සරසන ලද ඒ රථය සුවසේ ගමන් පිණිස පිළියෙල කෙළේය.

85 මේ රථයෙහි බොහෝවූ ස්වර්ණමය චන්ද්‍රයෝ නිපතිතවූහ හස්තීය ගවයෝය අශ්වයෝය කිකීය ව්‍යාඝ්‍රය දිවියෝය ඒනිමුවෝය යන මොහු මේ රථයෙහි නොයෙක් රත්නයෙන් කරණලද්දාවූ පක්ෂීහුද වෙත්. මෙහි තම තමන්ගේ ගැටුම්වලින් යුක්තවූ වෛදූර්‍ය්‍යයෙන් කරණලද්දාවූ මෘගයෝ වෙත්.

86 ඒ රථයෙහි බලවත් තරුණ ඇතුන් සමානවූ අලංකාරයෙන් සැරසූ රන් දැලින් කරණලද උර සැදින් යුක්තවූ ආවේලි නම් කර්ණාලංකාර ඇත්තාවූ ශබ්දයෙන්ම ගමන් කරන්නාවූ ශීඝ්‍ර ගමන් ඇත්තාවූ නිල්වන් මනෝමය අස් රජුන් දහසක් යෙදූහ

87 මාතලී නම් දිව්‍ය පුත්‍රතෙම ඒ උතුම් යානාවට නැඟ මේ දශ දිශාවන් එකනින්නාද කෙළේය. අහසද පර්වතද වනදෙටු රුක්ද සාගරයද සහිතවූ පෘථිවිය කම්පා කෙළේය.

88 ඒ මාතලී දිව්‍යපුත්‍රතෙම වහාම අසපුවට පැමිණ ඒකාංශකොට පෙරවන ලද දිව්‍ය වස්ත්‍රයක් ඇත්තේ බැඳැඳිළි

වූයේ බහුශ්‍රැතවූ ගුණයෙන් වැඩි සිටියාවූ හික්මීම ඇත්තාවූ දෙවියන් හා සමානවූ බ්‍රාහ්මණයාට මෙසේ කීයේය.

**89** "පින්වත් කෝශිය තාපසය, ශක්‍රයාගේ වචනය අසව. මම ඔහුගේ දූතයා වෙමි. ශක්‍රතෙම ඔබගෙන් විචාරයි. 'කෝශිය තාපසයිනි ආශාවටද ශ්‍රද්ධාවටද ශ්‍රීයටද වඩා කවර හේතුවකින් හ්‍රීතොමෝ සුධා භෝජනය ලැබී දැයි'

**90** "එම්බා මාතලීනම් දිව්‍ය සාරථිය, ශ්‍රී තොමෝ ශිල්පාදියෙන් යුක්තවූවන්ද යුක්ත නොවූවන්ද භජනය කරණ හෙයින් අන්ධයයි මට වැටහේ. ශ්‍රද්ධාතොමෝ ඒ ඒ වස්තුව හැර අන් වස්තුවෙහි උපදන බැවින් ඇතිව නැතිවන ආකාරයෙන් අනිත්‍යයයි වැටහේ. ආශාව වනාහි රැවටිලි ඇත්තී යයි සම්මතයයි මට වැටහේ මේ හ්‍රී තොමෝද හිරි ඔතප් ඇති බවයයි කියනලද පිරිසිදු ගුණයෙහි පිහිටියාය

**91** "යම් මේ බාල වයස් ඇත්තියෝය, ගොත්‍ර රකින්නියෝය, වැන්දඹු ස්ත්‍රීහුය, ස්වාමිපුරුෂයන් සහිත ස්ත්‍රීහුය යන යමක්හු වෙද්ද, ඒ සියලු ස්ත්‍රීහුම අන් පුරුෂයන් කෙරෙහි උපන් කාමාසාව තමන්ගේ මේ සිත නුසුදුසුයයි දැන ලජ්ජාවෙන් වළක්වත්.

**92** "ඊ පහරවලින් හා අඩයටි පහරවලින් යුක්තවූ යුද්ධ භූමියෙහි පරදින්නවුන්ද වැටෙන්නවුන්ද පැන යන්නවුන්ද අතර ලජ්ජාවෙන් යුක්තවූවාහු ජීවිතය හැර දමා නවතිත්. ඒ ලජ්ජා සිත් ඇත්තෝ නැවත තමාගේ ස්වාමියා මුදාගනිත්.

**93** "සාගරයෙහි වේගය වළක්වන්නාවූ වෙරළ මෙන් මේ හ්‍රීතොමෝ පවින් ජනයා වළක්වන්නීවේ. දේව සාරථිය, සියලු ලෝකයෙහි ඒ හ්‍රීය ආර්‍ය්‍යයන් විසින් පුදන ලදැයි ඒ ශක්‍රයාට දන්වවයි" තාපසතෙම කීයේය.

**94** "කෝශිය තාපසය මේ ලබ්ධිය ඔබගේ සිත්හි කවරෙක් පිහිටුවීද බ්‍රහ්මතෙමේද ශක්‍රතෙමේද නොහොත් ප්‍රජාපතී නම් දිව්‍ය රාජයාද, මහර්ෂිය ශක්‍රයාගේ ධීතෘවූ මේ හ්‍රී තොමෝ දෙවියන් අතර ශ්‍රෙෂ්ඨයයි සම්මතවීයයි" මාතලී කීයේය.

95 "එබැවින් දැන් මාවිසින් ගෙණ එනලද මේ දිව්‍ය රථයට නැග දෙව්ලොවට ගමන් කරව. ඉන්ද්‍රයාට සමාන ගෝත්‍ර ඇත්ත ඉන්ද්‍රතෙමේද ඔබගේ ඒ ඊම බලාපොරොත්තු වෙයි. අදම ඔබ ඉන්ද්‍රයා සමග එක්වීමට යවයි" කීයේය.

96 "පාප කර්ම නැත්තාහු මෙසේ සමෘද්ධ වෙත්. තවද, මනාව කරණලද කර්මයාගේ විපාකය නොනැසේ. යම්කිසි කෙනෙක් එහි සුධා භෝජන දානය දුටුවාහුද, ඒ සියල්ලෝම ශක්‍රයාගේ සහභාවයට පැමිණියාහු යයි" වදාළේය.

97 හ්රී නම් දෙව්දුව උත්පලවර්ණා භික්ෂුණිය. කෝශිය තාපසතෙම දානපතීවූ භික්ෂු විය. පඤ්චශිඛ නම් දෙව්පුත් තෙම අනුරුද්ධ ස්ථවිර වූයේය. මාතලි දිව්‍යපුත්‍රතෙම ආනන්ද ස්ථවිර වූයේය.

98 "සූර්‍ය්‍ය දිව්‍යපුත්‍ර තෙම කාශ්‍යප නම් භික්ෂු විය. චන්ද්‍ර දිව්‍ය පුත්‍රතෙම මෞද්ගල්‍යායන ස්ථවිර වූයේය. නාරද නම් ඍෂිතෙම ශාරීපුත්‍ර ස්ථවිර වූයේය. එකල්හි සක්දෙව් රජ තෙම දැන් සම්‍යක් සම්බුද්ධවූ මමම වෙමියි" වදාළේය.

535 **කුණාළ ජාතකයඃ-** 1 තවද අර්ජුනය, නකුලය, භීමසේනය, යුධිෂ්ඨිලය, සහ දෙව නම් රජය යන මේ ස්වාමි පුරුෂයන් පස්දෙන හැර ස්ත්‍රීතොමෝ අඟුටු කුදෙකු සමග පාප කර්මය කෙළේයයි" කුණාල පක්ෂිතෙම කීයේය.

2 "යම් තැනැත්තියක් කොසොල් රජහු හැරදමා පඤ්චාල චණ්ඩයා සමග පාප කර්මයක් කෙළේද, ඒ මේ බඹදත් රජහුගේ මව මා විසින් මෙසේ දන්නා ලදී.

3 "මේ ස්ත්‍රීහුද අන්‍ය ස්ත්‍රීහුද යම්හෙයකින් පාප කර්මය කළාහුද එහෙයින් මේ ස්ත්‍රීන් විශ්වාස නොකරමි. ඔවුන්ට ප්‍රශංසා නොකරන්නෙමි.

4 "ලෝකයෙහි පෘථිවි තොමෝ යම්සේ සමාන ඇළුම් ඇත්තී සියල්ල දරන්නී අන්‍යෝන්‍ය ප්‍රතිෂ්ඨා ඇත්තී සියලු දෙය ඉවසන්නී නොසැලෙන්නී නොකිපෙන්නී වේද එසේවූ ඒ ස්ත්‍රීන් මනුෂ්‍යතෙම විශ්වාස නොකරන්නේය.

5 "යහළු පුණ්ණමුඛය, ලේ මස් බුදින්නාවූ චණ්ඩ මෘගයෙකු මුඛය ගාත් සතර යන අත් පසක් ඇත්තාවූ ඉතා එරුෂවූ සිංහතෙම යම්සේ බලාත්කාරයෙන් අල්වාගෙණ කන්නාවූ පරහිංසාවෙහි ඇළුනෙක් වේද, ස්ත්‍රීහුද එබඳු වෙත්. ස්ත්‍රීන් මනුෂ්‍යතෙම විශ්වාස නොකරන්නේය

6 "යහළු පුණ්ණමුඛය, මේ ස්ත්‍රී ජනතෙම සොරෙකු වැනිවේ. විෂ පෙවූ හීයක් මෙන්වේ. වෙළෙඳෙකු වැනිය. ස්ත්‍රී තොමෝ අගුණ සඟවාද ගුණය ප්‍රකාශ කරන්නීය ඉස්ස නම් මෘගයාගේ අඟ මෙන්,

7 "ඇඹරීගිය ගුණ ඇත්තීය. සර්පයෙකු මෙන් දිව් දෙකක් ඇත්තීය.

8 "හෙබක් මෙන් පිළිසන් ගති ඇත්තීය. පාතාලයක් මෙන් පිරවිය නොහැකි ආසා ඇත්තීය. රකුසියක් මෙන් සතුටු කරවිය නොහැක්කීය. යම රජු මෙන් ඒකාන්තයෙන් නිරයට හැරගන්නේය. ගින්නක් හා සමානය. ගංගා ප්‍රවාහයක් හා සමානය. සුළඟ හා සමානය කැමති පරිදි හැසුරුම් ඇත්තේය.

9 "මහමෙර මෙන් කිසිවෙකුටත් වෙනසක් නැත්තිය. විෂ අඹගසක් මෙන් නිතර එල ඇත්තීය. ස්වාමියන් විසින් දුකසේ සපයන ලද රත්නයන් නැතිකරන්නාවූ ස්ත්‍රීහු ගෘහයෙහි සම්පත් විනාශ කෙරෙත්යයි" කීයේය.

10 "යහළු පුණ්ණමුඛය, ගොනාද දෙනද යානයද භාර්‍ය්‍යාවද යන සතරදෙනා නෑ කුලයෙහි නොවැස්විය යුතුය. යානාවක් නැත්තාහු රථය පරිභොග කෙරෙත්. අධික බර පැටවීමෙන් ගවයා නසත්. අධික දෙවීමෙන් වස්සා නසත්. නෑ ගෙවල්හි භාර්‍ය්‍යාතොමෝ දූෂ්‍ය කරණු ලැබේයයි" කීයේය.

11 "දුනු දිය රහිත දුන්නද නෑ කුලයෙහිවූ භාර්‍ය්‍යාවද එතෙරවූ නැවද කඩ ඇනය බිඳුනාවූ යානයද, දුර සිටි මිත්‍රයාද ලාමක යහළුවාද කටයුත්තක් ඇතිවූ කල්හි අර්ථ පිණිස නොහැසිරෙන්නවුන් වෙත්යයි" කීයේය.

12 "යහළු පුණ්ණමුඛය, දිළිඳු බවද රෝගාතුර බවද, ජරාවට ගිය බවද, සුරාසොඬ බවද, ප්‍රමාද බවද, සිස් බවට පැමිණියාහුද

රක්තවූවහුද කටයුතුවල පිරිහීම් ඇත්තාහුද යන කරුණු අටකින් ස්වාමියාට සියලු කැමති සම්පත් දීමෙන්ද අවමන් කරත්යයි" කීයේය.

13 "යහළු පුණ්ණමුඛය, යම් ස්ත්‍රියක් තොමෝ මල් වත්තට යන ස්වභාව ඇත්තීද, උයනට යන ස්වභාව ඇත්තීද, නෑ ගෙදරට යන ස්වභාව ඇත්තීද, අන් ගෙදරට යන ස්වභාව ඇත්තීද, වස්ත්‍රවලින් සැරසීමෙහි යෙදුනීද, මත්පැන් පානය කරන්නීද,

14 "යම් ස්ත්‍රියක් තොමෝ කවුළු ආදියෙන් නිතර බලන ස්වභාව ඇත්තීද, යම් ස්ත්‍රියක් තෙමෝ අඟපසඟ දක්වමින් දොරකොඩ සිටින්නීද යන මේ කරුණු නවයකින් ස්ත්‍රීහු ස්වාමියා කෙරෙහි දොස් පමුණුවත්යයි" කීයේය.

15 "යහළු පුණ්ණමුඛය, ස්ත්‍රී තොමෝ මේ ස්වාමියාට පිටත්හි වාසය කිරීම වර්ණනා කරයි. ගියහු අනුව ශොක නොකරයි ආවාවූ ස්වමියා දැක සතුටු නොවෙයි. ස්වාමියාගේ ගුණයක් කිසිකලෙකත් නොකියයි. ප්‍රදූෂ්‍යවූ භාර්‍ය්‍යාවගේ මේ ලක්ෂණ වෙත්.

16 "සංයම නැත්තී ඔහුට අවැඩ කරයි. නොකටයුතු දේ කරන්නී ඔහුගේ වැඩද පිරිහෙළයි. දැඩි කොට හැඳගෙණ පරාංමුඛවී මුන යටකරගෙන සයනය කරයි, යන මේ ලකුණු ප්‍රදූෂ්‍යවූ භාර්‍ය්‍යාවගේ වෙත්.

17 "ඔබමොබ පෙරලෙන්නී හටගත් කළහ ඇත්තීදවේ. දුක් වේදනා ඇත්තී දීර්ඝකොට ආශ්වාසද කෙරෙත්. මලමුත්‍ර කිරීමට නිතර යයි, යන මේ ලක්ෂණයෝ ප්‍රදූෂ්‍යවූ භාර්‍ය්‍යාවගේ වෙති.

18 "විරුද්ධකාරයෙන්ද හැසිරෙයි. නොකටයුතුදෙය කරන්නීදවෙයි. කථාකරන්නාවූ අන්පුරුෂයෙකුගේ ශබ්දයටද ඇහුන්කන්දෙයි. නසනලද සම්පත් ඇත්තීද ක්ලෙශ සන්ථවයද කරයි. යන මේ ලක්ෂණයෝ ප්‍රදූෂ්‍යවූ භාර්‍ය්‍යාවගේ වෙත්.

19 "දුකසේ ලබනලද ධනයද දුකසේ රැස් කරණලද වස්තුවද විනාශකරයි. අසල්වැසියන් සමගද මිත්‍ර සන්ථවයද කරයි. ප්‍රදූෂ්‍යවූ භාර්‍ය්‍යාවගේ මේ ලක්ෂණයෝවෙත්.

20 "සොර සැමියන් සඳහා නික්මවනලද පා ඇත්තීද නොකල්හි විථිවල හැසිරෙන්නීද වේ. නිතර ස්වාමියා කෙරෙහි ප්‍රදුෂ්‍යසිත් ඇත්තී ස්වාමියා ඉක්ම හැසිරෙන්නීද වේ. එසේම ස්වාමියා කෙරෙහි ගෞරව නැත්තීද වේ. ප්‍රදුෂ්‍යවූ භාර්‍ය්‍යාවගේ මේ ලක්ෂණයෝ වෙත්.

21 "පියවුරුද කිසිලිද දක්වමින් නිතර දොර සමීපයෙහි සිටියි. භ්‍රාන්තවූ සිත් ඇත්තී දිශානු දිශාවන් බළයි. ප්‍රදුෂ්‍යවූ භාර්‍ය්‍යාවගේ මේ ලක්ෂණයෝවෙත්.

22 "සියලු ගංගාවෝ වක්වූ ගමන් ඇත්තාහ සියලු වනයෝ කාෂ්ටවලින් යුක්තවූවාහ. රහස් තැනක් ලැබුනු කල්හි සියලු ස්ත්‍රීහු පව්කරන්නාහුය.

23 "ඉදින් අවකාශයක් හෝ රහස් තැනක් හෝ ලැබේ නම් එබඳුවූ රහසිගතව මන්ත්‍රණය කිරීමට සුදුසු තැනක් ලැබේ නම් අන්පුරුෂයෙකු නොලද්දීහු පිලෙකු සමගවුවත් සියලු ස්ත්‍රීහුම පාප කර්මය නොකරන්නාහුද?

24 "ඇළුම් කරන්නාවූ නොයෙක් දෙනා කෙරෙහි සිත් ඇත්තාවූ, නිග්‍රහයෙන් හික්මවිය නොහැකිවූ මේ ස්ත්‍රීන් කෙරෙහි මිනිසුන්ගේ සියලු සිතින් සතුටුකරන්නාහුද, වෙෂ්‍යාවූවෝ වෙත්. ඔවුන් විශ්වාස නොකටයුතුය. ස්ත්‍රීහු වනාහි තොටුපලවල් හා සමාන වෙත්යයි" කීයේය.

25 "ඒකාන්තයෙන් කණ්ඩරී රජය කින්නරාදේවිය යන මොවුන්ගේ යම් නොඇල්මක්වීද, එය දැක සියලු ස්ත්‍රීහු ගෘහයෙහි ස්වාමිවරුන්ට නොඇලෙත්යයි, දතයුතුයි. ඒ එසේ මැයි අන්‍යවූ පිළුවූ පුරුෂයා දැක භාර්‍ය්‍යා තොමෝ එබඳු රජහු හැර පාප කර්මය කෙළේයයි" කීයේය.

26 "ඒකාන්තයෙන් කැමැත්ත අනුව ගියාවූ බකනම් රජහුගේද පාවාරික නම් රජහුගේද භාර්‍ය්‍යාවූ පඤ්චපාපී තොමෝ තමන්ගේ සිතේ බැඳීම අනුව ගියාවූ මෙහෙකරුවෙකුවෙත ඉක්මවා හැසුරුනේය. ස්ත්‍රී තොමෝ කවර නම් එයින් අන්‍ය පුරුෂයෙකු ඉක්මවා නොහැසිරෙන්නීදැයි" කීයේය.

27 "සියලු ලෝකයාට අධිපතිවූ බඹදත් රජහුගේ පිංගියානී නම් ප්‍රිය භාර්‍ය්‍යා තොමෝ සිත බැඳීම අනුව ගියාවූ අස්ගොව්වෙකු සමග ඉක්මවා හැසුරුණේය. කාමයන් පතන්නාවූ ඕතොමෝ ඒ අස්ගොව්වාද අගමෙහෙසුන් තනතුරද යන දෙකම නොලැබීයයි" කීයේය.

28 "කුදුවූවන්ටද ඇලෙන්නාවූ වහාපෙරලෙන සිත් ඇත්තාවූද කළගුණ නොදක්නාවූද ද්‍රෝහිවූද ස්ත්‍රීන්ගේ ස්වභාවය දිව්‍යභාවයකින් යුක්තනොවූ පුරුෂතෙම අදහන්ට සුදුසු නොවේ

29 "ඒ ස්ත්‍රීහු කරණලද්ද නොදනිත්, කටයුත්ත නොදනිත්, මව හෝ පියා හෝ සහෝදරයා හෝ නොදනිත්, ලජ්ජානැති ඉක්මවනලද ගුණධර්ම ඇති ඒ ස්ත්‍රීහු ස්වකීය චිත්තයාගේ වසඟයටම පැමිණෙත්.

30 "බොහෝ කලක් සමග වාසයකළාවූද ප්‍රියවූ මනාපවූ අනුකම්පා ඇත්තාවූ ප්‍රාණය හා සමානවූද ඒ ස්වාමියා ආපදාවන්හිද ඒ ඒ කටයුතු පැමිණි කල්හිද යම් හෙයකින් හැරදමද්ද, එහෙයින් මම ස්ත්‍රීන් විශ්වාස නොකරමි.

31 "ස්ත්‍රීන්ගේ සිත වනාහි වඳුරා බැසගත් ගත්තැන් මෙන්ද රුක්සෙවන මෙන්ද, ස්ථිර නොවේ. ස්ත්‍රියගේ ඒ සිත එක් අරමුණෙක්හිම නොපිහිටනලදී. රථරෝදයක නිම්වළල්ල මෙන් පෙරළේ

32 "යම්කලෙක්හි ඒ ස්ත්‍රීහු සොයා බලන්නාහු පුරුෂයාගේ ගතයුතු ස්වභාව ඇති වස්තුවක් දකිද්ද, මේ පුරුෂයා සිළුටුවූ වචනවලින් තමන්ගේ වසඟයට පමුණුවත්. කම්බෝජ රටවැස්සෝ දියෙහි හටගත්තාවූ සෙවෙලින් අසෙකු අල්වාගන්නා මෙනි.

33 "යම් කලෙක්හි සොයාබලමින් පුරුෂයාගේ ගතයුතු ස්වභාව ඇති වස්තුවක් නොදකිද්ද, සියලු ආකාරයෙන් ඔහු දුරු කෙරෙත්. එතර කළාවූ ගඟ එතෙරට ගියාවූ තැනැත්තේ පසුර හැර දමන්නාක්මෙනි.

34 "පුරුෂයන්ගේ සිත් අලවන බැවින් ලාටු බඳුවූද ගින්න මෙන් සියල්ල අනුභව කරන්නාවූද, තියුණු මායා ඇත්තාවූද

වහා බස්නා දිය පහර ඇති ගංගා වැනිවූ මේ ස්ත්‍රීහු ප්‍රියවූවහුද අප්‍රියවූවහුද සේවනය කරත්. ගඟ මෙගොඩ ඉවුරද එගොඩ ඉවුරද සේවනය කරන්නාවූ ඔරුව මෙනි.

35 "ඒ ස්ත්‍රීහු එකෙකුට නොවේ. දෙදෙනෙකුන්ට නොවේ. විවෘත කරණලද සල්පිලක්මෙන්වේ. යමෙක් එබඳු ස්ත්‍රීන් මාගේයයි හඟින්නේද, හෙතෙම දැලින් සුලං බඳින්නේය.

36 "ගංගාවද මාර්ගයද සුරාපානශාලාවද සභාවද පැන් ශාලාවද යන මොහු යම්සේ වෙද්ද, ලෝකයෙහි ස්ත්‍රීහු නම් මෙබඳු වෙත්. ඔවුන්ගේ වේලාවක් නැත්තේය.

37 "මේ ස්ත්‍රීහු නම් ගිනි හා සමානවෙත්. කෘෂ්ණ සර්පයෙකුගේ හිසට බඳු උපමා ඇතිවෙත්. ගවයෝ තණ කෑ තැන් හැර පිටත්හි සොය සොයා හැසිරෙන්නාක් මෙන් මේ ස්ත්‍රීහු ධන නැත්තාවුන් හැර ධන ඇත්තවුන් සොයත්.

38 "ගින්නද හස්තියාද කෘෂ්ණ සර්පයාද රජහුද ස්ත්‍රීද යන මේ සියල්ල මනුෂ්‍යතෙම නිතර සිහියෙන් යුක්තව සේවනය කටයුත්තේය. ඒකාන්තයෙන් මොවුන්ගේ අදහස් දැනගත නොහැක්කේය.

39 "විශිෂ්ට රූ ඇත්තී සේවනය නොකටයුත්තීය. බොහෝ දෙනාට ප්‍රිය තැනැත්තී සේවනය නොකටයුත්තීය. නෘත්‍ය ගීතයන්හි දක්ෂවූ ස්ත්‍රිය සේවනය නොකටයුත්තීය. අනිකෙකුගේ භාර්‍ය්‍යාව සේවනය නොකටයුත්තීය. ධන හේතුවෙන් විශ්වාසවූ තැනැත්තීද සේවනය නොකටයුත්තීය. මෙසේ මේ ස්ත්‍රීහු පස්දෙන සේවනය නොකටයුතු වෙත්යයි" කුනාල රජතෙම කීයේය.

40 "ඉදින් යම් පුරුෂයෙක් ධනයෙන් සම්පූර්ණවූද මේ පෘථිවිය සම්මතවූ යම් ස්ත්‍රියකට දෙන්නේද ඕතොමෝ අවකාශයක් ලැබ එබඳු පුරුෂයාද ඉක්ම පවත්නේය. එහෙයින් එබඳු ලාමක ස්ත්‍රීන්ගේ වසඟයට නොයන්නේය.

41 "ඉදින් උත්සාහවත්වූද නොපසුබට පැවතුම් ඇති ප්‍රියවූ මනාපවූ තරුණවයසෙහි සිටි ස්වාමි පුරුෂයෙකුවූ ඔහුද

විපත්තීන්හිද කටයුතු ඇතිකල්හිද ස්ත්‍රීහු යම්හෙයකින් හැර දමත්ද එහෙයින්ම ස්ත්‍රීන් විශ්වාස නොකරමි.

42 "මෝතොමෝ මා කැමතිවේයයි පුරුෂතෙම ස්ත්‍රිය විශ්වාස නොකරන්නේය. මා සමීපයෙහි හඬායයි ස්ත්‍රිය විශ්වාස නොකරන්නේය. මෙගොඩ ඉව්රද එගොඩ ඉව්රද සේවනය කරන්නාවූ ඔරුව මෙන් මේ ස්ත්‍රීහු ප්‍රියවූවහුද අප්‍රියවූවහුද සේවනය කෙරෙත්.

43 "පැරණිවූ කොළඅතු ඇතිරිය විශ්වාස නොකටයුතුය. මිත්‍රවූ පැරැණි සොරු විශ්වාස නොකටයුතුය. රජ තෙම මාගේ යහළුයයි විශ්වාස නොකටයුත්තේය. දශ දෙනෙකුන්ගේ මව්වූද ස්ත්‍රිය විශ්වාස නොකටයුතුය.

44 "බාලයන් කෙරෙහි ඇළුම් කරන්නාවූ ඉක්මවන ලද ශීලගුණ ඇත්තාවූ සංයම නැත්තාවූ ස්ත්‍රීන් කෙරෙහි විශ්වාස නොකටයුතුය. ඒකාන්තයෙන් ප්‍රේමය අනුවගිය හුගේද භාර්‍ය්‍යා තොමෝ විශ්වාස නොකටයුත්තීය. කුමක් හෙයින්ද යත් ස්ත්‍රීහු වනාහි තොටුපලවල් මෙන් සියල්ලන්ට සාධාරණවන හෙයිනි.

45 "යම්හෙයකින් කිපියාවූ හෝ අන්පුරුෂයන් කෙරෙහි ඇලුනාවූ ස්ත්‍රීහු ස්වාමි පුරුෂයා නසන්නාහුද, සිඳින්නාහුද, සිඳවන්නාහුද බොටුවද සිඳ රුධිරය පානය කරන්නාහුද, එහෙයින් ලාමක අදහස් ඇත්තාවූ සංයම නැත්තාවූ ගංගා තොටුපලවල් බඳුවූ ස්ත්‍රීන් කෙරෙහි අදහසක් නොකටයුතුයි.

46 "ඒ ස්ත්‍රීන්ගේ බොරුකීම සැබෑවක් මෙනි. ඔවුන්ගේ සැබෑවද බොරුව මෙනි. ගවයෝ තෘණ භූමියෙහි පිටත්හිම යම්සේ හොඳ හොඳ තැන් සොයා තණ අනුභව කරද්ද, එමෙන් ස්ත්‍රීහු අන් පුරුෂයන් සොයත්.

47 "මේ ස්ත්‍රීහු ගමනින් පුරුෂයන් පොළඹවා ගනිත්. බැල්මෙන්ද මද සිනහවෙන්ද පොළොඹවත්. තවද නුසුදුසු වස්ත්‍ර හැඳීමෙන්ද මිහිරිකථාවෙන්ද පුරුෂයන් පොළොඹවත්.

48 "මේ ස්ත්‍රීහු රැස්කළ වස්තුව නසන හෙයින් සොරහු වෙත්. තද සිත් ඇත්තියෝද වෙත්. චණ්ඩද වෙත්. සකුරු මෙන්

මිහිරිවූ නිරර්ථක කථා ඇත්තියෝද වෙත්. මිනිසුන් අතර යම් වඤ්චා ප්‍රයෝගයක් ඇත්නම් ඔව්හු ඒ සියල්ල දනිත්.

49 "ලෝකයෙහි ලාමකවූ මේ ස්ත්‍රීහු නම් සැමකල්හි ඇළුනාහුද කයේ නොහික්මීමෙන් යුක්තවූවාහුද, ගින්නක් සියල්ලන් අනුභව කරන්නාක්මෙන්ම ඔවුන්ගේ වේලාවක් නැත.

50 "ස්ත්‍රීන්ට ප්‍රියවූවෙක් නම් නැත්තේය. අප්‍රියවූවෙක්ද නැත. මොව්හු වනාහි මෙගොඩ ඉව්රද එගොඩ ඉව්රද සේවනය කරන්නාවූ නැවක් හෙවත් ඔරුවක් මෙන් ප්‍රියයාද අප්‍රියයාද සේවනය කරත්.

51 "ස්ත්‍රීන්ට ප්‍රියවූවෙක් නම් නැත. අප්‍රියයෙක්ද නොවේ. ගස ඇසුරුකළාවූ වැලක් මෙන් ධනය ඇති බැවින් පුරුෂයා වැළඳ ගනිත්.

52 "ස්ත්‍රීහු ඇත්ගොව්වාද අස්ගොව්වාද ගෝපාලයාද චණ්ඩාලයාද සොහොන්ගොව්වාද පුප් සඬුවාද යන මොවුන්ගෙන් ධනය ඇත්තහු අනුවයත්.

53 "ස්ත්‍රීහු වස්තු නැත්තාවූ කුලපුත්‍රයාද හැර දමත්. චණ්ඩාලයෙකු හා සමානවූවහුද ධන ඇත්තහු අනුව යෙත්. ස්ත්‍රීහු වනාහි ධන හේතුවෙන්ම පුරුෂයන් අනුව යෙත්යයි" ආනන්ද නම් ගිජුලිහිණි රජතෙම ස්ත්‍රීන්ගේ අගුණ කීයේය.

54 "පක්ෂි රාජය, මේ සතර දෙනෙක් නොපිරෙත්. ඔවුන් කියන්නාවූ මාගෙන් අසව්. සමුද්‍රයද බ්‍රාහ්මණයාද රජද ස්ත්‍රීද යන මොහුයි.

55 "යම්කිසි පෘථිවිය ඇසුරු කළාවූ ගංගාවෝ වෙද්ද, ඒ සියල්ලෝ සාගරයට බැසගත්. ඔව්හු සමුද්‍රය නොපුරවත්. ඌණ භාවයෙන්ම සිටියි. නොපිරේ මැයි.

56 "බ්‍රාහ්මණතෙමේද ඉතිහාසය පස්වෙනිකොට ඇති චතුර්වෙදය හදාරා මත්තෙහිද ඉගෙණීමට කැමතිවන්නේය. අඩු බැවින්ම සිටියි. නොපිරේමැයි.

57 "රජතෙමේද මුහුද සහිතවූ පර්වත සහිතවූ අප්‍රමාණ රත්නයන්ගෙන් යුක්තවූ සියලු පොළොව දිනා වාසය

කරන්නේද, මුහුදින් එතෙර ප්‍රාර්ථනා කරයි. මදිකමින්ම සිටියි නොපිරේමැයි

58 "මෙපරිද්දෙන්ම එක ස්ත්‍රියෙකුට ශූරවූද බලවත්වූද සියලු කැමති රශයන් ගෙණදෙන්නාවූද ස්වාමීහු අට අට දෙන වන්නාහුද ඕතොමෝ නවවැන්නහු කෙරෙහි ආලය කරන්නේය. ඌන භාවයෙන්ම සිටියි. කාම තෘෂ්ණා මහත් බැවින් නොපිරේමැයි

59 "සියලු ස්ත්‍රීහු ගින්න මෙන් සියල්ල අනුභව කරන්නාහුය. සියලු ස්ත්‍රීහු ගංගාව මෙන් සියල්ල වහණය කරන්නාහුය. සියලු ස්ත්‍රීහු කටුගස්වල අතු වැනි වෙත්. සියලු ස්ත්‍රීහු ධනහේතුවෙන් අන් පුරුෂයෙකු කරායෙත්.

60 "යම්පුරුෂයෙක් ස්ත්‍රීන් කෙරෙහි තමාගේ සියලු අදහස හරින්නේද, ඒ මිනිසා දැලින් සුළඟ අල්වන්නේය. එක අතකින් මුහුද ඉසින්නේය. ස්වකීය අතින් අතට ගසා ඝෝෂාව කරන්නේය.

61 "යම් ස්ත්‍රීන් කෙරෙහි ඇත්ත ඉතා දුර්ලභවේද, එබඳු සෙරියන්වූ බහු බුද්ධි ඇත්තාවූ ස්ත්‍රීන්ගේ අදහස මසුන්ගේ දියෙහි ගමන මෙන් දැන ගැණීමට දුෂ්කරවේ

62 "නුසුදුසුවූ මෘදු තෙපුල් ඇත්තාවූ නොපිරවිය හැකි අදහස් ඇත්තාවූ ගංගාවන් හා සමානවූ ඒ ස්ත්‍රීහු සේවනය කළවුන් සතර අපායෙහි ගිල්වත්යයි දැන දුරින් දුරු කටයුතු.

63 "අනුන් පෙරලාගන්නාවූ මහත් මායා ඇති බ්‍රහ්මචර්‍ය්‍යාව විනාශ කරන්නාවූ ඒ ස්ත්‍රීහු සේවනය කළවුන් අපායෙහි ගිල්වත්යයි දැන දුරින්ම දුරු කටයුතුයි.

64 "මේ ස්ත්‍රීහු ප්‍රිය සංවාස වශයෙන් හෝ ධන හේතුවෙන් හෝ යම් පුරුෂයෙකු සේවනය කෙරෙද්ද, ස්වකීය ස්ථානය දවන්නාවූ ගින්න මෙන් වහා ඔහු විනාශයට පමුණුවත්යයි" නාරද ඍෂිතෙම ස්ත්‍රීන්ගේ අගුණ කීයේය.

65 "නුවණැත්තේ තියුණු කඩුවක් ගත් අත් ඇත්තහු සමග කථාකරන්නේද, දෝෂීවූ පිසාචයෙකු සමග කථා කරන්නේද

උග්‍රතේජස් ඇත්තාවූ සර්පයෙකුට ලංවන්නේද එකලාව හුදකළාවූ ස්ත්‍රියක් සමග කථා නොකරන්නේය.

66 "නැටීමය ගී කීමය කථාකිරීමය යන මොවුන් ආයුධකොට ඇත්තාවූ මේ ස්ත්‍රීහු වනාහි ලෝකයාගේ සිත් මඩින්නාහුය. ද්විපයෙක්හිවූ රාක්ෂසිහු වෙළඳුන් වසඟයට ගෙණ පෙළන්නාක් මෙන් පැමිණසිටි සිහි නැත්තහු පෙළත්.

67 "ඒ ස්ත්‍රින්ගේ හික්මීමක් නැත. සංවරයක්ද නැත, මත්පැනෙහි හා මස් අනුභව කිරීමෙහි ඇළුනාවූ සංයම නැත්තාවූ ඒ ස්ත්‍රීහු සාගරයෙහි තිමිංගල නම් මත්ස්‍යතෙම මෝරෙකු ගිලින්නාක් මෙන් පුරුෂයාගේ වස්තුව විනාශ කරත්.

68 "පස්කම්සැප අනුභව කිරීම ගොචරකොට ඇත්තාවූ උඩගුවූ නියම සිතක් නැත්තාවූ සංයම නැත්තාවූ ස්ත්‍රීහු සාගරය කරා පැමිණෙන්නාවූ ගංගාවන් මෙන් ප්‍රමාදවූවහු කරා පැමිණෙත්.

69 "ස්ත්‍රීහු ප්‍රේමයෙන් හෝ පඤ්චකාමගුණ ආලයෙන් හෝ ධන හේතුවෙන් හෝ යම් මිනිසෙකුට ඇලී වාසය කෙරෙද්ද, රාගද්වෙෂවලින් යුක්තවූ ඒ ස්ත්‍රීහු එබඳු ගුණයෙන් ගින්නක් මෙන් දිළිසෙන්නාවූද ඔහු විනාශ කෙරෙත්.

70 "ආඪ්‍යවූ මහත් ධන ඇත්තාවූ පුරුෂයා දැන ධන සහිතවූවාහු ආත්ම භාවය සමග මිහිරි වචන කීමෙන් ඔහු වැළඳ ගනිත්. වනයෙහි සල්ගස් වැළඳගත් මාළුවා වැලමෙන් ඇළුනු සිත් ඇත්තාවූ ඔහු අතිශයින් පෙළෙත්

71 "සැරසීමෙන් විසිතුරු සිරුරු හා මුහුණ ඇති සිය ගණන් මායාවන්හි දක්ෂවූ ඒ ස්ත්‍රීහු නොයෙක් ආකාරවූ ඇල්මෙන් මායාකාරයෙකු හෙවත් සම්බර නම් අසුරයා මෙන් පැමිණෙත්. මහත්කොට සිනාසෙත්. මද සිනාවෙන්ද සිනාසෙත්.

72 "රත්රන්ය මැණික්ය මුතුය යන මෙයින් සැරසුනාවූ ස්වාමි කුලයන්හි සත්කාර කරණ ලද්දාවූ රක්නා ලද්දාවූ ස්ත්‍රීහු හෘදයාභ්‍යන්තරයෙහි ඇසුරු කළාවූ ස්ත්‍රීය අසුරයා ඉක්ම පැවතුනාක් මෙන් ස්වාමියා ඉක්මවා හැසිරෙත්.

73 "නුවණැත්තාවූ බොහෝ දෙනා විසින් සත්කාර කරණ ලද්දාවූ පුදන ලද්දාවූ තේජස් ඇත්තාවූද මිනිස්තෙමේ වනාහි රාග විසින් ලංවන ලද චන්ද්‍රයා මෙන් ස්ත්‍රීන්ගේ වසඟයට ගියේ නොබබළයි.

74 "කිපියාවූ විරුද්ධවූ දුෂ්ට සිත් ඇත්තාවූ සතුරෙක් තමා වසඟයට පැමිණියාවූ සතුරෙකුට යමක් කරන්නේද, ස්ත්‍රීන්ගේ වසඟයට ගියාවූ අපේක්ෂා ඇත්තේ එයට වැඩි ව්‍යසනයට පැමිණේ.

75 "හිසකේ ඇද කැඞීමෙන්, නියපොතුවලින් සීරීමෙන් තර්ජනය කරන ලද්දාවූ පයින් අතින් කසයෙන් දන්ඩෙන් තලනලද්දාවූ ඒ ස්ත්‍රීහු පැමිණියාහු කුණපයෙහි ඇලෙන මැස්සන් මෙන් හීනයාටම ඇලෙත්.

76 "කුලයන්ද විථි අතරද නැවත රාජධානි නියම්ගම්වලද අටවන ලද කෙළෙස් මරහුගේ මල පුඩුවක් බරුදැලක් වැනිවූ ඒ ස්ත්‍රීන් නුවණැස් ඇත්තාවූ දෙව්මිනිස් සැප කැමැත්තාවූ පුරුෂතෙම දුරුකරන්නේය.

77 "යම් පුරුෂයෙක් තෙම කුශලයද, තපෝගුණයද හැර අනායර්‍යවූ පඤ්චකාම ගුණයන්හි හැසුරුනේද හෙතෙම නුවණ මද වෙළෙන්දෙක් මාහැඟි බඩු දී නොවටිනා මැණිකක් ගන්නාක් මෙන් දිව්‍ය ආත්මවලින් නරකයට මාරුවන්නේය.

78 "මෙලොවද පරලොවද ගර්හා කරණ ලද ස්වකීය කර්මයෙන් යුක්තවූ ස්ත්‍රීන්ගේ වසඟයට ගියාවූ ඒ දුෂ්ප්‍රාඥ තෙම කූට ගද්‍රභයන් යෙදූ රථය නොමග යන්නාක් මෙන් කාලනියමයක් නැතිව දෙව්ලොවින්ද මිනිස්ලොවින්ද ගිලිහී අපායටම පැමිණෙයි.

79 "ඒ ස්ත්‍රීන් වසඟයට ගිය පුරුෂතෙම අතිශයින් තැවීම ඇත්තාවූ අයොමය කටුවලින් යුත් කටුහිඹුල්වන නම් නරකයටද පැමිණේ. තිරිසන් යෝනියෙහිද වාසයකොට ප්‍රෙතවිෂයද කාලකඤ්ජ නම් අසුර විෂයද නොමුදයි.

80 "ප්‍රමාදයෙන් යුත් පුරුෂයන්ගේ නන්දනොද්‍යානයෙහි දිව්‍ය ක්‍රීඩාවන්හි ඇළුමද මනුෂ්‍යලෝකයෙහි චක්‍රවර්ති

රාජ්‍යසම්පත්තියද ස්ත්‍රීහු නසත්. ඒ දුර්ගතියෙහි දුකද පිළියෙල කරත්

81 "යම් පුරුෂ කෙනෙක් ස්ත්‍රීන්ගෙන් ප්‍රයෝජන නැත්තෝව බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙද්ද, ඔවුන්ට දිව්‍ය ක්‍රීඩාවන්හි ඇළුම් දුර්ලභ නොවෙත්. මිනිස්ලොව චක්‍රවර්ති රාජ්‍යයද දුර්ලභ නොවේ. ස්වර්ණමය විමානවල වාසය කරන්නාවූ අප්සරාවෝ දුර්ලභ නොවෙත්.

82 "පුරුෂකෙනෙක් ස්ත්‍රීන් ප්‍රයෝජන නැත්තෝව බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙද්ද, කාමලෝකය ඉක්මවා පැවති ගතියවූ රූප ලෝකයෙහි උත්පත්තිය ඔවුන්ට දුර්ලභ නොවේ. පහවූ රාග ඇත්තවුන්ට විෂයවූ ශුද්ධාවාස ලෝකයෙහි යම් ඉපදීමක් වේනම් එයද දුර්ලභ නොවේ

83 "යම් පුරුෂ කෙනෙක් ස්ත්‍රීන්ගෙන් ප්‍රයෝජන නැත්තෝව බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙද්ද, ඒ නිවියාවූ කෙළෙස් ඇති පිරිසිදුවූවන් විසින් සියලු දුක් ඉක්මවූ ක්ෂෙමවූ ඒකාන්තවූ අකම්පාවූ අසංස්කෘතවූ නිවණ නොලැබිය හැකි නොවේයයි" කුණාල නම් බෝසත්තෙම දෙශනාව නිමකෙළේය.

84 එකල්හි මම කුණාලනම් වීමි. උදායි තෙම පූස්ස කෝකිල නම් වූයේය. ආනන්ද ස්ථවිරතෙම ගිජුලිහිණි රජ විය ශාරීපුත්‍ර ස්ථවිරතෙමේද නාරද නම් ඍෂිවූයේය. එකල්හි පිරිස දැන් බුදු පිරිස විය. මෙසේ මේ ජාතකයද දරාගණිවය"යි වදාළේය.

**536 මහා සුතසෝම ජාතකයඃ-** 1 "එම්බා අරක්කැමිය, තෝ කුමක් හෙයින් මෙබඳුවූ ඉතා දරුණු කම් කරන්නෙහිද? මුළාව ස්ත්‍රීන්ද පුරුෂයන්ද නසන්නෙහිය. මෙය මස හේතුකොටගෙණද නොහොත් ධනය හේතුකොට කොටගෙණදැයි" සේනාපතිතෙම ඇසීය.

2 "ස්වාමීනි, මෙය තමන් හේතුකොටගෙණ නොවේ. ධනය හේතුකොටගෙණද නොවේ. අඹුදරුවන්ද යහළුවන් නෑයන් හේතුකොටගෙණද නොවේ. මාගේද ස්වාමිවූ ඒ පින්වත් රජතෙම මෙබඳුවූ මස අනුභව කෙරේයයි" අරක්කැමිතෙම කීයේය.

3 "ඉදින් ස්වාමිහුගේ වැඩෙහි යෙදුනාවූ තෝ මේ ඉතා දරුණුකම් කරන්නෙහි නම් හෙට උදෑසනම අන්තඃපුරයට පැමිණ රජු ඉදිරියෙහි එය මට කියවයි" සේනාපතිතෙම කීයේය.

4 "ස්වාමිනි කාලහත්ථි නම් සේනාපති තුමනි, ඔබ වහන්සේ යමක් කියන්නෙහි නම් මම එසේම කරන්නෙමි. උදෑසනම අන්තඃපුරයට පැමිණ රජු ඉදිරියෙහි එය ඔබට කියන්නෙමියි" අරක්කැමිතෙම කීයේය.

5 ඉක්බිති රාත්‍රිය ඇවෑමෙහි සූර්යෝද්ගමන වේලෙහි කාල සේනාපතිතෙම අරක්කැමියා හැරගෙණ රජහුවෙත පැමිණියේය. රජහුවෙත පැමිණ මේ වචනය කීයේය.

6 "මහරජ, ඔබ විසින් අරක්කැමිතෙම ස්ත්‍රී පුරුෂයන් නසවයි මෙහෙයවන ලද්දේ ඔබ මිනිමස් කන්නෙහි යනු සැබෑදෑයි" ඇසීය.

7 "කාලහත්ථී සේනාපතිය, මේ කාරණය එසේය, මා විසින් අරක්කැමිතෙම එසේ මෙහෙයවනලදී. මාගේ වැඩය කරන්නාවූ ඔහුට කුමක් හෙයින් නින්දා කරන්නෙහිදැයි" රජතෙම ඇසීය.

8 "සියලු මත්ස්‍යයන්ට ජ්‍යෙෂ්ඨවූ මස් කෑමෙහි ගිජුවූ ආනන්ද නම් මත්ස්‍යතෙම තමන්ගේ පිරිස අනුභවකොට පිරිස පිරිහුනු කල්හි පසුව තමාද අනුභවකොට මළේය.

9 "මෙසේ ප්‍රමාදවූ රසයෙහි ගිජුබැව්හි ඇළුනාවූ අඥානතෙම ඉදින් මත්තෙහි උපදින දුක නොදනීද, හෙතෙම දරුවන් විනාශකොට නෑයන්ද හැරදමා පෙරලා තමන්ම අනුභව කෙරේ.

10 "මහරජ, මේ කරුණ අසා ඔබගේ ඒ කැමැත්ත දුරුකෙරේවා. මිනීමස් අනුභව නොකරව, මහරජ, නුඹ ආනන්ද මත්ස්‍යයා මෙන් මේ මුළු රට හිස්නොකරවයි" සේනාපතිතෙම කීයේය.

11 "එම්බා කාල හත්ථිය, පෙර නමින් සුජාත නම් කෙළෙඹියෙක් විය. ඔහුගේ ඖරශ පුත්‍රයෙක් විය. හෙතෙම දඹපල නොලැබ ඒ දඹපල නොලැබීමෙන් මළේය.

12 "කාලය, මෙපරිද්දෙන්ම මම කෑයුතුවූ උතුම් රශය අනුභවකොට මිනීමස් නොලබා ජීවිතය හරින්නෙමියි සිතම්යයි" රජ කීයේය.

13 "මානවකය, නුඹ විශිෂ්ට රූ ඇත්තෙහිය. සොත්ථිය නම් උතුම් කුලයෙහි උපන්නේය. පුත්‍රය, නුඹ අනුභව නොකටයුත්තක් අනුභව කරන්ට නුසුදුස්සෙහියයි" පියා කීයේය.

14 "පියාණෙනි නුඹ මා යමකින් වලක්නෙහිද මේ සුරාව නම් රශ අතුරෙන් එක්තරා උතුම් රශයෙක, යම් තැනෙක්හි මෙබඳු රශයක් ලබන්නෙම්ද ඒ මම එතැන්හි යන්නෙමි.

15 "බ්‍රාහ්මණය, යම් බඳුවූ මාගේ දැකීමෙන් නුඹ සතුටු නොවන්නෙහිද, ඒ මමම නික්ම යන්නෙමි. ඔබගේ සමීපයෙහි නොවසන්නෙමියි" මානවකයා කීයේය.

16 "මානවකය, අන්‍යවූද දායාද පුත්‍රයන් ලබන්නෙමු. ජඩය තෝද විනාශයට පැමිණෙව යම් තැනකට පැමිණියාවූ තා නොඅසන්නෙම්ද, එබඳු තැනකට යවයි" පියා කීයේය.

17 "දෙපා ඇත්තවුන්ට අධිපතිවූ මහරජ මෙපරිද්දෙන්ම ඔබ මාගේ වචනය අසව, සුරාවෙහි ලොල්වූ මානවකයා මෙන් ඔබද රටින් පිටුවහල් කරන්නාහුයයි සේනාපතිතෙම කීයේය.

18 "සේනාපතිය, නමින් සුජාත නම්වූ තාපසවරුන්ගේ ශ්‍රාවකයෙක් වීය. හෙතෙම දිව්‍යප්සරාවන් කැමති වෙමින්ම අනුභව නොකෙළේය. පානය නොකෙළේය.

19 "යම්සේ කුසතණ අග දියගෙණ මුහුද දිය මනින්නේද, දිව්‍යවූ කාය සම්පත් ලබා මානුසිකවූ කාමසම්පත් එමෙනි.

20 "කාලහත්ථිය, මෙපරිද්දෙන්ම මම කෑයුතුවූ උතුම් රශය අනුභවකොට දැන් මිනීමස් නොලදීන් ජීවිතය හරින්නෙමි සිතම්යයි" රජ කීයේය.

21 "අහසින් ගමන් කරන්නාවූ මේ ධ්‍රතරාෂ්ඨ නම් හංසයෝ දිවි පැවැත්මට නුසුදුසුවූ පරිභෝගයෙන් යම්සේ සියල්ලෝ විනාශයට පැමිණියාහුද,

22 "දෙපා ඇත්තවුන්ට අධිපතිවූ මහරජ මෙපරිද්දෙන්ම නුඹ මාගේ වචනය අසව, මහරජ, නුඹ නොකැයුත්තක් කැයෙහිය. එහෙයින් ඔබ පිටුවහල් කෙරෙත්යයි" සේනාපති කීයේය

23 "එම්බා තපස්සීය, සිටුවයි මා විසින් කියන ලද්දාවූ ඒ නුඹ පිටුපා යන්නෙහිය. නොසිටියාවූ නුඹ සිටියෙමියි කියන්නෙහිය. ශ්‍රමණය, මේ තොපගේ අයුත්තකි මාගේ මේ කඩුවද කුශතෘණයකැයි හඟින්නෙහිදැයි" පොරිසාදයා ඇසීය.

24 "මහරජ, මම ස්වකීයවූ කුශල ධර්මයන්හි සිටියේ වෙමි. මම නාමගොත්‍රය නොපෙරලමි. ලෝකයෙහි අකුශල කර්මයෙහි සිටියාවූ සොරවූවහුද නොසිටියහුයයි" කියත්. මෙයින් චුතව අපායට යන්නාවූ නිරිසතෙකුයයි කියත්.

25 "එම්බා පෝරිසාදය, ඉදින් සුතසෝම රජගන්නෙහි නම් එයින් යාගය කොට මෙසේ ස්වර්ගයට යන්නෙහියයි" දේවතාවා කීයේය.

26 "එම්බා බ්‍රාහ්මණය, කිනම් රටෙක්හි තොපගේ උපන් භූමිය වේද, තවද කවර කරුණකින් මෙහි පැමිණියේ වෙහිද, මේ කාරණය මට කියව. නුඹ කුමක් කැමැත්තෙහිද, අද තා විසින් කැමතිවනලද්ද දෙමියි" සුතසෝම රජ බමුණාට කීයේය.

27 "මහරජතුමනි, උතුම් සාගරය බඳුවූ ඉතා ගැඹුරුවූ අර්ථ ඇති ගාථා සතරක් ඔබගේම ප්‍රයෝජනය පිණිස මෙහි ගෙනායෙමි. උතුම් අර්ථයන්ගෙන් යුක්තවූ ඒ ගාථාවන් අසනු මැනවයි" බමුණා කීයේය.

28 "යම්හෙයකින් පණ්ඩිතයෝ අනුන්ගේ ශෝක දුරුකරන්නාහු වෙද්ද, මේ ශොක දුරුකිරීම මිනිසුන්ට උතුම් ප්‍රතිෂ්ඨාවක්වේ. යම්කෙනෙක් බොහෝ කරුණු සිතන්නාවූ බොහෝ ඇසූපිරුතැන් ඇත්තාවූ සප්‍රාඥයෝ වෙද්ද, ඒ ඔබ වැනි නුවණැත්තෝ ඒකාන්තයෙන් නොහඬත්

29 "කොරව්‍ය ශ්‍රෙෂ්ඨවූ සුතසෝම නම් රජ නුඹ තමන්ද නෑයන්ද, නොහොත් අඹුදරුවන්ද, ධාන්‍යයද, ධනයද, රිදීද,

රත්රන්ද යන මේ කුමකට තැවෙන්නෙහිදැයි තොපගෙන් මේ වචනය අසමියි" පෝරිසාදයා කීයේය.

30 "එම්බා පෝරිසාදය, මම තමන්ගැන ශෝක නොකරමි. ධනයටද ශෝක නොකරමි රාජ්‍යයටද ශෝක නොකරමි. පුරාණවූ සත්පුරුෂයන්ගේ ධර්මය හැසිරෙන ලද්දෙමි. බ්‍රාහ්මණයාටවූ ඒ පොරොන්දුව ගැන ශෝක කරමි.

31 "ස්වකීය රටෙහිවූ රාජ්‍යයෙහි සිටියාවූ මා විසින් බ්‍රාහ්මණයෙකු සමග පොරොන්දුවීමක් කරණලදී. ඒ පොරොන්දුව බ්‍රාහ්මණයාට සත්‍යය රකිමින් නැවත එන්නෙමියි" සුතසෝම රජතෙම කීයේය.

32 "මාරයාගේ මුඛයෙන් මිදුනාවූ සුවපත්වූ මනුෂ්‍ය තෙම සතුරාගේ අතට නැවත පැමිණෙන්නේය යන මෙය මම නොම අදහමි. කෞරව්‍ය ශ්‍රෙෂ්ඨවූ රජ නුඹ නැවත මා වෙත නොඑන්නෙහිය

33 "කාම සම්පත් කැමැතිවන්නාවූ රජ පෝරිසාදවූ මාගේ අතින් මිදුනාවූ නුඹ ස්වකීය රජ භවනයට ගොස් මිහිරිවූ ප්‍රියවූ ජීවිතය ලබා කවර කරුණකින් නුඹ මාලඟට එන්නෙහිදැයි" පෝරිසාදයා ඇසීය.

34 "පිරිසිදු සිල් ඇත්තේ මරණය කැමතිවන්නේය. නින්දා ලබනලද ලාමක ස්වභාව ඇත්තේ වනාහි ජීවත්වීම නොකැමැති වන්නේය. යමක් හේතුකොටගෙණ බොරුව කියන්නේද, එය ඒ මිනිසා දුර්ගතිවලින් නොම රක්ෂා කෙරේ.

35 "යහළු පෝරිසාදය, ඉදින් වාතයතෙම පර්වතයක් ගසා යන්නේද, චන්ද්‍රයාද, සූර්‍ය්‍යයාද, යන මොහු භූමියෙහි වැටෙන්නාහුද, සියලු ගංගාවෝ උඩුගං බලා යන්නාහුද නමුත් මහරජ, මම බොරු නොකියන්නෙමි. අහස පැලෙන්නේද, සමුද්‍රය වියලෙන්නේද, සත්වයන් දරා සිටින්නාවූ පෘථිවිය පෙරලෙන්නේද, මේරු නම් පර්වතය සහමුලින් ඉදිරී වැටෙන්නේද නමුත් මම බොරුවක් නම් නොකියන්නෙමියි' සුතසෝම රජතෙම කීයේය.

36 "යහළු පෝරිසාදය, මම කඩුවද සිරියද පරාමර්ශනය කරමි. ඔබට එහි දිවිරීමද කරමි. ඔබ විසින් මුදනලද මම බ්‍රාහ්මණයාට නයකාරයෙක් නොවී සත්‍යය රකිමින් නැවත එන්නෙමියි සුතසෝම රජතෙම කීයේය.

37 "මහරජ, ස්වකීය රටෙහි රජබැව්හි සිටියාවූ ඔබ විසින් බ්‍රාහ්මණයෙකු සමග යම් පොරොන්දුවීමක් කරණ ලද්දේද, ඒ පොරොන්දුව බ්‍රාහ්මණයාට දී සත්‍යය රකිමින් නැවත එවයි" පෝරිසාදයා කීයේය

38 "ස්වකීය රටෙහි රජබැව්හි සිටියාවූ මා විසින් බ්‍රාහ්මණයෙකු සමග යම් පොරොන්දු කථාවක් කරණ ලද්දේද, ඒ පොරොන්දුව බ්‍රාහ්මණයාට දී සත්‍යය රකිමින් නැවත එන්නෙමියි" සුතසෝම රජතෙම කීයේය

39 පෝරිසාදයා අතින් මිදුනාවූ හෙතෙමේද ගොස් ඒ නන්දනම් බ්‍රාහ්මණයාට මෙය කීයේය. එම්බා බ්‍රාහ්මණය, අසනලද යම් ගාථාවෝ මට හිත පිණිස වන්නාහුද, ඒ සතා රහ නම් ගාථාවන් අසමියි රජතෙම කීයේය.

40 "සුතසෝම නම් රජතුමනි, එක්වරක්ම සත්පුරුෂයන් සමග යම් සමාගමයෙක්වේද, ඒ එක්වීම ඔහු ආරක්ෂා කෙරේ. අසත්පුරුෂයන් සමග බොහෝවූද එක්වීම එසේ නොකෙරේ.

41 "සත්පුරුෂයන් සමගම එක්වන්නේය. සත්පුරුෂයන් සමගම මිත්‍ර සන්ථවය කරන්නේය. බුද්ධාදී සත් පුරුෂයන්ගේ සත්තිස් බොධිපාක්ෂික ධර්ම නම්වූ සද්ධර්මය දැන ශ්‍රෙෂ්ඨයෙක්වේ. ලාමකවූවෙක් නොවන්නේය.

42 "ඉතා විසිතුරු කරණලද රජුන්ට නැගීමට සුදුසුවූ රථයෝ ඒකාන්තයෙන් දිරත්. තවද මේ ශරීරයද ජරාවට පැමිණේ සත්පුරුෂයන්ගේ ධර්මය වනාහි ජරාවට නො පැමිණේ. බුද්ධාදී සත්පුරුෂයෝ ඒකාන්තයෙන් උතුම්වූ නිවන ප්‍රකාශකෙරෙත්.

43 "මහරජ, අහසද දුරවේ. පොළොවද දුරවේ. සමුද්‍රයා ගේ ඒ පරතෙරද දුරවේයයි කීහ සත්පුරුෂයන්ගේ ධර්මයන් අසත්පුරුෂයන්ගේ ධර්මයද ඒකාන්තයෙන් ඊටවඩා ඉතාදුරයයි කියත්යයි" කීයේය.

44 "එම්බා බ්‍රාහ්මණය, මේ ගාථාවෝ දහසක් වටින්නාහු වෙත්. මේ ගාථාවෝ සියයකට සුදුසු නොවෙත්. එහෙයින් නුඹ සාරදහසක් වහා ගනුවයි" සුතසෝම රජතෙම කීයේය.

45 "එම්බා පුත්‍රවූ සුතසෝමය අසූවක් දීමට සුදුසුවූ ගාථාවෝද, අනූවක් දීමට සුදුසුවූ ගාථාවෝද, සියයක් දීමට සුදුසුවූ ගාථාවෝද ඇත්තාහුයයි තමා විසින්ම දැනගනුව, දහසක් දීමට සුදුසුවූ ගාථාවෝ නම් කොහි ඇද්දැයි" පියරජ ඇසීය.

46 "පියාණෙනි, මම තමන්ගේ ශ්‍රැතය වැඩීම කැමති වෙමි. ශාන්තවූ සත්පුරුෂයෝද භජනය කරන්නාහු නම් කැමැත්තෙමි. ගංගාවලින් තෘප්තියට නොපැමිණෙන්නාවූ මහාසාගරය මෙන් මම සුභාසිතය ඇසීමෙන් තෘප්තියට නොපැමිණෙමි.

47 "යම්සේ ගින්න තෘණ හා කාෂ්ට දවමින් තෘප්තියට නොපැමිණේද, සාගරය හෝ ගංගා ජලයෙන් තෘප්තියට නොපැමිණේද, රාජශ්‍රෙෂ්ඨය, මෙපරිද්දෙන්ම ඒ පණ්ඩිතයෝ සුභාසිතයෙන් අසා තෘප්තියට නොපැමිණෙත්.

48 "ජනාධිපතිය, යම් කලෙක්හි මම ස්වකීය දාසයෙකුගේ අර්ථවත්වූ ගාථාවක් අසම්ද, එයම සකස්කොට අසමි පියාණෙනි, ධර්මයන්හි මාගේ තෘප්තියක් නැත්තේයයි" සුතසෝම රජතෙම කීයේය.

49 "පියාණෙනි, ධනය සහිතවූ බලවාහන සහිතවූ ආභරණ සහිතවූ සියලු කැමැති සම්පත් ඇත්තාවූ ඔබගේ මේ රාජ්‍යය බාරගනුව. කුමකට කාම සම්පත් හේතුකොට ගෙණ මට පරිභව කරන්නෙහිද? මම පෝරිසාදයා වෙතට යමියි" කීයේය.

50 "එම්බා පුත්‍රය, ඇතරුවෝද, රථසේනාවෝද, පාබල සෙනගද, අශ්වාරෝහකයෝද යම් ධනුර්ධරයෝ වෙත්නම් ඔව්හුද යන මේ සියල්ලෝම තමන්ගේ ආරක්ෂාව පිණිසවෙත්. එහෙයින් සේනාව යොදවමු. සතුරා නසමුයි" පියරජතෙම කීයේය.

51 "යම්හෙයකින් ජීවත්වූ මා අල්වාගෙණ හැරදැමීද එහෙයින් පෝරිසාදතෙම ඉතා දුෂ්කරවූවක් කෙළේය. මහරජ,

ඒ එබඳු පළමු උපකාරය සිහිකරන්නාවූ මම ඔහුට කෙසේ නම් ද්‍රෝහ කෙරෙම්දැයි" සුතසෝමරජ ඇසීය.

52 හෙතෙම පියාටද, මව්ටද, වැඳ නියම්ගම් වැස්සන්ටද බලසෙනගටද අනුශාසනාකොට සත්‍ය වචන ඇත්තෝ සත්‍ය වචනය රකිමින් ඒ පෝරිසාදයා යම් තැනෙක්හිද හෙතෙම එතනට ගියේය.

53 "ස්වකීය රටෙහි රජබැව්හි සිටියාවූ මා විසින් බ්‍රාහ්මණයෙකු සමග යම් පොරොන්දුවක්වීද, ඒ පොරොන්දුව ඒ බ්‍රාහ්මණයාටද සත්‍ය වචනය රකිමින් නැවත මෙහි ආවෙමි. එම්බා පොරිසාදය, මා මරා දේවතාවාට යාගය හෝ කරව. මාගේ මස් හෝ අනුභව කරවයි" සුතසෝම රජතෙම කීයේය.

54 "ඔබ කෑම මට පසුවද හැකිය. මේ සෑයද තවම දුම් සහිතය දුම් නැතිවූ කල්හි පිසන ලද්ද, මනාව පැසුනේවේ ඒතාක් මම සතාරහ නම් ගාථාවන් අසමියි" පෝරිසාදයා කීයේය.

55 "එම්බා පෝරිසාදය, නුඹ අධාර්මිකවූ මිනී මස් කන්නෙක් වෙහිය. උදර පෝෂණය හේතුකොටගෙණ රාජ්‍යයෙන්ද ගිලිහුනෙහිය මේ ගාථාවෝද නවලෝකොත්තර ධර්මයයි කියත්. ධර්මයද අධර්මයද කොතැන්හි සම වේද,

56 "රෞද්‍රවූ නිතර ලේ වැකුණු අත් ඇති අධාර්මිකවූ නුඹගේ සත්‍යයක් නැත ධර්මයෙක් කොයින්ද, මේ ධර්මය ඇසීමෙන් කුමක් කරන්නෙහිදැයි" සුතසෝම රජ ඇසීය.

57 "යමෙක් මාංශය හේතුකොට ගෙණ මුව දඩයමෙහි හැසිරෙන්නේද, යමෙක් හෝ තමන් හේතුකොට ගෙණ පුරුෂයෙකු නසන්නේද, ඒ දෙදෙනම පරලොව සමාන වෙත්. කුමක් හෙයින් ඔබ මා අධාර්මිකයෙකු යයි කියන්නෙහි" දැයි පෝරිසාදයා ඇසීය.

58 "ක්ෂත්‍රිය ධර්මය දන්නාවූ ක්ෂත්‍රියයා විසින් ඇතුන් ආදී පස් දෙනෙකුගේ මස් කෑ යුතුවෙත්. නොහොත් නිය පසක් ඇත්තාවූ සතුන් පස්දෙනෙක් කෑ යුතුය මහරජ නුඹ නොකෑයුතු මිනීමස් කෑයෙහිය. එහෙයින් නුඹ අධාර්මිකයෙක් වෙහියයි සුතසෝම රජ කීයේය.

**59** "කාම සම්පත් කැමතිවන්නාවූ රජතුමනි, නුඹ පෝරිසාදයාවූ මා අතින් මිදී ස්වකීය භවනයට ගොස් සතුරා අතට නැවත ආයෙහිය. එබැවින් මහරජ, ඔබ ක්ෂත්‍රිය ධර්ම නම්වූ නීති ශාස්ත්‍රයෙහි දක්ෂයෙක් නොවෙහියයි" පෝරිසාදයා කීයේය.

**60** "එම්බා පෝරිසාදය, යම් කෙනෙක් ක්ෂත්‍රිය ධර්මයෙහි දක්ෂ වෙද්ද, ඔහු බොහෝසෙයින් නිරිසත්තු වෙත්. එහෙයින් මම ක්ෂත්‍රිය ධර්මය හැරදමා සත්‍ය වචනය රකිමින් නැවත මෙහි ආයෙමි. මා මරා යාගය හෝ කරව, මාංශය හෝ අනුභව කරවයි සුතසෝම රජ කීයේය.

**61** "යහළු සුතසෝම රජ, වාසයට සුදුසු ප්‍රාසාදද පෘථිවියද ගවයන් හා අශ්වයන්ද කාම වස්තුවූ ස්ත්‍රීන්ද කශී සලු හා රන්වන් සඳුන්ද යන සියල්ල එහිදී ඔබ ස්වාමිභාවයෙන් ලබන්නෙහිය. මේ සත්‍යයෙන් කුමන ආනිශංසයක් දක්නෙහිදැයි" පෝරිසාද ඇසීය.

**62** "පෘථිවියෙහි මේ යම්කිසි රසයෝ වෙද්ද, ඒ රස අතුරෙන් සත්‍යය ඉතා මිහිරි රසය වේ. යම් හෙයකින් සත්‍යයෙහි පිහිටියාවූ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ජාති මරණයයි කියන ලද සංසාරයාගේ පරතෙරට පැමිණෙද්ද, එහෙයිනැයි" සුතසෝම රජ කීයේය

**63** "කාම සම්පත් කැමති වන්නාවූ මහරජ, පෝරිසාද නම් මා අතින් මිදුනාවූ නුඹ ස්වකීය භවනයට ගොස් නැවත සතුරා අතට ආයෙහිය. ජනාධිපතිය, සත්‍යවාදීවූ නුඹ නොසැඟවුනු සිත් ඇත්තේම වෙහිය. නුඹට මරණ භයක් නැත්තේයයි" සිතමියි පෝරිසාද කීයේය.

**60** "එම්බා පෝරිසාදය, අනෙකප්‍රකාරවූ කුශල ධර්මයෝ මා විසින් කරණ ලද්දාහ. ප්‍රශස්තවූ මහත්වූ දානාදී යම් යාග කෙනෙක් වෙත්නම් ඔව්හුද පවත්වන ලද්දාහ. පරලොවට යන්නාවූ මාර්ගය පිරිසිදු කරණලදී. ධර්මයෙහි පිහිටියාවූ කවර නම් මා වැන්නෙක් මරණයට බිය වන්නේද?

**61** "අනේකප්‍රකාරවූ යහපත් කටයුතු මා විසින් කරණ ලද්දාහ. පණ්ඩිතයන් විසින් පසස්නා ලද්දාවූ මහත්වූ දානාදී

යම් යාගයෝ වෙත්නම් ඔව්හුද මා විසින් පවත්වන ලද්දාහ. එහෙයින් පසුතැවීමක් නැතිව මම පරලොවට යන්නෙමි. පෝරිසාදය, මා මරා යාගය කරව, මා හෝ අනුභව කරව,

62 "පියාද මවද යන දෙදෙනා මා විසින් උපස්ථාන කරණ ලදහ. මා විසින් දැහැමින් රාජ්‍යය අනුශාසනා කරණ ලදී. එහෙයින් පරලොවට යන මාර්ගය මා විසින් පිරිසිදු කරණ ලදී ධර්මයෙහි පිහිටියාවූ මාවැනි කවරෙක් නම් මරණයට බිය වන්නේද?

63 "පියාද මවද යන දෙදෙනා මා විසින් උපස්ථාන කරණලදහ. මා විසින් දැහැමින් රාජ්‍යය අනුශාසනා කරණලදී. එහෙයින් පසුතැවිල්ලක් නැතිව පරලොවට යන්නෙමි. පෝරිසාදය, මා මරා යාගය හෝ කරව, අනුභවය හෝ කරව,

64 "නෑයන් කෙරෙහිද මිත්‍රයන් කෙරෙහිද කටයුතු මා විසින් කරණ ලද්දාහ. මා විසින් දැහැමින් රාජ්‍යය අනුශාසණා කරණලදී. පරලොවට යන මාර්ගය පිරිසිදු කරණ ලදී. එහෙයින් ධර්මයෙහි පිහිටියාවූ මාවැනි කවරෙක් නම් මරණයට බිය වන්නේද?

65 "නෑයන් කෙරෙහිද මිතුරන් කෙරෙහිද කටයුතු දෑ මා විසින් කරණලද්දාහ. මා විසින් දැහැමින් රාජ්‍යය අනුශාසනා කරණලදී. එහෙයින් පසුතැවීමක් නැතිව මම පරලොවට යන්නෙමි. පෝරිසාදය, මා මරා යාගය හෝ කරව, අනුභව කිරීම හෝ කරව,

66 "නොයෙක් ආකාරයෙන් බොහෝදෙනාට මා විසින් දානය දෙනලදී. ශ්‍රමණයෝද බ්‍රාහ්මණයෝද සන්තර්පනය කරණ ලදහ. පරලොවට යන්නාවූ මාර්ගය පිරිසිදු කරණලදී. එහෙයින් ධර්මයෙහි පිහිටියාවූ මාවැනි කවරෙක් නම් මරණයට බිය වන්නේද?

67 "නොයෙක් ආකාරයෙන් බොහෝදෙනාට මා විසින් දානය දෙන ලදී. ශ්‍රමණයෝද බ්‍රාහ්මණයෝද සතුටු කරණ ලදහ. පසුතැවීමක් නැතිව පරලොවට යන්නෙමි. පෝරිසාදය,

මා මරා යාගය හෝ කරව, මස් කෑම හෝ කරවයි” සුතසෝම රජතෙම කීයේය.

68 “යමෙක් ඔබ වැනි සත්‍යවාදියෙකු අනුභව කරන්නේ නම් ඒ පුරුෂතෙම සත්වයන්ට හලාහළ විෂවූ උග්‍ර තේජස් ඇත්තාවූ එහෙයින්ම දිළිසෙන්නාවූ සර්පයෙකු ග්‍රීවයෙන් අල්වාගන්නේය. ඔහුගේ මුදුනද සත් කඩක්ව පැලෙන්නේ යයි” පෝරිසාද කීයේය.

69 “යහළු සුතසෝම රජ, මනුෂ්‍යයෝ ධර්මය අසා යහපතද අයහපතද දැනගනිත්. ඒ ගාථාවන් අසා මාගේද කුශල ධර්මයෙහි සිත ඇලේනම් ඉතා යෙහෙකැයිද” කීයේය.

70 “සුතසෝම නම් රජ, එක වරක්ම සත්පුරුෂයන් සමග සමාගමය වේද ඒ එක්වීම ඔහු ආරක්ෂා කෙරේ. අසත්පුරුෂයන් සමග බොහෝසෙයින් කරණලද සංගමයද එසේ නොකෙරේ.

71 “සත්පුරුෂයන් සමගම එක්ව වාසය කරන්නේය. සත්පුරුෂයන් සමග මිත්‍ර සන්ථවය කරන්නේය. බුද්ධාදී සත්පුරුෂයන්ගේ සත්තිස් බෝධිපාක්ෂික ධර්මය දැන ශ්‍රෙෂ්ඨයෙක් වන්නේය. ලාමකවූවෙක් නොවන්නේය.

72 “ඒකාන්තයෙන් ඉතා විසිතුරු කරණලද රජුන්ට නැගීමට සුදුසුවූ රථයෝද දිරත්. තවද මේ ශරීරයද ජරාවට පැමිණේ. සත්පුරුෂයන්ගේ ධර්මය වනාහි ජරාවට නොපැමිණේ. සත්පුරුෂයෝ ඒකාන්තයෙන් උතුම්වූ ධර්මය ප්‍රකාශ කෙරෙත්.

73 “අහසද දුරවේ. පොළොවද දුරවේ. සමුද්‍රයාගේ ඒ පරතෙරද දුරවේමයයි කීහ. මහරජ, සත්පුරුෂයන්ගේ ධර්මයද අසත්පුරුෂයන්ගේ ධර්මයද ඊටත් වඩා ඒකාන්තයෙන් ඉතා දුරමය කියත් යයි” කීයේය.

74 “මහරජ, ඔබගේ මනාකොට කියන ලද්දාවූ යහපත් වචන වලින් යුක්තවූ අර්ථවත්වූ මේ ගාථාවන් අසා හටගත් සන්තෝෂ ඇති සතුටුවූ මනා සිත් ඇති ප්‍රීතිමත්වූ මම, යහළුව, ඔබට වරසතරක්දෙමියි” පෝරිසාද කීයේය.

75 "එම්බා ලාමක ස්වභාව ඇත්ත, යම්බඳුවූ නුඹ තමන්ගේ මරණය නොදන්නෙහිද, තමන්ට හිතවූද අහිතවූද දෙය නොදන්නෙහිද අපායට යන්නාවූ කර්මයද ස්වර්ගයට යන්නාවූ කර්මයද නොදන්නෙහිද, මිනීමස් රශයෙහි ගිජුවූයේ දුශ්චරිතයෙහි ඇතුළත්වූයේ නුඹ කිනම් වරයක් දෙන්නෙහිද?

76 "මමද තට වරයක් දෙවයි කියන්නෙමි තෝද වරයක්දී ආපසු එය ගන්නේය. තමන් විසින් දැක්කහැකිවූ විරුද්ධවාදියක්වූ මේ කලහයට කවර නම් නුවණැත්තෙක් දැනගෙණ පැමිණෙන්නේදැයි" සුතසෝමරජ ඇසීය.

77 "යම්වරයක්දී ආපසුගන්නේ නම් සත්වතෙම ඒ වරය දෙන්ට සුදුසු නොවෙයි. යහළුව, නොපසුබටව වරය ගණු. ප්‍රාණය හැර දමාද එය දෙන්නෙම්මයයි" පෝරිසාද කීයේය.

78 "ආචාරයෙන් ආයර්‍ය්‍යවූවෙකුට එබඳු ආයර්‍ය්‍යයෙකු හා මිත්‍රධර්මය ගැලපේ. ප්‍රඥා ඇත්තෙකුට ඥාණවන්තයෙකු හා මිත්‍රකම ගැලපේ. අවුරුදු සියයක් නිරෝගවූ ඔබ දක්නෙමි යන වරයන්ගෙන් මේ පළමුවෙනි වරය ඉල්වමියි" සුතසෝම රජ කීයේය.

79 "ආචාරයෙන් ආයර්‍ය්‍යවූවෙකුගේ එබඳු ආයර්‍ය්‍යයෙකු හා මිත්‍ර ධර්මය සුදුසුවේ. ප්‍රඥා ඇත්තෙකුගේ ප්‍රඥා ඇත්තෙකු හා මිත්‍ර ධර්මය සුදුසුවේ. අවුරුදු සියයක් නිරෝගවූ මා දක්නෙහිය යන වරයන්ගෙන් මේ පළමුවෙනි වරය දෙමියි" පෝරිසාද කීයේය.

80 "මෙහි මස්තකයෙහි අභිෂෙක කරණලද්දාවූ භූමි පාලයයි කරණලද නම් ඇති යම් ක්ෂත්‍රිය කෙනෙක් වෙද්ද, එබඳු රජුන් අනුභව නොකරවයි වරයන්ගෙන් මේ දෙවෙනි වරය ඉල්වමියි" සුතසෝම රජ කීයේය.

81 "මෙහි මුදුනෙහි අභිෂෙක කරණලද්දාවූ භූමි පාලයයි කරණලද නම් ඇත්තාවූ යම් ක්ෂත්‍රිය කෙනෙක් වෙද්ද, එබඳු රජුන් අනුභව නොකරමි, යන මේ දෙවෙනි වරය දෙමියි" පෝරිසාද කීයේය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

82 "ඔබ විසින් ගන්නාලද්දාවූ අතුල්තලවලින් අව්නන ලද්දාවූ කඳුළු පිරුණු මුහුණු ඇතිව හඬන්නාවූ සියයකට වැඩි රජදරුවෝ මෙහි වෙත්. ඒ රජදරුවන් ස්වකීය රාජ්‍යයෙහි පිළියෙළ කරව, යන මේ තුන්වෙනි වරය ඉල්වමියි" සුතසෝම රජ කීයේය.

83 "මා විසින් ගන්නාලද්දාවූ අතුල්තලවලින් අව්නන ලද්දාවූ කඳුළු පිරුණු මුහුණු ඇතිව හඬන්නාවූ සියයකට අධික රජදරුවෝ මෙහි වෙත්. ඔවුන් ස්වකීය රාජ්‍යය හා පිළියෙල කරමි යන මේ තුන්වෙනිවරය දෙමියි" පෝරිසාද කීයේය.

84 "එම්බා පෝරිසාද රජ, ඔබ විසින් රාජ්‍යය සිදුරු කරණලදී. භයින් කම්පාකරණලදී. බොහෝ මිනිස්සු සැඟවීම පිණිස ලෙන්වලට ඇතුල්වූහ. මිනීමස්කෑම හැර දමවයි මේ සතරවෙනි වරය ඉල්වමියි" සුතසෝමරජ කීයේය.

85 "යහළු සුතසෝම රජ, ඒකාන්තයෙන්ම ඒ ආහාරය මට මනාපවේ. මේ හේතුකොට ගෙණම වනයට වැදුනෙමියි ඒ මම කෙසේනම් මෙයින් වලකින්නෙම්ද? වරයන්ගෙන් සතරවෙනි කොට අනික් වරයක් ඉල්වවයි" පෝරිසාද කීයේය.

86 "මහරජ, තා වැන්නෙක් ඒකාන්තයෙන් මෙය මට ප්‍රිය යයි ආත්මය හැරදමා ප්‍රියවස්තූන් සේවනය නොකෙරේද, මිනිසාට වනාහි අන්‍යවූ ප්‍රිය වස්තුවට වඩා ආත්මයම උතුම්වේ. රැස්කරණලද අර්ථ ඇත්තහු විසින් පසුවද ප්‍රියවූවස්තු ලැබිය හැකිවෙත්යයි" සුතසෝම රජ කීයේය.

87 "යහළු සුතසෝම නම් රජ, මිනීමස මට ප්‍රියයයි ඔබද දන්නෙහිය. එය වළක්වන්ට නොහැක්කෙමි. ඔබ අන් වරයක් ගණුවයි" පෝරිසාද කීයේය.

88 "යහළු පෝරිසාද රජ, යමෙක් මෙය මට ප්‍රියයයි ප්‍රියවූවක් අනුව කැමතිවන්නේ ආත්මය හැරදමා ප්‍රිය වස්තූන් සේවනය කෙරේද, හෙතෙම විෂ මිශ්‍රවූ සුරා බඳුනක් සුරාවෙහි ලොල්වූවෙකුමෙන් ඒ කර්මයෙන්ම පරලොව දුක් ඇත්තෙක් වේ.

89 "යහළු පෝරිසාදය, මේ ලෝකයෙහි යමෙක් වනාහි නුවණින් සළකා අධර්මයෙන් යුත් ප්‍රිය වස්තූන් හැර දුකසේ නමුත් ආයර්‍යධර්මය සේවනය කෙරේද හෙතෙම දුක් ඇත්තේම ඖෂධ පානයකොට මෙන් ඒ කර්මයෙන්ම පරලොව සුව ඇත්තෙක්වේයයි" සුතසෝම රජ කීයේය.

90 "යහළු සුතසෝම රජ මම පියාද මව්ද මන වඩන්නාවූ පඤ්චකාම සම්පත්ද හැරදමා මේ මිනීමස හේතු කොට ගෙණ වනයට වැදුනේවෙමි. කුමකැයි මම ඔබට ඒවරය දෙම්දැයි" පෝරිසාද ඇසීය.

91 "යහළු පෝරිසාදය, පණ්ඩිතයෝ එකක් කියා නැවත එය වලහමින් දෙගුණකොට වචනය නොකියත්. සත්පුරුෂයෝ සත්‍යවූ ප්‍රතිඥා ඇත්තෝම වෙත්. යහළුව වර ඉල්වවයි මෙසේ මට කීයේය. එහෙයින් යමක් නුඹ මෙසේ කීයේද, දැන් ඔබගේ ඒ කීම සංසන්දනය නොවේයයි" සුතසෝම රජ කීයේය.

92 "යහළු සුතසෝම රජ, මිනීමස් හේතුකොට ගෙණ අපුන්‍ය ලාභයටද අයසසටද අපකීර්තියටද බොහෝවූ පාපයටද දුශ්චරිතයටද දුකටද පැමිණියෙමි. ඒවරය ඔබට කෙසේ නම් මම දෙන්නෙම්දැයි" පෝරිසාදයා ඇසීය.

93 "යහළු පෝරිසාදය, යම් වරයකුත් දී නැවත ගන්නේ නම් සත්වතෙම එබඳුවරය දෙන්ට සුදුසු නොවේ. 'ප්‍රාණය හැරද දෙන්නෙම්මය නොපසුබටව වර ගනීවායි' කීයෙහිය.

94 "සත්පුරුෂයෝ ප්‍රාණය හැරදමත්, ධර්මයද හැර නොදමත්. සත්පුරුෂයෝ සත්‍යවූ ප්‍රතිඥා ඇත්තාහුද වෙත්. යහපත් රාජශ්‍රෙෂ්ඨය මට වරයදී වහා නැවත නොගනුව හෙවත් වහා මට වරය දෙව, මේ සත්‍ය කාරණයෙන් සම්පාදනය වෙව

95 "යහළු පෝරිසාදය, යම් නුවණැත්තෙක් වනාහි ශරීරාවයව හේතුකොට ගෙණ ධනය හැරදමන්නේද, ජීවිතය රකිමින් ශරීරාවයවය හැරදමන්නේද, ඒ මනුෂ්‍ය තෙම ධර්මය සිහිකරමින් ශරීරාවයද ධනයද ජීවිතයද යන සියල්ලම හැරදමන්නේයයි" කීයේය.

96 "පුරුෂතෙම යමෙකුගෙන් කුශලා කුශල ධර්මය දැනගන්නේද යම් සත්පුරුෂ කෙනෙකුත් මොහුගේ සැකය දුරුකෙරේද්ද, ඒ ගුරුවරයා වනාහි මේ පුද්ගලයාට පිහිටද උතුම් ආරක්ෂාවද වේ. නුවණැත්තේ ඒ ඇඳුරු පුද්ගලයා සමග මිත්‍රකම නොනසන්නේයයි" සුතසෝම රජ කීයේය.

97 "සුතසොම රජතුමනි, ඒකාන්තයෙන්ම ඒ මිනීමස් කෑම මට මනාපවේ. මේ හේතුකොටගෙණම මම වනයට ඇතුල්වූයෙමි. ඉදින් මේ සඳහා මගෙන් ඉල්වන්නෙහි නම් යහළුව, මේ වරයද ඔබට දෙමියි" පෝරිසාද කීයේය.

98 "යහළු සුතසොම රජ ඔබ මාගේ අනුශාසකයාද වෙහිය. මාගේ යහළුවාද වෙහිය. ඔබගේ කීමද මම කෙළෙමි. යහළුව ඔබද මගේකීම කරව, අපි දෙදෙනම ගොස් ඒ රජ දරුවන් මුදන්නෙමුයි" පෝරිසාද කීයේය.

99 "යහළු පෝරිසාදය, ඔබට මම අනුශාසකයාද වෙමි. ඔබගේ යහළුවාදවෙමි. මාගේ කීමද ඔබ කෙළෙහිය. යහළුව මමද ඔබගේ වචනය කරමි. දෙදෙනම එක්ව ගොස් ඒ රජුන් මුදමුයි" සුතසෝම රජ කීයේය.

100 "පින්වත් රජුනි, තෙපි කල්මාසපාද නම්වූ පෝරිසාදය විසින් වෙහෙසනලද්දාහු අතුල් තලවලින් අව්නන ලද්දාහු කඳුළු පිරුණු මුහුණු ඇතිව අඬන්නෝවහුය. කිසිකලෙකත් මේ රජුට ද්‍රෝහ නොකරව් මෙසේ සත්‍යවූ ප්‍රතිඥාවක් මට දෙව්යයි" සුතසෝම රජ කීයේය.

101 "පින්වත් සුතසෝම නම් රජතුමනි, තෙපි කල්මාස පාදයා විසින් පෙළෙන ලද්දෝ අතුල්තලවලින් අව්නන ලද්දෝ කඳුළු පිරුණු මුහුණු ඇතිව හඬන්නෝවෙමු. කිසි කලෙකත් අපි මේ රජුට ද්‍රොහ නොකරමු. මේ සත්‍යවූ ප්‍රතිඥාව ඔබට දෙමුයි ඒ රජවරුකීහ.

102 "යම්සේ පියා හෝ තවද මව හෝ දරුවන්ට අනුකම්පා ඇත්තෝ වැඩ කැමැත්තෝ වෙද්ද, මේ රජ තෙමේද තොපට මෙපරිද්දෙන්ම වේවා තෙපිද පුත්‍රයන්මෙන් වව්යයි" සුතසෝම රජ කීයේය.

103 "යම්සේ පියා හෝ තවද මව හෝ දරුවන්ට අනුකම්පා ඇත්තෝ වැඩ කැමැත්තෝ වෙද්ද මේ රජ තෙමේද අපට මෙපරිද්දෙන්ම වේවා, අපිද මොහුට පුත්‍රයන් මෙන් වන්නෙමුයි" ඒ රජවරු ප්‍රතිඥා දුන්හ.

104 "යහළු පෝරිසාදය, අරක්කැමියන් විසින් දුරුම්රිස් ආදියෙන් රඳනාලද මනාව කරණලද මනාකොට නිමවනලද සිව්පාසතුන් පිළිබඳවූද පක්ෂීන් පිළිබඳවූද මාංශය සහිත භෝජනය ශක්‍රතෙම සුධාභෝජනය මෙන් අනුභව කොට දැන් එය හැරදමා කෙසේනම් හුදකළාව මේ වනයෙහි සිත් අලවන්නෙහිද?

105 "රන්වන් රැසින් බබළන්නාවූ සිහින් මධ්‍ය ප්‍රදෙශ ඇති සැරසුනාවූ ඒ රාජස්ත්‍රීහු හාත්පස පිරිවරාගෙණ දෙව්ලොව දිව්‍යප්සරාවෝ සක්දෙව් රජහු මෙන් ඔබ සතුටු කළාහුය. දැන් ඔවුන් හැර කෙසේ නම් හුදකළාවූ මේ වනයෙහි සිත් අලවන්නෙහිද?

106 "රතුකොට්ට ඇති බොහෝ එළුලොම් ඇතිරි ඇති පවිත්‍රවූ සියලු ඇතිරි අතුරණලද මනාව පිළියෙළ කළාවූ යහනාව මැද සුවසේ සයනය කොට දැන් එය හැර කෙසේ නම් හුදකලාව මේ වනයෙහි ඇලෙන්නෙහිද?

107 "රාත්‍රි කාලයෙහි පානිස්සරය හෙවත් අත්තල ගැසීම්ද කුම්භථූනය හෙවත් කලපිඹීමද තවද ඒකාන්තයෙන් පවත්වනලද පුරුෂයන් නැත්තාවූ තූර්‍ය්‍ය විශෙෂය බොහෝවූ මනාකොට ගායනා කරණලද්දද මනාකොට වාදනය කරණ ලද්දද, හැරදමා දැන් කෙසේනම් හුදකලාව මේ වනයෙහි ඇලෙන්නෙහිද?

108 "උද්‍යානංගයන්ගෙන් සම්පූර්ණවූ බොහෝමල් වර්ග ඇති මිගාචිර නම් උයනින්යුත් පුරයවූ අශ්වයන්ගෙන්ද ඇතුන්ගෙන්ද රථවලින්ද යුක්තවූ ඉතා සිත්කළුවූ නගරය හැරදමා, දැන් කෙසේ නම් හුදකලාව මේ වනයෙහි ඇලෙන්නෙහිදැයි" (සුතසෝම රජ පෝරිසාද රජුට සිය නුවරට යන්ට කථා කෙළේය.)

109 "යම්සේ කරුවල පක්ෂයෙහි චන්ද්‍රතෙම දවසක් පාසා පිරිහෙන්නේමවේද, මහරජ එසේම අසත් පුරුෂයන්ගේ සමාගමය කරුවල පක්ෂයෙහි චන්ද්‍රයාට බඳුවේ.

110 "යම්සේ අධම පුරුෂයෙක්වූ රසක නම් අරක්කැමියා නිසා මම යම් කර්මයකින් දුර්ගතියට යෙම්ද එබඳු පාප කර්මය කෙළෙම්ද, (එහෙයිනි)

111 "යම්සේ ශුක්ල පක්ෂයෙහිවූ චන්ද්‍රතෙම දවසක් පාසා වැඩෙන්නේම වේද මහරජ එමෙන් සත්පුරුෂයන්ගේ සමාගමය ශුක්ල පක්ෂයෙහි චන්ද්‍රයාට බඳු උපමා ඇත්තේවේ.

112 "සුතසෝම නම් රජතුමනි, යම්සේ මම ඔබ නිසා යම් කර්මයකින් සුගතියටයෙම්ද, එබඳු කුශල කර්මය කරන්නෙම්ද එහෙයිනැයි" දැනගුනව,

113 "ජනාධිපතිය, යම්සේ ගොඩබිම වර්ෂාකළ ජලය බොහෝකල් පැවැත්මට නුසුදුසු බොහෝකල් නොතිබෙන්නක්වේද, මෙපරිද්දෙන්ම ඒකාන්තයෙන් අසත් පුරුෂයන්ගේ සමාගමය ගොඩබිම ජලය මෙන් බොහෝකල් පැවැත්මට නුසුදුසුවේ.

114 "නරවීර ශ්‍රෙෂ්ඨවූ මහරජ, යම්සේ සමුද්‍රයෙහි වර්ෂා කළ ජලය බොහෝ කල්පවත්නේවේද, මෙපරිද්දෙන්ම සත් පුරුෂයන්ගේ සමාගමය සමුද්‍රයෙහි ජලය මෙන් ඒකාන්තයෙන් බොහෝකල් පවත්නේවේ.

115 "සත්පුරුෂයන්ගේ සමාගමය ඉක්ම නොයන්නේ වේ, යම්තාක් ඒ ජීවත්ව සිටින්නේද, ඒතාක් එසේම පවතී. අසත්පුරුෂයන්ගේ සමාගමය වනාහි වහා ඉවත්වූයේ. එහෙයින් සත්පුරුෂයන්ගේ ධර්මයතෙම අසත්පුරුෂයන් ගෙන් දුරුවේයයි" කීයේය.

116 "යම්රජෙක් නොදිනියයුතු මව්පියන් දිනාද, හෙතෙම රජෙක් නොවෙයි. යමෙක් යහළුවා දිනාද, හෙතෙම යහළුවෙක් නොවේ. යම්භායයාීවක් ස්වාමියාට බිය නොවේද, ඕතොමෝ

භාර්‍ය්‍යාවක් නොවේ. යම් පුත්‍රයෝ ජරාවට ගියාවූ මව්පියන් පෝෂණය නොකෙරෙද්ද, ඔව්හු පුත්‍රයෝ නම් නොවෙත්.

117 "යම් සභාවෙක්හි පණ්ඩිතයෝ නොවෙද්ද, ඕතොමෝ සභානම් නොවේ. යම්කෙනෙක් ස්වභාව ධර්මය නොකියද්ද, ඔව්හු පණ්ඩිතයෝ නොවෙත්. රාගයද ද්වෙෂයද මෝහයද හැර ධර්මය කියන්නාහුම පණ්ඩිතයෝ නම්වෙත්.

118 "කථා නොකරන්නාහු බාලයන් හා මිශ්‍රවූවහු පණ්ඩිතයයි නොදනිත්. අමෘතපදය දෙශනාකරන්නාවූ කථා කරන්නහුම පණ්ඩිතයායයි දනිත්.

119 "පණ්ඩිත පුරුෂතෙමේ ධර්මය කියන්නේය. ධර්මය බබුළුවන්නේය. ඍෂීන්ගේ ධ්වජය අල්වා ගන්නේය. බුද්ධාදී ඍෂිවරයෝ සුභාෂිතය ධ්වජකොට ගණිත්. ධර්මය වනාහි ඍෂිවරයන්ගේ ධ්වජය වේයයි" වදාළේය.

---

## 10 මහානිපාතය

537 **මූගපක්ඛජාතකයː-** 1 "පුත තේමිය කුමාරය, පණ්ඩිත බව ප්‍රකාශ නොකරව, සියලු සතුන්ට බාලයයි සම්මතවූවෙක් වෙව, සියලු ජනතෙමේ තා කාලකණ්ණියයි බැහැර කෙරේවා. මෙසේ ඇති කල්හි තොපට වැඩෙක්වන්නේ යයි" ඡත්‍රයෙහි අධිගෘහිත දෙවතාතොමෝ කීය.

2 "එම්බා දෙවතාවෙනි, මට යමක් කියන්නෙහිද, මම ඔබගේ ඒ වචනය කරමි. මෑණියෙනි, ඔබ මට වැඩ කැමැත්තෙහිය. දෙවතාවෙනි ඔබ මට හිත කැමති තැනැත්තියක් වෙහියයි" කුමාරතෙම කීයේය.

3 "එම්බා සාරථිය, කුමක් සඳහා යුහුසුළුවම වළක් සාරන්නෙහිද, යහළුව, විචාරණලද්දේ මට කියව, මෙවලින් කුමක් කරන්නෙහිදැයි" තේමිය කුමරු ඇසීය.

4 "අප රජහුගේ ගොළුවූද පිළුවූද සිතිවිලි නැත්තාවූ පුත්‍රයෙක් උපන්නේවේ. ඒ මම රජහු විසින් මාගේ පුත්‍රයා වනයෙහි වළලවයි අණලද්දේ වෙමියි" රියැදුරා කීයේය.

5 “එම්බා සාරථිය, මම බිහිරිනොවෙමි. ගොළුවෙක්ද නොවෙමි. කොරෙක්ද නොවෙමි. පිලෙක්ද නොවෙමි. ඉදින් තෝ මා වනයෙහි වළලන්නෙහි නම් අධර්මයක් කරන්නෙහිය.

6 “මාගේ කලවාදෙකද අත්දෙකද බළව, මාගේ කථාවද අසව, එම්බා සාරථිය, ඉදින් තෝ මාවනයෙහි වළලන්නෙහිනම් අධර්මයක් කරන්නෙහියයි” තේමිය කුමරු කීයේය.

7 “ඔබවහන්සේ දෙවතාවෙක්වෙහිද, ගන්ධර්වයෙක් වෙහිද, නොහොත් පුරින්දද නම් ශක්‍රයා වෙහිද, ඔබ කවරෙක් හෝ වෙහිද, කවරෙකුගේ පුත්‍රයෙක් හෝ වෙහිද, අපි ඔබ කෙසේ දනිමුදැයි” සාරථීතෙම ඇසීය.

8 “මම දෙවියෙක් නොවෙමි. ගන්ධර්වයෙක්ද නොවෙමි. පුරින්දද නම් ශක්‍රයාද නොවෙමි. යමෙකු වලෙහි වළලන්නෙහි නම් කශීරජහුගේ පුත්‍රවූ ඒ මම වෙමි.

9 “එම්බා සාරථිය, තෝ යමෙකු නිසා ජීවත් වෙහිද, මම ඒ රජහුගේ පුත්‍රවෙමි. ඉදින් තෝ මා වනයෙහි වළලන්නෙහි නම් අධර්මයක් කරන්නෙහිය.

10 “යම් වෘක්ෂයක්හුගේ සෙවෙනෙහි යමෙක් හිඳින්නේ හෝ වේද, සයනය කරන්නේ හෝ වේද, ඒ වෘක්ෂයෝ අත්ත නොබිඳිය යුත්තේය. කුමක් හෙයින්ද යත්, මිත්‍රද්‍රෝහිකම ලාමකවේ.

11 “සාරථිය, වෘක්ෂය, යම්සේද, රජතෙම එසේය, අත්ත යම්සේද මම එසේයි සෙවනට පැමිණි පුරුෂතෙම යම් සේද තෝ එසේ වෙහිය, එම්බා සාරථිය, ඉදින් තෝ මා වනයෙහි වළලන්නෙහි නම් අධර්මයක් කරන්නෙහියයි” තේමිය කුමරු කීයේය.

12 “යමෙක් මිත්‍රයන්ට ද්‍රෝහ නොකෙරේද හෙතෙම සිය ගෙදරින් පිටත්ව ගියේ බොහෝ අනුභව කිරීම ඇත්තෙක්වේ. බොහෝදෙනා ඔහු අනුව ජීවත් වන්නාහුදවෙත්.

13 “යමෙක් මිත්‍රයන්ට දූෂ්‍ය නොකෙරේද, හෙතෙම යම් යම් ජනපදයකටයේද, නියම්ගම්වලටයේද, රාජධානිවලටයේද, සියලු තන්හි පුදන ලද්දෙක්වේ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

14 "යමෙක් මිත්‍රයන්ට දූෂ්‍ය නොකෙරේද, මොහුට සොරු බලහාත්කාරකම් නොකෙරෙත්. ක්ෂත්‍රියතෙම ඔහු ඉක්මවා නොහැකියි. හෙතෙම සියලු සතුරන් ඉක්මවයි.

15 "යමෙක් මිත්‍රයන්ට ද්‍රෝහ නොකෙරේද, හෙතෙම නොකිපියේ ස්වකීය ගෙදරට පැමිණෙයි. සභාවෙහි සතුටු වූයේ වෙයි. නෑයන්ට උත්තමයෙක් වෙයි.

16 "යමෙක් මිත්‍රයන්ට ද්‍රෝහ නොකෙරේද, හෙතෙම අනුන්ට සත්කාරකොට තෙමේ සත්කාර ලද්දෙක්වේ. අනුන් කෙරෙහි ගෞරව සහිතවූයේ තෙමේද ගරු කටයුත්තෙක්වේ. ගුණ වර්ණනාවද කීර්තියද උසස් කොට හැසිරෙන්නෙක් වේ.

17 "යමෙක් මිත්‍රයන්ට ද්‍රෝහ නොකෙරේද, හෙතෙම මිත්‍රයන්ට පුදන්නේ තෙමේද පූජා ලබයි. වැඳිය යුත්තන්ට වඳින්නේ තෙමේද නැවත වැඳුම් ලබයි. යශපරිවාර සම්පත්තියටද ගුණකීර්තියටද පැමිණේ.

18 "යමෙක් මිත්‍රයන්ට ද්‍රෝහ නොකෙරේද, හෙතෙම ගින්නක් මෙන් දිළිසෙයි. දේවතාවෙකු මෙන් බබළයි. ශ්‍රී දේවිය විසින් නොහරින ලද්දේ වෙයි.

19 "යමෙක් මිත්‍රයන්ට ද්‍රෝහ නොකෙරේද, ඔහුට ගවයෝ හටගනිත්, කුඹුරෙහි වපුරණ ලද්ද මනාව වැඩේ. වපුරණ ලද්දවුන්ගේ ඵලය අනුභව කරයි.

20 "යමෙක් මිත්‍රයන්ට ද්‍රෝහ නොකෙරේද, කඳු රැලියෙන් හෝ පර්වතයෙන් හෝ ගසකින් හෝ වැටුනාවූ ඒ මිනිස්තෙම මෙලොවින් චුතවූයේ පිහිට ලබයි

21 "යමෙක් මිත්‍රයන්ට ද්‍රෝහ නොකෙරේද, හටගත් මුල් පරම්පරාව ඇති නුගගසකට මෙන් ඔහුට සතුරෝ බලාත්කාරකම් නොකරත්යයි" තේමිය කුමරු කීයේය

22 "එම්බා රාජ පුත්‍රය, එනු මැනව, ස්වකීය ගෘහයට ඔබ නැවත ගෙණ යන්නෙමි ඔබට යහපතක් වේවා රාජ්‍යය කරණු මැනව, මේ වනයෙහි තනිව කුමක් කරන්නෙහිදැයි සුනන්ද නම් සාරථිතෙම කීයේය.

23 "එම්බා සාරථිය, අධර්මචර්‍යාවෙන් යම් රාජ්‍යයක් මට ලැබෙන්නේද, ඒ රාජ්‍යයෙන්ද, නෑයන්ගෙන්ද ධනයෙන්ද මට කම් නැතැයි" තේමිය කුමරු කීයේය

24 "එම්බා රාජ පුත්‍රය, මෙයින් ගියේ මට සතුටු පඬුරු ලබාදුන මැනව, රාජ පුත්‍රය, ඔබ ගිය කල්හි පියාද මව්ද යන දෙදෙනා මට බොහෝ තුටු පඬුරු දෙන්නාහුය.

25 "අන්තඃපුර වාසීවූද කුමරුවෝද වෛශ්‍යයෝද බ්‍රාහ්මණයෝද බොහෝ වෙත්. රාජ පුත්‍රය, ඔබ ගිය කල්හි සතුටු සිත් ඇති ඔව්හුද මට බොහෝ පඬුරු දෙන්නාහුය.

26 "ඇතරුවෝද සේවාවන්හි වූවෝද රථිකයෝද පාබල සෙනගෙහිවූවෝද බොහෝවෙත්. රාජපුත්‍රය, ඔබ ගිය කල්හි සතුටුවූ ඔව්හුද මට බොහෝ පඬුරු දෙන්නාහුය.

27 "රාජපුත්‍රය, ඔබ ගිය කල්හි බොහෝවූ දනව් වැස්සෝද සෙසු නියම්ගම් වැස්සෝද රැස්වූවාහු මට සතුටු පඬුරුදෙන්නාහුයයි" සුනන්දතෙම කීයේය.

28 "එම්බා සාරථිය, මම පියා විසින්ද මව විසින්ද රටවැසියා විසින්ද නියම් ගම් වැසියා විසින්ද හැර දමන ලද්දේ වෙමි. තවද සියලු කුමාරයන් විසින්ද හැරදමන ලද්දෙමි. එබැවින් මට ස්වකීය ගෘහයක් නැත්තේය.

29 "මම මව විසින් අනුදන්නාලද්දෙමි. පියා විසින් හැරදමන ලද්දේවෙමි. හුදකලාව අරණ්‍යයෙහි පැවිදි වූයෙම් කාමසම්පත් නොපතන්නෙමියි" තේමිය කුමරු කීයේය.

30 "එම්බා සාරථිය, යුහුසුළු නොවන්නවුන්ගේද ආසාවෙහි ඵලය හෙවත් අදහස් කරණ ලද අර්ථය සමෘද්ධ වේමැයි විශෙෂයෙන්ම මුහුකුරාගිය බඹසර ඇත්තේ වෙමි. හෙවත් නිෂ්ඨාවට පැමිණි මනදොළ ඇති තේමිය මෙසේ දනුව.

31 "යුහුසුළු නොවන්නවුන්ගේද යහපත් අර්ථයතෙම සම්පාදනයවේ. නිෂ්ටාවට පැමිණි මනදොල ඇත්තේ වෙමි. කාමයන්ගෙන් නික්මුනේ කොයිනුත් බියක් නැත්තේ වෙමියි" ප්‍රීති වාක්‍ය ප්‍රකාශ කළේය.

32 "එම්බා රාජ පුත්‍රය, මෙබඳු මිහිරි කථා ඇත්තේ මනොඥ වචන ඇත්තේද වෙහිය. කුමක් හෙයින් එකල්හි මවගේද පියාගේද සමීපයෙහි කථා නොකෙළේදැයි" සුනන්ද තෙම ඇසීය.

33 "එම්බා සාරථිය, මම කලවා නැති බැවින් කොර නොවෙමි. කන් නැති බැවින් බිහිරි නොවෙමි. මම දිව නැති බැවින් ගොළු නොවෙමි. මා ගොළුවෙකැයි නොසලකව.

34 "යම් ජාතියෙක්හි මම රාජ්‍ය කරවීම්ද, ඒ පළමු ජාතිය සිහි කරමි. එහි රාජ්‍ය කරවා දරුණුවූ නරකයට පැමිණියෙමි. එහි මම විසි අවුරුද්දක් රාජ්‍යය කරවීමි. ඉන්පසු අසූ දාහක් අවුරුදු නරකයෙහි පැසුනෙමි.

35 "ඒ රාජ්‍යයට භයවූ මම මා රාජ්‍යයෙහි අභිෂෙක නොකෙරෙත්වායි, එහෙයින් පියාගේද මවගේද සමීපයෙහි එකල්හි කථා නොකෙළෙමි.

36 "මා ඔඩොක්කුවෙහි හිඳුවා පියරජතෙමේ අර්ථයෙන් අනුශාසනා කරයි. එකෙකු නසව්යයිද එකෙකු බඳිව්යයිද එකෙකුට බාරා පතච්ජිකනම් (ශරීරය පලා කාරම් ගෑමේ) කම්කටුල්ල කරව්යයිද එකෙකු හුල හිඳුවව්යයිද මෙසේ ඔහුගේ අනුශාසනාවවේ.

37 "මෙසේ කියන ලද්දාවූ ඔහුගේ ඵරුෂවූ වචනයන් අසා මම ගොළුනුවූයේ ගොළුවෙකුගේ වෙසයෙන්ද කොර නොවූයේ කොරෙකැයි සම්මතවූයෙම්ද මම ස්වකීය මල මුත්‍රයෙහි ගැලී හුන්නෙමි.

38 "යහළු සාරථිය, දුක්වූද ස්වල්පවූද ඒ මනුෂ්‍ය ජීවිතය දුකින් යුක්තවූයේ වෙයි. කවරෙක් නම් එබඳු ජීවිතයට පැමිණ කිසි කරුණකිනුත් ප්‍රාණඝාත ආදී වෛරය කරන්නේද,

39 "විදර්ශනා ප්‍රඥාව නොලැබීමෙන්ද සෝවාන් මාර්ගය නොදැකීමෙන්ද කවරෙක් නම් ඒ ජීවිතයට පැමිණ කිසි කරුණකිනුත් ප්‍රාණඝාත ආදී වෛරය කරන්නේද,

40 "සාරථිය, යුහුසුළු නොවන්නවුන්ගේද අදහසෙහි ප්‍රතිඵලය සමෘද්ධ වේමැයි මම නිෂ්ටාවට පැමිණි මනදොල ඇත්තේ වෙමියි" මෙසේ දනුව.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

41 "යුහුසුළු නොවන්නවුන්ගේද යහපත් අදහස සම්පාදනයවේ. මම නිෂ්ටාවට පැමිණි මනදොල ඇත්තේ වෙමියි ගිහිගෙන් නික්මුනෙම්, කොයිනුත් බියක් නැත්තේ වෙමියි, තේමිය කුමරු කීයේය.

42 "එම්බා රාජ පුත්‍රය, මමද ඔබ සමීපයෙහි පැවිදි වන්නෙමි. ඔබට යහපතක් වේවා. මා කැඳවනු මැනව, ප්‍රව්‍රජ්‍යාතොමෝ මට රුචිවේයයි" සුනන්දතෙම කීයේය.

43 "එම්බා සාරථිය, රථය පාවාදී ණයෙන් නිදහස්ව එව, ප්‍රව්‍රජ්‍යාව වනාහි ණය නැත්තහුට වේ. මේ කාරණය බුද්ධාදී ඍෂීන් විසින් වර්ණනා කරණ ලදීයයි" තේමිය කුමරු කීයේය.

44 "එම්බා රාජ පුත්‍රය, ඔබට යහපතක් වේවා, මම ඔබගේ යම් වචනයක් කෙරෙම්ද, ඒ මා විසින් ඉල්වන ලද්දේ ඔබද මාගේ වචන කරන්ට සුදුස්සෙහිය.

45 "යම්තාක් මම රජහු මෙහි ගෙණ එම්ද, ඒතාක් මෙහිම හිඳිනු මැනව, ඔබගේ පියතෙම දැක සතුටු සිත් ඇත්තෙක් වන්නේ නම් යෙහෙකැයි" සුනන්දතෙම කීයේය.

46 "එම්බා සාරථිය, නුඹ මට යමක් කියන්නෙහි නම් නුඹගේ වචනය කරමි. මෙහි පැමිණියාවූ මාගේ පියරජුහු මමද දකින්ට කැමැත්තෙමි යහළුව, එහි ගොස් එව, ඉන්පසු මෙහි නවතුව. නිරෝගබැව් නෑයන්ට කියව, මාවිසින් කියන ලද්දේ මව්ටද පියාටද මාගේ වැඳීම කියවයි" තේමිය කුමරු කීයේය.

47 සුනන්ද නම් සාරථිතෙම ඒ කුමරුගේ පා අල්වා ගෙණ වැඳ ඔහු ප්‍රදක්ෂිණාද කොට රථයට නැගී රජ ගෙදරට ගියේය.

48 තේමිය කුමරුගේ මව චන්ද්‍රා දේවී තොමෝ ආවාවූ හිස් රථය දැක කඳුළු පිරුණු ඇස්වලින් යුක්තව හඬමින් එකලාවූ ඒ රියැදුරු බලයි.

49 "ඒ මේ රියැදුරුතෙම මාගේ පුත්‍රයා නසා එයි. පොළොවෙහි භූමි වර්ධනය කරන්නාවූ මාගේ පුත්‍රතෙම නසන ලද්දේයයි සිතමි.

50 "මාගේ පුත්‍රයා නසා ආවාවූ රියැදුරු දැක සතුරෝ ඒකාන්තයෙන් සතුටුවෙත්. වෛර ඇත්තෝ ඒකාන්තයෙන් ප්‍රීතිවෙත්."

51 මව්දේවිතොමෝ හිස්වූ රථය දැක කඳුළු පිරුණු ඇස්වලින් යුක්තව හඬමින් තනිව ආවාවූ රියැදුරු විචාරයි.

52 "කිමෙක්ද ඒ මාගේ පුත්‍රතෙම ගොළුවීද, කිම කොරවූයේද, කිම එකල්හි භූමියෙහි වළලනු ලබන්නේ වැළපුනේද එම්බා සාරථිය එය මට කියව.

53 "ගොළුවූ කොරවූ හෙතෙම කෙසේනම් භූමියෙහි වළලනු ලබන්නේ අත්වලින් පාවලින් දුරු කෙළේද, විචාරණලද්දේ එය මට කියවයි" මව් බිසව කීයේය.

54 'එම්බා ආයඨාවෙනි, මට අභය දෙන්නෙහි නම් රාජ පුත්‍රයාගේ සමීපයෙහි මා විසින් යමක් අසන ලදද, දක්නා ලදද මම එය ඔබට කියන්නෙමියි" සාරථිතෙම කීයේය.

55 "යහළු සාරථිය තට අභය දෙමි. රාජපුත්‍රයාගේ සමීපයෙහි තා විසින් යමක් අසන ලද්දේ හෝ දකින ලද්දේ නම් භය නැතිව එය කියවයි." දේවිතොමෝ කීය.

56 "එම්බා ආයඨාවෙනි, හෙතෙම ගොළුවෙක් නොවේ. හෙතෙම කොරෙක් නොවේ. හෙතෙම මනොඥ වචන ඇත්තේ වේ. හෙතෙම වනාහි රාජ්‍යයට භයවූයේ ගෘහයෙහි බොහෝ දෑ කෙළේය.

57 "හෙතෙම යම් නගරයෙක්හි රාජ්‍යය කරවීද, ඒ පළමු ජාතිය සිහි කරයි. එහි රාජ්‍යය කරවා දරුණුවූ නරකයට පැමිණියේය.

58 "හෙතෙම එහි විසි අවුරුද්දක් පමණ කල් රාජ්‍යය කරවීය. ඉන්පසු අසූ දහසක් අවුරුදු නරකයෙහි පැසුනේය.

59 "ඒ රාජ්‍යයට භයවූ හෙතෙම මා රාජ්‍යයෙහි අභිෂේක නොකෙරෙත්වායි, එහෙයින් එකල්හි පියාගේද මවගේද සමීපයෙහි කථා නොකෙළේය.

**60** "සියලු ශරීරාවයන්ගෙන් යුක්තවූ උස මහත ඇත්තාවූ මනොඥ වචන ඇත්තාවූ ප්‍රඥාව ඇත්තාවූ හෙතෙම දෙව්ලොවට යන මාර්ගයෙහි සිටියි.

**61** "එම්බා රාජපුත්‍රිය, ඉදින් ඔබ ඔබගේ පුත්‍රයා දකින්ට කැමැත්තෙහි නම් එනු මැනව. යම් තැනෙක්හි ඒ තේමිය කුමාරතෙම මෙසේද, එතනට පමුණුවන්නෙමියි" සාරථීතෙම කීයේය.

**62** "රථවල අශ්වයන් යොදත්වා. ඇතුන්ට පොරොදු හෙවත් අබරණ පළඳවව්. සක් පනාබෙර නාද කෙරෙත්වා. එකැස් බෙර වාදනය කෙරෙත්වා.

**63** "මනාව සරහන ලද බෙර ගසත්වා. මිහිරි ස්වර ඇති බෙරය වාදනය කෙර්වා. පුත්‍රයාට දන්වා අභිෂේක කොට ගෙණ ඊමට මම යමි. නියම්ගම් වැස්සෝද මා අනුව එත්වා.

**64** "අන්තඃපුර වාසීහුද කුමාරයෝද වෛශ්‍යයෝද බ්‍රාහ්මණයෝද වහා යානාවන් යොදත්වා. මම පුතුට අවවාද කොට ආපසු ගෙණ එන්ට යමි.

**65** "ඇතරුවෝද සේනාවන්හි වූවෝද රථ නැගෙන්නෝද පාබල සෙනඟෙහි වූවෝද වහා යානාවන් යොදත්වා. මම පුත්‍රයාට දන්වා අභිෂේකකොට ගෙණ එන්ට යමි.

**66** "මෙහි රැස්වූ දනව් වැස්සෝද රැස්වූ නියම්ගම් වැස්සෝද වහා යානාවන් යොදත්වා. මම පුත්‍රයාට දන්වා ආපසු ගෙණ එන්ට යමියි" කශී රජතෙම කීයේය.

**66** "රියැදුරෝද ශීඝ්‍ර ගමන් ඇත්තාවූ සෛන්ධව අශ්වයන් යොදනලද රථයන් ගෙණ රජ ගෙදරට පැමිණියාහුය. දේවයන් වහන්ස, මේ අශ්වයෝ රථවල යොදන ලද්දාහුයයි" රජහට දැන්වූහ.

**67** "දේවයන් වහන්ස, තරවූ අශ්වයෝ වේගයෙන් පිරිහෙත්. කෙට්ටුවූ අශ්වයෝ ශක්තියෙන් අඩුවෙතියි කෙට්ටු වූවන්ද තර වූවන්ද හැර වේගයෙන්ද ශක්තියෙන්ද සමානවූම අශ්වයෝ යොදන ලද්දාහුයයි" දැන්වූහ.

68 "ඉක්බිති රජතෙමේද යුහුසුළුව සුදුසු යානාවකට නැග සියල්ලෝම මා අනුව ගමන් කරවයයි අන්තඃපුරයට කීයේය.

69 "වල් විදුනාවද නළල්පටද කඩුවද ශ්වෙතච්ඡත්‍රයද රන් මිරිවැඩි සඟලද ගෙණ ස්වර්ණයෙන් අලංකෘතවූයේ රථයට නැග,

70 "ඉක්බිති රජතෙමේද, රියැදුරා පෙරටුකොට පිටත් වූයේය. යම් තැනෙක්හි තේමිය කුමාරතෙම වාසය කෙරේද, වහාම එතන්හි පැමිණියේය.

71 "තෙජසින් දිලිසෙන්නාක් මෙන් එන්නාවූ ක්ෂත්‍රිය සමූහයා විසින් පිරිවැරුවාවූ ඒ රජහුද දැක තේමිය කුමාර තෙම මෙය කීයේය.

72 "කිමෙක්ද පියාණෙනි, නීරෝගද කිමෙක්ද පියාණෙනි, රෝග පීඩාවක් නැද්ද, කිමෙක්ද මාගේ මෑණිවරුවූ රාජ කන්‍යාවෝ නීරෝග වෙද්දැයි" ඇසීය.

73 "පුත්‍රය, මට නිරෝගද වේමය. තවද පුත්‍රය රෝග පීඩාවක් නැත්තේ ඔබගේ මෑනිවරුවූ සියලු රාජ කන්‍යාවෝද නීරෝග වෙත්යයි" පියරජ කීයේය.

74 "පියාණෙනි කිම මද්‍යපානය නොකරන්නෙහිද, කිම ඔබට සුරාපානය ප්‍රිය නොවේද, කිම සත්‍ය වචනයෙහිද දශරාජ ධර්මයෙහි දන්දීමෙහිද ඔබගේ සිත ඇලේද්දැයි" ඇසීය

75 "පුත තේමිය කුමාරය, මම මද්‍යපානය කරන්නෙක් නොවෙමි. තවද මට සුරාපානය ප්‍රිය නොවේ. තවද සත්‍ය වචනයෙහිද දශරාජ ධර්මයෙහිද දීමෙහිද මාගේ සිත ඇලෙයි

76 "ප්‍රිය රජතුමනි, කිම ඔබගේ අශ්වයන් ගොනුන් ආදී වාහන නිරෝගද කිම හස්ති ආදී සියලු වාහණ ඔබ උසුලයිද, කිම ඔබට ශරීරය තවන්නාවූ ව්‍යාධීහු නැද්ද?

77 "පුත්‍රය, තවද මාගේ වාහන සියල්ල නීරෝගය, තවද වාහනය මා උසුලයි. තවද සිරුරු තවන්නාවූ රෝග පීඩාවෝ මට නැත්තාහ.

78 "පියාණෙනි, ඔබගේ පසල් දනව්වැස්සෝ සමෘද්ධ වූවාහුද, ඔබගේ රට මැද සනවූ වාස ඇත්තාහුද, කිම ඔබගේ කොටුගුළුද, භාණ්ඩාගාරයද පිරීතිබේද,

79 "පුත්‍රය, තවද මාගේ පසල් දනව් වැස්සෝද සමෘද්ධ වූහ. මාගේ රට මැදද සනවූ වාස ඇත්තාහ. මාගේ කොටුගුළුද භාණ්ඩාගාරයද සියල්ල සම්පූර්ණව සුරක්ෂිතව තිබේ.

80 "මහරජ, ඔබගේ යහපත් ඊමකි. තවද ඔබගේ අයහපත් ඊමක් නොවේ. යම් තැනෙක්හි රජෙක්තෙම හිඳීද එබඳු අස්නක් පනවත්වායි" තේමිය කුමාරතෙම කීයේය.

81 "මනාව පනවනලද මේ කොළ ඇතිරියෙහි උන්නාවූ ඔබගේ පාදයන් මෙයින් දිය හැරගෙණ සෝදත්වායිද" කීයේය.

82 "පිය රජුනි, ලුනු නැත්තාවූ දූෂිතවූ මේ කොළද මාගේ ආහාරයවේ. මහරජ, මෙහි ආවාවූ ඔබ මාගේ සත්කාරයට සුදුස්සෙක් වෙහිය. එබැවින් මෙය අනුභව කරවයි" තේමිය කුමාරතෙම කීයේය.

83 "පුත්‍රය, මම කොළ අනුභව නොකරමි. මේ මාගේ භෝජනය නොවේමැයි. මම පවිත්‍රවූ රශමසවුලෙන් යුක්තවූ ඇල්සාලේ බත අනුභව කරන්නෙමියි" රජතෙම කීයේය.

84 "පුත්‍රය, එකලාවූද, රහසිගතවූද මේ ආහාරයෙන් යැපෙන්නාවූ ඔබ දැක මට ආශ්චර්‍ය්‍යයක් වැටහේ. මෙබඳු ආහාරය වළඳන්නවුන්ගේ කවර කාරණයකින් ශරීරවර්ණය පහදීද කියායි."

85 "මහරජ, මනාව අතුරණලද්දාවූ කොල ඇතිරියෙහි තනිව වැදහෙමි. මහරජ, ඒ මාගේ තනිව සයනය කිරීමෙන් ශරීරවර්ණය පහදියි.

86 "ඒකාන්තයෙන් කඩු බැඳගත්තාවූ රජුන් රකින්නෝ මට පැමිණ සිටියාහු නොවෙත්. මහරජ, ඒ මාගේ සැපවූ සයනයෙන් ශරීරවර්ණය පහදියි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

87 "මහරජ, ඉකුත්වූ දෙයට ශෝක නොකරමි. නො ලැබුනු දෙයක් නොපතමි. මේ කාලයෙහි ලැබුනු දෙයින් යැපෙමි, ඒ කාරණයෙන් මාගේ ශරීරවර්ණය පහදියි.

88 "නොපැමිණියාවූ දෙය පැතීමෙන්ද ඉකුත්වූ දෙයට ශොක කිරීමෙන්ද යන මේ කාරණයෙන් අඥාණයෝ වියලෙත්. කුමත් මෙන්දයත් කපා අව්වෙහි දමනලද නිල්වන්වූ බටගසක් මෙනැයි" කීයේය.

89 "පුත්‍රය, හස්ති සේනාවද, රථසේනාවද සැරසුනාවූ අශ්ව සේනාවද, පාබලසේනාවද, සිත්කළුවූ ගෘහයන්ද යන සියල්ල මම ඔබට දෙමි.

90 "සියලු අලංකාරයෙන් සැරසුනාවූ අන්තඃපුරයද ඔබට දෙමි. පුත්‍රය, ඔවුන් පිළිපදුව. ඔබ අපගේ රජවෙව.

91 "පුත්‍රය, නෘත්‍ය ගීතයට දක්ෂවූ සෙසු කටයුතුවලද හික්මුනාවූ දක්ෂ ස්ත්‍රීහු කාමයෙහි ඔබ අලවන්නාහුය. මේ හිස් වනයෙහි කුමක් කරන්නෙහිද?

92 "පුත්‍රය, අන් රජුන්ගෙන් ඔබට සරසනලද රාජ කන්‍යාවන් ගෙණ දෙන්නෙමි. ඔවුන් කෙරෙහි වැස පුත්‍රයන් උපදවා නැවත පසුව පැවිදිවන්නෙහිවා.

93 "පුත්‍රය, ඔබ යෞවන වයසට පැමිණියේද, තරුණ වූයේද උත්පත්තියෙන් ප්‍රථම වයස් ඇත්තේද ඉතා තරුණදවෙහිය ඔබට යහපතක් වේවා. රාජ්‍යය කරව. මේ හිස් වනයෙහි කුමක් කරන්නෙහිදැයි" පියරජතෙම කීයේය.

94 "තරුණවූයේ බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙන්නේය. බ්‍රහ්මචර්‍ය්‍යා ඇත්තේ තරුණයෙක් වන්නේය. තරුණ වූවහුටම ප්‍රව්‍රජ්‍යාව සුදුසුවේ. මේ කාරණය බුද්ධාදී ඍෂීන් විසින් වර්ණනා කරණලදී.

95 "තරුණවූයේ බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙන්නේය. බ්‍රහ්මචර්‍ය්‍යා ඇත්තේ තරුණයෙක් වන්නේය. එබැවින් මමද බ්‍රහ්මචර්‍ය්‍යාවෙන් හැසිරෙන්නෙමි. මට රාජ්‍යයෙන් ප්‍රයෝජන ඇත්තෙක් නොවෙමි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

96 "තරුණවූ මෑනියෙනි, පියාණෙනි, කියන්නාවූ දුකසේ ලද්දාවූ ප්‍රිය පුත්‍රවූ ජරාවට නොපැමිණව මළාවූ මිනිසෙකු මම දකිම්මය.

97 "තරුණවූ මනොඥ දර්ශන ඇත්තාවූ ජීවිත විනාශයෙහි බට, හුණ කිළිලක් මෙන් මරහු විසින් සිඳගන්නාලද කුමරියකු මම දකිම්මය.

98 "මිනිස්සුද තවද ස්ත්‍රීහුද තරුණවූවාහුද මියයනු ලබත් කවර නම් පුරුෂයෙක් එබඳු ජීවිතයෙහි තරුණ වෙමියි විශ්වාස කරන්නේද?

99 "මහරජ, යමෙක්හුගේ රාත්‍රි ඇවෑමෙහි ආයුශය ඉතා ස්වල්ප වන්නේද, මත්ස්‍යයන්ගේ මද දියෙහි මෙන් එහි කවර නම් කුමාර භාවයක් වේද?

100 "ලෝවැසිතෙම නිරන්තරයෙන් පහරණ ලද්දේ වේ. නිරන්තරයෙන් පිරිවරණ ලද්දේද වේ. රෑ දාවල් නොසිස්ව ඉක්ම යනකල්හි කුමකට මා රාජ්‍යයෙන් අභිෂෙක කරන්නෙහිද?

101 "ලෝ වැසිතෙම කවරෙකු විසින් පහරණලද්දේ වේද, කවරෙකු විසින් පිරිවරණ ලද්දේවේද, කවරක්හු නොසිස්ව ඉක්ම යද්ද, පුත්‍රය, මා විසින් විචාරණලද්දේ එය මට කියව.

102 "මේ ලෝවැසිතෙම මරුවා විසින් පහරණ ලද්දේ වෙයි. ජරාවෙන් පිරිවරණලද්දේ වෙයි. රාත්‍රීහු නොහිස්ව ඉක්මයත්. මහරජ මෙසේ දනුව

103 "යම්සේ නූල් පැතිරවූ කල්හි යම් යම්ම කොටසක් වියනුලැබේද, වියයුතු කොටස ස්වල්පවේද, සත්වයන්ගේ ජීවිතයද මෙසේය.

104 "යම්සේ පිරුණාවූ දිය පහර බෑසයන්නේ ආපසු නොනවතීද? මෙසේ මිනිසුන්ගේ ආයුෂය ගෙවීයන්නේ පෙරලා නොනවතියි.

105 "යම්සේ පිරීයන්නාවූ සැඩපහරතෙම ඉව්ර සමීපයෙහි හටගත් ගස් උදුරාගෙණ යන්නේද? මෙසේම ජරාවෙන්ද,

මරණයෙන්ද, සත්වයෝ ඒකාන්තයෙන් ගසා ගෙණයන්නේ යයි" තේමිය කුමාරතෙම ධර්මය දේශනා කෙළේය.

106 "එම්බා පුත්‍රය, හස්තිසේනාවද, රථසේනාවද, සන්නාහසන්නද්ධවූ අශ්වයන්ද, පාබලසෙනගද, සිත්කළුවූ මාලිගාවල්ද මම ඔබට දෙමි.

107 "සියලු අලංකාරයෙන් සැරසුනාවූ අන්තඃපුරයද ඔබට දෙමි. පුත්‍රය, ඔවුන් පිළිබඳව ඔබ අපට රජවන්නෙහිවා.

108 "නැටීමට හා ගී කීමට දක්ෂවූ සෙසු කටයුතුවලද හික්මුනාවූ ඒ දක්ෂ ස්ත්‍රීහු කාම සම්පත්හි ඔබ අලවන්නාහ. මේ හිස්වූ අරණ්‍යයෙහි කුමක් කරන්නෙහිද?

109 "අන්‍යවූ රජවරුන්ගෙන් අලංකාරයෙන් සැරසුනා වූ රාජ කන්‍යාවන් ඔබට ගෙණ දෙන්නෙමි. ඔවුන් කෙරෙහි වාසය කොට පුත්‍රයන් උපදවා ඉක්බිති පසුව පැවිදි වන්නෙහිවා.

110 "පුත්‍රය, ඔබ යෞවනවූයේද, තරුණවූයේද, උත්පත්තියෙන් පළමු වයස් ඇත්තේද ඉතා බාලවූයේද වෙහිය. ඔබට යහපතක්වේවා. රාජ්‍යය කරව, මේ හිස්වූ අරණ්‍යයෙහි කුමක් කරන්නෙහිද?

111 "කොටුගුල්ද, භාණ්ඩාගාරයද, වාහණයන්ද බල සෙනගද, සිත්කළුවූ වාසල්ද යන සියල්ල පුත්‍රය, මම ඔබට දෙමි

112 "පුත්‍රය, ඔබට යහපතක් වේවා. මිහිරිකථා ඇති රාජකන්‍යා සමූහයා විසින් වටකරණලද්දේ දාසී සමූහයා විසින් පිරිවරණලද්දේ ඔබ රාජ්‍යය කරව. මේ හිස්වූ අරණ්‍යයෙහි කුමක් කරන්නෙහිදැයි" පියරජතෙම කීයේය.

113 "මහරජ, යම් ධනයක් විනාශයට යන්නේද, එබඳු ධනයෙන් මට කවරප්‍රයෝජනද යම් භාර්‍ය්‍යාවක් මැරෙන්නේද එබඳු භාර්‍ය්‍යාවගෙන් කවර ප්‍රයෝජනද යම් තරුණ බවකට ජරාව පහර දෙන්නේද, පුරුදුකළාවූ එබඳු යෞවනයෙන් කවර ප්‍රයෝජනද?

114 "එබඳු ලෝකයෙහි කවර නම් සතුටක්ද, කවරනම් ක්‍රීඩාවක්ද, කවරනම් ඇල්මක්ද, කවර නම් ධන සෙවීමක්ද, පුත්‍රයන්ගෙන් හා අඹුවන්ගෙන් මට කවර ප්‍රයෝජනයක්ද, මහරජ, මම තෘෂ්ණා බන්ධනයෙන් මිදුනේ වෙමි.

115 "මට මාරයා ප්‍රමාද නොවේ. ඒ මම මෙසේ දනිමි. මරුවා විසින් යටපත් කරණ ලද්දහුගේ කවර නම් පඤ්ච කාමයන්හි ඇල්මක්ද, කවරනම් වස්තු සෙවීමක්ද?

116 "පැසුනාවූ ගෙඩිවල වැටීම හේතුකොටගෙණ නිතර භය යම්සේද මෙසේම උපන්නාවූ සත්වයන්ට මරණ හේතුවෙන් නිතර භය වේ.

117 "උදය දක්නා ලද්දාවූ බොහෝ දෙනාගෙන් සමහරු සවස නොදක්නා ලැබෙත්. සවස දක්නා ලද බොහෝ දෙනාගෙන් සමහරු උදය නොදක්නා ලැබෙත්.

118 "අදම වීර්‍ය්‍යය කටයුතුයි. සෙට මරණය වේයයි කවරෙක් දන්නේද, පස්විසි භය ආදී මහත් සේනාවන් ඇති මරු සමග අපගේ විශ්වාසයක් නැත්තේ මැයි.

119 "සොරු වස්තුව ප්‍රාර්ථනා කරත්. මහරජ මම ඒ වස්තුව පැතීම නම්වූ තෘෂ්ණා බන්ධනයෙන් මිදුනේ වෙමි. මහරජ මෙහි එනු මැනව, මාගේ වචනයෙහි පවතිනු මැනව. මම වනාහි රාජ්‍යයෙන් ප්‍රයෝජන ඇත්තෙක් නොවෙමියි" බෝසත්තෙම දහම් දෙසීය.

538 **මහාජනක ජාතකය:-** 1 "මේ මුහුද මැද ඉවුරක් නොදක්නේ කවරෙක් නම් පීනමින් උත්සාහ කරන්නේද, ඔබ කිනම් ප්‍රයෝජනයක් සලසා මෙසේ මහත් ලෙස ව්‍යායාම කරන්නෙහිදැයි" මණිමෙඛලා නම් දෙව්දුව ඇසීය.

2 "එම්බා දෙව්දුව, මම ලෝක චාරිත්‍රයද අසා ඇත්තෙමි. ව්‍යායාමයාගේ ආනිශංසයද දැන සිටිමි. එහෙයින් මේ මුහුද මැද ඉව්රක් නොදැක උත්සාහ කරන්නෙමියි" මහා ජනක කුමාරතෙම කීයේය.

3 "අපමණ ගැඹුරුවූ මේ සාගරයෙහි ඉවුර යමෙකුට නොපෙනේද ඉවුරට නොපැමිණම මරණයට පැමිණෙන්නෙහිද, එම්බා පුරුෂය, එබඳුවූ ඔබගේ ඒ ව්‍යායාමයතෙම හිස්වේයයි" දෙව්දුව කීය.

4 "එම්බා දෙව්දුව යමෙක් පුරුෂ වීර්‍ය්‍ය කරන්නේ නම් හෙතෙම නෑයන්ටද දෙවියන්ටද බ්‍රහ්මයාටද ණය නැත්තෙක් හෙවත් නොගැරහිය යුත්තෙක් වේ. පසුතැවිලිද, නොවේයයි' කුමාරතෙම කීයේය.

5 "එම්බා පුරුෂය, යම් කර්මයක් උත්සාහයෙන් නොලැබිය හැකිද, නිෂ්ඵලද වෙහෙස වඩන්නේද, යම් උත්සාහයක් කරන්නෙකුට මරණය පැමිණේද එබඳු කටයුත්තෙහි උත්සාහ කිරීමෙන් කවර ප්‍රයෝජනයෙක්දැයි" දෙව්දුව ඇසීය.

6 "එම්බා දෙව්දුව, යමෙක් ඒකාන්තයෙන් උත්සාහ කොටද නොලැබිය හැකියයි දැන ඉදින් එබඳු තැන්වල උත්සාහය අඩුකෙරේ නම් හෙතෙම තමන්ගේ ආත්මය නොරකීයයි දතයුතුයි.

7 "එම්බා දෙව්දුව මේ ලෝකයෙහි සමහරු ප්‍රයෝජනය සලකා කර්මාන්ත යොදවත්. ඒ කර්මාන්තයෝ සමෘද්ධවන්නාහුද වෙත්.

8 "එම්බා දෙව්දුව, සෙස්සෝ මුහුදෙහි ගිළුනාහ. මම වනාහි මෙතාක් තරණය කරමි. සමීපයෙහි සිටි ඔබද දකිමි. මේ ආත්මයෙහිවූ කර්ම විපාකය නොවේදැයි බලව.

9 "ඒ මම සත්‍යවූ පරිදි බලය ඇති පරිදි සමුද්‍රයාගේ පරතෙරට යමින් පුරුෂ වීර්‍ය්‍ය කරමින් උත්සාහ ගන්නෙමියි" කුමාරතෙම කීයේය.

10 "එම්බා පුරුෂය, මෙබඳු ගැඹුරු පුළුල්වූ සැඩපහර ඇත්තාවූ ප්‍රමාණයක් කළ නොහැකි මහා සාගරයෙහි දැහැමි උත්සාහයෙන් යුක්තවූ යම්බඳුවූ ඔබ ස්වකීය පුරුෂ වීර්‍ය්‍යයෙන් නොගිලෙන්නෙහිය. යම්තැනෙක්හි ඔබගේ සිත ඇළුනේද, එ ඔබ එතැන්හිම යවයි" දෙව්දුව කීය.

11 "සූර්යයා උදාවන තන්හි නිධානයෙක, බස්නා තන්හි නිධානයෙක, ඇතුළත නිධානයෙක, පිටත නිධානයෙක ඇතුළත්හි නොවූ පිටත්හි නොවූ තැන නිධානයෙක.

12 "නගින තැන මහත් නිධානයෙක, තවද බහින තැන නිධානයෙක, මහසල් ගස් සතර තිබෙන තැන්වලද නිධාන වෙත්. හාත්පස යොදුනක් තැනද නිධානයෙක.

13 "දළ කෙළවර තැන්හි මහා නිධානයෙක. මාලිගා කෙළවරවල්හිද නිධානවෙත්. දිය ඇති තන්හි නිධානයෙක. ගසමුදුන මහා නිධානයෙක මේ මහ නිධන් සොළොසට ලකුණුවෙත්. සහස්සත්ථාම දුන්න නැගීමද හතරැස් ආසනය හිස කෙළවර දැනීමද සීවලී කුමරිය සතුටු කිරීමද (හැකි කෙනෙකුට රාජ්‍යය දියයුතුයයි පෝලජනක රජ විසින් මරණ මඤ්චකයෙහිදී කියන ලදී.)"

14 "නුවණැති පුරුෂතෙම ප්‍රාර්ථනා කරන්නේමය. වීර්යය කරමින් නොකලකිරෙන්නේය. ඒ මම තමන් දකිමි. මම යමක් කැමතිවීම්ද එය එසේවිය.

15 "නුවණැති පුරුෂතෙම ප්‍රාර්ථනා කරන්නේමය. උත්සාහයෙහි නොකලකිරෙන්නේය. ඒ මම දියෙන් ගොඩ ආ තමා දකිමි.

16 "නුවණැති පුරුෂතෙම උත්සාහකරන්නේමය අතර නොකලකිරෙන්නේය. ඒ මම තමන් දකිමි. මම යම්සේ කැමතිවීම්ද එසේ වූයේය.

17 "නුවණැති පුරුෂතෙම උත්සාහ කරන්නේමය. උත්සාහ කරමින් නොකලකිරෙන්නේය. ඒ මම සාගරයෙන් ගොඩ ආවාවූ තමා දකිමි.

18 "දුකින් පෙළෙනාවූද නුවණැති මනුෂ්‍යතෙම සැප ලැබීමෙහි ආසාව නොසිඳින්නේය. දුක්වූද සැපවූද ස්පර්ශයෝ බොහෝ වෙත්. ඒ නොසිතන්නාහු මරණයට පැමිණෙත්.

19 "නොසිතන ලද්දේවේ. සිතනලද්දද වැනසේ. ස්ත්‍රියකට හෝ පුරුෂයෙකුට හෝ සිතූ පරිදිම වන්නාවූ සම්පත්තීහු නොමවෙත්යයි" මහාජනක රජතෙම ප්‍රීතිය ප්‍රකාශ කෙළේය.

20 "පින්වත්නි, සියලු පොළොව රක්නාවූ දිසාවන්ට අධිපතිවූ රජතෙම ඒකාන්තයෙන් පෙර මෙන් නොවේ. අද නැටුම් නොබලයි. ගී කීමෙහි සිත් නොකෙරෙයි.

21 "මෘග යුද්ධද නොබලයි. උද්‍යාන ක්‍රීඩාද නොකරයි. හංසයන්ද නොබලයි. ගොළුවෙකු මෙන් නිශ්ශබ්දව හුන්නේ අර්ථයෙන් අනුශාසනා නොකෙරේයයි" මහජනතෙම කීයේය.

22 "නිවන් සුව කැමැත්තාවූ වැසුන ශීලාදී ගුණ ඇත්තාවූ වධබන්ධනයෙන් වැළකුණාවූ තරුණවූද මහළුවූද පසේ බුදුවරයෝ කවරකෙනෙකුන්ගේ ආරාමයෙහි අද වාසය කෙරෙද්ද?

23 "පහවූ තෘෂ්ණා ඇති ප්‍රාඥවූ යම් කෙනෙක් රාගාදීන් උත්සන්න බවට පැමිණි ලෝකයෙහි උත්සාහවත් නොවූවාහු වාසය කෙරෙද්ද, මහර්ෂීවූ උන්වහන්සේලාට නමස්කාරවේවා.

24 "උන්වහන්සේලා අතිශයින් මායාකාරීවූ මරුවාගේ දෘඪවූ ඒ දැල සිඳගෙණ සුන්කරණ ලද ආලය ඇති බැවින් යත්, කවරෙක් මා උන්වහන්සේලාගේ නිවාසස්ථානයට පමුණුවන්නේදැයි" මහාජනක රජතෙම ප්‍රීතිය ප්‍රකාශකෙළේය.

25 "කවර කලෙක්හි මම සමෘද්ධවූ සියලු දෙසින් ප්‍රභා සම්පන්නවූ මියුලුනම් නුවර හැරදමා පැවිදිවන්නෙම්ද, ඒ සියල්ල හැරදමා පැවිදිවීම කවර කලෙක්හි නම් වන්නේද,

26 "විභාග කරණ ලද කොටස් වශයෙන් ප්‍රමාණ කරණ ලද සමෘද්ධවූ (ii) මියුළු නුවර හැර කවර කලෙක්හි මම පැවිදිවන්නෙම්ද, ඒ මෙබඳු නුවර හැර පැවිදිවීම කවර කලෙක්හි නම් වන්නේද,

(27-35 ඡේදවල අගට 26 (ii) යෙදිය යුතුයි)

27 "මහත්වූ ප්‍රකාරයෙන් හා දොරටු තොරන් වලින් යුක්තවූ

28 "දෘඪවූ අටළු වලින් හා දොරකොටු වලින් යුක්තවූ

29 මනාකොට කොටස් කරණ ලද මහත් වූ වීථි ඇති

30 "මනාකොට විභාග කරණ ලද සල්පිල් ඇති

31 "ගවයන් හා අශ්වයන් යෙදූ රථවලින් ගැවසී ගත්තාවූ

32 පුෂ්පාරාම ඵලාරාම වන පංක්තීන් යුක්තවූ

33 "උද්‍යාන වන පංක්තීන් යුක්තවූ

34 "ප්‍රාසාද වන පංක්තීන් යුක්තවූ

35 "රජහුගේ නෑයන්ගෙන්ම යුත් පුරත්‍රයකින් යුක්තවූ පිරිවර ඇත්තාවූ සොමනස්ස නම් වෙදෙහ රජු විසින් මවන ලද්දාවූ සමෘද්ධවූ

36 "දැහැමින් රක්නාලද රැස්කරණ ලද ධන ධාන්‍යයන් ඇති සමෘද්ධවූ විදෙහ වැසියන් හැර (ii) කවර කලෙක්හි මම පැවිදි වන්නෙම්ද, පැවිදිවීම කවර කලෙක්හි නම් වන්නේද?

(37-54 ඡෙද අගට 36 (ii) ඡෙදය යෙදිය යුතුයි)

37 "දැහැමින් රක්නා ලද සතුරන් විසින් නොදිනිය හැක්කාවූ සමෘද්ධවූ විදේහ වැසියන් හැර

38 "විභාග කරණ ලද කොටස් වශයෙන් ප්‍රමාණ කරණ ලද සිත්කළුවූ අන්තඃපුරය හැර

39 "සුනු පිරියමින් හා මැටි ගෑමෙන් යුක්තවූ සිත් කළුවූ අන්තඃපුරය හැර

40 "පිවිතුරු ගඳින් යුක්තවූ සිත් අලවන්නාවූ රම්‍යවූ අන්තඃපුරය හැර

41 "විභාග කරණ ලද කොටස් වශයෙන් ප්‍රමාණ කරණ ලද කූටාගාරයන් හැර

42 "සුනු පිරියමින් හා මැටි ආලෙපයෙන් යුක්තවූ කූටාගාරයන් හැර

43 පිවිතුරු ගඳ ඇත්තාවූ සිත් අලවන්නාවූ කූටාගාරයන් හැර

44 ආලෙප කරණ ලද රත් සඳුන් වලින් සුගන්ධවත්වූ කූටාගාරයන් හැර

45 "සතරඟුල් පමණ එළු ලොමින් කළ විසිතුරු ඇතිරිලි අතුරණ ලද ස්වර්ණමය පය්‍ර්‍යංකයන් හැර

46 "කප්පිපිළි හා කොශෙය්‍ය වස්ත්‍රද කොමුපිළි හා කොටුම්බර දෙශයෙහි උපන් වස්ත්‍රද හැර

47 "සක්වාලිහිණියන් විසින් පවත්වන ලද නාද ඇති මන්දාලකයන්ගෙන්ද පියුම් හා උපුල් වලින්ද ගැවසීගත්තාවූ පුෂ්කරණීන් හැර

48 "සියලු හස්ත්‍යලංකාරයෙන් සරසන ලද්දාවූ හස්ති සමූහයන්ද රන් පොරොදු ඇත්තාවූ රණින් කළ ශීර්ෂාභරණයෙන් හා රන් දැලින්ද යුක්තවූ හස්තිරාජයන්ද හැර

49 තෝමර හා අකුසු ගත් අත් ඇති ඇතරුවන් විසින් නගින ලද (හස්තිරාජයන්) හැර

50-51 "සර්වාලංකාරයෙන් සරසන ලද්දාවූ උත්පත්තියෙන්ම ආජානියවූ ශීඝ්‍රවාහණවූ සෙන්ධවනම් අශ්වසමූහයන්ද කරවාල දුනු දරන්නාවූ අශ්වාරොහකයන් විසින් නගින ලද අශ්වයන්ද හැර

52-53 "කවර කලෙක්හි මම මනාව සැරසූ ඔසවන ලද ධජ ඇති දිවිසම් ඇත්තාවූද තවද ව්‍යාඝ්‍ර සම් අතුරණ ලද්දාවූ සියලු අලංකාරයෙන් අලංකාරවූ දුනුගත් අත් ඇති සැට්ට ලනලද රියැදුරන් විසින් නගන ලද රථ පංක්තීන් හැර

54-55 "කවර කලෙක්හි මම සරසන ලද ඔසවන ලද ධ්වජ ඇති අතුරණ ලද දිවිසම් ඇති තවද ව්‍යාඝ්‍ර සම් ඇති සියලු අලංකාරයෙන් සැරසූ ස්වර්ණමය රථයන් සැට්ට ලන ලද දුණුගත් අත් ඇති රියැදුරන් විසින් නගින ලද රථයන් (ii) හැරපැවිදි වන්නෙම්ද ඒ මෙබඳු සම්පත් හැර පැවිදිවීම කවර කලෙක්හි වන්නේද?

(56-62 ඡෙද අගට 54-55 (ii) ඡෙදය යෙදිය යුතුයි)

56 රිදියෙන් කළ රථයන්

57 අශ්වයන් යොදන ලද රථයන්

58 ඔටුවන් යොදනලද රථයන්

59 ගවයන් යොදනලද රථයන්

60 එළුවන් යොදනලද රථයන්

**61** තිරෙළුවන් යොදනලද රථයන්

**62** මුවන් යොදනලද රථයන්

**63** "කවර කලෙකින් මම සියලු අලංකාරයෙන් සැරසුනාවූ නිල්වන් සැට්ට දරන්නාවූ ශූරවූ තෝමර හා අංකුශ ගත් අත් ඇති ඇතරුවන් හැර පැවිදි වන්නෙම්ද ඒ මාගේ පැවිදිවීම කවර කලෙක්හි නම් වන්නේද?

**64** "කවර කලෙක්හි මම සියලු අලංකාරයෙන් සැරසුනාවූ නිල්වන් සැට්ට දරන්නාවූ කරවාලය හා දුන්න දරන්නාවූ ශූරවූ අශ්වාරෝහකයන් හැර පැවිදි වන්නෙම්ද, ඒ මෙබඳුවූ පැවිද්ද කවර කලෙක්හි වන්නේද?

**65** "කවර කලෙක්හි මම සියලු අලංකාරයෙන් සැරසුනාවූ නිල්වන් සැට්ට දරන්නාවූ හියවුරු හා දුනුගත් අත් ඇති ශූරවූ ධනුර්ධරයන් හැර පැවිදි වන්නෙම්ද, ඒ මෙබඳුවූ පැවිද්ද කවර කලෙක්හි වන්නේද?

**66** "කවර කලෙක්හි මම සියලු අලංකාරයෙන් සැරසුනාවූ විසිතුරු සැට්ට දරන්නාවූ ස්වර්ණමය හිස් වෙළුම් දරන්නාවූ ශූරවූ රාජකුමාරයන් හැර පැවිදි වන්නෙම්ද, ඒ මෙබඳුවූ පැවිද්ද කවර කලෙක්හි වන්නේද?

**67** "කවර කලෙක්හි මම වස්ත්‍ර ඇති සැරසුනාවූ රන්වන් සඳුන් ගල්වන ලද ශරීරාවයව ඇති උතුම් කශී සළු දරන්නාවූ බ්‍රාහ්මණ සමූහයා හැර පැවිදි වන්නෙම්ද, ඒ මෙබඳුවූ පැවිදිවීම කවරකලෙක්හි වන්නේද?

**68** "කවර කලෙක්හි මම සියලු අලංකාරයෙන් සැරසුනාවූ සත් සියයක් භාර්‍ය්‍යාවන් හැර පැවිදි වන්නෙම්ද, ඒ මෙබඳු පැවිදිවීම කවර කලෙක්හි වන්නේද?

**69** "කවර කලෙක්හි මම මනාව සංයම ඇත්තාවූ කෘශවූ මධ්‍ය ප්‍රදෙශ ඇත්තාවූ සත්සියයක් භාර්‍ය්‍යාවන් හැර පැවිදි වන්නෙම්ද?

**70** "කවර කලෙක්හි මම සුවචවූ ප්‍රියතෙපුල් ඇත්තාවූ සත්සියයක් භාර්‍ය්‍යාවන් හැර පැවිදිවන්නෙම්ද, ඒ මෙබඳුවූ පැවිදිවීම කවර කලෙක්හි වන්නේද?

71 "කවර කලෙක්හි මම සියක් පලමකින් කරණලද සියගණන් රේඛා ඇති ස්වර්ණමය තලිය හැර පැවිදි වන්නෙම්ද, ඒ මෙබඳුවූ පැවිදිවීම කවර කලෙක්හි වන්නේද?

72 "කවර කලෙක්හි සියලු අලංකාරයෙන් සරසන ලද්දාවූ රන් පොරොදු ඇත්තාවූ ස්වර්ණමය ශීර්ෂාභරණ හා සරසනලද වස්ත්‍ර ඇත්තාවූ තෝමර හා අංකුශ ගත් අත් ඇති ඇතරුවන් නඟින ලද හස්ති රාජයන්ගෙන් යුක්තවූ හස්ති සමූහයෝ එකලාව වනයට යන්නාවූ මා අනුව නොයන්නාහුද ඒ මෙබඳුවූ පැවිදිවීම කවර කලෙක්හි නම් වන්නේද?

73 "සර්වාලංකාරයෙන් සරසන ලද උත්පත්තියෙන්ම ආජානීයවූ ශීඝ්‍ර ගමන් ඇත්තාවූ සෛන්ධවයන්ගෙන් යුක්තවූ කරවාලායුධ හා දුනු දරන්නාවූ අශ්වාරෝහකයන් විසින් නගින ලද අශ්ව සමූහයෝ කවර කලෙක්හි වනයට යන්නාවූ මා අනුව නොයන්නාහුද, කවර කලෙක්හි එහි මෙබඳුවූ පැවිදිවීම වන්නේද?

74-75 "කවර කලෙක්හි සරසනලද (ii) ඔසවනලද ධවජ ඇති අතුරණ ලද දිවිසම් ඇති තවද ව්‍යාඝ්‍ර සම් ඇති සර්වාලංකාරයෙන් සැරසූ දුනු ගත් අත් ඇති සැට්ට ලනලද රියැදුරන් විසින් නගිනා ලද්දාවූ (iii) රථ පංක්තිහු (iv) වනයට යන්නාවූ අනුව නොයන්නාහුද ඒ මෙබඳු පැවිදිවීම කවර කලෙක්හි වන්නේද,

76-77 "කවර කලෙක්හි ස්වර්ණමය රථයෝ-(මෙහි 74 75 (iv) යෙදිය යුතුයි)

78-79 "කවර කලෙක්හි සරසන ලද (මෙම 74-75 (ii) යෙදිය යුතුයි) රිදීයෙන් කළ රථයෝ (මෙහි 74 75 (iv) යෙදිය යුතුයි)

80-81 "කවර කලෙක්හි සරසනලද (මෙහි 74-75 (ii) යෙදිය යුතුයි) අසුන් යොදන ලද රථයෝ (මෙහි 74-75 (iv) යෙදිය යුතුයි)

82-83 "කවර කලෙක්හි සරසනලද (මෙහි 74-75 (ii) යෙදිය යුතුයි)

ඔටුවන් යොදන ලද රථයෝ (මෙහි 74-75 (iv) යෙදිය යුතුයි)

**84-85** "කවර කලෙක්හි සරසන ලද (මෙහි 74-75 (ii) යෙදිය යුතුයි)

ගවයන් යොදන ලද රථයෝ (මෙහි 74-75 යෙදිය යුතුයි)

**86-87** "කවර කලෙක්හි සරසන ලද (මෙහි 74-75 (ii) යෙදිය යුතුයි)

එළුවන් යොදනලද රථයෝද (මෙහි 74-75 (iv) යෙදිය යුතුයි)

**88-89** කවර කලෙක්හි සරසන ලද (මෙහි 74-75 (ii) යෙදිය යුතුයි) තිරෙළුවන් යොදන ලද රථයෝ (මෙහි 74-75 (iv) යෙදිය යුතුයි)

**90** "කවර කලෙක්හි සැරසූ නගන ලද ධජ ඇති අතුරණ ලද දිවිසම් ඇති තවද ව්‍යාඝ්‍ර සම් ඇති සියලු අලංකාරයෙන් හෙබියාවූ දුනුගත් අත්ඇති සැට්ට ලන ලද රියැදුරන් නැගුණු මුවන් යෙදූ රථයෝ වනයට යන්නාවූ මා අනුව නොයන්නාහුද ඒ මෙබඳු පැවිදිවීම කවර කලෙක්හි වන්නේද?

**91** "සර්වාලංකාරයෙන් සැරසුනාවූ නිල්වන් සැට්ට දරන්නාවූ තෝමරය හා අකුසු ගත් අත් ඇත්තාවූ ශූරවූ ඇතරුවෝ කවර කලෙක්හි වනයට යන්නාවූ මා අනුව නොයන්නාහුද, ඒ මෙබඳු පැවිදිවීම කවර කලෙක්හි නම් වන්නේද?

**92** "කවර කලෙක්හි සියලු අලංකාරයෙන් සැරසුනාවූ නිල් සැට්ට දරන්නාවූ කරවාලායුධ දුනු දරන්නාවූ ශූරවූ අසරුවෝ (ii) වනයට යන්නාවූ මා අනුව නොයන්නාහුද ඒ මෙබඳුවූ පැවිදිවීම කවර කලෙක්හි නම් වන්නේද?

**93** "දුනු හියවුරුගත් අත් ඇති ශූරවූ ධනුර්ධයෝ (මෙහි 92 (ii) යෙදිය යුතුයි)

94 "සර්වාලංකාරයෙන් සැරසුනාවූ විසිතුරු සැට්ට දරන්නාවූ සවර්ණමය හිස් වෙළුම් ඇත්තාවූ ශූරවූ රාජ පුත්‍රයෝ (මෙහි 92 (ii) යෙදිය යුතුයි)

95 "අලංකාරවූ වස්ත්‍රවලින් සැරසුනාවූ රත්සඳුන් ගල්වන ලද ශරීරාවයව ඇත්තාවූ උතුම් කශීසලු දරන්නාවූ බ්‍රාහ්මණ සමූහයෝ කවර කලෙක්හි වනයට යන්නාවූ මා අනුව නොයන්නාහුද ඒ මෙබඳු පැවිදිවීම කවර කලෙක්හි නම් වන්නේද,

96 "කවර කලෙක්හි සර්වාලංකාරයෙන් සැරසුනාවූ සත් සියයක් ස්ත්‍රීහු (ii) වනයට යන්නාවූ මා අනුව නොයන්නාහුද, ඒ මෙබඳුවූ පැවිදිවීම කවර කලෙක්හි නම් වන්නේද?

97 "කවර කලෙක්හි මනා සංයම ඇත්තාවූ කෘශවූ මධ්‍ය ප්‍රදෙශ ඇති සත් සියයක් භාර්‍ය්‍යාවෝ (මෙහි (ii) යෙදිය යුතුයි)

98 "කවර කලෙක්හි සුවචවූ ප්‍රිය තෙපුල් ඇති සත් සියයක් භාර්‍ය්‍යාවෝ වනයට යන්නාවූ මා අනුව නොයන්නාහුද ඒ මෙබඳු පැවිදිවීම කවර කලෙක්හි නම් වන්නෙද?

99 කවර කලෙක්හි හිස මුඩු කළාවූ සඟල සිවුරක් පොරවන ලද මම පාත්‍රයක් ගෙණ පිඩු පිණිස හැසිරෙන්නෙම්ද ඒ මෙබඳු පැවිදිවීම කවර කලෙක්හි නම්වන්නේද?

99 "කවර කලෙක්හි මම මහා මාර්ගයෙහි හැර දමන ලද පාංශුකූල වස්ත්‍ර වලින් සඟල සිවුරක් දරන්නෙම්ද ඒ මෙබඳු පැවිදිවීම කවර කලෙක්හි නම් වන්නේද?

100 "කවර කලෙක්හි මම සත් දවසක් බැඳගෙණ වස්නා කල්හි වර්ෂා ජලයෙන් තෙමුනේ තෙත්වූ සිවුරු ඇත්තේ පිඩු පිණිස හැසිරෙම්ද, ඒ මෙබඳුවූ පැවිදිවීම කවර කලෙක්හි නම් වන්නේද?

101 "කවර කලෙක්හි මම සිටිමින් ගසක් හැර ගසක් වනයක් හැර වනයක් අපේක්ෂා නොකර වාසය කරන්නෙම්ද, ඒ මෙබඳු පැවිදිවීම කවර කලෙක්හි නම්වන්නේද?

102 "කවර කලෙක්හි මම පර්වත දුර්ගම ස්ථානවල පහව ගියාවූ භය ඇත්තේ තනිව හැසිරෙන්නෙම්ද, ඒ මෙබඳු පැවිදිවීම කවර කලෙක්හි වන්නේද?

103 "කවර කලෙක්හිම වීණා වාදකයෙක් සත් තැනක් ඇත්තාවූ සිත්කළුවූ වීණාව මෙන් සිත ඍජු කරන්නෙම්ද ඒ මෙබඳු පැවිදිවීම කවර කලෙක්හි වන්නේද,

104 "කවර කලෙක්හි මම සමකරුවෙක් කපා හරිනලද සම් ඇති පාවහනක් මෙන් දිව්‍යවූද මානුසිකවූද කාමසඤ්ඤොා ජනයන් සිඳින්නෙම්දැයි" මහාජනක රජතෙම කීයේය.

105 "සියලු අලංකාරයෙන් සැරසුනාවූ ඒ සත් සියයක් ස්ත්‍රීහුද කුමක් හෙයින් අප හැර යන්නෙහි දැයි හිස අත් බැඳගෙණ හැඬුවාහුය.

106-107 "මනා සංයම ඇත්තාවූ කෘශවූ මධ්‍ය ප්‍රදේශ ඇති ඒ 'සුවචවූ ප්‍රිය තෙපුල් ඇති ඒ සත් සියයක් ස්ත්‍රීහු කුමක්හෙයින් අප හැර යන්නෙහිදැයි හිස අත් බැඳ ගෙණ හැඬූහ.

108 "සියලු අලංකාරයෙන් සැරසුනාවූ ඒ සත් සියයක් භාර්‍ය්‍යාවන්ද හැර ප්‍රව්‍රජ්‍යාව විසින් පෙරටු කරණලද රජතෙම පිටත්ව ගියේය.

109-110 "මනා සංයම ඇත්තාවූ ඒ සත් සියයක් ස්ත්‍රීන්ද හැර, "සුවචවූ ප්‍රිය තෙපුල් ඇති ඒ සත් සියයක් ස්ත්‍රීන්ද හැර ප්‍රව්‍රජ්‍යාව විසින් පෙරටු කරණලද රජතෙම පිටත්ව ගියේයි.

111 "ඒ රජතෙම සියක් පලමකින් කළාවූ සියගණන් රේඛා ඇති රන් තලිය හැර දෙවෙනි අභිෂේකයක් මෙන් ඒ මැටි පාත්‍රය ගත්තේය.

112 "මහරජ, ගෙවල් ගිනි ගොඩවල් මෙන් ඇවිල ගත්තාහ. කොටස් වශයෙන් බඩු ගබඩාවල් දැවෙත්. එහි රිදීද රත්රන්ද මුතු ද වෛදූර්‍ය්‍ය මැණික්ද බොහෝ වෙත්.

113 "මැණික්ද සක් මුතුද වස්ත්‍ර ජාතිද රන්වන් සඳුන්ද අඳුන් දිවිසම්ද දලකඩ බඩුද ලෝහ භාණ්ඩද කාල ලෝහයෙන්

කළ බඩුද බොහෝ වෙත්. මහරජ, එනු මැනව. නවතිනු මැනව ඔබගේ ඒ ධනය විනාශනොකරණු මැනවැයි" සීවලී බිසව කීයේය.

114 "යම්බඳු අපට කිසිවකුත් නැත්තේද, ඒ අපි ඒකාන්තයෙන් ඉතා සුවසේ ජීවත්වෙමු. මියුළු නුවර දනු ලබන කල්හි මාගේ කිසිවකුත් නොදැවෙන්නේයයි" රජතෙම කීයේය.

115 "මහරජ, වනගත සොරු පැමිණියාහු ඔබගේ ඒ රට වනසත්. මහරජ, එනු මැනව. නවතිනු මැනව. මේ රට විනාශ නොකරණු මැනවැයි සීවලි බිසව කීයේය.

116 "යම්බඳුවූ අපට කිසිවක් නැත්තේද, ඒ අපි ඒකාන්තයෙන් ඉතා සුවසේ ජීවත් වෙමු. රට පැහැර ගනු ලබන කල්හි මාගේ කිසිවකුත් නොනැසේ.

117 "යම්බඳුවූ අපට කිසිවක් නැත්තේද, ඒ අපි ඒකාන්තයෙන් ඉතා සුවසේ ජීවත්වෙමු. ආභස්සර නම් බඹ ලොව වැසි දෙවියන් මෙන් ප්‍රීතිය ආහාර කොට ඇත්තෝ වන්නෙමුයි" රජතෙම කීයේය

118 "කවර කරුණක් නිසා මහජනයාගේ මේ ඝෝෂාව වේද, ගමෙහි මෙන් කවර නම් කිලිකිලි ශබ්දයක්ද ශ්‍රමණවූ ඔබම විචාරමු. කුමක් නිසා මේ මහජනතෙම රැස්වේදැයි" නාරද කාශ්‍යප නම් තාපසතෙම ඇසීය.

119 "ඔවුන් හැර යන්නාවූ මා නිසා මෙහි මේ ජනයා රැස්වූයේය. සීමාව ඉක්මවා අනගාරිය මුනි සංඛ්‍යාත තපසට යන්නාවූ පැවිදිවීමියි සතුටින් යුක්තවූ මා දැනගෙණ කුමට විචාරන්නෙහිදැයි" රජතෙම ඇසීය.

120 "මේ පැවිදිවීම කෙළෙසුන් තරණය කෙළේයයි නොසිතව, මෙයින් ක්ලේශයන් තරණය කළහැකි නොවේ. උපද්‍රවයෝ බොහෝ වෙත්යයි" තාපසතෙම කීයේය.

121 "යමෙක් මේ ආත්මයෙහිද පරලෙව්හිද කාම සම්පත් නොපතන්නේද, එසේ වාසය කරන්නාවූ මට කවර නම් උවදුරෙක් වන්නේදැයි මහසත්තෙම කීයේය.

122 "නිදා ගැණීමය. අලස කමය ඇනුම් ඇරීමය නොඇල්මය. බත් මතය යන බොහෝවූ උපද්‍රවයෝ ඔබගේ සිරුරෙහි පිහිටියාහු වාසය කෙරෙත්යයි" නාරද තාපසතෙම කීයේය.

123 "පින්වත් බ්‍රාහ්මණය, ඒකාන්තයෙන් නුඹ මට යහපත්කොට අනුශාසනා කෙරෙහිය. නිදුකාණෙනි, ඔබ කවරෙක් වෙහිදැයි බ්‍රාහ්මණවූ ඔබම විචාරමියි" මහසත්තෙම කීයේය.

124 "පින්වත, නාරදයයි මාගේ නාමය වේ. කාශ්‍යප යයි ගෝත්‍ර වශයෙන් මා දනිත්. සත්පුරුෂයන් හා සමාගමය යහපත් වේයයි. පින්වත්හුගේ සමීපයෙහි ආයෙමි."

125 "ඒ ඔබට ප්‍රව්‍රජ්‍යාව පිළිබඳ සියලු සතුට වේවා. සතර බ්‍රහ්ම විහරණයෙන් යුක්තව පවතීවා. යමක් අඩු නම් එය ඉවසීමෙන්ද සංසිඳීමෙන්ද සම්පූර්ණ කරව.

126 "අවමානයද දුරු කරව, අතිමානයද දුරු කරව, දශ කුශල කර්මයද පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති ඥානයද මහණ දම්ද සකස්කොට පවතුවයි" (නාරද තාපසතෙම අවවාද කොට ගියේය)

127 "පින්වත් මහාජනක රජ, බොහෝවූ ඇත්තුද අශ්වයන්ද නගරයන්ද ජනපදයන්ද හැර පැවිදිවූ ඔබ කබලෙක්හි හෙවත් මැටි පාත්‍රයෙහි ඇලීමට පැමිණියෙහිය.

128 "එම්බා මහාජනක රජ, කිමෙක්ද ඒ දනව් වැස්සෝද මිත්‍රාමාත්‍යයෝද නෑයෝද ඔබට කිසි අපරාධයක් කළාහුද කුමක්හෙයින් මේ මැටි පාත්‍රය කැමතිවූයේදැයි" මිගාජින නම් තාපසතෙම ඇසීය.

129 "එම්බා මිගාජින නම් තාපසය, ඒකාන්තයෙන්ම මම කිසිකලෙකත් කිසි නෑයෙකු අධර්මයෙන් නොදිනු වෙමි. නෑයෝද මා නොදනුහයි" මහසත්තෙම කීයේය.

130 "පින්වත් මිගාජින නම් තාපසය, යම් ක්ලෙශ වස්තුවෙක්හි ඇළුනාවූ පෘථග්ජනතෙම නසනු ලැබේද, බඳිනු

ලැබේද මෙහි කෙලෙසුන් විසින් කනු ලබන්නාහු කෙලෙසුන් විසින්ම මඩ කරණ ලද්දාවූ, ලෝකයාගේ පැවැත්ම දැක මම මේ කාරණයම උපමාකොට පිඩු සිඟන්නෙක් වීමියි" මහසත් තෙම කීයේය.

131 "එම්බා මහරජ, ඔබගේ පින්වත් අනුශාසක තෙම කවරේද" මේ ඔබ විසින් කියනලද පිරිසිදු වචනය කවරෙකුගේ වචනයක්ද? ශ්‍රමණයෙකුගේ ආකාරය හෝ ශ්‍රමණයෙකුගේ විද්‍යාව හෝ හැර යම්සේ දුක ඉක්මවාද, එසේ පවත්නාවූ ශ්‍රමණයෙකු නොම කියද්ද එහෙයිනියි" මිගාජිනතෙම ඇසීය.

132 "පින්වත් මිගාජින තාපසය, ඒකාන්තයෙන් මම කිසිකලෙකත් කිසියම් ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ සත්කාර කොට ඇසීමට නොපැමිණියෙමියි" මහසත් තෙම කීයේය.

133-134 "පින්වත් මිගාජින තාපසය මනහර ගීතයන් ගායනා කරණුලබන කල්හි මිහිරි නාද ඇති වාද්‍යයන් වාදනය කරණුලබන කල්හි, තූර්‍ය්‍ය වාදනයෙන් කරණලද ඝෝෂා ඇති කුලු තාලම් වලින් යුක්ත ශබ්ද ඇති කල්හි මහත්වූ රාජානුභාවයෙන්ද ශෝභාවෙන්ද දිළිසෙමින් යන්නාවූ, "ඒ මම ඵල කැමැත්තාවූ මිනිසුන් විසින් විනාශ කරණු ලබන්නාවූ ප්‍රාකාරය ඇතුළත උයනෙහි පිහිටියාවූ ඵල දරණ අඹ රුකක් දුටුවෙමි.

135 "මිගාජින තාපසය, ඒ මම වනාහි උද්‍යානශ්‍රිය බලා ඇතු පිටින් බැස ඵල දැරුවාවූ ඵල නසනලද අඹගස මුලට පැමුණුනෙමි.

136 "විනාශ කරණලද කොළ අතු පවා සිඳිනලද නසනලද, ඵල ඇති අඹගස දැක ඉක්බිති සිත්කළුවූ නීලවර්ණයෙන් බබළන්නාවූ මේ අනික් ඵල නැති අඹරුක දුටුයෙමි.

137 "යම්සේ ඵල ඇත්තාවූ අඹරුක නසන ලද්දේද, මෙපරිද්දෙන්ම බොහෝ කරදර ඇත්තාවූ ඉසුරුමත්වූ අපටද පසමිතුරෝ හිංසා කරන්නාහු නොවෙද්ද?

138 "අඳුන් දිවිසම නිසා දිවියා නසනු ලැබේ. දළ නිසා හස්තිතෙම නසනු ලැබේ. ධනය හේතුකොට ගෙණ ධන ඇත්තවුන් නසයි. නිවාසස්ථානයක් නැත්තාවූ සන්ථවයක් නැත්තාවූ පැවිද්දහු කවරෙක් නසාද? ඵල ඇත්තාවූ අඹ ගසද ඵල නැත්තාවූ අඹ ගසද යන ඒ දෙදෙන මාගේ ශාස්තෘවරයෝවූහයි" මහසත්තෙම කීයේය.

139 "මහරජ, රජතෙම පැවිදිවූයේයයි ඇතරුවෝද සේනාවන්හිවූවෝද රථ සේනාවෝද පාබල සේනාවෝද යන සියලු ජනතෙම අතිශයින් පෙළුනේය.

140 "ජන සමූහයා අස්වසා නුවර ආරක්ෂා තබා පුත්‍රවූ දීඝාවූ කුමාරයා රාජ්‍යයෙහි පිහිටුවා ඉන්පසු පැවිදිවන්නෙහි වායි" සීවලී දේවිය කීයේය.

141 "එම්බා දේවිය, මා විසින් දනව් වැස්සෝ හරණා ලද්දාහ. මිත්‍රාමාත්‍යයෝද නෑයෝද හැර දමන ලදහ. විදේශ වාසීන්ගේ රට වර්ධනය කරන්නාවූ දීඝාවූ නම් පුත්‍රයෝ ඇත්තාහ. ඔව්හු මියුළු නුවර රාජ්‍යය කරවන්නාහු යයි" රජ තෙම කීයේය.

142 "එම්බා දේවිය, මාගේ යම් වචනයකට කැමති වේද, එව. එයින් තිට අනුශාසනා කරමි. තී රාජ්‍යය කරවන්නී කය වචනය සිත යන යමකින් දුගතියට යන්නෙහිද, එබඳුවූ දුශ්චරිත පව් බොහෝ කරන්නෙහිය.

143 "අනුන් විසින් දෙනලද්දාවූ, අනුන් විසින් නිමවන ලද්දාවූ, ආහාරයකින් යැපෙව, මේ පිඩු සිඟා යැපීම නම් ප්‍රාඥයන්ගේ ස්වභාවයකැයි" බිසවට අවවාද කෙළේය.

144 "යමෙකුත් ඉදින් සතරවැනිවූ බත් අනුභව කරණ කාලයෙහි අනුභව නොකරන්නේද, නොනසාවූ මරණ ඇත්තේම ක්ෂුධාවෙන් මිය යන්නේද, නමුත් වැලි තැවරුණාවූ අයහපත්වූ ආහාරය වළඳන්නේද, කුලපුත්‍ර ස්වභාව ඇත්තාවූ සත්පුරුෂතෙම මෙබඳු ආහාරය නොවළඳන්නේය.

145 "මහරජ, ඔබ යම් බල්ලා විසින් ඉඳුල් කළ ආහාරයක් වළඳන්නෙහිද, ඒ මේ වැළඳීම යහපත් නොවේ. ඒ මේ වැළඳීම ශෝභන නොවේයයි" බිසව කීයේය.

146 "එම්බා සීවලී දේවිය, ගිහිවූවහු විසින්ද ශූනකයෙකු විසින්ද හැර දමනලද යමක් වේනම්, ඒ පිණ්ඩපාතය තෙම මා විසින් නොකෑයුතු නොවේ. මේ ලෝකයෙහි දැහැමින් ලද්දාවූ යම්කිසි භෝග කෙනෙක් වෙත්නම්, ඒ සියල්ල අනුභව කටයුතුය. නිරවද්‍යයයි කියන ලද්දේයයි" රජතෙම කීයේය.

147 "නිතර මම ලඟ සයනය කරන්නාවූ සැරසෙන ස්වභාව ඇත්තාවූ එම්බල දැරිය කුමක්හෙයින් තීගේ එක් අතක් ශබ්ද කෙරේද එක් අතක් ශබ්ද නොකෙරේදැයි රජතෙම ලදැරියකගෙන් ඇසීය.

148 "ශ්‍රමණයන් වහන්ස, මාගේ මේ අතෙහි වළලු දෙකක් දමන ලද්දාහ. එකට හැපීමෙන් ශබ්දය හටගනියි. දෙවැන්නක් ඇත්තහුගේම මේ ස්වභා ගතිය වේ.

149 "ශ්‍රමණයන් වහන්ස, මාගේ මේ අතෙහි එක් වළල්ලක් දමනලදී. දෙවැන්නක් නැති හෙතෙම ශබ්ද නොකරයි. පහවූ කෙළෙස් ඇති මුනිවරයෙකු මෙන් සිටියි.

150 "දෙවැන්නක් ඇත්තේ විරුද්ධවාදයට පැමිණියෙක්වේ. තනිවූයේ කවරෙකු හා විරුද්ධ වාද කරන්නේද? එහෙයින් ස්වර්ග සැපය කැමැත්තාවූ ඒ ඔබවහන්සේට එකලා බව කැමතිවේවැයි" ලදැරිය කීයේය.

151 "එම්බා සීවලී දේවිය, ලදැරිය විසින් කියනලද ගාථාවන් ඇසුවෙහිය. වැඩකාරියක්වූ ඕතොමෝ දෙවැන්නක් ඇත්තහුගේම මේ ස්වභාවය වේයයි මට නින්දා කෙළේය

152 "සොඳුර, මගීන් විසින් ගමන් කළාවූ මේ දෙමං සන්ධියෙක් වේ. ඔවුන්ගෙන් තී එක් මාර්ගයක් ගනුව නැවත අනික් මාර්ගය මම ගනිමි" සීවලී දේවිය, තී මාගේ ස්වාමියායයි නොකියව. මමද නැවත මාගේ භාර්‍ය්‍යාවයයි නොකියමියි" රජතෙම කීයේය.

153 "මේ කථාවම කියන්නාහු ථූන නම් නුවරට පැමුණුනාහුය.

154 "එහි ඒ රජතෙම තමන්ගේ අනුභව කරණ වේලාව පැමිණි කල්හි හී වඩුවාගේ කොටුව වෙත පැමිණ සිටියේය. එහිද ඒ හී වඩුතෙම එක ඇසක් වසා එක ඇසකින් ඇදය බලන්නේය

155 "යහළු හී වඩුව, මෙසේ නුඹ හොඳට බලන්නෙහි දැයි, මාගේ වචනය අසව, එක ඇසක් පියා එක ඇසකින් ඇදය බළන්නෙහිය යන යමක් ඇද්ද එයයි."

156 "පින්වත් ශ්‍රමණයන් වහන්ස, දෙ ඇසින් බලන කල්හි විශාලවූවක් මෙන් වැටහෙයි. අන්‍යවූ වක්වූ තැනට නොපැමිණ ඇද නැති බැව් කිරීමට සුදුසු නොවේ.

157 "එක ඇසක් පියාගෙණ එක ඇසකින් ඇදය බලන්නහුට අන්‍යවූ වංක ස්ථානය බලා ඇද නැති කිරීමට සුදුසුවේ.

158 "දෙවැන්නෙක් ඇත්තේ විවාදයට පැමිණියෙක් වන්නේය. එකලාවූයේ කවරෙකු හා විවාද කරන්නේද, ස්වර්ගයට යනු කැමැත්තාවූ ඒ ඔබවහන්සේට හුදකලාවීම රුචි වේවායි" හී වඩුතෙම අවවාද කෙළේය.

159 "එම්බා සීවලී දේවිය, හී වඩුවා විසින් කියනලද ගාථාවන් ඇසූවෙහිද, දෙවැන්නක් ඇත්තහුගේ මේ ස්වභාව යයි හීවඩුවා මට නින්දා කෙළේය.

160 "සොඳුර මගීන් විසින් ගමන්කළාවූ මේ දෙමන් සන්ධිය වේ. ඔවුන්ගෙන් තී එක් මාර්ගයක් ගණුව. නැවත මම මේ අනික් වග ගනිමි. තී මාගේ ස්වාමියා යයි මට නොකියව. මමද නැවත මාගේ භාර්‍ය්‍යාවයයි නොකියමියි" රජ තෙම කීයේය.

161 "සීවලී දේවීනි, වෙන්කොට ගන්නාලද මේ මුදු තණ ගොබය මෙන් නැවත තී හා එක්නොවව. මම තනිව වාසය කරන්නෙමි තීද තනිවම වාසය කරවයි සීවලී දේවියට අවවාද කෙළේයයි" වදාළේය.

539 **සාම ජාතකය:-** 1 "කවරෙක් නම් දිය ගෙණ යාමට ප්‍රමාදවූ මට ඊයකින් විද්දේද, ක්ෂත්‍රියවූ බ්‍රාහ්මණවූ වෛශ්‍යවූ කවරෙක් මට විද සැඟවීදැයි" සාම කුමාරතෙම ඇසුයේය.

2 "මාගේ මස් කෑයුතු නොවෙත්. සමින්ද ප්‍රයෝජනයක් නැත්තේය. එසේ ඇතිකල්හි කවර කාරණයකින් මට විදිය යුතුයයි හැඟීදැයි" කීයේය.

3 "නුඹ කවරෙක් හෝ වෙහිද කවරෙකුගේ පුතෙක් හෝ වෙහිද අපි තා කෙසේ දනිමුද, යහළුව මා විසින් විචාරණ ලද්දේ කියව, කුමකට මා විද සැඟවුනෙහිදැයි" සාම කුමරු ඇසීය.

4 "මම වනාහි කශී රට වැස්සන්ගේ රජවෙමි. පිළියක් නමැයි මා දනිත්. මාංශ ලෝභයෙන් රට හැර මම මුවන් සොයමින් හැසිරෙමි.

5 "මම දුනු ශිල්පයෙහිද දක්ෂවෙමි. සහස්සත්ථාම නම් දුන්න නගන්ට පුළුවන් බැවින් දළ්හධම්මයයි ප්‍රකටය. මාගේ හී පහරට පැමිණ හස්තිතෙමේද නොමිදෙන්නේයයි" පිළියක් රජතෙම කීයේය.

6 "ඔබද කවරෙකුගේ පුත්‍රයෙක් හෝ වෙහිද, අපි තා කෙසේ දනිමුද, පියාගේ හෝ තමන්ගේ හෝ නාමයද ගොත්‍රයද කියවයි" රජතෙම කීයේය.

7 "මහරජ, ඔබට යහපතක් වේවා. මම වැදි පුත්‍රයෙක්මි. සාමයයි ජීවත්වන්නාවූ මා නෑයෝ කැඳවූහ. ඒ මම අද මෙසේ මරුමුවට පැමිණියේ සයනය කරමි.

8 "මහරජ, විෂ සහිතවූ මහත්වූ හීයකින් මුවෙකු මෙන් විදිනලද්දේ වෙමි. බලව ස්වකීය ලේවල ගැලුනේ සයනය කරමි.

9 "හීතලය වම්පසින් ඇතුල්ව දකුනැලයෙන් නික්ම ගියේය. ලේ වමාරමි. ගිලන්වූයේ මම තා විචාරමියි කුමට මා විද සැඟවූයෙහිද?

10 "අඳුන් දිවිසම නිමිතිකොට දිවියා නසනු ලැබේ. දළ නිසා හස්තිතෙම නසනු ලැබේ. එකල්හි කවර කරුණකින් මා විදියයුතු කොට හැඟීදැයි" සාම කුමරු ඇසීය.

11 'පින්වත් සාමය, හීපහරට පැමිණියාවූ මුවෙක් ඉදිරිපස සිටියේය. තා දැක මුවා භයවී ගියේය. එයින් ක්‍රොධයතෙම මට උපන්නේයයි" පිළියක් රජ කීයේය.

12 යම් කලෙක පටන් තමා සිහි කෙරෙම්ද, යම්කලෙක පටන් නුවණැති බවට පැමිණියෙම්ද, මේතාක් වනයෙහි චණ්ඩ මෘගයන්වූ මුවෝද, මා දැක භය නොවෙත්.

13 "යම්කලක පටන් වැහැරි සිවුර පරිහරණය කෙරෙම්ද, යම්කලෙක පටන් යෞවන බවට පැමිණියෙම්ද, මේතාක් වනයෙහි චණ්ඩ මෘගයෝද මා දැක භය නොවෙත්.

14 "මහරජ, ගන්ධමාදන පර්වතයෙහි භයජනකවූ කිම් පුරිසයෝද වෙත්. පර්වතවලද වනාන්තර වලද ඔවුන් සමග සතුටු වෙමින් යමු. එසේ ඇතිකල්හි කවර කරුණකින් ඒ මුවා මට බියවන්නේදැයි" සාම කුමරු ඇසීය.

15 "එම්බා සාමයෙනි, මුවා ඔබ නොදැක්කේය. කුමට මම ඔබට බොරුකියම්ද, ක්‍රොධයෙන් හා ලොභයෙන් මඩනා ලද්දාවූ මම ඒ ඊය ඔබට විද්දෙමියි" පිළියක් රජ කීයේය.

16 "යහළුව, කොතැනින් හෝ අවුත් දියගෙණ ඊමට ගඟට යවයි' කවරෙකු විසින් හෝ එවනලද්දේ නුඹ මුවන්ගේ යයි සම්මතවූ මේ විලට ආයේදැයි" ඇසීය.

17 "මහරජ, මාගේ මව්පියෝ අන්ධවූහ. මේ මහත්වූ වනයෙහි මම ඔවුන් පෝෂණය කරමි. මම ඔවුන්ට දිය ගෙණ යන්නෙක්ව මෘග සම්මතවූ මේ විලට ආයෙමියි" සාම කුමරු කීයේය.

18 "ඒ මාගේ මව් පියන්ට භෝජනය පමණක් ඇත්තේය. එකල්හි සදවසක් ජීවත්වීම වන්නේය. ඒ මාගේ අන්ධවූ මව්පියෝ දිය නොලැබීමෙන් මැරෙන්නාහුයයි හඟිමි.

19 "මට මෙය එබඳු දුකක් නොවේ. පුරුෂයෙකු විසින් මෙය ලැබිය යුත්තේමය. මව නොදකිමි යන යම් දුකක්වේද එය මට මීට වඩා ඉතා දුක්වේ.

20 "මෙය මට එබඳු දුකක් නොවේ. මෙය පුරුෂයෙකු විසින් ලැබිය යුත්තේමය. පියා නොදකිමි යන යම් දුක ඇද්ද එය මට මීට වඩා ඉතා දුක්වේ.

21 "බැගෑපත්වූ මාගේ ඒ මව්තොමෝ ඒකාන්තයෙන් මධ්‍යම රාත්‍රියෙහිද පැසුළු රාත්‍රියෙහිද බොහෝ කලක් හඬන්නේය. කුඩා විලක් මෙන් වියලෙන්නේය.

22 "ඒ මාගේ බැගෑපත්වූ පියතෙම මධ්‍යම රාත්‍රියෙහිද පැසුළු රාත්‍රියෙහිද බොහෝ කලක් හඬන්නේය. කුඩා විලක් මෙන් වියලෙන්නේය.

23 "මහරජ, රෑ දාවල් නැගී සිටි වීයඈයෙන් ඔවුන්ට මෙහෙකිරීමෙන් අත්පා මිරිකීමෙන්ද උපස්ථාන කෙළෙමි. ඔව්හු 'පුත සාමයයි' වැළපෙන්නාහු මේ මහවනයෙහි ඇවිදින්නාහුය.

24 "ජීවිතය හැරදමන්නෙමිය යන යමකුත් වේද, අන්ධවූ මව්පියන් නොදකිමියි යන යමක් ඇද්ද, මේ දෙවැනි ශොකසල්ලය මාගේ හෘදය කම්පා කෙරේයයි" සාම කුමරු වැළපුණේය.

25 'සාම නම්වූ කළ්‍යාණ දර්ශනය හෙවත් යහළුව, දැඩිකොට නොවැළපෙව. මම කම්කරුවෙක්ව මේ මහා වනයෙහි නුඹමෙන් නුඹගේ ඒ මව්පියන් පෝෂණය කරන්නෙමි

26 "මම දුනු ශිල්පයෙහිද දක්ෂවෙමි. දළ්හ ධර්මයයි ප්‍රකටවූ මම කම්කරුවෙක්ව මේ මහා වනයෙහි නුඹ මෙන් නුඹගේ ඒ මව් පියන් පෝෂණය කරන්නෙමි.

27 "සිංහාදී මෘගයන් විසින් කා ඉතිරිකළ මස්ද වනයෙහි අල මුල් හා පලවැලද සොයමින් මම කම්කරුවෙක්ව මේ මහා වනයෙහි නුඹ මෙන් නුඹගේ ඒ මව් පියන් පෝෂණය කරන්නෙමි.

28 "පින්වත් සාමය, නුඹගේ මව්පිය දෙදෙනා යම් තැනෙක්හිද, ඒ වනය කවරේද, නුඹ යම්සේ ඔවුන් පෝෂණය කෙරේද, එසේම මමද ඔවුන් පෝෂණය කරන්නෙමියි" පිළියක් රජ කීයේය.

29 "මහරජ, මාගේ හිස පාර්ශ්වයෙහි යම් මේ ඒක පදික මාර්ගයක් වේද, මේ මගින් ගොස් ශබ්දය ඇසෙන දුර ප්‍රමාණයෙන් බාගයක් අතර යම්තැනක් වේද, එහි ඔවුන්ගේ

වාස ගෘහයවේ. එහි මාගේ මව්පියෝ වෙසෙත්. මේ මගින් ගොස් ඔවුන් පෝෂණයකරවයි” සාම කුමරු කීයේය.

30 “පින්වත් කශීරජතුමනි, ඔබට නමස්කාරවේවා. කශීරට වර්ධනය කරණ තැනැත්තෙනි, ඔබට නමස්කාරවේවා මාගේ මව්පියෝ අන්ධවූහ. මේ මහ වනයෙහි ඔවුන් පෝෂණය කරව

31 “එම්බා කශී රජතුමනි, ඔබට ඇඳිළිබැඳ ගනිමි. ඔබට නමස්කාරවේවා. මා විසින් කියන ලද්දේ මාගේ මව්පිය දෙදෙනාට මාගේ වැඳීම කියවයි” සාම කුමරු කීයේය.

32 “තරුණවූ යහපත් දැකුම් ඇත්තාවූ ඒ සාම කුමර තෙම මේ වචන කියා විෂවේගයෙන් මුසපත්වූයේ විසඥ බවට පැමිණියේය.

33 “ඒ රජතෙම ‘මම මෙතෙක්කල් ජරා මරණ නැත්තෙක්යයි’ සිතුවෙමි. අද මේ කළුරිය කළාවූ සාම කුමරු දැක කිසිවෙකුටත් මරුවාගේ නොපැමිණීමක් නැතැයි දැන ගතිමි. මින්පෙර එසේ නොදැක්කෙමිය. කරුණා සහගතව බොහෝකොට වැළපුනේය.

34 “විෂ සහිත හීයෙන් විදිනා ලද්දේ යමෙක් දැන් මා සමග කථාකෙළේද හෙතෙම මෙබඳු මරණයට පැමිණි කල්හි කිසිවකුත් කථා නොකරයි.

35 “එකල්හි මා විසින් කරණ ලද පාපය බොහෝ කලක් දුක් විඳීමට සමර්ථ වූ දරුණු කර්මයකි. ඒකාන්තයෙන් මම නරකයට යමි. මෙහි මට සැකයක් නැත්තේය.

36 “ඒ පව්කළ තැනැත්තාට අපරාධ කරන්නෙකැයි ගමෙහි නින්දා කරන්නාහු වෙත්. මිනිසුන් නැත්තාවූ මේ වනයෙහි කවරෙක් මට නින්දාකරන්ට සුදුසුවේද?

37 “ගමෙහි මිනිස්සු එක්ව කර්මයන් සිහි කරවත්. හෙවත් චෝදනා කරත්. මිනිසුන් නැත්තාවූ වනයෙහි කවරෙක් මට චෝදනා කරන්නේදැයි පිළියක් රජ වැළපුනේය.

38 “එකල්හි බහුසෝදරී නම් ඒ දෙවතාතොමෝ ගන්ධ මාදන පර්වතයෙහි අතුරුදහන්වූවා රජහුටම අනුකම්පාවෙන් මේ ගාථාවන් කීය.

39 "එම්බා මහරජ, නුඹ මහත් අපරාධයක් කෙළෙහිය. ලාමක කර්මයක් කෙළෙහිය. නිර්දෝෂවූ මව්පිය දෙදෙනාද පුත්‍රයාද යන මේ තුන්දෙනා එක ඊපහරින් නසන ලදහ.

40 "මහරජ මෙහි එව, යම්සේ තොපට සුගතියක් වන්නේද, එසේ තොපට අනුශාසනාකරමි. වනයෙහි අන්ධවූ ඒ මව්පිය දෙදෙනා සාමකුමරු මෙන් දැහැමින් පෝෂණය කරව. තා විසින් මෙසේ කළ කල්හි සුගතියට යන්නේයයි මම සිතමියි" දෙව්දුව කීවාය.

41 "ඒ රජතෙම කරුණාසහගතව බොහෝසේ වැළපී දියකලය හැරගෙණ දකුණුදිග බලා ගියේය.

42 "මෙහි ආවාවූ මිනිසෙකුගේ මෙන් මේ පියවර ශබ්දය කවරෙකුගේද, මේ ශබ්දය සාමකුමරුගේද, පියවර ශබ්දය නොවේ. නිදුකාණෙනි, මෙහි ආ නුඹ කවරෙක්වෙහිද,

43 "සාමතෙමේ සන්සුන්වම එයි. සන්සුන්ව පියවර තබයි. මේ ශබ්දය සාමකුමරුගේ ශබ්දය නොවෙයි. නිදුකාණෙනි, මෙහි ආ නුඹ කවරෙක්වෙහිදැයි" සාමකුමරුගේ අන්ධ පියාවූ දුකුල පණ්ඩිතතෙම ඇසීය.

44 "පින්වත මම කශීරට වැස්සන්ගේ රජවෙමි. පිළියක් රජයයි මා දනිත්. මාංශලොභයෙන් රටහැර අවුත් මම මුවන් සොයමින් හැසිරෙමි.

45 "දුනුශිල්පයෙහිද මම දක්ෂවෙමි. දළ්හ ධර්මයයිද ප්‍රකටය. මාගේ ඊපහරට පැමිණියාවූ හස්තියෙක්ද නොමිදෙන්නේයයි" රජතෙම කීයේය.

46 "මහරජ, ඔබට යහපත් ඊමක්වේවා. තවද ඔබට අයහපත් ඊමක් නොවේ. මෙහි පැමිණියේ අධිපතිවෙහිය. මෙහි යමක් ඇත්නම් එය පිළිගනුව

47 "විලිකුන් තිඹිරිපලද මොරද මිහිරිවූ එරමිණියද යන කුඩාපලවර්ග මෙහි බොහෝවෙත්. මහරජ, හොඳ හොඳ ඵල අනුභව කරව.

48 "පර්වත කඳුරැලියෙන් ගෙණාවාවූ මේ සිහිල් පියයුතු පැන්දවේ. මහරජ, ඉදින් ඔබ කැමැත්තෙහි නම් එයින් පැන්පානය කරවයි" පණ්ඩිතතෙම පිළිසඳර වශයෙන් කීයේය.

49 "අන්ධවූවාහු වනයෙහි මේ පල වර්ග දකින්ට නොහැකි වෙත්. කවරෙක් නම් මේ පලවැල ගෙණායේද, මේ මනාවූ පලවැල රැස්කිරීම අන්ධනුවූවෙකුගේ මෙන් මට වැටහේයයි" රජතෙම කීයේය.

50 "තරුණවූ යෞවනවූ ඉතා මහත් නොවූ සාමකුමාර තෙමේ යහපත් දැකුම් ඇත්තේවෙයි. ඔහුගේ දික්වූ කාල වර්ණවූ කෙශයෝ වෙත්. තවද ඒ කෙශයෝ ශූන නම් මස් කොටන පෙතලි අග මෙන් නැමුනාහුය.

51 "හෙතෙම ඒකාන්තයෙන් පලවැල ගෙණ හැර තබා මෙයින් කමඩලාව ඇරගෙණ දියගෙණ ඊමට ගඟට ගියේ ලඟ එන්නේයයි හඟිමියි" පණ්ඩිතතෙම කීයේය.

52 "නුඹට මෙහෙවර කරන්නාවූ යමෙක්වේද, යහපත් දැකුම් ඇත්තාවූ සාමයයි යම් කුමාරයෙකුට කියන්නහුද, මම ඒ සාමකුමරු මුවෙකුයයි සිතා විද මැරීමි.

53 "ඔහුගේ කාලවර්ණවූ කෙශයෝ දික්වූහ. ශූන නම් මස් කොටන පෙතැලි දග මෙන් වක්වූ අත් ඇත්තාහ. ලේ තැවරුණාවූ ඒ කෙශයන්හි මා විසින් නසන ලද සාමතෙමේ සයනය කෙරේයයි" රජතෙම කීයේය.

54 "එම්බා දුකුල පණ්ඩිතය, සාමතෙම නැසුයේයයි කියන්නාවූ කවරෙකු හා කථාකරන්නෙහිද? සාමතෙමේ නැසූයේයයි අසා මාගේ හෘදය වෙව්ලයි."

55 "ඇසටු ගසක්හුගේ සුලඟින් කම්පාකරණලද බාල පල්ලවයක් මෙන් සාමතෙමේ නසනලදැයි අසා මාගේ හෘදය වෙව්ලායයි" පාරිකා නම්වූ අන්ධ මව කීවාය.

56 "එම්බා පාරිකාවෙනි, ඒ මේ කශීරජතෙම මිග සම්මත ගං ඉවුරෙහි මුවා මරමි යන ක්‍රොධසිතින් සාමකුමරුට හීයකින් විද්දේය. ඔහුට අපි පාපයක් නොකැමැතිවෙමුයි" පණ්ඩිතතෙම කීයේය.

57 "දුකසේ ලැබුවාවූ යම් ප්‍රිය පුත්‍රයෙක් වනයෙහි අන්ධවූ අප පෝෂණය කෙළේද, ඒ එකම පුතු නසන ලද්දහු කෙරෙහි කෙසේ සිත කෝප නොකෙරෙම්දැයි" මම ඇසීය.

58 "දුකසේ ලද්දාවූ ප්‍රිය පුත්‍රවූ යම් සාමකුමාරයෙක් වනයෙහි අන්ධවූ මව්පියන් පොෂණය කෙළේද, ඒ එකම පුත්‍රයා නැසූ කල්හිද ක්‍රොධ නොකිරීම මැනවැයි" පණ්ඩිතයෝ කියත්යයි දුකූල පණ්ඩිතතෙම කීයේය.

59 "පින්වතුනි, සාමකුමාරතෙම නසන ලද්දේයයි කීමෙන් දැඩිකොට නොවැළපෙව්. මම කම්කරුවෙක්ව මේ මහවනයෙහි තොප දෙදෙනා පෝෂණය කරන්නෙමි.

60 "මම දුනු ශිල්පයෙහිද දක්ෂවෙමි. දළ්හ ධර්මයයි ප්‍රසිද්ධවූ මම කම්කරුවෙක්ව මේ මහවනයෙහි තොප දෙදෙනා පෝෂණය කරන්නෙමි.

61 "සිංහාදීන් විසින් කා දමන ලද මසද වනයෙහි අල මුල් පලවැලද සොයමින් මම කම්කරුවෙක්ව මහවනයෙහි තොප දෙදෙනා පොෂ්‍යකරන්නෙමියි" රජතෙම කීයේය.

62 "මහරජ, මෙතෙම ස්වභාව ධර්මයෙක් නොවේ. මෙය අපට නොහොබියි ඔබතුමා අපගේ රජවෙහිය. අපි ඔබගේ පා වඳිමුයි" ඒ දෙදෙනා කීහ.

63 "පින්වත් වැදි පුත්‍රයෙනි, තෙපි ධර්මය කියව්. තොප විසින් සත්කාරද කරණලද්දී, දුකූල පණ්ඩිතයෙනි. අද පටන් ඔබ මාගේ පියා වෙහිය. එම්බා පාරිකාවෙනි, ඔබද මාගේ මව් වෙහියයි," රජතෙම කීයේය.

64 "කශී රජතුමනි, ඔබට නමස්කාරවේවා. කශීරට වර්ධනය කරණ තැනැත්ත ඔබට නමස්කාර වේවා. ඔබට ඇඳිළි බඳිමි. සාමකුමරු යම්තැනෙක්හිද එතනට අප පමුණුවව.

65 "ඔහුගේ පාදයන් පිරිමදිමින් යහපත් දර්ශනීයවූ මුහුනද අතගා බලමින් තමන් ඔහු හා වැළඳගනිමින් කාලක්‍රියාවට පැමිණෙන්නෙමුයි" අන්ධවූ ඒ මව්පිය දෙදෙනා කීය.

66 "යම්තැනෙක්හි නසනලද සාමකුමරතෙම භූමියෙහි පතිතවූ චන්ද්‍රයා මෙන් ශයනය කෙරේද, ඒ පෙදෙස ඉතා උස්වූ චණ්ඩ මෘගයන්ගෙන් ගැවැසී ගත්තේවේ. අහස් කෙළවර මෙන් දක්නා ලැබේ.

67 "යම් පෙදෙසෙක්හි නසනලද සාමකුමාරතෙම පොළොවෙහි වැටුනාවූ හිරු දෙව්පුත් මෙන් ශයනය කෙරේද, මහත්වූ චණ්ඩ මෘගයන්ගෙන් ගැවැසීගත්තාවූ ඒ ප්‍රදෙශය අහස් කෙළවර මෙන් දක්නා ලැබේ.

68 "යම් ගංඉවුරෙක්හි නසනලද සාමකුමාරතෙම පස්වලින් ගැවසීගත්තේ ශයනය කෙරේද, ඒ පෙදෙස ඉතා උස්වූ වල්මෘගයන්ගෙන් ගැවැසී ගත්තාවූ අහස් කෙළවර මෙන් දක්නා ලැබේ.

69 "යම් ගංඉවුරෙක්හි සාමකුමාරතෙම නසන ලද්දේද ඒ ප්‍රදෙශය ඉතා උස්වූ වල්මෘගයන්ගෙන් ගැවසීගත්තාවූ අහස් කෙළවර මෙන් දක්නා ලැබේ. එබැවින් මේ ආශ්‍රමයෙහිම වාසය කරව්යයි" රජතෙම කීයේය.

70 "මහරජ, එහි සියයක්ද දහසක්ද දශදහසක්ද වල්මෘගයෝ වන්නාහු නමුත් මේ වනයෙහි වල්මෘගයන් කෙරෙහි අපට කිසි භයක් නැත්තේයයි" ඒ දෙදෙනා කීහ.

71 "එකල්හි කශීරජතෙම මහවනයෙහි අන්ධවූ ඔවුන්ගේ අත් අල්වාගෙණ යම් තැනෙක්හි නසනලද සාම කුමරු වූයේද එතනට ගියේය.

72 "මහවනයෙහි හැරදමන ලද පොළොවෙහි වැටුනාවූ චන්ද්‍රයා මෙන් වැටුනාවූ පස් තැවරුනාවූ සාම නම් පුත්‍රයා මේයයි දැන.

73 "මහවනයෙහි හැරදමනලද බිම වැටුනු හිරු දෙව් පුත් මෙන් ගංඉවුරෙහි වැටී උන් පසින් ගැවසී ගත්තාවූ සාම නම් පුත්‍රයා මේයයි දැන.

74 "මහවනයෙහි හැරදමනලද, ගංඉවුරෙහි වැටුනාවූ පස්වලින් ගැවැසී ගත්තාවූ සාමනම් පුත්‍රයා මේයයි දැන බැගෑපත්ව හැඬුවාහුය.

75 "ගංඉවුරෙහි වැටුනාවූ පස්වලින් ගැවසීගත්තාවූ සාමනම් පුත්‍රයා මේයයි දැන පින්වත අධර්මය වනාහි ලෝකයෙහි පවතීයයි හිස අත් බැඳගෙණ මව්පිය දෙදෙනා ඇඬූහ.

76 "(i) යහපත් දැකුම් ඇති සාමනම් පුත්‍රය, නුඹ බොහෝකොට (ii) නිදනලද්දෙහිය (iii) අද මෙබඳු කාල ක්‍රියාවට පැමිණි කල්හි යම් සාම කුමාරයෙක් කිසිවක් කථා නොකරන්නෙහිද එහෙයිනි.

77 "(මෙහි 76 (i) යෙදිය යුතුයි) මත්වූයෙහිය (මෙහි 76 (iii) යෙදියයුතුයි.)

78 "(මෙහි 76 (i) යෙදිය යුතුයි) ප්‍රමාදවූයෙහිය (මෙහි 76 (iii) යෙදිය යුතුයි)

79 "(මෙහි 76 (i) යෙදිය යුතුයි) කිපියේ වෙහිය. (මෙහි 76 (iii) යෙදිය යුතුයි)

80 "(මෙහි 76 (i) යෙදිය යුතුයි.) දපිතවූයේ වෙහිය.) (මෙහි 76 (iii) යෙදිය යුතුයි)

81 "යහපත් දැකුම් ඇති සාමනම් පුත්‍රය, නුඹ බොහෝ සෙයින් පහවගියාවූ සිත් ඇත්තේවෙහිය. අද මෙසේ කළුරිය කිරීමට පැමිණිකල්හි යමෙක් කිසිවක් කථා නොකරන්නෙහිද, එහෙයිනි.

82 "(i) අන්ධවූ මව්පියන්ට අත්පාමෙහෙවර කරන්නාවූ මේ සාමකුමාරතෙම කළුරිය කෙළේවේ. (ii) දැන් කවරෙක් අවුල්වූ මඩතැවරුණාවූ දල මඩුල්ල සෝධා පිළියෙල කරන්නේද,

83 "(මෙහි 82 (i) යෙදිය යුතුයි.) කවරෙක් නම් අද හමඳනා මුස්න හැරගෙණ ආශ්‍රමය හමදින්නේද,

84 "(මෙහි 82 (i) යෙදිය යුතුයි.) දැන් කවරෙක් සිහිල්වූද උණුවූද ජලයෙන් නහවන්නේද,

85 "(මෙහි 82 (i) යෙදිය යුතුයි.) කවරෙක් නම් දැන් වනයෙහි අල මුල් හා පලවැල අනුභව කරවන්නේදැයි" මව්පිය දෙදෙනා වැළපුනාහුය.

86 "මිගසම්මත නම් ගංඉවුරෙහි වැටුනාවූ පස් තැවරුනාවූ සාම නම් පුත්‍රයා දැක පුත්‍ර ශොකයෙන් පෙළුනාවූ මව්තොමෝ මෙසේ සත්‍ය ක්‍රියාකළහ.

87 "යම් සත්‍යයකින් මේ සාම කුමාරතෙම පෙර ධර්මයෙහි හැසිරෙන්නෙක්වූයේද (ii) මේ සත්‍ය වචනය කරණකොටගෙණ සාමකුමරුගේ විෂ නැසේවා.

88 "යම් සත්‍යයකින් මේ සාමකුමාරතෙම පෙර බ්‍රහ්මචාරීවූයේද (මෙහි 87 (ii) යෙදිය යුතුයි.)

89 "යම් සත්‍යයකින් මේ සාමකුමාරතෙම පෙර සත්‍ය වචන ඇත්තේවේද (මෙහි 87 (ii) යෙදිය යුතුයි.)

90 "යම් සත්‍යයකින් මේ සාමකුමාරතෙම පෙර මව් පියන් පෝෂණය කරන්නෙක්වීද (මෙහි 87 (ii) යෙදිය යුතුයි.)

91 "යම් සත්‍යයකින් මේ සාමකුමාරතෙම කුලදෙටුවන් පුදන්නෙක්වීද (මෙහි 87 (ii) යෙදිය යුතුයි.)

92 "යම් සත්‍යයකින් මේ සාමකුමාරතෙම මාගේ ප්‍රාණයටත් වඩා ඉතා ප්‍රියවීද (මෙහි 87 (ii) යෙදිය යුතුයි.)

93 "ඔබගේ පියා විසින්ද මා විසින්ද කරණලද්දාවූ යම්කිසි පිනක් ඇද්ද ඒ කුශලවූ සත්‍යය කරණකොටගෙණ සාමකුමරුගේ විෂ නැසේවායි" මව සත්‍යක්‍රියා කළාය.

94 "මිගසම්මත ගංඉවුරෙහි වැටුනාවූ පස් තැවරුණාවූ සාම නම් පුත්‍රයා මේයයි දැන පුත්‍ර ශොකයෙන් පෙළුනාවූ පිය තෙමේද මෙසේ සත්‍ය ක්‍රියා කෙළේය.

95-100 (මේ ඡෙද 87-92 ඡෙද මෙනි.)

101 "ඔබගේ මව විසින්ද මා විසින්ද කරණ ලද යම් පිනක් ඇද්ද, ඒ කුශලවූ සත්‍යය කරණකොට ගෙණ සාම කුමරුගේ විෂ නැසේවායි" යි පියා සත්‍ය ක්‍රියා කෙළේය.

102 "ඒ දෙවතා තොමෝ ගන්ධමාදන නම් පර්වතයෙහි අතුරුදහන්වූවා සාම කුමරුට අනුකම්පාවෙන් මේ සත්‍ය ක්‍රියාව කළාය.

103 "ගන්ධ මාදන නම් පර්වතයෙහි මම බොහෝ කල් වාසය කරන්නියක් වෙමි. සාම කුමරුට වඩා මට ඉතා ප්‍රියවූ අන්කිසිවෙක් විද්‍යමාන නොවේ. (ii) මේ සත්‍ය වචනය කරණකොටගෙණ සාම කුමරුගේ විෂ නැසේවා.

104 "ගන්ධ මාදන නම් පර්වතයෙහි සියලු වනවෘක්ෂයෝ ගන්ධයෙන් යුක්තවූවාහුවෙත්. (මෙහි 103 (ii) යෙදිය යුතුයි)"

105 ඔවුන් කරුණා සහගතව බොහෝකොට කථා කරමින් සිටියදීම යහපත් දැකුම් ඇති තරුණවූ සාම කුමාරතෙම වහානැගී සිටියේය.

106 "මම සාම නම් වෙමි. නුඹලාට යහපතක් වේවා. මම සුවසේ නැගී සිටියේ වෙමි. දැඩිකොට නොවැළපෙව්. මිහිරි කොට මට කථාකරව්යයි" සාමකුමරු කීයේය.

107 "මහරජ, ඔබට යහපත් ඊමක් වේවා. තවද ඔබට අයහපත් ඊමක් නොවේවා. මෙහි පැමිණි ඔබ අධිපතිවෙහිය. මෙහි යමක් ඇත්නම් අනුභව කරව.

108 "විලිකුන් මිහිරි තිඹිරි එලද මොරද කටුඑරමිණියද යන කුඩා පල වර්ග බොහෝ වෙත්. මහරජ, හොඳ හොඳ පල අනුභව කරව.

109 "මා විසින් කඳු රැළියෙන් ගෙණන ලද සිහිල්වූ පියයුතු පැන් ඇත. මහරජ ඉදින් ඔබ කැමැත්තෙහි නම් එයින් පාණය කරවයි" මහසත්තෙම රජුට පිළිසඳර වශයෙන් කීයේය.

110 "එම්බා සාම කුමරුනි, මම මුළාවට පැමිණියෙමි. අතිශයින් මුළාවෙමි. මට සියලු දිසාවෝ මුළාවෙත්. පරලොව ගියාවූ ඔබ දිටිමි. සාමය, ඔබ කෙසේ නම් ජීවිතය ලැබුයෙහි දැයි" රජතෙම ඇසීය.

111 "මහරජ, ජීවත්වන්නාවූද දැඩිවේදනා ඇත්තාවූ භවාංගයට බැසගත් චිත්ත සංකල්පනා ඇති පුරුෂයා ජීවත්වන්නාහුම මළාහුයයි හඟියි.

112 "මහරජ, දැඩි වේදනා ඇත්තාවූ ආශ්වාස ප්‍රශ්වසයන්ගේ වැළැක්මට පැමිණියාවූ ජීවත්වන්නාවූ ඒ පුරුෂයා ජීවත්වන්නහු මළාහුයයි හඟීයයි" සාම කුමරු කීයේය.

113 "යම් මිනිසෙක් මව හෝ පියා හෝ දැහැමින් පෝෂණය කෙරේද, මව්පියන් පෝෂණය කරන්නාවූ ඒ ජනයාට දෙවියෝද පිළියම් කරත්.

114 "යම් මිනිසෙක් මව හෝ පියා හෝ දැහැමින් පෝෂණය කෙරේද මෙලොවද, ඔහුට ප්‍රශංසා කෙරෙත්, පරලොවද හෙතෙම ස්වර්ගයෙහි සතුටුවේයයි" සාම කුමරු කීයේය.

115 "එම්බා සාම කුමාරය, මේ මම වැඩියක් මුළාවෙමි. මට සියලු දිශාවෝ මුළාවෙත්. මම ඔබ සරණකොට යෙමි. ඔබද මට පිහිට වෙවයි" රජතෙම කීයේය.

116 "ක්ෂත්‍රියවූ මහරජ, මව්පියන් කෙරෙහි දැහැමින් හැසිරෙව. (ii) මහරජ, මෙලොව ධර්මයෙන් හැසිර පරලොව ස්වර්ගයට යන්නෙහිය.

117 "ක්ෂත්‍රියවූ මහරජ, අඹුදරුවන් කෙරෙහි දැහැමින් හැසිරෙව. (116 (ii) යෙදිය යුතුයි.)

118 "ක්ෂත්‍රියවූ මහරජ, මිත්‍රා මාත්‍යයන් කෙරෙහි දැහැමින් හැසිරෙව (116 (ii) යෙදිය යුතුයි.)

119 "මහරජ, වාහණයන්හිද, බලයන්හිද දැහැමින් හැසිරෙව. (116 (ii) යෙදිය යුතුයි.)

120 "මහරජ, ගම් වැස්සන් කෙරෙහිද නියම්ගම් වැස්සන් කෙරෙහිද දැහැමින් හැසිරෙව. (116 (ii) යෙදිය යුතුයි.)

121 මහරජ, රටවැස්සන් කෙරෙහිද දනව් වැස්සන් කෙරෙහිද දැහැමින් හැසිරෙව. (116 (ii) යෙදිය යුතුයි.)

122 මහරජ මහණ බමුණන් කෙරෙහිද දැහැමින් හැසිරෙව. (116 (ii) යෙදිය යුතුයි.)

123 ක්ෂත්‍රියවූ මහරජ මෘගපක්ෂීන් කෙරෙහි දැහැමින් හැසිරෙව, (116 (ii) යෙදිය යුතුයි.)

124 මහරජ, ධර්මයෙහි හැසිරෙව, හැසිරෙන ලද ධර්මයතෙම සැප ගෙණ දෙන්නේවේ. (116 (ii) යෙදිය යුතුයි.)

125 "මහරජ, ධර්මයෙහි හැසිරෙව, හැසිරෙන ලද ධර්මය තෙම සැප ගෙණදෙන්නේවේ. මෙලොව ධර්මයෙහි හැසිර ශක්‍රයා සහිතවූ බ්‍රහ්මයා සහිතවූ දෙවියෝ මනාව හැසිරෙන ලද ධර්මයෙන් දෙව්ලොවට පැමිණියාහුය. එබැවින් මහරජ කුශල ධර්මයෙහි ප්‍රමාද නොවෙවයි" (මහසත් තෙම පිළියක් රජුට දශරාජ ධර්මයන් දෙශනා කෙළේය"

540 නිමි ජාතකයඃ- 1 මාගේ මේ කෙශයෝ වයස් පැහැරගන්නෝ වූහ. දෙවදූතයෝ පහළවූහ. එබැවින් දැන් මට පැවිදිවීමට සුදුසු කාලය වේයයි" නිමි රජතෙම කීයේය.

2 යම් කලෙක්හි පණ්ඩිතවූ කුසල් කැමතිවූ නිමි රජ තෙම වීද, එකල්හි මෙබඳු දක්ෂවූ පණ්ඩිතයෝ ලොව පහළ වෙත්යයි දෙවි මිනිසුන්ට ඒකාන්තයෙන් ආශ්චර්‍යයක් විය.

3 සතුරන් දමනය කරන්නාවූ සියලු විදෙශවාසීන්ගේ රජවූ හෙතෙම දානය දුන්නේය. ඒ දානය දෙන්නාවූ ඒ රජහට මෙබඳු කල්පනාවක් පහළවිය. 'දන්දීම හෝ සිල් රැකීම හෝ යන මොවුන්ගෙන් කවරක් නම් මහත්ඵල වේද?' කියායි.

4 දෙවියන්ට නායකවූ දහසක් නුවණැස් ඇත්තාවූ ශක්‍රතෙම ඒ රජුගේ කල්පනාව දැන ශරීරාලෝකයෙන් අඳුරු දුරුකෙරෙමින් පහළවිය.

5 ලොමු ඩැහැගත්තාවූ ඒ නිමි රජතෙම ශක්‍රයාට මෙසේ කීයේය. "ඔබ දෙවතාවෙක් වෙහිද, ගන්ධර්වයෙක් වෙහිද, නොහොත් පුරින්දද නම් ශක්‍රයා වෙහිද, ඔබඳුවූ වර්ණයක් මා විසින් දක්නා ලද්දේ හෝ අසන ලද්දේ හෝ නොමවේයයි" කීයේය.

6 ඒ සක්දෙව් රජතෙම ආලෝකය දැක භයින් ලොමු ඩැහැගත්තාවූ නිමි රජහු දැන මෙසේ කීයේය. "මම ශක්‍ර දෙවෙන්ද්‍ර වෙමි. ඔබගේ සමීපයට ආයෙමි. මහරජ, යම් ප්‍රශ්නයක් අසනු කැමැත්තෙහි නම් නිර්භයව අසව."

7 ඒ නිමි රජතෙමේද ඒ සක්දෙව් රජු විසින් කරණලද අවකාශ ඇත්තේ සක්දෙව් රජුට මෙසේ කීය. "මහත් බාහු

ඇත්තාවූ සියලු භූතයන්ට අධිපතිවූ ශක්‍රදෙවේන්ද්‍රය, ඔබ විචාරමි. දන්දීම හෝ සිල් රැකීම හෝ යන මෙයින් කවරක් නම් මහත්ඵල වේද?"

8 නර ශ්‍රෙෂ්ඨයා විසින් අසන ලද ඒ සක්දෙව් රජ තෙම නිමිරජුට මෙසේ කීය. බ්‍රහ්මචර්‍ය්‍යාවගේ හෙවත් ශීලයාගේ විපාකය දන්නාවූ හෙතෙම නොදන්නාවූ රජුට කීයේය.

9 ලාමකවූ බ්‍රහ්මචරිය ශීලයෙන් රජ කුලයෙහි උපදී. මධ්‍යමවූ බ්‍රහ්මචරිය ශීලයෙන්ද දෙව් බවට පැමිණේ. උතුම්වූ බ්‍රහ්මචරිය ශීලයෙන් පිරිසිදුවේ.

10 "ගිහිගෙයින් නික්මුනාවූ තපස් රකින්නාවූ යම් කෙනෙක් බ්‍රහ්ම කයෙහි උපදිද්ද, යාචකයන්ට සුදුසුවූ හෙවත් දන් දෙන්නාවූ කිසිවෙකු විසිනුත් මේ බ්‍රහ්ම කායයෝ නොලැබ හැක්කාහු වෙත්යයි" කීයේය.

11 "මහරජ, පෙර බරණැස් නුවර දුදීප නම් රජය. සාගර නම් රජය, සේලය මුචලින්දය, භගීරශය, උසීනරය, අට්ඨකය, අස්සකය, පෘථජ්ජනය, යන,

12 මේ රජවරුද අන්‍යවූ ක්ෂත්‍රිය රජවරුද බොහෝවූ බ්‍රාහ්මණයෝද නොයෙක් ආකාරයෙන් දන්දීම කොට ඔව්හු කාමාවචර භූමියයි කියන ලද මේ ප්‍රේත ලෝකය නොයික්මවූවාහුයයි" කීයේය.

13 "යම් කෙනෙක් ඒකාන්තයෙන් දෙවැන්නක් නැත්තාහු එකලාවූවාහු සිත් නොඅලවත්ද, යම්කෙනෙක් විවේකයෙන් හටගත්තාවූ ප්‍රීතිය නොලබද්ද, කිසිසේත් ඔව්හු ඉන්ද්‍රයාට හා සමාන සම්පත් ඇත්තාහු වෙද්ද, අනුන් අයත් සැප ඇත්තාවූ ඔව්හු ඒකාන්තයෙන් බැගෑපත්වූවාහු යයි" කියනු ලැබෙත්.

14-15 "යාමහනුය, සෝම යාගය, මනොජවය, සමුද්දය මාඝය, භරතය, ඉසිකාලිකරක්ඛිය යන මේ ඍෂීහු සත්දෙනද අංගීරශය, කාශ්‍යපය කිසවච්ඡය අකිත්තිය යන ගිහිගෙන් නික්මුනාවූ තපස් ඇත්තාවූ මේ ඍෂීහු ඒකාන්තයෙන් කාම ලෝකය ඉක්මවූවායයි" කීයේය.

16 "හිමවත් උතුරු දිශාවෙහි ගැඹුරුවූ ඉක්මවිය නොහැක්කාවූ සීදා නම් ගංගාවක් විය. එහි උභය පාර්ශවයෙහි රුවන් පර්වතයෝ හැමකල්හි ඇවිලෙන ගිනිමෙන් බබළත්

17 "ඒ ගංගාකච්ඡයෝ අතිශයින් වැඩුනාවූ තුවරලාවලින් යුක්තවූහ. පර්වතයෝ වැඩුනාවූ මල් පල දරන්නාවූ ගස් වලින් යුක්තවූහ. ඒ සිත්කළු ප්‍රදෙශයෙහි පෙර එක් කලෙක දශ දහසක් පමණ පුරාණ ඍෂීහු වාසය කළහ.

18 "එකල්හි මම දානයෙන් ශ්‍රෙෂ්ඨවූයෙමි. ශීලයෙන්ද ඉන්ද්‍රිය දමනයෙන්ද නිරුත්තරවූ ව්‍රත සමාදානයෙහි හැසිර එකීභාවයට ගියාවූ එකඟවූ සිත් ඇති ඍෂීන්ට උපස්ථාන කෙළෙමි.

19 "ජාති සම්පන්නවූද ජාතිසම්පන්න නොවූද එක මිනිසෙකුදු නොසලකා මම ඍජුභාවයට ගියාවූ ඒ තපස්වී සමූහයා නිරන්තරයෙන්ම නමස්කාර කරන්නෙමි. කුමක් හෙයින්ද? මනුෂ්‍යයෝ වනාහි කර්මය නෑයන්කොට ඇත්තාහ.

20 "සියලු වර්ණයෝ අධර්මයෙහි සිටියාහු යටදිසාවෙහිවූ නරකයෙහි වැටෙත්. සියලු වර්ණයෝ උතුම්වූ ධර්මයෙහි හැසිර නිරුද්ධ වෙත්යයි" කීයේය.

21 සුජම්පති නම් ශක්‍රදෙවෙන්ද්‍රතෙම මෙය කියා වෙදෙහ රජුට අනුශාසනා කොට දෙව්ලොවට ගියේය.

22 "පින්වත්නි, මෙහි රැස්වූ සියල්ලෝම මේ මා කියන්නාවූ යහපත් ස්වභාව ඇති මිනිසුන්ගේ උස්පහත්වූ බොහෝවූ ගුණ වර්ණනාව අසව්.

23 "කුසල් කැමැත්තාවූ මේ නිමි රජතෙම ඉතාම පණ්ඩිතවේ. සතුරන් දමනය කරන්නාවූ සියලු විදෙහ වාසීන්ගේ රජවූ හෙතෙම දානය දුන්නේය.

24 "ඒ දානය දෙන්නාවූ ඒ නිමි රජහට මෙබඳු කල්පනාවක් පහළවිය. දන්දීමද බ්‍රහ්මචර්‍ය්‍යාව හෙවත් සිල් රැකීමද යන මෙයින් කවරක් නම් මහත්ඵල වේද යනුයි ශක්‍රතෙම කීයේය."

25 "ලෝකයෙහි ඒකාන්තයෙන් ලොමුඩැහැගන්නාවූ පෙරනුවූවක් පහළවිය. එනම් යශපරිවාර ඇත්තාවූ අපගේ වේදේහ රජහට දිව්‍යරථයක් පහළවූයේයයි" මහජන තෙමේ කීයේය.

26 "දිව්‍ය රථාචාර්‍ය්‍යවූ මහත් ඍද්ධි ඇත්තාවූ මාතලී නම් දිව්‍යපුත්‍රතෙම මියුළු නුවර වාස භවන කොට ඇති වෙදෙහ රජුට මෙසේ පැවරීය.

27 "දිශාවන්ට අධිපතිවූ රාජෝත්තමය, මේ රථයට නැග එනු මැනව. ශක්‍රයා සහිතවූ ඒ තව්තිසා වැසි දෙවියෝ ඔබ දකිනු කැමැත්තාහු වෙත්. ඔබ සිහිකරන්නාහුම ඒ දෙවියෝ සුධර්මා නම් සභාවෙහි රැස්ව හිඳිත්යයි" මාතලී දිව්‍යපුත්‍ර තෙම කීයේය.

28 ඉක්බිති මියුළු නුවර වාසභවනකොට ඇති වේදේහ රජ තෙමේද ඉක්මන්ව හුනස්නෙන් නැගිට අභිමුඛව දිව්‍ය රථයට නැංගේය.

29 දිව්‍යරථයට නැංගාවූ නිමි රජුට මාතලී දිව්‍යපුත්‍ර තෙම මේ කීයේය 'දිශාවන්ට අධිපතිවූ මහරජ යම් මගකින් හෝ ගොස් පාපකර්ම කළවුන් දැක්කහැකිවෙද්ද, යම් මගකින් හෝ පිංකම් කළාවූ යම් මනුෂ්‍ය කෙනෙක් වෙත්නම් ඔවුන් දැක්කහැකිවෙද්ද, මෙයින් කවර මගකින් ඔබ ගෙණයම්දැයි" මාතලී දිව්‍යපුත්‍ර තෙම ඇසීය.

30 "එම්බා මාතලී නම් දිව්‍ය රථාචාර්‍ය්‍යය, යම් මගකින් හෝ ගොස් පාපකර්ම කළවුන් දැක්කහැකිවෙද්ද, යම් මගකින් හෝ ගොස් පිංකම් කළාවූ යම් මනුෂ්‍ය කෙනෙක් වෙත් නම් ඔවුන් දැක්කහැකිවෙද්ද, ඒ මාර්ග දෙකින්ම මා ගෙණයවයි" නිමි රජතෙම කීයේය.

31 "දිශාවන්ට අධිපතිවූ මහරජ, යම් මගකින් හෝ ගොස් පාපකර්ම කළවුන් දැක්කහැකිවෙද්ද, යම් මගකින් හෝ පිංකම් කළාවූ යම් මනුෂ්‍ය කෙනෙක් වෙත්නම් ඔවුන් දැක්ක හැකිවෙද්ද, මෙයින් කවර මගකින් ඔබ පළමුකොට ගෙණ යම්දැයි" මාතලීතෙම ඇසීය.

32 "රෞද්‍ර කර්ම ඇත්තවුන්ගේ යම් ස්ථාන වෙද්ද, දුශ්ශීල වූවන්ගේද යම් නිෂ්පත්තියක් වේද, පාපකර්ම ඇත්තවුන්ට වාසස්ථානවූ එබඳු නරකයන් පළමු කොට දකිමියි" නිමි රජතෙම කීයේය.

33 "මාතලී දිව්‍යපුත්‍රතෙම නිමිරජහට කැකෑරෙන්නාවූ ලෝදිය ඇත්තාවූ, රත්වූ ගිනිසිළු බඳු යානොහැකි වේතරණී නම් නදිය දැක්වූයේය.

34 නිමි රජතෙම ඒකාන්තයෙන් ඉතා දුර්ගමවූ නරකයෙහි වැටෙන්නාවූ ජනයා දැක මාතලී දිව්‍යපුත්‍රයාට මෙසේ කීයේය. "රථාචාර්‍ය්‍යය මෙය දැක මට වනාහි භය උපදී. මාතලී නම් දිව්‍යරථාචාර්‍ය්‍යය, ඔබ විචාරමි යම් මේ ජනයෝ වේතරණීයට වැටෙද්ද, මේ සත්වයෝ කිනම් පාපයක් කළාහු දැයි" ඇසීය.

35 මෙසේ විචාරණ ලද්දාවූ මාතලී නම් දිව්‍යරථාචාර්‍ය්‍ය තෙම ඔහුට ප්‍රකාශකෙළේය. පාපකර්මයන්ගේ විපාක දන්නාවූ හෙතෙම නොදන්නාවූ රජුට මෙසේ කීයේය.

36 "මනුෂ්‍යලෝකයෙහි ඉතා ලාමක ස්වභාව ඇත්තාවූ බලවත්වූ යම් කෙනෙක් දුර්වලවූවන්ට පීඩා කෙරෙද්ද, නොයෙක් ආකාරයෙන් ආක්‍රොෂ කෙරෙද්ද, රෞද්‍රවූ කර්ම ඇති ඔව්හු පව් රැස්කොට නිරන්තරයෙන් ඒකාන්තයෙන් ඒ ජනයෝ වේතරණීනම් නරකයෙහි වැටෙන්නේයයි" මාතලී තෙම කීයේය.

37 රක්තවර්ණවූ ශුනකයෝද, කබරවර්ණවූ ශුනකයෝද, ගිජුලිහිණියෝද, බිහිසුනුවූ වනකව්ඩෝද දුටුදුටුවන් කත්. "රථාචාර්‍ය්‍යය, මේ දැක මට වනාහි භය උපදියි. එම්බා මාතලී දේව සාරථිය, ඔබ විචාරමියි යම් මේ ජනයා වනකව්ඩෝ කද්ද, මේ සත්වයෝ කුමන පාපයක් කළාහුදැයි" ඇසීය.

38 (මේ ඡෙදය 35 ඡෙදය මෙනි)

39 "මසුරු බැවින් අනුන්ට නොදෙන්නාවූ අනුන්ට දෙනලද්ද වළක්වන හෙයින් තද මසුරුවූ ඉතා ලාමක ස්වභා ඇත්තාවූ මේ යම්කිසි කෙනෙක් මහණ බමුණන්ට නින්දා

කරන්නාහු හිංසා කෙරෙද්ද, ආක්‍රොෂ කෙරෙද්ද, රෞද්‍ර කර්මාන්ත ඇත්තාවූ ඔව්හු පව් රැස්කොට නිරයට යෙත්. වන කව්ඩෝ ඒ මේ ජනයා අනුභව කරත්යයි" මාතලීතෙම කීයේය.

40 ගිනිදැල් සහිතවූවාහු පෘථිවිය ආක්‍රමණය කරත්. රත්වූ යමුගුරුවලින්ද තලනුලබත් "සාරථිය මට වනාහි මෙය දැක භය උපදියි. එම්බා මාතලී නම් දේවසාරථිය ඔබ විචාරමි. යම් මේ ජනයෝ යමුගුරුවලින් පෙළන ලද්දාහු සයනය කෙරෙද්ද, මේ සත්වයෝ කිනම් පාපයක් කළාහුදැයි" ඇසීය.

41 (මෙය 35 වෙනි ඡේදය මෙනි.)

42 "මනුෂ්‍ය ලෝකයෙහි ඉතා ලාමක ස්වභාව ඇත්තාවූ යමක්හු නිරපරාධවූ පුරුෂයෙකුටද ස්ත්‍රියකටද තුමූ ලාමක ස්වභාවයෙන් යුක්තව හිංසා කෙරෙද්ද, ආක්‍රෝෂ කෙරෙද්ද, රෞද්‍ර කර්ම ඇත්තාවූ ඔව්හු පව් රැස්කොට නිරයට යෙත්. ඒ මේ ජනයෝය. මුගුරුවලින් පෙළන ලද්දාහු සයනය කෙරෙත්යයි" කීයේය.

43 "සමහරු ගිනි අඟුරුවලට වැටෙත්. ඔවුන්ගේ ඇඟෙහි ගිනි අඟුරු දමත්. හාත්පසින් දැවිනාවූ ශරීර ඇති හඬන්නාවූ සත්වයෝ සැලෙත්. "සාරථිය, මේ දැක මට වනාහි භය උපදියි. එම්බා මාතලී දේවසාරථිය, ඔබ විචාරමි. යම් මේ ජනයෝ අඟුරුවලින් ශරීරයෙහි විසුරුවද්ද, මේ සත්වයෝ කිනම් පාපයක් කළාහුදැයි" ඇසුයේය.

44 (මෙය 35 වෙනි ඡේදය මෙනි.)

45 "යම්කිසි කෙනෙක් සමූහයා සතු ධනය හේතුකොට ගෙණ බොරු සාක්ෂි ඉදිරිපත් කොට භය නැති කෙරෙද්ද, මහරජ, ඔව්හු ජනසමූහයාට මෙසේ ණය නැතිකොට රෞද්‍ර කර්ම ඇත්තාහු පව් රැස්කොට නිරයට යෙත්. ඒ මේ ජනයෝ අඟුරුවලට වැටී කම්පාවෙත්යයි" කීයේය.

46 ගිනිදැල් සහිතවූ දිලියෙන්නාවූ ඇවිලගත්තාවූ මහත්වූ ලෝසැල දක්නාලැබේ. සාරථිය මෙය දැකුමට වනාහි භය උපදියි. එම්බා මාතලී නම් දේවසාරථිය, ඔබ විචාරමි යම් මේ

ජනයෝ යටිකුරුවූ හිස් ඇත්තාහු ලෝ සැලට වැටෙද්ද, මේ සත්වයෝ කිනම් පාපයක් කළාහුදැයි" නිමිරජ තෙම ඇසීය.

47 (මෙය 35 ඡේදය මෙනි)

48 "මේ ලෝකයෙහි ඉතා ලාමක ස්වභාව ඇත්තාවූ යම් කෙනෙක් සිල්වත්වූ ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ හිංසා කරද්ද, ආක්‍රෝශ කරත්ද, රෞද්‍ර කර්ම ඇත්තාවූ ඔව්හු පව් රැස්කොට නරකයට යෙත්. ඒ මේ ජනයෝ යටිකුරු හිස් ඇත්තාහු ලෝකුඹු නිරයට වැටෙත්යයි" කීයේය.

49 තවද දිලියෙන යොත්වලින් ග්‍රීවය වෙලා උණු ලෝදියෙහි බහා ග්‍රීවය සිඳිත් "සාරථිය, මේ දැක මට වනාහි භය උපදියි. එම්බා මාතලි නම් දේව සාරථිය, ඔබ විචාරමි. යම් මේ ජනයෝ සිඳිනලද හිස් ඇත්තාහු සයනය කෙරෙද්ද, මේ සත්වයෝ කිනම් පාපයක් කාළහුදැයි" ඇසීය.

50 (මෙය 35 වෙනි ඡේදය මෙනි)

51 "මේ සත්ව ලෝකයෙහි ඉතා ලාමක ස්වභාව ඇත්තාවූ යම් කෙනෙක් පක්ෂීන් අල්වාගෙණ වෙහෙසට පමුණුවද්ද, මහරජ, ඔව්හු පක්ෂි සමූහයාට හිංසාකොට පව් රැස් කෙරෙත්. රෞද්‍ර කර්ම ඇත්තාවූ ඔව්හු පව් රැස්කොට නරකයට යෙත්. ඒ මේ ජනයෝ සිඳින ලද හිස් ඇත්තාහු සයනය කෙරෙත් යයි" කීයේය.

52 බොහෝ දිය ඇත්තාවූ නොගැඹුරු ඉවුරු ඇත්තාවූ මනා තොටුපලවල් ඇත්තාවූ මේ ගඟ ගලා බසියි. ග්‍රීෂ්මයෙන් තැවුනාවූ සත්වයෝ පැන් පානය කෙරෙත්. පානය කරන්නාවූද ඔවුන්ට පානය කරණ ජලය වී බොල් බවට පැමිණේ.

53 "සාරථිය, මට වනාහි මේ දැක භය උපදියි. එම්බා මාතලී නම් දේව සාරථිය, ඔබ විචාරමි. පානය කරන්නාවූද ඔවුන්ට ඒ බොන දිය වී බොල් බවට පැමිණේ. මේ සත්වයෝ කවර නම් පාපයක් කළාහුදැයි" ඇසීය.

54 (මෙය 35 වෙනි ඡේදය මෙනි)

**55** "මේ ලෝකයෙහි අපිරිසිදු කර්මාන්ත ඇත්තාවූ යම් කෙනෙක් පිරිසිදුවූ ධාන්‍යය බොල් හා මිශ්‍රකොට මිලදී ගන්නහුට දෙද්ද, ග්‍රීෂ්මයෙන් තැවුනාවූ පැන් බොනු කැමැත්තාවූ පානය කරන්නාවූද ඔවුන්ගේ බොන දිය බොල් බවට පැමිණේයයි" කීයේය.

**56** ඊවලින්ද අඩයටිවලින්ද තෝමරවලින්ද හඬන්නවුන්ගේ උභය පාර්ශවයන් විදිත්. "සාරථිය, මට වනාහි මේ දැක භය උපදියි. එම්බා මාතලී නම් දේව සාරථිය ඔබ, විචාරමියි යම් මේ ජනයෝ අඩයටිවලින් නසන ලද්දාහු සයනය කෙරෙද්ද, මේ සත්වයෝ කිනම් පාපයක් කළාහුදැයි" ඇසීය.

**57** (මෙය 35 වෙනි ඡේදය මෙනි)

**58** "මේ සත්ව ලෝකයෙහි අයහපත් කර්ම ඇත්තාවූ යම් කෙනෙක් ධාන්‍යයද ධනයද රිදීද රත්රන්ද එළු තිරෙළුවන්ද, ගවයන්ද මීවුන්ද යන නුදුන් දෙය සොරාගෙණ ජීවිකාව කෙරෙද්ද, රෞද්‍ර කර්ම ඇත්තාවූ ඔව්හු පව් රැස්කොට නරකයට යෙත්. ඒ මේ ජනයෝ අඩයටිවලින් ගසන ලද්දාහු සයනය කෙරෙත්යයි" කීයේය.

**59** "මේ සත්වයෝ කුමකට ග්‍රීවයෙන් බඳනා ලද්දාහුද, නැවත අන් සමහරු කඩ කඩකොට කපන ලද්දාහුද, තවද සමහරු මස් ගොඩවල් කරණ ලද්දාහුද, සාරථිය, මේ දැක මට වනාහි භය උපදියි. එම්බා මාතලී නම් දේවසාරථිය, ඔබ විචාරමි. යම් මේ ජනයෝ මස් ගොඩවල් කරණ ලද්දාහු සයනය කෙරෙද්ද, මේ සත්වයෝ කිනම් පාපකර්මයක් කළාහු දැයි" ඇසීය.

**60** (මෙය 35 වෙනි ඡේදය මෙනි)

**61** "මේ ලෝකයෙහි එළුවන් මරා ජීවත්වන්නාහුද, ඌරන් මරා ජීවත්වන්නාහුද, මසුන් මරා ජීවත්වන්නාහුද, ගවයන්ද මීවුන්ද එළු තිරෙළුවන්ද මරා මස් ලොඹුවල විකිණීමට දිගහැරතැබුවාහුද, රෞද්‍ර කර්ම ඇත්තාවූ ඔව්හු පව් රැස්කොට නිරයට යෙත්. ඒ මේ ජනයෝ මස් ගොඩවල් කරණ ලද්දාහු සයනය කෙරෙත්යයි" කීයේය.

62 "මල මූත්‍රවලින් පිරුණාවූ දුගීන්ධ ස්වභාව ඇත්තාවූ මේ විල අපවිත්‍රවූ කුණුගඳ හමයි. බඩ සයින් පෙළුනාවූ සත්වයෝ එය අනුභව කරත්. සාරථිය, මේ දැක මට වනාහි භය උපදියි. එම්බා මාතලී දේව සාරථිය, ඔබ විචාරමි. යම් මේ ජනයෝ මලමූත්‍ර අනුභව කරන්නාහුද, මේ සත්වයෝ කිනම් පාපයක් කළාහුදැයි" ඇසීය.

63 (මෙය 35 වෙනි ඡේදය මෙනි)

64 "කටයුතු කරවන්නාවූ මේ ලෝකයෙහි යම්කිසි කෙනෙක් යහළු මිත්‍රයන්ට පවා වෙහෙසන්නාහු අනුන්ට හිංසා පිණිස හැමකල්හී යුක්තවූවාහුද, රෞද්‍ර කර්‍ම ඇත්තාවූ අඥානවූ මිත්‍ර ද්‍රෝහිවූ ඔවුහු පව් රැස්කොට නිරයට පැමිණ අශුචි අනුභව කෙරෙත්යයි" කීයේය.

65 ලේ සැරව වලින් පිරුණාවූ දුගීන්ධ ස්වභාව ඇත්තාවූ මේ විල අපවිත්‍රවූ කුණුගඳ හමයි. ග්‍රීෂ්මයෙන් තැවුනාවූ සත්වයෝ එය පානය කෙරෙත්. සාරථිය, මෙය දැක මට වනාහි භය උපදියි. එම්බා මාතලී නම් දෙවසාරථිය, ඔබ විචාරමි. යම් මේ ජනයෝ ලේ සැරව ආහාරකොට ඇත්තාහුද, මේ සත්වයෝ කිනම් පාපයක් කළාහුදැයි" ඇසීය.

66 (මෙය 35 ඡේදය මෙනි.)

67 "මේ සත්ව ලෝකයෙහි ගිහි බැව්හිම පාරාජිකාවට පැමිණියාවූ යම්කෙනෙක් මව හෝ පියා හෝ රහතන් හෝ නසද්ද, රෞද්‍ර කර්මය ඇත්තාවූ ඔව්හු පව්රැස්කොට නිරයට යෙත්. ඒ මේ ජනයෝ ලේ සැරව අනුභව කරන්නාහු වෙත්යයි" කීයේය.

68 "හුල් සියයකින් ගසනලද සමක් මෙන් බිලියෙන් විදිනලද දිවද බළව, කුමක් හෙයින් මේ සත්වයෝ ගොඩ දමනලද මසුන් මෙන් සැලෙත්ද හඬමින් කෙළ මුදද්ද?"

69 "සාරථිය, මෙය දැක මට වනාහි භය උපදියි. එම්බා මාතලී නම් දෙවසාරථිය, ඔබ විචාරමි යම් මේ ජනයෝ ගිලිනලද බිලිය ඇත්තාහු සයනය කෙරෙද්ද මේ සත්වයෝ කිනම් පාපයක් කළාහුදැයි" ඇසීය.

70 (මෙය 35 ඡේදය මෙනි.)

71 "බඩුමිල නියම කරණ තන්හි සිටියාවූ යම්කිසි මනුෂ්‍ය කෙනෙක් අගය කිරීමෙන් ඒ ඒ දෙය අගයකොට වෙළඳුන්ගේ ලාභය පිරිහෙළද්ද, වස්තු ආශාව හෙතුකොට ගෙණ හොරකිරීම් ආදී කූටකර්මයෙන් ඇමකින් සැඟවූ බිලිය ගෙණ මත්ස්‍යයෙකු මැරීමට ලංවෙන්නාක් මෙන් කූට ප්‍රයෝග කෙරෙද්ද,

72 "ස්වකීය කර්මවලින් පෙරටුකරණලද එබඳු කූට ප්‍රයෝග කරන්නාහට ආරක්ෂාස්ථාන නම් නොවෙත්. ඒ රෞද්‍ර කර්ම ඇත්තාහු පව්රැස්කොට නිරයට යෙත්. ඒ මේ ජනයෝ ගිලිනලද බිලි ඇත්තාහු සයනය කෙරෙත්යයි" කීයේය.

73 "අතිශයින් හාත්පස බිඳුනු ශරීර ඇත්තාවූ පිළිකුල්වූ මේ ස්ත්‍රීහු හිස අත් බැඳගෙණ හඬත්. ලේ සැරව වලින් ගැවැසීගත්තාවූ වදභූමියෙහි ගෙරින් මෙන් කපන ලද්දාහුවෙත්. ඔව්හු යකඩ පොළොවෙහි හැමකල්හි ගැළුනාහු ගිනිදැල් සහිතවූවාහු කඳන් ඉක්මවා පවතිත්.

74 "සාරථිය, මේ දැක මට භය උපදියි. එම්බා මාතලි නම් දෙවසාරථිය, ඔබ විචාරමි. යකඩ පොළොවෙහි හැම කල්හි ඉඟ දක්වා ගැළුනාවූ ගිනිදැල් සහිතවූ යම් ස්ත්‍රීහු කඳන් ඉක්ම පවතිද්ද, මේ ස්ත්‍රීහු කිනම් පාපයක් කළාහුදැයි" ඇසීය.

75 (මෙය 35 ඡේදය මෙනි.)

76 "මේ මනුෂ්‍ය ලෝකයෙහි අපිරිසිදු කර්ම ඇත්තාවූ යම් කුලධීතෘහු අයහපත්ව හැසුරුනාහුද, උඩඟු ස්වභාව ඇත්තාවූ, ඒ ස්ත්‍රීහු කාමරතියද ක්‍රීඩාවද හේතුකොටගෙණ ස්වකීය ස්වාමියා හැර අන්පුරුෂයෙකු වෙත ගියාහුද, ඒ ස්ත්‍රීහු මේ මනුෂ්‍ය ලෝකයෙහි පරපුරුෂයන් සමග සිත් අලවා වාසයකොට නිරයට පැමිණ ගිනිදැල් සහිතවූවාහු කඳන් ඉක්ම පවතිත්යයි" කීයේය.

77 "මේ සත්වයෝ කුමකට පා අල්වාගෙණ නැවත සමහරු යටිකුරු හිස් ඇත්තාහු නරකයෙහි හෙලනු ලබද්ද සාරථිය මෙය දැක මට භය උපදියි. එම්බා මාතලීනම් දෙව සාරථිය, ඔබ විචාරමි. යම් මේ ජනයෝ යටිකුරුවූ හිස් ඇත්තාහු

නරකයෙහි හෙලනුලබද්ද, මේ සත්වයෝ කිනම් පාපයක් කළාහුදැයි” ඇසීය.

78 (මෙය 35 ඡෙදය මෙනි.)

79 “මේ මනුෂ්‍ය ලෝකයෙහි අයහපත් කර්ම ඇත්තාවූ යම් කෙනෙක් පරදාරාවන් ඉක්මවද්ද, එබඳු උතුම් බඩු සොරකම් කළාවූ ඔව්හු නිරයට ගොස් ඒ මේ ජනයෝ යටිකුරු හිස් ඇත්තාහු නරකයෙහි හෙළනු ලබත්.

80 “ඔව්හු බොහෝ වර්ෂ සමූහයන් ඒ නරකයෙහි දුක් වේදනාව විඳිත්. ස්වකීය කර්මයන්ගෙන් ඉදිරිපත් කරණ ලද්දාවූ පව්කරණ ස්වභාව ඇත්තහුට, ආරක්ෂස්ථාන නම් නොවෙත්. රෞද්‍ර කර්ම ඇත්තාවූ ඔව්හු පව්රැස්කොට නිරයට යෙත්. ඒ මේ ජනයෝ යටිකුරුහිස් ඇත්තාහු නරකයෙහි හෙලනු ලබත්යයි” කීයේය.

81 “ඉතා දරුණු ස්වභාව ඇත්තාවූ අනෙකප්‍රකාරවූ මේ කුඩා මහත් කම්කටුළු නිරයන්හි දක්නා ලැබෙත්. සාරථිය මෙය දැක මට භය උපදියි එම්බා මාතලීනම් දෙවසාරථිය, ඔබ විචාරමි. යම් මේ ජනයෝ තියුණුවූ කර්කශවූ කටුකවූ ඉතාමහත් දුක්වේදනාවෝ විඳිනුලබද්ද, මේ සත්වයෝ කිනම් පාපයක් කළාහුදැයි” ඇසීය.

82 (මෙය 35 ඡෙදය මෙනි.)

83 “මේ මනුෂ්‍ය ලෝකයෙහි ඉතාලාමක දෘෂ්ටි ඇත්තාවූ යම් කෙනෙක් මුළාවෙන් විශ්වාසය පරිදි පාප කර්මයන් කෙරෙද්ද, අන්‍යයාද මිථ්‍යාදෘෂ්ටිකර්මවල සමාදන් කරවද්ද, ලාමක දෘෂ්ටි ඇත්තාවූ ඔව්හු පව්රැස්කොට නිරයට යෙත්. ඒ මේ ජනයෝ තියුණුවූ කර්කශවූ කටුකවූ ඉතා මහත්වූ දුක්වේදනා විඳිනු ලබත්යයි” මාතලී දෙව්පුත් තෙම කීයේය.

84 “මහරජ, පාපකර්ම කළාවූ සත්වයන්ගේ වාසස්ථාන දැක රෞද්‍ර කර්ම ඇත්තවුන්ගේ ස්ථානයන් ඔබ විසින් දැන ගන්නාලදහ. දුශ්ශීලවූවන්ගේද යම් නිෂ්පත්තියක්වේ නම් ඕතොමෝද, ඔබ විසින් දන්නාලදී. මහරජ, දැන් දෙව්රජහුගේ

සමීපයෙහි දිව්‍ය සම්පත් දැකීමට යනු මැනවැයි” මාතලී දිව්‍ය පුත්‍රතෙම කීයේය.

85 “එම්බා මාතලී දිව්‍යපුත්‍රය මුදුන් පහක් ඇත්තාවූ මේ විමානයක් දක්නා ලැබේ. එහි යහන්මැද මාලාදීන් පලඳනාලද්දාවූ මහත් ආනුභාව ඇති ස්ත්‍රියක් තොමෝ නොයෙක් ආකාර දිව්‍ය ඍද්ධීන් දක්වමින් හිඳියි.

86 “සාරථිය, මෙය දැක මට වනාහි සතුට උපදියි. එම්බා මාතලීනම් දෙවසාරථිය, ඔබ විචාරමි. දෙව්ලොවට පැමිණියාවූ යම් ස්ත්‍රියක් තොමෝ මේ විමානයෙහි සතුටු වේද, මේ ස්ත්‍රී තොමෝ කවර යහපතක් කළාදැයි” ඇසීය.

87 අසනලද මාතලීනම් දෙව්රියැදුරුතෙම ඔහුට ප්‍රකාශ කෙළේය. පුණ්‍යකර්මයන්ගේ විපාකය දන්නාවූ හෙතෙම නොදන්නාවූ රජුට මෙසේ කීයේය.

88 “ඉදින් මනුෂ්‍ය ලෝකයෙහි බ්‍රාහ්මණයෙකුගේ ගෘහ දාසියගේ කුසෙහි උපන් බීරණී නම් දාසියක් වීයයි. ඔබ විසින් අසනලද්දීද, ඕතොමෝ සුදුසු කාලයෙහි ආගන්තුග සත්කාරය දැන දුරසිට ආ පුත්‍රයා දැක වරක් සතුටු වන්නාවූ මව් මෙන් නිරන්තරයෙන් සතුටින් උපස්ථාන කෙළේද, සිල් රැක්කාවූද ත්‍යාග ඇත්තීදවූ ඕතොමෝ මේ විමානයෙහි සතුටුවේයයි” කීයේය.

89 “මැව්නාවූ දිළිසෙන්නාවූ විමාන සතක් බැබළෙත්. එහි මහත් ඍද්ධි ඇත්තාවූ සියලු දිව්‍යාභරණයෙන් සැරසුනාවූ දිව්‍ය පුත්‍රයෙක් ස්ත්‍රී සමූහයා විසින් පෙරටු කරණ ලද්දේ හාත්පස අනුගමනය කරයි

90 “සාරථිය, මෙය දැක මට වනාහි සතුට උපදියි. එම්බා මාතලී නම් දෙවසාරථිය, ඔබ විචාරමි. දෙව් ලොවට පැමිණියාවූ යමෙක් මේ විමානයෙහි සතුටුවේද, මෙ සත්ව තෙමේ කිනම් යහපතක් කෙළේ දැයි” ඇසීය.

91 (මේ ඡේදය 87 ඡේදය මෙනි.)

**92** "මෙතෙම පෙර ස්වාමිභාවයෙහි සිට දන් දෙන්නාවූ සෝන දින්න නම් ගෘහපති වූයේය. මෙතෙම භික්ෂූන් උදෙසා විහාර සතක් කරවූයේය.

**93** "එහි වසන්නාවූ ඒ භික්ෂූන්ට සකස්කොට උපස්ථාන කෙළේය. වස්ත්‍රද ආහාරද ශයනාසනද පහන් උපකරණද ඍජුවූ ගුණ ඇති භික්ෂූන් කෙරෙහි විශෙෂයෙන් ප්‍රසන්නවූ සිතින් දුන්නේය.

**94** "තුදුස්වක් දිනෙහිද පසළොස්වක් දිනයෙහිද පක්ෂය සම්බන්ධ අටවක් දිනයෙහිද, ප්‍රාතිහාර්‍ය්‍ය පක්ෂයෙහිද අංග අටකින් යුත් සීලය සමාදන්ව,

**95** "සියලු කල්හි ශිලයන්හි සංවරවූයේ පෙහෙවස්ද විසීය. සිල් රක්කාවූද දන් දුන්නාවූද හෙතෙම මේ විමානයෙහි සතුටුවේයයි" කීයේය.

**96** "පළිඟුවලින් මනාව නිමවන ලද්දාවූ උතුම් ස්ත්‍රී සමූහයාගෙන් ගැවසී ගත්තාවූ උත්තම කූටාගාර වලින් හෙබියාවූ ආහාරපාන වලින්ද නෘත්‍ය ගීතවලින්ද යන දෙකින් යුක්තව මේ විමානය බබළයි.

**97** "සාරථිය, මෙය දැක මට වනාහි සතුට උපදියි. එම්බා මාතලි නම් දෙව සාරථිය, ඔබ විචාරමි. දෙව්ලොවට පැමිණියාවූ යම් කෙනෙක් මේ විමානයෙහි සතුටු වෙද්ද, මේ ස්ත්‍රීහු කිනම් යහපතක් කළාහුදැයි" ඇසීය.

**98** (මෙය 87 ඡෙදය මෙනි.)

**99** මේ මනුෂ්‍ය ලෝකයෙහි යම්කිසි ස්ත්‍රී කෙනෙක් සිල්වත් උපාසිකාවූවාහුද, දීමෙහි ඇළුනාහුද නිතර පහන් සිත් ඇතිවූවාහුද, සත්‍යයෙහි පිහිටියාවූ පෙහෙවස් රකීමෙහි අප්‍රමාදවූවාහුද සිල් රක්කාහුද දාන සංවිභාග ඇතිවූවාහුද ඒ ස්ත්‍රීහු මේ විමානයෙහි සතුටුවෙත්යයි" කීයේය.

**100** වෛඩූර්‍ය්‍ය බිත්තිවලින් මනාව නිමවන ලද්දාවූ සිත්කළු භූමි ප්‍රදෙශයන්ගෙන් යුක්තවූ කොටස් වශයෙන් ප්‍රමාණකොට බෙදන ලද්දාවූ මේ විමානය බබළයි.

101 "පණාබෙරද මිහිගු බෙරද නෘත්‍ය ගීතයෝද මනා කොට වාදනය කරණ ලද්දාහු ඇසීමට යෝග්‍යවූ සිත්කළුවූ දිව්‍යමය ශබ්ද නිකුත් කරත්.

102 "මෙසේ සිත්කළු බවට පැමිණියාවූ මෙසේ ඉතා මනොඥවූ දක්නා ලද හෝ අසනලද හෝ ශබ්දයක් පෙර කිසිකලෙකත් මම නොදකිමි.

103 "සාරථිය, මෙය දැක මට වනාහි සතුට උපදියි. එම්බා මාතලී නම් දෙවසාරථිය, ඔබ විචාරමි. දෙව්ලොවට පැමිණියාවූ යම් කෙනෙක් මේ විමානයෙහි සතුටු වෙද්ද, මේ සත්වයෝ කිනම් යහපතක් කළාහු දැයි" ඇසීය.

104 (මෙය 87 ඡෙදය මෙනි.)

105 "මේ මනුෂ්‍ය ලෝකයෙහි යම්කිසි මනුෂ්‍යකෙනෙක් සිල්වත් උපාසකවූවාහු ආරාමයන්ද පැන් පොකුණුද පැන් ශාලාවන්ද සක්මන් මලුද,

106 "සිහිල් ගුණයෙන් යුක්තවූ රහතුන්ට සකස්කොට සම්පාදනය කළාහුද චීවරද පිණ්ඩපාතයද ගිලන්පසද ශයනාසනද ඍජු ගුණ ඇත්තවුන් විෂයෙහි විශෙෂයෙන් ප්‍රසන්නවූ සිතින් දුන්නාහුද,

107 "තුදුස්වක් දිනය පසළොස්වක් දිනය පක්ෂය සම්බන්ධ අටවක් දිනය ප්‍රාතිහාර්‍ය්‍ය පක්ෂය යන මේ දිනයන්හි අංග අටකින් යුක්තවූ ශීලය සමාදන් වූවාහුද

108 හැමකල්හි ශීලයන්හි යුක්තවූවාහු පෙහෙවස් විසුවාහුද, ශීල සංයම ඇත්තාවූද දාන සංවිභාග ඇත්තාවූද ඔව්හු මේ විමානයෙහි සතුටු වෙත්යයි" කීයේය.

109 "පළිඟු බිත්තිවලින් මනාව නිමවන ලද්දාවූ උත්තම ස්ත්‍රී සමූහයාගෙන් ගැවසී ගත්තාවූ උතුම් කුළු ගෙවලින් හෙබියාවූ මේ විමානය බබළයි.

110 "ආහාර පානවලින්ද නෘත්‍ය ගීතවලින්ද යන දෙකින් යුක්තවූ මේ විමානය වටා නොයෙක් මල්ගසින් යුක්තවූ ගංගාවක්ද ගලාබසියි.

111 සාරථිය, මෙය දැක මට වනාහි සතුට උපදියි. එම්බා මාතලීනම් දෙවසාරථිය, ඔබ විචාරමි. දෙව්ලොවට පැමිණියාවූ යමෙක් මේ විමානයෙහි සතුටුවේද, මේ සත්ව තෙම කිනම් යහපතක් කෙළේදැයි" ඇසීය.

112 (මෙය 87 ඡේදය මෙනි.)

113 "මහරජ මෙතෙම පෙර කිම්බිලා නම් නුවර සාමි භාවයෙහි සිට දන්දෙන්නාවූ ගෘහපතියෙක් විය. හෙතෙම ආරාමයන්ද පැන් පොකුණුද පැන්හල්ද සක්මන් මළුද,

114-116 (මේ ඡේද 106-108 ඡේද මෙන් වෙත්.)

117 "පළිඟු බිත්තිවලින් මනාව නිමවනලද උතුම් ස්ත්‍රී සමූහයාගෙන් ගැවසීගත් උතුම් කුළුගෙවලින් හෙබියාවූ මේ විමානය බබළයි.

118 "ආහාරපානවලින්ද, නෘත්‍යගීතවලින්ද යන දෙකින් යුක්තවේ. නොයෙක් මල් ගස්වලින් යුක්තවූ ගඟක්ද හාත්පස ගළාබසියි.

119 "කිරිපළු නුගද, ගිවුළුද, අඹද, සල්ද, දඹද තිඹිරිද, මොරද යන නිතර පලදරන්නාවූ බොහෝ ගස් වෙත්.

120 "සාරථිය, මෙය දැක මට වනාහි සතුට උපදියි. එම්බා මාතලී නම් දෙවසාරථිය, ඔබ විචාරමි. දෙව්ලොවට පැමිණියාවූ යමෙක් මේ විමානයෙහි සතුටුවේද, මේ සත්ව තෙම කිනම් යහපතක් කෙළේදැයි" ඇසීය.

121 (මෙය 87 ඡේදය මෙනි.)

122 "මහරජ, මෙතෙම පෙර මිථිලා නම් නුවර ස්වාමි භාවයෙහි සිට දන්දෙන්නාවූ ගෘහපතියෙක් විය. හෙතෙම ආරාමයන්ද, පැන්, පොකුණුද, පැන්හල්ද, සක්මන්මළුද 123-125 (මේ ඡේද 106-108 ඡේද මෙන් වෙත්.)

126 "වෛඩූර්‍ය්‍ය බිත්තිවලින් නිමවනලද කොටස් වශයෙන් ප්‍රමාණකොට බෙදනලද්දාවූ සිත්කළු බිම්කොටස් වලින් යුක්තවූ මේ විමානය බබළයි.

127 "මනාකොට වාදනය කරණලද්දාවූ පණාබෙරද, මිහිඟු බෙරද, නෘත්‍ය ගීතයෝද, කණට මිහිරිවූ සිත්කළුවූ දිව්‍යශබ්ද නිකුත්කෙරෙත්.

128 "මෙසේ සිත්කළුබවට පැමිණියාවූ මෙසේ මනොඥ වූ පෙර දක්නාලද හෝ අසනලද හෝ ශබ්දයක් කිසි කලෙකත් මම නොදනිමි.

129 "සාරථිය, මෙය දැක මට වනාහි සතුට උපදියි. එම්බා මාතලී නම් දේවසාරථිය, ඔබ විචාරමි. ස්වර්ගයට පැමිණියාවූ යමෙක් මේ විමානයෙහි සතුටුවේද, මේ සත්වතෙම කිනම් යහපතක් කෙළේදැයි" ඇසීය.

130 (මෙය 87 ඡෙදය මෙනි.)

131 "මහරජ, මෙතෙම පෙර බරණැස දානපතිවූ ගෘහපතියෙක් විය. හෙතෙම ආරාමයන්ද, පැන් පොකුණුද පැන්හල්ද, සක්මන් මළුද,

132-134 (මේ ඡෙද 106-108 ඡෙද මෙන් වෙත්.)

135 "ලේවන්වූ මහත්වූ උදාවන්නාවූ සූයර්‍යයා යම්සේ වේද, ස්වර්ණයෙන් නිමවනලද මේ විමානය එබඳුවේ.

136 "සාරථිය, මෙය දැක මට වනාහි සතුට උපදියි. එම්බා මාතලී නම් දේවසාරථිය, ඔබ විචාරමි. ස්වර්ගයට පැමිණියාවූ යමෙක් මේ විමානයෙහි සතුටු වේද මේ සත්වතෙම කිනම් යහපතක් කෙළේදැයි" ඇසීය.

137 (මෙය 87 ඡෙදය මෙනි.)

138 මහරජ, මෙතෙම පෙර සැවැත්නුවර දානපතිවූ ගෘහපතියෙක් විය. හෙතෙම ආරාමයන්ද, පැන් පොකුණුද, පැන්හල්ද, සක්මන් මළුද,

139-140 (මෙහි 106-108 ඡෙද යෙදිය යුතුයි.)

141 "හැමකල්හි සීලයන්හි පිහිටියාවූ හෙතෙම පෙහෙවස් විසීය. සිල්රැක්කාවූද, දන් දුන්නාවූද හෙතෙම මේ විමානයෙහි සතුටුවේයයි" කීයේය.

142 "ස්වර්ණයෙන් නිමවනලද්දාවූ ආකාශස්ථවූ මේ බොහෝ විමානයෝ සණ වළාකුල් අතර විදුළිය මෙන් දිළිසෙමින් බබළත්.

143 "සාරථිය, මෙය දැක මට වනාහි සතුට උපදියි. එම්බා මාතලී නම් දේව සාරථිය, ඔබ විචාරමි. දෙව්ලොවට පැමිණියාවූ යම් කෙනෙක් මේ විමන්වල සතුටු වෙද්ද, මේ සත්වයෝ කිනම් යහපතක් කළාහුදැයි" ඇසීය.

144 (මෙය 87 ඡෙදය මෙනි.)

145 "මහරජ, පෙර මනාකොට ප්‍රකාශ කළාවූ කාශ්‍යප බුද්ධශාසනයෙහි යම්කෙනෙක් මනාව පිහිටියාවූ ශ්‍රද්ධාවෙන් සර්වඥ ශාසනයවූ ශාස්තෘන් වහන්සේගේ වචනය කළාහුද, මහරජ, යම් විමානයක් ඔබ දක්නෙහි නම් මේ විමාන ඒ ආයුෂ්‍යයන්ගේ විමාන වෙත්යයි" කීයේය.

146 "මහරජ, ඔබවිසින් පළමුකොටම පාපකර්ම කළවුන්ගේ වාසස්ථානවූ තැන් දැනගන්නා ලදී ඉන්පසු කුශලකර්ම කළවුන්ගේ ස්ථාන ඔබවිසින් දක්නා ලදහ මහරජ, දැන් සක්දෙව් රජහුගේ සමීපයෙහි සම්පත් දැකීමට යවයි" මාතලීතෙම කීයේය.

147 "දහසක් අසුන් යොදනලද අසුන් විසින් උසුලනු ලබන්නාවූ දිව්‍ය යානාවට නැඟී ගමන් කරන්නාවූ නිමි මහරජතෙම සිදන්ත සාගරයෙහිවූ පර්වතයන් දුටුවේය. දැක මේ කිනම් පර්වතදැයි" සාරථිහු ආමන්ත්‍රණයකොට විචාළේය.

148 සුදස්සනය, කරවීකය ඊසධරය, යුගන්ධරය නෙමින්ධරය, විනතකය, අස්සකණ්ණා යන මහත් පර්වත සතක් වෙත්.

149 මහරජ, ඔබ යම් පර්වතයක් දක්නෙහිද, පිළිවෙළින් උස්ව නැංගාවූ සතරවරම් මහරජ දරුවන්ට වාසස්ථානවූ මේ පර්වතයෝ සීදන්ත සමුද්‍රයෙහිවූ පර්වත වෙත් යයි" කීයේය.

150 "නොයෙක් රූප ඇත්තාවූ මනොඥවූ නොයෙක් රුවණින් විසිතුරුවූ ව්‍යාඝ්‍රයන් විසින් මනාව රක්නා ලද්දක්

මෙන් ඉන්ද්‍රයා හා සමානවූවන්ගෙන් ගැවසීගන්නා ලද්දක් පෙනේ

151 "සාරථිය, මෙය දැක මට වනාහි සතුට උපදියි. එම්බා මාතලීනම් දෙවසාරථිය, ඔබ විචාරමි. මේ දොරටුව කිනම් ඇත්තක්ය කියද්දැයි" ඇසීය.

152 (මෙය 87 ඡේදය මෙනි.)

153 දෙව්රජුන්ගේ ඇතුල්වීම ඇත්තාවූ යමක් චිත්‍ර කූටයයි කියද්ද, සුදස්සන නම් පර්වතයාගේ මේ දොරටුව පෙනේ.

154 නොයෙක් රූපඇති මනොඥවූ නොයෙක් රුවණින්, විසිතුරුවූ ව්‍යාඝ්‍රයන් විසින් මනාව රක්නාලද වනයක් මෙන් ඉන්ද්‍රයා හා සමානවූ ප්‍රතිමාවලින් ගැවසී ගත්තාවූ මේ දෙව්නුවර දොරටුව වේ. මහරජ, මේ දොරටුවෙන් ඇතුල්වුව මැනව. රජස් රහිතවූ භූමිය අනුක්‍රමන කළ මැනවැයි" මාතලී දෙව්පුත්තෙම කීයේය.

155 දහසක් අසුන් යොදන ලද්දාවූ අසුන් විසින් උසුලනු ලබන්නාවූ දිව්‍යයානයට නැග ගමන් කරන්නාවූ නිමි මහරජතෙම සුධර්මා නම් දිව්‍ය සභාව දුටුවේය.

156 යම්සේ සරත් කාලයෙහි අහස නීලවර්ණවූයේම දක්නා ලැබේද. එබඳුවූ වෛඩූර්‍ය්‍ය බිත්තිවලින් නිමවනලද මේ විමානය දක්නා ලැබේ.

157 සාරථිය, මෙය දැක මට වනාහි සතුට උපදියි, එම්බා මාතලීනම් දෙවසාරථිය, ඔබ විචාරමි. මේ විමානය වනාහි කවර නමක් කියත්දැ"යි ඇසීය.

158 (මෙහි 87 ඡේදය මෙනි.)

159 සුධර්මා නම් දිව්‍ය සභාවයයි යමක් කියද්ද, මෙය බැලුව මැනව, මනහර වෛඩූර්‍ය්‍යයෙන් කරණ ලද විසිතුරුවූ මනාව නිමවනලද මේ සභා තොමෝ දක්නා ලැබේ

160 අටැස් ඇත්තාවූ මනාව කරණ ලද්දාවූ සියල්ල වෛඩූර්‍ය්‍යමය ස්තම්භයෝ මෙය දරණු ලබත්. යම් සභාවෙක්හි ශක්‍රයා ප්‍රධාන කොට ඇති සියලු තව්තිසා වැසි දෙවියෝ

161 දෙව්මිනිසුන්ගේ අභිවෘද්ධිය සිතමින් එක්ව හිඳිද්ද මහරජ, මේ මාර්ගයෙන් දෙවියන්ගේ සතුට ඇත්තාවූ එතනට ඇතුල්වුව මැනවයි” මාතලීතෙම කීයේය.

162 එහි පැමිණියාවූ ඒ රජහු දැක දෙවියෝ පිළිගෙණ සතුටුවූහ. “මහරජ ඔබගේ, යහපත් පැමිණීමකි. තවද ඔබගේ අයහපත් පැමිණීමක් නොවේ

163 “මහරජ, දැන් සක්දෙව් රජහුගේ සමීපයෙහි අස්නෙක හිඳගණු මැනව” සක්දෙව්රජතෙමේද, මියුළු නුවර රාජධානිකොට ඇති වේදේහ රජු පිළිගනිමින් සතුටු වීය.

164 සක්දෙව් රජතෙම කම්සැපවලින්ද සුදුසු අස්නකින්ද රජුට පැවරීය. මහරජ, දෙවියන්ගේ වාසස්ථානයට ඔබගේ පැමිණීම යහපත්වේ.

165 “සියළු කාමසම්පත්තියෙන් සමෘද්ධව වාසය කරව. තව්තිසා වැසි දෙවියන් අතර දිව්‍යමයවූ කම්සැප අනුභව කරවයි” ශක්‍රතෙම කීයේය.

166 “අනුන් වෙතින් දීම හේතුකොටගෙණ යම් සම්පත්තියක් ලබාද, මේ සම්පත්තියද අනුන්ගෙන් ඉල්වා ගන්නාලද යානාවක් යම්සේද අනුන්ගෙන් ඉල්වා ගන්නාලද ධනයක් යම්සේද මෙසේ දතයුතුයි.

167 “යම් සම්පත්තියක් අනුන් වෙතින් දීම හේතුකොට ගෙණ ලැබේද මෙය මම නොකැමැත්තෙමි. තෙමේ කරණ ලද්දාවූ යම් පිංකම් වෙද්ද, එය මාගේ අනුන් හා අසාධාරණවූ ධනයවේ.

168 “ඒ මම ගොස් මිනිසුන් අතර යම් පින්කම් කොට සුවපත්වේද පසුතැවිලි නොවේද, දානයෙන්ද තුන් දොරින් සමව හැසිරීමෙන්ද සිල්රැකීමෙන්ද, ඉන්ද්‍රිය දමනයෙන්ද එබඳුවූ බොහෝ කුසල් කරන්නෙමියි’ නිමි රජතෙම මෙසේ ධර්මදෙශනා කෙළේය.

169 “යමෙක් මට කුශල කර්මයන් කළවුන් වසන තැන් හා පාපකර්මය කළවුන් වසන තැන් දැක්වූයේද, ඒ මේ පින්වත්

මාතලීනම් දෙව්රියැදුරු තෙමේ අපට බොහෝ උපකාර ඇත්තේවීයයි" මාතලීදෙව්පුත්හට ප්‍රශංසා කෙළේය.

**170** මියුළු නුවර රාජධානිකොට ඇත්තාවූ විදෙශාධිපතිවූ නිමි රජතෙම මේ (මාගේ හිසෙහි යනාදි) ගාථාව කියා මහත්වූ දානයදී සීලසංයමයට ෙහවත් (ii) තපසට ගියේයයි" වදාළේය.

**541 බණ්ඩහාල ජාතකයː-** **1** "පෙර පුෂ්පවතී නම් නුවර රෞද්‍රකම් ඇත්තාවූ ඒකරාජයයි ප්‍රසිද්ධවූ රජෙක්වූයේය. හෙතෙම බණ්ඩහාල නම්වූ මූඪවූ පුරෝහිත බ්‍රාහ්මණයා විචාළේය.

**2** "එම්බා බ්‍රාහ්මණය, නුඹ සුචරිත ධර්මයෙහිද ආචාර විනයෙහිද දක්ෂවෙහිය. යම්සේ මනුෂ්‍යයෝ පින්කම්කොට මෙලොවින් සුගතියට යෙද්ද, එසේ දෙව්ලොවට යන මට කියවයි" රජතෙම කීයේය.

**3** "මහරජ, අතිදාන නම් දානයදී නොනැසිය යුත්තන් නසා මෙසේ මනුෂ්‍යයෝ පින්කොට සුගතියටයෙත්යයි" පුරෝහිත බමුණා කීයේය.

**4** "ඒ අතිදානය නම් කුමක්ද? මේලෝකයෙහි නොනැසිය යුත්තෝ කවරහුද, මෙයද අපට කියව. යාගය කරන්නෙමු. දන්දෙමුයි" රජතෙම කීයේය.

**5** "දෙවයන් වහන්ස, පුත්‍රයන්ගෙන්ද මෙහෙසින්ගෙන්ද සිටුවරුන්ගෙන්ද වෘෂභයන්ගෙන්ද ආජානීය අසුන්ගෙන්ද යන මොවුන් සතර දෙනෙක් බැගින්ගෙණ යාග කටයුතුයි. දෙවයන් වහන්ස, සබ්බ චතුක්ක නම් යාගයක් කටයුතුයයි" පුරෝහිතයා කීයේය.

**6** රජකුමරුවෝද මෙහෙසීහුද නසනු ලබත්වායි 'එය අසා අන්තඃපුරයෙහි උස්ව නැංගාවූ බිහිසුනු ශබ්ද ඇති එකම ඝෝෂාවෙක් වූයේය

**7** "යව්. චන්ද්‍රකුමාරයාද සූරිය කුමාරයාද භද්දසේන කුමාරයාද වාමගොත්ත ශූරනම් කුමාරයාද යන රජ කුමරුවන්ට යාගය පිණිස එක්තැනකට රැස්වව්යයි කියව්යි" රජ නියම කෙළේය.

8 "උපසේනීද කෝකිලාද මුදිතාද නන්දා කුමරියද යන රාජ කුමාරිකාවන්ටද යාගය සඳහා එක්තැනකට රැස්වච්ය කියව්යී" රජතෙම කීයේය.

9 "විජයානම් මාගේ මෙහෙසියද ඒ රාවතීද කේශිනීද සුනන්දාද යන උතුම් ලක්ෂණවලින් යුක්තවූ මාගේ මේ මෙහෙසීහුද යාගය සඳහා එක්තැනකට රැස්වච්යයි කියව්යී" රජතෙම කීයේය.

10 පුණ්ණ මුඛය, භද්දියය, සිඟලාය, වද්ධ නම් ගෘහපතියාද යන සිටුවරුන්ටද යාගය සඳහා එක්තැනකට රැස්වච්යී කියව්යයි" රජතෙම කීයේය.

11 "එහි රැස්වූ අඹුදරුවන් විසින් පිරිවැරූ ඒ ගෘහපතීහු රජුට මෙසේ කීවාහුය. දෙවයන් වහන්ස, අප සියල්ල මුඳුනෙහි සිළු තබා දාසයන් කරණු මැනව. තවද අප නොමරා පිරිස් මැද දාසයන්කොට අස්වනු මැනවැයි" කීවාහුය.

12 "අභයන්කර නම් ඇතුද නාලාගිරිනම් ඇතුද අච්චුත නම් ඇතුද වරුණදන්ත නම් ඇතුද යන ඔවුන් වහා ගෙනෙව්. ඒ ඇත්තු යාගය පිණිස" වන්නාහුය.

13 "කේශීනම් අශ්වරත්නයද, සුරාමුඛද, පුණ්ණකද, විනතකද යන ඒ අශ්වරත්නයන් වහා ගෙනෙව්" ඒ අශ්වයෝ යාගය පිණිස වන්නාහුය.

14 "යූථපති නම් වෘෂභයාද, අනෝජ නම් වෘෂභයාද, තිසභ නම් වෘෂභයාද, ගවම්පතී නම් වෘෂභයාද, යන මාගේ ඒ වෘෂභයන්ද ගෙණෙව්. මා විසින් කියනලද මේ සියල්ල ලඟා කෙරෙත්වා. යාගය කරන්නෙමු, දන්දෙමු.

15 "මේ සියල්ල පිළියෙල කරව්. සූර්‍ය්‍යයා උදාවූ කල්හි යාගය කරන්නෙමු. මේ රාත්‍රිය අභිරමණය කෙරෙත්වායි රජකුමරුවන්ටද අණකරව්.

16 "සෙසු සියලු යාග උපකරණද ලන්කොට තබව්. යාගය වනාහි හිරුඋදාවූ කල්හි උදෑසනම කරන්නෙමි. අද නුඹලාගේ අන්තිම රාත්‍රියයි දැන් රජකුමරුවන්ට කියව්යි" රජතෙම කීයේය.

17 තමා උන් විමානයෙන් ආවාවූ රජුගේ මව්තොමෝ හඬමින් ඒ මේ රජුට මෙසේ කීය. "එම්බා පුත්‍රය, ඔබගේ පුතුන් සතර දෙනාගෙන් යාග කිරීමක් නම් වන්නේ දැයි" ඇසීය.

18 "චන්ද්‍රකුමරු නසනු ලබන කල්හි මාගේ සියලුම පුත්‍රයෝ යාගය පිණිස හරණලදහ. පුතුන් කරණකොට ගෙණ යාගය කොට සුගති නම් දෙව්ලොවට යන්නෙමියි" රජතෙම කීයේය.

19 "එම්බා පුත්‍රය, දරුවන් මරා යාග කිරීමෙන් සුගතියක් නම් වේයයි නොඅදහව. සතර අපායට මේ මාර්ගයවේ. මෙතෙම ස්වර්ගයන්ට මාර්ගය නොවේ

20 "කොණ්ඩඤ්ඤ ගොත්‍ර ඇති පුත්‍රය, දන්දෙව. ඇතිවූද ඇතිවිය යුතුවූද සියලු සත්වයන්ට අවිහිංසාකරව. මෙතෙම සුගතියට යන මාර්ගයවේ. දරුවන් මරා කරණ යාගයෙන් ස්වර්ගයට යන මාර්ගයක් නැත්තේයයි" මව කීය.

21 "මෑනියෙනි, (ii) පුරෝහිතාචාරීන්ගේ කීමෙන් චන්ද කුමරුද සූරිය කුමරුද නසන්නෙමි. අත්නොහැරිය හැකිවූ පුතුන් කරණකොටගෙණ යාගකොට සුගති නම් දෙව්ලොවට යන්නෙමියි" රජතෙම කීයේය.

22 "ඉක්බිති වසවර්ති නම් පිය රජතෙමේද ස්වකීය ඖරශපුත්‍රවූ ඒ මේ රජුට එම්බා පුත්‍රය, දරුවන් සතරදෙනා මරා ඔබගේ යාග කිරීමක් වන්නේදැයි" කීයේය.

23-25 (මේ ඡෙද 18-20 ඡෙද මෙන් වෙත්.)

26 "පියාණෙනි (මෙහි 21 (ii) යෙදියයුතුයි)

27 "කොණ්ඩඤ්ඤ ගොත්‍ර ඇත්තාවූ පුත්‍රය දන්දෙව්. සියලු සත්වයන්ට හිංසානොකරව. පුත්‍රයන් විසින් පිරිවරණ ලද්දාවූ නුඹ සියලු කශීරටද ජනපදද රක්ෂාකරවයි" පියරජ තෙම කීයේය.

28 (i) "දෙවයන් වහන්ස, අප නොනැසුව මැනව. ඛණ්ඩහාල නම් පුරෝහිතයාට අප දාසයන් කොට දුනමැනව. (ii) මහදම්වැලින් බැන්දාවූද අපි ඇතුන්ද අසුන්ද රක්ෂා කරමු.

29 (මෙහි 28 (ii) යෙදියයුතුයි.) දම්වැල්වලින් බැන්දාවූද අපි ඇත්වසුරු හැරදමන්නෙමු.)

30 (මෙහි 28 (i) යෙදියයුතුයි.) දම්වැලින් බැන්දාවූද, අපි අස්වසුරු එක්කොට හැරදමන්නෙමු.

31 "දෙවයන් වහන්ස, අප නොමැරුව මැනව. යමෙකුට දෙන්ට ඔබගේ කැමැත්තවෙත් නම් ඔහුට අප දාසයන් කොට දෙනුමැනව. තවද රටින් පිටකරණ ලද්දාවූ අපි පිඩුසිඟමින් හැසිරෙන්නෙමුයි" චන්ද කුමරු කීයේය.

32 "ජීවිතයට කැමැත්තෙන් වැළපෙන්නාහු මට වනාහි දුක උපදවන්නහුය. දැන් ඒ කුමරුන් මුඳාහරිව්. දරුවන් මරා කරණ යාගයෙන් මට කම්නැත්තක්ද වේවායි" රජතෙම කීයේය

33 "මහරජ, මේ යාගය කළනොහැකිය. ලැබිය නොහැකියයි, පළමුකොට කියන ලද්දේවෙහිය. දැන් අප විසින් පිළියෙල කළාවූ යාගයාගේ වැළැක්ම කෙරෙහිය.

34 "යම්කෙනෙක් යාගකෙරෙද්ද, යම්කෙනෙකුත් යාගය කරවද්ද, මෙබඳු මහත් යාගයක් කරන්නවුන්ගේ ඒ යාගය යම්කෙනෙකුත් අනුමෝදන්වෙද්ද, ඒ සියල්ලෝ සුගතියට පැමිණෙත්යයි" පුරෝහිත තෙම කීයේය.

35 "පියාණෙනි, මෙසේ ඇතිකල්හි බමුණුතෙම පළමු කුමකට අපගේ සුවපත්බව කීයේද? එසේ ඇතිකල්හි කුමට අප නිකරුණේ යාගය පිණිස නසන්නෙහිද,

36 "මහරජ, ඉදින් අප මරණු කැමැත්තෙහි නම් පළමුකොටම ලදරුවුම අප නොනැසුයෙහිද, නොමැරවූයෙහිද, දැන් යෞවනයට පැමිණියාවූ තරුණයෝවෙමු. පියාණෙනි, ඔබට දොසක් නැත්තාවූ අප කුමට නසනු ලබම්ද,

37 "මහරජ, ඇතුන්පිට නැංගාවූද අසුන්පිට නැංගාවූද යුද්ධයට සැරසුනාවූ යුද්ධයක් පැමිණි කල්හි යුද්ධ කරන්නාවූ අප සතර දෙනා බලනු මැනව. අප වැනි ශූරයෝ යාග පිණිස සුදුසු නොවෙත්.

38 "පියාණෙනි, පසල් දනව්ව කිපුන කල්හි හෝ වනචාරී සොරුන් ඇතිවූ කල්හි හෝ අප වැන්නවුන් යොදවත්. එසේ ඇතිකල්හි නිකරුනේ අප අනවකාශයෙහිම කුමක් හෙයින් නසනු ලබම්ද,

39 "පියාණෙනි, යම් ඒ පක්ෂීහු තෘණමය කැදලිකොට වාසය කෙරෙද්ද, ඔවුන්ට පවා දරුවෝ ප්‍රියවෙත්. දේවයන් වහන්ස, එසේ ඇතිකල්හි නුඹ අප මරවන්නෙහිය.

40 "ඛණ්ඩහාල බ්‍රාහ්මණතෙම මා නොමරන්නේය. යන ඔහුගේ කීම නොඅදහනු මැනවි. දේවයන් වහන්ස හෙතෙම වනාහි මා මරා අනතුරුව ඔබද මරන්නේය.

41 "මහරජ, ගම්වරද නියම්ගම්වරද සම්පත්ද මොහුට දෙත්. තවද අග්‍රපිණ්ඩය ලබන්නාහුද මොව්හු ගෙයක් පාසාම අනුභව කරත්.

42 "මහරජ, එබඳුවූ ඔවුන්ටද මොව්හු ද්‍රෝහ කරන්ට කැමති වෙත්. දෙවයන් වහන්ස, මේ බමුණෝ බොහෝ සෙයින් අකෘතඥ වෙත්.

43-49 (මේ ඡේද 28-34 ඡේද මෙන් වෙත්)

50 "ඉදින් වනාහි දරුවන් කරණකොට ගෙණ යාගකොට මෙයින් චුතවූවාහු දෙව්ලොවට යෙත් නම් බ්‍රාහ්මණ තෙම පළමුකොට එසේ යාගය කෙරේවා. මහරජ, නුඹද පසුව යාගය කරණු මැනව.

51 "ඉදින් වනාහි දරුවන් කරණ කොටගෙණ යාගකොට මෙයින් චුතවූවාහු දෙව්ලොවට යෙත් නම් මේ ඛණ්ඩහාලනම් පුරෝහිත තෙමේද ස්වකීය දරුවන් මරා යාග කෙරේවා.

52 "ඛණ්ඩහාලතෙමේ මෙසේ දන්නේ කුමක්හෙයින් දරුවන් නොනැසීද, සියලු ඤාති ජනයාත් තමනුත් නොනැසීද,

53 "යම් කෙනෙක් යාග කෙරෙද්ද යම් කෙනෙකුත් යාගය කරවද්ද, යම් කෙනෙකුත් යාග කරන්නවුන්ගේ මෙබඳුවූ මහා යාගයක් අනුමෝදන් වෙද්ද, ඒ සියල්ලෝ නරකයට යෙත්යයි" චන්ද කුමාරතෙම කීයේය.

**54** "නගරයෙහි දරුවන් කැමතිවූ ගෘහපතීහුද ඔවුන්ගේ භාර්‍ය්‍යාවෝද ඖරශ පුත්‍රයා නොමරවයි කෙසේනම් රජුට දොස් පැවරීම නොකෙරෙද්ද,

**55** "නගරයෙහි දරුවන් කැමතිවූ ගෘහපතීහුද ඔවුන්ගේ භාර්‍ය්‍යාවෝද තමහට දාවූ පුත්‍රයා නොමරවයි කෙසේ නම් රජුට නොකියද්ද,

**56** "මම රජුට වැඩ කැමැත්තේවෙමි. සියලු කල්හි ජනපදයට හිත ඇත්තේද වෙමි. කිසිවෙක් මා හා ක්‍රෝධ නොකරන්නේය. එසේ ඇති කල්හි ජනපද වැසිතෙම මෙය රජුට නොකියා යයි" චන්ද කුමරු කීයේය.

**57** "භාර්‍ය්‍යාවරුනි තෙපි යව්, පිය රජුටද ඛණ්ඩහාල නම් පුරෝහිතයාටද දෝෂයක් නැත්තාවූ සිංහයන් හා සමාන වූ රජ කුමරුවන් නොමරව්යයි කියව්.

**58** "භාර්‍ය්‍යාවරුනි, තෙපි යව්. ඒකරාජ නම් පිය රජුටද ඛණ්ඩහාල නම් පුරෝහිතයාටද සියලු ලෝවැස්සාගේ බලාපොරොත්තු ඇත්තාවූ රජකුමරුවන් නොමරව්යයි කියව් යයි" කීයේය.

**59** "මම සොම්මර කුලයෙහි හෝ පුප්සඬු කුලයෙහි හෝ උපන්නෙම් නම් යෙහෙකි. කුළුපොතු කුලයෙහි හෝ උපන්නෙම් රජතෙමේ අද මා යාගය පිණිස නොමරන්නේ යයි" කුමාරතෙම කීයේය.

**60** "සියලු ස්ත්‍රීහු යව් ඛණ්ඩහාල නම් පුරෝහිත බ්‍රාහ්මණයාගේ පා ලඟ වැටී කියව්. අපගේ අපරාධයක් මම නොදකිමි.

**61** "සියලු ස්ත්‍රීහු යව්. ඛණ්ඩහාල නම් පුරෝහිත බ්‍රාහ්මණයාගේ පා ලඟ පෙරලෙව් 'ස්වාමීනි, ඔබට අපි කිනම් දෝෂයක් කෙළෙමුදැයි' අසව්යි" කීයේය.

**62** සේලානම් කුමරිය පැමිණියාවූ මෙබඳු ස්වභාව ඇති සහෝදරයන් දැක "දෙව්ලොව යනු කැමැත්තාවූම පියාණෙනි, ඔබ විසින් මේ යාගය නංවන ලද්දේදැයි" බැගෑපත්ව වැළපුණිය.

**63** 'වාසල නම් චන්ද කුමරුගේ පුත් කුමරුතෙම "අපි ළදරුවෝ වෙමු. යෞවන බවට නොපැමිණියෙමු. අපගේ පියා නොමරවයි" වැළපෙමින් රජුගේ ඉදිරියෙහි ඉදිරියටද පෙරළුනේය. ආපසුද පෙරළුනේය.

**64** "වාසුලය, ඔබගේ මේ පියාවේ. පියා සනසව අන්තඃපුරයෙහි වැළපෙමින් මට වනාහි දුක් උපදවන්නේය. දැන් රජකුමරුන් මුදා හරිව්. පුත්‍රයන් මරා කරණ යාගයෙන් මට කම් නැත්තක්ද වේවායි" රජතෙම කීයේය.

**65-66** (මේ ඡේද 33, 34 ඡේද මෙන් වෙත්.)

**67** "ඒකරාජ නම් මහරජ. ඔබගේ මේ යාගයතෙම සියලු රත්නයන්ගෙන් සරසා පිළියෙළ කරණ ලද්දේය. දේවයන් වහන්ස, ඒ සඳහා දැන් නික්මෙනු මැනව. දෙව් ලොවට ගියාවූ ඔබ සතුටුවන්නෙහි යයි" පුරෝහිතතෙම කීයේය.

**68** තරුණවූ සත් සියයක් පමණ චන්ද කුමරුගේ මේ ස්ත්‍රීහු වනාහි හිසකේ මුදාගෙණ හඬමින් මාර්ගයෙහි ඔහු අනුව යත්.

**69** ශොකයෙන් නික්මුණාවූ අන්‍ය ස්ත්‍රීහු වනාහි නන්දන වනයෙහි චුතවන දිව්‍ය පුත්‍රයෙකු පිරිවැරූ දෙව්දූන් මෙන් හිසකේ මුදාගෙණ හඬමින් මාර්ගයෙහි ඔහු අනුව යෙත්.

**70** (i) පවිත්‍රවූ කශී සළු දරන්නාවූ පැළඳි කුණ්ඩලාභරණ ඇත්තාවූ අගිල් සඳුන් ගල්වන ලද්දාවූ චන්ද්‍ර කුමාරයා හා සූර්‍ය්‍ය කුමාරයාද යන දෙදෙනා (ii) ඒකරාජ නම් රජුගේ යාගය සඳහා ගෙණයනු ලබත්.

**71** (මෙහි 70 (i) යෙදිය යුතුයි.) මවගේ හෘදයෙහි ශෝකය ඇතිකොට ගෙනයනු ලබත්.

**72** (මෙහි 70 (i) යෙදිය යුතුයි.) මහජනයාගේ හෘදයෙහි ශෝකය ඇතිකොට ගෙණයනු ලබත්.

**73** (i) මස් රශ බුදින්නාවූ කරනැවැමියන් විසින් මනා කොට නහවන ලද්දාවූ පැළඳි කුණ්ඩලාභරණ ඇත්තාවූ අගිල් සඳුන් සුවඳ ගල්වන ලද්දාවූ චන්දය සූරියය යන කුමරුවෝ (ii)

ඒකරාජනම් රජුගේ යාගය පිණිස මවගේ හෘදයෙහි ශොකය ඇතිකොට ගෙණයනු ලබත්.

**74** (මෙහි 73 (i) යෙදිය යුතුයි.) මහජනයාගේ හෘදයෙහි ශෝකය ඇතිකොට ගෙණයනු ලබත්.

**75** සැරසූ ඇතුන් පිට නැංගාවූ යම් කෙනෙක් පෙර ඇතුන් පිටින් අනුගමනය කෙරෙද්ද, (ii) අද ඒ චන්දය සූරියය යන කුමාරයෝ දෙදෙනම පයින් යන්නාහු ගමන් කෙරෙත්.

**76** පෙර යම් කෙනෙක් උතුම් අසුන් පිට නැංගාහු අසුන් පිටින් අනුගමනය කෙරෙද්ද, (මෙහි 75 (ii) යෙදිය යුතුයි.)

**77** යම් කෙනෙක් පෙර උතුම් රථවලට නැංගාහු රථවලින් ගමන් කෙරෙද්ද, (මෙහි 75 (ii) යෙදිය යුතුයි.)

**78** පෙර යම් කෙනෙක් රුවන් අබරණින් සැරසූ අසුන් විසින් ගෙණයනු ලැබුවාහුද, (මෙහි 75 (ii) යෙදිය යුතුයි.) යයි වැළපුනාහ

**79** (i) එම්බා ලිහිණිය, ඉදින් මස් කැමැත්තෙහි නම් පුෂ්පවතී නුවරට පූර්ව දිශාවෙහිවූ යාගාවාටයට යව. (ii) මෙහි ඛණ්ඩහාලගේ කීමෙන් මුළාවූ ඒකරාජනම් රජතෙම පුතුන් සතරදෙන මරා යාග කරයි.

**80** (මෙහි 79 (i) යෙදිය යුතුයි.) මෙහි ඛණ්ඩහාලගේ කීමෙන් මුළාවූ ඒකරාජනම් රජතෙම දූන් සතරදෙන මරා යාග කරයි.

**81** (මෙහි 79 (i) යෙදිය යුතුයි.) මෙහි ඛණ්ඩහාලගේ වචනයෙන් මුළාවූ ඒකරාජ නම් රජතෙම මෙහෙසියන් සතර දෙන මරා යාග කරයි

**82** (මෙහි 79 (i) යෙදිය යුතුයි.) මෙහි ඛණ්ඩහාලගේ වචනයෙන් මුළාවූ ඒකරාජ නම් රජතෙම සිටුවරුන් සතර දෙන මරා යාග කරයි.

**83** (මෙහි 79 (i) යෙදිය යුතුයි.) මෙහි ඛණ්ඩහාලගේ වචනයෙන් මුළාවූ ඒකරාජ නම් රජතෙම ඇතුන් සතර දෙනෙකු මරා යාග කරයි.

84 (මෙහි 79 (i) යෙදිය යුතුයි.) මෙහි ඛණ්ඩහාලගේ වචනයෙන් මුළාවූ ඒකරාජ නම් රජතෙම අශ්වයන් සතර දෙනෙකු මරා යාග කරයි.

85 (මෙහි 79 (i) යෙදිය යුතුයි.) මෙහි ඛණ්ඩහාලගේ වචනයෙන් මුළාවූ ඒකරාජ නම් රජතෙම වෘෂභයන් සතර දෙනෙකු මරා යාග කරයි.

86 (මෙහි 79 (i) යෙදිය යුතුයි.) මෙහි ඛණ්ඩහාලගේ වචනයෙන් මුළාවූ ඒකරාජ නම් රජතෙම සියල්ලන්ගෙන් සතරදෙනා බැගින් මරා යාග කෙරේයයි කියමින් මහජනයා වැළපුනේය.

87 මේ කුමරුගේ මේ ප්‍රාසාදයවේ. ඉතා සිත්කළුවූ මේ අන්තඃපුරයයි. (ii) දැන් ඒ අපගේ ආර්‍ය්‍ය පුත්‍රවූ කුමාරයෝ සතර දෙන වධයට ගෙණයන ලද්දාහ

88 මේ කුමරුගේ රණින් කළාවූ මල්මාලාවන්ගෙන් ගැවසී ගත්තාවූ මේ කූටාගාරයවේ. (මෙහි 87 (ii) යෙදිය යුතුයි.)

89 මේ කුමරුගේ මනාව පිපියාවූ සියලු කල්හි හටගත් මල් ඇත්තාවූ සිත්කළුවූ මේ උයනවේ. (මෙහි 87 (ii) යෙදිය යුතුයි.)

90 "මේ කුමරුගේ මනාව පිපුනාවූ හැමකල්හි හටගත් මල් ඇති සිත්කළුවූ මේ හෝපළු වනයවේ. (මෙහි 87 (ii) යෙදිය යුතුයි.)

91 "මේ කුමරුගේ මනාව පිපුනාවූ හැමකල්හි මල් ඇත්තාවූ සිත්කළුවූ මේ කිනිහිරි වනයවේ. (මෙහි 87 (ii) යෙදිය යුතුයි.)

92 "මේ කුමරුගේ මනාව පිපුනාවූ සියලු කල්හි මල් ඇත්තාවූ සිත්කළුවූ මේ පළොල් වනයවේ. (මෙහි 87 (ii) යෙදිය යුතුයි.)

93 "මේ කුමරුගේ මනාව පිපුනාවූ හැමකල්හි ඵල ඇත්තාවූ සිත්කළුවූ මේ අඹ වනයවේ. (මෙහි 87 (ii) යෙදිය යුතුයි.)

94 "මේ කුමරුගේ පියුම් හෙළ පියුම්වලින් ගැවසී ගත්තාවූ මේ පොකුණද රණින් කරණලද්දාවූ මල් පංක්තියෙන් විසිතුරුවූ

ඉතා සිත්කළුවූ නැවදවේ. (මෙහි 87 (ii) යෙදිය යුතුයි.) මහජනතෙමේ වැළපුනේය.

95 "මේ කුමරුගේ ඒරාවන නම් හස්තියාද, වරුණදන්ති නම් හස්තියාදැයි, මේ හස්ති රත්නයවේ. (මෙහි 87 (ii) යෙදිය යුතුයි.)

96 "මේ කුමරුගේ ඒකබුර නම් අශ්වයාදැයි මේ අශ්ව රත්නයවේ. (මෙහි 87 (ii) යෙදිය යුතුයි.)

97 "මේ කුමරුගේ යහපත්වූ රුවණින් විසිතුරු කරණ ලද ශාලිය නිග්ඝෝස නම් මේ අශ්ව රථයවේ. යම් රථයෙක්හි උන්නාවූ අපගේ ආයර්‍ය්‍යපුත්‍රයෝ නන්දන වනයෙහි දෙවියන් මෙන් හෙබියාහුද (මෙහි 87 (ii) යෙදිය යුතුයි.)

98 (i) "නිල් රන්වන් මෙන් සොඳුරු වූ රත්සඳුන් ගල් වූ ශරීර ඇති (ii) පුත්‍රයන් සතරදෙන මරා මුළාවූ රජතෙමේ කෙසේ නම් යාග කරන්නේද,

99 (මෙහි 98 (i) යොදන්න.) රාජ කන්‍යාවන් සතර දෙන මරා මුළාවූ රජතෙම කෙසේනම් යාගය කරන්නේද,

100 (මෙහි 98 (i) යෙදිය යුතුයි.) මෙහෙසියන් සතර දෙනෙකු මරා මුළාවූ රජතෙමේ කෙසේනම් යාගය කරන්නේද,

101 "ශ්‍යාමවර්ණ බඳු සුන්දරවූ ලෝහිත චන්දනයෙන් ගල්වන ලද ශරීර ඇති සිටුවරුන් සතර දෙනෙකු මරා මුළාවූ රජතෙමේ කෙසේනම් යාගය කරන්නේද,

102 "යම්සේ ගම් නියම්ගම් හිස්වූ අමනුෂ්‍යයන් ඇත්තාවූ මහා වනයෝ වෙද්ද, චන්ද්‍ර කුමාරයා හා සූයර්‍ය් කුමාරයන් මරා යාග කළ කල්හි පුෂ්පවතී රාජධානියද එසේ වන්නේයයි" වැළපුනාහුය.

103 "දේවයන් වහන්ස, ඉදින් උතුම් චන්ද කුමරු නසන්නේ නම් මම නැසුනාවූ වැඩීම් ඇති පසින්ද ගැවසීගත් උමතු තැනැත්තියක් වන්නෙමි. මාගේ ප්‍රාණයෝද නිරුද්ධ වෙත්.

104 "දේවයෙනි, ඉදින් උතුම් සූරිය කුමරු නසා නම් මම නැසුනු වැඩීම් ඇත්තී පසින්ද ගැවසුනි උමතු තැනැත්තියක් වන්නෙමි. මාගේ ප්‍රාණයෝද නිරුද්ධ වෙත්යයි" මව හැඬුවාය.

105 "කුමක්හෙයින් මේ සට්ටියා නම්වූද, ඕපරක්ඛි නම්වූද පොක්ඛරක්ඛි නම්වූද නායිකා නම්වූද ඔවුනොවුන්ට ප්‍රිය වචන කියන්නාවූ චන්ද්‍ර සූරිය කුමරුන් වෙත නටන්නාවූ යෙහෙලිණියෝ මාගේ පුතුන් නොසතුටු කෙරෙව්වාහුද නෘත්‍ය ගීතාදියෙහි ඔවුන්ට සමවූවෙක් නැත්තේයයි" මව වැළපුනාය.

106 "ඛණ්ඩහාලය, චන්ද කුමරු වධයට ගෙණගිය කල්හි (ii) මාගේ හෘදයෙහි යම් ශෝකයක් වේද, මාගේ හෘදයෙහිවූ මේ ශෝකය තාගේ මව ලබාවා.

107 "ඛණ්ඩහාලය, සූරිය කුමරු වධයට ගෙණගිය කල්හි (මෙහි 106 (ii) යෙදිය යුතුයි.)

108 "එම්බා ඛණ්ඩහාලය, චන්ද කුමරු වධයට ගෙණ ගිය කල්හි (ii) මාගේ හෘදයෙහි යම් ශෝකයක් වීද, මාගේ මේ හෘදයෙහිවූ ශෝකය තාගේ අඹුවලබාවා,

109 "ඛණ්ඩහාලය, සූරිය කුමරු වධයට ගෙණගිය කල්හි (මෙහි (108) (ii) යෙදිය යුතුයි.)

110 "එම්බා ඛණ්ඩහාලය, යම් තෝ දොසක් නැත්තාවූ සිංහයන්ට සමානවූ රජ කුමරුන් නැසුයෙහිද, (ii) ඒ තාගේ මව දරුවන්ද, ස්වාමියාද, නොදකීවා.

111 "එම්බා ඛණ්ඩහාලය, යම්බඳුවූ තෝ සියලු ලෝක වාසීන්ගේ බලාපොරොත්තු ඇත්තාවූ රජ කුමරුන් නැසූයෙහිද, ඒ තාගේ මව දරුවන්ද, ස්වාමියාද නොදකීවා.

112 "එම්බා ඛණ්ඩහාලය, යම්බඳුවූ තෝ දොසක් නැත්තාවූ සිංහයන් හා සමානවූ රජකුමරුන් නැසූයෙහිද, ඒ තාගේ අඹුව, දරුවන්ද, ස්වාමියාද නොදකීවා

113 "එම්බා ඛණ්ඩහාලය, යම්බඳුවූ තෝ සියලු ලෝකයාගේ බලාපොරොත්තු ඇත්තාවූ රජකුමරුන් නැසුයෙහිද, ඒ තාගේ අඹුව, දරුවන්ද, ස්වාමියාද නොදකීවායි" මව ඛණ්ඩහාලයාට ආක්‍රොශකළාය.

114-117 (මේ ඡෙද 28-31 ඡෙද මෙන් වෙත්.)

118 "දරුවන් කැමැත්තාවූ දිළිඳුවූද ස්ත්‍රීහු දෙවියන්ට එළඹ යාඥාකරත්. ඒ ඇතැම් ස්ත්‍රීහු දොළද නොලැබ දරු ගර්භය වියලී දරුවන් නොමලබත්.

119 "මහරජ, මේ සත්වයෝ අපට දරුවෝ උපදිත්වා. ඒ දරුවන්ගෙන්ද, දරුවෝ උපදිත්වායි ආසාකෙරෙත්. එසේ ඇතිකල්හි නිකරුනේ අප යාගය සඳහා මරවන්නෙහි.

120 "පියාණෙනි, දෙවියන්වෙත එළඹ යාඥාකිරීමෙන් දරුවෙකු ලබත්. අප නොමැරුව මැනව. දුකසේ ලැබුවාවූ පුතුන්ගෙන් මේ යාගය නොකරණු මැනව.

121 "පියාණෙනි, දෙවියන්ට යාඥා කිරීමෙන් පුතෙකු ලබත්. එහෙයින් අප නොනැසුව මැනව. මව විසින් බැගෑපත්ව ලබනලද්දාවූ දරුවන්ගෙන් අපගේ මව වෙන් නොකරණු මැනවැයි" චන්දකුමරු යාඥාකෙළේය.

122 "මෑණියෙනි, නුඹ චන්දකුමාරයාවූ මා බොහෝ දුක්සේ පෝෂ්‍ය කරණලද්දී දැන් පුත්‍රයා නොලබන්නෙහිය. මම ඔබගේ පාදයන් වඳිමි. අපගේ පියතෙමේ සම්පත් සහිත පරලොව ලබාවා.

123 (i) "මෑණියෙනි, එබැවින් මා වැළඳගණුමැනව. මටද ඔබගේ පාදයන් වඳින්ට දුනමැනව. (ii) දැන් මම ඒකරාජ නම් රජුගේ යාගය සඳහා ඒකාන්තයෙන් වෙන්ව විසීමට යමි.

124 (මෙහි 123 (i) යෙදිය යුතුයි.) දැන් මම මවගේ හෘදයෙහි ශොකය ඇතිකොට වෙන්ව වාසයට යමි.

125 (මෙහි 123 (i) යෙදිය යුතුයි.) මම දැන් මහජනයාගේ හෘදයෙහි ශොකය ඇතිකොට නැවත නොඑන බැවින් ඒකාන්තයෙන් වෙන්ව වාසයකිරීමට යමියි" චන්දකුමරු වැළපුනේය.

126 "ගෝතමී පුත්‍රය, එසේ වීනම් කෙශකලාපය පියුම් පත් වෙළුමෙන් බැඳගණුව. ඇතුළත සපුමල්පතින් මිශ්‍රවූ මේ චෝලිබන්ධනය ඔබගේ පුරාණ සිට ආ සිරිතවේ.

127 "යම් විලවුන් වලින් විලේපනය කරණලද්දේ රජ පිරිසට හොබීද, එබැවින් මේ අන්තිම සඳුන් සුවඳ ගැල්වීමෙන් ඔබගේ ශරීරය සුවඳගල්වනු.

128 "පුත්‍රය, යම් වස්ත්‍රවලින් මනාව හඳනාලද්දේ රජ පිරිසට හොබීද, එබැවින් මෘදුවූ වස්ත්‍ර හැඳගණුව, ලක්ෂයක් වටනා අන්තිම කශීසළුව හැඳගණුව.

129 "පුත්‍රය, යම් අතෙහි පලඳිනලද ආභරණවලින් සැරසුනේ, රජපිරිසට හොබීද, එබඳුවූ මුතු, මැණික්, රත්රන් යන මෙයින් සරසනලද අත් අබරණ පැළඳගණුවයි" මට කීවාය.

130 "රට රක්නාවූ ජනපද දායාදකොට ඇත්තාවූ ලොවට අධිපතිවූ මේ රජතෙමේ මහත්බැවින් දරුවන් කෙරෙහි ආදරය නූපදවායයි" සිතමියි චන්දා නම් අග මෙහෙසිය කීවාය.

131 "මට දරුවෝ ප්‍රියවෙත්. ආත්මයද ප්‍රියවේ. යෙහෙළිනීවූ තෙපිද ප්‍රියවෙත්. ස්ත්‍රීහුද ප්‍රියවෙත්. එසේ වුවත් මම ස්වර්ග සම්පත්තියද ප්‍රාර්ථනා කරන්නේ වෙමි. ඒ කාරණයෙන් යාගය සඳහා මේ දරුවන් මරන්නෙමි" රජතෙම කීයේය.

132 "දෙවයන් වහන්ස, පළමුකොට මා මරව. අලංකාර කරන ලද සුන්දරවූ සිව්මැලිවූ ඔබගේ පුත්‍රතෙමේ මරණයට නොපැමිණේවා. චන්දකුමරුගේ මරණ දුක මාගේ හෘදය නොපලාවා

133 "දෙවයන් වහන්ස, එබැවින් මා පළමුකොට නසව. චන්ද කුමරු හා සමාන දෙව්ලොව ඇත්තියක් වන්නෙමි ඔබද මහත්වූ පිං රැස්කරව, එකවර නසන ලද්දාවූ අප දෙදෙනාම පරලොව සුව විඳිමින් හැසිරෙමුයි" චන්ද්‍රා දේවී කීවාය.

134 "එම්බා චන්ද්‍රාවෙනි, නුඹ මෙසේ මරණය කැමති නොවෙව. මහත්වූ ඇස් ඇත්තිය, නුඹගේ ස්වාමියාගේ සහෝදරයෝ බොහෝ වෙත්. ගෝතමී පුත්‍රවූ චන්දකුමරු මරා යාග කළ කල්හි ඔව්හු තී සමග හැසිරෙන්නාහුයයි" රජතෙම කීයේය.

135 මෙසේ කී කල්හි චන්ද්‍රා දේවිතොමෝ තමන්ට අතුල් තලවලින් ගසාගත්තීය. මාගේ ජීවිතයෙන් ප්‍රයෝජනයක් නැත. විස පානය කරමි. මැරෙන්නෙමි.

136 "යම් කෙනෙක් ඖරශ පුත්‍රයන් නොමරවයි රජුට නොකියද්ද, එබඳු යහළු මිත්‍රාමාත්‍යයෝද නැත්තාහුයයි" සිතමි.

137 "යම් කෙනෙක් තමහට ජාතකවූ පුත්‍රයන් නොමරවයි රජුට නොකියද්ද, එහෙයින් මේ රජුට යහළුවූ ඥාති මිත්‍රයෝද නැත්තාහුයයි සිතමි.

138 "මහරජ, මල්මාලා දරන්නාවූ අඟුපළඳනාවලින් සැරසුනාවූ මේ ඒ මාගේ පුත්‍රයෝද ඇත්තාහ. ඔවුන්ගෙන්ද යාගය කරණු මැනව, එකල්හි ගෝතමී පුත්‍රවූ චන්දකුමරුන් මුදාවා

139 "මහරජ, මා මරා සත් කොටසක් කොට යාග කරණු මැනව. දොසක් නැත්තාවූ සිංහයෙකුට සමානවූ වැඩිමහළු පුත්‍රයා නොමරව.

140 "මහරජ, මා මරා කොටස් වශයෙන් සතක්කොට යාගය කරණු මැනව. සියලු ලෝවැස්සාගේ බලාපොරොත්තු ඇත්තාවූ වැඩිමහළු පුත්‍රයා නොමරවයි" චන්ද්‍රාදේවි කීවාය.

141 "එම්බා චන්ද්‍රාව, යහපත් වචන කී කල්හි මුතු මැණික් වෛඩූර්‍ය්‍යමයවූ බොහෝවූ කුඩා මහත් ආභරණයෝ මා විසින් තිට දෙන ලද්දාහ. මේ මා විසින් තිට දෙන්නාවූ අන්තිම දීමනාවයයි" චන්දකුමරු පැළඳි ආබරණ දුන්නේය.

142 "පෙර යම් කෙනෙකුගේ ස්කන්ධයන්හි පිපියාවූ මල්දම් පැවත්තාහුද, අද ඔවුන්ගේ ස්කන්ධයන්හි විෂ පෙවූ මුවහත්වූ කඩුව පවත්නේය.

143 "පෙර යම් කෙනෙකුගේ ශරීරයන්හි විසිතුරු මල් දම් වැටුනාහුද, අද ඔවුන්ගේ ශරීරයන්හි විෂ පෙවූ මුවහත් ඇති කඩුව වැටෙන්නේය.

144 "නොබෝ කලකින් ඒකාන්තයෙන් රජකුමරුවන්ගේ ශරීරයන්හි කඩුව වැටෙන්නේය. එසේ ඇතිකල්හි මාගේ හෘදය

නොපැලෙයි මාගේ හෘදය ඉතාම දෘඪවූ බන්ධන ඇත්තක්ද විය.

145 "(i) පිරිසිදු කශීසළු දරන්නාවූ පැළඳි කුණ්ඩලාභරණ ඇති අගිල් සඳුන් සුවඳ ගල්වන ලද්දාවූ චන්ද සුරිය කුමාරයෝ (i) ඒකරාජනම් රජුගේ යාගය සඳහා බැහැර ගෙණ යන්නාහුය.

146 "(මෙහි 145 (i) යෙදිය යුතුයි) මවගේ හෘදයෙහි ශොකය ඇතිකොට බැහැර ගෙණයන්නහුය.

147 "(මෙහි 145 (i) යෙදිය යුතුයි.) මහජනයාගේ හෘදයෙහි ශොකය ඇති කොට බැහැර ගෙණ යන්නාහුය.

148 "(i) මස්රස අනුභව කරන්නාවූ කරනැවෑමියන් විසින් (කපුවන්) මනාකොට නහවන ලද්දාවූ පැළැඳිකුණ්ඩලාභරණ ඇති අගිල් සඳුන් සුවඳ ගල්වන ලද්දාවූ චන්දසුරිය කුමාරයෝ (ii) ඒකරාජනම් රජුගේ යාගය සඳහා බැහැර ගෙණයන්නාහ.

149 "(මෙහි 148 (i) යෙදිය යුතුයි.) මවගේ සිතෙහි ශෝකය උපදවා බැහැර ගෙණයනු ලබන්නාහ.

150 "(මෙහි 148 (i) යෙදිය යුතුයි. බොහෝ දෙනාගේ" හෘදයෙහි ශෝකය ඇතිකොට බැහැරයනු ලබන්නාහයි චන්ද්‍රාදේවී වැළපුනාය.

151 සියලු යාග ද්‍රව්‍ය පිළියෙල කර කල්හි චන්ද කුමරු යාගය සඳහා හිඳවූ කල්හි පඤ්චාල රාජධීතෘවූ චන්ද්‍රාතොමෝ ඇදිලි බැඳගෙණ සියලු පිරිස අනුව ගමන් කළාය.

152 "යම් සත්‍යයකින් මෝඩවූ ඛණ්ඩහාලතෙමේ පව්කම් කෙරේද, මේ සත්‍ය වචනය කරණකොටගෙණ ස්වාමියා සමග මම එක්වීම ඇත්තියක් වෙම්වා.

153 "මෙහි යම් අමනුෂ්‍ය කෙනෙක් ඇද්ද, යක්ෂයෝද වැඩිසිටි භූතයෝද වැඩෙන්නාවූ භූතයෝද යන යම් කෙනෙකුත් ඇද්ද, ඒ සියල්ලෝ මට වතාවත් කෙරෙත්වා. මම ස්වාමියා සමග එක්වන්නියක් වෙම්වා.

154 "යම් දෙවිකෙනෙක් මෙහි පැමිණියාහුද, යම් යක්ෂභූත කෙනෙකුත් මෙහි පැමිණියාහුද, ඒ සියල්ලෝ අස්වාමිකවූ පිහිට

සොයන්නාවූ මා රක්ෂා කරව්. ස්වාමියාගෙන් මම නොපිරිහෙම්වායි මම තොපට යාඥා කරමියි" චන්ද්‍රාදේවි වැළපුනාය.

155 සක්දෙව් රජතෙම එය අසා යකුලක් කරකවා මොහුට භය උපදවමින් රජුට මෙය කීයේය.

156 "එම්බා මෝඩ රජ, මම තොපගේ හිස නොපලමියි දනුව, දොසක් නැත්තාවූ සිංහයෙකුට බඳුවූ වැඩිමහළු පුත්‍රයා නොමරව,

157 "එම්බා පවිටු රජ, දෙව්ලොව පතන්නාවූ දොසක් නැත්තාවූ අඹුදරුවන්ද සිටු ගෘහපතියන්ද නසනු ලබන්නවුන් තොප විසින් කොතැන්හි දක්නා ලද විරූද?

158 ඒ අසා ඛණ්ඩහාල තෙමේද රජතෙමේද මේ ආශ්චර්‍ය්‍යය දැක යම්සේ පවිටු නොවූවන්ගේ ඒ මිදීමක් වේද, එපරිද්දෙන් සියල්ලන්ගේ බන්ධනයන් මිදූහ.

159 සියල්ලන් බන්ධන වලින් මිදුනු කල්හි යම් කෙනෙක් එහි එදා රැස්වූවාහුද, ඒ සියල්ලෝ එක එක ගල්කැට පහර දුන්හ. මේ ඛණ්ඩහාලයාගේ නැසීම වූයේයයි කීයේය.

160 යම්සේ ඒ ලාමකවූ යාගය කොට සියල්ලෝ නිරයෙහි වැටුනාහුද, එමෙන් පව්කම්කොට මෙලොවින් සුගතියට යන්ට නොලැබිය හැක්කේයයි වදාළේය

161 (i) සියල්ලන් බන්ධන වලින් මිදුනු කල්හි යම් කෙනෙක් එහි එදා රැස්වූවාහුද, (ii) ඔව්හුද රැස්වූ රජ පිරිස්ද චන්ද කුමරු අභිෂෙක කළාහුය.

162 (මෙහි 161 (i) යෙදිය යුතුයි.) ඔව්හුද රැස්වූ රාජකන්‍යාවෝද චන්දකුමරු අභිෂෙක කළාහුය.

163 (මෙහි 161 (i) යෙදිය යුතුයි.) ඔව්හුද රැස්වූ දෙව් පිරිස්ද චන්දකුමරු අභිෂෙක කළාහුය.

164 (මෙහි 161 (i) යෙදිය යුතුයි.) ඔව්හුද එහි රැස්වූ දිව්‍ය කන්‍යාවෝද චන්දකුමරු අභිෂෙක කළාහුය.

**165** (මෙහි 161 (i) යෙදිය යුතුයි.) ඔව්හුද එහි රැස්වූ රජපිරිස්ද පිළිහිස සිසෑරිම කළාහුය.

**166** (මෙහි 161 (i) යෙදිය යුතුයි.) ඔව්හුද එහි රැස්වූ රාජකන්‍යාවෝද පිළිහිස සිසෑරීම කළාහුය.

**167** (මෙහි 161 (i) යෙදිය යුතුයි.) ඔව්හුද එහි රැස්වූ දෙව්පිරිස්ද පිළිහිස සිසෑරීම කළාහුය.

**168** (මෙහි 161 (i) යෙදිය යුතුයි.) ඔව්හුද එහි රැස්වූ දිව්‍යකන්‍යාවෝද පිළිහිස සිසෑරීම කළාහුය.

**169** "සියල්ලන් බන්ධනවලින් මිදුනු කල්හි බොහෝ දෙනා සතුටු සිත් ඇත්තෝවූහ. මහජනතෙමේ සතුටුසිත් ඇතිව නුවරට ඇතුල්විය. සියල්ලවුන් බන්ධනයෙන් මිදීම ප්‍රකාශකෙළේයයි" වදාළේය.

**542 භූරිදත්ත ජාතකය-: 1** "මහරජ, ධෘතරාෂ්ට නම් නාරජුගේ ගෘහයෙහි යම්කිසි රත්නයක් ඇද්ද, ඒ සියල්ල ඔබගේ ගෘහයට පැමිණෙත්වා, අපගේ රජුට සමුද්දජා නම් ඔබගේ දූ කුමරිය දෙනු මැනවයි" නාගයෝ කීහ.

2 "එම්බා නාගයෙනි, කිසිකලෙකත් නාගයන් හා අපගේ විවාහයෙක් නොකළවිරූය. තිරිසනුන් හා එක්වීම ඇත්තාවූ ඒ විවාහය සුදුසු නොවේ. මනුෂ්‍යවූ අපි එය කෙසේ කරමුදැයි" බරණැස් රජ කීයේය.

3 "මහරජ, ඔබගේ ජීවිතයද, රටද හැරදමනලදැයි, සිතමි. නාගයන් කිපුනු කල්හි ඔබවැන්නෝ බොහෝ කලක් නොම ජීවත්වෙත්.

4 "දේවයන් වහන්ස මිනිසුන් අතර ඍර්ධි නැති යම්බඳුවූ ඔබ ඍර්ධි ඇත්තාවූ යමුනා නම් ගංගා යටභාගයෙහි උපන්නාවූ වරුණ නම් නාරජුගේ ස්වකීය පුත්‍රවූ නා රජහු ඉක්මවා හගින්නෙහිද, එහෙයිනැයි" කීයේය

5 "යස පිරිවර ඇත්තාවූ ධෘතරාෂ්ටනම් නාරජු ඉක්මවා නොහගිමි. ධෘතරාෂ්ට නම් නාරජ වනාහි බොහෝවූ නාගයන්ටද අධිපති වේ.

6 "මහත් ආනුභාව ඇත්තේද, නාරජතෙමේ මාගේ දුවට සුදුසු නොවේ. විදෙහවාසීන්ගේ ක්ෂත්‍රියවූද සමුද්දජා නම් මාගේ දුව විශිෂ්ට ජාති ඇත්තීවේයයි" රජතෙම කීයේය.

7 "කම්බලස්සතර නම් නාගයෝ නැගීසිටිත්වා. සියලු නාගයන්ට වහා රැස්වව්යයි දන්වව, සියල්ලෝ බරණැස් නුවරට පැමිණෙත්වා. තොප කිසිකෙනෙක් කිසිවෙකුටත් හිංසා නොකෙරෙත්වායි" නාරජ අණකෙළේය.

8 "ගෘහවලද, පොකුණුවලද, වීථියෙහි සන්ධිවලද, ගස් මුදුන්වලද, දොරටු තොරන්වලද, පැතුරුනාහු එල්බෙත්වා.

9 "මමද සියල්ල සුදුවූ මහත්වූ ශරීරයකින් යුක්තව ගොස් ඉතා මහත්වූ නගරය කසී රටවැස්සන්ට භය උපදවමින් දරණ වැලින් වටකරන්නෙමියි" නාරජ කීයේය.

10 ඔහුගේ ඒ කීම අසා නොයෙක් වර්ණ ඇත්තාවූ නාගයෝ බරණැස් නුවරට රෑ වැදුනාහ. කිසිවෙකුත් හිංසා නොකළහ.

11 ගෙවල්වලද, පොකුණුවලද, මංසන්ධිවලද ගස් මුදුන්වලද, දොරටු තොරන්වලද, පැතිරී එල්බුනාහුය.

12 පෙණය කරණලද වරින්වර ප්‍රශ්වාස කරන්නාවූ එල්බෙන්නාවූ ඒ නාගයන් දැක බොහෝ ස්ත්‍රීහු හැඬුහ.

13 බරණැස අතිශයින් පෙළන ලදී. පීඩාවට පැමිණියාහු රජුවෙත එළඹියාහුය. 'රජුගේ දුව නාරජුට දෙවයි' හිස අත්බැඳගෙණ ඇඬූහ.

14 "පූජා පිණිස ගෙණඑනලද මල් ඇති මේ වනය මැද රක්තවර්ණ ඇස් ඇත්තාවූ පුළුල් උරහිස් අතර ඇති ඔබ කවරෙක්ද? ස්වර්ණමය ග්‍රීවාභරණ, හස්තාභරණ දරන්නාවූ මනා හැඳිවස්ත්‍ර ඇති කවරනම් ස්ත්‍රීහු දශදෙනෙක් වඳිමින් සිටිද්ද,

15 "මහත්වූ බාහු ඇති කවරෙක්වූ ඔබ වනමැද ගිතෙල් ඉසිනලද ගින්නක් මෙන් බබළන්නෙහිද? මහේශාක්‍යවූ එක්තරා යක්ෂයෙක්වෙහිද නොහොත් මහත් ආනුභාව ඇති නාගයෙක් වෙහිදැයි" බමුණා ඇසීය.

16 "මම මෙහි ඍර්ධි ඇත්තාවූ විෂ තේජස් ඇති අනිකෙකු විසින් ඉක්මවිය නොහැකිවූ නාගයෙක් වෙමි. ඒ මම කිපියේ විෂ තේජසින් සියලු ජනපදයද දෂ්ටකරන්නෙමි.

17 "සමුද්දජා නම් දේවි වනාහි මාගේ මවය. ධ්‍රතරාෂ්ට නම් නාරජතෙමේද, මාගේ පියාවේ. මම සුදස්සන නම් නා රජුගේ මළනුවෙමි භූරිදත්තයයි නාගභවනයෙහි මා දනිත්යි" නාරජ කීයේය.

18 "ගැඹුරුවූ හැමකල්හි පැවති දියසුළි ඇත්තාවූ බිහිසුනුවූ යම් ඒ විලක් දක්නෙහිද, නොයෙක් සියගණන් පුරුෂ ප්‍රමාණ ඇත්තාවූ මෙතෙම මාගේ දිව්‍යවූ වාසස්ථානයවේ.

19 "ඉව්රුදෙක්හි වාසය කරන්නාවූ මොනරුන් විසින්ද, කොස්වාලිහිණියන් විසින්ද, පවත්වනලද නාද ඇත්තාවූ නීලවර්ණ ජලය ඇත්තාවූ ආචාරසම්පන්න වූවන්ගේ වාසස්ථානවූ, ක්ෂෙමභූමියවූ මේ යමුනා නම් ගඟට භය නැතිව ඇතුල්වෙයි" නාරජ කීයේය.

20 අනුචරයන් සමග එහි පැමිණියේ පුත්‍රයා සහිත බ්‍රාහ්මණයාට පුදනලද්දේ "බ්‍රාහ්මණය, මාසතු කම්සැපවලින් සුවසේ වාසය කරවයි" නාරජ කීයේය.

21 "පින්වත් නාගරාජය, ඔබගේ භවනයෙහි මේ භූමි තොමෝ හාත්පස සියලු දිශාවන්හි සමතලාවූවා බොහෝ තුවරලා ඇත්තී රන්වන් ඉඳුගොව්වන්ගෙන් ගැවසීගත්ති නිල්වන් කුශතණවලින් යුක්තවූවා බබළයි.

22 "වනපංතීහු සිත්කළුවෙත්. මනාව නිමවනලද සිත්කළුවූ හංසයන් විසින් පවත්වනලද නාද ඇත්තී පිපී වැටුනාවූ පියුම් පෙතිවලින් ගැවසීගත් පොකුණුද තිබෙත්

23 "අටැස් ඇතිකොට මනාව කරණලද ටැම් ඇති සියල්ල වෛඩූර්‍යමයවූ නාග කන්‍යාවන්ගෙන් පිරුණාවූ දහසක් ටැම් ඇති ප්‍රාසාදයෝ බබළත්.

24 "තමන්ගේ පිනෙන් පහළවූ සම්බාධ නැත්තාවූ ක්ෂෙමවූ රම්‍යවූ අත්‍යන්ත සැප ඇත්තාවූ මේ දිව්‍යවූ විමානයෙහි උපන්නෙහිය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

25 "යම්හෙයකින් ඔබගේ මේ සම්පත්තිය ප්‍රභාවත්වූ ශක්‍රයාගේ මෙන් මහත්වේද, එහෙයින් සක්දෙව් රජුගේ වෛජයන්ත ප්‍රාසාදය නොකැමැතිවෙහියයි සිතමි.

26 "සම්පත්තියෙන් සමෘද්ධවූ සක්දෙව් රජුගේ ආනුභාවයතෙම ශක්‍රයා සහ දෙවියන්ට මෙහෙවර කරන්නාවූ අපගේ සිතිනුදු නොපැමිණියයුතු වේයයි" නාරජ කීයේය.

27 "සොයනලද සුව ඇත්තාවූ දෙවියන්ගේ ඒ විමානය ප්‍රාර්ථනාකොට පෙහෙවස් වසමින් මම තුඹස මත්තෙහි සයනය කරමියිද" කීයේය.

28 "පින්වත් නාරජ, මමද මුවන් සොයමින් පුත්‍රයා සමග වනයට පිවිසුනෙමි. ඒ මා මළහු හෝ ජීවත්වන්නහු හෝ අපගේ නෑයෝ නොදනිත්.

29 "කාශිරාජගේ දුව මගේ පුත්‍රවූ යශ පිරිවර ඇත්තාවූ භූරිදත්ත නම් ඔබට කියා අවසර ගනිමි. ඒ ඔබ විසින් අනුදන්නා ලද්දාවූ අපි ගොස් නෑයන් දකිම්හයි" බමුණා කීයේය.

30 "මා සමීපයෙහි වසන්නෙහිය යන යමක්වේද, මෙය වනාහි ඒකාන්තයෙන් මාගේ කැමැත්ත වේ. මිනිස්ලොව මෙබඳුවූ කාම සම්පත් නොම සුලභවෙත්.

31 "ඉදින් මාසතු කම්සැපවලින් පුදනලද්දාවූ ඔබ මෙහි වාසයකරන්ට නොකැමැත්තෙහි නම් මා විසින් අවසර දෙනලද්දාවූ නුඹ සුවසේ ගොස් නෑයන් දකුවයි" නාරජ කීයේය.

32 "මේ දිව්‍යවූ මැණික දරන්නේ මෙහි ආනුභාවයෙන් ගව සම්පත්ද, දූ දරුවන්ද ලබයි. නිරෝගවූයේ සුව ඇත්තේ වෙයි. බ්‍රාහ්මණය, එබැවින් මේ මැණික භාරගෙණම යවයි" සියලු කැමැති සම්පත් දෙන්නාවූ මැණිකක් දුන්නේය.

33 "පින්වත් භූරිදත්ත නම් නාගරාජය, ඔබගේ නිර්දොෂවූ වචනය අසා සතුටුවෙමි. මම වනාහි ජරාවට ගියෙමි. එහෙයින් පැවිදිවන්නෙමි. කම්සැප ප්‍රාර්ථනා නොකරන්නෙමි. මට මැණිකෙන් ප්‍රයෝජන නැතැයි" බමුණා කීයේය.

34 "බ්‍රාහ්මණය, ඉදින් බ්‍රහ්මචයර්‍යාවගේ බිඳීමෙක් වේනම් සම්පත්වලින් කටයුත්තක් ඇතිවීනම් එකල්හි සැක නැතිව මා ලඟට එව. තොපට බොහෝ ධනය දෙන්නෙමියි" නාරජ කීයේය.

35 "පින්වත් භූරිදත්ත නම් නාරජ, ඔබගේ නිර්දොෂවූ වචනයට කැමතිවෙමි. ඉදින් මට ප්‍රයෝජනයෙක් වන්නේ නම් නැවතද ඔබ වෙතට එන්නෙමියි" බමුණා කීයේය.

36 භූරිදත්ත නාරජතෙම මෙය කියා නාගයන් සතර දෙනෙකු යැවූයේය. "එව්, තොපි යව්. මොවුන් නගාසිටුවව්." බ්‍රාහ්මණයා වහා බරණැස්නුවරට යන මගට පමුණුවව්."

37 ඔහුගේ ඒ වචනය අසා භූරිදත්ත නාරජහු විසින් මෙහෙයන ලද්දාවූ නාගයෝ සතරදෙනා නැගිට වහා බ්‍රාහ්මණයා බරණැස මගට පැමිණවූවාහුය.

38 "අභිවෘද්ධිදායකවූ යහපත් වස්තුවක්වූ සිත්කළුවූ ලක්ෂණ ඇති මැණික්ගලක් හැරගෙණ එන්නාවූ නුඹ කොහිදී මේ මැණික්ගල ලැබුවෙහිදැයි" බමුණා ඇසීය.

39 "අද මම උදෑසනම මහමග යමින් හාත්පස රතුඇස් ඇති නාගකන්‍යාවන් දහසක් විසින් පිරිවරණ ලද මේ මැණික ලැබුවෙමියි" ආලම්බනතෙම කීයේය.

40 "මනාව බුහුමන් කරණලද, පුදනලද හැමකල්හි ආදරකරණලද මේ මැණික මනාව දරණලද්දේ මනාව බහා තබනලද්දේ සියලු සම්පත් සිද්ධකර දෙන්නේය.

41 "බහා තැබීමෙහිද, දැරීමෙහිද බුහුමන් ඇත්තහුගේ විනාශයට නුනුවණින් පුරුදුකළ මේ මැණිකම සෑහේ

42 "උපචාර කිරීමෙහි අදක්ෂයෙක් මේ දිව්‍ය මැණික දරන්ට සුදුසු නොවේ. එබැවින් ස්වර්ණනිෂ්ක සියයක් ගණුව, මේ මාණික්‍යරත්නය මට දෙවයි" බ්‍රාහ්මණයා කීයේය.

43 "මාගේ මේ මැණික ගවයන්ගෙන් හෝ රත්නයකින් හෝ විකිණිය යුතු නොවේ. සියලු ලක්ෂණයෙන් යුක්තවූ මාගේ මේ මැණික්ගල නොම විකිණිය යුතුයයි" ආලම්බන තෙම කීයේය.

44 "ඉදින් නුඹ විසින් ගවයන්ගෙන් හෝ කරත්තයකින් හෝ මේ මැණික විකිණියයුතු නොවේ නම්, එසේ ඇතිකල්හි කුමකින් මැණික විකිණිය යුතුදැයි අසන ලද්දේ නුඹ එය මට කියවයි" බමුණා කීයේය.

45 "යමෙක් තේජස් ඇත්තාවූ කිසිවෙකු විසින් ඉක්මවිය නොහැකි මහත් නාගයෙකු මට කියන්නේ නම් ඔහුට ප්‍රභාවෙන් දිළිසෙන්නාක් බඳුවූ මේ මැණික දෙන්නෙමියි" ආලම්බන කීයේය.

46 "කිමෙක්ද, නුඹ බ්‍රාහ්මණ වෙශයෙන් ආ පක්ෂීන් ගෙන් උතුම්වූ සුපර්ණයෙක්ද, තමන්ගේ ගොදුරවූ නාගයෙකු අල්වා ගණු කැමැත්තෙන් සොයමින් ඇවිදීයයි සිතමියි" බ්‍රාහ්මණයා කීයේය.

47 "මම ගුරුළෙක් නොවෙමි. මා විසින් ගුරුළෙක් නොදක්නාලදී. නයි විෂ බස්වන්නාවූ ආලම්බන නම් වෛද්‍යවූ බ්‍රාහ්මණයෙකුයයි, මා දනිත්"යි ආලම්බන කීයේය.

48 "නුඹගේ කවර නම් බලයක් ඇද්ද, නුඹගේ කිනම් ශිල්පයක් තිබේද, කවර කරුණෙක්හි හෝ තදින් පිහිටියාවූ නුඹ නාගයාට අවමන් කරන්නෙහිදැයි" බ්‍රාහ්මණයා ඇසීය.

49 වනයෙහි වාසය කරන්නාවූ බොහෝ කල් කරණලද තපස් ඇත්තාවූ කොශිය ගොත්‍ර ඇති ඍෂිහට ගුරුළෙක් උතුම්වූ විෂ බස්වන මන්ත්‍රයක් කීයේය.

50 "පර්වත අතරෙහි වාසයකරන්නාවූ උන්වහන්සේ වඩනලද සිත්ඇත්තාවූ තාපසයන්ගෙන් එක්තරා කෙනෙකි. රෑ දාවල් අනලස්වූ මම උන්වහන්සේට සකස්කොට උපස්ථාන කෙළෙමි.

51 "එකල්හි සිල්වත්වූ රකිණලද බ්‍රහ්මචර්‍ය්‍යා ඇත්තාවූ මා විසින් බුහුමන් කරණලද්දාවූ ඒ පින්වත් තාපසතෙම සියකැමැත්තෙන්ම මට මේ දිව්‍යවූ මන්ත්‍රය ප්‍රකාශ කෙළේය.

52 "මම ඒ මන්ත්‍ර ඇසුරුකෙළේ වෙමි. එහෙයින් මම සර්පයන්ට බිය නොවෙමි. විෂබස්වන්නාවූ වෙදුන්ට ආචාර්‍ය්‍යවූ ආලම්බන යයි මා දනිත්යයි" කීයේය.

53 "පුත සෝමදත්තය, මේ මැණික ගනිමු. නුඹද එය දනුව, කැමැත්තෙන් ලඟට පැමිණියාවූ ශ්‍රී කාන්තාව දණ්ඩකින් ගසා දුරු නොකරමුයි" බ්‍රාහ්මණයා සෝමදත්තට කීයේය.

54 "එම්බා බ්‍රාහ්මණය, ස්වකීය ගෙදරට පැමිණියාවූ ඔබට ඒ නාරජතෙම පූජා සත්කාර කෙළේය. මෙසේ යහපත කරන්නහුට කුමක්හෙයින් මුළාවෙන් ද්‍රෝහ කිරීමට කැමැත්තෙහිද?"

55 "ඉදින් වනාහි නුඹ වස්තුව කැමැත්තෙහි නම් භූරිදත්ත නාරජතෙම දෙන්නේය. ඒ නාරජ වෙතටම ගොස් ඉල්වව, ඔබට බොහෝ ධනය දෙන්නේයයි" පුත්‍රවූ සෝමදත්ත කීයේය.

56 "පුත සෝමදත්තය, අතට පැමිණියාවූද, භාජනයට පැමිණියාවූද, ඉදිරියෙහි තබනලද්දාවූද, යමක් වේනම් එය කෑමට උතුම් වන්නේය.

57 "තමන් විසින් දැක්ක හැකිවූ අපගේ ලාභය ඉක්ම නොයේවායි" බ්‍රාහ්මණයා කීයේය.

58 "පියාණෙනි, යමෙක් තමහට වැඩ කැමැත්තවුන් හැර දවන්නාවූ මිත්‍රද්‍රෝහිවේද, හෙතෙම මරණින් මතු දරුණු වූ නිරයෙහි පැසේ. ජීවත්වන්නාවූද මොහුට පෘථිවිය විවෘත වේ. හෙතෙම ජීවත්වන්නේ නමුත් වියලෙන්නේය.

59 "ඉදින් වනාහි ඔබ ධනය කැමැත්තෙහි නම් භූරිදත්තතෙම දෙන්නේය. තමන් විසින් කරණ ලද්දාවූ පාපය නොබෝ කලකින් විපාක විඳින්නෙහියයි සිතමියි" සෝමදත්තතෙම කීයේය

60 "පුත සොමදත්තය, බ්‍රාහ්මණයෝ මහත්වූ යාගකොට මෙසේ කළාවූ පාපයෙන් පිරිසිදුවෙත්. අපි මහා යාගයක් කරන්නෙමුයි මෙසේ ඒ පාපයෙන් මිදෙන්නෙමුයි" බ්‍රාහ්මණයා කීයේය.

61 "එහෙනම් දැන් මම ඉවත්වයෙමි. මෙසේ පව් කරන්නාවූ ඔබ සමග අද මම එක පියවරක්වත් නොයන්නෙමියි" සෝමදත්තතෙම කීයේය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

62 පණ්ඩිතවූ සෝමදත්තතෙම පියාට මෙය කියා දේවතාවන්ට උස්හඬින් දන්වා ඒ ස්ථානයෙන් බැහැරව ගියේයි.

63 "යම් නාගයෙකුගේ රක්තවර්ණවූ හිස රතිඳු ගොව්වන්ගේ පැහැයට බඳු ප්‍රභා ඇත්තේද, ඒ මේ මහානාගයා අල්වාගණුව. මේ මැණික මට දෙව;

64 "මොහුගේ මේ කපුපුළුන් ගොඩක් බඳු සිරුර දක්නා ලැබේ. හෙතෙම තුඹස මතුයෙහි වූයේ සයනය කරයි. බ්‍රාහ්මණය, නුඹ ඒ නාගයා අල්වාගනුවයි" බ්‍රාහ්මණතෙම කීයේය,

65 ඉක්බිති දිව්‍ය ඖෂධවලින්ද මන්ත්‍ර පදයන් ජප කරමින් තමහට ආරක්ෂාකොට ඒ ආලම්බනතෙමේ මෙසේ ඒ භූරිදත්ත නාගරාජයා අල්වාගන්ට හැකිවූයේය.

66 "මෑණියෙනි, සියලු කාමසම්පත්තියෙන් සමෘද්ධ වන්නාවූ මා දැක ඔබගේ ඉන්ද්‍රියයෝ විප්‍රසන්න නොවූහ. රන් කැඩපතක්බඳු මුහුණද කාලවර්ණ විය.

67 "අතින් කඩාගන්නාලද, අත්ලෙන් පිරිමදිනාලද, පියුමක් මෙන් මෙබඳුවූ මා දැක ඔබගේ මුහුණ කළුවූයේ මක්නිසාදැයි" සුදස්සන නම් නාරජ ඇසීය.

68 "කිමෙක්ද ඔබට කිසිවෙක් හිංසාවක් නොකෙළේද, කිම ඔබට කිසියම් වේදනාවක් ඇද්ද, යම් කාරණයකින් ආවාවූ මා දැක ඔබගේ මුහුණ කළුවීද, ඒකාරණය මට කියවයි" කීයේය.

69 "පුත්‍රය, මම සිහිනය දුටුවෙමි. මෙයින් සිව්මසක් ඉක්ම ගියේය. මාගේ දකුණු අත කපා ලේ වැගිරෙන්නාක් මෙන් මා හඬමින් සිටි කල්හි පුරුෂයෙක් හැරගෙණ ගියේය.

70 "එම්බා සුදස්සන නම් පුත්‍රය, යම් කලෙක මම ඒ ස්වප්නය දුටුයෙම්ද, එතැන් සිට දාවල් හෝ රාත්‍රියෙහි හෝ මට සුවයෙක් නම් නොලැබේ යයි දැනගණුවයි" කීය.

71 "පෙර රන්දැලින් වසනලද මනොඥ ශරීර ඇත්තාවූ නාග කන්‍යාවෝ යමෙකු පිරිවැරුවාහුද ඒ භූරිදත්ත නම් නාරජ දැන් දක්නා නොලැබේ.

72 "මනාව පිපුනාවූ කිනිහිරි ගස් මෙන් උතුම් කඩු දරන්නාවූ නාග මානවකයෝ පෙර යමෙකු පිරිවැරුවාහුද, ඒ භූරිදත්ත තෙම දැන් දක්නා නොලැබේ.

73 "එබැවින් දැන් අපි භූරිදත්තගේ ගෙදරට යන්නෙමු. ධර්මයෙහි පිහිටියාවූ සිල්වත්වූ ඔබගේ සහෝදරයා දකිමුයි" මව කීවාය.

74 එන්නාවූ භූරිදත්ත නාරජුගේ ඒ මවද දැක භූරිදත්ත නාරජුගේ ස්ත්‍රීහු හිස අත්බැඳගෙණ හැඬුවාහුය.

75 "එම්බා ආයසීාවෙනි, යශස් ඇත්තාවූ භූරිදත්ත නම් ඔබගේ පුත්‍රයා මළාහුද, නොහොත් ජීවත්වන්නාහුදැයි මෙයින් යට මාසයක් පමණ කල් නොදනිමුයි" කීවාහුය.

76 "හිස්වූ කැදැල්ල දැක නැසුනාවූ පැටව් ඇති ලිහිණියක මෙන් භූරිදත්ත නොදක්නාවූ මම බොහෝ කලක් දුකින් තැවෙන්නෙමි.

77 "හිස්වූ කැදැල්ල දැක එහා මෙහා දුවන්නාවූ නැසුනු පැටවුන් ඇත්තාවූ ලිහිණියකමෙන් ප්‍රිය පුත්‍රයා නොදක්නී මම ඒ ඒ තැන දුවන්නෙමි.

78 "හිස්වූ කැදැල්ල දැක නැසුනු පැටවුන් ඇත්තාවූ කබරුසු දේනුවක මෙන් මම භූරිදත්ත නම් පුතු නොදක්නී බොහෝ කලක් දුකින් තැවෙන්නෙමි.

79 "භූරිදත්ත නම් පුත්‍රයා නොදක්නාවූ ඒ මම ඒකාන්තයෙන් දිය නැත්තාවූ කුඩා විලෙක්හි සක්වාලිහිණියක මෙන් බොහෝ කලක් දුකින් තැවෙන්නෙමි.

80 "යම්සේ කඹුරන්ගේ උදුන ඇතුළත ගිනි ඇවිලේද, පිටත නොඇවිලේද, එමෙන් භූරිදත්ත නොදක්නාවූ මම ශොකයෙන් ඇවිලෙමියි" මව වැළපුනාය.

81 භූරිදත්ත නම් නාරජුගේ භවනයෙහි අඹුවෝද දරුවෝද යුගාන්ත වාතයෙන් මඩනා ලද්දාවූ සල්ගස් මෙන් අතිශයින් ඇලලී ගියාහු ශයනය කෙරෙත්යයි වදාළේය.

82 අරිට්ඨ නම් නා රජතෙමේද සුභග නම් නා රජ තෙමේද, යන දෙදෙනා අනතුරුව භූරිදත්ත නා රජුගේ භවනයෙහි මේ ශබ්දය අසා එහි දිව ගියාහුය.

83 "එම්බා මෑණියෙනි අස්වසව, ශොක නොකරව සත්වයෝ නම් මෙබඳු ස්වභාව ඇත්තාහුමය. චුතවෙත් උපදිත් යන මෝතොමෝ මේ ලෝකයාගේ පිරිනැමීම වේයයි" කීහ.

84 "පුත්‍රය, මමද දනිමි. ප්‍රාණීහු මෙබඳු ස්වභාව ඇත්තාහුමය. එසේද භූරිදත්ත නොදක්නී මම ශොකයෙන් පෙළුනේවෙමි.

85 "පුත සුදස්සනය, ඉදින් මට මේ රාත්‍රියෙහි භූරිදත්ත නොදක්නී නම් ජීවිතය හරින්නෙමියි සිතමි. එය දනුවයි" මව කීවාය.

86 "මෑණියෙනි, අස්වසනු මැනව. ශොක නොකරව සහෝදරයා සොයාගෙණ එන්නෙමු. සහෝදරයා සෙවීමෙහි හැසිරෙමින් දිශානු දිශාවන්ට යන්නෙමු.

87 "පර්වතයෙහිද පර්වත දුර්ගයන්හිද ගම්වලද නියම් ගම්වලද ඇවීද සොයන්නෙමු. දශරථයකින් මොබ ආවාවූ සහෝදරයා බලවයි' පුත්‍රයෝ කීහ.

88 "දරුව, තාපසය අතින් මුදන ලද සර්පතෙම ඔබගේ පාදයෙහි දැඩිලෙස පතිතවූයේය. කිමෙක්ද, ඔබට දෂ්ට කෙළේද, බිය නොවෙව, සුවපත් වෙවයි" ආලම්බනයා කීයේය

89 "මේ නාගතෙම මට ස්වල්ප තරම්වත් දුකක් ඉපදවීමට සමර්ථ නොවේ. යම්තාක් අහිගුණ්ඨිකයෝ ඇද්ද, මට වැඩියෙන් සමර්ථවූවෙක් නැත්තේයයි" තවුස් වෙසින් ආ සුදස්සන නම් නාරජ කීයේය.

90 "බමුණෙකුගේ ආකාරයෙන් කවර නම් ලාමකවූවෙක් මේ පිරිසට පැමිණියේද, මනා යුද්ධයකින් කැඳවත්වා පිරිස මාගේ වචනය අසාවායි" ආලම්බනයා කීයේය.

91 "ආලම්බනය, තෝ නාගයාගෙන් මා හා යුද්ධ කරව. මම වැඩි පැටවියගෙන් තා හා යුද්ධ කරන්නෙමි. අපගේ

යුද්ධයෙහි පන්දහසකින් පරදු තිබීම වේවායි" සුදස්සනතෙම කීයේය.

92 "එම්බා මානවකය, මම වනාහි ධන ඇත්තාවූ වස්තුවෙන් ආඪ්‍යවූවෙක්මි. නුඹ දිළින්දෙක් වෙහිය. නුඹට කවර නම් ඇපකාරයෙක් ඇත්තේද? මේ දූ කෙළියෙහි තැබිය යුතු කිනම් ධනයක් වන්නේද?

93 "මට වනාහි මේ දූ කෙළියෙහි දියයුතු ධනයද වන්නේය. තැබියයුතු එබඳු ඇප ඇත්තේය එහෙයින් එහි පන්දහස දක්වා අපගේ පරදු තිබීම වේවායි" ආලම්බන කීයේය.

94 "මහරජ, ඔබට යහපතක් වේවා. මාගේ වචනය අසනු මැනව. කීර්තිමත්වූ රජතෙමේ මට පන්දහසකට ඇප වේවායි" සුදස්සනතෙම කීයේය.

95 "බ්‍රාහ්මණය, පියා විසින් ගන්නාලද ණයක් හෝ වේද, නොහොත් තෙමේ කරණලද යම් ණයක් හෝ වේද, කුමක් හෙයින් නුඹ මෙබඳු බොහෝ ධනයක් මාගෙන් ඉල්වන්නෙහි දැයි" රජතෙම ඇසීය.

96 "මහරජ, ආලම්බනයා වනාහි නාගයා කරණකොට ගෙණ යුද්ධයෙහි මා දිනන්ට කැමතිවේ. මම මැඩි පැටව් ලවා ඒ බ්‍රාහ්මණයා දෂ්ට කරවන්නෙමි

97 "රට වර්ධනය කරවන්නාවූ මහරජ්ජුරුවෙනි, අද ඔබ ඒ නයි නැටීම දකින්ට ක්ෂත්‍රිය සමූහයා විසින් පිරිවරණ ලදුව වැඩිය මැනවයි" සුදස්සනතෙම කීයේය.

98 "එම්බා මානවකය, මම ශිල්පවාදයෙන් ඔබ ඉක්මවා නොහඟිමි. ඔබ වනාහි ශිල්පයෙන් ඉතා මත්වූයෙහිය. එබැවින් මේ නාගයාට බුහුමන් නොකෙරෙහියයි" ආලම්බන කීයේය

99 "අපිදු ශිල්පවාදයෙන් බ්‍රාහ්මණයා ඉක්මවා නොහඟිමි. නුඹ විෂ නැත්තාවූ මේ නාගයාගෙන්ද බොහෝ සෙයින් ජනයා රවටන්නෙහිය.

100 "යම්සේ එය මම දනිම්ද, මහජනතෙමේද මෙසේ දන්නේනම් ආලම්බනය තෝ අත්සුණු මිටකුත්

නොලබන්නෙහිය. කොයින් නම් ධනයක් ලබන්නෙහි දැයි” සුදස්සනතෙම ඇසීය.

101 රළු අඳුන් දිවිසම් දරන්නාවූ ජටාධරවූ අඳුන් නොගෑ නොසැරසුනාවූ ජඩවූ මේ පිරිසට පැමිණියාවූ ඒ නුඹ මෙබඳු ආනුභාව ඇති ඒ නාගයා විෂ නැත්තෙකැයි අවමන් කරන්නෙහිය.

102 “උග්‍රවූ විෂ තේජසින් සම්පූර්ණවූ ඒ නාගරාජයාට ලංව නුඹ දැනගන්නෙහිය. මේ නාගරාජතෙම නුඹ වහා අළු රැසක් මෙන් කරන්නේයයි සිතමියි” ආලම්බනයා කීයේය.

103 “ගැරඬියාගේද දියබරියාගේද පනවුල්ලාගේද විෂ ඇතිවන්නේය. තොපගේ මේ රතු හිස ඇත්තාවූ සර්පයාගේ විෂයක් නම් නැත්තේයයි” සුදස්සනතෙම කීයේය

104 “මේ ලෝකයෙහි දන්දී දායකයෝ දෙව්ලොවට යතියි සංයම ඇත්තාවූ තපශ්වීවූ රහතුන් වෙතින් මෙය මා විසින් අසන ලදී. ඉදින් තගේ දියයුතු දෙයක් ඇත්නම් ජීවත්වන්නේම දන්දෙව,

105 “මේ නාගතෙම මහත් ඍද්ධි ඇත්තාවූ තේජස් ඇත්තාවූ කිසිවෙකුට ඉක්මවිය නොහැක්කෙක්වේ. ඔහු ලවා තා දෂ්ට කරවන්නෙමි. හෙතෙම තා හළුකරන්නේයයි” ආලම්බන තෙම කීයේය.

106 “යහළු ආලම්බනය, මේ ලෝකයෙහි දන්දී දායකයෝ දෙව්ලොවට යෙත්යයි සංයම ඇත්තාවූ තපස්වීන් අතින් මා විසිනුදු මෙය අසන ලදී. ඉදින් තාගේ දිය යුතු දෙයක් ඇත්නම් ජීවත් වන්නාවූ තෝම එය දෙව

107 “මේ අච්චීමුඛී නම් මැඩී පැටව් උග්‍රවූ විෂතෙජසින් සම්පූර්ණවූවාය. ඈ ලවා තා දෂ්ට කරවන්නෙමි. ඕතොමෝ තා හළු කරන්නේය.

108 “යම් තැනැත්තියක් ධ්‍රතරාෂ්ට නම් නා රජුගේ දුවවීද, මාගේ වෙන මව් ඇති නැගනි වීද, උග්‍රවූ විෂ තේජසින් පිරුණාවූ

ඒ මේ අච්චිමුඛීනම් මැඩි පැටව් දක්නා ලැබේවායි” සුදස්සනතෙම කීයේය.

109 “බ්‍රහ්මදත්ත නම් මහරජ, ඉදින් මේ විෂ පොළොවෙහි ඉසින්නෙම් නම් තෘණද ලතාවෝද ඖෂධ ජාතීහුද සැක නැතිව වියලි යන්නාහුයයි දැන ගනු මැනවයි” කීයේය.

110 “එම්බා බඹදත් රජ, ඉදින් මේ විෂ උඩට දමන්නෙම් නම් මේ වර්ෂාව හත් අවුරුද්දක් නොවස්නේය. පිනි බින්දුවකුත් නොවැටෙත්යයි දනුවයි” කීයේය.

111 බඹදත් රජ, ඉදින් මේ විෂ බින්දු දියට ඉසින්නේ නම් දියෙහි හටගත්තාවූ මස් කැසුප් ආදී යම් පමණ ප්‍රාණීහු වෙද්ද. ඒ සියල්ලෝ මැරෙන්නාහුයයි දැන ගණුවයි” සුදස්සනතෙම කීයේය.

112 “පව් සෝදා හැරීමට සුදුසුයයි ලෝකයා විසින් සම්මත කරණ ලද්දාවූ ප්‍රයාග නම් තීර්ථයෙහි පිහිටියාවූ මෙබඳු ජලය ස්නානය කරන්නාවූ මා කවර නම් භූතයෙක් යමුනා නම් ගඟෙහි ගිල්වමින් ඇද ගත්තේදැයි” වැදි බමුණා ඇසීය.

113 “ලොවට අධිපතිවූ යශ පිරිවර ඇත්තාවූ යම් මේ ධෘතරාෂ්ට නම් නාරජෙක් හාත්පසින් බරණැස් නුවර වටකොට මත්තෙහි පෙණයෙන් වසාගත්තේද, මම ඒ නාග රාජයාගේ පුත්‍ර වෙමි. බමුණ මා සුභගයයි දනිත්යයි” කීයේය.

114 “ඉදින් වනාහි ඔබ දීර්ඝායුෂ ඇතිබැවින් අමර නම් නාගයින්ට අධිපතීවූ කංශනම් ධෘතරාෂ්ට නාගරජහුගේ පුත්‍ර වෙහි නම් ඔබගේ පියතෙම එක්තරා මහේශාක්‍ය වූ නාරජෙක. ඔබගේ මව වනාහි මිනිසුන් අතර අසමාන තැනැත්තියක. එබඳු මහත් ආනුභාව ඇත්තේ බ්‍රාහ්මණයෙකුගේ දාසයෙකු වත් දියෙහි ගිල්වන්ට නුසුදුසුයයි” වැදි බමුණා කීයේය.

115 “එම්බල බමුණ, තෝ ගසක් ඇසුරුකොට සිට ගෙණ දියබොන්ට ආවාවූ මුවෙකු විද්දෙහිය. විදින ලද ඒ මුවා ඊතල වේගයෙන් තැති ගැනුම් ඇත්තේ දුරට ගියේය.

116 "නුඹ මහ වනයෙහි දුවගොස් වැටුනාවූ ඒ මුවා දුටුවෙහිය. ඒ නුඹ මුවමස් කද අරගෙණ සවස නුග ගසක් ලඟට පැමිණියේය.

117 "ගිරා සැළලිහිණියන් විසින් පවත්වන ලද නාද ඇති පැසුනු ගෙඩිවලින් පිගුවන්වූ ඇටුවන් වලින් ගැවසී ගත්තාවූ නුගගස ඇති ඒ භූමිය කොවුලන් විසින් පවත්වන ලද නාද ඇති සිත්කළුවූ නිතර නිල්වන් තෘණයෙන් ගැවසී ගත්තෙක් විය.

118 "ඒ නුග ගසෙහි සිටියාවූ තට ඍද්ධියෙන් හා යශසින් දිළිසෙන්නාවූ මහත් ආනුභාව ඇත්තාවූ නාග කන්‍යාවන් විසින් පිරිවරණ ලද්දාවූ ඒ මාගේ සහෝදරතෙම පෙනුනේය.

119 "ඒ නුඹ මාගේ සහෝදරවූ භූරිදත්ත නම් ඒ නා රජ විසින් සියලු කැමති සම්පත් වලින් සතුටු කරණ ලද්දේ බුහුමන් කරණ ලද්දේ වෙහිය. නුඹ ද්‍රෝහ නොකටයුතුවූ ඔහුට ද්‍රෝහ කෙළෙහිය. තාගේ ඒ පාප කර්මය දැන් මෙහි පැමිණියේය.

120 "වහා බෙල්ල දිගහරුව. තාගේ ජීවිතය නොදෙන්නෙමි. සහෝදරයාට කළාවූ අපරාධය සිහිකරන්නාවූ මම තාගේ හිස සිඳින්නෙමියි" සුභගතෙම කීයේය.

121 'බ්‍රාහ්මණතෙම මන්ත්‍ර හදාරන්නේය. ඉල්ලීමට සුදුසුය. පුදනලද ගිනි ඇත්තේද වේ. යන මේ කරුණු තුනින් බ්‍රාහ්මණතෙම වධ නොකටයුතු වේයයි" වැදි බමුණා කීයේය

122 ධ්‍රතරාෂ්ට නම් නාරජහුගේ යමුනා නම් ගඟ යට භාගයෙහි සියල්ල ස්වර්ණමයවූ යම් නගරයක් යමුනා ගඟ සමීපයෙහි හිමවත් පර්වතය දක්වා බබළාද,

123 "ඒ නගරයෙහි පුරුෂ ශ්‍රෙෂ්ඨවූ සමාන උදාර ඇත්තාවූ ඒ මාගේ සහෝදරයෝ වෙසෙත්. ඔව්හු එහිදී යම්සේ කියද්ද, බ්‍රාහ්මණය, තට එසේ වන්නේයයි" සුභගතෙම කීයේය.

124 "සුභගය, ලෝකයෙහි යාගයෝද වේදයෝද ලාමක නොවෙත්. ලාමකවූ බ්‍රාහ්මණයන් විසින් යොදන ලද්දාහු වෙත්. එබැවින් ඒ නොගැරහිය යුතු බමුණාට නින්දා කරණ තැනැත්තේ

වස්තුවද සත්පුරුෂ ධර්මයද දුරු කෙරේයයි" දොරටුව සමීපයෙහි සිටි කානාරිෂ්ටතෙම කීයේය.

125 "ආයසීවූ බ්‍රාහ්මණයෝවේද හැදෑරීමටද ක්ෂත්‍රීයයෝ පෘථිවි පාලනයටද වෛශ්‍යයෝ සී සෑමටද ශුද්‍රයෝ මෙහෙවර කිරීමටද පැමිණෙත් වායි මහා බ්‍රහ්මයා කීයේය. එසේ පැමිණෙන්නාවූ වෙන වෙනම තමන්ගේ කුල ප්‍රදේශයට සුදුසු පරිද්දෙන් පැමිණියාහුය. මෙසේ වනාහි ඒ මහා බ්‍රහ්මයා විසින් මවන ලද්දාහුයයි කියත්යයිද" කීයේය.

126 "ධාතෘය විධාතෘය වරුණය කුවේරය සෝමය යමය චන්දිමාය වායුය සූරියය යන මේ දෙව් රජවරු වනාහි අනේකප්‍රකාරයෙන් යාග කොට තවද බමුණන්ට සියලු කැමති සම්පත් දී මෙකී තනතුරුවලට පැමිණියාහුය.

127 "අදනාලද දුනු පන්සියයක් පමණවූ මහ දුන්න ඇති බලවත්වූ බිහිසුනු සේනා ඇති දහසක් අත්වලින් ඇද ලිය හැකි දුනුදිය අදනා හෙයින් සහස්සබාහු නම්වූ පෘථිවියෙහි අසමාන යම් අර්ජුන නම්වූ රජෙක්වීද, ඒ රජතෙමේද එකල්හි ගිනිදෙවියා පිදීයයි" කීයේය.

128 "යම් බරණැස් රජෙක් ආහාරයෙන්ද පානයෙන්ද ශක්ති පරිද්දෙන් බොහෝ කලක් මුළුල්ලෙහි පහන් සිත් ඇත්තේ සතුටුවෙමින් බමුණන් වැළඳවීද සුභගය හෙතෙම එක්තරා මහේශාක්‍ය දිව්‍ය රාජයෙක් වූයේයයි" අරිෂ්ටතෙම කීයේය.

129 "යම් රජෙක් මහත්වූ ආහාර ඇති අලාමකවූ ප්‍රභා ඇති ගිනිදෙවියා ගිතෙලින් සතුටු කරන්ට හැකිවීද, ඒ මුචලින්ද නම් රජතෙම උතුම්වූ ගිනිදෙවියාට යාග විධි පවත්වා දිව්‍ය ගතියට පැමිණියේයයි" ද කීයේය.

130 "මහත් ආනුභාව ඇත්තාවූ අවුරුදු දහසක් ජීවත් වූ දැකුම් කටයුතුවූ උදාරවූ යම් රජෙක් අප්‍රමාණවූ රථ සේනාව හැරදමා පැවිදිවූයේ ද දුදීප නම් ඒ රජතෙමේද දෙව් ලොවට ගියේයයි" කීයේය.

131 "යම් සාගර නම් රජෙක් සයුර හිම්කොට ඇති පෘථිවිය ජයගෙණ යහපත්වූ ස්වර්ණමයවූ මහත්වූ යාගස්ථම්භයක් එසවීද,

සුභගය, ගිනිදෙවියා පුදමින් ඒ රජතෙමේද එක්තරා මහේශාක්‍ය දෙවියෙක් වූයේය.

132 "එම්බා සුභගය, යම් රජෙකුගේ ආනුභාවයෙන් ගංගාවෝ පැවැත්තාහුද, දීමක්වූ තැන සමුද්‍රය හටගත්තේද, පාදයෙහි ලොම් ඇත්තාවූ ඒ අඟු රජතෙම ගිනිදෙවියා පුදා ශක්‍ර පුරයට පැමිණියේයයි" කීයේය.

133 "එම්බා සුභගය, යමෙක් දැන් දෙව්ලොව සක්දෙව් රජහුගේ සේනාපතිවූ මහත් සෘද්ධි ඇත්තාවූ යශ පිරිවර ඇත්තාවූ උතුම් දෙවියෙක්වීද, හෙතෙමේද පෙර සෝම යාගයෙන් පව් සෝදා හැර එක්තරා මහේශාක්‍ය දෙවියෙක් වූයේ යයි" කීයේය.

134 "සහෝදර සුභගය, යම් සෘද්ධි ඇත්තාවූ යශස් ඇත්තාවූ මහා බ්‍රහ්මයෙක්තෙම මේ ලෝකයද පරලෝකයද භාගිරතී නම් ගංගාවද හිමවත් පර්වතයද ගිජ්ඣ පර්වතයද යන මේ සියල්ල කෙළේද, හෙතෙමේද එකල්හි ගිනිදෙවියා පිදූයේය.

135 "මාලාගිරි පර්වතයද, හිමවත් පර්වතයද ගිජ්ඣ නම් යම් පර්වතයක් වේද, සුදස්සන නම් පර්වතයද නිසභ නම් පර්වතයද කාකනේරු නම් පර්වතයද යන මොව්හුද සෙසු මහත් වූ පර්වතද යාග කරන්නාවූ බමුණන් විසින් ගඩොලින් බඳන ලද ආසන පිණිස කරණලද්දාහු වෙත්යයි" කීයේය.

136 "වේද හදාරන්නාවූ වේද මන්ත්‍ර කොටස්වලින් යුක්තවූ තපස් ඇත්තාවූ බ්‍රාහ්මණයා ඉල්වීමට සුදුස්සෙකැයිද කීයේය. මුහුදු ඉවුරෙහි දිය නාන්නාවූ එබඳු බ්‍රාහ්මණයෙකු සාගරයතෙම ඇදගත්තේය. එහෙයින් සමුද්‍රය පානය කළ නොහැකි ලුනුදිය ඇත්තෙක් කෙළේය.

137 "ශක්‍රයාගේ යාගයන්ට සුදුසුවූ බොහෝවූ බ්‍රාහ්මණයෝ පෘථිවියෙහි ඇත්තාහ. පළමු දිශාවය පැසුළු දිශාවය දකුණු දිශාවය උතුරු දිශාවය යන මේ දිශාවන්හි ඇත්තාවූ ඒ බ්‍රාහ්මණයෝ දැනුදු ශක්‍රයාට සතුට උපදවත්යයි" කානාරිෂ්ටතෙම කීයේය.

138 "එම්බා අරිෂ්ටය, වේද හැදෑරීම් නම් නුවණ ඇත්තන්ට පරාජය නම් අකුශල ග්‍රහණයද නුවණ නැත්තන්ට ජය නම්

කුශල ග්‍රහණයද වෙත්. වේදත්‍රය මිරිඟු ස්වභාව ඇත්තකැයි නොසළකන්නාහු එයට පැමිණෙත්. මායා කොටස් ඇති මේ වේදයෝ නුවණැත්තහු නොඉක්මවත්. හෙවත් නොරවටත්.

139 "මේ අභිවෘද්ධි නසන්නාවූ මිත්‍රද්‍රෝහි මනුෂ්‍යයාගේ ආරක්ෂාව පිණිස වේදයෝ නොපවතිත්. පුදනලද ගින්නද දෝෂ සහිත සිත් ඇති අකුශල කර්ම කරන්නාවූ මනුෂ්‍යයා ආරක්ෂා නොකෙරේ.

140 "ඉදින් ධන සහිතවූ සම්පත් සහිතවූ මනුෂ්‍යයෝ දර හා තෘණයෙන් මිශ්‍රකොට සියල්ල ගිනි දල්වන ලද්දේද, අසමාන තේජස් ඇත්තාවූ ඒ ගින්නතෙම සියල්ල දවමින් තෘප්තියකට නොපැමිණේ. දිව් දෙකකින් රශ දැනීමට සමර්ථවූ අරිෂ්ටය කවරෙක් ඒ ගින්න සුලභ භික්ෂා ඇත්තක් කරන්නේද,

141 "යම්සේ පෙරලෙන ස්වභාව ඇති කිරි දී බවට පැමිණ නැවත වෙඬරු බවටත් පැමිණේද, මෙසේ ගින්නද පෙරලෙන ස්වභා ඇත්තේවේ. ගිනිගාන දඬු හා යෝගයෙන් යුක්තවූයේ ගින්න හටගණියි.

142 "වියලි කාෂ්ටයන්හිද අළුත්වූ කාෂ්ටයන්හිද ඇතුලට වැදුනාවූ ගින්නක් දක්නා නොලැබේ. ගිනි ගාන දඬු ගත් මිනිසෙකු විසින් අළලනු නොලබන්නේ කටයුතු රහිතව ගින්න නොහටගණියි.

143 "ඉදින් වනාහි ගින්න වියලි කාෂ්ටවලද අළුත් කාෂ්ටවලද ඇතුළත වසන්නේ නම් ලෝකයෙහි සියලු වනයෝ වියලෙන්නාහුය. වියලි කාෂ්ටයෝද ගිනි ඇවිලෙන්නාහුය.

144 "ඉදින් යම් මිනිසෙක් දර හා තෘණයෙන් දුම්සිළු ඇත්තාවූ මහත් තේජස් ඇති ගින්නට අනුභව කරවමින් පින් කෙරේනම් අඟුරු දවන්නෝද ලුණු සාදන්නෝද අරක්කැමියෝද මල සිරුරු දවන්නෝද පින් කරන්නාහුය

145 "ඉදින් මොව්හු වනාහි පින් නොකෙරෙත් නම්, මේ ලෝකයෙහි මන්ත්‍ර හදාරන්නාවූ බ්‍රහ්මණයෝ ගිනි තැප පින් කෙරෙද්ද, මේ ලෝකයෙහි කිසි මිනිසෙක් දුම්සිළු ඇත්තාවූ

මහත් තේජස් ඇති ගින්නට අනුභව කරවමින් පිනක් නොකෙරෙයි.

146 "ලෝවැස්සන් විසින් පුදන ලද්දාවූම ගින්නතෙමේ නොමනා ගඳ ඇති බොහෝ දෙනාට අප්‍රියවූ යම් කුණපයක් මනුෂ්‍යයෝ දුරු කෙරෙද්ද, දිව් දෙකින් රස දැනගැනීමට සමර්ථවූ අරිෂ්ටය එබඳු නොපසස්නා ලද කුණපය කෙසේ නම් අනුභව කරන්නේද?

147 "ගින්න වනාහි සමහරු දෙවියන් අතුරෙන් කෙනෙකැයි කියත්. අඥානවූ ම්ලෙච්ඡයෝ වනාහී ජලය දෙවියෙකැයි කියත්. මේ සියල්ලෝම බොරු කියත්. ගින්න දෙවියන්ගෙන් කෙනෙක් නොවේ. ජලයද දෙවියෙක් නොවේ.

148 "ඉන්ද්‍රියයන් නැත්තාවූම සිත් පිත් නැත්තාවූ, සත්වයන්ගේ බත් පිසීම ආදී කටයුතු කරන්නාවූ වෙස්සානර නම්වූ ගින්න පුදා පාප කර්ම කරණු ලබන්නෙක් කෙසේ නම් සුගතියට යන්නේද?

149 "මේ ලෝකයෙහි ජීවිකාව ප්‍රයෝජනකොට ඇත්තාහු සියල්ලන් මැඩ පවත්වන්නාවූ මහා බ්‍රහ්මයා ගිනි දෙවියාට පුදන්නෙකැයි කියත්. සියලු ආනුභාව ඇත්තාවූද බ්‍රහ්ම තෙමේ කුමක් නිසා තෙමේ නොමවන ලද්දේ මවනලද ගින්නට වඳින්නෙක් වන්නේද,

150 "එම්බා අරිෂ්ටය, මේ බ්‍රාහ්මණයෝ සිනාසීමට සුදුසුවූ නුවණැත්තන්ගේ සිතීමට නුසුදුසුවූ අසත්‍යවූවක් ලාභසත්කාර හේතුවෙන් පෙර පැතිරවූහ. ඔව්හු ලාභ සත්කාර නොලැබෙන කල්හි සතුන් හා එක්කොට ශාන්ති ධර්ම නම් යාග පූජාවක් නිපදවූහ.

151 "ආයසීවූ බ්‍රාහ්මණයෝ මන්ත්‍ර හැදෑරීමටද ක්ෂත්‍රියයෝ පෘථිවි පාලනයටද වෛශ්‍යයෝ සීසෑමටද ශුද්‍රයෝ ඔවුන්ගේ මෙහෙකිරීමටද වෙන් වෙන් වශයෙන් තමන්ගේ කුලප්‍රදෙශයට සුදුසු පරිද්දෙන් පැමිණියාහුය. මොව්හු මහා බ්‍රහ්මයා විසින් මෙසේ මවන ලද්දාහුයයි කියත්.

152 "යම්සේ බ්‍රාහ්මණයන් විසින් මේ කියන ලද්ද එසේ මෙයද සත්‍ය වචනයක් වන්නේ නම් ක්ෂත්‍රිය නුවූවෙක් කිසිකලෙකත් රාජ්‍යය නොලබන්නේය, බ්‍රාහ්මණ නොවූවෙක් මන්ත්‍රපද ඉගෙණ නොගන්නේය. වෛශ්‍යයන් හැර අනිකෙක් සීසෑම නොකරන්නේය. ශූද්‍රතෙම අනුන්ගේ මෙහෙකරු බැවින් නොමිදෙන්නේය

153 "යම්හෙයකිනුත් මේ කීම අසත්‍යවේද, එහෙයින් උදර පූරණය හේතුකොට ඇත්තාවූ මේ බ්‍රාහ්මණයෝ බොරුද කියත්. ඒ බොරුව මද නුවණැත්තෝ අදහා ගණිත්. නුවණැත්තෝ තුමූම ඒ බොරුව සදොස්යයි දකිත්.

154 "ක්ෂත්‍රියයෝ අයබදු නොගනිත්. වෛශ්‍යයෝ අයබදු නොදෙත්. බ්‍රාහ්මණයෝ ආයුධගෙණ හැසිරෙත්. එබඳු කැළඹුනාවූ විශෙෂයෙන් බිඳීගියාවූ ඒ ලෝකය කුමක් හෙයින් බ්‍රහ්මතෙමේ ඍජු නොකෙරේද?

155 "ඉදින් වනාහි සියලු ලෝකයෙහි අධිපතිවූ බොහෝ සත්ව ප්‍රජාවන්ට ස්වාමිවූ ඒ බ්‍රහ්මතෙම ලෝකය මැවීනම් මායාවය මුසාවාදය මදය යන මේ අධර්මයෙන් යුක්තව කුමක් සඳහා මැවුයේද?

156 "ඉදින් වනාහි සියලු ලෝකයෙහි අධිපතිවූ බොහෝ සත්ව ප්‍රජාවන්ට ස්වාමිවූ යම් මහා බ්‍රහ්මයෙක්වීද, අරිෂ්ටය කුශල ධර්මය ඇති කල්හි යම් බ්‍රහ්මයෙක් අධර්මය ඇති කෙළේද එහෙයින් හෙතෙම අධාර්මිකයෙක් වේ

157 "පනුවන්ද පලඟැටියන්ද සර්පයන්ද මැඩියන්ද මැස්සන්ද යන කෘමිවර්ගයා නසා පිරිසිදු වේය යන මේ අනාර්‍ය්‍ය ස්වරූපවූ ධර්මයෝ වනාහි කාම්බෝජ රටවැසි බොහෝ දෙනාගේ අසත්‍ය ධර්මයෝ වෙත්යයි" බොධිසත්ව තෙම කීයේය.

158 "ඉදින් වනාහි යමෙක් යාගයෙහි නැසේද, හෙතෙම පිරිසිදු වේනම් නසනලද්දාවූද හෙතෙම දිව්‍යලෝකයට පැමිණේ නම් බ්‍රාහ්මණයෝ බ්‍රාහ්මණයෙකුම මරන්නාහුය. යම්කෙනෙකුත් ඔවුන්ගේ වචන අදහන්නාහු නම් ඔවුන්ද මරවන්නාහුය.

159 "කිසියම් මෘග කෙනෙක් තමා නැසීමට යාඥා නොකරත්. සිව්පාවෝද යාඥා නොකරත්. ගවයෝද එසේ තමා නැසීමට යාඥා නොකරත්. මේ ලෝකයෙහි ජීවිකාව ප්‍රයෝජන කොට ඇත්තාහු යාගයන්හි පණ ඇති සිව්පා සතුන් සල්වමින් මරත්.

160 "ඒ අඥානයෝ යාගස්ථම්භයෙහි සිව්පාවුන් බඳනා ලද කල්හිද මේ යාගස්ථම්භයතෙම තොපට පරලෙව්හි කැමැති සම්පත් දෙන්නේය. පරලොව ශාස්වත වන්නේයයි විසිතුරු වර්ණනා වලින් මුහුණ සතුටු කරත්.

161 "ඉදින් යාගස්ථම්භයෙහි මැණික්ද සක්ද මුතුද ධාන්‍යයද ධනයද රිදීද රත්රන්ද වේනම් වියලි කාෂ්ටවලද අළුත් කාෂ්ටවලද වේනම්, ඉදින් දෙව්ලොව සියලු කැමති සම්පත් දෙන්නේ නම්, වෙදත්‍රය දන්නාවූ බ්‍රාහ්මණයෝම බොහෝකොට යාග කරන්නාහුය. බ්‍රාහ්මණයෝ අන්කිසිවෙකු ලවා යාග නොකරවන්නාහුය.

162 "යාගස්ථම්භයෙහි මැණික්ය සක්ය මුතුය ධාන්‍යය ධනය රිදීය, රත්රන්ය යන මොව්හු කොයින්ද, වියලි කාෂ්ට වලද අළුත් කාෂ්ට වලත් කොයින්ද, දෙව්ලොව සියලු කැමැති සම්පත් කොයින් ලබන්නේද?

163 "කෛරාටිකවූද රෞද්‍රවූද පොළඹවාගන්නා ලද අඥාන ජනයන් ඇති බ්‍රාහ්මණයෝ ගිනිගෙණ පුදා මට වස්තුව දෙව, එහෙයින් නුඹ සියලු කැමැති සම්පත් ලබා සුවපත් වන්නෙහියයි විසිතුරු වර්ණනා වලින් ඔවුන්ගේ මුහුණු සතුටු කරත්.

164 "ඒ ගිනි පුදන ශාලාවට ඇතුල්ව හිසකේ රැවුල් බාවා නියද කප්පවා විසිතුරු වර්ණනා වලින් මුහුණ ප්‍රසන්න කරත්. වේද කථා වලින් ඔහුගේ වස්තුව විනාශයට පමුණුවත්.

165 "කව්ඩෝ තනි තැනෙක්හි බකමුහුණෙකු ලබා මෙන් එකලාවූම ඔහු බොහෝදෙනා එකතුව ඒ කුහක බ්‍රාහ්මණයෝ වංචාකොට රශ බොජුන් වළඳා හිස මුඩුකොට යාගස්ථානයෙහි පසෙකට දමත්.

166 "මෙසේ වනාහි එකලාවූම හෙතෙම බොහෝවූ බ්‍රාහ්මණයන් විසින් එකතුව වංචාකරණ ලද්දේවේ. ඒ බ්‍රාහ්මණයෝ ඒ ඒ යෝගයෙන් පැහැරගන්නාවූ ප්‍රත්‍යක්ෂවූ ධනය අප්‍රත්‍යක්ෂවූ දිව්‍ය සම්පත්තිය නිසා හැරගෙණ යත්.

167 "රජුන් විසින් අනුශාසනා කරණ ලද්දාවූ අයබදු අයකරණ රාජපුරුෂයන් මෙන් මොහුගේ ඒ ධනය හැර ගෙණ යත්. අරිෂ්ටය ලෝකයෙහි සොරුන් හා සමානවූ අසත්පුරුෂවූ වධ කිරීමට සුදුසුවූ එබඳුවූ ඒ බ්‍රාහ්මණයෝ නොනසනු ලබත්.

168 "ඔව්හු ශක්‍රයාගේ දකුණු අතයයි යාගස්ථානයන්හි කැල ලීයක් සිඳිත්. ඉදින් ඒ සත්‍යයක්නම් ශක්‍රතෙමේ සිඳිනාලද බාහු ඇත්තෙකි. මොහුගේ කවර බලයකින් ශක්‍රතෙම අසුරයන් ජයගණීද?

169 "ඔවුන්ගේ ඒ බසද හිස්ය. ඒ සක්දෙව් රජතෙම බාහු වලින් යුක්තවේ. සතුරන් නසන්නෙකි. කිසිවෙකු විසින් වධ නොකොට හැකිවේ. උතුම් වූ පුණ්‍ය ඍද්ධීන් යුක්ත වූයේය. බ්‍රාහ්මණයන්ගේ හිස් ස්වභාවය ඇත්තාවූ යම් මේ මන්ත්‍ර කෙනෙක් වෙත්නම් මෝ තොමෝ ලෝකයෙහි තමන් විසින් දැක්කහැකි රැවටීමක් වේ.

170 "මාලාගිරි පර්වතයද හිමවත් පර්වතයද යම් ගිජ්ඣකූට නම් පර්වතයක්ද සුදස්සන නම් පර්වතයද නිසභ නම් පර්වතයද කාකනේරු නම් පර්වතයද යන මේ පර්වතයෝද සෙසු මහත් පර්වතයෝද යාග කරන්නාවූ බ්‍රාහ්මණයන් විසින් ආසන පිණිස උළින් කරණ ලද්දාහුයයි කියත්.

171 "යම්බඳුවූ උළුගෙණ යාග කරන්නවුන් විසින් උළුවලින් ආසන කළාහුයයි කියද්ද, පර්වතයෝ එබඳු ආකාර ඇත්තෝ නොවෙත්. පර්වතයෝ නොසෙල් වෙන්නාවූ පිහිටිගල් ඇත්තාවූ අන් ආකාර ඇත්තෝ වෙත්.

172 "උළු බොහෝ කලකිනුත් ගල් නොවෙත්. එහි යකඩ හට නොගණියි. ලෝහද නොවේ. යාගයෙහිද මෙය වර්ණනා කරන්නාහු යාග කරන්නවුන් විසින් උළින් කළ ආසන වෙත්යයි කියත්.

172 "වේදහදාරන්නාවූ මන්ත්‍ර කොටස්වලින් යුක්තවූ තපශ්වීවූ බ්‍රාහ්මණයා දක්ෂිණාර්හයයි කියත්. මුහුදු ඉව්රෙහි දිය නාන්නාවූ ඒ බ්‍රාහ්මණයා සාගරයතෙම ඇදගත්තේය. එහෙයින් සාගරයතෙම නොපියයුතු ලුනුරස ඇත්තක් කෙළේය.

174 "සම්පූර්ණකළ වේද ඇති මන්ත්‍ර වලින් යුක්තවූ බමුණන් දහසකටත් වඩා ගංගාවෝ ගිල්වත්. ඒකාරණයෙන් ගංගාවෝ ලුනුරස ඇති කළාහු නොවෙද්ද, කවර කාරණයකින් අසමානවූ සමුද්‍රයතෙම නොපියයුතු අය ඇත්තක් කෙළේද?

175 "මේ මනුෂ්‍ය ලෝකයෙහි ලිං සාරන්නවුන් විසින් සාරණ ලද්දාවූ යම්කිසි ලිං පොකුණු කෙනෙක් වෙද්ද ඒ පොකුණුවල බ්‍රාහ්මණයන් වැටීමෙන් ලුනු දිය ඇතිවූවාහු නොවෙත්. ද්විරසඤ්ඤ නම් අරිෂ්ටය ඒ ලිංවල ජලය නොපියයුතු නොකෙළේයයි කියත්.

176 "පූර්වයෙහි පළමු කවර නම් තැනැත්තියක් කවරෙකුට භාර්‍ය්‍යාවීද, පූර්වයෙහි මානසතෙම මනුෂ්‍යයා ඉපදවීය. ඒ කාරණයෙනුත් කිසිවෙක් හීන නොවේ. මෙසේ ඇති කල්හිද තම තමන්ගේ කර්ම විශෙෂයෙන් වෙනස කියත්.

177 "ප්‍රඥා ඇත්තාවූ දක්ෂවූ චණ්ඩාල පුත්‍රයෙක් ද වේදයන් හදාරා මන්ත්‍ර කියන්නේ නම් ඔහුගේ මුදුන සත්කඩක්ව නොපැලෙන්නේය. එහෙයින් මේ මන්ත්‍ර තමහට වධ පිණිස කරණ ලද්දාහු වෙත්.

178 "මිථ්‍යා වචනයෙන් කරණ ලද්දාවූ බමුණන් විසින් ලෝභයෙහි ගිජු බැවින් ගන්නා ලද්දාවූ කාව්‍යක්කාරයින්ගේ වචන පථයට අනුව ගියාවූ මේ වේද, මන්ත්‍රයෝ දුරලිය නොහැක්කාහුවෙත්. අඥානයන්ගේ සිත මේ විෂම වූ වේදයෙහි ඇතුළත් විය. මද නුවණැත්තෝ එය අදහත්.

179 "සිංහයෙකුගේද ව්‍යාඝ්‍රයෙකුගේද දිවියෙකුගේ ද බලය හා සමානවූ පුරුෂ වීර්‍ය්‍යයක් බ්‍රාහ්මණයින්ට නැත. මනුෂ්‍ය ස්වභාව ඇත්තේද ගවයන්ගේ ස්වභාව මෙන් සැළකියයුතුවේ. ඔවුන්ගේ ජාතිය වනාහි අසමානවේ. නුවණැති බැවින් ගතිය සමානයි

180 "ඉදින් රජතෙමේද පෘථිවිය ජයගෙණ සුවචවූ පිරිස් වැස්සන් ඇත්තේ සමග ජීවත් වන්නවුන්ගෙන් යුක්ත වේද, ඒ රජතෙමේද සතුරු සමූහයා ජය ගන්නේ නම් ඔහුගේ ප්‍රජාව නිතර සුවපත් වන්නේය.

181 ක්ෂත්‍රිය මන්ත්‍රද, ත්‍රිවේදයද යන මොහු අර්ථයෙන් සමාන බැව් ඇතිවෙත්. ඔවුන්ගේද අර්ථය විනිශ්චය නොකොට සැඩපහරකින් වැසුනු මාර්ගයක් මෙන් අවබොධ නොකෙරේ.

182 "ක්ෂත්‍රිය මන්ත්‍රයෝද ත්‍රිවේදයෝද යන මොව්හු වචනාර්ථ වශයෙන් සම බැව් ඇත්තාහු වෙත්. ලාභයද අලාභයද අයශද යශසද යන මේ සියල්ලෝ සියලු චතුවර්ණයන්ගේ ස්වභාව ධර්ම වෙත්.

183 "යම්සේ ගෘහපතිහු ධන ධාන්‍ය හේතුකොටගෙණ පෘථිවියෙහි බොහෝ කර්මාන්ත කරවද්ද, බ්‍රාහ්මණයෝද එපරිද්දෙන්ම දැන් පෘථිවියෙහි බොහෝ කර්මාන්ත කරවත්.

184 "නිතර උත්සාහවත්වූ පස්කම් සැපවල යෙදුනාවූ පෘථිවියෙහි බොහෝ කර්මාන්ත කරවන්නාවූ මොව්හු ගෘහපතීන් හා සමාන බැව් ඇත්තෝ වෙත්. දිව් දෙකකින් රශ දැනීමෙහී සමර්ථවූ අරිෂ්ටය මද නුවණ ඇත්තාවූ ඒ බ්‍රාහ්මණයෝ ඒ බ්‍රාහ්මණ ධර්ම කෙරෙන් දුරුවුවාහුයයි" භූරිදත්ත නාරජතෙම කීයේය.

185 "මහ බෙරද මිහිඟු බෙරද සක්ද පනාබෙර ගැටබෙරද වාදනය කිරීම ඇත්තාවූ රජහු සතුටු කරමින් කවරක්හුගේ ඉදිරියෙන් පිළිපන්නාහුද,

186 කවරෙකුගේ මහත්වූ විදුලියට බඳු පැහැ ඇති ස්වර්ණමය නළල් පටින් මුහුණ බබළාද, තරුණවූ දුනු හියවුරු වලින් සැරසුනාවූ කවරෙක් සොභාවෙන් දිළිසෙමින් එන්නේද,

187 "කඹුරු උදුනෙහි ඔපදමන ළද්දක් මෙන්ද දිලිසෙන කිහිරි අඟුරු මෙන් ප්‍රභාවත් මනොඥවූවක් මෙන් මුහුණ බබළයි. එබඳු කවරෙක් සොභාවෙන් දිළිසෙමින් එන්නේද?

188 "සිත්කළුවූ සළාක සහිත හිරුරැස් වලක්වන්නාවූ රක්ත ස්වර්ණමයවූ ඡත්‍රය කවරෙකුට දරාද, සොභාවෙන් දිළිසෙමින් කවරෙක් එන්නේද?

189 "ඇකයෙන් වැළඳ ගත්තාවූ උතුම් වල්විදුනාව උතුම් ප්‍රඥාව ඇත්තාවූ කවරෙකුගේ හිසමතුමත්තෙහි හසුරුවාද?

190 "සත්රුවණින් විසිතුරුවූද මෘදුවූද රත්රනින් හා මිණියෙන් කරණලද දඬු ඇත්තාවූද මොණරපිල ගත් අත් ඇත්තාහු කවරෙකුගේ මුහුණ දෙපසින් හැසිරෙද්ද?

191 "දිළිසෙන කිහිරි අඟුරු බඳු පැහැඇති කඹුරු උදුනෙහි ඔපදමන ලද්දාවූ මනහරවූ මේ කුණ්ඩලාභරණයෝ කවරෙකුගේ මුඛය දෙපසින් බබළත්ද?

192 "සුළඟින් කම්පා කරණලද සිනිඳුවූ මෘදුවූ කියඹු වැළ අහස පැන නැංගාවූ විදුලියක් මෙන් කවරෙකුගේ නළල් කෙළවර හොබවද්ද?

193 "දික්වූ පුළුල්වූ මේ ඇස් කවරෙකුගේ ද මහත් ඇස් ඇත්තාවූ මේ කවරෙක් බබළාද? රන් කැඩපතක් බඳු මේ කවරෙකුගේ මුහුණක්ද?

193 "පිරිසිදු උතුම් සක්පෙති බඳුවූ කථාකරන්නාවූ යමෙකුගේ කොඳ කැකුළු සමානවූ දත් බබළත්ද, එබඳුවූ මේ පිරිසුදුවූ දත් කවරෙකුගේද?

195 "ලාකඩ දියට බඳු පැහැ ඇති සුවසේ වැඩුනාවූ මේ හස්තපාදයෝ කවරෙකුගේද, බිඹුපල වැනි තොල් ඇත්තාවූ ඒ කවරෙක් නම් දහවල් සූය්‍ර්‍යයා මෙන් බබළාද?

196 "හිම ඍතුහුගේ අවසානයෙහි හිමාලයෙහි පිපියාවූ මහත් සල් ගසක්මෙන්, පෙරවි සුදු උතුරු සළු ඇති එන්නාවූ ඒ කවරෙක් අසුරයන් ජයගත්තාවූ සක්දෙව් රජහුමෙන් බබළාද?

197 "ස්වර්ණමය පීලක (බිබිලි) වලින් ගැවැසීගත් මාණික්‍ය කඩුමිටෙන් විසිතුරු කරණ ලද කඩුව පිරිස් මැදට බැස ඒ කවර නම් අධිපතියෙක් මුදාද?

198 "රණින් කරණ ලද්දාවූ විසිතුරුවූ මනාව කරණ ලද්දාවූ විසිතුරු ගෙතුම් ඇති මිරිවැඩි (සෙරෙප්පු) ඒ කවරෙක් මහර්ෂිවූ ඔබවහන්සේට නමස්කාර කොට පාදයෙන් මුදාදැයි" සාගර බ්‍රහ්මදත්ත රජතෙම පිය රජවූ තාපසයන් ගෙන් ඇසීය.

199 "ඍද්ධිමත්වූ යශපිරිවර ඇත්තාවූ ඔව්හු ධෘතරාෂ්ට නම් නාරජහුගේ පුත්‍රවූ නාගයෝ වෙත්, මහත් ඍද්ධි ඇත්තාවූ මේ නාගයෝ සමුද්‍රජා නම් මාගේ දුවට උපන්නාවූ පුත්‍රයෝ වෙත්යයි" පියරජතෙම කීයේය.

543 **මහානාරද කස්සප ජාතකය:-** 1 බොහෝවූ හස්ති වාහණාදිය ඇති ධන ඇත්තාවූ අප්‍රමාණ භට සෙනග ඇති විදෙහ රටවැස්සන්ගේ අංගාති නම් ක්ෂත්‍රිය රජෙක් වූයේය.

2 ඒ රජ තෙමේද වස් සාරමස පිළිබඳ අවසාන දිනයවූ පිපි කුමුදු මල් ඇති ඉල්මස පුරපසළොස්වක් රාත්‍රියෙහි ප්‍රථම යාමය ඉක්ම නොගිය කල්හි ඇමැතියන් රැස් කරවීය.

3 "පණ්ඩිතවූ උගත්කම් ඇත්තාවූ පළමු සිනාසී කථාකරණ සුළුවූ දක්ෂවූ විජයද සුණාමද අලාතකද යන සේනාපතින් තිදෙනෙක් වූහ.

4 ඒ වේදෙහ රජතෙම, "අද වස් සාරමස පිළිබඳ අවසාන දිනයවූ පිපි කුමුදුමල් ඇති පසළොස්වක් දිනයවේ. උදාවූ චන්ද්‍රයාද ඇත්තේය. අන්ධකාරයද දුරුව ගියේය. අද අපි මෙබඳුවූ රාත්‍රි කාලය කවරනම් ඇල්මකින් යුක්තව වාසය කරමුදැයි තමන්ගේ කැමැත්ත වෙන් වෙන් වශයෙන් කියව්යයි" ඒ ඇමතියන් විචාළේය.

5 ඉක්බිති ඒ රජුගේ අලාත නම් සෙනෙවිතෙම මේ කීයේය. සතුට ඇත්තාවූ වාහණද භට පිරිසද යන සියලු සෙනග රැස්කරමු.

6 "දේවයන්වහන්ස, අප්‍රමාණ බලසෙනග ඇති අපි යුද්ධයට පිටත්ව යමු. යම් ඒ සතුරු කෙනෙක් වසඟයට නොපැමිණෙත් නම් ඔවුන් වසඟයට පමුණුවන්නෙමු. අප විසින් නොදිනනලද යමෙක් ඇත්නම් ඔහු දිනන්නෙමු මේ මාගේ අදහස වේයයි" කීයේය.

7 අලාත නම් සෙනෙවියාගේ කීම අසා සුනාම නම් සෙනෙවිතෙම මෙය කීයේය. "මහරජ, ඔබගේ සියලු පස මිතුරෝ වසඟවූහ.

8 "බහා තබනලද ශස්ත්‍ර ඇති සතුරෝ අවිරුද්ධව පවතිත්. අද උතුම්වූ උත්සව දිනයක්වේ. එහෙයින් මට යුද්ධය රුචි නොවේ.

9 "ආහාරද, පානවර්ගද, කෑයුතුදෑද ඔබවහන්සේට වහා එළවත්වා. මහාව වාදනය කරණලද නෘත්‍ය ගීතයන්ද එළවත්වා. දේවයන්වහන්ස, නුඹවහන්සේ පස්කම් සැපවලින් සිත් අලවනු මැනවයි" කීයේය.

10 සුනාම නම් සෙනෙවියාගේ මේ කීම අසා විජය නම් සෙනෙවිතෙම මේ කීයේය. "මහරජ, සියලු කාම සම්පත්තීහු ඔබවහන්සේට නිතර එළඹ සිටියාහුය.

11 "දේවයන් වහන්ස, කම්සැපවලින් සතුටු වීමය යන මොව්හු නුඹවහන්සේට දුර්ලභ නොවෙත්. හැමකල්හිම කම් සැප ලැබෙත්. එබැවින් මෙය මාගේ සිතට අභිමත නොවේ.

12 "අද අර්ථය හා ධර්මය දන්නාවූ යම් ඍෂිවරයෙක් අපගේ සැකය දුරුකරන්නේද, එබඳු බහුශ්‍රැතවූ ශ්‍රමණයෙකු හෝ බ්‍රාහ්මණයෙකු වෙත එළඹෙන්නෙමුයි" කීයේය.

13 විජය නම් සෙනෙවිහුගේ කීම අසා අංගාති රජ තෙම මෙසේ කීයේය. 'විජයතෙම යම්සේ කීයේද මටත් මෙයම රුචිවේ.

14 "අර්ථයන් හා ධර්මයන් දන්නාවූ යම් ඍෂිවරයෙක් අද අපගේ සැකය දුරුකරන්නේද, එබඳු බහුශ්‍රැතවූ ශ්‍රමණයෙකු හෝ බ්‍රාහ්මණයෙකු හෝ වෙත එළඹෙමුයි' කීයේය.

15 "අර්ථයන් හා ධර්මයන් දන්නාවූ කවර නම් ඍෂිවරයෙක් අද අපගේ සැකය දුරුකරන්නේද? අපි කවරනම් පණ්ඩිතයෙකු කරා එළඹෙමුදැයි මෙහි ඉන්නාවූ තෙපි සියලු දෙනාම කල්පනා කරව්."

16 වෙදේහ නම් රජුගේ වචනය අසා අලාත නම් සෙනෙවිතෙම මෙය කීයේය. "මෘගදායනම් උයනෙහි පණ්ඩිත යයි සම්මතවූ මේ අචේලකයෙක් ඇත්තේය.

17 "කාශ්‍යප ගොත්‍රයෙහිවූ ගුණ නම් හෙතෙම බහුශ්‍රැතය, විසිතුරු කථා ඇත්තේය. ගණාචාර්‍ය්‍යවේ. දෙවයන් වහන්ස, ඒ ආජීවකයා ඇසුරු කරණුමැනව. හෙතෙම අපගේ සැකය දුරුකරන්නේය."

18 අලාත නම් සෙනෙවිහුගේ කීම අසා රජතෙම මෘගදාය නම් උයනට යන්නෙමු. සුදුසුවූ යානාවක් මෙහි ගෙණෙවයි" රියැදුරා මෙහෙය වීය.

19 දළකඩමයවූ රිදියෙන් කළ වෙහෙල් පත් ඇති සුදුවූ මටසිළුටු ප්‍රාවරණ ඇති සඳරැසින් යුත් සන්ධ්‍යාවකට බඳු ශ්වෙතවර්ණවූ යානාවක් ඒ රජුට පිළියෙල කළාහුය.

20 ඒ රථයෙහි කුමුදුවර්ණ ඇත්තාවූ වාතයට හා සමාන ගමන් වේග ඇත්තාවූ මනාව දැමුනාවූ රන්මාලා ඇත්තාවූ සෛන්ධව අශ්වයෝ සතරදෙනෙක් යොදනලද්දාහුය.

21 ඡත්‍රයද ශ්වෙතවර්ණය, රථයද ශ්වෙතවර්ණය අශ්වයෝද, ශ්වෙතවර්ණය, වල්විදුනාවද ශ්වෙතවර්ණය මෙසේ ඇමැතියන් සමග යන්නාවූ වේදේහ රජතෙම සඳමෙන් බැබලුනේය.

22 ඉන්ද්‍රයාට බඳු කඩු දරන්නාවූ බලවත්වූ ධෛර්‍ය්‍ය සම්පන්නවූ අසුන්පිට නැංගාවූ බොහෝ මිනිස්සු ඒ රජහු අනුව ගමන්ගත්තාහුය.

23 වෙදෙහ නම් වූ ඒ ක්ෂත්‍රිය රජතෙම ඇමතියන් සමග මොහොතකින්ම උයනට ගොස් යානාවෙන් බැස පා ගමන් ඇත්තේ ගුණ නම් ආජීවකයා වෙතට එළඹියේය.

24 එකල්හි එහි රැස්වූ යම් බ්‍රාහ්මණ ගෘහපතියෝ වූවාහුද, රජතෙම ඔවුන් ඉවත් නොකෙළේය. අවකාශ නොකරණලද භූමියෙහි එකත්පස්ව හිඳගත්තේය.

25 ඉක්බිති ඒ රජතෙම මෘදු ස්පර්ශ ඇති විසිතුරු ඇතිරිලි ඇත්තාවූ මෘදුවූ පසතුරුණුවලින් යුක්තවූ මොලොක් වූ බිස්සෙක්හි එකත්පස්ව හිඳගත්තේය.

26 රජතෙම හිඳගෙණ ඉක්බිති සිහිකටයුතු කථාව කොට සතුටුවූයේය "ස්වාමීනි, කිම යැපියහැක්කේද, වාතයන්ගේ පීඩාවල් නැද්ද?

27 "කිම දිවිපැවැත්ම දුක්රහිතද, ආහාරයෙන් යැපීම ලැබේද, ස්වල්ප ආබාධ ඇත්තේවෙහිද, කිම චක්ෂුරාදී ඉන්ද්‍රිය නොපිරිහේද?"

28 ගුණ නම් ආජීවකතෙම විනයෙහි ඇළුනාවූ ඒ වේදේහ නම් රජුට සතුටුවියයුතු කථාවෙන් පිළිතුරු දුන්නේය. "මහරජතුමනි, යැපියැකිවේ. මේ සියල්ල එසේමය ඒ ආබාධ නැතිබවද ඉන්ද්‍රියයන්ගේ නොපිරිහීමද යන දෙකද, එසේමය.

29 "වේදේහ රජතුමනි, කිමෙක්ද, ඔබගේ පසල්දනව් වැස්සෝ බලය නොපවත්වද්ද, කිම බලවාහණ නීරෝගද කිම ඔබගේ වාහණය ඔබ උසුලාද, කිමෙක්ද ශරීරය තවන්නාවූ ව්‍යාධීහු ඔබට නැද්ද?

30 පිළිසඳර කථාවෙන් සතුටුකරණලද්දාවූ ධර්මය කැමතිවූ රථශ්‍රෙෂ්ඨවූ ඒ රජතෙම ඊට අනතුරුව අර්ථයද, ධර්මයද න්‍යායයද විචාළේය.

31 "කාශ්‍යපයන් වහන්ස, මනුෂ්‍යතෙම මව්පියන් කෙරෙහි කෙසේ ධර්මයෙන් හැසිරෙන්නේද, ගුරුවරයා කෙරෙහි කෙසේ හැසිරෙන්නේද, අඹුදරුවන් කෙරෙහි කෙසේ හැසිරෙන්නේද?

32 "වැඩිහිටියන් කෙරෙහි කෙසේ හැසිරෙන්නේද? මහණ බමුණන් කෙරෙහි කෙසේ හැසිරෙන්නේද, බලසෙනග කෙරෙහි කෙසේ හැසිරෙන්නේද, දනව් වැස්සන් කෙරෙහි කෙසේ හැසිරෙන්නේද?

33 "කෙසේ නම් ධර්මයෙහි හැසිර පරලොව සුගතියට පැමිණේද, කෙසේ නම් අධර්මයෙහි පිහිටියාවූ සමහරු යට දිශාවෙහි නරකයට වැටෙද්දැයි" විචාළේය.

34 "වේදේහ රජුගේ වචනය අසා කස්සප නම් අචේලක තෙම මෙය කීයේය. "මහරජ්ජුරුවෙනි. සත්‍යවූ බොරු නොවන්නාවූ කාරණය මාගෙන් අසව.

35 "පුරුදුකරණලද ධර්මයාගේ යහපත්වූද, අයහපත්වූද විපාකයක් නැත්තේය. දෙවයෙනි, පරලොවක් නැත්තේය. එයින් කවරෙක් නම් මෙහි ආයේවේද?

36 "දේවයෙනි, මුත්තනු මුත්තනියෝද නැත. එහෙයින් මව කොයින්ද, පියා කොයින්ද, ගුරුවරයෙක් නම් නැත්තේය. එහෙයින් කවරෙක් නම් නොදැමුනහු දමනය කරන්නේද?

37 "සත්වයෝ සමසම වූවාහු වෙත්. වැඩිහිටියන් පුදන්නාහු නැත. බලයක් හෝ වීර්‍ය්‍යයක් හෝ නැත, උට්ඨාන වීර්‍ය්‍යයක් පුරුෂ වීර්‍ය්‍යයක් කොයින්ද, නැවක් අත්හැර නොයන්නාවූ ගල්වන මෙන් සත්වයෝ නියමය අනුවමයෙත්.

38 "මනුෂ්‍යතෙම ලැබියයුත්ත ලබන්නේය. එහි දානයෙහි විපාකයක් කොයින්ද? දේවයෙනි, දානයෙහි විපාකයක් නැත. දෙන තැනැත්තේ වසඟ නොවූයේ වීර්‍ය්‍ය නැත්තේ දෙයි.

39 "අඥානයන් විසින් දානය පනවනලදී. නුවණැත්තන් විසින් එය පිළිගන්නාලදී. පණ්ඩිතයයි යන සිත් ඇත්තාවූ අඥානයෝ අවසඟවූවාහු ප්‍රාඥයන්ට දෙත්යයි" කීයේය.

40 "නොසිඳියහැක්කාවූ වෙනස් නොකොටහැක්කාවූ ශාස්වතවූ මේ සමූහ සතක් වෙත්. එනම් තේජසද, පෘථිවියද, ජලයද, වාතයද, සැපයද, දුකද ජීවයද යන මේ සතයි. යම් කෙනෙකුන්ගේ සිඳීමක් නැද්ද, ඒ මේ සමූහ සත වෙත්.

41 "නසන්නෙක් හෝ සිඳින්නෙක් හෝ කිසිවෙක් එය නසනු ලබන්නේද, එබන්දෙක් නැත. මේ සත්වැදෑරුම් වූ සමූහයන්ගේ අතරෙන්ම ආයුධ ඉක්ම පවතිත්.

42 "මේ යම්කිසිවෙක් අනුන්ගේ හිසක් අල්වාගෙණ මුවහත් ඇති කඩුවකින් සිඳීද. හෙතෙම ඒ සත්ව කායයන් නොසිඳියි. එහි පාප විපාකයක් කොයින්ද?

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

43 "සූ අසූ මහාකල්පයක් සැරිසරමින් මේ සියල්ලෝ පිරිසිදු වෙත්. ඒ කියනලද කාලය නොපැමිණි කල්හි සංයම ඇත්තේද පිරිසිදු නොවේ.

44 "බොහෝවූ යහපතෙහි හැසිරද එකී කාලය නොපැමිණිකල්හි නොමපිරිසිදු වෙත්. ඉදින් බොහෝ පව්කොට නමුත් එකී කාලය ඉක්මවනුලැබේ.

45 "කල්පයන් සම්බන්ධ සූ අසූවකින් පිළිවෙළින් අපගේ ශුද්ධිය වේ. සාගරයතෙම වෙරළ නොඉක්මවන්නාක් මෙන් අපිදු නියමය ඉක්මවා නොපවතිමුයි" නිගණ්ඨතෙම කීයේය.

46 කාශ්‍යප නම් නිගණ්ඨයාගේ කීම අසා අළාත නම් සෙනෙවිතෙම මෙය කීයේය. "පින්වතුන් වහන්සේ යම්සේ කියාද මටත් මෙයම රුචිවේ.

47 "මමද තමන් සැරිසැරූ පළමු ජාතිය සිහිකරමි. පෙර ජාතියෙහි මම පිංගල නම් රෞද්‍රවූ ගව ඝාතකයෙක්වීමි.

48 "සමෘද්ධවූ බරණැස් නුවර මා විසින් බොහෝ පව් කරණලදී. මීමෝය, ඌරෝය, එළුවෝය යන බොහෝ ප්‍රාණීහු මා විසින් නසන ලදහ.

49 "එයින් චුතවූ මම මේ නගරයෙහි සමෘද්ධවූ සෙනෙවි කුලයෙක්හි උපන්නෙමි. ඒ මම නරකයට නොගියෙමි. එහෙයින් පව් කිරීමෙහි විපාක නැතැයි සිතමියි" කීයේය.

50 ඉක්බිති මේ මියුළුනුවර දිළිඳුවූ බීජක නම් දාසයෙක් විය. පෙහෙවස් වසන්නාවූ හෙතෙම ගුණ නම් ඒ නිගණ්ඨයා සමීපයට පැමිණියේය.

51 කාශ්‍යපයාගේ කීම අසා අලාතගේද කීම අසා වරින්වර සුසුම්ලමින් උනුසුම්කොට හඬමින් කඳුළු වැගිරවීය.

52 "වේදේහ නම් රජතෙම යහළුව, කුමක්නිසා හඬන්නෙහිදැයි" ඔහුගෙන් ඇසීය. නුඹ විසින් කුමක් අසනලද්දේ හෝ දක්නාලද්දේ හෝ වේද, කවර වේදනාවකට හෝ පැමිණියෙහිද, එය මට දන්වවයි" කීයේය.

53 වේදේහ නම් රජුගේ වචනය අසා බීජක නම් දාස තෙම මේ කීයේය. "මහරජ්ජුරුවෙනි, මට දුක් වේදනාවක් නැත. මාගේ වචනය අසනුමැනව.

54 "මමද තමහට සැපවූ පළමු ජාතිය සිහිකරමි. මම පෙර ජාතියෙහි සාකේත නම් නුවර භාවසෙට්ඨි නම් ගුණයෙහි ඇළුනෙක්වීමි

55 "බ්‍රාහ්මණයන් හා ගෘහපතීන් විසින් සම්භාවනා කරණලද දාන සංවිභාගයෙහි ඇළුනාවූ පවිත්‍රවූ කර්මාන්ත ඇති මම තමන් කළාවූ ලාමකවූ කර්මයක්ද සිහි නොකරමි

56 "වේදෙහ රජ්ජුරුවෙනි, එයින් චුතවූ මම මේ මියුළු නුවර දිළිඳු ස්ත්‍රියක්වූ කුම්භ දාසියකගේ කුසෙහි ඉපදුනෙමි. උපන් තැන් සිට ඉතා දිළිඳුවූවෙක් වෙමි.

57 "මෙසේද දුක්පත්වූම මම සමවූ හැසිරීමෙහි පිහිටියේ වෙමි. යමෙක් මාගෙන් කැමතිවේනම් ඔහුට අනුභව කරණ බත දෙකට බෙදා කොටසක් දෙමි.

58 "තුදුස්වකද පසළොස්වකද හැමකල්හි මම පෙහෙවස් වසමි. සතුන්ටද හිංසා නොකරමි. සොරකමද දුරු කෙළෙමි.

59 "මනාව පුරුදු කරණ ලද මේ සියල්ලම ඒකාන්තයෙන් නිෂ්ඵලවේ. අලාත නම් සෙනෙවිතෙම යම්සේ කියාද එසේ මේ ශීලය නිෂ්ප්‍රයෝජනයයි හඟිමි.

60 "ශිල්පය නොදන්නාවූ දූ කෙළින්නෙක් මෙන් මම ඒකාන්තයෙන් පරාජය ගණිමි. ශිල්පය දැනගත්තාවූ දූ කෙළින්නෙක් යම්සේද, එමෙන් අලාත නම් සෙනෙවිතෙම දිනුම ගනියි.

61 "යම් දොරටුවකින් සුගතියට යන්නෙම්ද ඒ දොරටුව නොදකිමි. මහරජ, කාශ්‍යප නම් ආජීවකයාගේ තෙපුල අසා එහෙයින් හඬමියි" කීයේය.

62 "බීජකයාගේ කීම අසා අංගාති නම් රජතෙම මෙසේ කීයේය. යහළු බීජකය "සුගතියට දොරටුවක් නැත්තේය. එහෙයින් නියමයම බලාපොරොත්තු වෙව.

63 "සැපයක් හෝ ඉදින් දුකක් හෝ ලබන්නේ නම් එය කාල නියමයෙන්ම ලබන්නේය. සියල්ලන්ගේ සංසාර ශුද්ධිය වේ. ඒ කාලය නොපැමිණි කල්හි ඉක්මන් නොවෙව

64 "මමද පූර්වයෙහි යහපත්වූයේ බ්‍රාහ්මණයන් හා ගෘහපතීන් කෙරෙහි ව්‍යාවෘතවූයෙමි. විනිශ්චය ස්ථානයෙහිද ව්‍යවහාරය අනුශාසනා කරමින් ඒ අතරතුර කාමගුණයන්හි ඇලීමෙන් පිරිහුනේ වෙමියි" කීයේය.

65 "ස්වාමීනි, ඉදින් අපගේ එක්වීමක් වන්නේ නම් නැවතද දක්නෙමුයි" වේදෙහ නම් රජතෙම මෙය කියා ස්වකීය භවනයට පෙරලා ගියේය.

66 ඉක්බිති රාත්‍රීහුගේ ඇවෑමෙහි අංගාති රජතෙම තමහට උපස්ථාන කරණ තන්හි ඇමතියන් රැස්කරවා මේ වචනය කීයේය

67 "මාගේ චන්ද්‍රක නම් ප්‍රාශාදයෙහි මට හැමකල්හි කාමසම්පත් සංවිධාන කෙරෙත්වා. රහසිගතවූද ප්‍රකාශයෙහිවූද කටයුතු ඇතිවූ කල්හි කිසිකෙනෙක් මා වෙත නොඑළඹෙත්වා

68 "විජය නම් සෙනෙවි තෙමේද, සුනාම නම් සෙනෙවි තෙමේද, අලාත නම් සෙනෙවිතෙමේද යන ව්‍යවහාරයන්හි දක්ෂවූ මේ තුන්දෙනා විනිශ්චය ස්ථානයෙහි හිඳ ගනිත්වා"

69 "වේදෙහ නම් රජතෙම මෙය කියා කාම සම්පත්ම බොහෝකොට අනුභව කෙළේය. බ්‍රාහ්මණයන් හා ගෘහපතීන් කෙරෙහිවූ කිසි කටයුත්තෙහි ව්‍යාවෘත නොවූයේයි

70 "ඉක්බිති දහහතර වන දවසෙහි වේදෙහ නම් රජහුගේ ප්‍රිය ධීතෘවූ රුජා නම් රාජ කන්‍යාව කිරි මවට මෙසේ කීයේය.

71 "වහාම මා සරසව්. මාගේ යෙහෙළියෝද අලංකාර කෙරෙත්වා. සෙට දිව්‍යවූ පසළොස්වක වේ පිය රජුවෙතට යන්නෙමි."

72 ඇට මල් මාලා පැමිණවූහ. මාහැඟිවූ සුවඳ සඳුන්ද මැණික්ය, සක්ය, මුතුය යන රත්නද නා නා වර්ණ වස්ත්‍රයන්ද පැමිණවූහ.

73 "ස්වර්ණමය පුටුවෙහි උන්නාවූ මනොඥ ශරීරවර්ණ ඇත්තාවූ ඒ රුජා නම් රාජකන්‍යාව පිරිවරාගෙණ සිටියාවූ බොහෝ ස්ත්‍රීහු අතිශයින් බැබළුණහ.

74 "යෙහෙළින් මැදට ගියාවූ සියලු ආභරණයෙන් සැරසුනාවූ ඒ රුජා නම් රාජකන්‍යා තොමෝද වළාකුලකට ඇතුල්වන්නාවූ විදුලියක් මෙන් චන්ද්‍රක නම් ප්‍රාසාදයට ඇතුල්විය.

75 "විනයෙහි ඇළුනාවූ වේදෙහ රජු වෙතට පැමිණ වැඳ රණින් විසිතුරු කොට කරණ ලද පූටුවෙක්හි එකත්පස්ව ඉඳගත්තේය.

76 "වේදෙහ රජතෙම දිව්‍යප්සරාවන් සමූහයක් බඳුවූ ඒ පිරිසිද දැක යෙහෙළින් මැදට පැමිණියාවූ රුජා නම් දියණියට මේ වචනය කීයේය

77 "කිමෙක්ද දියණියෙනි, මා විසින් කරවා දෙන ලද ප්‍රාසාදයෙහි ඇලෙන්නෙහිද, ගෘහ වස්තුව ඇතුළතවූ පොකුණෙහි සිත් අලවන්නෙහිද, කිම අනෙක ප්‍රකාරවූ ඛාද්‍යය හැමකල්හි තිට පමුණුවත්ද?

78 "කිම අනෙකප්‍රකාරවූ මල් රැස්කොට ක්‍රීඩාරතියෙහි ඇළුනාවූ කුමරියෝ වරින්වර වෙන් වෙන් වශයෙන් මල් ගුලාවන් කරන්නාහුද?

79 "කුමකින් හෝ තිට වෙනසක් වේද, වහා එය ඔව්හු පමුණුවත්වා, අබ ආදී කුඩුවලින් පැහැපත් කරණ ලද මුහුණු ඇත්තිය, චන්ද්‍රයා හා සමාන දෙයෙහි පවා සිත් උපද වන්නෙහි නම් එයද ලබාදෙමියි" රජතෙම කීයේය

80 වේදෙහ නම් රජහුගේ කීම අසා රුජා නම් රාජ කන්‍යාව පිය රජුට මෙය කීයේය. "මහරජ්ජුරුවෙනි, ජනාධිපතිවූ ඔබ සමීපයෙහි මේ සියල්ල ලැබේ.

81 "පියාණෙනි, හෙට දිව්‍යවූ පසළොස්වක් පොහොය වේ. මට දහසක් කහවණු දෙත්වා. මම සියලු යාචකයන් කෙරෙහි දෙන ලද පරිදි දානයද දෙන්නෙමියි" කීවාය.

82 රුජා නම් කුමරියගේ කීම අසා අංගාති රජ මෙසේ කීයේය. "තී විසින් නිෂ්ඵල පරිදි නිරර්ථකයේ බොහෝ වස්තුව විනාශ කරණ ලදී.

83 "නිතර පෙහෙවස් වසමින් ආහාර පාන අනුභව නොකරන්නෙහිය. නියමය වශයෙන් මෙය නොවැළඳිය යුතුය. අනුභව නොකරන්නහුට පිනක් නම් නැතැයි" කීයේය.

84 බීජක තෙමේද වනාහි එකල්හි කාශ්‍යප නම් නිගණ්ඨයාගේ කීම අසා නැවත නැවත ප්‍රශ්වාස කරමින් උනුසුම්ව හඬමින් කඳුළු වැගිරවීය.

85 "එම්බා රුජාවෙනි, යම්තාක් ජීවත්වන්නෙහි නම් ඒතාක් අනුභව කිරීම අත්නොහරුව. සොඳුරු දියණිය, පරලොවක් නැත්තේය. කුමට නිරර්ථකයේ වෙහෙසෙන්නෙහි දැයි" කීයේය.

86 මනොඥවූ ශරීර වර්ණ ඇති රුජා නම් රාජකන්‍යා තොමෝ වෙදෙහනම් පිය රජුගේ කීම අසා යටගිය ජාති සතක්හුගේ වශයෙන් පූර්වවූද මතු එන්නාවූ ජාති සතක්හුගේ වශයෙන් අපරවූද ස්වභාවය දනිමින් පියාට මෙය කීයේය.

87 "යමෙක් අඥානයන් සේවනය කරන්නේවේද, හෙතෙම අඥානයෙක්ම වේය, යනු මා විසින් පෙර අසන ලද්දක්ම විය. මෙය වනාහි මා විසින් දැන් ප්‍රත්‍යක්ෂයෙන් දක්නා ලදී.

88 "මුළාවූවෙක් වනාහි මුළාවූවෙකු වෙතට පැමිණ වැඩියක් මුළාවට පැමිණේ. එබැවින් අලාත නම් සෙනෙවියා විසින්ද, බීජක නම් දාසයා විසින්ද, මුලාවන්ට සුදුසු වේමයයි" කීවාය.

89 "දෙවයන් වහන්ස, නුඹ වහන්සේද සප්‍රාඥවෙහිය. එහෙයින් ධෛර්‍යවන්ත වෙහිය. කාරණා කාරණා දැනීමෙහි දක්ෂවෙහිය. කෙසේනම් බාලයින් හා සමානවූ ලාමකවූ දෘෂ්ටියට පැමිණියේද?

90 "ඉදින් වනාහි සංසාර මාර්ගයෙන් පිරිසිදුවේනම් ගුණ නම් නිගණ්ඨයාගේ ප්‍රව්‍රජ්‍යාව නිරර්ථක වන්නීය. ඇවිලෙන්නාවූ ගින්නට පැමිණ විනාශ වන්නාවූ පලගැටියෙකු මෙන් අතිශයින් මුලාවූයේ නග්න භාවයට පැමිණේ.

91 "පියාණෙනි, සංසාරයෙන් ශුද්ධිය වේයයි පළමු ඇතුළත්වූවාහු නොදැන බොහෝදෙනා කර්මය දූෂ්‍ය කෙරෙත්. මෙසේ පළමු නපුරුකොට ගන්නා ලද්දේම පරාජයවේ. මෙසේ නොදැන ගන්නාලද අර්ථ ඇත්තාහු බිලියෙන් නොමිදිය හැකි මසෙකු මෙන් නොමිදිය හැක්කාහු වෙත් යයි" කීවාය.

92 "මහරජ තුමනි, ඔබගේ ප්‍රයෝජනය පිණිස ඔබට උපමාවක් ගෙණහැර දක්වන්නෙමි. මේ ලෝකයෙහි ඇතැම් පණ්ඩිතයෝ උපමාවෙන්ද අර්ථය දැන ගනිත්.

93 "යම්සේ වෙළඳුන්ගේ නැවක අපමණවූ බඩු බර ඇත්තී. බරවූවා අධික බර හැරගෙණ සාගරයෙහි ගැලේද,

94 "මෙපරිද්දෙන්ම මනුෂ්‍යතෙම පාපකර්මය ටික ටික නමුත් රැස් කරමින් අධිකවූ බර හැරගෙණ නරකයෙහි ගැලේ.

95 "මහරජ, අලාත නම් සෙනෙවියාගේ අකුසල් බර තවම සම්පූර්ණවූයේ නොවේ. යම් කර්මයකින් හෙතෙම දුර්ගතියට යේද. හෙතෙම ඒ පාපකර්මයද රැස් කරයි.

96 "මහරජ, අලාත නම් සෙනෙවියාගේ පෙර ඔහු විසින් කරණ ලද පිනක්ම වේ. දෙවයන් වහන්ස, මෙතෙම යම් සුවයක් ලබානම්, ඒ කුශලකර්මයාගේ මේ විපාකයවේ.

97 "මොහුගේ ඒ පින පිරිහේමැයි. එසේම අකුශල කර්මයෙහි ඇළුනාවූ හෙතෙම ඍජුවූ කුශල මාර්ගය හැර දමා අයහපත්වූ අකුශල මාර්ගයෙහි දුවයි.

98 "යම්සේ අල්ලාගන්නාලද තරාදිය තුලා මණ්ඩලයෙහි බඩු දැමූ කල්හි පහත් වේද, බර ඉවත්කළ කල්හි තරාදිය උස්වේද?

99 "මෙපරිද්දෙන්ම මනුෂ්‍යතෙම පුණ්‍යකර්මය ටික ටික නමුත් රැස්කරමින් කුශල කර්මයෙහි ඇළුනාවූ බීජක නම් දාසයා මෙන් ස්වර්ගයට පැමිණේයයි" කීවාය.

100 "බීජක නම් දාසතෙම අද තමා කෙරෙහි යම් දුකක් දකීද, පෙර ජාතියෙහි ඔහු විසින් කරණ ලද පාප කර්මයක්වේ. හෙතෙම ඒ කර්මයාගේ විපාකය විඳියි.

101 "ඔහුගේ ඒ පාප කර්මය මෙහි ගෙවීයේමය. එසේම කුශල කර්මයෙහි ඇලුනෙක්වේ. එබැවින් පියාණෙනි, ඔබ මේ කාශ්‍යප නම් ආජීවකයා වෙතට පැමිණ නිරයට පමුණුවන්නාවූ අපාය මාර්ගයට නොපැමිණෙවයි" පියාට අවවාද කළාය.

102 "මහරජ, සත්පුරුෂයෙකු හෝ නොහොත් අසත් පුරුෂයෙකු හෝ ශීලවන්තයෙකු හෝ දුශ්ශීලයෙකු හෝ යම් යම් පුද්ගලයෙකු සේවනය කෙරේද, ඒ සේවනය කරණ තැනැත්තේ ඔහුගේම වසඟයට පැමිණේ.

103 "යම්බඳුවූවෙකු මිත්‍රයා කෙරේද, යම්බඳු වූවෙකු සේවනය කෙරේද, හෙතෙමේද එබන්දෙක්වේ. එක්ව වාසය කිරීම වනාහි එබඳුමැයි.

104 "සේවනය කරණු ලබන්නෙක් සේවනය කරණු ලබන්නාහුද, ස්පර්ශ කරණු ලද්දේ ස්පර්ශ කරන්නාවූ අනිකාද, විෂ පොවන ලද්දාවූ ඊය හියවුර මෙන් නොතැවරුහු තවරයි. තැවරීම් බිය හේතුකොටගෙණ ප්‍රාඥතෙම පවිටු යහළුවන් ඇත්තෙක් නොවන්නේමැයි.

105 "යම් මනුෂ්‍යයෙක් කුණු මසක් කුශතණ ආදී පත්‍රවලින් වෙලා බඳීද, කුශතණ ආදී පත්‍රද කුණුගඳ හමත්. අඥානයන් සේවනය කිරීම මෙබඳුවේ.

106 "යම් මිනිසෙක් පත්‍රයකින් තුවරලා වෙලා බඳීද, ඒ පත්‍රද සුවඳ හමත්. ප්‍රාඥයන් සේවනය කිරීම මෙබඳුවේ.

107 "එහෙයින් කොලගොටුව මෙන් තමන්ගේ නුවණ මේරීම දැන නුවණැත්තේ අසත් පුරුෂයන් සේවනය නොකරන්නේය. සත්පුරුෂයන් සේවනය කරන්නේය. අසත්පුරුෂයෝ නරකයට පමුණුවත්. සත්පුරුෂයෝ වනාහි සුගතියට පමුණුවත්ය"යි කීවාය.

108 "පියාණෙනි, මමද තමන් සැරිසැරූ ජාති සතක් ජාතිස්මරණ ඥානයෙන් සිහිකරමි. මෙයින් චුතවූ මම යම් ගතිවලට යන්නෙම්ද, අනාගතයෙහිවූ ඒ ජාති සතක්ද සිහි කරමි.

109 "ජනාධිපතිය, පෙර මාගේ යම් සත්වෙනි ජාතියක් වීද, ඒ ජාතියෙහි මම මගධ රට රජගහ නුවර කර්මාර පුත්‍රයෙක් වීමි.

110 "මා විසින් එහිදී පවිටු යහළුවෙකු නිසා බොහෝ පව් කරණ ලදී. අන් අඹුවන් වෙහෙසමින් නොමැරෙන්න වුන් මෙන් හැසුරුනෙමු.

111 "ඒ පාපකර්මය අළුවලින් වැසුනාවූ ගින්නක් මෙන් යටපත්ව තිබුණේය ඉක්බිති අන්‍යවූ කුශල කර්මවලින් වංශ නම් රටෙහි ඉපදුනිමි.

112 "මහරජ, සමෘද්ධවූ පිරීගියාවූ මහත් වස්තු ඇති කොසඹෑ නුවර සිටු කුලයෙහි නිතර සත්කාර පූජා කරණලද එකම පුත්‍රයා වීමි

113 "එහි මම උපකාරවූ කුශල කර්මයෙහි ඇළුනාවූ පණ්ඩිතවූ ශ්‍රැතවත්වූ මිත්‍රයෙකු සේවනය කෙළෙමි. ඒ යහළු තෙම මා කුශල කර්මයෙහි පිහිටුවීය

114 "තුදුස්වකය, පසළොස්වකය යන බොහෝවූ රාත්‍රි දවස් පෙහෙවස් විසූයෙමි. ඒ කුශල කර්මය දිය කෙළවර කොට ඇති තැනෙක්හි නිධානයක් මෙන් තැන්පත්ව සිටියේය.

115 "ඉක්බිති පාප කර්මයන්ගෙන් යම් මේ කර්මයක් මගධ රටෙහිදී මා විසින් කරණලදද, දුෂ්ටවූ විෂයක් අනුභව කොට මෙන් වාර වශයෙන් පසුව එහි විපාකය පැමිණියේය.

116 "වේදේහ නම් රජ, එයින් චුතවූ මම රෝරුව නම් නරකයෙහි බොහෝ කලක් ස්වකීය පාප කර්මයෙන් පැසුනෙමි. එය සිහි කරන්නාවූ මම සුවයක් නොලබන්නෙමි

117 "මහරජ, මම ඒ නරකයෙහි නොයෙක් අව්රුදු ගණන් බොහෝවූ දුක ගෙවා හෙන්නාකට නම් ජනපදයෙහි උදුරණ ලද බීජය ඇත්තාවූ එළුවෙක් වීමියි" කීවාය.

118 "දේවයන් වහන්ස, එහිදී මා විසින් අමාත්‍ය පුත්‍රයෝ පිටෙන්ද රථයෙන්ද උසුලන ලද්දාහ. ඒ පරදාරාවන් කරා ගියාවූ මාගේ අකුශල කර්ම විපාකයවේයයි" කීවාය.

119 "වේදේහ රජ්ජුරුවෙනි, එයින් චුතවූ මම මහ වනයෙහි වඳුරෙක්ව උපන්නෙමි. එහිදීද මම බුහුටිවූ රැළෙහි නායක වඳුරා විසින් දතින් සිඳ දමනලද බීජ ඇත්තෙක්ම වීමි. මා පරදාරාවන් වෙත ගියාවූ ඒ අකුශල කර්මයාගේ මේ විපාකය වේයයිද" කීවාය.

120 "වේදේහ රජතුමනි, එයින් චුතවූ මම දසන්න නම් ජනපදයෙහි ගවයෙක්ව උපන්නෙමි. එහිද මම උදුරා දමනලද බීජ ඇත්තේ ජවයෙහි යහපත් වීමි. මා විසින් බොහෝ කලක් යානාව උසුලන ලදී. මා පරදාරාවන් වෙත ගියාවූ ඒ අකුශල කර්මයාගේ මේ විපාකයවේ

121 "වේදේහ රජුනි, එයින් චුතවූ මම වැදෑරට කුල ගෘහයකට උත්පත්ති වශයෙන් පැමිණියෙමි. ඉතා දුර්ලභවූ මනුෂ්‍යාත්මයෙහි උපන් මම නොම ස්ත්‍රියක්ද, නොම පුරුෂයෙක්ද හෙවත් නපුංසකයෙක් වීමි. පරදාරාවන් කරා යාමෙන්වූ මාගේ ඒ අකුශල කර්මයාගේ මේ විපාකයවේ.

122 "වේදේහ රජුනි, එයින් චුතවූ මම නන්දන වනයෙහි උපන්නෙමි. තව්තිසා භවනයෙහි මම කැමති වර්ණයෙන් යුක්තවූ දිව්‍යප්සරාවක් වීමි.

123 "එහි මම විසිතුරු වස්ත්‍රාභරණ ඇති අමුණන ලද මණි කොඩොල් ඇති නැටීමෙහි හා ගී කිමෙහි දක්ෂවූ සක් දෙව් රජහුගේ පරිචාරිකාවක් වීමි.

124 "වේදේහ රජුනි, එහි සිටියාවූ මම මෙයින් චුතව යම් ජාතිවලට යන්නෙම්ද, අනාගතයෙහිවූද ඒ මේ ජාති සතක්ම සිහි කරමි.

125 "කොසඹෑ නුවරදී මා විසින් යම් කුශලයක් කරණ ලදද, ඒ කුශලය පරියාය වශයෙන් මෙහි පැමිණියේය. එබැවින් මෙයින් චුතවූ මම දෙව්ලොවද මිනිස් ලොව හැසිරෙන්නෙමි.

126 "මහරජුනි, ජාති සතක් නිරන්තරයෙන් සත්කාර හා පූජා කරණ ලද්දීවෙමි. මේ ගති සයම ස්ත්‍රී භාවයෙන්ද නොමිදෙන්නෙමි.

127 "දේවයන් වහන්ස, සත්වෙනි ගතියද මහත් සෘද්ධි ඇත්තාවූ දිව්‍ය පුත්‍රයෙක් වෙමි. දිව්‍ය සමූහයා අතරෙහි උතුම්වූ පුරුෂ දෙවියෙක් වන්නෙමි.

128 "මහරජ, නන්දනොද්‍යානයෙහි අනතුරු ජාතියෙහි මාගේ ස්වාමිවූ ජව නම් යම් දිව්‍ය පුත්‍රයෙක් මල්මාලාව පිළිගනීද, එක අතට නැටි තැබීම් වශයෙන් කරණලද ඒ මල් මාලාව අදත් පරිචාරිකාවෝ ගොතත්මැයි.

129 "මහරජ, මේ අවුරුදු සොළොස ඒ දිව්‍යවූ මොහොතක් වැනිය. ඒ දිව්‍යවූ එක් රෑ දවාලෙක්ද මානුසික වූ වර්ෂ සියයක් වේ.

130 "මෙසේ කුශලාකුශල කර්මයෝ ගණන් නැති ජාතිවලද පසුපස්සේ ගමන් කෙරෙත්. යහපත්වූද නොහොත් පවිටුවූද, කර්මය විපාක නොදී නොනැසේමයයි" කීවාය.

131 "යමෙක් ජාති ජාතියෙහි නැවත නැවත පුරුෂයෙක් වන්ට කැමැත්තේ නම් ධෝවනය කළ පා ඇත්තෙක් මඩ මෙන් පරදාර සේවනය දුරු කරන්නේය.

132 "යම් ස්ත්‍රියක් ජාති ජාතියෙහි නැවත නැවත පුරුෂයෙක් වන්ට කැමති වන්නේ නම් පරිචාරිකා ස්ත්‍රීහු සක්දෙව් රජුට මෙන් ස්වාමියාට බුහුමන් කරන්නේය.

133 "යමෙක් දිව්‍යවූ සම්පත්ද දිව්‍යවූ ආයුෂද යසසද සැපයද කැමැතිවන්නේ නම්, හෙතෙම පාප කර්මයන් දුරු කොට ත්‍රිවිධවූ කුශල ධර්මයෙහි හැසිරෙන්නේය.

134 "යම් ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ තමහට වැඩ පිණිස පවතී නම්, නුවණැත්තාවූ හෙතෙම කයින්ද වචනයෙන්ද සිතින්ද අප්‍රමාදවූවෙක් වියයුතුයි.

135 "මේ සත්ව ලෝකයෙහි යසස් ඇත්තාවූ සම්පූර්ණවූ සියලු සම්පත් ඇති යම්කිසි මේ මනුෂ්‍ය කෙනෙක් වෙද්ද, ඔවුන් විසින් පූර්ව භවයෙහි සැක නැතුව මනාව පුරුදු කරණ ලද කුශල කර්මයවේ. බොහෝවූ සියලු සත්වයෝ කර්මය ස්වකීය කොට ඇත්තාහුමය.

136 "ජනාධිපතිය, අලංකාරයෙන් සැරසුනාවූ, රන් දැලින් වැසුනාවූ දිව්‍යප්සරාවන් හා සමානවූ යම් මේ ස්ත්‍රීහු ඔබට උපස්ථාන කෙරෙද්ද ඒ මේ ස්ත්‍රීහු කවර හේතුවකින් ඇතිවූවාහුද, දේවයන් වහන්ස, එබැවින් තමන් විසින්ද සිතා බලනු මැනවයි" පිය රජුට අනුශාසනා කළාය.

137 "මෙසේ මේ කථාවලින් රුජා නම් රාජ කන්‍යාතොමෝ අංගාති නම් පියරජහු සතුටු කෙළේය. මුළාවූ ඔහුට සුගති මාර්ගය කීයේය. මනා පැවතුම් ඇති ඕතොමෝ ධර්මය ප්‍රකාශ කෙළේයි.

138 "ඉක්බිති නාරද නම් බ්‍රහ්මතෙම මනුෂ්‍ය ප්‍රජාව ඇත්තාවූ ජම්බුද්වීපය පරීක්ෂා කරන්නේ අංගාති නම් රජහු දැක බ්‍රහ්ම ලෝකයෙහි සිට ආයේය.

139 "ඉන්පසු වේදේහ නම් රජු ඉදිරියෙහි ප්‍රාසාදයෙහි සිටියේය. රුජා නම් රාජ කන්‍යාතොමෝ පැමිණියාවූ ඒ ඍෂීන් වහන්සේද දැක වැන්දේය.

140 "එකල්හි විස්ම පත්වූ සිත් ඇති රජතෙම හුනස්නෙන් බැස නාරද නම් ඍෂීන් විචාරමින් මේ වචනය කීයේය.

141 "දෙවියෙකුට බඳු වර්ණ ඇත්තාවූ නුඹවහන්සේ රාත්‍රියෙහි බබළන්නාවූ සඳ දෙව්පුත් මෙන් බබළමින් කොයි සිට ආයෙහිද? විචාරණ ලද්දේ නාමය හා ගෝත්‍රය මට කියව, කෙසේ නම් මනුෂ්‍ය ලෝකයෙහි ඔබ දනිද්දැයි" ඇසීය.

142 "මම වනාහි දැන් රාත්‍රියෙහි සඳ දෙව් පුත් මෙන් බබළමින් දෙව්ලොවින් එමි. විචාරණ ලද්දේ ඔබට නාමය හා ගෝත්‍රය කියමි. මා නමින් නාරද යයිද ගෝත්‍රයෙන් කාශ්‍යප යයිද මිනිස් ලොව දනිත්යයි" කීයේය.

143 "ඔබගේ යම්බඳු සටහණක් වේද, අහසෙහි ගමන් කරන්නෙහිය. සිටින්නෙහිය, යන යමකුත් වේද, ඒකාන්තයෙන් මෙය ආශ්චර්‍ය්‍ය ස්වභාව ඇත්තේය. නාරදයන් වහන්ස, මේ කාරණය ඔබගෙන් විචාරමි. එසේ ඇතිකල්හි කවර කරුණකින් ඔබගේ මෙබඳු ඍද්ධියක් වීදැයි" ඇසීය.

144 "සත්‍ය වචනයද සුචරිත ධර්මයද ඉන්ද්‍රිය දමනයද පරිත්‍යාගයද යන මේ ගුණ ධර්මයෝ මා විසින් පළමු ජාතියෙහි කරණ ලද්දාහුය. මනාව සේවනය කරණලද්දාවූ ඒ ගුණ ධර්ම වලින්ම මනෝමය ජව ඇත්තාවූ මම කැමති පරිදි ගමන් කරන්නෙක්වෙමියි" කීයේය.

145 "ඉදින් ඔබවහන්සේ යම්සේ කියන්නෙහිද, මොව්හු එසේ වෙත්නම් ආශ්චර්‍යයීවූ පුණ්‍ය කර්මයන්ගේ සිද්ධියක් කියන්නෙහිය. නාරදයන් වහන්ස, මේ කාරණය ඔබගෙන් විචාරමි. විචාරණ ලද්දේද, මට එය මනාකොට ප්‍රකාශ කරවයි" කීයේය.

146 "භූමිපාලවූ මහරජ, යම් සැකයක් කරන්නෙහි නම්, ඔබගේ මේ කාරණය මාගෙන් අසව. මම කරුණුවලින්ද න්‍යායවලින්ද හේතුවලින්ද ඔබ සැක නැති බවට පමුණුවමියි' ඍෂිතෙම කීයේය.

147 "නාරදයන් වහන්ස, මේ කාරණය ඔබගෙන් විචාරමි. පින්වත් නාරදයෙනි, මාවිසින් විචාරණ ලද්දාවූද ඔබ මට බොරුවක් නොකියනු මැනව. මේ ජනතෙම යමක් ඇතැයි කියද්ද, ඒ දෙවියෝ ඇත්තාහුද බ්‍රහ්මයෝ ඇත්තාහුද පරලොවක් ඇත්තේදැයි" ඇසීය.

148 "මේ ජනතෙම යමක් ඇතැයි කියාද, ඒ දෙවියෝ ඇත්තාහුමය. බ්‍රහ්මයෝද ඇත්තාහ. පරලොවක්ද ඇත්තේය. කාමයන්හි ගිජුවූම අතිශයින් මුළාවූ මනුෂ්‍යයෝ මෝහයෙන් යුක්තවූවාහු ඒ පරලොව නොදනිත්යයි" ඍෂි තෙම කීයේය.

149 "පින්වත් නාරදයෙනි, ඉදින් මළවුන්ට පරලොව වාසස්ථානයක් ඇතැයි අදහන්නෙහි නම් මෙහිදීම මට කහවණු පන්සියයක් දුන මැනව. පරලොවදී ඔබට දහසක් දෙන්නෙමියි" රජතෙම පරිහාස වශයෙන් කීයේය.

150 "ඉදින් පින්වතා සිල්වෙතක. ප්‍රතිග්‍රාහකයන්ගේ වචන දන්නෙකැයි දනිවු නම්, පින්වතාට කහවණු පන්සියයක් දෙන්නෙමු. නරකයෙහි වසන්නාවූ රෞද්‍රවූ පින්වත් ඔබ දැක කවරෙක් නම් පරලොවදී දහස ඉල්වන්නේද?

151 "මෙලොවම යමෙක් අධර්ම ස්වභාව ඇති ලාමක හැසුරුම් ඇති අලසවූ රෞද්‍ර කර්මාන්ත ඇත්තෙක් වේද, නුවණැත්තෝ එබඳු පුද්ගලයා කෙරෙහි ණය නොදෙත්. එබඳු පුද්ගලයා ගෙන් නැවත ණය ලැබීමක් නොවේ.

152 "මනුෂ්‍යයෝ දක්ෂවූද උත්සාහවත්වූද, සිල්වත්වූද ප්‍රතිග්‍රාහකයන්ගේ වචන දන්නාවූද, පුරුෂයා දැක කර්මාන්ත කොට නැවත ගෙණහැර දෙවයි. තුමූම සම්පත්වලින් පවරත්යයි" ඍෂිතෙම කීයේය.

153 "මහරජ, මෙයින් චුතව ගියාවූ ඔබ වන කවුඩු සමූහයා විසින්ද, අදිනු ලබන්නහු ඒ නිරයෙහි දක්නෙහිය. කව්ඩන් විසින්ද ගිජුලිහිණින් විසින්ද උකුස්සන් විසින්ද කනු ලබන්නාවූ සිඳීගිය ශරීර ඇත්තාවූ ලේ වැගිරෙන්නාවූ නිරයෙහි වසන්නාවූ ඔබ දැක කවරෙක් නම් පරලොවදී දහස ඉල්වන්නේදැයි" ඇසීය.

154 "මහරජ, යම් ලෝකාන්තර නරකයෙක්හි ඝනාන්ධකාරය ඇත්තේද, එහි සඳ හිරු නොවෙත්. ඒ නරකයටම හැමකල්හි ඝනාන්ධකාර වේ. බිහිසුනු ස්වභාව ඇත්තේද වේ. එහි ඒ රාත්‍රියද දාවලද නොපෙනේ. එබඳු නරකයෙහි කවර නම් ණයට දුන් ධනය කැමැත්තෙක් හැසිරෙන්නේදැයි" ඇසීය.

155 "මහත්ව වැඩුනු ශරීර ඇති බල ඇත්තාවූ මහත්වූ කබර ඇත්තාවූද ස්‍යාම වර්ණවූද ශුනකයෝ දෙදෙනෙක් මෙයින් චුතව පරලොවට පැමිණියාවූ ඔබ යකඩින් කළ දත්වලින් හපා කත්.

156 "රෞද්‍රවූ චණ්ඩවූ දුක් එලවන්නාවූද ශුනකයන් විසින් කනු ලබමින් නරකයෙහි වසන්නාවූ සිඳුනු ශරීර ඇති ලේ වැගිරෙන්නාවූ ඔබ දැක කවරෙක් නම් පරලොවදී ඒ දහස ඉල්වන්නේදැයි" ඇසීය.

157 "දරුණුවූ නරකයෙහි කාළූපකාල නම් නිරය පාලයෝ පෙර ජාතියෙහි කළාවූ අකුශල කර්ම ඇති මිනිසාට ඉතා මුවහත්වූ ඊතලවලින් හා අඩයටි වලින් අනිත්, විදිත්.

158 "ඒ අනිනු ලබමින් නරකයෙහි ඔබමොබ ගමන් කරන්නාවූ කුසෙහිද පාර්ශවයෙහිද විශෙෂයෙන් පැලීගිය උදර ඇත්තාවූ සිඳුනු ශරීර ඇති ලේ වැගිරෙන්නාවූ ඔබ දැක කවරෙක් නම් පරලොවදී ඒ දහස ඉල්වන්නේදැයි" ඇසීය.

159 "ඒ නරකයෙහි මේඝය තෙම අඩයටිය, ඊතලය, තෝමරය, භෙණ්ඩිවාලය යන නොයෙක් ආයුධ වලින් යුක්තව වසියි. ගිනි සිළු වලින් යුත් අඟුරු මෙන් ආයුධ වැටෙත්. රෞද්‍ර කර්ම ඇත්තහු කෙරෙහි හෙන මෙන් ගල්වැසි වසියි.

160 "ඒ නරකයෙහි වාතයතෙම ඉසිලිය නොහැකි උෂ්ණදවේ. එහි ස්වල්ප තරම්වූද සැපයක් නොලබයි. ඒ ඒ තැන දුවන්නාවූ පිහිටක් නැත්තාවූ පීඩිතවූ ඔබ දැක කවරෙක් නම් ඒ දහස ඉල්වන්නේදැයි" ඇසීය

161 "දිලිසෙන ලෝහමය රථයන්හි යොදන ලදුව ගිනිදැල් සහිතවූ පොළොව මැඩගෙණ ඔබ්මොබ දුවන්නාවූ කැවිටි කෝටුවලින් මෙහෙයනු ලබන්නාවූ ඔබ දැක කවරෙක් නම් පරලොවද ඒ දහස ඉල්වන්නේදැයි ඇසීය.

162 "බිහිසුණුවූ ගිනිගෙණ දිළියෙන්නාවූ භය ජනකවූ කරකැති වලින් එක්කරණ ලද පර්වතයට නගින්නාවූ සිඳුනු ශරීර ඇති ලේ වැගිරෙන්නාවූ ඔබ දැක කවරෙක් නම් පරලොවදී ඒ දහස ඉල්වන්නේදැයි" ඇසීය.

163 පර්වතයක් හා සමානවූ දිළියෙන්නාවූ භයජනකවූ අඟුරු ගොඩට නගින්නාවූ අතිශයින් දැවුණු ශරීර ඇති බැගෑපත්ව හඬන්නාවූ ඔබ දැක කවරෙක් නම් පරලොවදී ඒ දහස ඉල්වන්නේදැයි" ඇසීය.

164 "යමක් තියුණුවූ මනුෂ්‍යයන්ගේ ලේ පානය කරන්නාවූ අයෝමය කටු වලින් යුක්තද, එබඳු කටුවලින් යුක්තවූ වළාකුළු මෙන් උස්වූ වෘක්ෂයෝද වෙත්යයි" කීයේය.

165 "පරදාරාවන් කරා ගියාවූ ස්ත්‍රීහුද පුරුෂයෝද යමරජහුගේ නියමය කරන්නාවූ අඩයටි ගත් අත් ඇති යමපල්ලන් විසින් මෙහෙයන ලද්දාහු ඒ ගස්වලට නගිත් යයි" කීයේය.

**166-167** "ඒ නරකයෙහිවූ කටුඉඹුල් ගසට නගින්නාවූ ලෙයින් වැකුණාවූ විශෙෂයෙන් දැවුනු ශරීර ඇති පහව ගිය සිවිය ඇති පීඩිතවූ දැඩි වේදනා ඇති වරින් වර උණුසුම්ව ප්‍රස්වාස කරන්නාවූ පූර්වයෙහි අකුශල කර්ම වශයෙන් කරණ ලද අපරාධ ඇත්තාවූ ගස්මුදුන්වල හා වෙලෙප් අග නැසුනාවූ ඒ නිරිසතා දැක කවරෙක් නම් ඒ ණයට දුන් ධනය ඉල්වන්නේ දැයි" කීයේය.

**168** "අයෝමයවූ තියුණුවූ නිරිසතුන්ගේ ලේ පානය කරන්නාවූ කඩුපත් වලින් ගැවසීගත්තාවූ මෙඝකුට සමාන උස්වූ මහා ගස් වෙත්.

**169** ඒ කඩුපත් ඇති වෘක්ෂයට පැමිණියාවූද තියුණුවූ කඩුවලින් සිඳිනු ලබන්නාවූ සිඳුනු ශරීර ඇති ලේ වැගිරෙන්නාවූ ඔහු දැක කවරෙක් නම් පරලොවදී දහස ඉල්වන්නේ දැයි" ඇසීය.

**170** "දුක්වූ ඒ අසිපත්‍ර නම් නරකයෙන් නික්මුණු කෙනෙහිම වේතරණී නම් නරකයට වැටුනාවූ ඔහු දැක කවරෙක් නම් ඔහුගෙන් ඒ ණයට දුන් ධනය ඉල්වන්නේ දැයි" ඇසීය.

**171** "රළුවූ ක්ෂාර ජලය ඇත්තාවූ රත්වූ යානොහැකිවූ අයෝමය පොකුරු පත් වලින් ගැවසීගත්තාවූ ඒ වේතරණී නම් ගංගාව තියුණු පත්‍ර වලින් යුක්තව ගලා බසීයයි" කීයේය.

**172** "එල්බීමක් නැත්තාවූ ඒ වේතරණී නම් ඔසුපත් නිරයෙහි වහනය කරන්නාවූ ලෙයින් වැකුණාවූ සිඳුනු ශරීර ඇති ඔහු දැක කවරෙක් නම් ඔහුගෙන් ඒ ණයට දුන් ධනය ඉල්වන්නේ දැයි" නාරද ඍෂිතෙම ඇසීය.

**173** "පින්වත් ඍෂිවරය, ඔබ විසින් කියන ලද මේ ගාථාවන් අසා මම වනාහි සිඳිනු ලබන්නාවූ ගසක් මෙන් වෙව්ලමි. අතිශයින් මුළාවූ සිහි ඇත්තේ යන දිශාවක් නොදනිමි. කළාවූ පාපකර්මයට භයින් තැවෙමි. මට මහත්වූ අපාය භයද උපන්නේය.

174 "සිරුර ගිනි ඇවිලගත් කල්හි ජල මධ්‍යස්ථානයක් මෙන්ද, නැව බිඳුන කල්හි මහත් සැඩ පහරෙහි හෝ සාගරයෙහි දිවයිනක් මෙන්ද, අන්ධකාරය ඇතිකල්හි දල්වන ලද පහනක් මෙන්ද, ඍෂින් වහන්ස, නුඹවහන්සේ අපට පිහිට වුව මැනව.

175 "ඍෂිතුමනි, මා විසින් ඉකුත් කාලයෙහි අපරාධ කරණ ලදී. එබැවින් මට අර්ථයෙන්ද ධර්මයෙන්ද අනුශාසනා කරණු මැනව. නාරදයන් වහන්ස, යම්සේ මම නරකයෙහි නොවැටෙම්ද එබඳු පිරිසිදු මාර්ගයක් මට කියවයි" රජතෙම කීයේය.

176 "යම්සේ ධතරට්ඨය, වෙස්සාමිත්තය, අට්ඨකය, යමතග්ගිය, උසින්නරය, සිවිරජය යන මේ රජහු මහණ බමුණන්ට සත්කාර කරන්නෝ වූවාහුද?

177 "මේ රජවරුද අන්‍යවූ රජවරුද යන යම් කෙනෙක් කුශල ධර්මයන්හි හැසිර සක්දෙව් රජ බවට පැමිණියාහුද, මහරජ, එහෙයින් ඔබද අකුශල ධර්මය දුරුකොට කුශල ධර්මයෙහි හැසිරෙව.

178 "මහරජ, ඔබගේ ප්‍රාසාදයෙහි ආහාර ගත් අත් ඇත්තෝද සොෂා කෙරෙත්වා. ඔබගේ නගරයෙහි කවරෙක් සයින් යුක්තද කවරෙක් පිපාස ඇත්තේද, කවරෙක් මල් මාලාවල් දරන්නේද, කවරෙක් විලවුන් ගල්වන්නේද, කවර නම් වස්ත්‍ර නැත්තෙක් නානා වර්ණවූ වස්ත්‍ර හඳින්නේද?

179 "කවරෙක් ගමන් මාර්ගයෙහි කුඩයක් දරන්නේද, මෘදුවූ යහපත්වූ වහන් කැමැත්තේදැයි මෙසේ සවසද උදයද ඔබගේ නගරයෙහි සෝෂා කරවත්වා.

180 "ජරාවට ගියාවූ පුරුෂයාද ගවයන් හා අසුන්ද පෙරපරිද්දෙන් කටයුතුවල නොයොදව. ශරීර ශක්තියෙන් යුක්තවූ යමෙක් පළමු උපකාර කෙළේද, පසුවද ඔහුට බත් වැටුප් දෙවයි මෙසේ" අවවාද කෙළේය.

181 "මහරජ, ඔබගේ ශරීරය රථයයි දක්නා ලද්දේ වේවා. ඒ රථය සැහැල්ලුවූ කුසල් සිත නමැති රියැදුරාගෙන් යුක්ත

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

වේවා. අවිහිංසා නමැති මනාව නිමවන ලද අකුරෙන් යුක්ත වේවා. දාන සංවිභාග නමැති වැස්මෙන් යුක්ත වේවා.

182 "පාද සංයම නමැති නිම්වළල්ලෙන් යුක්ත වේවා. හස්ත සංයම නමැති වෙහෙල් පත් වලින් යුක්ත වේවා. කුක්ෂි සංයම නමැති තෙල් ගැල්වීමෙන් යුක්ත වේවා. වාක් සංයම නමැති නොහැඬීම ඇතිවේවා.

183 "සත්‍ය වචන නමැති සම්පූර්ණ අවයව ඇතිවේවා. පෙහෙසුන් බස් නොකීම නමැති මනා ස්පර්ශ කිරීම ඇති වේවා. සිලුටු වචන නමැති නිර්දෝෂ අවයව ඇති වේවා. ප්‍රමාණවත් කථාව නමැති ලහටුවෙන් මනාකොට සම්බන්ධ කිරීම ඇතිවේවා.

184 "ශ්‍රද්ධාව හා ලොභ නොවීම නමැති සොඳුරු සැරසීමෙන් යුක්තවේවා. සිල්වතුන්ට යටත් පැවතීම හා ඇඳිලි කිරීම නමැති රිය කඳින් යුක්තවේවා. තද නැති බැව් නමැති මදක් නැමුණු රථ හිසින් යුක්තවේවා. සීලය හා සංවරය නමැති බඳින රැහැනින් යුක්ත වේවා.

185 "ක්‍රොධ නොකිරීම නමැති නොගැටීමෙන් යුක්ත වේවා. දශකුශල ධර්ම නමැති සේසතින් යුක්ත වේවා. බහුශ්‍රැතභාවය නැමති රිය කුඩුවෙන් යුක්ත වේවා. එකඟ බැවින් යුත් සිත නමැති මතු මත්තෙහි ඇතිවීමෙන් හෙවත් රාජාශනයෙන් යුක්ත වේවා.

186 "කල් දන්නා බැවින් කරණ ලද කුශල චිත්ත නමැති සාරයෙන් යුක්ත වේවා. විසාරද බැව් නමැති ත්‍රී දණ්ඩයෙන් යුක්ත වේවා. යටත් පැවතුම් නමැති යොතකින් යුක්ත වේවා. අධික මාන්න රහිත වීම් නමැති සැහැල්ලුවූ වියදණ්ඩෙන් යුක්ත වේවා.

187 "නොහැකුළුණු සිත නමැති ඇතිරීමෙන් යුක්ත වේවා. ප්‍රඥා වෘද්ධයන් සේවනය කිරීම නමැති රජස් නැසීම ඇතිවේවා. ප්‍රාඥවූ ඔබගේ ඒ රථයෙහි මනාව පිහිටියාවූ සිහිය නමැති කෙවිටක් ඇතිවේවා. ධෛර්‍ය්‍යයෙන් යුක්ත වීම නමැති රැහැන් ඇතිවේවා.

188 "සමව දමනයවූ අසුන් විසින් උසුලන ලද රථය මෙන් දමනයවූ සිත ඔබගේ කාය නමැති රථය ඍජුවූ මාර්ගයට පමුණුවයි. නොලද වස්තුවෙහි ආශාවද ලද වස්තූන්හි ලොභ කිරීමද අයහපත් මාර්ගයවේ. ශීලාදී සංයමය තෙම ඍජුවූ මාර්ගය නම් වේ.

189 "මහරජ, රූපය ශබ්දය රශය ගන්ධය යන මේ කාම ගුණයන්හි නිමිතිගෙණ දුවන්නාවූ වාහණයට ප්‍රඥා නමැති කෙවිටි කිරීම ඇතිවේ. ඒ ඔබගේ කාය නමැති රථයෙහි තෙමේම රියැදුරාවේ

190 "යමෙකුගේ සම චරියාවද ධෛර්‍ය්‍යයද ස්ථිරවේද, හෙතෙම මේ යානාවෙන් ගමන් කරයි. මහරජ, සියලු කැමති සම්පත් දෙන්නාවූ මේ රථයතෙම කිසිකලෙකත් නිරයට නොපැමිණෙන්නේ යයි" නාරද ඍෂිතෙම කීයේය.

191 "එකල්හි අලාත නම් සෙනෙවිතෙම දැන් දෙව්දත් තෙර වූයේය. සුනාම නම් සෙනෙවිතෙම භද්දජි ස්ථවිර විය. විජය නම් සෙනෙවිතෙම ශාරීපුත්‍ර ස්ථවිර වූයේය. බීජක නම් දාසතෙම මොග්ගල්ලාන ස්ථවිර වූයේය.

192 "ගුණ නම් අචේලකතෙම සුනක්ඛත්ත නම් ලිච්ඡවි පුත්‍රයාවූයේය. යම් රුජා නම් රාජකන්‍යාවක් රජ පැහැදවීද, ඕතොමෝ ආනන්ද ස්ථවිරවූයේය.

193 "එකල්හි ලාමක දෘෂ්ටි ගත්තාවූ රජ තෙමේ උරුවේල කාශ්‍යපනම් වූයේය. නාරද නම් බ්‍රහ්මතෙමේ බොධිසත්වවූ මමම වෙමියි මෙසේ මේ ජාතකය දරාගනිව්යයි" වදාළේය.

544 විධුර ජාතකයඃ- 1 "යම්කිසිවෙක් කිපිය යුතු පුද්ගලයෙකු කෙරෙහි කෝප නොකෙරේද, සත්පුරුෂවූ හෙතෙම කිසිකලෙකත් ක්‍රොධ නොකෙරේද, කිපියාවූද යමෙක් කෝපය පහළ නොකෙරේද, ඒකාන්තයෙන් ඒ මනුෂ්‍යයා ලෝකයෙහි පණ්ඩිතයෝ ශ්‍රමණයායයි කියත්යයි" වරුණ නම් නාරජ කීයේය.

2 "උණුවූ උදර ඇති හෙවත් බඩසය ඇති යමෙක් ඉන්ද්‍රිය දමනයෙන් යුක්තවූයේ තපසින් යුක්තවූයේ පමණ දැන ආහාර

පාන වැළඳීම ඇත්තේ කුසගින්න ඉවසාද, ආහාර හේතුවෙන් පාපකර්මයක් නොකෙරේද, ඒකාන්තයෙන් ඒ මනුෂ්‍යයා ලෝකයෙහි ශ්‍රමණයාය කියත්යයි” සුපර්ණරාජයා කීයේය.

3 “යමෙක් කායික වාචසිකවූ ක්‍රීඩාද දිව්‍යවූ කම්සැපයෙහි ඇලීමද යන සියල්ල හැරදමා ලෝකයෙහි ස්වල්ප තරම්වත් බොරුවක් නොකියාද, කය සරසන කරුණුවලින් හා මෛථුන සෙවනයෙන් වැළකුනේ වේද, ඒකාන්තයෙන් ඒ මිනිසා ලෝකයෙහි පණ්ඩිතයෝ ශ්‍රමණයාය කියතියි” ශක්‍රතෙම කීයේය.

4 “තමන් අයත්වූ ලෝභ ඉපදවිය යුතුවූ සියල්ලම ඉදින් යම්කෙනෙක් පිරිසිඳ දැන හැර දමද්ද, ඉන්ද්‍රිය දමනයෙන් යුක්තවූ එකඟවූ සිත් ඇති මමත්වය නැත්තාවූ ආහාර හිතවූ ඒ පුද්ගලයා ඒකාන්තයෙන් ශ්‍රමණයායයි ලෝකයෙහි පණ්ඩිතයෝ කියත්යයි” ධනඤ්ජය රජතෙම කීයේය.

5 “පඬිතුමනි, කටයුතු කරවන්නාවූ අලාමක ප්‍රඥා ඇත්තාවූ ඔබ විචාරමි. අප විසින් කියන ලද ගාථාවන්හි හටගත්තාවූ විවාදයක් ඇත්තේය. අපගේ සැකයද විචිකිච්ඡාවන්ද සිඳුව. අද ඔබ නිසා අප සියල්ලෝ සැක දුරුකර ගනිමුයි” කීවාහුය.

6 “අර්ථය දැක්මට සමර්ථවූ යම් පණ්ඩිත කෙනෙක් වෙද්ද, ඔව්හු ඒ විවාදය සුදුසු කල්හි නුවණින් සළකා කියත්. මහරජුනි, නොකියන ලද ගාථාවන්ගේ අර්ථය දක්ෂවූවාහු නමුත් කෙසේ නම් නුවණින් පමුණුවන්නාහු දැයි” විධුර පණ්ඩිතතෙම ඇසීය.

7 “වරුණ නම් නාරජතෙම කෙසේනම් කියාද? වෙණතෙය්‍යා නම් ගුරුළු රජතෙම කෙසේ හෝ කියාද? ගන්ධර්ව රාජවූ ශක්‍රතෙම වනාහි කුමක් කියයිද? කුරුරට වැස්සන්ගේ ශ්‍රෙෂ්ඨයාවූ ධනඤ්ජය රජතෙම කෙසේ කියා දැයි” ඇසූහ

8 “පඬිතුමනි, නාරජතෙම ඒකාන්තයෙන් ඉවසීම උතුම්ය කියයි. වෙණතෙය්‍යා නම් ගුරුළුතෙම මදවූ ආහාර ඇතිවීම උතුම්ය කියයි. ගන්ධර්ව රාජවූ ශක්‍රතෙම පස්කම් සැපයෙහි ආලය දුරුකිරීම උතුමැයි කියයි. කුරුරට වාසීන්ගේ රාජොත්තමතෙම පලිබොධ නැතිවීම වර්ණනා කෙරේයයි” ඒ රජහු කීහ.

9 "මහරජවරුනි, මේ සියල්ලම වනාහි කියන ලදහ. මෙහි අයහපත්කොට කියනලද කිසිවක් නැත්තේය. යම් පුද්ගලයෙකු කෙරෙහි මේ සිව්වැදෑරුම් ගුණයෝ ගැල්නැබෙහි මනාව පිහිටියාවූ දැකීමෙන් පිහිටියාහු වෙද්ද, මේ ගුණධර්ම සතරින් යුක්තවූ ඒ පුද්ගලයා ඒකාන්තයෙන් ශ්‍රමණයායයි ලෝකයෙහි පණ්ඩිතයෝ කියත්යයි" පණ්ඩිතතෙම කීයේය.

10 "පණ්ඩිතය, නුඹ ශ්‍රෙෂ්ඨයාද වෙහිය, නුඹ අනුත්තරද වෙහිය. නුඹ ධජය රක්නේද ධර්මය දන්නේද මනා ප්‍රඥා ඇත්තේද වෙහිය. තමන්ගේ ප්‍රඥාවෙන් අපගේ ප්‍රශ්නය මනාකොට දැනගෙණ ප්‍රාඥවූ ඔබ අපගේ සැකයන් දුරු කෙළේය. දළ කැටයම් කරන්නෙක් කියතෙන් ඇත් දත යම්සේ කපන්නේද එමෙන් අපගේ සැකයද විචිකිච්ඡාවන්ද සිඳ දැම්මේයයි" ස්තුති කළාහුය.

11 "ප්‍රාඥවූ පණ්ඩිතය, ප්‍රශ්න විසඳීමෙන් සතුටුවූ මම නිළුපුල් බඳු පැහැ ඇති නිර්මලවූ අනර්ඝවූ දුමට බඳු වර්ණ ඇති මේ වස්ත්‍රය ධර්ම පූජා වශයෙන් ඔබට දෙමි" ශක්‍රතෙම කීයේය.

12 "පණ්ඩිතතුමනි, ප්‍රශ්නය විසඳීමෙන් සතුටුවූ මම පිපියාවූ පද්මයක් බඳුවූ කෙශර සහිතවූ රුවන් දහසකින් හෙබියාවූ රන් මාලයක් දහම් පඬුරු වශයෙන් ඔබට දෙමියි" ගුරුළු රජතෙම කීයේය.

13 "පඬිතුමනි, ප්‍රශ්න විසඳීමෙන් සතුටුවූ මම මාගේ බොටුවෙහි පැළඳි මැණික් වලින් හෙබියාවූ පැහැවිහිදෙන්නාවූ සිත්කළුවූ අනර්ඝවූ මේ මැණික දහම් පඬුරු වශයෙන් ඔබට දෙමියි" නාරජතෙම කීයේය

14 "ගවයන් දහසක්ද වෘෂයෙකුද හස්තියෙකුද ආජානීය අසුන් යෙදුවාවූ මේ රථ දහසක්ද ගම්වර සොළසක්ද ප්‍රශ්න විසඳීමෙන් සතුටුවූ මම ඔබට දෙමියි" ධනඤ්ජය නම් රජතෙම කීයේය.

15 'එම්බා විමලාවෙනි, තී පඬුවන්වූ කෘෂවූ දුර්වලවූ ශරීර ඇත්තී වෙහිය. තීගේ රූපවර්ණය පෙර මෙබඳු නොවෙයි. මාවිසින් විචාරණ ලද්දී තිට කෙබඳු ශරීර වේදනාවක් ඇද්දැයි

කියවයි" වරුණ නම් නාරජතෙම විමලා නම් බිසොවගෙන් ඇසීය.

16 "පින්වත් නාරජුනි, මිනිසුන් අතර ස්ත්‍රීන්ගේ දොළ දුකනම් ස්වභාවයක් ඇතැයි කියනු ලැබේ. නා රජුනි, දැහැමින් සෙමෙන් ගෙණන ලද විධුරනම් පඬිහුගේ හදවත පතමියි" කීය.

17 "විමලාවෙනි, නුඹ චන්ද්‍රයා වනාහි දොළ වශයෙන් කැමති වන්නෙහිය. සූර්‍ය්‍යයා හෝ තවද සුළඟ හෝ කැමැති වන්නෙහිය. විධුර පණ්ඩිතයාගේ දර්ශනය පවා දුර්ලභ කල්හි කවරෙක් නම් විධුර පණ්ඩිතයා මෙහි ගෙණන්නේදැයි" නා රජතෙම ඇසීය.

18 "පියාණෙනි, කුමක් සඳහා නුඹ සිතිවිලි සිතන්නෙහිද, ඔබගේ මුහුණ අතින් මැඩගන්නාලද පියුමක් වැනිය අධිපතිය, කුමකට නොසතුටු ස්වභාව ඇත්තේ වෙහිද, සතුරන් තවන්නාවූ නාරජු නුඹ ශොක නොකරවයි" ඉරන්දතී නම් දුව කීවාය.

19 "එම්බා ඉරන්දතිය, ඔබගේ මව වනාහි විධුර පණ්ඩිතයාගේ හදවත පතයි. විධුර පණ්ඩිතයාගේ දර්ශනය පවා දුර්ලභ කල්හි, කවරෙක් නම් විධුර පණ්ඩිතයා මෙහි ගෙණන්නේදැයි" නාරජ කීයේය.

20 "දුවණියෙනි, යමෙක් විධුර පණ්ඩිතයා මෙහි ගෙණෙන්නේද, එබඳු ස්වාමිපුරුෂයෙකු සෙවීමෙහි හැසිරෙවයි" කීයේය. ඒ නාග මානවිකාතොමෝ පියාගේ කීම අසා රාත්‍රියෙහි නාගභවනයෙන් නික්ම ස්වාමියෙකු සෙවීමෙහි හැසුරුණේය

21 "ගන්ධර්වයන්ද රාක්ෂසයන්ද නාගයන්ද කිඳුරන්ද මිනිසුන්ද යන මොවුන් අතරෙහි සියලු කැමැතිදේ දෙන්ට සමර්ථවූ කවර නම් පණ්ඩිතයෙක් බොහෝ කලක් මුළුල්ලෙහි මට ස්වාමියා වන්නේදැයි" කියමින් ගායනා කළාය.

22 "එම්බා මානවිකාව මම තිට ස්වාමි වන්නෙමි අනින්දිතවූ ලෝචන ඇත්තිය, මම තිගේ ස්වාමිපුරුෂයා වන්නෙමි. තී සැනසෙව, මාගේ ප්‍රඥාව වනාහි එබඳුය, තී මාගේ

භාර්‍ය්‍යාවන්නෙහි තී සැනසෙව"යි පූර්ණක නම් යක්ෂ සේනාපතිතෙම කීයේය.

23 ඉක්බිති ඉරන්දතී නම් නාගකන්‍යාව පෙර ජාතියට අනුව ගියාවූ සිතින් ඔහුට මෙසේ කීය. "ස්වාමිය, එව, මාගේ පියාගේ සමීපයට යමු. මේ මාගේ පිය තෙමේද මේ කාරණය ඔබට කියන්නේයයි" ඉරන්දතී කීය.

24 අලංකාරයෙන් සැරසුනාවූ මනාව හැඳි වස්ත්‍ර ඇත්තාවූ පැළැඳි මල්මාලා ඇති සඳුන් කල්ක ගල්වන ලද්දාවූ ඉරන්දතී නම් නාග කන්‍යාව පූර්ණක නම් යක්ෂ සේනාපතියා අතින් අල්වාගෙණ පියවූ නා රජු සමීපයට පැමිණියේය.

25 "උතුම් නාරජ මාගේ වචනය අසව, සුදුසුවූ අයබද්දෙන් උපදනා ධනය පිළිගණුව. මම ඉරන්දතිය කැමති වෙමි. නුඹ ඈ හා මාගේ සමගිවීම කරව

26 "ඇතුන් සියයක්ද අසුන් සියයක්ද අස් වෙළඹුන් යෙදූ රථ සියයක්ද නොයෙක් රත්නවලින් සියල්ල පිරුණාවූ බඩු ගැල් සියයක්ද ඔබට දෙමි. නාරජ තුමනි, එය පිළිපදුව ඉරන්දතී නම් ඔබගේ දුව මට දෙවයි" පූර්ණකතෙම කීයේය.

27 "පින්වත් යක්ෂ සේනාපතිය යම්තාක් ඥාතිමිත්‍රයන්ද සුහෘද ජනයාද කැඳවා කියම්ද ඒ තාක් බළාපොරොත්තු වෙව. එසේ කථා නොකරණ ලද ඒ කටයුත්ත පසුතැවීම පිණිස පවතීයයි" නාරජ කීයේය.

28 ඉක්බිති ඒ වරුණ නම් නාරජතෙම බිසවගේ ගෘහයට ප්‍රවිෂ්ටව භාර්‍ය්‍යාව කැඳවා මේ වචනය කීයේය.

29 "ඒ මේ පූර්ණක නම් යක්ෂතෙම අපගේ මේ ඉරන්දතී නම් නාගකන්‍යාව ඉල්වයි. බොහෝවූ වස්තුව ලබාගෙණ මාගේ ප්‍රියවූ දුව ඔහුට දෙමුයි" කීයේය.

30 "අපගේ ඉරන්දතී නම් දුව ධනයදීමෙන් නොලැබිය හැක්කේය. වස්තුවෙන්ද නොලැබිය හැක. ඉදින් වනාහි විධුරපණ්ඩිතයාගේ හදවත දැහැමින් ලබාගෙණ මෙහි

ගෙනෙන්නේ නම්, මේ වස්තුවෙන් කුමරිය ලැබිය හැක. ඉන්මත්තෙහි අන්කිසි ධනයක් නොපතමුයි" විමලා කීවාය.

31 ඉක්බිති ඒ වරුණ නම් නාරජතෙම භවනයෙන් නික්ම පූර්ණකයා කැඳවා මේ වචනය කීයේය. "ධනයෙන්ද වස්තුවෙන්ද අපගේ ඉරන්දතිය නොලැබිය හැක.

32 "ඉදින් ඔබ පණ්ඩිතයාගේ හදවත දැහැමින් ලැබ මෙහි ගෙණෙන්නෙහි නම් මේ වස්තුවෙන් කුමරිය ලැබිය හැක. ඉන්මත්තෙහි යම්කිසි ධනයක් නොපතමියි" නාරජ කීයේය.

33 "ලෝකයෙහි සමහරු යමෙකුට පණ්ඩිතයායයි කියද්ද, නැවත අන් සමහරු ඔහුටම බාලයායයි කියත්. මෙහි මේ කාරණය විරුද්ධව කියත්. නාරජ ඔබ කවර පණ්ඩිතයෙකු කියන්නෙහි දැයි මට කියවයි" පූර්ණකතෙම කීයේය.

34 "එම්බා පූර්ණකය, ධනඤ්ජය කොරව්‍ය නම් රජුගේ විධූර නම් කටයුතු කරන්නාවූ ඇමතියෙක් ඉදින් ඔබ විසින් අසන ලද්දේද, ඒ පණ්ඩිතයා දැහැමින් ලැබ මෙහි ගෙණෙව. ඉරන්දතී නම් නාග කන්‍යාව එකල්හි ඔබට පාදපරිචාරිකා වේවායි" නාරජ කීයේය.

35 වරුණ නම් නාරජහුගේ මේ වචනයද අසා අතිශයින් සතුටුවූ පූර්ණක නම් යක්ෂතෙම හුනස්නෙන් නැගිට එහි සිටියේම "සරසන ලද ආජානීය අශ්වයෙකු මෙහිම ගෙණෙවයි" සේවක පුරුෂයෙකුට අණ කෙළේය.

36 ඒ මනෝමය අශ්වයාගේ ස්වර්ණමය කන්වෙත්. රක්ත මාණික්‍යමයවූ කුරවෙත්. රත්රණින් නිමවනලද උර සැත්මාලාව ඇත්තේය.

37 අලංකාරයෙන් සැරසුනාවූ සරසනලද හිසකේ රැවුළු ඇති පූර්ණක නම් යක්ෂතෙම දේව සංඛ්‍යාත ඉසිලිය යුත්ත උසුලන හෙයින් දේවවාහ වහ නම්වූ අශ්ව යානයට නැග අන්තරීක්ෂ නම් අහසින් ගියේය.

38 කාම වේගයෙන් ගිජුවූ ඒ පූර්ණකතෙම ඉරන්දතී නම් නාග කන්‍යාව පතමින් භූතයන්ට අධිපතිවූ යශ පිරිවර ඇත්තාවූ ඒ කුවේර නම් වෛශ්‍රවන රජු වෙතට ගොස් මෙසේ කීයේය.

39 "ස්වර්ණමයවූ නිමවනලද නගරයෙහි මන්දිරයන් භෝගවතී නමැයි වාසා නමැයි හිරඤ්ඤවතී නමැයිද, කියනු ලැබේ. භෝග මණ්ඩලයෙන් යුක්තවූ නාරජහුගේ භවනය මෙසේ නිමවන ලදී.

40 "ඔටුවන්ගේ කර මෙන් කරණ ලද්දාවූ රක්ත මාණික්‍යමයවූද මසාර ගල්ලයෙන් කරණ ලද්දාවූද, අටළු ඇත්තාහ. මේ නාග භවනයෙහි ප්‍රාසාදයෝ මාණික්‍යමය වූද සුවර්ණයෙන් කරණලද උළුවලින් වසන ලද්දාහ.

41 "අඹගස්ද එරමුදු ගස්ද දඹගස්ද රැක්අත්තනද මිදෙල්ල හා වැටකේද පියල් ගස්ද ඇසළ සහ එරබදු ගස්ද තික ගස්ද,

42 "සපුගස්ද නාගස්ද ගිරිතිල්ලද යොහොඹුද තවද මෙහි කොළොම් ගස්ද යන මේ වෘක්ෂයෝ හාත්පසින් නැමුනාහු නාරජුගේ මන්දිරය හොබවත්.

43 "ඕපපාතිකව උපන්නාවූ මහත් ඍද්ධි ඇත්තාවූ වරුණ නම් නාරජතෙම යම් තැනෙක්හි වෙසේද, මේ නාග භවනයෙහි ස්වර්ණමයවූ නිතර පිපි මල් ඇති ඉන්ද්‍රනීල මාණික්‍යමයවූ බොහෝ ඉඳිගස් ඇත්තාහ.

44 "ඔහුගේ රුවන් රැසක් බඳු ශරීර ඇති උඩට නැංගාවූ ලදරු කළුවැල් දලුවක් බඳුවූ කොසඹ පලවැනි තනපුඩු ඇති මනොඥ දර්ශන ඇත්තාවූ විමලා නම් තරුණ බිරිඳක්වේ.

45 "ඕතොමෝ ලතුදියමෙන් රතු පැහැ ඇති මනා සිවි ඇත්තීය. නිවාසස්ථානයෙහි පිපියාවූ කිණිහිරි රුකක් වැනි වේ. දිව්‍ය භවනයෙහි හැසිරෙන්නාවූ දිව්‍යප්සරාවක් බඳුය. ඝන වළාපටලයකින් නික්මුණාවූ විදුලියක් හා සමානද වූවාය.

46 "සිනා පෙරදැරි තෙපුල් ඇති ඕතොමෝ හටගත් දොළ ඇත්තී විධුර පණ්ඩිතයාගේ හදවත පතන්නීය. අධිපතිතුමනි, මම එය ඔවුන්ට ගෙණ දෙමි. එයින් සතුටුවූ ඔව්හු ඉරන්දතී නම් නාග කන්‍යාව මට දෙතියි" කීයේය.

47 "ඒ පූර්ණක නම් යක් සෙනෙවිතෙම යක්ෂයන්ට අධිපතිවූ යස පිරිවර ඇත්තාවූ කුවේර නම් වෛශ්‍රවණ රජුට

කියා අවසර ගෙණ එහිම සිටියේ "සරසනලද ආජානීය අශ්වයෙකු මෙහිම ගෙණෙවයි" සේවකයෙකුට අණ කෙළේය.

48 ඒ අසුගේ කන් ස්වර්ණමය වෙත්. කුර රක්ත මාණික්‍යමය වෙත්. උරසැත් මාලාව රත්රණින් කරණ ලද්දේය.

49 අලංකාරයෙන් සැරසුනු සරසනලද හිසකේ රැවුල් ඇති පූර්ණක නම් යක්ෂතෙම දේවවාහ වහ නම් අශ්ව යානයට නැග අන්තරීක්ෂ නම් අහසින් ගියේය.

50 හෙතෙම බොහෝවූ කෑ යුතු දෑ ඇති බොහෝ ආහාර පානද ඇති සක්දෙව් රජහුගේ මසක්කසාර නම් නගරය වැනිවූ සතුරන් විසින් ලංවිය නොහැකිවූ ඉතා රම්‍යවූ රජගහ නම් අග්‍ර රජහුගේ නගරයට ගියේය.

51 තවද ඒ නගරය මොනරුන් හා කොස්වාලිහිණි සමූහයා විසින් මනාව ඝෝෂා කරණ ලද්දේය. අන් පක්ෂීන් විසින්ද මනාව ඝෝෂා කරණලදී. නොයෙක පක්ෂි සමූහයා විසින් සේවනය කරණලදී. නොයෙක් පක්ෂීන්ගේ නාද ඇත්තාවූ මනා භූමි ප්‍රදේශවලින් යුක්තය. හිමවත් පර්වතය මෙන් මල්වලින් මනාව ගැවසී ගත්තේය.

52 ඒ පූර්ණක නම් යක්ෂතෙම මහත්වූ මාණික්‍ය රත්නයක් සොයමින් කිඳුරන්ගෙන් ගැවසී ගත්තාවූ මෙබඳුවූ වේපුල්ල නම් පර්වතයට නැංගේය. පර්වත කුට අතරෙහි ඒ මැණික දුටුයේය.

53 පැහැ විහිදෙන්නාවූ ජාතිමත්වූ කැමති සම්පත් ගෙණ දෙන්නාවූ මහත් මාණික්‍ය රත්නයක් පිරිවර මාණික්‍යවලින් බබළන්නාවූ යසස් ඇත්තාවූ අහස විදුලියක් මෙන් බබළන්නාවූ මාණික්‍යය දැක,

55 මහත් ආනුභාව ඇත්තාවූ මනෝහර නම් මාහැඟිවූ ඒ වෛඩූර්‍ය්‍ය මාණික්‍යය ගත්තේය. අලාමක වර්ණ ඇති පූර්ණකතෙම එය ගෙණ ආජානීය අසුට නැගී අන්තරීක්ෂ නම් අහසින් ගියේය.

55 ඒ පූර්ණකතෙම ඉඳිපත් නුවරට ගියේය. අසු පිටින් බැස මානවක වේශයෙන් කුරු රජුන්ගේ සභාවටද ගියේය. යක්ෂතෙම නිර්භයව සමාගමයෙහි එක්ව උන් ඒ සියක් රජදරුවන් දූ කෙළියට කැඳවීය.

56 "මෙහි රජුන්ගෙන් කවරෙක් නම් මේ උතුම් මැණික දිනාගණීද මේ උතුම් ධනයෙන් අපි කවරක්හු දිනාගන්නෙමුද? දිනන්නාහුද කවර රජක්හු මේ උතුම්වූ රත්නයෙන් දිනම්ද, කවරෙක් හෝ මේ උතුම් ධනයෙන් දිනාදැයි" මෙසේ දූ කෙළියට කැඳවීය.

57 "එම්බා මානවකය, කවර නම් රටෙක්හි තොපගේ උපන් භූමිය වේද? තොපගේ මේ කථාව කුරු රට වැස්සෙකුගේ මෙන් නොවේ. ශරීර වර්ණයෙන් අප සියල්ලන් යටපත් කරන්නෙහිය. තොපගේ නාමයද නෑයන්ද මට කියවයි" රජතෙම කීයේය.

58 "මහරජ, මම කච්චායන නම් මානවක වෙමි. නොඅඩුවූ නම් ඇත්තෙකැයි මා කැඳවත්. අඟුරට මාගේ නෑයෝද බන්ධූහුද ඇත්තාහ. දෙවයන් වහන්ස, මම දූ කෙළිය සඳහා මෙහි පැමිණියේ වෙමියි" පූර්ණකතෙම කීයේය.

59 "අක්ෂධූර්තියෙක් තා දිනමින් යම් රත්නයන් හැර ගන්නේද, කිම මානවකවූ ඔබට එබඳු රත්න ඇත්තේද, රජහුට වනාහි බොහෝවූ රත්න ඇත්තාහ. එබඳුවූ රජුගේ දිළිඳුවූ නුඹ කෙසේ නම් දූ කෙළියට කැඳවන්නෙහි දැයි" රජ තෙම ඇසීය.

60 "කැමති වස්තුව ගෙණදෙන්නාවූ මහත් මාණික්‍ය රත්නයක්වූ මාගේ මේ මනෝහර නම් මාණික්‍ය රත්නයක් ඇත්තේය. සතුරන් තවන්නාවූ මේ ආජානීය අශ්වයෙක්ද සිටියි. අක්ෂධූර්තතෙම මාගේ මේ වස්තු දෙකම දිනා හැර ගෙණ යන්නේයයි" පූර්ණකයා කීවේය.

61 "එම්බා මානවකය තොපගේ මේ එක මැණික කුමක් කරන්නේද, මේ එකම ආජානීය අශ්වයාද කුමක් කරන්නේද, රජහුගේ භාණ්ඩාගාරයෙහි බොහෝ මාණික්‍ය රත්න ඇත්තාහ. වාතයට බඳු වේගඇති බොහෝවූ ආජානීය අශ්වයෝද රජුට ඇත්තාහුයයි" රජතෙම කීයේය.

62 "දෙපා ඇත්තවුන්ට උතුම්වූ මහරජ නුඹ වහන්සේ මාගේ මේ මාණික්‍ය රත්නයද බලනු මැනව. මේ මාණික්‍ය රත්නයෙහි අලංකාරයෙන් සැරසුනාවූ ස්ත්‍රීන්ගේ ශරීරද පුරුෂයන්ගේ ශරීරද, පෙනෙත්.

63 "මේ මාණික්‍ය රත්නයෙහි මුවන්ගේ ශරීරද පක්ෂීන්ගේ ශරීරද පෙනෙත්. නාරජුන්ද ගුරුලන්ද මැණිකෙහි මැවුනු ආශ්චය්‍ය්‍යීය බලනු මැනවැයි" කීයේය.

64 "තවද හස්ති සේනාය රථසේනාය, අශ්වසේනාය ධජවලින් යුත් පාබල සේනාවද යන මේ සිව්රඟ සෙනග මැණිකෙහි මැවුනු ආශ්චය්‍ය්‍යීය බලව.

65 "ඇතරුවන්ද සේනාවෙහි සිටියවුන්ද රථවල සිටියවුන්ද, පාබල සේනාවෙහි වූවන්ද යන රැස්වූ සේනා සමූහයන් මේ මැණිකෙහි මැවුනු ආශ්චය්‍ය්‍යීය බලවයි" කීයේය

66 "වස්තුවෙන් යුක්තවූ බොහෝ ප්‍රාකාර හා තොරන් ඇති සතරමං සන්ධි ආදියෙහිවූ සිත්කළු භූමිවලින් යුක්තවූ නගරය මේ මැණිකෙහි මැවුනු ආශ්චය්‍ය්‍යීය බලව.

67 "ඉන්ද්‍රඛීලද දිය අගල්ද කණයමද අගුළු ඇති දොරවල්ද අටළුද දොරටුද මේ මැණිකෙහි මැවුනු ආශ්චය්‍ය්‍යීය බලවයි" කීයේය

68 "ඒ තොරන් අග හංසයෝද කොස්වාලිහිණද මොණරුද සක්වාලිහිණිද කබරුස්සෝද කොවිලෝද බොහෝ විසිතුරුවූ පියාපත් ඇති කොවිලෝද මොණරුද ජීවන් ජීවක පක්ෂීහුද යන බොහෝ නොයෙක් පක්ෂි සමූහ ඇත්තාහ. ඔවුන් බලාවා. නොයෙක් පක්ෂි සමූහයාගෙන් ගැවැසී ගත්තක් කොට මැණිකෙහි මැවුනු ආශ්චය්‍ය්‍යීය බලවයි" කීයේය

69 මනා ප්‍රාකාර ඇති අද්භූතවූ ලොමුඩැහැගන්නාවූ ඔසවනලද ධජ ඇති සිත්කළුවූ රුවන්වැලි අතුරණ ලද්දාවූ නගරය බලව.

70 "එහි කොටස් වශයෙන් ප්‍රමාණ කොට බෙදන ලද්දාවූ ආපන ශාලාවන්ද ගෘහයන්ද ගෘහවස්තූන්ද විනිවිද නොගිය විථීන්ද විනිවිද ගිය වීථීන්ද නුඹ වහන්සේ බලනු මැනව.

71 "එහි සුරාපාන ශාලාවන්ද සුරා සොඬුන්ද අංගානිද මුළුතැන් ගෙවල්ද වෙෂ්‍යා ස්ත්‍රීන්ද ගණිකාවන්ද යන මේ සියල්ල මාණික්‍යයෙහි නිර්මිත කරණ ලද ආශ්චර්‍ය්‍ය බලව.

72 "මාලාකාරයන්ද රජකයන්ද සුවඳ විලවුන් විකුණන්නන්ද තවද වස්ත්‍ර විකුණන්නන්ද රන්කරුවන්ද මැණික් කරුවන්ද යන සියල්ල මැණිකෙහි මැවුනු ආශ්චර්‍ය්‍ය බලනු මැනව.

73 "සූප කාරයන්ද අරක්කැමියන්ද නෘත්‍ය කරන්නවුන් හා නෘත්‍යයෙහි ගායනා කරන්නවුන්ද, අත්තල ගසන්නවුන් කල පිඹින්නන්ද යන මේ සියල්ල මැණිකෙහි මැවුනු ආශ්චර්‍ය්‍ය බලනු මැනවැයි" කීයේය.

74 "බෙරද මිහිඟු බෙරද සක්ද පනාබෙරද ගැටබෙරද ඇත්තාහ. එය බැලුව මැනව, සියලුම තූර්‍ය්‍ය විශෙෂද මේ මැණිකෙහි නිර්මිතව පෙණෙන ආකාරය බැලුව මැනව.

75 "මෙහි කුළුතාලම්ද වීණාද නැටීම් ගී කීම්ද මනා තූර්‍ය්‍යවාදනයද වේ වාදනය කිරීමෙන් ඝෝෂා කරණ ලද තූර්‍ය්‍යභාණ්ඩද මේ මැණිකෙහි නිර්මිතව තිබෙන ආකාරය බැළුව මැනව,

76 "මෙහි කරණම් පනින්නෝද මුෂ්ටි යුද්ධ කරන්නෝද ඉන්ද්‍රජාලිකයෝද නුවර හොබවන්නෝද ඇත්තාහ. ඔවුන් බැලුව මැනව. වන්දිභට්ටයන්ද කරනැවැමියන්ද මේ මැණිකෙහි මැවුනු ආශ්චර්‍ය්‍ය බැලුව මැනවැයි" කීයේය.

77 "මෙහි ස්ත්‍රී පුරුෂයන්ගෙන් ගැවසීගත්තාවූ මැසි පිට මැසි බඳින ලද භූමි ඇති නෘත්‍යස්ථානද වෙත්. එය මේ මැණිකෙහි මැවී පෙනෙන ආකාරය බැලුව මැනවයි" කීයේය.

78 "මල්ලව පොර අල්ලන නෘත්‍යස්ථානයෙහි දෙගුණ කොට අත්පොළසන් දෙන්නවුන්ද ජයගෙණ සිටියවුන්ද පැරදුනවුන්ද මේ මැණිකෙහි නිර්මිතව තිබෙන ආකාරය බැලුව මැනවයි" කීයේය.

79 "මෙහි පර්වතයෙහි පාදයන්හිවූ බොහෝවූ නොයෙක් මෘග සමූහයෝ වෙත්. ඔවුන් බැලුව මැනව, සිංහයෝද ව්‍යාඝ්‍රයෝද උඟ්‍රරෝද වලස්සුද කොක්නාවෝද කළුහිස් වලස්සුද ඇත්තාහ.

80 "කඟවේන්නුද ගවරුද මීමෝද රෝහිත මුවෝද රුරුනම් මුවෝද ඒනිමුවෝද වරාහ මෘගයෝද ගෝන්නුද මෘග සූකරයෝද මෙහි ඇත්තාහ.

81 "තවද කෙසෙල් මුවෝද බොහෝ විසිතුරු මෘගයෝද වල් බළල්ලුද සාවෝද මීමින්නෝද යන මේ නොයෙක් මෘග සමූහයාගෙන් ගැවසීගත් මේ මැණිකෙහි නිර්මිතව පෙනෙන ආකාරය බැලුව මැනවයි" කීයේය.

82 "මෙහි මනා තොටුපල ඇත්තාවූ රන්වැලි අතුරණ ලද්දාවූ ජලයෙහි මත්ස්‍ය සමූහයන් විසින් නිතර සේවනය කරණ ලද්දාවූ ගංගාවෝ ප්‍රසන්න ගලා බසිත්.

83 "තවද එහි කිඹුල්ලුද මෝරුද පැටි කිඹුල්ලුද කැස්බෝද පෙටියෝද ලුල් මස්සුද වලපොත්තෝද මුද්දුද රේ මස්සුද යන මොහු ඇත්තාහ. ඔවුන් බැළුව මැනවැයි" කීයේය.

84 "එහි නොයෙක් වෘක්ෂ සමූහයාගෙන් ගැවසීගත්තාවූ නොයෙක් පක්ෂි සමූහයාගෙන් යුක්තවූ වෛඩූර්‍ය්‍යමය පාෂාණයන්හි හැපී ශබ්ද නගන්නාවූ ගංගාවෝ වෙත්. ඔවුන් මේ මැණිකෙහි මැවීතිබෙන ආකාරය බැලුව මැනවයි" කීයේය.

85 "තවද මෙහි සතර දිග මනාව බෙදන ලද්දාවූ නොයෙක් පක්ෂි සමූහයාගෙන් ගැවසීගත්තාවූ මත්ස්‍යයන් විසින් නිතර සේවනය කරණ ලද්දාවූ පොකුණු වෙත්. ඔවුන් බැළුව මැනව.

86 "හාත්පස ජලයෙන් පිරුණාවූ සාගරය කුණ්ඩලාභරණ කොට ඇති වන රොද වලින් යුක්තවූ පෘථිවිය මේ මැණිකෙහි මැවී තිබෙන ආශ්චර්‍ය්‍යය බැලුව මැනවයි" කීයේය.

87 "පෙර දිගින් පූර්වවිදෙහයද පසු දිගින් අපරගෝයානයද උතුරුදිගින් උතුරුකුරු දිවයිනද දකුණෙන් දඹදිවද මේ මැණිකෙහි නිර්මිතවූ ආකාරය බැළුව මැනව.

88 "තවද මෙහි සතර දිශාවන් බබුළුවන්නාවූ සඳද හිරුද බැළුව මැනව. මහමෙර හාත්පස ගමන් කරන්නාවූ මොවුන් මැණිකෙහි නිර්මිතව පෙනෙන ආකාරය බැළුව මැනව.

89 "තවද මහමෙරද හිමවත ද සාගරයද මහත් සෘද්ධි ඇත්තාවූ සතරවරම් මහා රජදරුවන්ද මේ මැණිකෙහි මැවී තිබෙන අයුරු බැළුව මැනව.

90 "තවද ආරාමයන්ද වනලැහැබ්ද ගල්තලාවන්ද සිත්කළුවූ කිඳුරන්ගෙන් ගැවැසීගත්තාවූ පර්වතයන්ද මේ මැණිකෙහි මැවී පෙනෙන ආකාරය බැළුව මැනව.

91 "තවද බොරළු දමුණු වනයද චිත්‍රලතා වනයද මිශ්‍රක නම් වනයද නන්දන වනයද වෛජයන්ත ප්‍රාසාදයද මේ මැණිකෙහි මැවී පෙනෙන ආකාරය බැළුව මැනව.

92 "තවද සුධර්මානම් දිව්‍ය සභාවද තව්තිසා භවනයද පිපියාවූ පරසතු රුකද ඓරාවන නම් දිව්‍ය හස්ති රාජයාද මේ මැණිකෙහි නිර්මිතව පෙනෙන ආකාරය බැළුව මැනව.

93 "තවද මෙහි අහසින් පැනනැගි විදුලිය බඳු දිව්‍ය කන්‍යාවන් බැළුව මැනව. නන්දනොද්‍යානයෙහි හැසිරෙන දිව්‍ය ස්ත්‍රීන් මේ මැණිකෙහි නිර්මිතව පෙනෙන ආකාරය බැළුව මැනව.

94 "තවද මෙහි දිව්‍ය සුත්‍රයන් පොළඹවන්නාවූ දිව්‍ය කන්‍යාවන් බැළුව මැනව. එහි හැසිරෙනු ලබන දිව්‍ය පුත්‍රයන්ද මේ මැණිකෙහි නිර්මිතව පෙණෙන ආකාරය බැළුව මැනවයි" කීයේය.

95 "තවද එහි වෛඩූර්‍ය්‍යමය පුවරු අතුරණ ලද බබළන්නාවූ වර්ණයෙන් යුක්ත දහසකටත් වැඩි දිව්‍ය ප්‍රසාදයන් මේ මැණිකෙහි නිර්මිතව පෙනෙන ආකාරය බැළුව මැනව.

96 "තවද තවතිසා වැසි දෙවියන්ද යාම නම් දෙවියන්ද තුසිත නම් දෙවියන්ද නිම්මානරතීනම් දෙවියන්ද පර්නිම්මිතවසවර්ති නම් දෙවියන්ද මේ මැණිකෙහි නිර්මිතව පෙනෙන ආකාරය බැළුව මැනව.

97 "තවද මෙහි විශෙෂයෙන් ප්‍රසන්නවූ ජලය ඇති පවිත්‍රවූ හෙල්මැලි වලින්ද පියුම් උපුල් වලින්ද ගැවසීගත්තාවූ පොකුණු ඇත්තාහ. ඔවුන් බැළුව මැනවයි" කීයේය.

98 "තවද මේ මාණික්‍ය රත්නයෙහි සුදුඉරි දසයක්ද සිත්කළුවූ නිල්ඉරි දසයක්ද පිඟුවන් ඉරි සයක් හා පසළොසක් ද කසාවන් ඉරි තුදුසක්ද වෙත්.

99 "එහි රන්වන් ඉරි විස්සක්ද රිදී පැහැති ඉරි විස්සක්ද රතිඳු ගොච්චන්ගේ පිට පැහැ බඳු ඉරි තිසක් පමණද දක්නා ලැබෙත්.

100 "තවද මෙහි කළු ඉරි දශයක් හා සයක්ද මදටියවන් ඉරි විසි පහක්ද වෙත්. ඒ කළුවූද මදටිය වන්වූද ඉරි බඳුවද මල් වලින් හා නිළුපුල් වලින් මිශ්‍රවූවාහු විසිතුරුව පැණෙත්.

101 "දෙපා ඇත්තවුන්ට උතුම්වූ මහරජුනි, මෙසේ සියලු අංගයන්ගෙන් යුක්තවූ රශ්මි ඇත්තාවූ පැහැ විහිදෙන්නාවූ මේ මාණික්‍ය රත්නය සුන්වත් කොටස වශයෙන් බැළුව මැනවයි" කීයේය.

102 "මහරජ, සූදු ශාලාවෙහි කටයුතු නිමවන ලදී. මෙබඳු මාණික්‍ය රත්නයක් ඔබට නැත. පසැටින් ක්‍රීඩා කරණ තැනට එළඹුන මැනව. ක්‍රීඩාකරන්නාවූද අපි සැහැසිකමින් නොව දැහැමින්ම දිනන්නෙමු දිනන ලද්දේද අපට වහා ධනය දුන මැනවයි" පූර්ණකයා රජුට කීයේය.

103 "පඤ්චාල රජුද ප්‍රසිද්ධවූ ශූරසේන නම් රජුද මච්ඡ නම් රටෙහි රජු ද කේතක ජනපදවාසී රජුන් හා මදුරට රජුද යන ඒ රජවරු කෛරාටික නොවීමෙන් අපගේ මේ දක්ෂ යුද්ධය බලත්වා. මේ සභාවෙහි කිසිවෙකුට කිසිවෙක් සාක්ෂි නොකරන්නේ නොවේ හෙවත් අප්‍රමාද වචියයි" යක් සෙනෙවිතෙම ඒ රජුන් සාක්ෂිකරුවන් කෙළේය.

104 කුරුරට වැස්සන්ගේ රජ තෙමේද පූර්ණක නම් යක්ෂ තෙමේද යන අක්ෂ මදයෙන් මත්වූ ඔව්හු සූදු ශාලාවට ඇතුල්වූහ. රජතෙම සොයමින් පරාජයවන අය ගත්තේය. පූර්ණක නම් යක්ෂතෙම දිනන අය ගත්තේය.

105 ඔවුන් ඒ සුදු ශාලාවෙහි දූ කෙළියට පැමිණි කල්හි ඒ දෙදෙන දූ කෙළියහ. රජුන් සමීපයෙහිද යහළුවන්ගේ මද්ධ්‍යයෙහිද ඒ යක්ෂතෙම නරවර ශ්‍රෙෂ්ඨවූ රජහු පරදවා ජයගත්තේය. ඒ සූදුවෙහි මා විසින් දිනන ලදැයි මහත්වූ ශබ්දයෙක් වූයේය.

106 "මහරජතුමනි, ජයද පරාජයද ව්‍යායාම් කරන්නවුන්ගෙන් එක්තරා එකෙකුම වේ. ජනාධිපතිතුමනි, ඔබ වහන්සේ උතුම්වූ ධනයෙන් පිරිහුනේ වෙහි. මා විසින් දිනන ලද්දේද වේ. වහා මට දිනුම දෙවයි" පූර්ණකතෙම කීයේය.

107 "එම්බා කාත්‍යායනය, ඇත්තුද ගවයෝද අශ්වයෝද මාණික්‍ය කුණ්ඩලාභරණද යන මාගේ යම්කිසි රත්න සමූහයක් මේ පෘථිවියෙහි ඇද්ද, ධනයන්ගෙන් උතුම්වූ ඒ වස්තුව හැරගණුව. ඒ වස්තුව හැරගෙණ යම් දිශාවකින් යනු කැමැත්තෙහි නම් ඒ දිශාවෙන් යවයි" රජතෙම කීයේය.

108 "මහරජ, ඇත්තුද ගවයෝද අශ්වයෝද මාණික්‍ය කුණ්ඩලාභරණද යන මේ පොළොවෙහි ඔබගේ යම්කිසි රත්න සමූහයක් ඇද්ද ඔවුන් අතුරෙන් විධුර නම්වූ ඇමති තෙම උතුම්වේ. හෙතෙම මා විසින් දිනන ලදී. ඔහු මට දෙවයි" පූර්ණකතෙම කීයේය.

109 "එම්බා මානවකය, හෙතෙම මාගේ ආත්මයද සරණද ගතියද පිහිටද සැඟවෙන තැනද උතුම් ප්‍රතිෂ්ඨාවද වේ. හෙතෙම මාගේ වස්තුව හා සමාන කළ නොහැක්කේය. මේ විධුර පණ්ඩිතතෙම මාගේ ප්‍රාණය හා සමවේයයි" රජ තෙම කීයේය.

110 "මහරජ, මාගේද ඔබගේද විවාදය බොහෝකලක් ඇතිවන්නේය. එබැවින් ඒකාන්තයෙන්ම ඔහු වෙතටම ගොස් විචාරමු. මෙතෙමේම මේ කාරණය අපට ප්‍රකාශ කෙරේවා. හෙතෙම යමක් කියාද අප දෙදෙනාගේ කථාව එපමණ වේවායි" පූර්ණකයා කීයේය.

111 "එම්බා මානවකය, ඒකාන්තයෙන්ම නුඹ සැබවක් කියන්නෙහිය. සාහසික වචනයක්ද නොකියන්නෙහිය. ඔහු

වෙතම ගොස් විචාරමු. ඔහුගේ ප්‍රකාශයෙන් අපි දෙදෙනා සතුටු වන්නෙමුයි" රජතෙම කීයේය.

112 "කුරු රටෙහි ධර්මයෙහි පිහිටියාවූ විධුර නම් අමාත්‍යයෙක් වේයයි දෙවියෝ ප්‍රකාශ කරත්. ඒ සැබවක්ද, ඔබ රජහුගේ දාසයෙක් වෙහිද නොහොත් නෑයෙක් වෙහිද, ලෝකයෙහි විධුරය යන නාමය කවරක් වීදැයි" පූර්ණකයා ඇසීය.

113 "සමහර කෙනෙක් දාසියගේ කුසෙහි දාසයෙකුට දාව උපන් දාසයෝද වෙත්. සමහරු වස්තුවදී මිලයට ගන්නා ලද්දාහුද දාසයෝ වෙත්. සමහරු තුමූම දාස බවට පැමිණියාහුද වෙත්. සමහරු රාජ භය ආදියෙන් තමාගේ වසඟයට පැමිණියාහුද දාසයෝ වෙත්.

114 "මිනිසුන් අතර මේ දාසයෝ සතර කොටසක් වෙත් මානවකය, ඒකාන්තයෙන් මමද මේ එක්තරා දාස යෝනියකින් උපන්නෙක් වෙමි. රජහට වැඩක් හෝ වේවා. රජහට අවැඩක් හෝ වේවා. අන් තැනකටද ගොස් මම දේවයන් වහන්සේගේ දාසයා වෙමි. රජතෙම මා දිනූ ධනය වශයෙන් දැහැමින් ඔබට දෙන්නේයයි" විධුර පණ්ඩිතතෙම කීයේය.

115 "අද මාගේ මේ දෙවැනි දිනීමවේ. විචාරණ ලද්දාවූ ඇමතිතෙමේ වනාහි ප්‍රශ්නය විසඳූයේය. රාජොත්තම තෙමේ ඒකාන්තයෙන් අධර්ම ස්වභාව ඇත්තෙකි. විධුර පණ්ඩිතයා විසින් ප්‍රශ්නය මනාකොට විසඳන ලදී. කුමක්හෙයින් මට අවසරය නොදෙන්නෙහිදැයි" පූර්ණකයා කීයේය.

116 "ඉදින් හෙතෙම අපගේ ප්‍රශ්නය මම දාසයෙක් වෙමියි නෑයෙක් නොවෙමියි මෙසේ විසඳීනම්, කච්චාන නම් මානවකය, ධන අතරෙන් උතුම් ධනයවූ මොහු ගණුව. හැරගෙණද යම් දිසාවකින් කැමැත්තෙහි නම් ඒ දිශාවෙන් යවයි" රජතෙම කෝපයෙන් කීයේය.

117 "එම්බා විධුර පණ්ඩිතය, ස්වකීය ගෘහයෙහි වාසය කරන්නාවූ ගෘහස්ථයාගේ නිර්භයවූ පැවැත්ම කෙසේ වන්නේද, සිව්වැදෑරුම් සංග්‍රහය කෙසේ වන්නේද?

118 "නිදුක් බව කෙසේ වන්නේද? කෙසේ නම් මානවකතෙම සත්‍යවාදී වන්නේද? මෙලොවින් පරලොව ගොස් කෙසේ නම් ශොක නොකෙරේදැයි" රජතෙම ඇසීය.

119 ඒ ධර්ම සභාවෙහි ඥාණගතියෙන් යුක්තවූ නුසුන් වීයඞ් ඇති මහත් ප්‍රඥාව ඇති අර්ථදැකීම් ඇති සියලු ධර්මයන් දන්නා නුවණ ඇති විධුරපණ්ඩිතතෙම ඒ රජුට මෙය කීයේය.

120 "මහරජ, සාධාරණ දාරාවන් ඇත්තෙක් නොවන්නේය. මිහිරි දෙය තනිව නොවළඳන්නේය. ලෝකායත නම් විතණ්ඩ ශාස්ත්‍රය සේවනය නොකරන්නේය. මෙය ප්‍රඥාවගේ වැඩීමට හේතු නොවෙයි.

121 "සිල් ඇත්තේද වතින් යුක්තවූයේද කුශල ධර්මයන්හි ප්‍රමාද නොවූයේද විචක්ෂණවූයේද යටහත් පැවතුම් ඇත්තේද, තද මසුරු නොවූයේද සුරත භාවයෙන් යුක්තවූයේද මිහිරි වචන ඇත්තේද මෘදුවූයේද වන්නේය.

122 "මිත්‍රයන් සංග්‍රහ කරන්නේද, දානසංවිභාග කිරීම ඇත්තේද, සියලු කටයුතුවල විධාන කිරීම ඇත්තේද, හැම කල්හි ආහාරපානයෙන් මහණ බමුණන් සතුටු කරන්නේද,

123 "දහම් කැමැතිවූයේ ශ්‍රැතයට ආධාරවූයේ මහණ බමුණන්ගෙන් පිළිවිසීම ස්වභාවකොට ඇත්තෙක් වන්නේය. සිල්වතුන්ද බොහෝ උගතුන්ද සකස්කොට ඇසුරු කරන්නේය.

124 "ස්වකීය ගෘහයෙහි ගෘහවාසයෙන් වාසය කරන්නාවූ ගෘහස්ථයාගේ නිර්භයවූ පැවැත්ම මෙසේ වන්නේය. සංග්‍රහයද මෙසේ වන්නේය.

125 නිදුක් බව ඇත්තේද මෙසේම වන්නේය. මෙසේ පිළිපන්නාවූ මානවකතෙම සත්‍යවාදීද වන්නේය. මෙලොවින් පරලොවට ගොස් මෙසේ පරලොවදී ශොක නොකෙරේ යයි" විධුර පණ්ඩිතතෙම කීයේය.

126 "එව දැන් යන්නෙමු. ඔබ ස්වාමියා විසින් මට දෙන ලද්දේ වෙහි. මාගේම වැඩට එළිපදුව. මේතෙම පුරාතනයන්ගේ ස්වභාව ධර්මයවේයයි' පූර්ණකතෙම කීයේය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

127 "මානවකය, නුඹ විසින් මම දිනාගන්නා ලද්දේ වෙමියි දනිමි. මම අපගේ රජහු විසින් තොපට දෙනලද්දේ වෙමි. යම් පමණ කලකින් අපි පුත්‍රදාරාවන්ට අනුශාසනා කරමුද, එපමණවූ තුන්දවසක් කල් අපගේ ගෙහි වාසය කරමුයි" විධූර පණ්ඩිතතෙම කීයේය.

128 "ඔබ යමක් කියන්නෙහි නම් ඒ සියල්ල මට එසේ වේවා. තුන් දවසක් ඔබගේ ගෙහි වසමු. පින්වතා අද ගෘහයන්හි කටයුතු කෙරේවා යම්සේ ඔබ ගිය කල්හි පසුව අඹුදරු සමූහයා සුවපත් වන්නේද එපරිද්දෙන් පින්වතා අද අඹුදරුවන්ට අනුශාසනා කෙරේවායි" මානවකතෙම කීයේය.

129 බොහෝ සම්පත් ඇති යක්ෂතෙම මැනවයි කියා විධුර පණ්ඩිතයන් සමග ගියේය. ආර්‍ය්‍ය ශ්‍රෙෂ්ඨවූ යක්ෂතෙම ඇතුන් හා ආජානීය අසුන්ගෙන් ගැවසීගත්තාවූ ඒ අන්තඃපුරයට ඇතුල්වූයේය.

130 කොඤ්ච නම්වූද මයුර නම්වූද පියකේත නම්වූද ප්‍රාසාද තුනක් එහි වෙත්. ඒ ප්‍රාසාද අතුරෙන් ඉතා සිත්කළු ස්වභාව ඇති බොහෝවූ කෑයුතු තු දෑ ඇති බොහෝ ආහාර පාන ඇත්තාවූ ශක්‍රයාගේ ශක්‍රපුරය වැනිවූ තමන් වසන ප්‍රාසාදයට විධුරතෙම යක්ෂයා කැඳවාගෙණ ගියේය.

131 දෙව්ලොව දිව්‍යප්සරාවන් මෙන් මනාව සැරසුනාවූ ස්ත්‍රීහු ඒ ප්‍රාසාදයෙහි නටත්. ගායනා කරත්. වරින්වර කැඳවත්.

132 දහම් රක්නාවූ පණ්ඩිතතෙම යක්ෂයා ස්ත්‍රීන් හා සමගිකොට ආහාරයෙන්ද පානයෙන්ද එක්කොට හිතවැඩම කල්පනා කරමින් එකල්හි භාර්‍ය්‍යාවගේ සමීපයට ඇතුල් වූයේය.

133 සුවඳ සඳුන් දියෙන් ගල්වන ලද ජාම්බෝනද ස්වර්ණ නිෂ්කයකට බඳු ශරීර ඇති ඒ භාර්‍ය්‍යාවට "තඹවන් නෙත්‍ර ඇති පින්වතිය මෙහි එව. මාගේ වචනය අසව. මාගේ දරුවන් කැඳවවයි" කීයේය.

134 අනුජ්ජා නම් ඒ භාර්‍ය්‍යාතොමෝ ස්වාමිහුගේ වචනය අසා "නිළුපුල් මල් බඳු ඝ්‍යාම වර්ණ ඇති දෙවතාවෙනි

ආභරණවලින් සැරසුනාවූ මාගේ දරුවන් කැඳවාවයි" තඹවන් නිය ඇති මනා ඇස් ඇති යෙහෙළියට කීවාය.

135 මහබෝසත්තෙම කම්පානොවෙමින් එහි ආවාවූ ඒ දරුවන් මස්තකයෙහි සිඹ ආමන්ත්‍රණය කොට "මම මෙහි මේ මානවකයාට රජු විසින් දෙනලද්දේ වෙමියි" යන වාක්‍යය කීයේය.

136 "අද මම තමන් සතු සැපයෙන් යුක්තවූයෙම් ඉන් පසු ඔහුට යටත්වූවෙක් වෙමි. හෙතෙම මා හැරගෙණ යම් මගකින් කැමැති නම් ඒ මගින් යයි මම වනාහි තොපට අනුශාසනා කරන්ට ආයේවෙමි. කෙසේ නම් මම ආරක්ෂාවක් නොකොට යන්නෙම්ද?

137 "ඉදින් තොපගෙන් බොහෝවූ කාම සම්පත් ඇති ජනයන් පාලනය කරන්නාවූ කුරුරට වැසි රජතෙම මින් පෙර කවර නම් පැරණි දෙයක් තෙපි දනිව්ද, පළමු පියතෙම තොපට කිනම් අනුශාසනාවක් කෙළේදැයි අසන්නේ නම් මෙසේ කියව්.

138 "ඉදින් තොපට රජතෙම තෙපි සියල්ලෝ මා හා සමාන ආසන ඇත්තෝ වව් යයි කී කල්හි මේ රාජ කුලයෙහි කවර නම් මනුෂ්‍යයෙක් රජහු ඉක්මවා ඉන්නේදැයි ඒ රජුට ඇඳිලිකොට මෙසේ කියව් 'දේවයන්වහන්ස, මෙසේ නො කියනුමැනව. මෙතෙම අපගේ ප්‍රවේනි ධර්මය නොවේ. දේවයන් වහන්ස, සිංහ රාජයෙකුට නීච ජාති ඇති හිවලෙක් කෙසේ නම් සම සම අසුන් ඇත්තෙක් වන්නේදැයි' කියවයි" අවවාද කෙළේය.

139 ඉක්බිති නොසැලගවුණු චිත්ත සංකල්පනා ඇති ඒ විධුර පණ්ඩිතතෙම මිත්‍රයන්ටද, ඇමැතියන්ටද, නෑයන්ටද, සුහද ජනයන්ටද මෙය කීයේය.

140 "පින්වතුනි, මෙහි එව්. යම්සේ රජකුලයට පැමිණියාවූ පුරුෂතෙම යශසට පැමිණේද එබඳුවූ මා කියන්නාවූ රාජ පරිචය්‍යාව මාස කීපයෙහි හිඳ අසව්යයි" කීයේය.

141 "රජ ගෙදරට පැමිණියාවූ අප්‍රකට ගුණ ඇත්තේ යශස නොම ලබයි. ශූර නොවූ තැනැත්තේද නොලබයි. දුෂ්ප්‍රාඥ

තැනැත්තේද නොලබයි. ප්‍රමාදවූ තැනැත්තේද, කිසි කලෙක යශස නොලබයි.

142 "යම් කලෙක මේ සේවකයාගේ ශීලයද හෙවත් ආචාර සම්පත්තියද, ඥාණශක්තියද, පිරිසිදුකමද දැනගණීද, එකල්හි රජතෙම ඔහු කෙරේ විශ්වාස කෙරේ. සැඟවියයුතු රහසද ඔහුට නොසඟවායයි" කීයේය.

143 "දැඩිකොට ගන්නාලද සමවූ දඬු ඇති මනාව දරණ ලද තරාදිය උස් පහත් නොවන්නාක් මෙන් අණ ලද්දාවූ රාජ සේවකතෙම කම්පා නොවන්නේ නම් (ii) හෙතෙම රජ ගෙදර විසීමට සුදුසු වන්නේය.

144 "දැඩිව ගන්නා ලද සමවූ දඬු ඇති මනාව දැරූ තරාදිය මෙන් රාජසේවකතෙම සියලු රාජකෘත්‍යයන් කරන්නේවේද (මෙහි 143 (ii) යොදන්න.)

145 "නුවණැත්තාවූ යම් රාජසේවකයෙක් දාවල් හෝ ඉදින් රාත්‍රි හෝ රාජ කෘත්‍යයන්හි අණ දෙනලද්දේ කම්පා නොවන්නේද (ii) හෙතෙම රාජකුලයෙහි වාසයෙන් වාසය කරන්නේය.

146 "නුවණැති සේවකතෙම ඉදින් දාවල් හෝ රාත්‍රියෙහි හෝ රාජකෘත්‍යයන්හි, සියල්ල සම්පූර්ණකරන්නේවේද (මෙහි 143 (ii) යොදන්න.)

147 "රජුට මනාව කරණලද, මනාව පිළියෙල කළාවූ යම් මාර්ගයක් වන්නේද, කියන ලද්දාවූද හෙතෙම ඒ මාර්ගයෙන් නොයන්නේද, (මෙහි 145 (ii) යොදන්න.)

148 "යමෙක් රජුගේ කාමභොගයන්ට සමානව කිසි කලෙකත් කාම සම්පත් අනුභව නොකරන්නේද, සැමතන්හි රජුට පසුවම යන්නේද (මෙහි 145 (ii) යොදන්න.)

149 "රජුට සමානව වස්ත්‍රයක් නොහඳින්නේද මල් මාලාවක් නොදරන්නේද, විලෙපනයක් නොගල්වන්නේද, ආකාරයක් හෝ ශබ්දකිරීමක් හෝ රජුට සමානව නොකරන්නේද, අන්‍යවූම ආකාරයක් කරන්නේද (මෙහි 145 (ii) යොදන්න.)

150 "රජතෙමේ ඇමැතියන් විසින්ද, ස්ත්‍රීන් විසින්ද, පිරිවරණලදුව ක්‍රීඩා කරන්නේද, එකල්හි නුවණැති ඇමැතිතෙම රාජ ස්ත්‍රීන් කෙරෙහි විශ්වාස බවක් නොකරන්නේය.

151 "උඩගු නොවූ නොසැරසෙනසුළුවූ මේරූ නුවණ ඇති සංවරවූ ඉන්ද්‍රියයන් ඇති මනාව තැන්පත්වූ සිත් ඇති හෙතෙම රජුවෙත පැමිණ වාසය කරන්නේයයි" කීයේය.

152 "යමෙක් ඒ රජහුගේ ස්ත්‍රීන් සමග ක්‍රීඩා නොකරන්නේද, රහසිගතව මන්ත්‍රණය නොකරන්නේද, ඒ රජහුගේ භාණ්ඩාගාරයෙන් ධනය සොරකම්කොට නොගන්නේද, (මෙහි 143 (ii) යොදන්න.)

153 "යමෙක් නිදන්නවුන්ගෙන් බොහෝකොට නිදමියි නොහගින්නේද, මත්වීම පිණිස සුරාපානය නොකරන්නේද, ඒ රජහුගේ අභය ස්ථානයෙහි මුවන් නො නසන්නේද, (මෙහි 143 (ii) යොදන්න.)

154-161 (මේ ඡේදවල අගට 143 (ii) යෙදිය යුතුයි.)

154 "යමෙක් ඒ රජහුගේ පුටුවකට නොනගින්නේද, ඇඳකට නොනගින්නේද, බඳවෙළුවකට නොනගින්නේද, ඇතෙකුටද, රථයකටද මම සම්මත කරණ ලද්දේ වෙමියි, නොනගින්නේද,

155 "යම් නුවණැත්තාවූ සේවකයෙක් තෙම රජුට ඉතා දුර තන්හි නොවන්නේද, ඉතා ලංව නොසිටින්නේද, ඒ රජුගේ කටයුතු බලමින් ස්වකීය ස්වාමිහුට පෙනෙමින් සිටින්නේද,

156 "රජතෙම ඒකාන්තයෙන් යහළුවෙක් නොවේ රජතෙමේ තමා හා සමානවූවෙක් නොවේ. වී නණ්ඩුවකින් ගටනාලද ඇසක් මෙන් රජවරු වහා කිපෙත්. රජ විසින් පුදනලද දේ යයි හගිමින් නුවණැති පණ්ඩිතවූ සේවක පුරුෂතෙම පිරිස් මැදට පැමිණියාවූ රජුට පරුෂවූ කථා නොකරන්නේයයි" කීයේය.

157 "යමෙක් ලබනලද දොරටු ඇත්තේ දොරටුව ලබන්නේද, රජුන් කෙරෙහි නොම විශ්වාස කරන්නේද, ගින්නක් ලග මෙන් අප්‍රමාදයෙන් යුක්තව සිටින්නේද,

158 "රජතෙම ස්වකීය පුත්‍රයාට හෝ ස්වකීය සහෝදරයාට හෝ ගම්වලින් හෝ නියම්ගම්වලින් හෝ රටෙහිවූ ජනපදවලින් හෝ යමක් දෙමියි, සේවකයන් සමග කථාකෙරේද, එකල්හි සේවකතෙම නිශ්ශබ්දව මධ්‍යස්ථ වන්නේද, එහි ගුණයක් හෝ අගුණයක් හෝ නොකියන්නේද,

159 "ඇතරුවන්ද, අසරුවන්ද, රථවල නගින්නවුන්ද පාබල සේනාවන්ද යන ඔවුන්ගේ කර්මාන්ත හා චරිත බලා රජතෙම වැටුප් වැඩිකරයි. යම් සේවකයෙක් ඔවුන්ගේ ලාභයට අන්තරා නොකරන්නේද,

160 "ප්‍රාඥවූ යම් සේවකයෙක් දුන්නක් මෙන් අඩුවූ උදර ඇත්තේද, හුණ ගොබයක් මෙන් කම්පා වීමෙන් යුක්තද, රජුට විරුද්ධව නොපවත්නේද,

161 "යමෙක් දුන්න මෙන් අඩුවූ උදර ඇත්තෙක් වන්නේද, මත්ස්‍යයෙකු මෙන් මදවූ කථා ඇති බැවින් දිව නැත්තෙක් වන්නේද, මදවූ අනුභව කිරීම ඇති මේරූ නුවණ ඇති ශූරවූ

162 "යමෙක් තේජස් පිරිහීම දකිමින් නැවත නැවත ස්ත්‍රියකරා නොයන්නේද, එසේ යන්නාවූ ක්ෂීණවූ නුවණ ඇති පුරුෂතෙම කෘෂයටද ස්වාසයටද කායද රථයටද, දුර්වල බවටද පැමිණේ.

163 "දරුවෙනි, රජුන් සමීපයෙහි පමණ ඉක්මවා කථා නොකරන්නේය. හැමකල්හි නිශ්ශබ්ද නොවන්නේය. සුදුසු කාලයෙහි නොවිසිරුනාවූ ප්‍රමාණවත්වූ වචනය කියන්නේය.

164 "නොකිපෙනසුළුවූ අනුන් නොගටන්නාවූ සත්‍යය සියුම්වූ ප්‍රිය ශූන්‍ය නොවූ වචන ඇත්තෙක් වන්නේද, යමෙක් නිරර්ථක කථා නොකියන්නේද, (143 (ii) යොදන්න.)

165-177 (ඡෙද අගට 143 (ii) යෙදිය යුතුයි)

165 "යමෙක් මව්පියන් පෝෂණය කරන්නෙක් වන්නේද, කුල දෙටුවන් පුදන්නෙක් වන්නේද, ලජ්ජා භය දෙකින් යුක්තවූවෙක් වන්නේද,

166 "යම් සේවකයෙක් හික්මුණාවූ ශිල්ප දන්නාවූ දමනයවූ සම්පාදනයවූ ආත්ම ඇති නිශ්චලවූ අධික මාන රහිතවූ අප්‍රමාදවූ පවිත්‍රවූ උපස්ථාන කිරීමෙහි දක්ෂයෙක්වේද,

167 "යමෙක් යටත් පැවතුම් ඇත්තේ වෘද්ධයන් කෙරෙහි ආදර ගෞරව සහිතවූයේ සුරතවූයේ සැපවූ යහපත් වචන ඇත්තේවේද,

168 "යමෙක් අන් රජුන් විසින් සහනය කරන්ට එවන ලද ජනයා දුරින්ම දුරුකරන්නේද, තම ස්වාමියාම බලන්නේද අන් රජෙකුට ලං නොවන්නේද,

169 "යමෙක් සිල්වත්වූ බොහෝ ඇසූ පිරූ තැන් ඇති ශ්‍රමණයන්ද බ්‍රාහ්මණයන්ද සකස්කොට ඇසුරු කරන්නේද,

170 "යමෙක් සිල්වත්වූ බොහෝ උගත් ශ්‍රමණයන්ද බ්‍රාහ්මණයන්ද සකස්කොට අනුව වාසය කරන්නේද,

171 "යමෙක් සිල්වත්වූ බොහෝ දැන උගත්කම් ඇති ශ්‍රමණයන්ද බ්‍රාහ්මණයන්ද ආහාරපාන දීමෙන් සතුටු කරන්නේද,

172 "යමෙක් සිල්වත්වූ බහුශ්‍රැතවූ ශ්‍රමණයන්ද බ්‍රාහ්මණයන්ද යන පණ්ඩිතයන් වෙත පැමිණ තමහට අභිවෘද්ධිය පතමින් සේවනය කරන්නෙද,

173 "යමෙක් මහණ බමුණන්ට පෙර දුන් දානය නොපිරිහෙළන්නේද, දෙන්නාවූ කල්හි ආවාවූ යාචකයන්ට දෙන කිසිවකුත් නොවලක්වන්නේද,

174 "විමසන නුවණින් යුක්තවූ විකල නොවූ බුද්ධි ඇති නොයෙක් සංවිධාන කොටස්වල දක්ෂවූ සුදුසු කල් දන්නාවූ කටයුතු කිරීමෙහි කාලය දන්නාවූද,

175 "යමෙක් තමන්ගේ කටයුතුවල උත්සාහවත්වූ අප්‍රමාදවූ දක්ෂවූ මනාකොට කරණලද කර්මාන්ත ඇත්තෙක් වේද,

176 "තවද යමෙක් කලවිටද ශාලාවටටද ගව ශාලටද කුඹුරටද නිතර යන්නෙකුත් වන්නේද මනිනලද ධාන්‍යය

කොටුවල තැන්පත් කරන්නේද මනිනලදුවම ගෘහයෙහි පිසවන්නේද,

177 "තවද ශීලයන්හි නොපිහිටියාවූ ස්වකීය පුත්‍රයෙකු හෝ සහෝදරයෙකු හෝ තනතුරෙහි නොතබන්නේද, අඥානවූ ඔහු වනාහි අංග සමානයෝ නොවෙත්. පරලොව ගියහු යම්සේද ඔව්හුද එසේමැයි. ඇවිත් ඉඳගත්තාවූ ඔවුන්ට වස්ත්‍ර කඩක්ද ආහාරයක්ද පමණක් දෙවන්නේද,

178 "ශීලයන්හි මනාව පිහිටියාවූද දාසයන්ද කම්කරුවන්ද පණිවිඩකාරයන්ද දක්ෂවූ වීර්‍ය්‍යයෙන් යුක්තවූවන්ම අධිපති බැව්හි තබවන්නේයයි" කීයේය

179-181 (මේ ඡෙද අගට 143 (ii) යෙදිය යුතුයි.)

179 "තවද යමෙක් සිල් ඇත්තේද, ලෝභී නොවූයේද රජුට ඇළුම් ඇත්තෙකුත් වන්නේද ඉදිරියෙහිද රහසිගතවද ඒ රජුට හිතවූ

180 "තවද යමෙක් රජුගේ කැමැත්ත දන්නෙක් වන්නේද, රජුගේ සිතට වසඟවූවෙක් වන්නේද, අවිරුද්ධවූ පැවතුම් ඇත්තෙක් වන්නේද,

181 "තවද ඇඟ උලන්නේද නාවන්නේද පාද සෝදවන්නේද යටිකුරුවූ හිස ඇතිව කරන්නේද ගසන ලදුවත් නොකිපෙන්නේද,

182 "තවද පුරුෂතෙම කලසක් දැකද ඇඳිලි කරන්නේය. කව්ඩෙකු හෝ දැක පැදකුණු කරන්නේය. සියලු කැමති දෙය දෙන්නාවූ ප්‍රාඥවූ උතුම්වූ රජු දැක කියනුම කවරේද?

183 "යමෙක් ශයනාසනද වස්ත්‍රාභරණද යානවාහනද, වාසය කරණ ගෙවල්ද දෙන්නේ නම් සත්වයන්ට මේඝයක් මෙන් සම්පත්වලින් වස්ස වන්නේ නම්, හේ රජතෙම නමස්කාර කටයුත්තේය.

184 "පින්වත්නි, මාවිසින් කියනලද මෝතොමෝ රාජවසති නම්වේ එහි පවත්නාවූ මනුෂ්‍යාතෙම යම්සේ රජහු සතුටු කෙරේද

එසේම හෙතෙම ස්වාමිවරුන්ගෙන් සත්කාර ලබායයි" විධුර පණ්ඩිතතෙම මෙසේ අනුශාසනා කෙළේය.

185 "විධුර පණ්ඩිතතෙම නෑ සමූහයාට මෙසේ අනුශාසනාකොට මිත්‍රයන් විසින් පිරිවරණ ලද්දේ රජු වෙතට පැමිණියේය.

186 "හිස් කරණකොටගෙණ පා වැඳ ඒ රජහු පැදකුණුද කොට විධුර පණ්ඩිතතෙම ඇඳිලි බැඳගෙණ රජුට මෙය කීයේය.

187 "මහරජ, මේ මානවකතෙම ඔහුගේ අදහස පරිදි කරණු කැමැත්තේ මා ගෙණ යයි. නෑයන්ට හිතවූවක් කියන්නෙමි එය ඇසුව මැනව.

188 "මාගේ දරුවන්ද බැලුව මැනව. මාගේ ගෘහයෙහි අන්‍යවූ යම් ධනයකුත් ඇද්ද, එයද බැලුව මැනව. මා ගිය කල්හි නෑ සමූහයා පසුව යම්සේ නොපිරිහෙන්නේද, එසේ කරණු මැනව.

189 "යම්සේ පෘථිවියෙන්ම පැකුලුනේ පෘථිවිය ආධාර කොටම සිටීද මාගේ මේ පැකිලීමද මෙසේය. මාගේ මේ වරද දකිමියි" විධුරතෙම කීයේය.

190 "එම්බා විධුර පණ්ඩිතය, තොපට යන්ට නොහැකිය මට මෙසේ සිතක් වෙයි. මේ මානවකයා මෙහි කැඳවා ගසා මරා මෙහිම සිටුව. මෙසේ මට කැමති වේ. මහත් ප්‍රඥා ඇති උත්තමය, ඔබ නොයවයි" රජතෙම කීයේය.

191 "මහරජතුමනි, අධර්මයන්හි සිත නොපිහිටවනු මැනව. අර්ථයෙහිද ධර්මයෙහිද යෙදුනෙක් වෙව. යම් කර්මයක් කොට පසුව නරකයට පැමිණෙන්නේද, එබඳු අනායචූ අකුශල කර්මයට නින්දාවේවා.

192 "මේ තෙම ස්වභාව ධර්මයෙක් නොවේමය. නැවත මෙය කටයුත්තක්ද නොවෙයි. මහරජ, ස්වාමියා වනාහි දාසයාට අධිපතිවේ. නසන්ටද දවන්ටද තවද රක්ෂා කරන්ටද ලබයි. මාගේ මානවකයා කෙරෙහි ක්‍රෝධයකුත් නැත. මමද යමියි" පණ්ඩිතතෙම කීයේය.

**193** ඉක්බිති ඒ විධුර පණ්ඩිතතෙම වැඩිමහළු පුත්‍රයා වැළඳගෙණ හිතෙහි ශොකය දුරුකොට කඳුළු පිරුණු නෙත් වලින් යුක්තව මහත්වූ ප්‍රාසාදයට ඇතුල්වූයේයි.

**194** "විධුර පණ්ඩිතයාගේ ප්‍රාසාදයෙහි දරුවෝද භාර්‍ය්‍යාවෝද මහසුලඟකින් මඩනාලද එහා මෙහා පෙරළුනාවූ සල් වනයෙක්හි සල්ගස් මෙන් වැටී ශයනය කරත්.

**195** "විධුර පඬිහුගේ ගෘහයෙහි ස්ත්‍රීන් දහසක්ද දාසීන් සත්සියයක්ද හිස අත් බැඳගෙණ ඇඬුවාහුය.

**196** "විධුර පඬිහුගේ ගෘහයෙහි අන්තඃපුර ස්ත්‍රීහුද කුමාරයෝද වෛශ්‍යයෝද බ්‍රාහ්මණයෝද හිස අත් බැඳගෙණ හැඬුවාහුය.

**197** "විධුර පඬිහුගේ ගෘහයෙහි ඇතරුවෝද අසරුවෝද රථිකයෝද පාබලසේනාවෝද හිස අත් බැඳගෙණ හැඬුවාහුය.

**198** "විධුර පඬිහුගේ නිවාසස්ථානයෙහි රැස්වූ දනව් වැස්සෝද රැස්වූ නියම්ගම් වැස්සෝද හිස අත් බැඳගෙණ හැඬුවාහුය.

**199** "ගෘහයෙහි ස්ත්‍රීන් දහසක්ද දාසීන් සත් සියයක්ද (ii) කුමක්හෙයින් අප හැර යන්නෙහිදැයි" හිස අත් බැඳ ගෙණ හැඬුවාහුය.

**200** "අන්තඃපුර වාසීහුද කුමරුවෝද වෛශ්‍යයෝද බ්‍රාහ්මණයෝද (199 (ii) යොදන්න)

**201** ඇතරුවෝද අසරුවෝද රථිකයෝද පාබල හමුදාවෝද (199 (ii) යොදන්න)

**202** රැස්වූ දනව් වැස්සෝද රැස්වූ නියම්ගම් වැස්සෝද (199 (ii) යොදන්න)

**203** ඉක්බිති පණ්ඩිතතෙම ගෘහයන්හි කටයුතු නිමවා මිත්‍රාමාත්‍යයන්ද දාසයන්ද අඹුදරුවන්ද නෑයන්ද යන ස්වකීය ජනයාට අනුශාසනාකොට.

204 කර්මාන්ත සංවිධානකොට ඒ ඒ තන්හි නිධන් කොට තබනලද්දාවූද ණය වශයෙන් දෙන ලද්දාවූද ගෘහයෙහිවූ ධනය කියා පූර්ණකයාට මෙය කීයේය.

205 "ඔබ මාගේ ගෘහයෙහි තුන් දවසක් විසූයෙහිය. මා විසින් ගෘහයන්හි කටයුතුද කරණ ලදහ. මා විසින් අඹු දරුවෝද අනුශාසනා කරණ ලදහ. කච්චායනය, දැන් ඔබගේ අදහස් පරිදි කරමුයි" විධුරතෙම කීයේය.

206 "ඇමතිතුමනි, ඉදින් වනාහි ඔබ විසින් දරුවෝද භාර්‍ය්‍යාවෝද අනුව ජීවත් වන්නෝද අනුශාසනා කරණ ලද්දාහුද එහෙනම් දැන් ඉක්මන් කොට එව. ඉදිරියෙහි මේ මාර්ගයද දීර්ඝවේමැයි.

207 "බිය නැතුවම මේ ආජානීය අසුගේ වලිගය අල්වා ගණුව. මේ ඔබගේ මිනිස්ලොව අන්තිම දර්ශනය වේයයි" පූර්ණක කීයේය.

208 "කයින් වචනයෙන් සිතින් යම්බඳුවූ මා නපුරු කොට ගෙණ ලද්දක් නැත්තේද ඒ මම කුමකට භය වන්නෙම්දැයි" විධුරතෙම ඇසීය.

209 ඒ අශ්වරාජතෙම විධුර පඬිහු උසුලමින් අන්තරීක්ෂ නම්වූ අහසින් ගමන් කෙළේය. අතුවලද ගල්වලද නොහැපෙමින් කාලාගිරි නම් පර්වතයට වහා පැමිණියේය.

210 ඉක්බිති භාර්‍ය්‍යාවූ ස්ත්‍රීන් දහසද දාසීන් සත්සියයද යක්ෂයෙක් බමුණු වෙසින් අවුත් විධුර පඬිහු හැරගෙණ ගියේයයි හිස අත් බැඳගෙණ හැඬුවාහුය.

211 රැස්වූ දනව්වැස්සෝද රැස්වූ නියම්ගම් වැස්සෝද යක්ෂයෙක් බමුණු වෙසින් අවුත් විධුර පඬිහු හැර ගෙණ ගියේයයි හිස අත් බැඳගෙණ හැඬූහ.

212 ගෘහයෙහි ස්ත්‍රීන් දහසක්ද දාසීන් සත් සියයද (ii) ඒ පණ්ඩිතතෙම කොහි ගියේදැයි හිස අත් බැඳගෙණ හැඬූහ.

213 රැස්වූ දනව්වැස්සෝද රැස්වූ නියම්ගම් වැස්සෝද (211 (ii) යෙදිය යුතුයි)

214 ඉදින් ඒ පණ්ඩිතතෙම සත් රැයකින් නොඑන්නේ නම් අපි සියල්ලෝ ගින්නට ප්‍රවිෂ්ට වන්නෙමු. අපගේ ජීවත්වීමෙන් ප්‍රයෝජනයක් නැත්තේයයි” සියල්ලෝම කීහ.

215 “ඒ විධුරතෙමේ පණ්ඩිතයෙක්ද විමසන නුවණින් යුක්ත බැවින් ව්‍යක්තයෙක්ද කාරණා කාරණා දක්වා කියන්ට සමර්ථ බැවින් විභාවීද ස්ථානෝචිත නුවණින් යුක්ත බැවින් විචක්ෂණයෙක්ද වන්නේය. එබැවින් බිය නොවව්. වහා තමන් මිදෙන්නේය. එසේ මිදී නැවත මෙහි එන්නේයයි” රජතෙම කීයේය.

216 හෙතෙම එහි ගොස් සිතන්නේ උස්පහත්වූ බොහෝ සිතිවිලි උපන්නාහු වෙත්. ‘මොහුගේ ජීවත්වීමෙන් කිසිදු වැඩක් නැත්තේය. මෙහිදීම මොහු මරා හදවත ගෙණ යන්නෙමියි” පූර්ණකයා සිතුයේය.

217 “ඒ කාතියානතෙම එහි ගොස් පර්වත අතර ඇතුළට ඇතුල්ව ප්‍රදූෂ්‍යවූ සිත් ඇත්තේ අසංවරවූ භූමිප්‍රදෙශයෙහි විධුර පඬිහු හිස යටිකුරුකොට අල්වා ගත්තේය.

218 “මහත් භය ඇත්තාවූ ලොමුඩැහැගන්නාවූ යා නොහැකිවූ නරකය වැනි ප්‍රපාතයෙහි එල්බෙන්නාවූ කුරු රට වැස්සන්ගේ උතුම්වූ ඒ ඇමතිතෙම නිර්භයව පූර්ණක නම් යක්ෂයාට මෙසේ කීයේය.

219 “මානවකය, නුඹ රූපයෙන් දෙවියෙකු බඳුවෙහිය. එහෙත් අනාර්‍ය්‍ය ස්වභාව ඇත්තෙහිය. සංයමයක් නැත්තේ සංයම ඇත්තෙකු බඳුවෙහිය. රෞද්‍රවූ ඉතා අහිතකම් කරන්නෙහිය. තොපගේ සිතෙහිද ස්වල්ප තරම්වත් කුසලයක් නැත්තේය.

220 “යම්හෙයකින් මා ප්‍රපාතයෙහි හෙලා මරන්ට කැමැත්තෙහිද, එහෙයින් මාගේ මරණයෙන් තොපට කවර ප්‍රයෝජනයක්ද, අද තොපගේ මේ කාරණය අමනුෂ්‍යයෙකුගේ වැනි වේ. ඔබ කවර දේවතාවෙක් වෙහිදැයි” මට කියවයි කීයේය.

221 "ඉදින් ඔබ විසින් පූර්ණක නම් යක්ෂයෙක් අසන ලද්දේද, හෙතෙම වනාහි කුවේර නම් රජුගේ ඇමතියෙක් වේ. මහත්වූ පවිත්‍රවූ වර්ණයෙන් හා බලයෙන් යුක්තවූ භූමිය දරන්නාවූ වරුණ නම් නාගරාජයෙක් වේ.

222 "මම ඒ නාරජහුගේ අනුජාත දුව කැමති වෙමි. ඕතොමෝ ඉරන්දතී නම් නාගකන්‍යාව වේ. පණ්ඩිතය, ශොභන මධ්‍ය ප්‍රදෙශ ඇති ඒ ප්‍රියාව හේතුකොටගෙණ ඔබට වධ පිණිස සිත පහළ කෙරෙමියි" පූර්ණකතෙම කීයේය.

223 "එම්බා යක්ෂය, නුඹ මෙසේ මුළාවූවෙක් නොවෙව. බොහෝවූ ලෝවැස්සෝ වරදවා ගැණීමෙන් නැසුනාහුය. ශොභන මධ්‍ය ප්‍රදෙශ ඇත්තාවූ තාගේ ප්‍රියාවට මා මැරීමෙන් කවර කටයුත්තක් වේද, එබැවින් ඒ සියල්ල අසමුයි" විධුර තෙම කීයේය.

224 "මහත් ආනුභාව ඇත්තාවූ මහත්වූ නාරජහුගේ දුව කැමැත්තේ මම නෑයන්ට බැලමෙහෙ කරන්නෙක්වෙමි. යම්හෙයකින් මා පහසුවෙන් කාමයෙන් පොළඹවනු හැකියයි දැනගත්තාහුද, එහෙයින් මයිල්තෙම ඇය ඉල්වන්නාවූ මට මෙසේ කීය.

225 "ඉදින් ඔබ පණ්ඩිතයාගේ හදවත දැහැමින් ලැබ මෙහි ගෙනෙන්නෙහි නම්, යහපත් ශරීර ඇති මනා නෙත් යුවලක් ඇති ඉතා විස්මයට කරුණුවූ සඳුන් ගල්වන ලද ශරීර ඇති ඉරන්දතී නම් දුව තට දෙන්නෙමු. මේ සතුටු පඬුරෙන් කුමරිය ලැබිය හැක. මෙයින් අන්‍යවූ ධනයක් මත්තෙහි නොකැමැත්තෙමුයි" කීහ.

226 "එම්බා පණ්ඩිතය, මෙසේ මම මුළාවූයේ නොවෙමි. ඇසුව මැනව. මා විසින් නපුරුකොට ගන්නා ලද කිසිවකුත් නැත්තේය. දැහැමින් ලබන ලද තොපගේ හෘදයවස්තුවෙන් නාගයෝ මට ඉරන්දතී නම් නාග කන්‍යාව දෙති

227 "එහෙයින් මම තොපට වධකිරීම පිණිස යෙදුනෙමි. මෙසේ මට තොපගේ මරණයෙන් ප්‍රයෝජනයෙක්වේ. මෙහිම

ඔබ ප්‍රපාතයෙහි හෙළා මරා ඒ හෘදයවස්තුව ගෙණ යන්නෙමියි” පූර්ණක කීයේය.

228 “එම්බා කාතියානය, ඉදින් තොපට මාගේ හෘදය වස්තුවෙන් කටයුත්තක් ඇත්තේ නම් මා වහා ගොඩගනුව මේ යම්කිසි සාධුනර ධර්මනම්වූ ධර්ම කෙනෙක් ඇද්ද, ඒ සියලුම ධර්මයන් අද තොපට ප්‍රකාශකොට කියමියි.” පණ්ඩිත තෙම කීයේය.

229 ඒ පූර්ණකතෙම කුරුරට වැස්සන්ගේ ශ්‍රෙෂ්ඨවූ පණ්ඩිතයන් වහා පර්වත මුදුනෙහි තබා ලබන ලද ආස්වාස ඇතිව උන්නහු බලා අලාමකවූ ප්‍රඥා ඇති පඬිහු විචාළේය.

230 “පඬිතුමනි, මා විසින් ඔබ ප්‍රපාතයෙන් ගොඩගන්නා ලද්දේ වෙහිය. අද මට ඔබගේ හෘදයෙන්ද කටයුත්තක් ඇත්තේය. යම්කිසි මේ සාධු නර ධර්ම කෙනෙක් වෙද්ද, ඒ සියල්ලන්ම අද මට ප්‍රකාශකොට කියවයි” පූර්ණක කීයේය.

231 “එම්බා පූර්ණකය, තොප විසින් මම ප්‍රපාතයෙන් ගොඩගන්නා ලද්දේ වෙමි. ඉදින් මාගේ හෘදයෙන් තොපට කටයුත්තක් ඇත්තේද යම්කිසි මේ සාධුනර ධර්ම කෙනෙක් ඇද්ද, ඒ සියලුම ධර්මයන් අද තොපට ප්‍රකටකොට කියමියි” පණ්ඩිතතෙම කීයේය.

232 “එම්බා මානවකය, තෙත්වූ අත්ලද නොදවව, උපකාර කළවුන්ට ප්‍රත්‍යුපකාර කරව, මිත්‍රයන් කෙරෙහි කිසි කලෙකත් ද්‍රොහ කරන්නෙක්ද නොවෙව, අසත්පුරුෂ ස්වභාව ඇත්තියන්ගේ වසඟයටද නොපැමිණෙවයි” පණ්ඩිත තෙම කීයේය.

233 “එම්බා පණ්ඩිතය, හෙතෙම කෙසේ නම් උපකාර කළවුන්ට ප්‍රත්‍යුපකාර කරන්නේද තෙත්වූ අත දවන්නේද අසත්පුරුෂ ස්වභාව ඇත්තී කවර තැනැත්තියක්ද, මිත්‍රයන්ට ද්‍රොහ කරන්නේ කවරෙක්ද, විචාරණ ලද්දේ මට මේ කාරණය කියවයි” පූර්ණකතෙම කීයේය.

234 "යමෙක් මිත්‍ර සන්ථව නොකළාවූද නුදුටු විරූද පුද්ගලයෙකු ආසනයකින් පමණවත් පවරන්නේද, ඒ පූර්වොපකාරීවූ පුද්ගලයාට පුරුෂතෙම වැඩක්ම කරන්නේද උපකාර කළවුන්ට ප්‍රත්‍යුපකාර කරන්නෙකැයි ඔහුට පණ්ඩිතයෝම කියත්

235 "යමෙකුගේ ගෘහයෙහි එක රැයකුත් වසන්නේද යම් තැනෙක්හි පුරුෂතෙම ආහාරපාන ලබන්නේද, ඔහුට සිතිනුත් පව්ටු සිතක් නොසිතන්නේය. මිත්‍ර ද්‍රොහතෙම තමන්ගේ තෙත්වූ වළඳන අතම දවන්නේය.

236 "යම් ගසක්හුගේ සෙවෙනෙහි හිඳින්නේ හෝ වේද, සයනය කරන්නේ හෝ වේද, ඒ වෘක්ෂයාගේ අත්ත නොබිඳින්නේය. මිත්‍රද්‍රෝහිකම වනාහි ලාමකවේ.

237 "වස්තුවෙන් සම්පූර්ණවූද මේ පොළොව පුරුෂතෙම සම්මත කරණලද ස්ත්‍රියකට දෙන්නේද, ඕතොමෝ මොහොතක් ලැබ ඒ පුරුෂයාද ඉක්මවා සිතන්නේය එබැවින් එබඳු අසද්ධර්මයෙන් යුක්තවූ ස්ත්‍රීන්ගේ වසඟයට නොයන්නේය.

238 "මෙසේ වනාහි ගියහු අනුව යන්නේවේ. නැවත මෙසේ තෙත්වූද අත්ල දවන්නේය. අසද්ධර්මයෙන් යුක්ත තැනැත්තීද ඕතොමෝය. මිත්‍රද්‍රොහී කරන්නේද ‍‍හෙතෙම වේ. ඒ නුඹද මේ ධර්මයන්ගෙන් යුක්තවූ වෙක් වෙම්, අකුශල ධර්මය දුරුකරවයි" පණ්ඩිතතෙම කීයේය.

239 "උතුම් ප්‍රඥාවන්තය, මම ඔබගේ ගෘහයෙහි තුන් දවසක් විසුයෙමි. ආහාරයෙන්ද පානයෙන්ද උපස්ථාන කරණ ලද්දේ වෙමි. මාගේ මිත්‍රයා වෙහිය. එහෙයින් මම තොප මුදා හරිමි. ඒකාන්තයෙන් ස්වකීය ගෘහයට යව.

240 "නාග කුලයාගේ කටයුත්තද පිරිහේවා. නාග කන්‍යාවගෙන් මට ප්‍රයෝජන නැත්තක්ද වේවා ප්‍රඥාවන්තය, ඒ නුඹ ස්වකීයවූම සුභාසිතයෙන් අද මා විසින් වධයෙන් මුදන ලද්දේ වෙහියයි" පූර්ණකතෙම කීයේය.

241 "එම්බා යක්ෂය, එසේවීනම් නුඹ මාද එහිගෙණ යව, ඔබගේ මයිලනුවන් පිළිබඳවූ ඒ කටයුත්ත මා කෙරෙහි කරව,

අපිදු නුදුටු විරූ නාරජහුගේ විමානයද ඒ නාරජහුද දක්නෙමුයි" පණ්ඩිතතෙම කීයේය.

242 "ඉදින් මිනිසාට යමක් අහිත පිණිස වන්නේද, ප්‍රඥා ඇත්තේ එය දැකීමට සුදුසු නොවේ. උත්තමවූ ප්‍රාඥය එසේ කල්හි ඔබ කවර කරුණකින් සතුරන් වසන තැනට යන්ට කැමැත්තෙහි දැයි" පූර්ණකතෙම ඇසීය.

243 "එම්බා දිව්‍යරාජය, ඒකාන්තයෙන් මමද මේ දනිමි. නුවණැත්තේ එය දැකීමට සුදුසු නොවේ. මා විසින් කොතැනකදීත් කරණ ලද පාප කර්මයකුත් නැත්තේය. එහෙයින් මම මරණ පැමිණීමට සැක නොවන්නෙමියි" පණ්ඩිතතෙම කීය.

244 "එසේවීනම් පඬිතුමනි, මා සමග එව, යම් තැනෙක්හි වෛශ්‍රවණ නම් රජතෙම නලිනී නම් රාජධානියෙහි මෙන් නෘත්‍ය ගීතවලින් යුක්තව නාරජතෙම හිඳීද, අසමානවූ ආනුභාව ඇති ඒ ස්ථානය බලව,

245 "ඒ නාරජුගේ විමානය රෑ දාවල් දෙක්හි නිතර සමූහව ක්‍රීඩා කරණ ලද නාගකන්‍යාවන් විසින් හැසිරෙන ලදී. බොහෝ මල්දම් ඇත්තාවූ බොහෝ මල්වලින් ගැවසුනාවූ ඒ විමානය අහස විදුලියක් මෙන් බබළයි.

246 "ආහාරයෙන්ද පානයෙන්ද යුක්තවූ සොභාව ඇති නෘත්‍යවලින්ද ගීතවලින්ද වාදනවලින්ද යුක්තවූ වස්ත්‍රවලින් හා පළඳනා වලින්ද සැරසුනාවූ නාග කන්‍යාවන් ගෙන් පිරුණාවූ ඒ විමාණය ඉතා සෝභමාන වේයයි" පූර්ණකතෙම කීයේය

247 "ඒ පූර්ණක නම් යක්ෂතෙම කුරුරට වැස්සන්ගේ උතුම් ඇමතියාවූ පණ්ඩිතයා තමහට පසු අස්නෙහි හිඳුවීය. හෙතෙම අලාමක ප්‍රඥා ඇති විධුර පඬිහු හැරගෙණ නා රජහුගේ භවනයට පැමිණ වීය.

248 "අසමානවූ ආනුභාව ඇති ඒ ස්ථානයට පැමිණ පණ්ඩිතතෙම පූර්ණකයාගේ පිටුපසින් සිටියේය. සමගිය අපේක්ෂා කරන්නාවූ නාරජතෙම පළමුකොටම බෑනා සමග කථා කෙළේය.

249 "නුඹ පණ්ඩිතයාගේ යම් හෘදයවස්තුවක් සොයමින් මිනිස්ලොවට ගියේද, කිම, ඒ මනදොළ සමෘද්ධවීමෙන් අලාමකවූ ප්‍රඥා ඇති මේ පණ්ඩිතයා හැරගෙණ මෙහි පැමිණියේදැයි" නාරජතෙම ඇසීය.

250 "ඔබ යමක්හු කැමැත්තෙහිද, ඒ මේ පණ්ඩිත තෙමේ මෙහි ආයේය. ධර්මය රක්නාවූ මෙතෙම මා විසින් දැහැමින් ලබන ලදී. ඉදිරියෙහි කථාකරන්නාවූ ඔහු බලනු මැනව, ඒකාන්තයෙන් සත්පුරුෂයන් හා එක්වීම සැපවේයයි" පූර්ණකතෙම කීයේය.

251 "ඉක්බිති පණ්ඩිතය, මනුෂ්‍යවූ නුදුටුවිරූ නාග භවනය දැක විෂ්මයට පැමිණ මරණ භයින් බියපත්ව නොවඳින්නේද, මේ කාරණය ප්‍රඥාවන්තයින්ගේ මෙන් නොවන්නේයයි" නාරජතෙම කීයේය.

252 "නාගරාජය, මම විෂ්මයට පැමිණියේ නොවෙමි. මරණ භයින් බියපත් නොවූයෙමි. වධයට සුදුසුවූවෙක් නොවඳින්නේය. වධයට සුදුසුවූවහුට හෝ නොවඳින්නේය.

253 "මනුෂ්‍යතෙම යමෙකු නසන්ට කැමති වන්නේද, කෙසේ නම් ඔහුට වඳින්නේද, කෙසේනම් ඔහු ලවා වන්දවා ගන්නේද, ඒකාන්තයෙන් ඒ කර්මය සම්පාදනය නොවේයයි" පණ්ඩිතතෙම කීයේය.

254 "පණ්ඩිතය, ඔබ යම්සේ කියන්නෙහිද, මෙය මෙසේය. සත්‍යයක් කියන්නේය. වධයට සුදුසුවූවෙක් නොවඳින්නේය. වධයට සුදුසුවූවහුට හෝ නොවඳින්නේය. වධයට සුදුසුවූවහුට හෝ නොවඳින්නේය.

255 "මනුෂ්‍යතෙම යමෙකු නසන්ට කැමතිවන්නේද හෙතෙම කෙසේ නම් වඳින්නේද, කෙසේ නම් ඔහු ලවා වන්දවා ගන්නේද, ඒකාන්තයෙන් ඒ කටයුත්ත සම්පාදනය නොවේයයි" නාරජද කීයේය.

256 "නාගරාජය, බොහෝ කලක් නොපවත්වන්නාවූ ඔබගේ මේ විමානයද නාග ඍද්ධියද නාග තේජසද කායික බලයද චෛතසික වීර්‍ය්‍යයද නාලොව ඉපදීමද බොහෝකල්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

පවතින්නක් මෙන් සිතා පාප කර්ම නොකරව. මේ විමානය ඔබ විසින් කෙසේ ලබන ලද්දේද යන මේ කාරණය මම ඔබ ගෙන් විචාරමි.

**257** "නාගරාජය, ඔබ විසින් මේ විමානය නිකරුනේ ලබන ලද්දක්ද, නොහොත් ඍතු පෙරලීමෙන් හටගත්තක්ද, එසේ නැතහොත් තමා විසින් කරණ ලද්දක්ද, නොහොත් දෙවියන් විසින් දෙනලද්දක්ද, යම් පරිද්දෙකින්ම ඔබ විසින් මේ විමානය ලබනලද්දේද එපරිද්දෙන්ම මේ කාරණය මට කියවයි" බෝධිසත්වතෙම කීයේය.

**258** "පණ්ඩිතය, මේ විමානය මා විසින් කරුණක් නැතිව ලබනලද්දක් නොවේ. ඍතු පෙරලීමෙන් හටගත්තකුත් නොවේ. තමා විසින් කරණලද්දකුත් නොවේ. දෙවියන් විසින් දෙන ලද්දකුත් නොවේ. මා විසින් කරණලද ලාමක නොවූ ස්වකීයවූ පුණ්‍ය කර්මවලින් මේ විමානය ලබන ලද්දේ යයි" නාරජ කීයේය.

**259** "නාගරාජය, පෙර භවයෙහි ඔබගේ කිනම් ව්‍රත සමාදානයක්ද කවරනම් බ්‍රහ්මචය්‍ය‍ීාවක්ද, මනාකොට පුරුදු කරණලද කවර කර්මයක්හුගේ මේ විපාකයෙක්ද, නාග ඍද්ධියද නාග තේජසද කායික බලයද චෛතසික වීය්‍ය‍ීයද නා ලොව ඉපදීමද මේ මහත්වූ විමානයද ඔබ විසින් කෙසේ ලබනලදදැයි' ඇසීය.

**260** "පණ්ඩිතය, ගිය දවස මිනිස්ලොව මමද මාගේ භාය්‍ය‍ීාවද යන අපි දෙදෙන ශ්‍රද්ධා ඇත්තාවූ දානපතිවීමු. එකල්හි මාගේ ගෙදර පැන් මඩුවක් මෙන් විය. අප විසින් මහණ බමුණෝද සතුටු කරණ ලද්දාහ.

**261** "මල්ද සුවඳද විලවුන්ද පහන් උපකරණද සයනාශනද ආවාස ගෘහද හඳනා පිළිද යහන්ද ආහාරපානද යන මේ දාන වස්තූන් එහිදී සකස්කොට දුනිමු.

**262** "පණ්ඩිතය, ඒ මාගේ ව්‍රත සමාදානයවේ. ඒ වනාහි මාගේ බ්‍රහ්මචය්‍ය‍ීාවදවේ. මනාව පුරුදු කරණලද ඒ කුශල කර්මයාගේ මේ විපාකයවේ. එනම් නාග ඍද්ධියද නාග

තේජසද, කාය බලයද චෛතසික වීර්‍ය්‍යයද නාලොව ඉපදීමද මාගේ මේ මහත්වූ විමානයද වේයයි" නාරජතෙම කීයේය.

**263** "ඉදින් ඔබ විසින් මෙසේ මේ විමානය ලබනලද්දේ නම් පුණ්‍ය කර්මයන්ගේ ඵල විපාක දන්නෙහිය. යම්සේ ඔබ නැවත මේ විමානයෙහි වාසය කරන්නෙහිද, එහෙයින්ම අප්‍රමාදව කුශල ධර්මයෙහි හැසිරෙවයි" මහසත්තෙම කීයේය.

**264** "පණ්ඩිතය, යම් කෙනෙකුන්ට ආහාරපාන දෙමුද, එබඳු මහණ බමුණෝ මේ නාලොව නැත්තාහ. යම්සේ අපි නැවත මේ විමානයෙහි වාසය කරමුද, එසේ මේ කාරණය විචාරණ ලද්දේ මට කියවයි" නාරජ කීයේය.

**265** "නාග රාජය, මෙහි උපන්නාවූ ඔබගේ පුත්‍රවූද භාර්‍ය්‍යාවූද අනුව ජීවත්වන්නාවූද නාගයෝ වනාහී ඇත්තාහ. ඔවුන් කෙරෙහි ඔබ වචනයෙන්ද කටයුතුවලින්ද නිතර ද්වෙෂ නොකරන්නෙක්ම වෙව.

**266** "නාගරාජය, නුඹ මෙසේ වචනයෙන්ද කර්මයෙන්ද මෛත්‍රී නම්වූ චිත්තයාගේ සංසිඳීම රකිමින් දිවි ඇතිතාක් මේ විමානයෙහි සිට මෙයින් චුතව මත්තෙහිවූ දෙව්ලොවට පැමිණෙන්නෙහියයි" මහසත්තෙම කීයේය.

**267** "පණ්ඩිතය, යමෙකුට ඔබ ඇමති වීද, ඒ රාජ ශ්‍රෙෂ්ඨතෙම ඔබගෙන් වෙන්ව ඒකාන්තයෙන්ම ශෝක කෙරෙයි දුකට පැමිණියාවූද, දැඩි ගිලන්වූද පුරුෂතෙමේ ඔබ හා එක්ව සැප ලබන්නේයයි" නාරජතෙම කීයේය.

**268** "නාගරාජය, ඒකාන්තයෙන් මනාව පුරුදු කරණ ලද උතුම්වූ අර්ථයෙන් යුක්තවූ සත්පුරුෂයන්ගේ ස්වභාව ධර්මයක් කියන්නෙහිය. මෙබඳු විපත් පැමිණි කල්හි මා වැනි ප්‍රඥාවන්තයන්ගේ වෙනස පෙනේයයි" පණ්ඩිතතෙම කීයේය.

**269** "පණ්ඩිතය, මේ පූර්ණකතෙම ඔබ නොමිළයේම ලබාගත්තේද, නොහොත් දූ කෙළියෙහි පසැටින් ක්‍රීඩාකොට මෙතෙම ඔබ දිනාගත්තේද, මෙතෙම පණ්ඩිතයා දැහැමින් ලබනලදැයි කියයි. ඔබ කෙසේනම් මොහුගේ අතට පැමිණියේ දැයි" නාරජ ඇසීය.

270 "එහි මාගේ අධිපතියාවූ යම් රජෙක්වීද, මෙතෙම දූ කෙළියෙහි පසැටින් ක්‍රීඩාකොට ඔහු පැරදවීය. පැරදුනාවූ ඒ රජතෙම මොහුට මා දුන්නේය. එහෙයින් සැහැසි කමක් නැතිව දැහැමින් ලබන ලද්දෙමි, කීයේයයි" මහසත්තෙම කීයේය.

271 "සතුටුවූ ඔදවැඩි සිත් ඇත්තාවූ මහත්වූ නාරජ තෙම පණ්ඩිතයාගේ සුභාසිතයන් අසා, අලාමකවූ ප්‍රඥා ඇති ඔහු අත අල්වාගෙණ එකල්හි භාර්‍ය්‍යාව සමීපයට ගියේය.

272 "සොඳුරු විමලාවෙනි, යම් කරුණකින් ඔබ පඩුවන්වූයෙහිද, යම් කරුණකින් ආහාරය රුචි නොකෙරේද, මෙබඳු ගුණ වර්ණනා ඇත්තෙක් කොතැනකත් මා විසින් නොදක්නාලදී. ඒ මේ අඳුරු දුරු කරන්නාවූ විධුර පණ්ඩිතයාවේ.

273 "ඔබට යමෙකුගේ හෘදය වස්තුවෙන් ප්‍රයෝජන ඇත්තේද, මේ එළිය කරන්නාවූ පණ්ඩිතතෙම ආයේය. ඔහුගේ කථාව අසව, නැවත මොහුගේ දර්ශනය නම් දුර්ලභ වේයයි" නාරජ කීයේය.

274 "විමලා නම් නාග මානවිකාතොමෝ මහත්වූ ප්‍රඥා ඇත්තී ඔහු දැක දසැඟිලි එකතුකොට ඇඳලි බැඳ හටගත් සොම්නස් ඇත්තී සතුටු සිතින් කුරුවැස්සන්ගේ උතුම් ඇමතිවූ පණ්ඩිතයන්ට මෙසේ කීයේය.

275-295 (මේ ඡෙද 250-269 ඡෙද මෙන් වෙත් "නා රජ" වෙනුවට "නාග මානවිකායයි" යෙදිය යුතුයි.)

296 "වරුණ නම් නා රජතෙම යම්බඳුවූම ප්‍රශ්න පඬිහු ගෙන් ඇසීද, නාග කන්‍යාතොමෝද එබඳුවූ ප්‍රශ්න පඬිහුගෙන් ඇසීය.

297 "පණ්ඩිතතෙම විචාරණලද්දේ යම්සේම වරුණ නම් නාරජහු සතුටු කෙළේද, විචාරණලද පණ්ඩිතතෙම එපරිද්දෙන්ම නාග කන්‍යාවද සතුටු කෙළේය.

298 "පණ්ඩිතතෙම මහත්වූ නාරජුද නාග කන්‍යාවද යන ඔවුන් දෙදෙන සතුටු සිත් ඇත්තවුන්යයි දැන තැති ගැන්මක් නැත්තේ නිර්භයවූයේ ලොමු ඩැහැ ගැණීමක් නැතුව වරුණ නම් නාරජුට මෙසේ කීයේය.

299 "එම්බා නාරජ මිත්‍රද්‍රෝහි කර්මයක් කරමියි බිය නොවෙව. මේ මම මෙහි වෙමි. යමකින් ඔබට ප්‍රයෝජන ඇත්තේද, ඒ මේ ශරීරයයි හෘදයවස්තුවෙන් හෝ මාංශයෙන් හෝ යම් කටයුත්තක් කෙරේනම් ඔබගේ අදහස් පරිදි මම එය තෙමේම කරන්නෙමියි" මහසත්තෙම කීයේය.

300 "ප්‍රඥාතොමෝ ඒකාන්තයෙන් පණ්ඩිතයන්ගේ හෘදයවේ. ඒ අපි ඔබගේ ප්‍රඥාවෙන් ඉතා සතුටුවෙමු. දැන් පූර්ණකතෙමේද භාර්‍ය්‍යාව ලබයි. හෙතෙම අදම ඔබ කුරුරට වැසියන් වෙතට පමුණුවාවායි" නා රජ කීයේය.

301 ඉරන්දතී නම් නාග කන්‍යාව ලැබ සතුටුවූ ඔදවැඩි සිත් ඇත්තාවූ ඒ පූර්ණකතෙම හටගත් ප්‍රීති ඇත්තේ සතුටු සිතින් කුරුරට වැස්සන්ගේ ඇමති ශ්‍රෙෂ්ඨයාට මෙසේ කීයේය.

302 "පණ්ඩිතය, ඔබ මා භාර්‍ය්‍යාව හා සමගි කෙළේය. මමද ඔබට කටයුත්තක් කරමි. ඔබට මේ මාණික්‍ය රත්නයද දෙමි. අදම ඔබ ඉඳිපත් නුවරට පමුණුවමියි" කීයේය.

303 "පූර්ණකය, මේ ඔබගේ භාර්‍ය්‍යාව සමග ප්‍රිය සංවාස නැමති මෛත්‍රිය නොපිරිහේවා. සතුටම ධනය කොට ඇත්තේ මනා සිත් ඇතිව ප්‍රීතියෙන් යුක්තව වෙසේවා. මාණික්‍යය දී මාද ඉඳිපත් නුවරට පමුණුවවයි" පණ්ඩිත තෙම කීයේය.

304 ඒ පූර්ණක නම් යක් සෙනෙවිතෙම කුරුරට ඇමතිතුමා ඉදිරියෙහිවූ අස්නෙහි ඉඳුවිය. හෙතෙම අලාමකවූ ප්‍රඥා ඇති විධුර ඇමති හැරගෙණ ඉඳිපත් නුවරට පැමිණවීය.

305 යම්සේ මිනිසාගේ සිත වහා ගමන් කරන්නේද ඊටත් වඩා ඉක්මණට මේ මනෝමය සෛන්ධවයාගේ ගමන වූයේය. ඒ පූර්ණකතෙම කුරුරට ඇමතිතුමා ඉඳිපත් නුවරට පැමිණවීය.

306 "පඬිතුමනි, මේ ඉඳිපත් නුවර පෙනේ. සිත්කළුවූ අඹ උයන්ද කොටස් වශයෙන් පෙනෙත්. මමද බිරිඳ හා සමගිවූයෙමි. ඔබද ස්වකීය නිවාස්සථානයට පැමිණියේ වෙහියයි" පූර්ණකතෙම කීයේය

307 ඒ පූර්ණකතෙම කුරුරට ඇමතිතුමා ධර්ම සභා මධ්‍යයෙහි බස්වා අලාමක වර්ණ ඇත්තාවූ හෙතෙම ආජානීය යාට නැග අන්තරීක්ෂ නම් අහසින් ගියේය.

308 රජතෙම ඒ පඬිහු දැක අතිශයින් ප්‍රීතිමත් වූයේ නැගිට අත්වලින් වැළඳගෙණ කම්පාවක් නැතුව ධර්ම සභා මධ්‍යයෙහිවූ සරසනලද ධර්මාසනයෙහි තමන්ට අභිමුඛකොට හිඳුවීය.

309 "පණ්ඩිතය, රියැදුරෙක් සරසනලද රථය පමුණුවන්නාක් මෙන් ඔබ අපගේ හිතවූ කටයුතුවල යොදවන්නා වෙහිය. කුරුරට වැස්සෝ ඔබ දැක ඒ දර්ශනයෙන් සතුටු වෙත්. විචාරණලද්දේ මේ කරුණ මට කියව. කෙසේනම් ඒ මානවකයා වෙතින් ඔබගේ මිදීම වීදැයි" රජතෙම ඇසීය.

310 "මහරජ, යමෙකුට මානවකයා යයි කීයේද, නරවීරශ්‍රෙෂ්ඨය, හෙතෙම මිනිසෙක් නොවේ. ඉදින් ඔබ විසින් පූර්ණක නම් යක්ෂයෙක් අසන ලද්දේද, හෙතෙම වනාහි කුවේර නම් රජුගේ ඇමතියෙක්වේ.

311 "භූමින්ධරනම් නාග භවනයෙහි වසන්නාවූ මහත්වූ පවිත්‍රවූ වර්ණයෙන් හා බලයෙන් යුක්තවූ වරුණ නම් නා රජෙක්වේ. ඔහුගේ අනුජාත ධීතෘව හෙතෙම කැමතිවිය. ඒ නාග කන්‍යාතොමෝ ඉරන්දතී නම් වූවාය.

312 "මනා මධ්‍ය ප්‍රදේශ ඇති ඒ ප්‍රියාව හේතුකොට ගෙණ හෙතෙම මා මරණු පිණිස උත්සාහ කෙළේය. හෙතෙමේද භාර්‍ය්‍යාව සමග එක්වූයේය. මමද නාරජ විසින් අනුදන්නා ලද්දේවෙමි. මා විසින් මේ මැණිකද ලබන ලද්දේයයි" පණ්ඩිතතෙම මැණික රජුට දෙමින් කීයේය

313 "මාගේ රාජ ගෘහද්වාරයෙහි වනාහි හටගත්තාවූ වෘක්ෂයක් මා විසින් සිහිනෙන් දක්නාලදී. ඒ වෘක්ෂය තෙම ප්‍රඥාමය නළ ඇත්තේය. ඒ වෘක්ෂයාගේ අතු ශීලමය වූහ. වැඩෙහිද ස්වභාව ධර්මයෙහිද, පිහිටියාවූ ඒ ප්‍රඥාමය රුක පස් ගෝරස නමැති ඵල ඇත්තේය. ඇතුන්ගෙන්ද අසුන්ගෙන්ද ගැවසුනේය.

314 "මහජනයා නෘත්‍ය ගීත තූර්‍ය්‍යවාදන පවත්වන කල්හි එක් පුරුෂයෙක් මේ ගස කපාගෙණ ගියේය. ඒ මේ ප්‍රඥාමය වෘක්ෂය තෙම අප සමීපයට නැවත ආයේය. මේ වෘක්ෂයට තෙපි පූජා සත්කාර කරව්.

315 "පින්වත් ඇමතිවරුණි, යම්කිසි කෙනෙක් මාගේ උපකාරයෙන් සතුටට පැමිණියාහුද, අද ඒ සියල්ලෝම සතුට පහළ කෙරෙත්වා. පඬුරු මහත්කොට මේ වෘක්ෂයට පූජා සත්කාර කරව්.

316 "මාගේ රාජ්‍යයෙහි බැඳ සිර කරණලද යම්කිසි සත්ව කෙනෙක් ඇද්ද, ඒ සියල්ලෝම බැම්මෙන් මුදත්වා. යම් පරිද්දකින්ම මේ පණ්ඩිතතෙම බැම්මෙන් මිදුනේද, එපරිද්දෙන්ම ඒ මේ සත්වයෝද බන්ධනයෙන් මුදනු ලබත්වා.

317 "මේ මාසය මුළුල්ලෙහි සී සාන නගුල් ගොඩගෙණ තැන්පත් කෙරෙත්වා. බ්‍රාහ්මණයෝ මාංශ රශයෙන් යුත් බත අනුභව කෙරෙත්වා. මත්පැන් පානය කරන්නෝ පානාගාරයෙහි සිට පිරී වැගීරෙන්නාවූ සැල්වලින් මද්‍යපානය කෙරෙත්වා.

318 මහමග සමීපයෙහි සිටියාවූ වෙශ්‍යා ස්ත්‍රීහු නිතර පුරුෂයන් කැඳවත්වා. යම්සේ ඔවුනොවුන්ට නොවෙහෙසන්නාහුද, එසේ රටෙහි දැඩිකොට ආරක්ෂාවද විධාන කෙරෙත්වා. මෙසේ මේ වෘක්ෂයට පූජා සත්කාර කරවියයි" රජතෙම කීයේය.

319 අන්තඃපුර ස්ත්‍රීහුද කුමරුවෝද වෛශ්‍යයෝද බ්‍රාහ්මණයෝද පණ්ඩිතයාට බොහෝවූ ආහාරද පාන වර්ගද පැමිණවූහ.

320 ඇතරුවෝද අසරුවෝද රථිකයෝද පාබල සේනාවෙහිවූවෝද පඬිහට බොහෝවූ ආහාරද පානවර්ගද පැමිණවූහ.

321 "රැස්වූ දනව් වැස්සෝද රැස්වූ නියම්ගම් වැස්සෝද බොහෝවූ ආහාරද පානවර්ගද පඬිතුමාට පැමිණවූහ.

322 "පඬිහු ආකල්හි දැක බොහෝදෙනා ප්‍රසන්න වූයේය. පඬිහු නැවත පැමිණි කල්හි පිළිහිස සිසෑරිම පැවැත්තේයයි' වදාළේය.

**545 උම්මග්ග ජාතකය:-** 1 මාංශ ප්‍රශ්නය, ගොන් ප්‍රශ්නය, ගණ්ඨි ප්‍රශ්නය, සූත්‍ර ප්‍රශ්නය, පුත්‍ර ප්‍රශ්නය, කාලගෝල ප්‍රශ්නය, රථ ප්‍රශ්නය යන සතද දණ්ඩ ප්‍රශ්නය, ශීර්ෂ ප්‍රශ්නය, අහි ප්‍රශ්නය, කුක්කුට ප්‍රශ්නය, මණි ප්‍රශ්නය, විජායන ප්‍රශ්නය, ඕදන ප්‍රශ්නය, වාළුක ප්‍රශ්නය, තඩාක ප්‍රශ්නය, උද්‍යාන ප්‍රශ්නය, ගද්‍රභ ප්‍රශ්නය, මණි ප්‍රශ්නය යන මේ දොළොසදැයි මෙහි එකුන් විස්සක් (19) ප්‍රශ්නයෝ වෙත්.

**සූත්‍ර ප්‍රශ්නය:-** මෙහි සර්වසංහාරක නම් ගන්ධයෙක් නැත්තේය. පිරිසිදුවූ පුවගු මල් සුවඳ හමයි මේ ධූර්ති ස්ත්‍රීතොමෝ බොරු කියන්නීය. මහළු ස්ත්‍රී ඇත්ත කියයි" කීයේය.

**ගද්‍රභ ප්‍රශ්නය:-** "රාජෝත්තමය, ඉදින් ඔබ සියලු තන්හි පුත්‍රයාට වඩා පියා උතුම්යයි මෙසේ හඟින්නෙහි නම්, ඔබගේ අශ්වතරයාට වඩා මේ කොටළුතෙම උතුම් වන්නේය. කුමක් හෙයින්දයත්. ගද්‍රභතෙම අශ්වතරයාගේ පියා වේද, එහෙයිනැයි" කීයේය

**කකණ්ටක ප්‍රශ්නය:-** 1 "පෙර මේ කටුසුතෙම තොරණ අග සිට හිස උස් නොකෙරෙයි. එම්බා මහෞෂධය, මේ කටුසුතෙම කවර කාරණයකින් මෙසේ තදබවට පැමිණියේද කියා දෙනුවයි" වේදේහ රජතෙම කීයේය.

2 "මේ කටුසුතෙම නොලදවිරූ අඩමස්සක් වටිනා රත්රන් ලද බැවින් මියුළුනුවරට අධිපතිවූ වේදේහ නම් රජහු ඉක්මවා හඟීයයි" පණ්ඩිතතෙම කීයේය

**සිරි කාලකන්නි ප්‍රශ්නය:-** 1 "එම්බා මහෞෂධය, ස්ත්‍රී තොමෝ රූ ඇත්තියක් වන්නීය. ඕතොමෝ ආචාරයෙන් යුක්තද වන්නීය. යම් පුරුෂයෙක් එබඳු ස්ත්‍රිය නොකැමැති වන්නේයයි අදහන්නෙහිදැයි" රජතෙම ඇසීය.

2 "මහරජ, පුරුෂතෙම පිංමද එකෙක් වන්නේ නම් ශ්‍රී තොමෝද කාලකණ්ණිවූවාද, කිසිකලෙකත් සමාන නොවෙත්. එබැවින් අදහම්යි" පණ්ඩිතතෙම කීයේය.

**මෙණ්ඩක ප්‍රශ්නය:-** 1 "මේ ලෝකයෙහි යම් කෙනෙකුන්ගේ කිසිකලෙකත් සත් පියවරක් පමණවත් ගියාවූ මිත්‍රකමක්

නුවූවිරූද සතුරුවූ දෙදෙනෙක් යහළු වූවාහු මිත්‍රකමින් එකකුව හැසිරෙත්. ඊට හේතු කවරේදැයි" රජ තෙම පඬිවරුන්ගෙන් ඇසීය.

2 "ඉදින් අද පෙරබත් කාලයෙහි තෙපි මට මේ ප්‍රශ්නය විසඳාකියන්ට නොහැකිවන්නාහු නම්, තෙපි සියල්ල රටින් පිටුවහල් කරන්නෙමි. දුෂ්ප්‍රාඥ ස්වභාව ඇත්තවුන්ගෙන් මට වැඩෙක් නැත්තේමයයිද" රජතෙම කීයේය.

3 "මහරජ, මහජන රැස්වීම් ඇති තන්හි දැඩිවූ ජනයා ගේ කෝලාහල ඇතිවූ කල්හි විසිර ගියාවූ සිත් ඇති නොයෙක් දේ ගැන සිතන්නාවූ අපි මේ ප්‍රශ්නය විසඳා කියන්ට නොහැකිවෙමු.

4 "මහරජ, මේ පණ්ඩිතයෝ තනි තනිව රහසිගතව එකඟ සිත් ඇත්තෝ කාරණය නිරවශෙෂ වශයෙන් සිතා ඉතා විවේක තැනක හිඳ කල්පනාකොට ඉක්බිති මේ කාරණය කියත්යයි" සේනක පණ්ඩිත තෙම කීයේය.

5 "උසස් ඇමති පුත්‍රයන්ටද, රාජ පුත්‍රයන්ටද එළුමස ප්‍රිය මනාප වේ. ඔව්හු ශුනකයාගේ මස අනුභව නොකරත්. එසේ ඇතිකල්හි එළුවාගේ බල්ලා හා යහළුකම වන්නේයයි" සේනකතෙම කීයේය.

6 "මහරජ, අසුපිට ඇතිරීම් සුවය හේතුකොට ගෙණ එළුවාගේ සම ගසාගනිත්. ඔව්හු ශුනඛයාගේ හම නො අතුරත්. එසේ ඇතිකල්හි එළුවාගේ ශුනකයා හා යහළුකම වන්නේයයි" පුක්කුසතෙම කීයේය.

7 "එළුවා වනාහි ඇඹරීගිය අං ඇත්තෙක් වේ. ශුනකයාගේ අං නැත. එළුවා තණ කන්නේද බල්ලා මස් බුදින්නෙක්දවේ. එසේ ඇතිකල්හි එළුවාගේ බල්ලා හා මිත්‍රකම වන්නේයි" කාවින්දතෙම කීයේය.

8 "එළුවා තණ කන්නෙක්ද කොළ කන්නෙක්දවේ. බල්ලා තණ කන්නෙක් නොවේ. කොළ ද නොකයි. බල්ලා සාවාද බළලාද කෑමට අල්ලාගන්නේය. එසේ ඇතිකල්හි එළුවාගේ බල්ලා හා මිත්‍රකම් වන්නේයයි" දේවින්දතෙම කීයේය.

9 "අර්ධවූ අෂ්ටපාදයක් හෙවත් සතර පයක් ඇති නිය අටක් හෙවත් කුර අටක් ඇති මේ එළුවා නොපෙනී සතර

පාදයක් ඇති මේ ශුනකයාට මස් ගෙණඑයි. මේ ශුනක තෙම එකී එළුවාට තණකොළ ගෙණ එයි.

10 "ප්‍රාසාද මතුමහලට ගියාවූ විදෙශාධිපතිවූ රජතෙම වනාහි බළලාගේද, එළුවාගේද ඔවුනොවුන්ගේ ආහාරය පිළිබඳවූ ඒ මේ ගණුදෙනුව ප්‍රත්‍යක්ෂකොට දැක්කේයයි" මහෞෂධ පණ්ඩිතතෙම කීයේය.

11 "ප්‍රාඥවූ යම්කෙනෙක් ගැඹුරුබවට ගියාවූ සියුම්වූ අර්ථය සුභාෂිතයෙන් දැන කියද්ද, යම්බඳුවූ මාගේ රාජ කුලයෙහි මෙබඳු පණ්ඩිතයෝ වෙද්ද, ඒකාන්තයෙන් මෙය මට මහත් ලාභයකියි" රජතෙම කීයේය.

12 "එක එක අස් වෙළඹුන් යෙදූ රථයක්ද එක එක පිරිගියාවූ ගම්වරයක්ද යන සියල්ල ශුභාෂිතයෙන් ඉතා සතුටු සිත් ඇති මට පණ්ඩිතවූ තොපට දෙමියි" කියා රජතෙම සියල්ල දෙවුයේය.

**සිරිමන්ද ප්‍රශ්නයා:-** 1 එම්බා සේනකය, ප්‍රඥාවෙන් යුක්තවූ සම්පත්තියෙන් තොරවූවහුද, යශස් ඇත්තාවූ ප්‍රඥාව නැත්තහුද, මොවුන් දෙදෙනාගෙන් කවරෙකු උතුම්යයි පණ්ඩිතයෝ කියද්ද, මේ කාරණය ඔබ විචාරමියි" රජතෙම කීයේය.

2 "මහරජ, ඒකාන්තයෙන් ප්‍රාඥයෝද, අඥානයෝද, ශිල්ප දන්නාහුද, ශිල්ප නොදන්නාහුද මනා ජාති ඇත්තාහුද යන සියල්ලෝ මනා ජාති නැත්තාවූ සම්පත් ඇත්තහුගේ මෙහෙකරුවෝ වෙත්. මේ කරුණද දැක ප්‍රඥා ඇත්තේ නිහීනය සම්පත් ඇත්තේම උතුම්යයි මම කියමියි" සේනක තෙම කීයේය.

3 "අලාමක ප්‍රඥා ඇති සියලු ධර්මයන් දක්නාසුළු මහෞෂධය ඔබද විචාරමි. අඥානවූ සම්පත් ඇත්තහුද, පණ්ඩිතවූ සම්පත් නැත්තහුද යන මේ දෙදෙනා අතුරෙන් කවරෙක් උතුම්යයි පණ්ඩිතයෝ කියද්දැයි" රජතෙම ඇසීය.

4 "මහරජ, මේ ලොකයෙහි මේ ඓශ්වර්‍ය්‍යම ශ්‍රෙෂ්ඨ යයි හඟිමින් අඥානතෙම පව්කම් කරයි. මෙලොව දක්නාසුළු පරලොව නොදක්නාවූ අඥානතෙම දෙලොවෙහිම පරාජය

ගණියි. මේ කාරණයද දැක ප්‍රඥාව ඇත්තාම උතුම් වේ. යශස් ඇත්තාවූ අඥානයා උතුම් නොවේයයි මම කියමියි" මහෞෂධ තෙම කීයේය.

**5** "මහරජ, මේ ශිල්පය සම්පත් නොදරයි. නෑයන් ඇත්තෙක්ද, නොකරයි. ශරීරාවකාශයක්ද නොවේ. කෙළ වැගිරෙන්නාවූ මුඛ ඇති සැප විඳින්නාවූ මේ ගෝරිමන්ද සිටුහු බැළුව මැනව. ශ්‍රී තොමෝ වනාහි ඔහු භජනය කෙරේ. මේ කරුණද දැක ප්‍රඥා ඇත්තේ නිහීනය. සම්පත් ඇත්තේම උතුම්යයි මම කියමි." සේනකතෙම කීයේය.

**6** "මහරජ, මද ප්‍රඥා ඇත්තේ සැපය ලැබ මත්වේ. දුකින් ස්පර්ශ කරණලද්දේද මුළාවීමට පැමිණේ. ආගන්තුගවූ සුවදුක් දෙකින් ස්පර්ශ කරණලද්දේ අව්වෙහි තබනලද මත්ස්‍යයෙකු මෙන් සැලෙයි. මේ කරුණද දැක ප්‍රඥාව ඇත්තේම උතුම්වේ. සම්පත් ඇති අඥානය උතුම් නොවේ යයි මම කියමියි" මහෞෂධතෙම කීයේය.

**7** "මහරජ, යම්සේ වනයෙහි මිහිරි පල ඇති රුක පක්ෂීහු හාත්පසින් හැසිරෙද්ද, මෙසේම ආඪ්‍යවූ ධන සහිතවූ සම්පත් ඇත්තාවූ පුද්ගලයා බොහෝදෙනා සම්පත් හේතුවෙන් භජනය කෙරෙයි. මේ කාරණය දැක ප්‍රඥා ඇත්තා උතුම් නොවේ සම්පත් ඇත්තේම උතුම්වේ යයි මම කියමියි" සේනකතෙම කීයේය.

**8** "මහරජ, බලවත්වූ අඥානතෙම යහපත් නොවේ. හෙතෙම සාහසික වශයෙන් ධනය ලබයි. පසුව නිරය පාලයෝ අඥානවූ ඔහු අඬද්දීම දරුණු දුක් ඇති නිරයට ඇද ගනිත්. මේ කාරණයද දැක ප්‍රඥා ඇත්තාම උතුම්ය. යශස් ඇති බාලතෙමේ උතුම් නොවේයයි මම කියමියි" මහෞෂධ තෙම කීයේය.

**9** "යම්කිසි ඇල දොලවල් ගඟ කරා ගලා බසිද්දී ඒ සියල්ලෝම තමතමන්ගේ නාමගොත්‍ර හැර දමත්. මුහුදට ගලාබසින්නාවූ ගංගාවද නමින් ප්‍රකට නොවේද, එපරිද්දෙන්ම ලෝවැසිතෙම ඉසුරුමත් තැනැත්තා ප්‍රධානකොට ඇත්තේය. මේ කරුණද දැක මම ප්‍රඥාවන්තයා නිහීනය සම්පත් ඇත්තේම උතුම්යයි කියමියි" සේනකතෙම කීයේය.

10 "යම් මේ මහා සාගරයක් ඔබ කීයෙහිද, අපමණවූ බොහෝ කලක් එයට ඇල-දොලවල් ගලා බසිත්. ඒ සාගරය තෙම නිතර මහත්වූ රලවේග ඇත්තේය. එසේ නමුත් මහා සමුද්‍රයතෙම වෙරල නොයික්මවාද,

11 "මෙපරිද්දෙන්ම අඥානයාගේ කථාවෝ නුවණ ඇත්තහු නොඉක්මවත්. ශ්‍රී තොමෝද කිසිකලෙකත් ප්‍රඥාවන්තයා නොඉක්මවයි. මේ කාරණයද දැක ප්‍රඥාවන්තයාම උතුම්වේ. යශස් ඇති අඥානතෙම උතුම් නොවේය කියමියි" මහෞෂධතෙම කීයේය.

12 "කායාදී සංයම නැත්තාවූද, යශපිරිවර ඇත්තේ ඉදින් විනිශ්චය ස්ථානයෙහි සිට අනුන්ට කරුණක් කියාද, ඔහුගේම ඒ කීම නෑ සමූහයා මැද නගියි. ශ්‍රී තොමෝ වනාහි එය කරවයි ප්‍රඥාව එසේ නොකරයි. මේ කරුණ දැක මම ප්‍රඥා ඇත්තේ හීනවේ. සම්පත් ඇත්තේම උසස්වේය කියමියි" සේනකතෙම කීයේය.

13 "මද ප්‍රඥා ඇත්තාවූ යම් බාලයෙක් අනුන්ගේ හෝ තමන්ගේ හේතුවෙන් බොරු කියාද, හෙතෙම සභා මධ්‍යයෙහි නින්දා ලද්දෙක්වේ. පරලොවටද යන්නාවූ හෙතෙම දුර්ගතියට යන්නෙක්වේ. මේ කාරණයද දැක මම ප්‍රඥා ඇත්තාම උතුම්වේ යශස් ඇත්තාවූ බාලයා උතුම් නොවේයයි කියමියි' මහෞෂධතෙම කීයේය.

14 "සහල් නැලියක්වත් නැති ස්වල්ප ධන නැත්තාවූ දිළිඳුවූ බොහෝ ප්‍රඥා ඇත්තා ඉදින් කාරණයක් නමුත් කියයි නම්, ඔහුගේ ඒ කීම නෑයන් මැද නොනගියි. ශ්‍රී තොමෝද ප්‍රඥා ඇත්තහුට නොවේ. මේ කාරණයද දැක ප්‍රඥා ඇත්තා හීනය සම්පත් ඇත්තාම උසස්යයි කියමියි" සේනක තෙම කීයේය.

15 "මහත් ප්‍රඥා ඇති යමෙක් අනුන් හෝ තමන් හේතු කොට ගෙණද බොරුවක් නොකියාද. හෙතෙම සභා මධ්‍යයෙහි පුදනලද්දෙක් වේ. පරලොවටද පැමිණියාවූ හෙතෙම සුගතියට යන්නෙක්වේ. මේ කාරණයද දැක මම ප්‍රඥාවන්තයාම උතුම්වේ.

යශස් ඇති බාලයා උතුම් නොවේය කියමියි" මහෞෂධතෙම කීයේය.

16 "ඇත්තුද ගවයෝද අශ්වයෝද මාණික්‍ය කුණ්ඩලාභරණයෝද සමෘද්ධ කුලවල උපන් ස්ත්‍රීහුද යන ඒ සියල්ලෝම වස්තු නැත්තාහු වස්තු ඇති පුරුෂයාගේ උපභොග වස්තූහුද වෙත්. මේ කාරණයද දැක මම ප්‍රඥා ඇත්තේ පහත්ය. සම්පත් ඇත්තේම උසස්ය කියමියි" සේනකතෙම කීයේය.

17 "නොමනාව විධාන කරණලද කර්මාන්ත ඇති නපුරු මන්ත්‍රණ ඇති මන්ත්‍රීන්ගෙන් යුක්තවූ දුෂ්ප්‍රාඥවූ බාලයා සර්පතෙම දිරාගියාවූ සැවයක් මෙන් ශ්‍රී තොමෝ හැර දමයි. මේ කාරණයද දැක මම ප්‍රඥා ඇත්තේම උතුම්ය යශස් ඇත්තාවූ බාලතෙමේ උතුම් නොවේය කියමියි" මහෞෂධ තෙම කීයේය.

18 "ස්වාමීනි, අපි පණ්ඩිතයෝ පස්දෙන සියල්ලෝ ඇඳිළි බැඳගත්තාහු පැමිණ සිටියාහුය. නුඹවහන්සේ භූතයන්ට අධිපතිවූ සක්දෙව් රජහු මෙන් අප සියල්ලන් මැඩගෙණ සිටි අධිපතියා වෙහිය. මේ කරුණද දැක මම ප්‍රඥාවන්තයා පහත්ය සම්පත් ඇත්තේම උතුම්ය කියමියි" සේනකතෙම කීයේය.

19 "එබඳුවූ කටයුතු ඇතිවූ කල්හි යශස් ඇත්තාවූ බාල තෙමේ ප්‍රඥාවන්තයාට දාසයෙකු මෙන්වේ. පණ්ඩිතතෙම දක්ෂවූ යම් කරුණක් සංවිධාන කෙරේද, එහි බාලතෙම ඉතා මුළාවට පැමිණේ. මේ කාරණයද දැක මම ප්‍රඥා ඇත්තේම උතුම්වේ. යශස් ඇත්තාවූ බාලයා උතුම් නොවේය කියමියි" මහෞෂධතෙම කීයේය.

20 "මහරජ, ඒකාන්තයෙන් ප්‍රඥාතොමෝම සත්පුරුෂයන් විසින් පසස්නා ලද්දීය. මිනිස්සු සම්පත්හි ඇළුනාහුම වෙත්. එහෙයින් ශ්‍රී තොමෝ ඔවුන් කැමැත්තිය. ඥාන වෘද්ධයන්ගේ ඥානයද, අසමාන ස්වභාව ඇත්තේය. ශ්‍රීතොමෝ කිසිකලෙකත් ප්‍රඥාවන්තයා නොඉක්මවායයි" මහෞෂධතෙම කීයේය.

21 "සියලු ධර්මයන් දක්නාසුළු මහෞෂධ පණ්ඩිතය, අපි යමක් විචාළෙමුනම් එය අපට කීයේය. ප්‍රශ්න විසඳීමෙන් සතුටුවූ මම් ගවයන් දහසක්ද, ශ්‍රෙෂ්ඨවූ හස්තියෙකුද, ආජානීය අසුන්

යොදනලද මේ රථ දශයක්ද, ගම්වර සොළසක්ද ඔබට දෙමියි" කියා රජතෙම සියල්ල දෙවූයේය.

**ඡන්නපථ ප්‍රශ්නයः-** "ස්වාමීනි, ඇතුල් ගමෙහි යම් තැනෙක අත්සුනුකඩයක්ද, කැඳ සල්පිලක්ද ඇත්තේද, යම් තැනෙක්හි මල් පිපුනාවූ කොබෝලීල ගසකුත් වේද, එහි සිට ගම් අතකින් අනුභව කෙරෙම්ද, ඒ අනිත්මග කියමි. යම් අතකින් අනුභව නොකෙරෙම්ද, ඒ අතින් නොයායුතුයයි කියමි. යවමැදුම්ගම අපගේ ගෙදරට මේ මගවේ. මේ සැඟවුනු මාර්ගය දැනගණුමැනවැයි" අමරාදේවි කීවාය.

**බජ්ජොපනක ප්‍රශ්නයः-** 1 "මහරජ, යමෙක් අත්වලින් පා වලින් ගසයිද, මුහුණට අනියිද මෙසේ කරන්නාවූ හෙතෙම ඒකාන්තයෙන් ප්‍රියයෙක් වේද, එයින් කවරෙකු දක්නෙහිදැයි" රජතෙම ඇසීය.

2 "කවරෙක් නම් ඇවිලගත් ගිනි ඇති කල්හි ගිනි සෙවීමෙහි ඇවිදිමින් රාත්‍රි කාලයෙහි කණමැදිරියෙකු දැක ගිනියයි හඟීද,

3 "හෙතෙම මේ කණමැදිරියා මත්තෙහි ගොම වැරටීද තණ පර්ණලාද එක්කොට විපරීත සංඥාවෙන් ගිනි පිඹින්නේ ගිනි දල්වන්ට නොහැකිවීද,

4 "එපරිද්දෙන්ම අනුපාය වශයෙන් සොයන්නාවූ අඥනතෙම අර්ථය නොලබයි. යම් ගව අඟකින් කිරි නො ලබාද, ගවයන්ගේ ඒ අඟින් දොවන්නාවූ පුරුෂයා මෙනි.

5 "නානාප්‍රකාරවූ උපායවලින් මිනිස්සු අර්ථයට පැමිණෙත්. අමිත්‍රයන්ට නිග්‍රහ කිරීමෙන්ද, මිත්‍රයන් සංග්‍රහ කිරීමෙන්ද,

6 "සේනාවන්හි ප්‍රධානවූ ඇමැතියන් ලැබීමෙන්ද, විශ්වාස ඇමැතියන්ගේ උපක්‍රමයෙන්ද, යන උපායවලින් රජවරු ලෝකයෙහි පෘථිවිය හිමකොටගෙණ වාසය කරත්"

**භූරි ප්‍රශ්නයः-** 1 "සේනක පණ්ඩිතතෙම කියනලද්දේ සැබෑවක්මය. මහත් ප්‍රඥා ඇත්තාවූ යම්බඳුවූ ඔබද මද ව්‍යඤ්ජන ඇති බත අනුභව කරන්නෙහිද, ශ්‍රී තොමෝ යම්බඳුයයි කීද

ඕතොමෝ එබඳුමය. ඔබගේ ධෛර්‍ය්‍යයද, ප්‍රඥාවද අභාවයාගේ වසඟයට ගියාවූ ඔබ නොරකීයයි” ඇමතිතෙම කීයේය.

2 “සැපය දුකින් මුහුකුරුවන්නාවූ කල් නොකල් සොයමින් කැමැත්ත සැඟවූ පුරුෂතෙම අභිවෘද්ධිහුගේ දොරටු අරින්නේ වෙයි. එහෙයින් මම යවසාලේ බතින් සතුටුවන්නෙමි.

3 “වීර්‍ය්‍යකිරීමට සුදුසු කාලයද දැන නුවණින් මාගේ අර්ථය මුහුකුරුවා සිංහවිජෘම්භනයෙන් විජෘම්භනය කරන්නෙමි. ඒ සමෘද්ධියෙන් යුක්තවූ මා නැවතද දක්නෙහි යයි” මහෞෂධතෙම කීයේය.

4 “පණ්ඩිතය, ඇතැම්හු වනාහි සැප ඇත්තාවූ පව් නොකරත්. නැවත සමහරු අපකීර්තිය ලැබීමට භයින් පව් නොකරත්. නුඹ වනාහි සමර්ථවූයේම මහත් අර්ථ සිතන්නේද කවර කාරණයකින් මට දුකක් නොකෙරෙහිදැයි” රජතෙම ඇසීය.

5 “පණ්ඩිතයෝ තමන්ගේ සැපය හේතුකොටගෙණ පාපකර්ම නොකරත්. දුකින් ස්පර්ශ කරණ ලද්දාහු සම්පත්තියෙන් ගිලිහුනාහුද සත්පුරුෂයෝ ඡන්දයෙන්ද ද්වෙෂයෙන්ද සුචරිත ධර්මය අත්නොහරිත්යයි” මහෞෂධතෙම කීයේය.

6 “ක්ෂත්‍රියතෙම මෘදුවූ හෝ දරුණුවූ හෝ යම්කිසි ආකාරයකින් බැගෑපත්වූ තමන් සම්පත්තියෙහි නගාසිටුවන්නේය පසුව සුචරිත ධර්මයෙහි හැසිරෙන්නේයයි” රජ තෙම කීයේය.

7 “යමෙක් යම් ගසක්හුගේ සෙවෙනෙහි හිඳින්නේද, ශයනය හෝ කරන්නේද, හෙතෙම ඒ ගසේ අත්ත නොබිඳින්නේය. කුමක් හෙයින්දයත්, මිත්‍රද්‍රෝහිතෙම ලාමකවේ යයි” පණ්ඩිතතෙම කීයේය.

8 “මහරජ, යමෙකුගේ සමීපයෙන් පුරුෂතෙම ස්වල්පවූද, ධර්මයක් දැනගන්නේද, යම් සත්පුරුෂ කෙනෙකුත් ඔහුගේ සැකය දුරුකරද්ද, ඔහු වනාහි ඒ පුද්ගලයාට පිහිටා සිටින හෙයින් දීපයද පරම ප්‍රතිෂ්ඨාවදවේ. ඔහු හා ප්‍රඥා ඇත්තේ මිත්‍රභාවය නම් නොනසන්නේයයි” පණ්ඩිතතෙම කීයේය.

පටුන



9 "කම්සැප අනුභව කරන්නාවූ අලසවූ ගෘහස්ථයා යහපත් නොවේ. සංයම නැත්තාවූ ප්‍රව්‍රජිතතෙම යහපත් නොවේ. නොවිමසා කටයුතු කරන්නාවූ රජතෙමේ යහපත් නොවේ. යම් පණ්ඩිතයෙක් කිපෙන සුළුද ඒ යහපත් නොවේ.

10 "ක්ෂත්‍රියතෙම විමසා බලා කටයුතු කරන්නේය, මහරජ නොවිමසා කටයුතු කිරීම සුදුසු නොවේ. මහරජ, විමසා කටයුතු කරන්නහුගේ යශසද කීර්තියද වැඩේයයි" පණ්ඩිතතෙම කීයේය.

**දෙවතා ප්‍රශ්නඃ-** 1 "යමෙක් අත්වලින් පාවලින් ගසාද මුහුණටත් අනීද, මහරජ, හෙතෙම ඒකාන්තයෙන් ප්‍රියයෙක් වේද, ඒකාරණයෙන් ඔබ කවරෙකු දක්නෙහිදැයි" දේවතා දූ ඇසීය.

2 "යමෙකුට කැමති පරිද්දෙන් බනීද, මොහුගේ ඊමත් නොකැමැති වේද, මහරජ, ඒකාන්තයෙන් හෙතෙම ප්‍රිය වූයෙක්වේ. ඒ කාරණයෙන් ඔබ කවරෙකු දක්නෙහි දැයී" දෙවෙනි ප්‍රශ්නය ඇසීය.

3 "යමෙක් අභූතයෙන් ගටා බෙනේද, බොරුවකින් චොදනා කෙරේද, මහරජ එකල්හි හෙතෙම ප්‍රියයෙක්වේ. ඒ කාරණයෙක් කවරෙකු ඔබ දක්නෙහිදැයි" තුන්වෙනි ප්‍රශ්නය ඇසීය.

4 "යමෙක් ආහාරද පාන වර්ගද වස්ත්‍ර ශයනාශනයන්ද හැරගෙණ යන්නේවේද, මහරජ, ඒකාන්තයෙන් හැරගෙණ යන්නාවූම ඔව්හු ප්‍රිය වෙත්. ඒ කාරණයෙන් ඔබ කවරෙකු දක්නෙහි දැයි" සතරවෙනි ප්‍රශ්නය ඇසීය.

**පඤ්චපණ්ඩිත ප්‍රශ්නයඃ-** 1 "මෙහි රැස්වූ පස් පඬිවරුනි, මට ප්‍රශ්නයක් වැටහේ. එය අසව්, නින්දා කටයුතු කරුණක් හෝ පැසසියයුතු කරුණක් හෝ රහස් කරුණ කවරෙකුට කියයුතු වන්නේදැයි" රජතෙම ඇසීය.

2 "මහරජ, නුඹ වහන්සේ අපට ප්‍රකාශ කරව, නුඹ වහන්සේ අපගේ ස්වාමියාද බර උසුලන්නාද වේ. එබැවින් පළමුකොට නුඹ වහන්සේම මෙය කියනු මැනව, මහරජ, නුඹ වහන්සේගේ කැමත්තද රුචිවන කරුණුද කල්පනා කොට පණ්ඩිතයෝ පස්දෙන පසුව කියත්යයි" සේනකතෙම කීයේය.

3 "යම් භාර්‍ය්‍යාවක් ආචාර සම්පන්නද අනුන් වසඟයෙහි නොපවත්නීද ස්වාමිහුගේ සිතේ කැමැත්ත පරිදි වසන්නීද, මනවඩන්නීද, එබඳු භාර්‍ය්‍යාවට නින්දා කටයුතු කරුණ හෝ පැසසිය යුත්ත හෝ රහස් කරුණ කියයුතු වන්නේයයි" රජතෙම කීයේය.

4 "යමෙක් දුකට පැමිණියාවූ ආතුරයාට උතුම් ප්‍රතිෂ්ඨාධාර වේද, එබඳු උපකාර ඇති යහළුවාටම නින්දා කටයුතු කරුණක් හෝ පැසසිය යුතු කරුණ හෝ රහස් කරුණ ප්‍රකට කරන්නේයයි" සේනකතෙම කීයේය.

5 "වැඩිමහළුවූද තවද මධ්‍යමවූද බාලවූද යම් සහෝදරයෙක්වේද, ඉදින් හෙතෙම ආචාර සීලයෙන් යුක්තවූ පිහිටීම ස්වභාව කොට ඇත්තෙක් වන්නේ නම් එබඳු සහෝදරයාටම නින්දා කටයුතුවූ හෝ පැසසිය යුතුවූ හෝ රහස් කරුණ කියයුතු වන්නේයයි" පුක්කුසතෙම කීයේය.

6 "යමෙක් ඒකාන්තයෙන් පියාගේ සිතට වසඟව පවතීද, පියාට අනුජාතක පුත්‍රවේද, ලාමක නොවූ ප්‍රඥා ඇත්තේද එබඳු පුත්‍රයාට නින්දා කටයුතුවූ හෝ ප්‍රශංසා කටයුතුවූ හෝ රහස් කරුණ කියයුතු වන්නේයයි" කාවින්ද තෙම කීයේය.

7 "දෙපා ඇත්තවුන්ට උතුම්වූ මහරජ්ජුරුවෙනි, යම් මවක් කැමැත්තෙන්ද ප්‍රේමයෙන්ද ඒ පුත්‍රයෙකු පොෂණය කෙරේද, එබඳු මවට නින්දා කටයුතුවූ හෝ ප්‍රශංසා කටයුතුවූහෝ රහස් කරුණ කියයුතු වන්නේයයි" දෙවින්දතෙම කීයේය.

8 "මහරජ, සැඟවියයුතු කරුණ වනාහි සැඟවීමට යහපත් වේ. සැඟවිය යුතු කරුණ වනාහි ප්‍රකාශ කිරීම නොපසස්නා ලදී. ප්‍රාඥතෙම අදහස මුදුන් පැමිණෙනතාක් ඉවසන්නේය. මුදුන් පැමිණි අර්ථ ඇත්තේ සුවසේ කියන්නේයයි" මහෞෂධ පණ්ඩිතතෙම කීයේය.

9 "රාජොත්තමය, නුඹවහන්සේ කුමට වෙනස්වූ සිත් ඇත්තෙහිද, දෙපා ඇත්තවුන්ට උත්තමය ඔබගේ යම් වචනයක් නොඅසමි. කුමක් සිතමින් නොසතුටු සිත් ඇත්තේ වෙහිද, දෙවයන් වහන්ස මාගේ කිසියම් වරදක් ඇත්තේදැයි" උදුම්බරා දේවි ඇසුවාය.

10 "මහත් ප්‍රඥා ඇත්තාවූ මහෞෂධපණ්ඩිතතෙම මැරිය යුතුයයි. ඔහු මැරීමට මා විසින් අණ කරණ ලදී. එය සිතන්නාවූ මම නොමනා සිත් ඇත්තේ වෙමි. දේවිය තොපගේ කිසි වරදක් නොමැත්තේයයි" රජතෙම කීයේය.

11 "මහත් ප්‍රඥා ඇති මහෞෂධය ඊයේ සවස ගියාවූ ඔබ දැන් එන්නෙහිය, කුමක් අසා තොපගේ සිත කුමකට සැක කෙරේද කවරෙක් තොපට කිම, රජ සමීපයට නොයවයි කීයේද, එබැවින් ඒ වචනය අසමි. මෙය මට කියවයි" රජතෙම කීයේය.

12 "මහරජ, මහෞෂධපණ්ඩිතතෙම මැරිය යුතුයයි ඉදින් ඔබ විසින් පඬිවරුන්ට කියන ලද්ද, රාත්‍රියෙහි කවරෙකුට කියන ලදද, ඔබවහන්සේ වනාහි රහසිගතව භායර්‍යාවට කීයේය. ඒ ප්‍රකාශ කරණ ලද රහස මා විසින් අසන ලදැයි" මහෞෂධතෙම කීයේය.

13 "සේනකතෙම සල් උයනෙහි නොසරුප් ස්වභාව ඇති යම් පවිටු කර්මයක් කෙළේද, මහරජ, රහසිගතව යහළුවෙකුටම එය කීයේය. ප්‍රකට කළාවූ මේ රහස මා විසින් අසන ලදැයි" කීයේය.

14 "මහරජ, ඔබගේ පුක්කුස නම් රාජපුරුෂයාගේ රජුන් විසින් ලංවීමට නුසුදුසු උපන් රෝගයෙක් වේ. හෙතෙම එය රහසිගතව සහෝදරයාටම කීයේය. පහළ කරණ ලද මේ රහසද මා විසින් අසන ලදැයි" කීයේය.

15 "මහරජ, කාවින්දතෙම නරදේව නම් යකෙකු විසින් ස්පර්ශ කරණ ලද්දේ වේ. මේ ආබාධය තෙම රජ කුලයට නොඑළඹිය යුතුවූ නොසරුප් ස්වභාව ඇත්තකි. හෙතෙම රහසිගතව එය තම පුත්‍රයාට කීයේය. පහළ කරණ ලද මේ රහසද මා විසින් අසන ලදැයි" කීයේය

16 "මහරජ, සක්දෙව් රජතෙම මහත් අෂ්ටවංක නම්වූ මාණික්‍ය රත්නයක් ඔබගේ මුත්තණියන්වූ කුශ රජ තුමාට දුන්නේය. අද ඒ මැණික දේවින්දයා අතට පත්විය. රහසිගතව හෙතෙම මවට ප්‍රකට කළාවූ මේ රහසද මා විසින් අසන ලදැයි" මහෞෂධ තෙම කීයේය.

17 "මහරජ, රහස් කරුණ වනාහි සැඟවීමම මැනව. රහස එළිදරව්කිරීම නම් නොම පසස්නා ලදී. ප්‍රාඥතෙම තම අදහස මුදුන් පැමිණෙනතාක් ඉවසන්නේය. නිපන් කරුණු ඇත්තේ සුවසේ කියන්නේය.

18 "සැඟවියයුතු කරුණ ප්‍රකාශ කටයුතු නොවන්නේය. නිධානයක් මෙන් එය රැකිය යුතු වන්නේය. නුවණැත්තහු විසින් රහස ප්‍රකාශ කරණ ලද්දේ සුදුසු නොවේමය. රහස් කරුණ සැඟවිය යුත්තේමය.

19 "පණ්ඩිතතෙම ස්ත්‍රියටද සතුරාටද රහස නොකියන්නේය. යමෙකුත් යම්කිසි ආමිෂ ලාභයකින් එකතු වන්නේද, යම් මිනිසෙකුත් මිත්‍ර ප්‍රතිරූපකවූ සතුරෙක් වේද, මොවුන් දෙදෙනාටද රහස නොකියයුතු වන්නේය.

20 "යම් මිනිසෙක් අනුන්ට නොදැන්විය යුතුවූ රහස් කරුණ දන්වාද, මන්ත්‍රණය බිඳෙන භයින් ඔහුගේ ආක්‍රොෂාදිය දාසයෙකු මෙන්වී ඉවසයි. මන්ත්‍රණය කළවුන් අතුරෙන් යම්තාක් දෙනා ඒ පුරුෂයාගේ රහස් කරුණ දනිද්ද, ඔහුට එපමණම තැතිගැනුම් හටගණිත්. එහෙයින් රහස නොහරණේය.

21 "දාවල් කාලයෙහි රහස විවේකව කියන්නේය. රාත්‍රි කාලයෙහි රහස කියන්නේ සීමාව ඉක්මවා ශබ්ද කරමින් නොකියන්නේය. ලංව අසා සිටියාහු වනාහි රහස් මන්ත්‍රණය අසත්. එහෙයින් ඒ රහස් මන්ත්‍රණය වහා බිඳීමට පැමිණේයයි" මහෞෂධ පණ්ඩිතතෙම කියේය.

**මහා උම්මග්ග කාණ්ඩය:-** 1 "එම්බා මහෞෂධය, පඤ්චාල රට බ්‍රහ්මදත්ත නම් රජතෙම සියලු සේනාව සමග මෙහි ආයේය. පඤ්චාල රජ සන්තකවූ ඒ මේ සේනා තොමෝ අපමණ වන්නීය.

2 "පිටින් ගෙනෙන ලද උපකරණ ඇත්තීද, පාබල හමුදා ඇත්තීද, සියලු යුද්ධයෙහි දක්ෂයන්ගෙන් යුක්තද වන්නීය. හිස සිඳ හැරගන්නවුන්ගෙන් යුක්තවූ දශවිධ ශබ්දයන්ගෙන් යුක්තවූ ඒ සේනා තොමෝ බෙර සක් හඬින් ප්‍රබොධ කරන්නීවේ.

3 "ලෝහ ශිල්පීන් විසින් කරණ ලද සත් රුවන්මය ආභරණයන්ගේ ශෝභා ඇති ධජ වලින් යුක්තවූ චම්පසින්

නැගිය යුතු ඇතුන් අසුන්ගෙන් යුක්තවූ හස්ති ශිල්පාදිය දන්නවුන්ගෙන් සමන්නාගතවූ ශූරවූ යෝධයන් විසින් මනාව පිහිටියාවූ සේනාවවේ.

4 "තවද මේ සේනාවෙහි මහත් ප්‍රඥා ඇති පණ්ඩිතයෝ දශදෙනෙක්යයි කියත්. රහස්ව ගමන් කරණ ස්වභාව ඇති රජුගේ මව් තොමෝ එකොළොස්වැනි වූවා පඤ්චාල රට සෙනගට අනුශාසනා කරයි.

5 "තවද මෙහි යශ පිරිවර ඇත්තාවූ පඤ්චාල රජු විසින් පැහැර ගන්නා ලද රටවල් ඇති භයින් පෙළුනාවූ පඤ්චාල රජුගේ වසඟයට ගියාවූ ඒ සීයක් රජ දරුවෝ අනුව යෙදුනාහු වෙත්.

6 "යමක් කියන්නාහු නම් එය කරන්නාහු, රජහුට නොකැමතිවත් ප්‍රිය තෙපුල් කියන්නාහු, නොකැමතිව වසඟයට ගියාහු පඤ්චාල රජු අනුව ගමන් කෙරෙත්.

7 "ඒ සේනාව විසින් මියුළු නුවර ත්‍රිසන්ධියකින් වට කරණ ලදී. විදේහ වැස්සන්ගේ රාජධානිතොමෝ හාත්පසින් සාරා දමනු ලැබේ. මහෞෂධය, හාත්පස පිරිවරණ ලද සේනාවෝ ගන්නා ලද දඬුවැට පහණින් යුක්තවූවාහු උඩ හටගත් තාරකා මෙන් පැණෙත්. කෙසේ නම් මිදීම වන්නේදැයි දනුවයි" රජතෙම කීයේය

8 "දේවයන් වහන්ස, නුඹවහන්සේ සුවසේ රජසුව නමැති පාදයන් දිගහැරිය මැනව. කාම සම්පත්ද අනුභව කරණු මැනව. සිත් අලවා වාසය කරණු මැනව. පඤ්චාල රටට අයත් සෙනග හැරදමා මේ බ්‍රහ්මදත්ත රජතෙම පැනයන්නේයයි" මහෞෂධතෙම කීයේය.

9 "මහරජ, අපගේ රජතෙම ඔබ හා මිත්‍රසන්ථවය කැමතිව ඔබට රත්නයන් පඬුරුකොට දෙයි. ඒ පඤ්චාල නුවරින් මිහිරිවූ ප්‍රිය තෙපුල් කියන්නාවූ දූතයෝ පඬුරු ගෙණ මෙහි එත්වා. මෙනුවරින්ද එහි යත්වා.

10 "යම් වචනයෝ සතුටුවීමෙන් යුක්තවෙද්ද, එබඳු මෘදු වචන කියත්වා. පඤ්චාල වැස්සෝද විදේහ වැස්සෝද, යන ඒ

දෙරට වැස්සෝ එකහා සමාන වෙත්වායි" කේවට්ට තෙම කීයේය.

11 "එම්බා කේවට්ටය, කෙසේද, මහෞෂධ පඬිහු හා එක්වූයේ වෙහිද එසේ නම් එය කියව. කිමෙක්ද, හෙතෙම ඔබ විසින් ක්ෂමා කරවන ලද්දේද, කිම මහෞෂධතෙමේ සතුටුවූයේදැයි" රජතෙම ඇසීය.

12 "මහරජ, අනාර්‍ය්‍ය ස්වභාව ඇති ඒ පුරුෂතෙම කිසිසතුටක් නැත්තාවූ තදවූ අපණ්ඩිත ස්වභාව ඇත්තෙකැයි සිතමි. ගොළුවෙක්ද බිහිරෙක්ද මෙන් හෙතෙම කිසි කරුණක් නොකීයේයයි" කේවට්ටතෙම කීයේය.

13 "ඒකාන්තයෙන් මේ රහස් මන්ත්‍රණය කිසිවෙකු විසිනුත් නොදැකිය හැකිවේ. වීර්‍ය්‍යවන්ත මනුෂ්‍යයා විසින් පිරිසිදුවූ කාරණය දක්නාලද්දේවේ. එසේ හෙයින් මාගේ ශරීරය වෙව්ලයි ස්වකීය රටහැර කවරෙක් නම් අනුන් අතට පැමිණෙන්නේදැයි" රජතෙම සිතුයේය.

14 "උතුම් බවට පැමිණියාවූ යම් පණ්ඩිත කෙනෙක් වෙද්ද, ඒ අප සදෙනාගේ වනාහි එකම අදහස සමානවේ. මහෞෂධය, එහි අපගේ යාම හෝ නොහොත් නොයාම නැතහොත් මෙහි සිටීම රුචිවේද, ඔබත් කල්පනා කරවයි" රජතෙම කීයේය.

15 'මහරජ, චුලනී බ්‍රහ්මදත්ත නම් රජතෙම මහත් ආනුභාව ඇත්තෙක. මහත් බලයෙන් යුක්තයයි ඔබ දන්නෙහිද? ඒ රජතෙමේද වැද්දෙක් දඩමුවදෙනක නිසා මුවෙකු අල්ලා ගන්නාක් මෙන් ඔබ අල්ලාගනු කැමතිවේ.

16 "යම්සේ මත්ස්‍යයෙක් මාංශයෙන් වසන ලද වක්වූ බිලිය නොදකීද, ඇමයෙහි ගිජුවූ මත්ස්‍යතෙම තමහට වන්නාවූ මරණය නොදකීද,

17 "මහරජ, මෙපරිද්දෙන්ම ඔබ චූලනී බ්‍රහ්මදත්ත රජහුගේ දුව කැමතිවෙහි. කාමයෙහි ගිජුවූ ඔබ ඇමෙහි ගිජුවූ මත්ස්‍යයා මෙන් තමහට වන්නාවූ මරණය නොදන්නෙහිය.

18 "මහරජ, ඉදින් ඔබ උත්තර පඤ්චාල නුවරට යන්නෙහි නම් වහා ආත්මය හරින්නෙහිය. ගම් දොර මගට පැමිණියාවූ

මුවෙකුට මෙන් ඔබටද මහත්වූ භයක් පැමිණෙන්නේයයි" මහෞෂධතෙම කීයේය.

19 "යම්බඳුවූ අපි උතුම් රත්න ලැබීම පිළිබඳ කරුණු තා සමීපයෙහි කීමුද එබඳුවූ අපිම කෙළතොලුවූ අඥානයෝ වෙමු. සෙසු පණ්ඩිතවරුන් මෙන් නගුල් කෙළවර අල්වා ගෙණ වැඩුනාවූ නුඹ කිම මංගල කාරණයන් දන්නෙහිදැයි" රජතෙම ඇසීය.

20 "යමෙක් මාගේ මේ රත්න ලාභය නැතිකිරීමට කථා කෙරේද ඒ මොහු බෙල්ලෙන් අල්ලාගෙණ මාගේ රටින් නෙරපව්යයි" රජතෙම කීයේය.

21 ඉක්බිති ඒ මහෞෂධ තෙමේද වේදෙහ රජු සමීපයෙන් ඉවත්ව ගොස් නැවත දූතවූ මාඪර ගොත්‍රයෙහිවූ සුව පණ්ඩිතයන් කැඳවීය.

22 "රන්වන් පියාපත් ඇති යහළු ගිරාපොතකය, මෙහි එව. මාගේ එක් වතාවතක් කරව. පඤ්චාල රජහුගේ යහන පාලනය කරන්නාවූ එක් සැළලිහිණි ධෙනුවක් ඇත.

23 "ඇය සමග විශ්වාසවීමෙන් රහසිගතව ඇයගෙන් අසව ඕතොමෝ වනාහි සියල්ලට දක්ෂය. ඒ සැළලිහිණි තෙමෝ රජහුගේද කේවට්ටයාගේද යන ඔවුන්ගේ සියලු රහස් දනී.

24 ඒ මාඪර නම් සුව පණ්ඩිතතෙම 'එසේයයි' ඔහුට පිළිවදන්දී රන්වන් පියාපත් ඇති ගිරාතෙම සැළලිහිණි ධෙනුව සමීපයට ගියේය.

25 ඉක්බිති ඒ මාඪර නම් සුව පණ්ඩිත තෙමේද එහි ගොස් එකල්හි රන්කුඩුවෙහි වසන්නාවූ මිහිරි කථා ඇත්තාවූ සැළලිහිණි ධෙනුව කැඳවීය.

26 "රන්කුඩුවක වාසය කරණ තැනැත්තිය, කිම ඔබට සැපද, වෛශ්‍ය වංශ ඇත්තිය කිම ඔබ නිරෝගද? කිමෙක්ද, රන් කුඩුවෙහි වසන්නාවූ තිට මීයෙන් හැනූ ඒ විළඳ ලැබේද?"

27 "යහළු ගිරා පණ්ඩිතය, මට මෙහි සැපදවේ. තවද යහළුව, මට නිරෝගද වේ. තවද මට මීයෙන් හැනු විළඳද ලැබේ.

28 "යහළුව, නුඹ කොයිසිට අවුත් මෙහි පැමිණියෙහිද, නුඹ කවරෙකු විසින් හෝ එවන ලද්දේද, මින් පෙර මා විසින් දක්නාලද්දෙක් හෝ අසන ලද්දෙක්ද, නොවෙහියයි" සැළලිහිණියා කීය.

29 "මම සිවිරට රජහුගේ ප්‍රාසාදයෙහි යහන රක්නාවෙමි. ඉක්බිති ඒ දැහැමිවූ රජතෙම බැඳ සිරකොට තබන ලද සතුන් බැම්වලින් මුදවා හැරියේයයි" කීයේය.

30 "ඒ මාගේ මිහිරි කථා ඇත්තාවූ එක් සැළලිහිණි ධෙනුවක් පළමු භායර්‍යාවූවාය. එහි උකුස්සෙක් රන් කූඩුවෙහි මා බලා සිටිද්දීම ඇමැරූයේයයි" ගිරවා කීයේය.

31 "එබැවින් මම ඔබට කැමැත්තෙන්ම කාමයෙන් මත්වූයේ තී සමීපයට ආයෙමි. ඉදින් අවකාශයක් ලැබෙන්නෙහි නම් අප දෙදෙනාම එක්ව වාසය කරමුයි" ගිරා තෙම කීය.

32 "ගිරාතෙමේ ගිරවියක්ම කැමැතිවන්නේය. සැළලිහිණි තෙමේ වනාහි සැළලිහිණියම කැමැති වන්නේය. ගිරවා ද සැළලිහිණියගේද කෙබඳුවූ එක්ව වාසය කිරීමෙන් වේදැයි" සැළලිහිණි තොමෝ ඇසීය.

33 "කාමයෙන් යුත් තැනැත්තේ යම් යම් තැනැත්තියෙකු සැඩොලියක නමුදු කැමතිවේ. ඒ සියල්ලන් හා එක්ව වාසය කිරීම එක සමානවේ. කාමසේවනයෙහි අසමාන කමක් නැත්තේ යයි" සුචපණ්ඩිතතෙම කීයේය.

34 "සිවි රජහුගේ මව ජම්බාවතී නම් සැඩොලියක් වූවාය. ඕතොමෝ කණ්හා යන ගොත්‍රයෙහිවූ වාසුදේව නම් රජුගේ මෙහෙසිවූ ප්‍රිය භායර්‍යාව වීයයි" කීයේය.

35 "රථවතී නම් කිඳුරු ධෙනුවක් වූවාය. ඕතොමෝද වච්ඡනම් තාපසයෙකු කැමති කරවා ගත්තේය. මෙසේ මනුෂ්‍යයෙක් තිරිසන් ගිය මාගම සමග එක්ව වාසය කෙළේය. එබැවින් කාමසේවනයෙහි අසමානයෙක් නැතැයි" සුච පණ්ඩිතතෙම කීයේය.

36 "මිහිරි වචන ඇති එම්බා ශාරිකාවෙනි, එහෙනම් මම යන්නෙමි. මේ ඔබ කී සියල්ල හැරදැමීමට කරුණුය.

ඒකාන්තයෙන් ඔබ මා ඉක්මවා සිතන්නෙහියයි" ගිරා පණ්ඩිතතෙම කීයේය.

37 "යහළුවූ මාඪර නම් සුවපණ්ඩිතය, ඉක්මන් වන්නහුට ශ්‍රී තොමෝ නොපැමිණේ. යම්තාක් ඔබ රජු දක්නෙහිද, ඒතාක් මෙහිම හිඳුව, මිහිගු බෙරහඬ අසව, රජහුගේ ආනුභාවයද බලවයි" සැළලිහිණි කීවාය.

38 "දවහත් තරුව මෙන් බබළන රූප සෝභා ඇති පඤ්චාල රජුහුගේ දූ කුමරියක්වේ. ඒ කුමරිය වෙදේහ රජුට දෙන්නේය, යන යම් මේ මහත්වූ ඝෝෂාවෙක් පිටත ගම්වල ප්‍රකටවූයේද, කිම, ඒ විවාහය වන්නේදැයි" ගිරා පණ්ඩිතතෙම ඇසීය.

39 "එම්බා මාඪර නම් ගිරවාණෙනි, යම්සේ පඤ්චාල රජහුගේ වේදේහ රජු හා අමිත්‍ර බවක් වන්නේද, පසමිතුරුවූ ඔවුන් අතර මෙබඳු විවාහයෙක් නොවේවායි' කීය.

40 "පඤ්චාල නම් රජතෙම මෙසේ වේදේහ රජු මෙහි පමුණුවාගෙණ ඉන්පසු ඔහු නසන්නේය. ඔහු හා කිසි මිත්‍ර භාවයක් නොවන්නේයයි" කීයේය.

41 "එබැවින් මම යම්තාක් සිවිරජහුටද මෙහෙසියටද මා විසින් ශාරිකා ධෙනුවක සමීපයෙහි වාසය කිරීම ලබන ලදැයි දන්වම්ද. ඒතාක් මට රාත්‍රි සතක් පමණ කල් අවසර දෙවයි" ගිරා පණ්ඩිතතෙම කීයේය.

42 "එහෙනම් මම ඔබට රාත්‍රි සතක් පමණ කල් අවසර දෙමි. ඉදින් නුඹ සත් රැයකින් මා වෙත නායෙහි නම් ඉක්මවූ දිවි ඇති සතෙක්යයි මා හඟින්නෙමි. මා මල කල්හි ඔබ එන්නෙහියයි" සැළලිහිණි ධෙනුව කීවාය.

43 "ඉන්පසු ඒ මාඪරනම් සුවපණ්ඩිතතෙමේද ගොස් සැළලිහිණියාගේ මේ වචනය මහෞෂධ පඬිහට කීයේය.

44 "පුරුෂතෙම යමෙකුගේම ගෘහයෙහි සම්පත් අනුභව කරන්නේද, ඔහුගේම වැඩ කළයුතු වන්නේ යයි" පණ්ඩිතතෙම ප්‍රීතිය ප්‍රකාශ කෙළේය.

45 "මහරජ, එසෙනම් මම පළමුකොට යශ පිරිවර ඇත්තාවූ වේදෙහ රජුට නිවාසස්ථානයත් සාදවන්ට පඤ්චාල රජුහුගේ ඉතා සිත් කළුවූ නුවරට යමි.

46 "යශ පිරිවර ඇත්තාවූ වේදෙහ රජුට නිවාසස්ථාන සාදවා යම් කලෙක ඔබට පනිවිඩ එවන්නෙම්ද, මහරජ, එකල්හි ඔබ එනු මැනවැයි" මහෞෂධතෙම කීයේය.

47 ඉක්බිති මහෞෂධතෙමේද යසපිරිවර ඇත්තාවූ වේදේහ රජුට නිවාසස්ථාන සාදවන්ට පඤ්චාල රජහුගේ ඉතා සිත් කළුවූ නුවරට පළමුකොට ගියේය.

48 යශ පිරිවර ඇත්තාවූ වේදේහ රජුට නිවාසස්ථාන සාදවා "ඉක්බිති මහරජ, ඔබගේ නිවාසස්ථානය නිමවන ලදී. දැන් එවයි" ඔහුට දූතයෙකු යැවූයේය.

49 ඉක්බිති රජතෙමේද සිව්රඟ සෙනඟින් යුක්තව අපමණ අශ්වාදි වාහන ඇති කම්පිල්ල දෙශයෙහි ගොඩනගන ලද සමෘද්ධවූ නගරය දක්නට ගියේය.

50 ඉක්බිති ඒ රජතෙමේද එහි ගොස් "මහරජ, ඔබගේ පා වඳින්ට ආයෙමියි" බ්‍රහ්මදත්ත රජුට පනිවිඩ යැවීය.

51 (i) ස්වර්ණාභරණයෙන් සරසන ලද දාසී සමූහයා විසින් පිරිවරණ ලද සියලු ශරීරාවයව වලින් සෝභමාන ස්ත්‍රියක්වූ (ii) ඔබගේ දූ කුමරිය දැන් මට භාර්‍ය්‍යාකොට දෙවයි කියා කීයේය.

52 "එම්බා වේදේහ රජ, ඔබගේ මේ යහපත් ඊමකි. තවද ඔබට අයහපත් ඊමක් නොවේ. ශුභ මුහුර්තියක්ම අසා ගණුව. ස්වර්ණාභරණයෙන් සැරසූ දාසී සමූහයා විසින් පිරිවරණලද මේ රාජකන්‍යාව මම ඔබට දෙමියි" බ්‍රහ්මදත්ත රජතෙම දූතයෙකුඅත කීයා යැවීය.

53 ඉක්බිති වේදේහ රජද නැකතක් විචාළේය. නැකත විචාරා බඹදත් රජුට පණිවිඩ යැවීය

54 (මේ ඡේදය 51 ඡේදය මෙනි.)

55 "(මෙහි 51 (i) යෙදිය යුතුයි.) මේ රාජකන්‍යාව දැන් ඔබට භාර්‍ය්‍යාකොට දෙමියි" චුලනී රජතෙමේද කියා යැවීය.

56 "ඇත්තුය, අශ්වයෝය, රථය, පාබල සෙනඟය යන සැරසුනාවූ මේ සේනාවෝ සිටිත්. දල්වනලද පන්දම්ද ඇවිලෙත්. පණ්ඩිතවරු කුමක් සිතද්දැයි" රජතෙම ඇසීය.

57 "එම්බා මහෞෂධ පණ්ඩිතය, ඇත්තුය, අශ්වයෝය, රථය පාබල සෙනඟය යන සැරසුනාවූ මේ සේනාවෝ සිටිත්. දල්වනලද පන්දම්ද ඇවිලෙත්. මේ සේනාවෝ අපට කුමක් කරන්නාහුදැයි" වේදේහ රජතෙම ඇසීය.

58 "මහරජ, මහත් බල ඇත්තාවූ මේ චූලනී රජතෙම ඔබ රකියි. ඔබට ප්‍රදූෂ්‍යවූ බ්‍රහ්මදත්ත රජතෙම උදෑසන ඔබ නසන්නේයයි" මහෞෂධතෙම කීයේය.

59 "පුත මහෞෂධය, මාගේ හෘදය උසස්ව වෙව්ලයි. මුඛයද වියලෙන්නේය. ගින්නෙහි දන ලද්දෙක් අව්වෙහි සිටි කලක් මෙන් නිවීමට නොපැමිණෙමි.

60 "කඹුරු උදුන යම්සේ ඇතුළත දවයිද, පිටත නොදවාද මෙසේම මාගේ හෘදය ඇතුළත දවයි. පිටතට නොපෙනේයයි" රජතෙම හැඬුයේය.

61 "මහරජ, කාමයෙන් ප්‍රමාදයට පැමිණි ඔබ මාගේ කීම ඉක්මවන ලද්දේ භින්නවූ මන්ත්‍රණ ඇත්තෙහිය. දැන් වනාහි මන්ත්‍රණ කළාවූ ඔබගේ ඒ පණ්ඩිතයෝ ඔබ ආරක්ෂා කෙරෙත්වා.

62 "මහරජ, තමහට වැඩ කැමැති හිතවත්වූ ඇමතිහුගේ ඒ වචනය නොකොට තමා පිනවීමෙහි ඇළුනාවූ ඔබ මල පුඩුවෙක්හි බැඳුනාවූ මුවෙකු මෙන් වෙහිය.

63 "යම්සේ මත්ස්‍යයා මසින් වැසූ වක්වූ බිලිය නොදකින්නේද, ඇමයෙහි ගිජුවූ මත්ස්‍යයා තමහට වන්නාවූ මරණය නොදනීද,

64 "මහරජ, මෙපරිද්දෙන්ම නුඹවහන්සේ චූලනී රජුගේ දූ කුමරිය නොදකියි. කාමයෙහි ගිජුව තමහට වන්නාවූ මරණය ඇමයෙහි ගිජුවූ මත්ස්‍යයාමෙන් නොදන්නෙහිය.

65 "මහරජ, ඉදින් ඔබ පඤ්චාල දෙශයට යන්නෙහි නම් වහා ජීවිතය හැරදමන්නේය. වැද්දාගේ මාර්ගයට පැමිණියාවූ

මුවෙකුට මෙන් මහත් භය පැමිණෙන්නේයයි එකල්හි මම කිවෙමි.

**66** "මහරජ, අසත්පුරුෂ ස්වභාව ඇති පුරුෂතෙම ඔඩොක්කුවෙහිවූ සර්පයෙකු මෙන් දෂ්ටකරන්නේය. ප්‍රාඥ තෙම ඔහු සමග මිත්‍රකමක් නොකරන්නේය. ඒකාන්තයෙන්ම අසත්පුරුෂයා හා එක්වීම දුක්වන්නේය.

**67** "යම් පුරුෂයෙකුම මෙතෙම සිල්වත්ය බහුශ්‍රැතයයි දන්නේද, ප්‍රාඥතෙම ඔහු සමගම මිත්‍රකම කරන්නේය ඒකාන්තයෙන් සත්පුරුෂයා හා එක්වීම සැප වන්නේයයි' පණ්ඩිතතෙම කීයේය.

**68** "මහරජ, යමෙක් උතුම් මංගල කරුණු මා සමීපයෙහි කීවෙහිද, ඒ නුඹවහන්සේ කෙළතොලු මෝඩයා වූයෙහිය. මේ අනායවූ කේවට්ටාදීන් මෙන් නගුල් කොන ගෙණ වැඩුනාවූ මම කිනම් මංගල කාරණයක් දන්නෙම්ද?

**69** "යමෙක් මගේ රත්න ලාභයට අනතුරු පිණිස කථාකෙරේ නම්, ඒ මොහු බෙල්ලෙන් අල්වාගෙණ රටින් නෙරපව් යයි" කීවෙහිය.

**70** "එම්බා මහෞෂධය, පණ්ඩිතයෝ පසුගිය දොස් කීම නමැති හුලින් නොවිදිත්. මනාව බැඳ තබනලද අසෙකුට කෙවිටකින් විදින්නාක් මෙන් පසුගිය දොස් කීම් නමැති හුලෙන් කුමට මට විදින්නෙහිද?

**71** "ඉදින් මේ දුකින් මිදීමක් දක්නෙහි නම් භයට ආරක්ෂාවක් හෝ දක්නෙහි නම්, එයින්ම මට අනුශාසනා කරව. ඉකුත්වූ දොස්කීම නමැති හුලින් කුමටවිදින්නෙහිදැයි" රජතෙම ඇසීය.

**72** "මහරජ, මෙයින් මිදීම සඳහා මිනිසුන් විසින් කළ යුතු දෙය ඉක්ම ගියේය. දැන් කළහැකිදෙයක් ලැබියයුත්තක් නැත්තේය. ඔබ මුදාගන්ට නොහැක්කෙමි. මහරජ, ඔබවහන්සේද මිදෙන උපාය දැනගනු මැනව.

**73** "සමහර රජෙකුට අහසින් ගමන් කරන්නාවූ ඍද්ධි ඇත්තාවූ යශස් ඇත්තාවූ උපොසථාදීවූ හස්තීහු වෙත්. යමෙකුට

එබඳු හස්තීහු වෙද්ද, මෙබඳු අවස්ථාවන්හි ඒ හස්තීහුද ඔවුන් හැරගෙණ අහසින් යන්නාහුය.

74 "සමහරෙකුට අහසින් යන්නාවූ ඍද්ධිමත්වූ යශස් ඇත්තාවූ වළාහකාදී අශ්වයෝ ඇත්තාහ. යමෙකුට එබඳු අශ්වයෝ වෙද්ද, මෙබඳු තන්හි ඔව්හුද අහසින් ගෙණ යන්නාහුය.

75 "සමහරෙකුට අහසින් යන්නාවූ ඍද්ධි ඇත්තාවූ යශස් ඇත්තාවූ ගරුඩාදී පක්ෂීහු වෙත්. යමෙකුට එබඳුවූවාහු වෙද්ද ඔව්හුද අහසින් හැරගෙණ යන්නාහුය.

76 "සමහරෙකු අහසින් ගමන්කරන්නාවූ ඍද්ධිමත් වූ යශස් ඇත්තාවූ යක්ෂයෝ ඇත්තාහ. යමෙකුට එබඳුවූවාහු ඇද්ද, ඔව්හුද අහසින් හැරගෙණ යන්නාහුය. ඔබවහන්සේට එබඳු වූවෙකුත් නැත.

77 "මේ සඳහා මිනිසුන් විසින් කළයුතු දෙය ඉක්ම ගියේය. දැන් කිසිවක් කළ නොහැක. කිසි උපායක් ලැබිය නොහැක. මහරජ, අහසින් ගෙණ ගොස් ඔබ මුදාගන්ට මම නොහැක්කෙමි"යි මහෞෂධතෙම කීයේය.

78 "මහත්වූ ජල සාගරයෙහි වැටී ඉව්රු නොදක්නාවූ යම් පුරුෂයෙක්වේද, හෙතෙම යම් තැනෙක්හි ගොඩබිමක් ලබාද, එහිදී හෙතෙම සැපය ලබාද,

79 "මහෞෂධය, මෙපෙරිද්දෙන්ම ඔබ අපටද රජුටද පිහිට වෙහිය. ඔබ මන්ත්‍රීවූ අප අතරෙන් ශ්‍රෙෂ්ඨ වෙහිය. එබැවින් අප මේ දුකින් මුදවයි" සේනකතෙම කීයේය.

80 "මිදීම සඳහා මිනිසුන් විසින් කළයුත්ත ඉක්ම ගියේය. දැන් කිසිවක් කළනොහැක. කිසි උපායක් නොලැබිය හැක. ඔබ මුදාගන්ට නොහැකිවෙමි. එම්බා සේනකය, ඔබද මෙයින් මිදෙන උපාය දැනගණුවයි" මහෞෂධතෙම කීයේය.

81 (i) "මාගේ මේ වචනය අසව, මේ මහත්වූ භය දක්නෙහිය. (ii) දැන් සේනක පඬිහු විචාරමියි මෙහි කුමක් කටයුතු යයි හඟින්නෙහිදැයි" රජතෙම ඇසීය.

82 "මහරජ, අපි දොර පැත්තෙන් ගෙට ගිනිදල්වමු. ඔවුනොවුන් කපා කොටා ගන්නා ආයුධ ගනිමු. ඔවුනොවුන්

හිංසාකොට වහා දිවි හරින්නෙමුයි, බ්‍රහ්මදත්ත රජතෙමේ අප බොහෝ කලක් දුකසේ නොමරාවායි" සේනක තෙම කීයේය.

38 (මෙහි 81 (i) යෙදිය යුතුයි.) දැන් පුක්කුස පඬිහු විචාරමියි මෙහි කුමක් කටයුතුයයි හඟින්නෙහිද?"

84 (i) "මහරජ, අපි විෂ අනුභවකොට මියයමු. වහා දිවිහරින්නෙමු. (ii) බ්‍රහ්මදත්ත රජතෙමේ අප බොහෝ කලක් දුක් දීමෙන් නොමරාවා."

85 (මෙහි 81 (i) යොදන්න) දැන් කාවින්ද පඬිහු විචාරමි. මෙහි කුමක් කටයුතුයයි හඟින්නෙහිද?"

86 "මහරජ, අපි රැහැනින් බැඳ එල්ලී මියයමු. ප්‍රපාතයකින් පැන යමුයි. (මෙහි 84 (ii) යොදන්න)

87 "(මෙහි 81 (i) යොදන්න) දැන් දේවින්ද නම් පඬිහු විචාරමි. මෙහි කුමක් කටයුතුයයි හඟින්නෙහිද?"

88 "මහරජ, මහෞෂධ පණ්ඩිතතෙම අපි සුවසේම නිදන්ට නොහැකිවේ නම් දොර පැත්තෙන් ගෙට ගිනිදල්වමු ඔවුනොවුන් කපාගන්නා ආයුධ ගනිමු. එකිනෙකාට වධකොට වහා දිවිහැරගන්නෙමුයි" දෙවින්දතෙම කීයේය.

89 "යම්සේ කෙසෙල්ගසක හරය සොයමින් එය නොලබාද මෙසේම මිදීමට උපාය සොයන්නවුන්ගෙන් ප්‍රශ්නය විසඳීම නොලැබීමු.

90 "යම්සේ ඉඹුල්ගසක හරය සොයමින් එය නොලබාද, මෙසේම මිදීමෙහි උපාය සොයන්නවුන්ගෙන් ප්‍රශ්න විසඳීම නොලැබීමු

91 "කිසිවක් නොදන්නාවූ අඥානවූ අයහපත් මිනිසුන් සමීපයෙහි අපගේ විසීම දිය නැති ප්‍රදෙශයෙහි ඇතුන්ගේ විසීම මෙන් ඒකාන්තයෙන් නුසුදුසු ප්‍රදෙශයෙහි විසීමක් විය.

92 "මාගේ හෘදය මහත් සේ වෙව්ලයි, මුඛයද වියලේ. ගින්නෙන් දනලද පුරුෂයෙක් අව්වෙහි සිටියාක් මෙන් නිවීමකට නොපැමිණෙමි.

93 "යම්සේ කඹුරන්ගේ උදුන ඇතුළත ඇවිලේද එය පිටතට නොපෙණේද, මෙසේම මාගේ හෘදය ඇතුළත ඇවිලෙයි. එය පිටතට නොපෙණේයයි" රජතෙම වැළපුනේය.

94 ඉක්බිති ප්‍රාඥවූ අර්ථ දක්නා සුළුවූ ඒ මහෞෂධ පණ්ඩිතතෙම දුකට පැමිණියාවූ වේදේහ නම් රජු දැක මේ වචනය කීයේය.

95 (i) මහරජ, ඔබවහන්සේ බිය නොවෙනු මැනව. රථ ශ්‍රෙෂ්ඨය, ඔබවහන්සේ බිය නොවෙනු මැනව. (ii) රාහු විසින් ගන්නාලද චන්ද්‍රයා මෙන් (iii) මම ඔබවහන්සේ මුදාගන්නෙමි.

96 (95 (i) යොදන්න.) රාහු විසින් ගන්නාලද සූයර්‍යයා මෙන් මම ඔබවහන්සේ මුදාගන්නෙමි.

97 (95 (i) යොදන්න.) මඩෙහි ගැලුනාවූ ඇතෙකු මෙන් (95 (iii) යොදන්න.)

98 (95 (i) යොදන්න.) පැසෙක බැඳ සිරකරණ ලද්දාවූ සර්පයෙකුමෙන් (95) (iii) යොදන්න.)

99 (95 (i) යොදන්න) දැලට අසුවූ මත්ස්‍යයන් මෙන් (95 (iii) යොදන්න.)

100 (95 (i) යොදන්න.) රථසේනා බලවාහන සහිතවූ ඔබ මුදා ගන්නෙමි.

(95 (i) යොදන්න.) පඤ්චාල රජහුගේ සෙනඟ කැටකින් ගැසූ කව්ඩු රැළක් මෙන් මම පලවා හරින්නෙමි.

101 "යම් ඇමතියෙක් කරදරයට පැමිණියාවූ ඒ රජක්හු දුකින් නුමුදන්නේද, එබඳු ඇමතිතෙමේ කවර ප්‍රයෝජන ඇත්තේද, ඔහුගේ ප්‍රඥාව නම් කුමක් ප්‍රයෝජන කොට ඇත්තීදැයි" මහෞෂධතෙම රජු සැනසීය.

102 "එම්බා තරුණයිනි, මෙහි එව්, උමංදොර හරිව්. ගෙවල්වල දොරවල්ද හරිව්. වේදේහ නම් රජතෙම ඇමතියන් සමග උමගින් ගමන් කරන්නේයයි" මහෞෂධතෙම කීයේය.

103 ඔහුගේ ඒ වචනය අසා පණ්ඩිතයාගේ අනුචරයෝ උමංදොර හැරියාහු යතුරු දමන ලද අගුළු ඇති දොරකව්ලුද හැරියාහුය.

104 සේනකතෙම ඉදිරියෙන්ද මහෞෂධතෙම පස්සෙන්ද ඇමැතියන් විසින් පිරිවරණ ලද වෛදෙහ රජතෙම මධ්‍යයෙහිද ගමන් කරයි.

105 උමගින් නික්ම වෛදෙහ රජතෙම නැවට නැගුනේය. නැවට නැංගාවූද ඔහු දැන මහෞෂධතෙම අනුශාසනා කෙළේය.

106 "දේවයන්වහන්ස, මේ පඤ්චාල චණ්ඩකුමාරතෙම ඔබගේ මයිලනුවන් පුත්‍රවේ. ජනාධිපතිය, මේ නන්දා දේවිතොමෝ නැන්දාවේ. මවට පිළිපැදීම යම්සේද ඔබගේ නැන්දනියටද මෙසේම පිළිපදීවා

107 "මහරජ, සමාන උදර ඇත්තාවූ එක මවගෙන් උපන්නාවූ ස්වකීය සහෝදරතෙම යම්සේද මෙසේම පඤ්චාල චණ්ඩ කුමාරතෙම ඔබ විසින් ආදර කටයුත්තේය.

108 "මේ පඤ්චාලචණ්ඩී තොමෝ ඔබ විසින් කැමති වන ලද රාජ කුමාරිකාවයි. ඈ සමග ඔබට කැමැත්තක් කරව, මහරජ, මෝතොමෝ ඔබගේ භාර්‍ය්‍යාවයයි" මහෞෂධ තෙම අනුශාසනා කෙළේය.

109 "එම්බා මහෞෂධය, ඉක්මන්කොට නැවට නැගෙව, කුමකට ඉව්රෙහි සිටින්නෙහිද? ඉතා අමාරුවෙන් දුකින් මිදුනෙමු දැන් අපි යමුයි" රජතෙම කීයේය.

110 "මහරජ, යමෙක් සෙනඟට නායකවේද, ඒ මම සේනා කොටස් හැරදමා තමන් මිදෙන්නෙම් නම් මෙතෙම ස්වභාව ධර්මයෙක් නොවේ.

111 "දෙවයන් වහන්ස, ඔබගේ ඒ නගරයෙහි සේනා කොටස් හැරදමන ලදී. මහරජ, බඹදත් රජහු විසින් දෙන ලද ඒ සෙනඟ හැරගෙණ එන්නෙමි" මහෞෂධතෙම කීයේය.

112 "මද සේනා ඇත්තෙක් මහත්වූ සේනා ඇත්තෙකුට කෙසේ නම් පහරගසා සිටින්නෙහිද? පණ්ඩිතය, දුර්වල තෙමේ බලවතා විසින් නසනු ලබන්නේයයි" රජතෙම කීයේය.

113 "ඉදින් මදසේනා ඇත්තේද ප්‍රඥා ඇත්තේ නම් ප්‍රඥා ඇත්තාවූ මහත් සෙනඟ ඇත්තහු දිනයි කුමක් මෙන්ද යත්,

උදාවන්නාවූ හිරු අඳුරු දුරු කරන්නාක්මෙන් ප්‍රඥා ඇති රජතෙම ප්‍රඥා නැති රජුන් ජයගනීයයි” මහෞෂධ තෙම කීයේය.

114 “එම්බා සේනකය, මහෞෂධතෙම මැදිරියක බැඳුනු පක්ෂින් මෙන්ද, දැලට අසුවූ මසුන් මෙන්ද, සතුරන් අතට අසුවූ අප මුදාගත්තේය. එබැවින් පණ්ඩිතයන් සමග එක්ව විසීම ඒකාන්තයෙන් යහපත් සැපයකැයි” රජතෙම කීයේය.

115 “මහරජ, මේ කාරණය මෙසේමැයි පණ්ඩිතයෝ වනාහි සුව එළවන්නාහුම වෙත්. මහෞෂධතෙම මැදිරියෙහි බැඳුනාවූ පක්ෂීන් මෙන්ද දැළකට අසුවූ මසුන් මෙන්ද සතුරන් අතට අසුවූ අප මුදාගත්තේයයි” සේනකතෙම කීයේය.

116 මහත් බල ඇත්තාවූ චූළනී බ්‍රහ්මදත්ත රජතෙම සියලු රාත්‍රියෙහි රැකසිට අරුණු නැගෙණ කල්හි උපනාරී නගරය වෙතට පැමිණියේය.

117 මහත් බල අත්තාවූ චූළනී බ්‍රහ්මදත්ත නම් පඤ්චාල රජතෙම බල ඇත්තාවූ සැට අවිරුද්දෙන් මද වැහෙන්නාවූ උතුම් ඇතෙකුට නැග තමන්ගේ සෙනඟට මෙසේ කීයේය.

118 මාණික්‍ය සන්නාහයෙන් සැරසුනාවූ රජතෙම අතින් හියක්ගෙණ රැස්වූ බොහෝ ශිල්ප දන්නා පනිවිඩ කාර ඇමතියන්ට පළමුකොටම කීයේය.

119 ඇතරුවන්ටද අසරුවන්ටද රථිකයන්ටද පාබල හමුදාවන්ටද දුනු ශිල්පයෙහි දක්ෂවූ රැස්වූ වාලවේදී ධනුර් ධරයන්ටද මෙසේ කීයේය.

120 “සැට අවිරුද්දෙන් මද වැහෙන්නාවූ ශක්ති සම්පන්නවූ දළ ඇත්තාවූ ඇතුන් මෙහෙයවව්, ඒ ඇත්තු වේදේහ රජු නිසා ගොඩනගන ලද නුවර මඩිත්වා.

121 “වස්සන්ගේ දත් මෙන් මුහුණත ඇති සියුම්වූ තුඩු ඇති ඇට පලා විදින්නාවූ දුන්නෙහි වේගයෙන් හරින ලද ඊතල වර්ෂාව මෙන් මතුමත්තෙහි පතිත කෙරෙත්වා.

122 “තරුණවූ යුද්ධ සැට්ට ලන ලද්දාවූ ශූරවූ විසිතුරු දඬුවලින් යුත් ආයුධ ගත්තාවූ යුද්ධයෙහි ඉදිරියට පැන යන්නාවූ

මහත්වූ ඇතුන් පවා සිඳීමට සමර්ථවූ යෝධයෝ ඇතුන් හමුවෙහි සිටිත්වා.

123 "තෙලින් දෝනාලද ගිනිසිළු වැනි සෝභා ඇති පැහැ විහිදෙන්නාවූ සිරිය නම් ආයුධ ගත්තාහු සිය ගණන් රශ්මි ඇති තාරකා මෙන් බබළමින් සිටිත්වා.

124 "ආයුධ බලයෙන් යුක්තවූ යුද්ධසැට්ට හා අඟු පළඳනා (බාහු වළලු) දරන්නාවූ යුද්ධ භූමියෙහි පැන නොයන්නාවූ මෙබඳුවූ යෝධයන්ගෙන් වෙදෙහතෙම කොයින් මිදෙන්නේද, ඉදින් පක්ෂියෙකු මෙන් අහසින් ගමන් කරන්නේද, නොමිදෙන්නේය.

125 "මුළු පොළොවෙහි හැසිර සොයන්නේ යම් කෙනෙකුන්ට සමානයෙකු නොදක්නෙම්ද එබඳුවූ එක එක තෝරා ගන්නාලද මාගේ සියලුම යෝධයෝ තිස් දහසක් පමණ වෙත්.

126 "යම් ඇතුන්ගේ පිට උඩ මනොඥ දර්ශන ඇති කුමාරයෝ බබළත්ද, එබඳුවූ සරසනලද දළ ඇත්තාවූ බළයෙන් යුක්තවූ සැට හවිරුද්දෙන් මඳ වැහෙන්නාවූ මහත් හස්තීහුද ඇත්තාහ.

127 "රන්වන් අලංකාරයෙන් සැරසුනාවූ රන්වන් වස්ත්‍ර ඇත්තාවූ රන්වන් උතුරුසළු ඇත්තාවූ කුමාරයෝ නන්දන වනයෙහි දිව්‍ය පුත්‍රයන් මෙන් ඇතුන් පිට බබළත්.

128 "පෙටියන්ට බඳු පැහැ ඇති තෙලින් දෝනාලද පැහැ විහිදෙන්නාවූ දක්ෂ ශිල්පීන් විසින් නිමවන ලද සියුම් මුවහත් ඇති මනාව මුවහත් කරණලද කඩුද වෙත්.

129 "හිරුරැස් මෙන් බබළන්නාවූ පහවූ මළ ඇති සික්කා නම් යඩකින් කරණලද්දාවූ දෘඪවූ ඒ කඩු, තදින් පහර දීමෙහි දක්ෂවූ ශක්තිමත්වූ යෝධයන් විසින් ගන්නා ලද්දාහ.

130 "ස්වර්ණමය කඩුමිටින් යුක්තවූ ලේවන් කොපුවලින් දරන්නාවූ ඒ කඩු එහා මෙහි පෙරලෙන්නාහු ඝන වළාකුලෙක්හි විදුලිය මෙන් බබළත්.

131 "යුද්ධ සැට්ට දරන්නාවූ ශූරවූ කඩු පළඟ දැරීමෙහි දක්ෂවූ කඩු ශිල්පයෙහි මනාව හික්මුනාවූ ඇතුන්ගේ කඳ පවා කපා හෙළන්නාවූ පතාක නම් යෝධයෝ ඇත්තාහ.

132 "වෛදේහය, මෙබඳු යෝධයන් විසින් වට කරණ ලද නුඹට මෙයින් මිදීමක් නැත. යමකින් නුඹ මියුළු නුවරට යන්නේද, ඔබගේ එබඳු ශක්තියක් නොදකිමියි" බ්‍රහ්මදත්ත රජතෙම කීයේය.

133 "මහරජ, කුමකට ඉතා ඉක්මනට මේ හස්ති රාජයා මෙහෙයවන්නෙහිද, ඉතා සතුටු ස්වභාව ඇතිව ඉදිරියට එන්නෙහිය. කිම සමෘද්ධවූ කටයුතු ඇත්තෙමියි සිතන්නෙහිද?

134 "මහරජ, මේ වෘෂ නම් දුන්න බහා තබව, ඊතලය අකුලාගණුව යහපත්වූ වෛඩූර්‍ය්‍ය මාණික්‍යයෙන් අතුරණ ලද මේ පලිහ බහා තබවයි" මහෞෂධතෙම කීයේය.

135 "ප්‍රසන්නවූ මුහුණෙහි පැහැ ඇත්තෙහිය. සිනහ පෙරදැරි කොටද කථා කරන්නේය. මරණය ලංවූ කල්හි එබඳුවූ වර්ණ සම්පත්තියක් ඇතිවේමයයි" චූළණී රජතෙම කීයේය

136 "මහරජ, ඔබගේ ගර්ජනාව හිස්වේ. මහරජ, ඔබ බිඳුනු මන්ත්‍රණ ඇත්තේ වෙහිය. කොටළුවෙකු විසින් ලුහුබඳවා අශ්වයෙක් අල්වාගන්ට බැරුවාක් මෙන් වේදේහ රජතෙම ඔබ විසින් අල්වාගත නොහැක්කේ මැයි.

137 "මහරජ, අපගේ රජතෙම ඇමතියන් සහිතව පිරිවර ජනයාද සමග ඊයේම ගඟින් එතරව ගියේය. ඔහු ලුහුබඳින්නේ හංස රාජයෙකු ලුහුබැඳ දුවන්නාවූ කව්ඩෙකු මෙන් අතරමගම වැටෙන්නේයයි" පණ්ඩිතතෙම කීයේය.

138 "සිවල්ලු රාත්‍රි කාලයෙහි පිපියාවූ කැල ගසක් හඳ එළියෙන් දැක මස්පිඩු යයි සිතමින් පිරිවරණ ලද්දාහු මෘගයන්ගෙන් අධමවූ ඔව්හු බලා සිටිත්.

139 "රාත්‍රිය ඉක්ම ගියකල්හි හිරු උදාවූ කල්හි පිපුනු කැල ගස දැක, යම්සේ ඒ නීචවූ සිව්පාවෝ ආශාව සිඳුනාහු වෙද්ද?

140 "මහරජ, මෙපරිද්දෙන්ම ඔබ වේදෙහ රජු පිරිවරා සිට සිවල්ලු කැල ගස හැර යන්නාක් මෙන් ආශාව සිඳ යන්නෙහියයි" මහෞෂධතෙම කීයේය.

141 "යමක් මාගේ අතට අසුවූ වේදේහ නම් සතුරා මුදා හැරියේද, ඒ මොහුගේ අත් පාද කන් නාස්ද කපව්.

142 "යමෙක් මාගේ අතට අසුවූ වේදේහ නම් සතුරා මුදා හැරියේද, ඒ මේ ගොවියා පුතු පිසිය යුතු මසක් මෙන් හුලෙහි ඇන පිසත්වා.

143 "යම්සේ වෘෂභයෙකුගේ සමක් හෝ සිංහයෙකුගේ සමක් හෝ තවද ව්‍යාඝ්‍රයෙකුගේ සම හෝ හුල් අනින ලදුව පොළොවෙහි පතුරවනු ලැබේද,

144 "මෙසේම මාගේ අතට අසුවූ වේදේහ නම් සතුරා යමෙක් මුදා හැරියේද ඔහු පොළොවෙහි වතුරුවා හුලෙන් අනින්නෙමියි" චූලනී රජතෙම කීයේය.

145 (i) "මහරජ, ඉදින් මාගේ අත් දෙකද පා දෙකද කන් හා නාසයද සිඳින්නෙහි නම්, (ii) අපගේ වේදේහ රජතෙම පඤ්චාල චණ්ඩ කුමරුගේද මෙසේ සිඳවන්නේය.

146 (මෙහි 145 (i) යෙදිය යුතුයි) අපගේ වේදේහ රජතෙම පඤ්චාල චණ්ඩි කුමරියගේද මෙසේම සිඳවන්නේය.

147 (145 (i) යොදන්න.) අපගේ වේදේහ රජතෙම නන්දා දේවියගේද මෙසේම සිඳවන්නේය.

148 (145 (i) යොදන්න.) අපගේ වේදේහ රජතෙම ඔබගේ අඹුදරුවන් ගේද මෙසේම සිඳවන්නේය.

149 "(i) මහරජ, ඉදින් පිසිය යුතු මසක් මෙන් මා හුලෙහි ඇන පිසන්නෙහි නම් (ii) අපගේ වේදේහ රජතෙම පඤ්චාල චණ්ඩ කුමරුගේ මස්ද මෙසේ පිසවන්නේය.

150 (149 (i) යොදන්න.) අපගේ වේදේහ රජතෙම පඤ්චාල චණ්ඩි කුමරියගේ මස්ද මෙසේ පිසවන්නේය.

141 (149 (i) යොදන්න.) අපගේ වේදේහ රජතෙම නන්දා දේවියගේ මසද මෙසේ පිසවන්නේය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

152 (149 (i) යොදන්න.) අපගේ වේදේහ රජතෙම ඔබගේ අඹුදරුවන්ගේ මසද මෙසේ පිසවන්නේය.

153 (i) "මහරජ ඉදින් මා බිම වතුරුවා හුල් ගසන්නෙහි නම් (ii) අපගේ වෙදෙහ රජතෙම පඤ්චාල චණ්ඩ කුමරුගේද මෙසේ හුල් ගසන්නේය.

154 (153 (i) යොදන්න.) අපගේ වේදෙහ රජතෙම පඤ්චාල චණ්ඩි කුමරියගේද මෙසේ හුල් ගසන්නේය.

155 (153 (i) යොදන්න.) අපගේ වේදෙහ රජතෙම නන්දා දේවියගේද මෙසේ හුල් ගසන්නේය

156 (153 (i) යොදන්න.) අපගේ වේදෙහ රජතෙම ඔබගේ අඹුදරුවන්ගේදෙ මෙසේ හුල් ගසන්නේය. මෙසේ අපගේ වේදෙහ රජ විසින් මා සමග රහසිගතව මන්ත්‍රණය කරණ ලදී.

157 "යම්සේ කොන්තිමන්තී නම් සම් කරුවන්ගේ ශස්ත්‍රයෙන් මනාව නිමවන ලද පලසත නම්වූ සම ඊතල වැලැක්වීමට සිරුර ආරක්ෂා කිරීමට සුදුසුවේද,

158 "එමෙන් මම යශපිරිවර ඇත්තාවූ වේදෙහ නම් රජුට සුවඑළවන්නෙක් වෙමි. දුක දුරුකරන්නෙක් වෙමි. පලසත නම් චර්මයෙන් ඊතල මෙන් ඔබගේ ප්‍රඥාව නසන්නෙමියි" පණ්ඩිත තෙම කීයේය.

159 "මහරජ, එබැවින් ඔබගේ සිස්වූ අන්තඃපුරය බලව. මහරජ, ඔබගේ දේවියද කුමාරයෝද මවද යන මොහු උමගින් හැරගෙණ විත් වේදෙහ රජුට බාරදෙන ලද්දාහුයයි" පණ්ඩිතතෙම කීයේය.

160 "එසේ නම් මාගේ අන්තඃපුරයට ගොස් මොහුගේ වචනය ඇත්තක් හෝ බොරුවක්දැයි එය සොයා බලව්යයි" රජතෙම ඇමතියෙකු යැවීය.

161 "මහරජ, මහෞෂධතෙම යම්සේ කීයේද, මෙය මෙසේමය. සියලු සිස්වූ අන්තඃපුරය කවුඩන් රැස්වූ පටුනක් මෙන් වීයයි" ඇමතිතෙම කීයේය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**162** "මහරජ, රන්පෝරුවක් වැනි මනා කටිප්‍රදෙශ ඇති හංසධෙනුවකගේ මෙන් මිහිරි කථා ඇති සියලු ශරීරාවයවන්ගෙන් ශෝභමානවූ ස්ත්‍රියක් නන්දා දේවීතොමෝ මේ උමගින් ගියාය.

**163** "මහරජ, හඳිනා ලද කොශෙය්‍ය වස්ත්‍ර ඇති ස්‍යාම වර්ණවූ පැළැඳි ස්වර්ණමය මනා මෙවුල්දම් ඇති සියලු ශරීරාවයවයන්ගෙන් හොබනා ස්ත්‍රියක්වූ නන්දා දේවීතොමෝ මේ උමගින් ගෙණයන ලද්දීය.

**164** "ඒ නන්දා දේවිතොමෝ ඉතා රත් පා ඇත්තීය. පඤ්චකලඵාණයෙන් යුක්තය. රන්මිණි මෙවුල් ඇත්තීය. පරෙවියන්ට බඳු ඇස් ඇත්තීය. ශොභන ශරීර ඇත්තීය. බිඹුපලවන් තොල් ඇත්තීය. කෘශවූ මධ්‍යප්‍රදෙශ ඇත්තිය.

**165** "තවද ඕතොමෝ මනාව හටගත් කළුවැල් ගොබයක් මෙන් බබළන්නීය රන් වේදිකාවක් මෙන් සිහින් මධ්‍ය ප්‍රදෙශ ඇත්තීය. ඇගේ කාළවර්ණවූ දික්වූ කේශයෝ මදක් අගින් නැමුනාහුය.

**166** "තවද ඕතොමෝ මනාව උපන්නාවූ මෘගපෝතිකාවක් වැනිය. හේමන්ත ඍතුවෙහි ගිනිසිලක් මෙන් බබලන්නීය. පර්වත දුර්ගයන්හි දියහුණ වලින් ගැවසීගත් ගංගාවක් වැනි රෝමරාජියෙන් බබලන්නීය.

**167** "තවද ඕතොමෝ ඇත්සොඬට බඳු ඌරුයුග්ම ඇත්තීය, සුන්දරවූ ප්‍රථම වයස් ඇත්තීය, තිඹිරි පලවන් පියවුරු ඇත්තීය, ඉතා දික්නුවූවා ඉතා කොට නොවූවා ලොම් රහිත නොවූවා අධික ලොම් වලින් ගැවසීගත්තීද නුවූවායයි" පණ්ඩිත තෙම කීයේය.

**168** "ශ්‍රීමත් වාහණ ඇති මහරජ ඒකාන්තයෙන් ඔබ මෙබඳුවූ නන්දා දේවියගේ මරණයෙන් සතුටුවෙහි නම් මමද නන්දා දේවියද ඒකාන්තයෙන් යමරජු සමීපයට යම්හයි" පණ්ඩිත තෙම කීයේය.

169 "එම්බා මහෞෂධය, යමෙක් මා අතට අසුවූ වේදෙහ නම් සතුරා මුදාහැරියේද, ඒ නුඹ දිව්‍යවූ මායාවක් දන්නෙහිද, නොහොත් ඉන්ද්‍රජාලයක් කෙළේදැයි" රජතෙම ඇසීය.

170 "මහරජ මේ ලෝකයෙහි පණ්ඩිතයෝ දිව්‍යවූ මායාව ඉගෙණගනිත්. ඒ ප්‍රඥා ඇත්තාවූ පණ්ඩිත ජනයෝ තමන් මුදාගණිත්.

171 "යම් කෙනෙකුන් කරණ ලද උමං මගකින් වේදෙහ රජතෙම මියුළු නුවරට ගියේද, එබඳු උමං කැපීමෙහි දක්ෂවූ මාගේ තරුණ යෝධයෝ ඇත්තාහුයයි" පණ්ඩිතතෙම කීයේය.

172 "මහරජ, එසේවීනම් ඇතුන්ගේද අසුන්ගේද රථයන්ගේද පාබල හමුදාවන්ගේද සිතුවම්වලින් යුක්තවූ මනාකොට නිමවන ලද මේ උමග බලනු මැනව. ඒකාලෝකව තිබෙන්නාවූ මේ උමග මනාකොට නිමවනලදැයි" පණ්ඩිතතෙම කීයේය.

173 "එම්බා මහෞෂධය, ඔබ යම්සේ වෙහිද, මේ එබඳු පණ්ඩිතයෝ යමෙකුගේ රටෙහිද ගෘහයෙහිද වෙසෙත් නම් ඒ විදෙහ රට වැස්සන්ට ඒකාන්තයෙන් ලාභයකැයි," චූලනී රජ කීයේය.

174 "එම්බා මහෞෂධ පණ්ඩිතය, ජීවන වෘත්තියද ගම් නියම් ගම් දීමද බත් වැටුප් දීමද ඔබට මම දෙගුණ කොටදෙමි. මහත්වූ සම්පත්තිය අනුභව කරව, කාමසම්පත්තියෙහිද, සිත් අලවා වාසය කරව. විදෙහරටට පෙරළා නොයව, වේදේහ රජතෙම කුමක් කරන්නේදැයි" බඹදත් රජතෙම කීයේය.

175 "මහරජ, යමෙක් ධනහේතුවෙන් ස්වාමියා හැර දමන්නේද, හෙතෙම තමන්ද අනුන්ද යන දෙදෙනා විසින්ම ගැරහිය යුත්තෙක්වේ. එබැවින් වෙදෙහ රජතෙම යම්තාක් ජීවත්වන්නේ නම් ඒතාක් අන් රජෙකුගේ පුරුෂයෙක් නොවන්නෙමි.

176 "මහරජ, යමෙක් වස්තුව හෙතුකොටගෙණ ස්වාමියා හැරදමන්නේද, හෙතෙම තමන්ද අනුන්ද යන දෙදෙනා විසින්ම ගැරහිය යුත්තෙක්වේ. එහෙයින් මම වේදේහ රජතෙම

යම්තාක් ජීවත්ව සිටින්නේද, ඒතාක් අන් රජෙකුගේ විජිතයෙහි නොවසන්නෙමියි” පණ්ඩිත තෙම කීයේය.

177 “මහෞෂධ පණ්ඩිතය, මම ඔබට රන් නිෂ්ක දහසක් දෙමි. කසී ජනපදයෙහිවූ ගම්වර අසූවක්ද දෙමි. දාසීන් සාරසියයක්ද දෙමි. ස්ත්‍රීන් සියයක්ද ඔබට දෙමි. සියලු සේනා කොටස් හැරගෙණ සුවසේ මියුළු නුවරට යවයි” රජතෙම අවසර දුන්නේය.

178 “ඇතුන්ටද අසුන්ටද යම්තාක් සෑහේද, එය දෙගුණකොට වියදම දෙත්වා රථ සේනාවන්ද පාබල සේනාවන්ද ආහාරපානයෙන් සතුටු කෙරෙත්වායි” රජ තෙම නියම කෙළේය.

179 “එම්බා පණ්ඩිතය, ඇතුන්ද අසුන්ද රථයන්ද පාබල සෙනගද හැරගෙණම යව. වෙදෙහ නම් මහරජතෙමේ සුවසේ මියුළු නුවරට ගියාවූ ඔබ දකීවායි” චූළනී රජතෙම මහෞෂධ පණ්ඩිතයන් පිටත් කෙළේය.

180 “හස්තිය අශ්වය රථය පාබල සෙනගය යන මහත්වූ භය ජනක ස්වභාව ඇති චතුරංගිනී සේනාව දක්නා ලැබේ. පණ්ඩිතයෝ මෙහි කුමක් හඟිත් දැයි” වේදේහ රජතෙම ඇසීය.

181 “මහරජ, ඔබගේ සතුටුවූ උතුම් පණ්ඩිතතෙම දක්නා ලැබේ. මහෞෂධතෙමේ සියලු සේනාංග හැරගෙණ සුවසේ මෙහි පැමිණියේයයි” සේනකතෙම කීයේය.

182 “එම්බා මහෞෂධ පණ්ඩිතය, යම්සේ සතර දෙනෙක් පරලොව ගියහු සොහොනෙහි හැරදමා එද්ද, මෙපරිද්දෙන් ඒ අපි කම්පිල්ල නරගයෙහි ඔබ හැරදමා මෙහි ආයෙමු

183 “එසේ ඇතිකල්හි ඔබ කෙබඳු ආකාරයකින් හෝ කවර හේතුවකින් කිනම් අර්ථ ජාතයකින් හෝ සතුරාගෙන් තමා මිදී ආයේදැයි” රජතෙම ඇසීය.

184 “එම්බා වෙදෙහරජ, තමා සිතනලද අර්ථයෙන් ඔවුන් සිතූ අර්ථයද, තමාගේ මන්ත්‍රණයෙන් ඔවුන් මන්ත්‍රණයද,

පිරිවැරූයෙමි. එපමණක් නොව ජම්බුද්වීපය පිරිවැරූ සාගරය මෙන් රජහුද පිරිවරා ගත්තෙමියි" මහෞෂධ තෙම සියලු ප්‍රවෘත්තිය කීයේය.

185 "තවද මහරජ, චූලනී රජු විසින් මට රන්නිෂ්ක දහසක්දෙන ලදී. කශීදනව්වෙහිවූ ගම්වර අසූවක්ද දෙන ලදී. දාසීන් සාර සියයක්ද ස්ත්‍රීන් සියයක්ද මට දෙන ලදී. මම සියලු සේනා කොටස් හැරගෙණ මෙහි සුවසේ පැමිණියෙමියි" පණ්ඩිතතෙම කීයේය.

186 "එම්බා සෙනකය මැදිරියෙක්හි බැඳුනු පක්ෂින් මෙන්ද දැලකට අසුවූ මසුන් මෙන්ද, සතුරන් අතට අසුවූ අප මහෞෂධතෙම මිදුනේය. එහෙයින් පණ්ඩිතයන් සමග වාසය කිරීම ඉතා සැපයකැයි" රජතෙම ප්‍රීතිය ප්‍රකාශ කෙළේය.

187 "මහරජ මේ කාරණය මෙසේමය, පණ්ඩිතයෝ වනාහි සුව එළවන්නාහුවෙත්. මැදිරියෙක්හි බැඳුනු පක්ෂීන් මෙන්ද දැලකට අසුවුනු මත්ස්‍යයන් මෙන්ද සතුරන් අතට අසුවූ අප මහෞෂධතෙම යම්හෙයකින් මිදුයේද, එහෙයිනැයි" සේනකතෙම කීයේය.

188 "සියලු වීණාද මහබෙරද පණාබෙරද වාදනය කෙරෙත්වා, මගධ දෙශයෙහිවූ සක්පිඹිත්වා. මහබෙරය මිහිරිකොට වාදනය කෙරේවායි" රජතෙම සැණකෙළි නියම කෙළේය.

189 අන්තඃපුරවැසි ස්ත්‍රීහුද කුමාරයෝද වෛශ්‍යයෝද බ්‍රාහ්මණයෝද බොහෝවූ ආහාරද පානවර්ගද පණ්ඩිතයන්ට පැමිණවූහ.

290 හස්තාරෝහකයෝද අශ්වාරෝහකයෝද රථ නගින්නාහුද පාබල සේනාවෝද බොහෝවූ ආහාරද පාන වර්ගද පණ්ඩිතයන් වෙතට පැමිණවූහ.

191 රැස්වූ දනව් වැස්සෝද එහි පැමිණියාවූ නියම් ගම් වැස්සෝද බොහෝවූ ආහාරද පානවර්ගද පණ්ඩිතයන් වෙතට පැමිණවූහ.

192 ආකල්හි පණ්ඩිතයන් දැක බොහෝදෙනා ප්‍රසන්න විය. පණ්ඩිතයා මියුළු නුවරට පැමිණි කල්හි සතුටුවූ මහ ජනතෙම පිළිහිස සිසෑරීම පැවැත්වීයයි වදාළේය

193 "මහරජ, ගැඹුරුවූ දිය සයුරෙක්හි නැවකින් ගමන් කරන්නාවූ ඔබගේ මව ආදී සත්දෙනා අතුරෙන් මිනිස් බිලියක් සොයන්නාවූ දියරකුසෙක් නැව අල්වා ගන්නේ නම් පිළිවෙළින් ඔහුට කවරෙකු කෙසේ දී දියරකුසා අතින් මිදෙන්නෙහිදැයි" භේරී නම් පරිව්‍රාජිකාව ඇසීය.

194 "ස්වාමීනි, පළමුකොට මව දෙන්නෙමි. දෙවනුව භාර්‍ය්‍යාව දී තුන්වෙනුව සහෝදරයා දෙන්නෙමි. ඉන්පසු සතරවෙනුව යහළුවා දී පස්වෙනුව බ්‍රාහ්මණයා දෙන්නෙමි. සවෙනුව මම තමන් දෙන්නෙමි. මහෞෂධ පඬිහු නොම දෙන්නෙමියි" රජතෙම කීයේය

195 "මහරජ, ඔබගේ මව ඔබ පොෂණය කළ තැනැත්තීවේ. ඔබගේ වැදූ මවදවේ. බොහෝ කලක් අනුකම්පා ඇත්තීදවේ. ඡම්භි නම් බ්‍රාහ්මණයා ඔබ කෙරෙහි ප්‍රදූෂ්‍යවූ කල්හි පණ්ඩිතවූ අර්ථ දක්නා සුළුවූ ඕතොමෝ අනිකෙකු ආශ්‍රයකොට ඔබ වධයෙන් මිදවීය.

196 "ඒ එබඳුවූ ප්‍රාණය දුන්නාවූ ලෙහිකොට වැඩූ ගර්භයෙන් දැරූ මව කවර දොෂයකින් දියරකුසාට දෙන්නෙහි දැයි" පරිව්‍රාජිකාව ඇසීය.

197 "මහළුවූවත් තරුණියක මෙන් නොපැළඳිය යුතුවූ ආභරණ පළඳියි. දොරටුපාලයන්ද, සේනාවල සිටියවුන්ද සමග සීමාව ඉක්මවා මහත්කොට සිනාසෙයි.

198 තවද සමීප රජුන්ට තොමෝ දූතයන් අත මා කී ලෙස හඟවා ලියා යවයි. ඒ දොෂයන් නිසා මම මව දියරකුසාට දෙන්නෙමියි" රජතෙම කීයේය.

199 "මේ නන්දා දේවීතොමෝ ස්ත්‍රී සමූහයාට උතුම්වූ ඉතාමත් ප්‍රිය තෙපුල් ඇති තරුණකල්හි පටන් අනුව ගියාවූ

ආචාර ගුණයෙන් යුක්තවූ සෙවනැල්ල මෙන් නොහැර පවත්නාවූ

200 "නොකිපෙන සුළුවූ ප්‍රඥා ඇත්තාවූ පණ්ඩිතවූ අර්ථ දක්නාසුළු තැනැත්තියක්වේ. එබඳු අගමෙහෙසිය කවර දොසයකින් දියරකුසාට දෙන්නෙහිදැයි" පරිව්‍රාජිකාව ඇසීය.

201 "කාම ක්‍රීඩාරතියෙන් යුක්තවූ අනර්ථකර කෙලෙසුන්ගේ වසඟයට ගියාවූ මාගෙන් ඒ නන්දා දේවි තොමෝ ස්වකීය දරුවන්ගේ නොඉල්වියයුතු වස්තුව ඉල්වයි.

202 "කෙළෙස් වශයෙන් ඇළුනාවූ ඒ මම ඒ කුදු මහත් ධනය වහාදෙමි. නොදියයුත්ත දී පසුව මම නොසතුටුව ශෝක කරමි. ඒ දොෂයෙන් මම අගබිසව දියරකුසාට දෙන්නෙමියි" රජතෙම කීයේය.

203 "මහරජ, යමෙකු විසින් ජනපද වඩනා ලද්දාහුද පිටරට සිටි ඔබ නැවත ගෙදරට පමුණුවන ලද්දාහුද පිටරට වලින් ඔවුන් අභිභවනයකොට බොහෝ වූ ධනය ගෙණෙන ලද්දේද,

204 "ධනුර්ධරයන්ගෙන් උතුම්වූ ශුරවූ සියුම් ප්‍රඥා ඇති ඒ සහෝදරයා කවර දොෂයකින් දිය රකුසාට දෙන්නෙහිදැයි" පරිව්‍රාජිකාව ඇසීය.

205 "මා විසින් ජනපදයෝ වර්ධනය කරණ ලද්දාහ. පිටරට සිටි රජුද සිය ගෙදරට පමුණුවන ලද්දාහ. අන් රට වලින් ඔවුන් මැඩපවත්වා බොහෝවූ ධනය ගෙණෙනලදී.

206 "මම ධනුර්ධරයන් ගෙන් උතුම්ද වෙමි. ශූරයෙක්ද සියුම්වූ පිණ ඇත්තෙක්ද වෙමි. මා විසින් මේ රජතෙම සුවපත් කරණ ලද්දේයයි තරුණවූ මෙතෙම මා ඉක්මවා හඟියි.

207 "ආයඝ්ඨාවෙනි, හෙතෙම පෙර පරිද්දෙන් මාගේ උපස්ථානයටද නොපැමිණෙයි ඒ දොෂයෙන් සහෝදරයා මම දියරකුසාට දෙන්නෙමියි" රජතෙම කීයේය.

208 "ඔබද ධනශෙඛර කුමාරයාද යන දෙදෙනම එක රැයෙක්හි උපන්නාහුය. මෙහි සමාන වයස් ඇත්තාවූ පඤ්චාල වැසි යහළුවෝ දෙදෙනවූහ.

**209** "හැසිරීමෙන්ද ඔබ අනුව ගියේය. ඔබගේ සමාන දුක් සැප ඇත්තෙක්දවේ. රෑ දාවල් දෙක්හි උත්සාහවත්ව ඔබගේ සියලු කටයුතුවල ව්‍යවෘත්තවූවෙකි. එබඳු යහළුවා කවර දොෂයකින් දියරකුසාට දෙන්නෙහිදැයි" පරිව්‍රාජිකාව ඇසීය.

**210** "ආර්‍යාවෙනි, පෙර මා සමග හැසිරීමෙන් මෙතෙම මා සමග මහත් කොට සිනාසුනේය. අදත් ඒ ආකාරයෙන් සීමාව ඉක්මවා මහත් කොට සිනාසෙයි.

**211** "ස්වාමීනි, මා අගබිසව සමග රහසිගතවද කථා කරමි. එකල්හි මෙතෙම කලින් නොදන්වන ලද්දේ කථා නොකොට ඇතුල්වෙයි.

**212** "වළක්වන ලද්දේද, අවකාශ කරගෙණ ලජ්ජා නැතිව අනාදරව හැසිරෙයි. ඒ දොෂයෙන් යහළුවා මම දිය රකුසාට දෙන්නෙමියි" රජතෙම කීයේය.

**213** "මහරජ, මේ කේවට්ට නම් බමුණුතෙම සියලු නිමිති කීමෙහි දක්ෂයෙක. සතුන්ගේ හඬ දන්නෙක. උගත් ශාස්ත්‍ර ඇත්තෙක. චන්ද්‍රග්‍රහණාදිය ඇතිවීමෙහි ස්වප්න දැකීමෙහි ගුණාගුණ දන්නෙක. ගමන් යාමෙහිද ගෘහාදියට ඇතුල්වීමෙහිද හොඳ නරක කියන්නෙක.

**214** "භූමියෙහිද, අහසෙහිද ගුණදොස් දැනීමෙහි සමර්ථයෙක නක්ෂත්‍ර කොටස් දැනීමෙහි දක්ෂයෙක. එබඳු බ්‍රාහ්මණයා කවර දොෂයකින් දියරකුසාට දෙන්නෙහිදැයි" ඇසීය.

**215** "ස්වාමීනි, මේ බ්‍රාහ්මණයා පිරිස් මැදද, මා දෙස ඇස දල්වා බළයි. එහෙයින් මම අද භයානකවූ බැම ඇති බමුණා දියරකුසාට දෙන්නෙමි." රජතෙම කීයේය.

**216** "මුහුදින් වටකිරීම ඇත්තාවූ සාගරයට කුණ්ඩලාභරණයක් බඳුවූ සියල්ල දරන්නාවූ මේ පෘථිවිය ඇමතියන් විසින් පිරිවරණ ලද්දාවූ ඔබ අයිතිකොටගෙණ වාසය කෙරෙහිය.

217 "සිව්දිගට පතළාවූ මහත් රට ඇති ගන්නාලද විජය ඇති මහත් බල ඇති ඔබ පෘථිවියෙහි අසහාය රජ වෙහිය. ඔබගේ යශස මහත්බවට පැමිණියේය.

218 "අමුණනලද මිණි කොඩොල් ඇති දිව්‍යකන්‍යාවන් බඳු යහපත්වූ නොයෙක් ජනපදවල ස්ත්‍රීන්ගෙන් යුක්තවූ සොළොස් දහසක් ස්ත්‍රීහුද වෙත්.

219 "මහරජ, මෙසේ සියලු අංගයන්ගෙන් යුක්තවූ සියලු කැමති සම්පත්තීන් සමෘද්ධවූ සුවපත්වූවන්ට බොහෝ කලක් ජීවත්වීම ප්‍රියවේයයි" පණ්ඩිතයෝ කියත්.

220 "එසේ ඇතිකල්හි ඔබ කෙබඳු ආකාරයකින් හෝ කවර හේතුවකින් නම් මහෞෂධ පණ්ඩිතයන් ආරක්ෂා කෙරෙමින් හැර නොදැමියහැකි ස්වකීය ප්‍රාණය හැරදමන්නෙහිදැයි" පරිබ්‍රාජිකාව ඇසීය.

221 "ස්වාමීනි, මේ මහෞෂධතෙම යම් කලෙක පටන් මා අතට පැමිණියේද, මෙතාක් පණ්ඩිතයාගේ ස්වල්ප තරම් වූද නොකටයුත්තක් නොම දනිමි.

222 ඉදින් කිසියම් කලෙක පළමුකොට මාගේ මරණය වන්නේනම්, මහෞෂධතෙමේ මාගේ දූ පුතුන්ද, මුණුබුරන්ද සුවපත් කරන්නේය.

223 "මෙතෙම මතු එන්නාවූද, දැන් පවත්නාවූද, සියලු අර්ථය මනාකොට දකියි. අපරාධ කිරීමක් නැත්තාවූ ඔහු දිය රකුසාට නොදෙන්නෙමියි" රජතෙම කීයේය.

224 "එම්බා පඤ්චාල රටවැසියෙනි, චූලනී බ්‍රහ්මදත්ත රජුගේ මේ කීම අසව්. රජතෙම මහෞෂධ පණ්ඩිතයන් රකිමින් හැරදැමිය නොහැකිවූ සියපන හැරදමයි.

225 "පඤ්චාල රජතෙම මවගේද, භාර්‍ය්‍යාවගේද, සහෝදරයාගේද, යහළුවාගේද, බ්‍රාහ්මණයාගේද, තමන්ගේද යන සදෙනාගේ ජීවිතය හැරදමයි.

**226** "මෙසේ ප්‍රඥාතොමෝ මහත් ප්‍රයෝජන ඇත්තීය. නිපුණය. යහපත් සිතිවිලි ඇත්තීය. මේ ආත්මයෙහි වැඩ පිණිසද පරලෙව්හි සැප පිණිසද වන්නීයයි" භෙරී නම් පරිබ්‍රාජිකාතොමෝ කීවායයි දෙශනා කෙළේය.

**227** එකල්හි භෙරී නම් පරිබ්‍රාජිකාතොමෝ දැන් උත්පලවර්ණා ස්ථවිරාවිය. පියතෙම සුද්ධොදන නම් රජවූයේය. මව මහමායා වූවාය. අමරාදේවි බිම්බාදේවී විය.

**228** සුවපොතකතෙම ආනන්ද ස්ථවිර වූයේය. චූළනී බ්‍රහ්මදත්ත රජතෙම ශාරීපුත්‍ර ස්ථවිර වූයේය මහෞෂධ පණ්ඩිතතෙම දැන් ලෝකස්වාමීවූ මම වෙමියි" මෙසේ මේ ජාතකය දරාගණිව්යයි වදාළේය.

---